බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලා: 37

සූත්‍රාන්තපිටකයෙහි

29 වන ග්‍රන්ථය

# පටිසම්භිදාමග්ගප්පකරණ

## ඛුද්දකනිකාය

ත්‍රයොදශ භාගය

---

පාඨශොධනය

මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය
ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන්වහන්සේ

සිංහලානුවාදය

යථොක්ත අනුනායක ස්ථවිරයන්වහන්සේ හා උඩමාකඩවර
පුරාණ විහාරවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර
ස්ථවිරයන්වහන්සේ

---

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 37

The Twenty-ninth Book in the
**Suttanta-Pitaka**
**Khuddaka Nikāya (12)**

**29**

# PATISAMBHIDĀ MAGGAPPAKARANA (I)

Edited by
**Ven. Labugama Lankānanda Anunāyaka Thera**

Translated into Sinhala by
**The Said Anunāyaka Thera and**
**Pandit Karahampitigoda Sumanasāra Thera**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතශ කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සූත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා එලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**


## බෝදාගම චන්දිම නායක ස්ථවිර

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.


$-\frac{2557}{2013}-$

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ
බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වී. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි
## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- ❈ පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- ❈ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❈ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❈ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- ❈ දර්ශනපති පූජ්‍ය කරගහදල්පත සුගතනන්ද හිමි
- ❈ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❈ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❈ පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- ❈ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❈ මිලිනා සුමතිපාල මැතිණිය
- ❈ ජගත් සුමතිපාල මැතිතුමා
- ❈ ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහත්මා
- ❈ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❈ සුජිත් මොහොට්ටි මහත්මා
- ❈ රංජිත් අමරසිංහ මහත්මා
- ❈ ගාමිණී කාරියවසම් මහත්මා
- ❈ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❈ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❈ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❈ සිරිසේන හේරත් මැතිතුමා
- ❈ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

## තෙරසමො භාගො

# සූත්‍රාන්තපිටකයෙහි

# ඛුද්දකනිකාය

## ත්‍රයොදශ භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරකනිවේදනය ... ... ... | IX |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | XI |
| සංඥාපනය ... ... ... ... | XIII |
| පාළිහෝඩිය — P̄ALI ALPHABET ... ... ... | XXI |
| සඞ්කේත නිරූපණය — ABBREVIATIONṢ ... ... | XXIII |
| විෂයසූචි ... ... ... ... ... | XXV |
| පෙළ හා පරිවර්තනය .. ... ... ... | 2 521 |
| ගාථාදිපාදානුක්කමණිකා ... ... ... | 525 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... | 529-531 |

# සංස්කාරක නිවේදනය

---

## පටිසම්භිදාමග්ගප්‍රකරණ ශොධනය

සම්බුද්ධපරිනිර්වාණයෙන් දෙදහස් පන්සිය වසක් ඉක්මයෑම නිමිත්ත කොටගෙන බුද්ධජයන්ති මහොත්සවය උත්කර්ෂයෙන් පවත්වාලීම සඳහා තත්කාලීන ලංකාරාජ්‍යයේ ද අනුග්‍රහයෙන් ඇරැඹුණු බෞද්ධමණ්ඩලය මගින් සංවිහිත වූ ශාසනොපස්තම්භක කාර්‍ය්‍යයන් අතුරෙහි ප්‍රශස්‍ය වූයේ ත්‍රිපිටක පාළිය හෙළබසින් තබාලීමේ අතිශය දුෂ්කර කර්තව්‍ය යි. 1955 දී ත්‍රිපිටක ග්‍රන්ථ හෙළබසට නඟාලීම සඳහා සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේ පත්කරගැනීමේ දී පටිසම්භිදාමග්ගයෙහි වර්ග තුන වෙන වෙන ම මහතෙර-වරුන් තුන්නමකට භාර කරන ලද විය. එහෙත් එහි ඇතැම් කොටස් 1959 වර්ෂය වන තුරු ද ශොධනය හා පරිවර්තනය නිමාවට නො පැමිණියේ විය. නිමවා තුබූ කොටස්හි පවා ශොධනය හා පරිවර්තනය ප්‍රමාණ නොවන බව පෙනීගිය හෙයින් උත්තරීතර සංස්කාරක මණ්ඩලය විසින් පටිසම්භිදාමග්ග-යෙහි සපුරා ශොධනය හා පරිවර්තනය අප වෙත පවරන ලද්දේ ය.

ලක්දිව, මෙතෙක් මුද්‍රණයට නො පමුණුවා තුබූ පටිසම්භිදාමග්ගයේ ශොධනය ආයාස උපදවන කරුණක් බව පෙනීගියෙන් පුස්කොළ පිටපත් බොහෝ ගණනකුදු සපයාගෙන, සියම්රට තායි අක්ෂරයෙන් මුද්‍රිත පොත ද, එංගලන්තයේ පාළිපොත් සමාගම මගින් පළකරවනලද පොත ද, බුරුමරට ඡට්ඨසඞ්ගීති පුස්තකය ද ඇසිරු කෙරෙමින් සූත්‍රාන්තපිටකයෙහි වෙනත් ග්‍රන්ථයනුදු වහල් කොටගෙන පටිසම්භිදාමග්ගය මුළුල්ල ශුද්ධියට පමුණුවන ලද්දේ ය. කල් නො යා දී මැ පරිවර්තනය ද නිමවන ලද්දේ ය. පරිවර්තන අවස්ථායෙහි ලා පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ මුල සිට මැ සහාය වූහ. 1962 දී පරිවර්තනය අවසන් කොට මුද්‍රණයට ඉදිරිපත් කරනලද නමුදු මුද්‍රණකාර්‍ය්‍යයෙහි ක්‍රමානුකූල සංවිධානයක් නොවූයෙන් පළකරවාලීම මෙතෙක් පමාවූ බව ද පවසම්හ.

තවද පටිසම්භිදාමග්ගපාඨශොධනයෙහි දී හා පරිවර්තනයෙහි දී ද දෙමටගොඩ පධානඝරවිහාරාධිපති වැ වැඩවිසූ ත්‍රිපිටක සංස්කාරකමණ්ඩ-ලයේ ප්‍රධාන සම්පාදක වැ සිටි පරම ගෞරවාස්පද ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය දර්ශනවිශාරද පරවාහැර ශ්‍රී වජ්‍රඥාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා එකාබද්ධ අමරපුරමහානිකායේ මහානායකධුරීණ අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා අහංගමැ විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය පණ්ඩිත කොදාගොඩ ඥානාලොකා-භිධාන දක්ෂිණලංකායෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ හා සදුපදෙශදානයෙන් උපස්තම්භ වූහ. මෙහි ලා දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධීශ්වර භාෂාන්තරවිශාරද ශ්‍රී වජ්‍රඥාන පණ්ඩිත පරවාහැර ශ්‍රී ප්‍රඥානන්ද (බී. ඒ. ගෞරව ලන්ඩන්) කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ ද කෘතඥතාපූර්වක වැ සඳහන් කරම්හ.

**ලබුගම ලංකානන්ද**
**අනුනායකස්ථවිර.**
ත්‍රිපිටකසම්පාදක මණ්ඩලයේ
ප්‍රධානසම්පාදක.

20. 12. 70
ප්‍රවචනොදයපිරිවෙන.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

බුද්ධජයන්ති ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකසභායෙහි ආරම්භයෙහි සිටම එහි ප්‍රධානසම්පාදකධුරය ධරමින් දවරිය වෙහෙසෙමින් ක්‍රියා කළ අතිගරු දර්ශනවිශාරද පරවාහැර ශ්‍රී වජිරඤාණාභිධාන නාහිමිපාණන් වහන්සේ 1970 පෙබරවාරි 9 වැනි දින සවර්ගස්ථ වූයෙන් එකල මුද්‍රණයෙහි පැවැති අඞ්ගුත්තර නිකාය චතුර්ථභාගය හා මේ 'පටිසම්භිදාමග්ග' ය ද තාවකාලික වැ නවතාලන්නට සිදු විය. සංස්කාරක මණ්ඩලයෙහි සංස්කරණයක් අවශ්‍ය වූ හෙයිනි. 1970 අප්‍රියෙල් 3 වැනි දින අධ්‍යාපන සාංස්කෘතික ස්ථිරලේකම් තුමා හා සාංස්කෘතික අධ්‍යක්‍ෂවරයා ද ඇතුළු කොට 'මහානායක චාරිකාරාම' යෙහි පැවැති සාකච්ඡාසභායෙහි දී පහත සඳහන් මණ්ඩලය සම්මත විය

1 ප්‍රධාන උපදේශක :

අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙයාභිධාන සමස්ත අමරපුර මහානිකායෙහි මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

2 සභාපති :

අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝකාභිධාන දක්‍ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

3. ප්‍රධාන සම්පාදක :

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය ත්‍රිපිටක වාගීශ්වර ලබුගම ශ්‍රී ලඞ්කානන්දාභිධාන ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

4 උත්තරීතර සාමාජික :

දෙමටගොඩ ධර්මදූතාශ්‍රමවිද්‍යාලයාධිපති, පණ්ඩිත, භාෂාන්තරවිශාරද පරවාහැර ශ්‍රී පඤ්ඤානන්ද (බී. ඒ. ගෞ. ලන්ඩන්) කොළඹ නව කෝරළයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

5. ,, පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ

6. කාර්ය සංවිධායක:

පණ්ඩිත දෙරගමුගම් ධම්මපාල කොළඹපලාතේ ප්‍රධාන නායක ස්ථවිරයන් වහන්සේ.

මෙහි සඳහන් පස්නම ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය වශයෙන් සම්මත වැ ඇත කලින් සභාපති ධුරය දැරූ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන්ගේ අභාවයෙන් වූ පුරප්පාඩුව පිණිස කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ ද පරවාහැර ශ්‍රී වජිරඤාණ නාහිමිපාණන්ගේ අභාවයෙන් වූ පුරප්පාඩුව පිණිස ලබුගම ශ්‍රී ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන් වහන්සේ ද පත්වූහ. අග්ගමහාපණ්ඩිත ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරයන් වහන්සේ වෙතින් උපදෙශ ලබාගත යුතු බවද තීරණය විය. අවශ්‍ය අවස්ථායෙක සහාය භාවයට කැඳවා ගතයුතු අතිරේක සාමාජිකයෝ කිහිප දෙනෙක් ද සම්මත වැ ඇත.

# සංඥාපනය

**''යො පබ්බජී ජාතිසතානි පඤ්ච
පහාය කාමානි මනොරමානි,
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං
පරිනිබ්බුතං වන්දථ සාරිපුත්තං''**

### පටිසම්භිදා

පටිසම්භිදා (පිළිසැඹියා) සතරෙකි. 'අත්ථ, ධම්ම, නිරුත්ති, පටිභාන' යි. ඒ සිවුපිළිසැඹියාවනට මාර්ගය, අධිගමයෙහි උපාය නුයි - 'පටිසම්භිදාමග්ග' නම් විය. ප්‍රතිසංවිත්ප්‍රතිලාභයෙහි හෙතුව යි.

මේ දෙශනාව හෝ මේ ප්‍රකරණය ඒ සිවුපිළිසිඹියාවනට කිසෙයින් උපාය වෙයි යත්: ප්‍රභෙද හෙයින් දෙසනලද ධර්මය හෙතු කොටගෙන පිළිසිඹියා නුවණ උපදවන හෙයිනි. එසේ මැ ය: නානාභෙදයෙන් ප්‍රභෙදයට ගිය ධර්මයන් පිළිබඳ නානාභෙදභින්න වූ දෙශනාව අසන ආයතිපුද්ගලයනට ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදය ද උපදවයි, පුහුදුන් පුගුලනට අනායෙහි ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට ද ප්‍රත්‍යය වෙයි. මේ වදාරන ලද මැ ය: **පභෙදතො හි දෙසනා ඝනවිනිබ්භොගපටිසම්භිදාඤාණාවහා හොති**' යි. මෙ ද අගසවු සැරියුත් මහරහතුන් වහන්සේගේ නානාභෙද භින්න වූ දෙශනායෙකි. එහෙයින් පටිසම්භිදාවනට මාර්ගභාවය සිද්ධ යි.

### සිවුපිළිසිඹියා

පටිසම්භිදා සතරෙකි. ''පටිසම්භිදා'' නම්; ඥානප්‍රභෙද යි, **අත්ථෙ ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා**' යි පටිසම්භිදාවිභඞ්ගයෙහි වදාළ හෙයින් අන් කිසිවක්හුගේ ප්‍රභෙද නොවැ ඥානයාගේ මැ ප්‍රභෙද යි: එහෙයින් 'චතුපටිසම්භිදා' යනු 'සතර ඥානප්‍රභෙද කෙනෙකැ' යන අර්ථ යි. අර්ථප්‍රභෙදය සැලැකීමෙහි ප්‍රකට කිරීමෙහි නිශ්චය කිරීමෙහි සමර්ථ වූ අර්ථයෙහි ප්‍රභෙදගත ඥානය **අත්ථපටිසම්භිදා** යැ, ධර්මප්‍රභෙදය සැලැකීමට ප්‍රකට කිරීමට නිශ්චය කිරීමට සමර්ථ වූ ධර්මයෙහි ප්‍රභෙදගත ඥානය **ධම්මපටිසම්භිදා** යැ, නිරුක්තිප්‍රභෙදය සැලැකීමට විභාවනයට නිශ්චය කිරීමට සමර්ථ වූ නිරුක්තාභිලාපයෙහි ප්‍රභෙදගත ඥානය **නිරුත්තිපටිසම්භිදා** යැ, ප්‍රතිභානප්‍රභෙදය සැලැකීමට විභාවනයට නිශ්චය කිරීමට සමර්ථ වූ ප්‍රතිභානයෙහි ප්‍රභෙදගත ඥානය **පටිභානපටිසම්භිදා** යි.

එහි සැකෙවින් හෙතුඵලය 'අත්ථ' නම් වෙයි. හෙතු අනුසාරයෙන් ඵලය අවබොධ කරනුලබන හෙයින් පැමිණෙනුලබන හෙයින් අර්ථ යයි කියනු ලැබේ. ඒ අර්ථය ප්‍රභෙද හෙයින් යම් කිසි ප්‍රත්‍යයසමුත්පන්නයෙකැ නිර්වාණ යැ භාෂිතාර්ථ යැ විපාක යැ ක්‍රියා යැ යන මේ පඤ්චධර්මයෝ වෙති. ඒ පඤ්චධර්ම සඞ්ඛ්‍යාත අර්ථය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ඒ අර්ථයෙහි ප්‍රභෙදගත ඥානය 'අර්ථපටිසම්භිදා' නම් වෙයි.

සැකෙවින් ප්‍රත්‍යය 'ධම්ම' නම් වෙයි, ඒ ඒ ඵලය උපදවා නුයි පවත්වා නුයි පමුණුවා නුයි ධර්ම යයි කියනුලැබේ. හේ ප්‍රභෙද හෙයින් යම් කිසි ඵල නිපදවන හෙතුයෙකැ ආයඊමාගී යැ භාෂිත යැ කුශල යැ අකුශල යැ යන මේ පස්දහම්හු ධර්ම යයි දතයුත්තාහ. ඒ ධර්මය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාහට ඒ ධර්මයෙහි ප්‍රභෙදගත ඥනය 'ධම්මපටිසම්භිදා නම් වෙයි, මේ අර්ථය මැ අභිධර්ම (විභඞගප්පකරණ) යෙහි ''දුක්ඛෙ ඤාණං අත්‍ථපටිසම්භිදා දුක්ඛසමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා දුක්ඛනිරොධෙ ඤාණං අත්‍ථපටිසම්භිදා දුක්ඛනිරොධගාමිනියා පටිපදය ඤාණං ධම්මපටිසම්භිදා'' යනාදි නයින් විභාග කොට වදාරන ලද්දේ ය.

''තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං'' යි ඒ අර්ථයෙහි ද ධර්මයෙහි ද යම් සවභාවනිරුක්තියක් අව්‍යභිචාරී ව්‍යවහාරයෙක් ඇද්ද ඒ ව්‍යවහාරය ලපනයෙහි භාෂණයෙහි උදීරණයෙහි පැවැති ලපිත භාෂිත උදීරිතසවභාවනිරුක්ති ශබ්දය අරමුණු කොට ගෙන ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාහට ඒ සවභාවනිරුක්ත්‍යභිලාපයෙහි මෙ 'සභාවනිරුත්ති' යැ මේ 'අසභාවනිරුත්ති' යැ යි මූලභාෂාව වූ මගධයෙහි උපන් ධර්මනිරුක්ති සඞ්ඛ්‍යාත ඒ සවභාවනිරුක්තියෙහි ප්‍රභෙදගත ඥනය 'නිරුත්තිපටිසම්භිදා' නම් වෙයි. මෙසෙයින් නිරුත්තිපටිසම්භිදාව ශබ්දාලම්බන වූවා යැ' ප්‍රඥප්ත්‍යාලම්බන නොවන්නී යැ, ශබ්දය ඇසීමෙන් මැ මේ සභාවනිරුක්ති යැ මේ අසභාවනිරුක්ති යැ'යි දැනැගන්නා හෙයිනි.

''ඤාණෙසු ඤාණං'' යි සර්වාර්ථසාධකඥනය අරමුණු කොට ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාහට ඒ ඥනයෙහි ප්‍රභෙදගතඥනය හෝ 'අත්‍ථපටිසම්භිදා'දි යථොක්ත ඥනත්‍රයෙහි ගොචර කෘත්‍යාදි වශයෙන් විස්තාරයට ගිය ඥනය හෝ ''පටිභානපටිසම්භිදා'' නම් වේ.

තවද මේ සතර ප්‍රතිසංවිද්ඥනයෝ ශෛක්‍ෂභූමි යැ අශෛක්‍ෂභූමි යැ යන දෙතැන්හි ප්‍රභෙදයට යන්නාහ. එහි සාරිපුත්ත මහාමොග්ගල්ලාන මහාකස්සප මහාකච්චායනා'දි අසූමහතෙරවරුන්ට අශෛක්‍ෂභූමියෙහි පටිසම්භිදාවෝ ප්‍රභෙදයට ගියාහු ය. 'ආනන්ද ස්ථවිර චිත්තගහපති ධම්මික උපාසක උපාලිගහපති ඛුජ්ජුත්තරා උපාසිකා' යනාදීනට ශෛක්‍ෂභූමියෙහි පටිසම්භිදාවෝ ප්‍රභෙදයට ගියාහ.

ප්‍රතිසංවිදාවෝ විශද වන්නාහු අධිගමයෙන, පර්‍ය්‍යාප්තියෙන, ශ්‍රවණයෙන, පරිපෘච්ඡායෙන, පූර්වයොගයෙන යන පස්කරුණෙන් විශද වන්නාහ. එහි අධිගම නම්: රහත්බවට පැමිණීම යැ, රහත්වූවහුට පටිසම්භිදාවෝ විශද වෙති, පර්‍ය්‍යාප්ති නම්: බුදුවදන් යැ. ඒ බුදුවදන් උගන්නාහට ද පටිසම්භිදාවෝ විශද වෙති, සවන නම්: සද්ධර්මශ්‍රවණය යි. සකස් ව අර්ථවත් කොට බණ අසන්නාහට පටිසම්භිදාවෝ විශද වෙති. පරිපුච්ඡා නම් පාළි අර්ථකථායෙහි ග්‍රන්ථිපද අර්ථපදයන්ගේ විනිශ්චයකථා යැ, උගත් පාළි ආදියෙහි අර්ථ පුළුවුස්නාහට පටිසම්භිදාවෝ විශද වෙයි. පුබ්බයොග නම්: පෙර බුදුන්ගේ සස්නෙහි යොගාවචර බව යැ, ගතපච්චාගතික වත පිරීමෙන් අනුලොමඥනය දක්වා ගොත්‍රභූ සමීපයට පැමිණි විදර්ශනායෙහි යෙදීම යි, එසේ මැ ය: පූර්වයොගාවචරයනට පටිසම්භිදාවෝ විශද වෙති මේ පස්කරුණෙන් සිව්පිළිසිඹියාවෝ විශද වන්නාහ

තවද කිසිකෙනෙක්:

'පුබ්බයොගො බාහුසච්චං දෙසභාසා ච ආගමො
පරිපුච්ඡා අධිගමො ගරුසන්නිස්සයො තථා
මිත්තසම්පත්ති චෙවාති පටිසම්භිදපච්චයා'' යි

‘පුබ්බයොග බාහුසච්ච දෙසභාසා ආගම පරිපුච්ඡා අධිගම ගරුසන්නිස්සය මිත්තසම්පත්ති’ යන අටකරුණ පටිසම්භිදාලාභයට ප්‍රත්‍යය වෙති’ කීහු. එහි පුබ්බයොග යට කී නය මැයි, බාහුසච්ච නම්: ඒ ඒ ශාස්ත්‍රයෙහි ද ශිල්පයන්හි ද නිපුණබව යැ, දෙසභාසා නම්: එක්සියක් භාෂාව්‍යවහාරයෙහි කුශල බව යැ, විශෙෂයෙන් මගධභාෂායෙහි කුශලබව යි. ආගම නම්: යටත් පිරිසෙයින් ඖපම්‍යවර්ගීය ප්‍රමාණ වූ ද බුද්ධවචන පුහුණු කිරීම යැ, පරිපුච්ඡා නම්: එක ගාථාවක හෝ අර්ථවිනිශ්චය විචාරීම යැ, අධිගම නම්: සෝවන් බව හෝ සෙදගැමිබව හෝ අනාගැමිබව හෝ රහත්බව හෝ යැ, ගරුසන්නිස්සය නම්: ශ්‍රැතප්‍රතිභාන බහුල වූ ගුරුන් සමීපයෙහි විසීම යැ, මිත්තසම්පත්ති නම්: එබඳු වූ මැ මිත්‍රයන්ගේ ප්‍රතිලාභ යි. එහි බුදු පසේබුදුවරයෝ පුබ්බයොගය ද අධිගමය ද නිසා පටිසම්භිදාවනට පැමිණෙති, ශ්‍රාවකයෝ මේ හැම කරුණු මැ නිසා පටිසම්භිදාලාභී වෙත්. තව්ද පටිසම්භිදාවනට පැමිණීම සඳහා වෙනම කමටහන් වැඩීමෙකුදු නැත. ශෛක්‍ෂයනට ශෛක්‍ෂඵල විමොක්‍ෂාන්තයෙහි වූ ද අශෛක්‍ෂයනට අශෛක්‍ෂඵලවිමොක්‍ෂාන්තයෙහි වූ ද පටිසම්භිදාප්‍රාප්තිය වෙයි. තථාගත බුදුවරයනට දශබලයන් සෙයින් ආර්‍යයනට ආර්‍යඵලයන් සමග මැ පටිසම්භිදාවෝ සමෘද්ධ වන්නාහු වෙත්.

**පටිසම්භිදාමග්ගප්පකරණ.**

මේ දක්වනලද සතර ප්‍රතිසංවිදාවනට මාර්ගීය නුයි ‘පටිසම්භිදාමග්ග’ නම් විය. පටිසම්භිදාමග්ගය මැ ප්‍රකරණ වූයේ ‘පටිසම්භිදාමග්ගප්පකරණ’ නම් වේ. නානාවිධ භෙදභින්න වූ ගම්භීරාර්ථයෝ මෙහි ලා ප්‍රකාරයෙන් කියනුලැබෙත් නුයි ‘පකරණ’ නම් වී. තෙල “පටිසම්භිදාමග්ගප්පකරණ”ය අර්ථසම්පන්න යැ, ව්‍යඤ්ජනසම්පන්න යැ, ගම්භීරාර්ථ ඇත්තෙ යැ, ලොවුතුරු දහම් පවසනුයෙ යැ, ශූන්‍යතාප්‍රතිසංයුක්ත යැ, ප්‍රතිපත්තිඵලවිශෙෂ ඵලවනුයෙ යැ, ප්‍රතිපක්‍ෂයන් වළහනුයෙ යැ, යොගාවචරයනට ඥානවරරත්නාකර වූයෙ යැ, ධර්මකථිකයනට ධර්මකථාවිලාසවිශෙෂයට කාරණ වූයෙ යැ; සංසාරභීරුකයනට දුක් දුරලනුයෙ වෙයි.

තව්ද මේ ප්‍රකරණය දුක්ඛනිස්සරණයට උපාය දැක්වීමෙන් ආශ්වාස දනවනු සඳහා ද තත්ප්‍රතිපක්‍ෂයන් නැසීම සඳහා ද ගම්භීර වූ අර්ථ ඇති නොයෙක් සූත්‍රාන්තපදයන්ගේ අර්ථ විවරණ කිරීමෙන් හුදී ජනයනට හෘදයාහ්ලාද දනවනු පිණිස සකලඥෙයධර්මවිෂයෙහි අප්‍රතිහත සර්වඥතාඥාන ලක්‍ෂණ මහාප්‍රදීපාවභාස ඇති සකල සත්ත්වවර්ගයා කෙරෙහි පතළ මහාකරුණා ලක්‍ෂණ සෙනහයෙන් සන්ගාඪ වූ සිත් ඇති තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් විසින් වෛනෙයජනහෘදයගත ක්ලෙශාන්ධකාර විධ්වංසනය සඳහා දල්වනලද සද්ධර්ම ලක්‍ෂණ මහාප්‍රදීපය තදධිප්‍රායවිකාශන ලක්‍ෂණ තෛලපරිෂෙකයෙන් පස්වාදහසක් නිරතුරු කොට දල්වාතැබීමෙහි රිසි ඇති ලොකානුකම්පක වූ සර්වඥකල්ප ධම්සෙනෙවි සැරියුත් මහරහතුන් වහන්සේ විසින් ඒ ඒ අවස්ථායෙහි වදාරනලද වේ, (මහානිද්දෙස සංඥාපනය ද බලන්න.)

ප්‍රථම මහාධර්මසඞ්ගීතියට පැමිණ ධර්මභාණ්ඩාගාරික ආනන්ද මහතෙරුන් විසින් ඇසූ පරිදි මැ සඞ්ගායනාවට ආරොපණය කරනලද ‘පටිසම්භිදාමග්ගප්පකරණය’ දෙවැනි තෙවැනි සඞ්ගීතියෙහි අනුසඞ්ගීත විය. ප්‍රථම සඞ්ගීතියේදී මැ තෙල ප්‍රකරණය සූත්‍රාන්ත පිටකයෙහි ඇතුළු කරනලද්දේ දීඝාගමාදි පඤ්චමහානිකායයන් කෙරෙහි ඛුද්දකමහානිකාය-පරියාපන්න විය. ‘සුත්ත ගෙය්‍යා’දි නව ශාස්තෘශාසනාඞ්ගයන් කෙරෙහි යථාසම්භවයෙන් ගෙය්‍ය වෙය්‍යාකරණාඞ්ගද්වයෙහි බැසැගෙන සිටී. චතුරාසීති ධර්මස්කන්ධයන් අතුරෙහි ධර්මභාණ්ඩාගාරික ආනන්ද තෙරණුවන් විසින් ශ්‍රාවක භික්ෂූන් කෙරෙන් උගත්තාලද්දැයි පැවැසූ දෙ දහසක් ධර්මස්කන්ධයන් ගෙන් සියගණනක් ධර්මස්කන්ධයෙන් සඞ්ගෘහීත වූයේ යි

තවද මේ පටිසම්භිදාමග්ගප්පකරණයෙහි ‘මහාවග්ග’ යැ, ‘මජ්ඣිමවග්ග’ යැ, චුල්ලවග්ග යැ’යි ප්‍රමාණපරිපාටියෙන් වර්ග තුනෙක් වෙයි, එහි මධ්‍යම-වර්ගය ‘යුගනද්ධවග්ග’ නමුදු චුල්ලවර්ගය ‘පඤ්ඤාවග්ග’ නමුදු වේ. එයින් මහාවර්ගයෙහි ‘ඤාණකථා යැ, දිට්ඨිකථා යැ, ආනාපානසතිකථා යැ, ඉන්ද්‍රියකථා යැ, විමොක්ඛකථා යැ, ගතිකථා යැ කම්මකථා යැ, විපල්ලාසකථා යැ, මග්ගකථා යැ, මණ්ඩපෙය්‍යකථා යැ’යි දසකථායෙක් ද - මධ්‍යමවර්ගයෙහි ‘යුගනද්ධකථා යැ, සච්චකථා යැ, බොජ්ඣඞ්ග කථා යැ, මෙත්තාකථා යැ, විරාගකථා යැ, පටිසම්භිදාකථා යැ, ධම්මචක්කකථා යැ, ලොකුත්තරකථා යැ, බලකථා යැ, සුඤ්ඤතාකථා යැ’යි කථා දසයෙක් ද - චුල්ලවර්ගයෙහි පඤ්ඤාකථා යැ, ඉද්ධිකථා යැ, අභිසමයකථා යැ, විවෙකකථා යැ, චරියාකථා යැ, පාටිහාරියකථා යැ, සමසීසකථා යැ, සතිපට්ඨාන කථා යැ, විපස්සනාකථා යැ, මාතිකාකථා යැ’යි දස කථායෙක් දැ’යි සමතිස් කථා කෙනෙක් වෙත්.

## ත්‍රිපිටකය

ආහච්චභාසිත වූ ධර්ම-විනය සංඛ්‍යාත ත්‍රිපිටකපාළිය යථාර්ථයෙන් මැ සාහිත්‍යයෙකි. ලොවැ ශිෂ්ටභාෂාවන් ඇසිරි කොටගෙන ගොඩනැගුණු විවිධ සාහිත්‍යයෝ ද වෙති ත්‍රිපිටකපාළිය හැර අන් හැම සාහිත්‍යයෝ ඒ ඒ භාෂායෙහි නිපුණ වූ විශාරදයන්ගේ නත්වැදූරුම් වූ රචනා එක්තැන් වීමෙන් ගොඩනැඟී ඇති රචනාසාහිත්‍යයෝ යි. එකලා ත්‍රිපිටකය වූ කලී තථාගත සම්මාසම්බුදුන් විසින් ද සාරිපුත්තාදී ඇතැම් ශ්‍රාවක කෙනකුන් විසින් ද ඒ ඒ කරුණෙහි ලා දෙශනා කරවදාළ අනෙකවිධ දෙශනාවන් යථාවිධින් එක්තැන් කොට සඞ්ගීත වැ අනුසඞ්ගීත වැ පවත්නා අනන්‍ය සාධාරණ වූ දෙශනාසාහිත්‍යයෙක් වේ මැ ය. එය ප්‍රථම සඞ්ගීතියෙහි පටන් මෙදවස දක්වා ස්ථවිරවංශයෙහි ආචාර්‍යවරයෝ ජීවිතයට ද වඩා අග්‍ර කෙරෙමින් ආරක්ෂා කෙරෙති. ඔහු බුද්ධභාෂිතයෙහි අක්ෂරයක් මාත්‍රාවකුදු වෙනස්වනු නො ඉවසති.

බුද්ධභාෂිත වූ පාළිධර්මයෙහි ඇති මේ විශෙෂය නොදත් අවරදිග ඇතැම් විචෙචකයෝ ද උන් අනුගමනය කළ මෙරට ඇතැම් උගතුන් හා නවකයෝ ද බුදුදහම සාහිත්‍යලෙශයෙන් ගෙන විවේචනයට භාජන කෙරෙති. බුදුරදුන් විසින් මැ තමන්වහන්සේ වදාළ දැය ‘**යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා**’ යනාදි

අනෙකස්ථලයෙහි ධර්ම-විනය විසින් දෙපරිදි වූ සැටි ද, **‘ඉධ පන භික්ඛවෙ එකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං’** යනාදි තැන්හි ඒ සියලු දෙශිතය අඞ්ග නවයෙක බැසැගෙන සිටුනා පරිදි ද වදාරන ලද්දේ ය. මෙයින් සියලු දෙශනාසාහිත්‍යය ධර්ම-විනය බවත් එය සුත්ත-ගෙය්‍යාදි අඞ්ග නවයකින් යුක්ත වූ බවත් පවසන ලදි.

සඞ්ගායනාඅවස්ථාවට පැමිණි මහාකස්සපාදි ප්‍රථම සඞ්ගීතිකාරක මහ තෙරවරුන් විසින් ධර්මවිනය සඞ්ඛ්‍යාත නවාඞ්ග ශාස්තෲශාසනය නාක් මලක්නෙක තැබූ නොගෙතූ මල්රැසක් සෙයින් වෙන් වෙන් වැ විසිරී පවත්නාසේ සලකා හැම දහම් කොටස් පිටක වශයෙන් හා නිකාය වශයෙන් පඨන පාඨනයෙහි ග්‍රහණ ධාරණයෙහි සුකර වනසේ ක්‍රමබද්ධ කොට සඞ්ගීත විය. එ මතු නො වැ තෙවළායෙහි අතුළු වැ සිටි එකකාදි නිපාත-පණ්ණාස- වර්ගවශයෙන් ද සඞ්ගෘහීත වූයේ නිදාන උද්දානගාථාදිය පවා ඒ ප්‍රථම සඞ්ගීතිකාරකයන් විසින් ම සපුරා තබන ලද විය. බුද්ධපරිනිර්වාණ-යෙන් පසු වැ ශ්‍රාවක භාෂිත වූ කතිපය සූත්‍ර කෙනකුන් හා මොග්ගලීපුත්ත-තිස්ස මහරහතුන් වහන්සේ වදාළ කථාවත්ථුප්පකරණය හා දෙවන තෙවන සඞ්ගායනාවන්හි දී සඞ්ගීත වැ ථෙරීය ඇදුරොල්හි මුඛ පාඨයෙන් මැ ගෙන එනලදු වැ බුදුන් පිරිනිවි සාරසියසූපනස් වසක්හුගේ ඇවෑමෙන් තෙවළාධර පන්සියක් රහතුන් විසින් අනාගත ජනතාවගේ පරිහානිය දැක ග්‍රන්ථාරූඪ කොට තබන ලද වී.

## පටිසම්භිදාමග්ගය රචනාවක් ද?

වළගම්බා රාජ්‍යසමය තෙක් ලෙඛනගත නො වූ ‘පටිසම්භිදාමග්ගප්ප-කරණය’ ගෙන විවෙකබුද්ධි රහිත වැ විවෙචනයට බස්නා ඇතැම් කෙනෙක් ‘‘පටිසම්භිදාමග්ගය ද සැරියුත් තෙරුන් වහන්සේ විසින් රචිත ප්‍රකරණයෙ-කැ යි ආචාර්‍යමතය වේ’’ යනු කියති. එහෙත් පටිසම්භිදාමග්ගය අගසවු සැරියුත් මහතෙරණුවන් විසින් රචනා කරනලදැයි ආචාර්‍යමතයෙක් කැල මැ නැත. එහි ලා ආචාර්‍යමතය නම්: **‘‘ගම්භීරට්ඨානඤ්ච අනෙකෙසං සුත්තන්තපදානං අත්ථවිවරණෙන ... ධම්මසෙනාපතිනා ආයස්මතා සාරිපුත්තත්ථෙරෙන භාසිතං’’** යී ගැඹුරු අරුත් ඇති සූත්‍රයන්ගේ අර්ථ විවරණ කරමින් සැරියුත් තෙරණුවන් විසින් වදාරනලද බව යි.

## පටිසම්භිදාමග්ගය අභිධර්මයක් ද?

පටිසම්භිදාමග්ගය නාමමාත්‍රයෙන් ඔබ්බෙහි නොහැඳින විවෙචනයට ගිය ඔහු ‘‘පටිසම්භිදාමග්ගය අභිධර්මපිටකයට අයත් නුවූයේ මන්දැයි විසඳිය නොහැකි ප්‍රශ්නයකි’’ යි කියති. ප්‍රකරණය ගැන අවබොධයක් නැතිවී-මත් යට දැක්වූ ආචාර්‍ය මතය නොදැනීමත් හෙතු කොටගෙන ‘‘පටිසම්භිදා’’ යනු අභිධර්මයෙකැයි සිතාගැනීමෙන් වූ සම්මොහය නිසා පටිසම්භිදාමග්ගය සූත්‍රපිටකයෙහි ලා සඞ්ගායනා කිරීම වරදක් කොට සැලකූ බව පෙනේ. වගකියයුතු තැන් ඇසුරු කරමින් මෙබඳු අවිචාරාත්මක ප්‍රකාශයන් කිරීම ධර්මය හා ධර්මධරයන් ලඝු කොට දක්වමින් ආධුනිකයන් නොමඟ යැවීමෙකි.

පටිසම්භිදාමග්ගය බුදුන් වදාළ ගම්භීරාර්ථ වූ නොයෙක් සූත්‍රාන්තපදයන්ගේ අර්ථවිවරණයෙකි. එහෙයින් සඞ්ගීතිකාරකයන් එය සූත්‍රාන්ත පිටකයෙහි ඛුද්දකමහානිකායාන්තර්ගත කොට සඞ්ගීත විය. එකරුණ තව දුරටත් විමසා බලනු සඳහා ''මණ්ඩපෙය්‍යකථාව'' ඉදිරිපත් කරම්හ: **''මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං සත්ථා සම්මුඛීභූතො''** යනු මණ්ඩපෙය්‍යකථායෙහි උද්දෙසපදයයි. මේ වූකලී සංයුත්සඟියේ නිදානවග්ගයට අයත් අභිසමයසංයුත්තයෙහි තුන්වැනි වර්ගයේ දෙවැන්න වූ දසබල සූත්‍රයෙහි වදාළ: **''දුක්ඛං භික්ඛවෙ කුසීතො විහරති වොකිණ්ණො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි මහන්තඤ්ච සදත්ථං පරිහාපෙති. ආරද්ධවිරියො ච ඛො භික්ඛවෙ සුඛං විහරති පවිවිත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි මහන්තඤ්ච සදත්ථං පරිපූරෙති. න භික්ඛවෙ හීනෙන අග්ගස්ස පත්ති හොති. අග්ගෙන ච ඛො අග්ගස්ස පත්ති හොති. මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං සත්ථා සම්මුඛීභූතො. තස්මාතිහ භික්ඛවෙ විරියං ආරභථ අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය''** යනාදි සූත්‍රප්‍රදෙශයෙහි 'මණ්ඩපෙය්‍ය' පදය ගෙන දෙසනා පටිග්ගහ-බ්‍රහ්මචරිය විසින් මණ්ඩය ත්‍රිවිධ කොට ඉන්ද්‍රිය බල බොජ්ඣඞ්ග මග්ගඞ්ගයන්හි ලා පරිපූර්ණ ධර්මවිභාගය වදාරන ලද්දේ ය.

මෙසෙයින් පටිසම්භිදාමග්ගයෙහි වර්ගත්‍රයට අයත් කථා තිස බෙහෙවින් සූත්‍රාන්තයක් හෝ සූත්‍රාන්තපදයක් හෝ පෙරදැරි කොටගෙන ශ්‍රොතෘජනයාගේ ඥානප්‍රභෙදය දනවනු සඳහා ශාස්තෘකල්ප වූ ධර්මසේනෙවි සැරියුත් මහරහතුන් වහන්සේ විසින් ඒ ඒ අවස්ථායෙහි වදාරන ලද බව ද සඞ්ගීතිකාරක මහතෙරවරුන් විසින් ක්‍රමසචිත කොට සඞ්ගීත වූ බව ද, ගම්භීරාර්ථ වූ සූත්‍රපදයන්ගේ අර්ථ විභාග කළ දෙශනා වන හෙයින් සූත්‍රාන්ත පිටකයෙහි සඟහාලූ බව ද, ප්‍රමාණයෙන් කුඩා ප්‍රකරණයක් වූයෙන් කුදුගත් සඟියෙහි ලා ගිණූ බව ද සැලැකිය යුතු ය.

තවද ''මහානිද්දෙසයත් පටිසම්භිදාමග්ගයත් පසු කලෙක පෙළට ඇතුළත් කරගත් අටුවා දෙකෙකැ''යි කියති. මෙයින් මහානිද්දෙසපාළිය ගෙන කියයුතු දෑ මහානිද්දෙස සංඥාපනයෙහි ලා ප්‍රකාශ කළම්හ. පටිසම්භිදාමග්ගය ද මහානිද්දෙසය සෙයින් ම සැරියුත් මහරහතුන් වහන්සේගේ දෙශනාවක් බව මුලින් සඳහන් කොට ඇත. එය අටුවාවක් නොවන පරිදි විමසුව මනා යැ: පටිසම්භිදාමග්ගයෙහි ආදිම වූයේ ඤාණකථා ය. එය වදාරන සැරියුත් තෙරණුවෝ ශ්‍රාවකයන් හා සාධාරණ වූ ශ්‍රුතමය ඥානය ආදි කොට ඇති සත්සැට නුවණ ද, ඉන්ද්‍රියපරොපරියත්තාදි ෂඩ්අසාධාරණ ඥානය දැයි තෙසැත්තෑ නුවණ මාතෘකා විසින් උද්දෙස කොට, යළි තමන් වහන්සේගේ ශ්‍රාවකපාරමීඥානයෙහි සිට බුදුන් වදාළ නය ගෙන විවිධාකාරයෙන් ඥානවිභාගය කළහ. හැම අටුවාඇදුරනුදු ධර්මකථිකයනුදු ඥානකථා වර්ණනා කරනුයේ පටිසම්භිදාමග්ගයෙහි වදාළ දහම්නය ඇසුරු කොටගෙන ය. එය අටුවාවකැ'යි කියනු නොදැනීමෙනි.

අනෙකකුදු විමසත් හොත් සත්‍යකථාදෙශනාවට පැමිණි මහතෙරණුවෝ සංයුත්සඟියෙහි සච්චසංයුත්තයට අයත් ධම්මචක්කප්පවත්තන වර්ගයේ දසවැනි සූත්‍රය උද්දෙස කොට හෙවත් මාතෘකා වශයෙන් තබා සියුසස් පිළිබඳ තථ අවිතථ අනඤ්ඤථ වූ ෂොඩශාර්ථය ද චතුස්සත්‍යය මාර්ගඥානයෙන් එක්වට ප්‍රතිවෙධ වන සැටි ද සත්‍යයන් පිළිබඳ ලක්ෂණාදි ප්‍රභෙදයන් ද නිද්දෙස කොට වදාළහ.

යළි ඛන්ධසංයුත්තයෙහි භාරවග්ගයේ පස්වැනි සූත්‍රය උද්දෙස කොට පඤ්චුපාදානක්ඛන්ධ - ද්වාදශායතනයන්ගේ වශයෙන් චතුස්සත්‍යය විවිධාකාරයෙන් ප්‍රභේද කොට වදාළහ. මෙසේ බලන් මැ පටිසම්භිදාමග්ගය අටුවාවක් නොව ශ්‍රොතෘජනයනට ඥානප්‍රභේද දනවනු සඳහා කරනලද ධර්මවිභාගයක් බව මැනැවින් දත හැකි ය.

## පරිවාර ග්‍රන්ථ

ත්‍රිපිටකයෙහි සඞ්ගීතිත්‍රයට නැඟීගිය අර්ථකථාව ද සියලු ආචාර්යවාදයනුදු මහාමහින්ද මහරහතුන් වහන්සේ ලක්දිවැ සිංහල අතැවැසියනට උගන්වාලූබව ශාසන ඉතිහාසයෙහි එයි. මඳකලක් ඉක්මැ යත් මැ එ හැම අටුවා හෙළබසින් තබා ලූ බව ද සඳහන් වෙයි. නිකායාන්තර සංකලනය නොවනු සඳහා යි. අටුවාඇදුරු බුදුගොස් මහතෙරණුවෝ මහානාම රජු දවස හෙළටුවා බොහෝ ගණනක් මගධභාෂාවට පරිවර්තන කළහ. පටිසම්භිදාමග්ගයට ද මිහිඳු අතවැසියන් ලියාතැබූ යම් හෙළටුවාවක් වී නම් එය මාගධියට නැඟී මෙකල **සද්ධම්මප්පකාසනී** යන නාමයෙන් දක්නට ලැබේ. එය කුමාරධාතුසෙන රජුගේ රාජ්‍යොදයෙන් තුන් වැන්නෙහි (ක්‍රි: ව: 510) **මහානාම නම්** තෙරකෙනකුන් විසින් ලියන ලද්දේය. ධාතුසේන (ක්‍රි: ව: 459-477) රජතුමාගේ මයිලණුවන් වූ මහානාම තෙරණුවෝ ම පටිසම්භිදාමග්ගඅටුවාවේ කතුවරයෝ වූහයි සලකනු ලැබෙත්. මේ අටුවාව පටිසම්භිදාමග්ගයේ අර්ථාවබොධයට මිණිපහනක් බඳු ඉතා ව්‍යක්ත වූ කෘතියකි.

තවද පැරකුම් මහරජුගේ ධර්මාගාරයෙහි නියුක්ත වූ පාලිථූපවංශ කර්තෘක **වාචිස්සර** තෙරණුවන් විසින් පටිසම්භිදාමග්ගයට සිංහලයෙන් ලීනාර්ථවර්ණනාවක් ලියූ බව ථූපවංස නිගමනයෙහි සඳහන් වෙයි. ඒ පොත මේ තාක් පළවූයේ නොවේ. අනුරාධපුර මහාවිහාරවාසී තෙරකෙනකුන් ලියූ ගණ්ඨිපදයකුදු ඇත. මුද්‍රණයෙන් පළවී ඇති මේ ග්‍රන්ථය ව්‍යක්ත රචනාවකැයි කිව නොහේ.

## පටිසම්භිදාමග්ගපාඨාන්තර

වළගම්බා රාජ්‍යසමයෙහි ඇතිවූ ද්‍රවිඩවිප්ලවය ද බ්‍රාහමණතීය දුර්භික්ෂය ද නිමිත්ත කොට මාතලේ අලුලෙණැ රැස්වූ ත්‍රිපිටකධර පන්සියක් මහරහතුන් විසින් ලෙඛන සංගීතිය සිදු කළ බව කියනලද්දේ ය. ලෙඛනය ආරම්භ වත් ම අනවධානය හෙතු කොටගෙන ලෙඛකයන් අතින් විවිධ පාඨයන්ගේ බැසැගැනීම අනිවාර්ය විය. දෙශාන්තර වශයෙන් ද ආචාර්යමත විසින් ද පාඨාන්තරපතනය විය. එහෙයින් ශොධනයෙහි දී මූලපාඨය නිශ්චය කර ගැනීම ආයාසකර විය. එහි දී අර්ථ කථාව ද ත්‍රිපිටකයේ සූත්‍රාන්තරයන් ද ඇසුරු කෙරෙමින් ශුද්ධපාඨය නඟාගත් සැටි පිටුවක් පාසා සඳහන් කළ පාඨාන්තරයන්ගෙන් දත හැකි ය. තවද ලෙඛන අවස්ථායෙහි හෙළ ඇදුරන් විසින් එකල පැවැති හෙළවහරට අනුරූප කොට ලියා තැබූ අතිරෙකපාඨ තුබූ බව පෙනේ, මැදුම් සඟියේ මූලපරියායසූත්‍ර ආදියෙහි මෙනි, විදෙශික ආචාර්යවරයන් විසින් එබඳු පාඨ බෙහෙවින් පෙළබසට නඟා විකෘත කොට ඇත ද ලක්දිව පැරණි පිටපත්හි කලතුරෙකින් ශෙෂ වැ ඇත, පටිසම්භිදාමග්ග, පැරණි පිටපතෙක දක්නට ලැබුණු එක් මැ පාඨය ''පරිපුණ්ණනිදානි'' (ද්විතීයභාගය 20 විට) යී එසෙයින් ම තබාලූම්හ.

ශ්‍රී ලඞ්කාණ්ඩුවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් සිදුවෙන ත්‍රිපිටක සිංහල පරිවර්තනකාර්යය වූ කලී ඉක්මැගිය දෙවාදහස්කාලය තුළ සිදුකරනලද අද්විතීය වූ ධර්මශාස්ත්‍රීය සේවාවකි. ශ්‍රද්ධාසම්පන්න සාධූන්ගේ ධර්මඥානය හා ස්වභාෂාඥානය හා අපේක්‍ෂා කොට ලියනලද පටිසම්භිදාමග්ග ව්‍යාඛ්‍යානය ලොවට වැඩ සිදුකෙරේවා’යි ද මෙ ම අධිකාරයෙහි නියුක්ත වූ හැම සාධූනට නිවන්සුව ලැබේවා’යි ද ආශංසනය කරම්හ.

ලබුගම ලඞ්කානන්ද
අනුනායකස්ථවිර.

20. 12. 71
ප්‍රවචනෝදය පිරිවෙන.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එe ඔo

## CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කka | ඛkha | ගga | ඝgha | ඞṅa | | |
| | චca | ඡcha | ජja | ඣjha | ඤña | | |
| | ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa | | |
| | තta | ථtha | දda | ධdha | නna | | |
| | පpa | ඵpha | බba | භbha | මma | | |
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙke | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhe | ඛොkhō |
| ගga | ගාgā | ගිgi | ගීgī | ගුgu | ගූgū | ගෙge | ගොgō |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්කkka | ඤ්ඤñña | ත්‍රtra | ම්ඵmpha |
| ක්ඛkkha | ණ්හṇha | ද්දdda | ම්බ,ඹmba |
| ක්‍යkya | ඤ්චñca | ද්ධddha | ම්භmbha |
| ක්‍රිkri | ඤ්ඡ,ඦñcha | ද්‍රdra | ම්මmma |
| ක්වkva | ඤ්ජ,ඦñja | ද්ව,ද්වdva | ම්හmha |
| ඛ්‍යkhya | ඤ්ඣñjha | ධ්වdhva | ය්‍ය,ය්යyya |
| ඛ්වkhva | ට්ටṭṭa | න්තnta | ය්හyha |
| ග්ගgga | ට්ඨ,ඨṭṭha | න්ථntha | ල්ලlla |
| ග්ඝggha | ඩ්ඩḍḍa | න්දnda | ල්‍යlya |
| ඞ්ක ṅka | ඩ්ඪḍḍha | න්ධndha | ල්හlha |
| ග්‍රgra | ණ්ණṇṇa | න්නnna | ව්හwha |
| ඞ්ඛṅkh | ණ්ටṇṭa | න්හnha | ස්සssa |
| ඞ්ගṅga | ණ්ඨṇṭha | ප්පppa | ස්මsma |
| ඞ්ඝṅgha | ණ්ඩ,ඬṇḍa | ප්ඵppha | ස්වsva |
| ච්චcca | ණ්හṇha | බ්බbba | හ්මhma |
| ච්ඡccha | ත්තtta | බ්භbbha | හ්වhva |
| ජ්ජjja | ත්ථttha | බ්‍රbra | ළ්හḷha |
| ජ්ඣjjha | ත්වtva | ම්පmpa | |

ා ā ි i ී ī ු ූ u ු ූ ū ෙ e ො ō

# සඞ්කෙතනිරූපණය

## ABBREVIATIONS

සී. 1. — පච්චනොදය පොත්ථකාලය - තාලපණ්ණපොත්ථකං

සී. 2. — සිරිසිද්ධත්ථාරාමපොත්ථකාලය - තාලපණ්ණපොත්ථකං

සී. 3. — 'පැල්මඩුල්ල' මහාවිහාරපොත්ථකාලය - තාලපණ්ණ-පොත්ථකං.

මජසං — මරම්මඡට්ඨසඞ්ගීතියා සොධිතපටිසම්භිදාමග්ගො.

ස්‍යා. — ස්‍යාම - තායඅක්ඛරමුද්දිත පටිසම්භිදාමග්ගො.

PTS. — Pali Text Society - Patisaṁbhidāmagga

සං — මුද්දිතසංයුත්තනිකායපාළි.

අනි — මුද්දිතඅඞ්ගුත්තරනිකායපාළි.

ස — සද්ධම්මප්පකාසිනී - පටිසම්භිදාමග්ගට්ඨකථා.

වි — විසුද්ධිමග්ගො.

පු — අට්ඨකථාගතානි - පොරාණකපාඨන්තරානි.

# ඛුද්දකනිකායො

## තෙරසමො භාගො – විසයසූචි

### මහාවග්ග


| විසයො | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|
| 1. ඤාණකථා | | ... | 2–249 |
| මාතිකා | ... | ... | 2– 9 |
| 1. සුතමයඤාණ | ... | ... | 10– 79 |
| 2. සීලමයඤාණ | ... | ... | 80– 91 |
| 3. සමාධිභාවනාමයඤාණ | ... | ... | 91– 95 |
| 4. ධම්මට්ඨිතිඤාණ | ... | ... | 94–101 |
| 5. සම්මසනඤාණ | ... | ... | 100–103 |
| 6. උදයබ්බයඤාණ | ... | ... | 104–109 |
| 7. භඞ්ගානුපස්සනාඤාණ | ... | ... | 108–111 |
| 8. ආදීනවඤාණ | ... | ... | 112–115 |
| 9. මුඤ්චිතුකම්‍යතාඤාණ | ... | ... | 114–125 |
| 10. ගොත්‍රභූඤාණ | ... | ... | 124–129 |
| 11. මග්ගඤාණ | ... | ... | 128–133 |
| 12. ඵලඤාණ | ... | ... | 132–137 |
| 13. විමුත්තිඤාණ | ... | ... | 136–139 |
| 14. පච්චවෙක්ඛණඤාණ | ... | ... | 138–143 |
| 15. වත්ථුනානත්තඤාණ | ... | ... | 142–147 |
| 16. ගොචරනානත්තඤාණ | ... | ... | 148 158 |
| 17. චරියානානත්තඤාණ | ... | ... | 152–159 |
| 18. භූමිනානත්තඤාණ | ... | ... | 160–161 |
| 19. ධම්මනානත්තඤාණ | ... | ... | 162–167 |
| 20–24. ඤාණපඤ්චක | ... | ... | 166–167 |
| 25-28. පටිසම්භිදාඤාණ | ... | ... | 168–175 |
| 29–31. ඤාණත්තය | ... | ... | 174–179 |
| 32. ආනන්තරිකසමාධිඤාණ | ... | ... | 180–183 |
| 33. අරණවිහාරඤාණ | ... | ... | 184–185 |
| 34. නිරොධසමාපත්තිඤාණ | ... | ... | 186–191 |
| 35. පරිනිබ්බානඤාණ | ... | ... | 190–193 |
| 36. සමසීසට්ඨඤාණ | ... | ... | 192–195 |
| 37. සල්ලෙඛට්ඨඤාණ | ... | ... | 194–197 |
| 38. විරියාරම්භඤාණ | ... | ... | 196–197 |
| 39. අත්ථසන්දස්සනඤාණ | ... | ... | 198-199 |
| 40. දස්සනවිසුද්ධිඤාණ | ... | ... | 198–201 |
| 41. ඛන්තිඤාණ | ... | ... | 200–201 |
| 42. පරියොගාහඤාණ | ... | ... | 202–203 |
| 43. පදෙසවිහාරඤාණ | ... | ... | 202–203 |
| 44 49. විවට්ටඤාණඡක්ක | ... | ... | 204–209 |
| 50. ඉද්ධිවිධඤාණ | ... | ... | 210–211 |

| විසයා | | පිට්ඨඞ්කානි |
|---|---|---|
| 51. | සොතධාතුවිසුද්ධිඤාණ | 212-213 |
| 52. | චෙතොපරියඤාණ | 212-215 |
| 53. | පුබ්බෙනිවාසානුස්සතිඤාණ | 214-215 |
| 54. | දිබ්බචක්ඛුඤාණ | 216-217 |
| 55. | ආසවක්ඛයඤාණ | 218-221 |
| 56-63. | සච්චඤාණචතුක්කද්වය | 222-223 |
| 64-67. | සුද්ධිකපටිසම්භිදාඤාණ | 224-227 |
| 68. | ඉන්ද්‍රියපරොපරියත්තඤාණ | 226-231 |
| 69. | ආසයානුසයඤාණ | 230-233 |
| 70. | යමකපාටිහීරඤාණ | 234-235 |
| 71. | මහාකරුණාසමාපත්තිඤාණ | 236-243 |
| 72-73 | සබ්බඤ්ඤුත-අනාවරණඤාණ | 242-249 |

**2. දිට්ඨිකථා ... 250-307**

| | | |
|---|---|---|
| | දිට්ඨිපුච්ඡා | 250-261 |
| 1. | අස්සාදදිට්ඨි | 262-267 |
| 2. | අත්තානුදිට්ඨි | 266-281 |
| 3. | මිච්ඡාදිට්ඨි | 282-283 |
| 4. | සක්කායදිට්ඨි | 282-283 |
| 5. | සක්කායවත්ථුකාසස්සතදිට්ඨි | 284-285 |
| 6. | සක්කායවත්ථුකාඋච්ඡෙදදිට්ඨි | 284-285 |
| 7. | අන්තග්ගාහිකාදිට්ඨි | 286-295 |
| 8. | පුබ්බන්තානුදිට්ඨි | 294-295 |
| 9. | අපරන්තානුදිට්ඨි | 294-295 |
| 10. | සංයොජනිකාදිට්ඨි | 294-296 |
| 11 | අහන්තිමානවිනිබන්ධාදිට්ඨි | 296-297 |
| 12. | මමන්තිමානවිනිබන්ධාදිට්ඨි | 286-297 |
| 13. | අත්තවාදපටිසංයුත්තාදිට්ඨි | 298-299 |
| 14. | ලොකවාදපටිසංයුත්තාදිට්ඨි | 298-299 |
| 15-16. | භවදිට්ඨි-විභවදිට්ඨි | 300-307 |

**3. ආනාපානසතිකථා ... 308-377**

| | | |
|---|---|---|
| 1. | ගණනුද්දෙස | 308-309 |
| 2. | පරිපන්ථ-උපකාරසොළසඤාණ | 308-311 |
| 3. | උපක්කිලෙසඤාණ | 310-317 |
| 4. | වොදානඤාණ | 316-331 |
| 5. | සතොකාරිඤාණ | 330-373 |
| 6-11. | ඤාණරාසිඡක්ක | 374-377 |

| විසයා | | පිටඞ්කානි |
|---|---|---|
| 4. ඉන්ද්‍රියකථා | ... | 378-485 |
| 1. පඨමසුත්ත | ... ... | 378-383 |
| 2. දුතියසුත්ත | ... ... | 382-401 |
| 3. තතියසුත්ත | ... ... | 400-413 |
| 4. චතුත්ථසුත්ත | ... ... | 412-423 |
| ඉන්ද්‍රියසමෝධානය | ... ... | 422-435 |
| 5. විමොක්ඛකථා | ... | 436-495 |
| 6. ගතිකථා | ... | 496-503 |
| 7. කම්මකථා | ... | 504-505 |
| 8. විපල්ලාසකථා | ... | 506-509 |
| 9. මග්ගකථා | ... | 508-513 |
| 10. මණ්ඩපෙය්‍යකථා | ... | 513-521 |
| ගාථාදිපාදනුක්කමණිකා | ... ... | 523 |
| විසෙසපදනුක්කමණිකා | ... ... | 524-529 |

# සුත්තන්තපිටකෙ

# පටිසම්භිදාමග්ගො

## පඨමො භාගො

# සූත්‍රාන්තපිටකයෙහි

# පටිසම්භිදාමාර්ගය

## ප්‍රථම භාගය

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

# පටිසම්භිදාමග්ගො

## 1. පඨමො පණ්ණාසකො

## 1. මහාවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

### මාතිකා

1. සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං.

2. සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං.

3. සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං.

4. පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං.

5. අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

6. පච්චුප්පන්නානං ධම්මානං විපරිනාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානු-පස්සනෙ ඤාණං.

7. ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං.

8 භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

9. මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

10. බහිද්ධා වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභු ඤාණං.

11. දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

12. පයොගපටිප්පස්සද්ධි පඤ්ඤා ඵලෙ ඤාණං.

13. ඡින්නවට්ටමනුපස්සනෙ[1] පඤ්ඤා විමුත්ති ඤාණං.

---

ඡින්නවච්චුමානුපස්සනෙ—මජසං. ඡින්නමනුපස්සනෙ—සයා PTS

සූත්‍රාන්තපිටකයෙහි

## කුදුගත්සඟිය

# පටිසම්භිදාමාර්ගය

### 1. ප්‍රථම පණ්ණාසකය

### 1. මහාවර්ගය

**ඒ භගවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

**මාතෘකා**

1. ශ්‍රොත්‍රද්වාරානුසාරයෙන් දත්නාලද ධර්මජාතයෙහි (ශ්‍රැතියෙහි) පැවැති ප්‍රඥාව ශ්‍රැතමයඥාන යැ.

2. ශ්‍රවණය කොට (ශ්‍රවණ හෙතුයෙන්) සංවරයෙහි පැවැති ප්‍රඥාව ශීලමයඥාන යැ.

3. ශීලයෙන් සංවෘත වැ සිත එකඟ කිරීමෙහි පැවැති ප්‍රඥාව සමාධිභාවනාමයඥාන යැ.

4. ප්‍රත්‍යයධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යැ.

5. අතීතානාගතප්‍රත්‍යුත්පන්න (පඤ්චස්කන්ධ) ධර්මයන් (කලාප විසින්) රැස් කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ.

6. ප්‍රත්‍යුත්පන්න වූ ස්කන්ධධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනඥාන යැ.

7. රූපාදි ආලම්බනය ප්‍රත්‍යවෙක්ෂා කොට භඞ්ගවශයෙන් දැකීමෙහි ප්‍රඥාව විදර්ශනාඥාන යැ.

8. උත්පාදාදිය භය වශයෙන් වැටහීමෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ.

9. (උත්පාදාදිය) මුදලන්නට කැමැති බව ද ප්‍රත්‍යවෙක්ෂාව ද අධ්‍යු-පෙක්ෂණය ද යන (ත්‍රිවිධ) ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යැ.

10. සංස්කාර නිමිත්තෙන් නැඟී සිටුනා එයට පරාඞ්මුඛ වීමෙහි ප්‍රඥාව ගොත්‍රභූඥාන යැ.

11. (කෙලෙසුන් කෙරෙන් ද, තදනුවර්තක ස්කන්ධයන් කෙරෙන් ද යන) දෙකින් නැඟී සිටුනා එයට පරාඞ්මුඛ වීමෙහි ප්‍රඥාව මාර්ගඥාන යැ.

12. (උභතොවුට්ඨානයෙහි) ප්‍රයොගයාගේ නිෂ්ඨාව (සතර මාර්ගකෘත්‍ය පර්‍ය්‍යවසානය) ට හෙතු වූ ප්‍රඥාව ඵලඥාන යැ.

13. ඒ ඒ මාර්ගයෙන් සිඳුණු කෙලෙස්වට ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි ප්‍රඥාව විමුක්තිඥාන යැ.

14. තදා සමුදාගතෙ[1] ධම්මෙ පස්සනෙ[2] පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං.

15. අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං.

16. බහිද්ධාවවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං.

17. චරියාවවත්ථානෙ[3] පඤ්ඤා චරියානානත්තෙ ඤාණං.

18. චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං.

19. නවධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං.

20. අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං.

21. පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං.

22. පහානෙ පඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං

23. භාවනාපඤ්ඤා එකරසට්ඨෙ ඤාණං.

24. සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ[4] ඤාණං.

25. අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං.

26. ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං.

27. නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං.

28. පටිභාන[5] නානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

29. විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං.

30. සමාපත්තිනානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං.

31. විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං.

32. අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමා-ධිස්මිං[6] ඤාණං.

33. දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං.

34. ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසිභාවතා[7] පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං.

35. සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං.

36. සබ්බධම්මානං සම්මා සමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං.

37. පුථුනානත්තතෙජපරියාදානෙ[8] පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං.

---

1. සමුපාගතෙ—සයා.
2. විපස්සනෙ—PTS. 3 චරියවවත්ථානෙ—පු.
4. ඵස්සනට්ඨෙ—මජසං, සයා. 5 පටිභාණ—සයා. 6 සමාධිම්හි—මජසං, සයා
7. වසීභාවතා—පු 8 නානත්තතෙපරියාදානෙ— සී 1, නානත්තතෙජපරියාදානෙ—සී 2.

14. ඒ මාර්ගඵලක්ෂණයෙහි (ප්‍රතිලාභප්‍රතිවෙධ වශයෙන්) පැමිණි (මාර්ගඵල චතුස්සත්‍ය) ධර්මයන් දක්නා ප්‍රඥාව ප්‍රත්‍යවෙක්ෂාඥාන යෑ.

15. අධ්‍යාත්ම(ආධ්‍යාත්මිකෂඩායතන)යන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව වස්තු-නානාත්වඥාන යෑ.

16. බාහිරවිෂයයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ගොචරනානාත්වඥාන යෑ.

17. (විඥානචර්යාදි වශයෙන්) චර්යාවන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව චර්යානා-නාත්වඥාන යෑ.

18. සතර සතර ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව භූමිනානාත්වඥාන යෑ.

19. නව නව ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධර්මනානාත්වඥාන යෑ.

20. අභිඥාප්‍රඥාව ඥාතාර්ථ (ජානන සවභාව) ඥාන යෑ.

21. පරිඥාප්‍රඥාව තීරණාර්ථඥාන යෑ.

22. ප්‍රහාණප්‍රඥාව පරිත්‍යාගාර්ථඥාන යෑ.

23. භාවනා ප්‍රඥාව එකරසාර්ථඥාන යෑ.

24. (ප්‍රතිවෙධ ප්‍රතිලාභ වශයෙන්) සාක්ෂාත් කරන ප්‍රඥාව ස්පර්ශනානාර්ථ ඥාන යෑ.

25. අර්ථනානාත්වයෙහි ප්‍රඥාව අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ.

26. ධර්මනානාත්වයෙහි ප්‍රඥාව ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ.

27. නිරුක්තිනානාත්වයෙහි ප්‍රඥාව නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ.

28. ප්‍රතිභානනානාත්වයෙහි ප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යෑ.

29. (අනිත්‍යානුදර්ශනාදි) විහාරනානාත්වයෙහි ප්‍රඥාව විහාරාර්ථඥාන යෑ.

30. සමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව සමාපත්ත්‍යර්ථඥාන යෑ.

31. විහාරසමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව විහාරසමාපත්ත්‍යර්ථඥාන යෑ.

32. අවික්ෂෙපපරිශුද්ධභාවයෙන් කාමාදි ආස්‍රවයන්ගේ සමුච්ඡේදයෙහි ප්‍රඥාව ආනන්තරික (මාර්ග) සමාධිඥාන යෑ.

33. දර්ශනාධිපතිභාවය ද, ශාන්තවිහාරාධිගමය ද, ප්‍රණීතාධිමුක්තතා ද යන (ත්‍රිවිධ) ප්‍රඥාව අරණවිහාරඥාන යෑ.

34. ශමථවිදර්ශනා යන බල දෙකින් සමන්‍වාගත බැවින් (වාචාදි) තුන් සංස්කාරයන්ගේ ද නිරුද්ධ කිරීමෙන් ෂොඩශඥානචර්යායෙන් නව-සමාධිචර්යායෙන් වශීභාවය ඇති ප්‍රඥාව නිරොධසමාපත්තිඥාන යෑ.

35. සම්‍යග්ඥාන ඇත්තහුගේ ක්ලෙශ-සකන්ධප්‍රවෘත්ති ක්ෂය කිරීමෙහි ප්‍රඥාව පරිනිර්වාණඥාන යෑ.

36. සියලු ත්‍රෛභූමක ධර්මයන් මොනොවට නිරුද්ධ කිරීමෙහි ද නිරුද්ධ කළ කල්හි නැවත නො ඉපදීමෙහි ද ප්‍රඥාව සමශීර්ෂාර්ථඥාන යෑ.

37. පෘථග්රාගයන්ගේ ද කාමච්ඡන්දාදීන්ගේ ද දුශ්ශිල්‍යාදීන්ගේ ද ක්ෂය කිරීමෙහි ප්‍රඥාව සල්ලෙඛාර්ථඥාන යෑ.

38. අසල්ලීනත්ත පහිතත්ත-පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං.

39. නානාධම්මපකාසනතා[1] පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං.

40. සබ්බධම්මානං එකසඞ්ගහතානානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සන-විසුද්ධිඤාණං

41. විදිතත්තා පඤ්ඤා ඛන්ති ඤාණං.

42. ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ[2] ඤාණං.

43. සමොදහනෙ[3] පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං.

44. අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං.

45. නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං.

46. අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං.

47. සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං.

48. වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං.

49. තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං.

50. කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං.

51. විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්ත සද්දනිමිත්තානං පරියොගාහනෙ[2] පඤ්ඤා සොතධාතුවිසුද්ධිඤාණං.

52. තිණ්ණං[4] චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියාපරියොගාහනෙ පඤ්ඤා චෙතොපරියඤාණං.

53. පච්චයප්පවත්තානං ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහනෙ[2] පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සති ඤාණං.

54. ඔභාසවසෙන නානත්තෙකත්තරූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං.

55. චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසිභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං.

56. පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං.

57. පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං.

---

1 ධම්මප්පකාසනතා—සයා, මජසං. 2 පරියොගාහණෙ—මජසං

3 සමොධානෙ—පු 4 තිණ්ණන්නං—මජසං

38. නො හැකුළුණු සිත් ඇති (කායජීවිතනිරපෙක්ෂක වැ) නිවනට
මෙහෙයූ ආත්මභාව ඇත්තහුගේ ප්‍රග්‍රහාර්ථයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ.

39. නානාධර්මයන් ප්‍රකාශ කරන ප්‍රඥාව අර්ථසන්දර්ශන ඥාන යැ.

40. සියලු සඞ්ඛතාසඞ්ඛත ධර්මයන්ගේ එකත්වයෙන් සඞ්ග්‍රහ කිරීම ද
කාමච්ඡන්දාදීන්ගේ නානාත්වය ද නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ එකත්වය ද
ප්‍රතිවෙධ කිරීමෙහි ප්‍රඥාව දර්ශනවිශුද්ධිඥාන යැ.

41. රූපස්කන්ධාදිය අනිත්‍යාදි වශයෙන් විදිතභාවයෙන් පැවැති ප්‍රඥාව
ක්ෂාන්තිඥාන යැ.

42. (රූපස්කන්ධාදිය අනිත්‍යාදි වශයෙන් ඥානස්පර්ශයෙන්) ස්පර්ශ කළ
බැවින් පැවැති ප්‍රඥාව පර්‍ය්‍යවගාහනඥාන යැ.

43. (ස්කන්ධාදීන්ගේ එකදෙශ වූ වෙදනාධර්මය) පිඬු කරන ප්‍රඥාව ප්‍රදෙශ-
විහාරඥාන යැ.

44. (නෛෂ්ක්‍රම්‍යාදිය) අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන යැ.

45. නානාස්වභාවයෙහි පැවැති ප්‍රඥාව චෙතොවිවර්තඥාන යැ.

46. (නෛෂ්ක්‍රම්‍යාදි වශයෙන් සිත) පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ.

47. ශූන්‍යත (අනාත්මානුදර්ශන) ප්‍රඥාව ඥානවිවර්තඥාන යැ.

48. කාමච්ඡන්දාදිය දුරලීමෙහි පැවැති ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන යැ.

49. (චතුස්සත්‍යයාගේ) අවිපරීතභාවයෙහි පැවැති ප්‍රඥාව සත්‍යවිවර්ත
ඥාන යැ.

50. රූපකාය ද පාදකධ්‍යානචිත්තය ද (පරිකර්මචිත්තයෙන්) එක් කොට
තැබීමෙන් සුඛසංඥාව ද ලඝුසංඥාව ද අධිෂ්ඨාන වශයෙන් සමෘද්ධ
වන ප්‍රඥාව ඍද්ධිවිධඥාන යැ.

51. විතර්කවිස්ඵාර වශයෙන් නානාත්ව වූ ද එකත්ව වූ ද ශබ්දනිමිත්තයන්ට
බැසගැනීමෙහි (දැනගන්නා) ප්‍රඥාව ශ්‍රොත්‍රධාතුවිශුද්ධිඥාන යැ.

52. (සොමනස්සසහගතාදි) ත්‍රිවිධ චිත්තයන්ගේ වෙගය හෙතු කොට
ගෙන ඉන්ද්‍රියයන්ගේ ප්‍රසාදවශයෙන් නානාස්වභාව එකස්වභාව වූ
එකුන්අනූචිත්තයාගේ පැවැත්ම දන්නා ප්‍රඥාව චෙතොපර්‍ය්‍යඥාන යැ.

53. ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ නානාත්ව එකත්ව කර්මවෙග වශයෙන්
දැනගැනීමෙහි ප්‍රඥාව පූර්වනිවාසානුස්මෘතිඥාන යැ.

54. කසිණොභාස වශයෙන් නානාස්වභාව එකස්වභාව වර්ණායතනය
දක්නා ස්වභාව වූ ප්‍රඥාව දිව්‍යචක්ෂුර්ඥාන යැ.

55. සූසැට අයුරින් (අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි) තුන් ඉන්ද්‍රියයන්ගේ
වශීභාවයෙන් පැවැති ප්‍රඥාව ආශ්‍රවක්ෂයඥාන යැ.

56. (දුඃඛයාගේ පීඩනාදි චතුර්විධ අර්ථයන්) පරිඥෙයස්වභාවයෙහි ප්‍රඥාව
දුඃඛඥාන යැ.

57. (සමුදයාගේ ආයූහනාර්ථාදිය) ප්‍රහාතව්‍යස්වභාවයෙහි ප්‍රඥාව සමුදය
ඥාන යැ.

58. සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං.

59. භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

60. දුක්ඛෙ ඤාණං.

61. දුක්ඛසමුදයෙ ඤාණං.

62. දුක්ඛනිරොධෙ ඤාණං.

63. දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

64. අත්ථපටිසම්භිදෙ ඤාණං.

65. ධම්මපටිසම්භිදෙ ඤාණං.

66. නිරුත්තිපටිසම්භිදෙ ඤාණං.

67. පටිභානපටිසම්භිදෙ ඤාණං.

68 ඉන්ද්‍රියපරොපරියත්තඤාණං.[1]

69 සත්තානං ආසයානුසයෙ ඤාණං.

70. යමකපාටිහීරෙ ඤාණං.

71. මහාකරුණාසමාපත්තියා ඤාණං.

72. සබ්බඤ්ඤුතඤාණං.

73. අනාවරණඤාණං.

ඉමානි තෙසත්තති ඤාණානි. ඉමෙසං තෙසත්තතියා[2] ඤාණානං සත්තසට්ඨි ඤාණානි සාවකසාධාරණානි. ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි.[3]

## මාතිකා නිට්ඨිතා.

1. ඉන්ද්‍රියවරොවරියත්තඤාණං—පු. ඉන්ද්‍රියපරොපරියත්තඤාණං—පු, මජසං, සයා, PTS, සී 1, 2, 3.
2. තෙසත්තතීනං - PTS.
3 සාවකෙහීති - සයා.

58. (නිරෝධයාගේ නිඃසරණාර්ථාදිය) සාක්ෂාත්කර්තව්‍ය ස්වභාවයෙහි ප්‍රඥාව නිරෝධඥාන යෑ.

59. (මාර්ගයාගේ නිර්යාණාර්ථාදිය) භාවිතව්‍ය ස්වභාවයෙහි ප්‍රඥාව මාර්ගඥාන යෑ.

60. දුඃඛසත්‍යඥාන යෑ.

61. දුඃඛසමුදයසත්‍යඥාන යෑ

62. දුඃඛනිරොධසත්‍යඥාන යෑ.

63. දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදා සත්‍යඥාන යෑ

64. අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ.

65. ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ.

66. නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ.

67. ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යෑ.

68. (සත්ත්වයන්ගේ) ඉන්ද්‍රියපරාවරතාඥාන යෑ

69. සත්ත්වයන්ගේ ආශයානුශයඥාන යෑ.

70. යමකප්‍රාතිහාර්යඥාන යෑ.

71. මහාකරුණාසමාපත්තිඥාන යෑ.

72. සර්වඥතාඥාන යෑ.

73. අනාවරණඥාන යෑ.

මොහු තෙසැත්තෑ ඥානයෝ යි. මේ තෙසැත්තෑ ඥානයන් කෙරෙහි සත්සැට ඥානයෙක් ශ්‍රාවකයන් හා සාධාරණ යෑ. සනුවණෙක් ශ්‍රාවකයන් හා අසාධාරණ යි.

**මාතෘකා නිමි.**

# ඤාණකථා.

## 1. සුතමයඤාණං

1. කථං සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං:

‘ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා පහාතබ්බා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා භාවෙතබ්බා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා හානභාගියා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා ඨිතිභාගියා’ති සොතාවධානං, තංජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා විසෙසභාගියා’ති සොතාවධානං, තංජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති සොතාවධානං, තංපාජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘සබ්බෙ ධම්මා අනත්තා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉදං දුක්ඛං අරියසච්ච’න්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉදං දුක්ඛසමුදයො[1] අරියසච්ච’න්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

---
1 දුක්ඛසමුදයං—මජසං

# ඥනකථා

## 1. ශ්‍රැතමයඥනය

**1.** කිසෙයින් ශ්‍රොත්‍රාවධානයෙහි (අසන ලද්දෙහි) ප්‍රඥව ශ්‍රැතමයඥන වෙයි යත්:

'මේ ධර්මයෝ (ස්වභාව ලක්‍ෂණාවබොධ වශයෙන්) මැනැවින් දතයුත්-තාහ'යි (දෙසන්නහුගේ ධර්මය) සොතාවධාන යැ හෙවත් ශ්‍රැතය යි. ඒ ශ්‍රැතය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ (සාමාන්‍ය ලක්‍ෂණාවබොධ වශයෙන්) පිරිසිඳ දතයුත්-තාහ'යි (දෙසන්නහුගේ ධර්මය) සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ ප්‍රහාතව්‍යයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැන ගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ වැඩියයුත්තාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ ප්‍රත්‍යක්‍ෂ කළයුත්තාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ පරිහාණීය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ ස්ථිතිය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැන ගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ (මත්තෙහි විශෙෂාධිගම විසින්) විශෙෂය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ ධර්මයෝ ආර්‍ය්‍යමාර්ග සඞ්ඛ්‍යාත නිර්වේදය සෙවුනාහ' යනු සොතාව-ධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'සියලු සංසකාරයෝ අනිත්‍යයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'සියලු සංසකාරයෝ දුඃඛයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'සියලු ධර්මයෝ අනාත්මයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ දුඃඛාර්‍ය්‍යසත්‍ය යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

'මේ දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන යැ.

‘ඉදං දුක්ඛනිරොධො[1] අරියසච්ච’න්ති සොතාවධානං, තංජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

‘ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්ච’න්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

## (2)

කථං ‘ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො අභිඤ්ඤෙය්‍යො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා

ද්වෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා: ද්වෙ ධාතුයො.

තයො ධම්මා අභිඤ්ඤෙය්‍යා: තිස්සො ධාතුයො.

චත්තාරො ධම්මා අභිඤ්ඤෙය්‍යා: චත්තාරි අරියසච්චානි.

පඤ්ච ධම්මා අභිඤ්ඤෙය්‍යා: පඤ්ච විමුත්තායතනානි.

ඡ ධම්මා අභිඤ්ඤෙය්‍යා: ඡ අනුත්තරියානි.

සත්ත ධම්මා අභිඤ්ඤෙය්‍යා: සත්ත නිද්දසවත්ථූනි.

අට්ඨ ධම්මා අභිඤ්ඤෙය්‍යා: අට්ඨ අභිභායතනානි.

නව ධම්මා අභිඤ්ඤෙය්‍යා: නව අනුපුබ්බවිහාරා.

දස ධම්මා අභිඤ්ඤෙය්‍යා: දස නිජ්ජරවත්ථූනි.

## (3)

“සබ්බං භික්ඛවෙ, අභිඤ්ඤෙය්‍යං. කිඤ්ච භික්ඛවෙ, සබ්බං අභිඤ්ඤෙය්‍යං:

චක්ඛුං[2] භික්ඛවෙ, අභිඤ්ඤෙය්‍යං, රූපා අභිඤ්ඤෙය්‍යා, චක්ඛුවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, චක්ඛුසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, යම්පිදං[3] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අභිඤ්ඤෙය්‍යං.

සොතං අභිඤ්ඤෙය්‍යං, සද්දා අභිඤ්ඤෙය්‍යා -පෙ- ඝානං අභිඤ්ඤෙය්‍යං, ගන්ධා අභිඤ්ඤෙය්‍යා -පෙ- ජිව්හා අභිඤ්ඤෙය්‍යා, රසා අභිඤ්ඤෙය්‍යා -පෙ- කායො අභිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බා අභිඤ්ඤෙය්‍යා -පෙ- මනො අභිඤ්ඤෙය්‍යො, ධම්මා අභිඤ්ඤෙය්‍යා, මනොවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, මනොසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අභිඤ්ඤෙය්‍යං.[4]

රූපං අභිඤ්ඤෙය්‍යං, වෙදනා අභිඤ්ඤෙය්‍යා, සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං.

1 දුක්ඛනිරොධං—මජසං. 2 චක්ඛු—මජසං 3 යදිදං—PTS

4 වෙදනාසංයුත්ත—අභිවච්චගොත්ත චතුත්ථං

'මේ දුඃඛනිරෝධාර්යසත්‍ය යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්යසත්‍ය යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යි.

(2)

කිසෙයිත් මේ ධර්මයෝ අභිඥෙයහ' යි සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන වෙයි යත්:

එක් ධර්මයෙක් අභිඥෙය යැ: හැම සත්හු ආහාරයෙන් සිටුනාහ.

ධර්මයෝ දෙදෙනෙක් අභිඥෙයහ: සඞ්ඛතාසඞ්ඛතධාතුහු දෙදෙන යි.

ධර්මයෝ තිදෙනෙක් අභිඥෙයයෝ යැ: (කාමරූපාරූප යන) තුන් ධාතුහු යි.

ධර්මයෝ සතර දෙනෙක් අභිඥෙයයෝ යැ: චතුරාර්යසත්‍යයෝ යි.

ධර්මයෝ පස් දෙනෙක් අභිඥෙයයෝ යැ: පඤ්චවිමුක්තායතනයෝ යි.

ධර්මයෝ ස දෙනෙක් අභිඥෙයයෝ යැ: ෂඩානුත්තරියයෝ යි.

ධර්මයෝ සත් දෙනෙක් අභිඥෙයයෝ යැ: සප්තනිර්දශවස්තුහු යි.

ධර්මයෝ අට දෙනෙක් අභිඥෙයයෝ යැ: අෂ්ටඅභිභායතනයෝ යි.

ධර්මයෝ නව දෙනෙක් අභිඥෙයයෝ යැ: නව අනුපූර්වවිහාරයෝ යි.

ධර්මයෝ දශ දෙනෙක් අභිඥෙයයෝ යැ (සම්‍යග්දෘෂ්ටි ආදි) දශනිර්ජරවස්තුහු යි.

(3)

මහණෙනි, සියල්ල අභිඥෙය යැ. මහණෙනි, කවර සියල්ල අභිඥෙය වෙයි යත්:

මහණෙනි, ප්‍රසාදචක්ෂුස (අභිඥෙය) මැනැවින් දතයුතු යැ. රූපයෝ දතයුත්තාහ. චක්ෂුර්විඥානය දතයුතු යැ. චක්ඛුසම්ඵස්සය දතයුතු යැ. චක්ෂුර්විඥානය හා සම්ප්‍රයුක්ත වූ ස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් එ ද දතයුතු යි.

ශ්‍රොත්‍රප්‍රසාදය දතයුතු යැ. ශබ්දයෝ දතයුත්තාහ ... ඝ්‍රාණප්‍රසාදය දතයුතු යැ. ගන්ධයෝ දතයුත්තාහ ... ජිහ්වාප්‍රසාදය දතයුතු යැ රසයෝ දතයුත්තාහ. ... කායප්‍රසාදය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යයෝ දතයුත්තාහ. ... භවාඞ්ගමනස දතයුතු යැ. ධර්මාලම්බනයෝ දතයුත්තාහ. මනොවිඥානය දතයුතු ය. මනොසම්ඵස්සය දතයුතු යැ මනොසම්ඵස්සප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් එ ද දතයුතු යි."

රූපය දතයුතු යැ. වෙදනාව දතයුතු යැ. සංඥාව දතයුතු යැ. සංස්කාරයෝ දතයුත්තාහ. විඥානය දතයුතු යි.

චක්ඛුං අභිඤ්ඤෙය්‍යං, සොතං අභිඤ්ඤෙය්‍යං, ඝානං[1] අභිඤ්ඤෙය්‍යං, ජිව්හා අභිඤ්ඤෙය්‍යා, කායො අභිඤ්ඤෙය්‍යො, මනො අභිඤ්ඤෙය්‍යො.

රූපා අභිඤ්ඤෙය්‍යා, සද්දා අභිඤ්ඤෙය්‍යා, ගන්ධා අභිඤ්ඤෙය්‍යා, රසා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බා අභිඤ්ඤෙය්‍යා, ධම්මා අභිඤ්ඤෙය්‍යා.

චක්ඛුවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, සොතවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, ඝානවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, ජිව්හාවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, කායවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, මනොවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං.

චක්ඛුසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, සොතසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, ඝානසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, ජිව්හාසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, කායසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, මනොසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො.

චක්ඛුසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, සොතසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, ඝානසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, ජිව්හාසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, කායසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, මනොසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා.

රූපසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, සද්දසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, ගන්ධසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, රසසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, ධම්මසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා.

රූපසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, සද්දසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, ගන්ධසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, රසසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, ධම්මසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා.

රූපතණ්හා අභිඤ්ඤෙය්‍යා, සද්දතණ්හා අභිඤ්ඤෙය්‍යා, ගන්ධතණ්හා අභිඤ්ඤෙය්‍යා, රසතණ්හා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බතණ්හා අභිඤ්ඤෙය්‍යා, ධම්මතණ්හා අභිඤ්ඤෙය්‍යා.

රූපවිතක්කො අභිඤ්ඤෙය්‍යො, සද්දවිතක්කො අභිඤ්ඤෙය්‍යො, ගන්ධවිතක්කො අභිඤ්ඤෙය්‍යො, රසවිතක්කො අභිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බවිතක්කො අභිඤ්ඤෙය්‍යො, ධම්මවිතක්කො අභිඤ්ඤෙය්‍යො.

රූපවිචාරො අභිඤ්ඤෙය්‍යො, සද්දවිචාරො අභිඤ්ඤෙය්‍යො, ගන්ධවිචාරො අභිඤ්ඤෙය්‍යො, රසවිචාරො අභිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බවිචාරො අභිඤ්ඤෙය්‍යො, ධම්මවිචාරො අභිඤ්ඤෙය්‍යො.

පඨවීධාතු[2] අභිඤ්ඤෙය්‍යා, ආපොධාතු අභිඤ්ඤෙය්‍යා, තෙජොධාතු අභිඤ්ඤෙය්‍යා, වායොධාතු අභිඤ්ඤෙය්‍යා, ආකාසධාතු අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා.

පඨවීකසිණං[3] අභිඤ්ඤෙය්‍යං, ආපොකසිණං අභිඤ්ඤෙය්‍යං, තෙජොකසිණං අභිඤ්ඤෙය්‍යං වායොකසිණං අභිඤ්ඤෙය්‍යං, නීලකසිණං අභිඤ්ඤෙය්‍යං, පීතකසිණං අභිඤ්ඤෙය්‍යං, ලොහිතකසිණං අභිඤ්ඤෙය්‍යං, ඔදාතකසිණං අභිඤ්ඤෙය්‍යං, ආකාසකසිණං අභිඤ්ඤෙය්‍යං, විඤ්ඤාණකසිණං අභිඤ්ඤෙය්‍යං.

1 ඝාණං - මජසං  2 පඨවිධාතු - මජසං  3 පඨවිකසිණං - මජසං.

ප්‍රසාදචක්ෂුස දතයුතු යැ. ශ්‍රොත්‍රප්‍රසාදය දතයුතු යැ. ඝ්‍රාණප්‍රසාදය දතයුතු යැ. ජිහ්වාප්‍රසාදය දතයුතු යැ. කායප්‍රසාදය දතයුතු යැ. භවාඞ්ගමනස දතයුතු යැ. රූපයෝ දතයුත්තාහ. ශබ්දයෝ දතයුත්තාහ. ගන්ධයෝ දතයුත්තාහ. රසයෝ දතයුත්තාහ. ස්ප්‍රෂ්ටව්‍යයෝ දතයුත්තාහ. ධර්මාලම්බනයෝ දතයුත්තාහ.

චක්ෂුර්විඥනය දතයුතු යැ. ශ්‍රොත්‍රවිඥනය දතයුතු යැ. ඝ්‍රාණවිඥනය දතයුතු යැ. ජිහ්වාවිඥනය දතයුතු යැ. කායවිඥනය දතයුතු යැ. මනොවිඥනය දතයුතු යි.

චක්ඛුසම්ඵස්සය දතයුතු යැ. සොතසම්ඵස්සය දතයුතු යැ. ඝානසම්ඵස්සය දතයුතු යැ. ජිව්හාසම්ඵස්සය දතයුතු යැ. කායසම්ඵස්සය දතයුතු යැ. මනොසම්ඵස්සය දතයුතු යි.

චක්ෂුස්සංස්පර්ශයෙන් උපන් වෙදනාව දතයුතු යැ. ශ්‍රොත්‍රසංස්පර්ශයෙන් උපන් වෙදනාව දතයුතු යැ. ඝ්‍රාණසංස්පර්ශයෙන් උපන් වෙදනාව දතයුතු යැ. ජිහ්වාසංස්පර්ශයෙන් උපන් වෙදනාව දතයුතු ය. කායසංස්පර්ශයෙන් උපන් වෙදනාව දතයුතු යැ. මනස්සංස්පර්ශයෙන් උපන් වෙදනාව දතයුතු යි.

රූපසංඥව දතයුතු යැ. ශබ්දසංඥව දතයුතු යැ ගන්ධසංඥව දතයුතු යැ. රසසංඥව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යසංඥව දතයුතු යැ. ධර්මසංඥව දතයුතු යි.

රූපසඤ්චෙතනාව දතයුතු යැ. ශබ්දසඤ්චෙතනාව දතයුතු යැ. ගන්ධසඤ්චෙතනාව දතයුතු යැ. රසසඤ්චෙතනාව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යසඤ්චෙතනාව දතයුතු යැ. ධර්මසඤ්චෙතනාව දතයුතු යි.

රූපතෘෂ්ණාව දතයුතු යැ. ශබ්දතෘෂ්ණාව දතයුතු යැ. ගන්ධතෘෂ්ණාව දතයුතු යැ. රසතෘෂ්ණාව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව දතයුතු යැ ධර්මතෘෂ්ණාව දතයුතු යි.

රූපවිතර්කය දතයුතු යැ. ශබ්දවිතර්කය දතයුතු යැ. ගන්ධවිතර්කය දතයුතු යැ. රසවිතර්කය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යවිතර්කය දතයුතු යැ. ධර්මවිතර්කය දතයුතු යි.

රූපවිචාරය දතයුතු යැ. ශබ්දවිචාරය දතයුතු යැ. ගන්ධ චාරය දතයුතු යැ. රසවිචාරය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යවිචාරය දතයුතු යැ. ධර්මවිචාරය දතයුතු යි.

පෘථිවිධාතුව දතුයුතු යැ. අබ්ධාතුව දතයුතු යැ. තෙජෝධාතුව දතයුතු යැ. වායුධාතුව දතයුතු යැ. ආකාශධාතුව දතයුතු යැ. විඥනධාතුව දතයුතු යි.

පඨවිකසිණය දතයුතු යැ. ආපොකසිණය දතයුතු යැ. තෙජෝකසිණය දතයුතු යැ. වායොකසිණය දතයුතු යැ. නීලකසිණය දතයුතු යැ. පීතකසිණය දතයුතු යැ: ලොහිතකසිණය දතයුතු යැ. ඔදාතකසිණය දතයුතු යැ. ආකාසකසිණය දතයුතු යැ විඤ්ඤාණකසිණය දතයුතු යි.

කෙසා අභිඤ්ඤෙය්‍යා, ලොමා අභිඤ්ඤෙය්‍යා, නඛා අභිඤ්ඤෙය්‍යා, දන්තා අභිඤ්ඤෙය්‍යා, තචො අභිඤ්ඤෙය්‍යා, මංසං අභිඤ්ඤෙය්‍යං, නහාරූ[1] අභිඤ්ඤෙය්‍යා, අට්ඨී අභිඤ්ඤෙය්‍යා, අට්ඨිමිඤ්ජං[2] අභිඤ්ඤෙය්‍යං, වක්කං අභිඤ්ඤෙය්‍යං, හදයං අභිඤ්ඤෙය්‍යං, යකනං අභිඤ්ඤෙය්‍යං, කිලොමකං අභිඤ්ඤෙය්‍යං, පිහකං අභිඤ්ඤෙය්‍යං, පප්ඵාසං අභිඤ්ඤෙය්‍යං, අන්තං අභිඤ්ඤෙය්‍යං, අන්තගුණං අභිඤ්ඤෙය්‍යං, උදරියං අභිඤ්ඤෙය්‍යං, කරීසං අභිඤ්ඤෙය්‍යං, පිත්තං අභිඤ්ඤෙය්‍යං, සෙම්හං අභිඤ්ඤෙය්‍යං, පුබ්බො අභිඤ්ඤෙය්‍යො, ලොහිතං අභිඤ්ඤෙය්‍යං, සෙදො අභිඤ්ඤෙය්‍යො, මෙදො අභිඤ්ඤෙය්‍යො, අස්සු අභිඤ්ඤෙය්‍යං, වසා අභිඤ්ඤෙය්‍යා, ඛෙළො අභිඤ්ඤෙය්‍යො, සිඞ්ඝාණිකා අභිඤ්ඤෙය්‍යා, ලසිකා අභිඤ්ඤෙය්‍යා, මුත්තං අභිඤ්ඤෙය්‍යං, මත්ථලුඞ්ගං අභිඤ්ඤෙය්‍යං.

චක්ඛායතනං අභිඤ්ඤෙය්‍යං, රූපායතනං අභිඤ්ඤෙය්‍යං, සොතායතනං අභිඤ්ඤෙය්‍යං, සද්දායතනං අභිඤ්ඤෙය්‍යං, ඝානායතනං අභිඤ්ඤෙය්‍යං, ගන්ධායතනං අභිඤ්ඤෙය්‍යං, ජිව්හායතනං අභිඤ්ඤෙය්‍යං, රසායතනං අභිඤ්ඤෙය්‍යං, කායායතනං අභිඤ්ඤෙය්‍යං, ඵොට්ඨබ්බායතනං අභිඤ්ඤෙය්‍යං, මනායතනං අභිඤ්ඤෙය්‍යං, ධම්මායතනං අභිඤ්ඤෙය්‍යං.

චක්ඛුධාතු අභිඤ්ඤෙය්‍යා, රූපධාතු අභිඤ්ඤෙය්‍යා, චක්ඛුවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, සොතධාතු අභිඤ්ඤෙය්‍යා, සද්දධාතු අභිඤ්ඤෙය්‍යා, සොතවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, ඝානධාතු අභිඤ්ඤෙය්‍යා, ගන්ධධාතු අභිඤ්ඤෙය්‍යා, ඝානවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, ජිව්හාධාතු අභිඤ්ඤෙය්‍යා, රසධාතු අභිඤ්ඤෙය්‍යා, ජිව්හාවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, කායධාතු අභිඤ්ඤෙය්‍යා. ඵොට්ඨබ්බධාතු අභිඤ්ඤෙය්‍යා, කායවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, මනොධාතු අභිඤ්ඤෙය්‍යා, ධම්මධාතු අභිඤ්ඤෙය්‍යා, මනොවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා.

චක්ඛුන්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සොතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ඝානින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ජිව්හින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, කායින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, මනින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ජීවිතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ඉත්ථින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, පුරිසින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සුඛින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සොමනස්සින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, දොමනස්සින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, උපෙක්ඛින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සද්ධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, විරියින්ද්‍රියං[3] අභිඤ්ඤෙය්‍යං, සතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සමාධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, පඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අඤ්ඤාතාවින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං.

කාමධාතු අභිඤ්ඤෙය්‍යා, රූපධාතු අභිඤ්ඤෙය්‍යා, අරූපධාතු අභිඤ්ඤෙය්‍යා, කාමභවො අභිඤ්ඤෙය්‍යො, රූපභවො අභිඤ්ඤෙය්‍යො, අරූපභවො අභිඤ්ඤෙය්‍යො, සඤ්ඤාභවො අභිඤ්ඤෙය්‍යො, අසඤ්ඤාභවො අභිඤ්ඤෙය්‍යො, නෙවසඤ්ඤානාසඤ්ඤාභවො අභිඤ්ඤෙය්‍යො, එකවොකාරභවො අභිඤ්ඤෙය්‍යො, චතුවොකාරභවො අභිඤ්ඤෙය්‍යො, පඤ්චවොකාරභවො අභිඤ්ඤෙය්‍යො.

පඨමං ඣානං[4] අභිඤ්ඤෙය්‍යං, දුතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, තතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, චතුත්ථං ඣානං අභිඤ්ඤෙය්‍යං, මෙත්තා චෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, කරුණාචෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, මුදිතාචෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, උපෙක්ඛාචෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, ආකාසානඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා.

---

1 නහාරූ - මජ්සං 2 අට්ඨිමිඤ්ජං අභිඤ්ඤෙය්‍යං - සයා, PTS
3 විරියින්ද්‍රියං - මජ්සං 4 පඨමජ්ඣානං - සයා

කෙස් දතයුතු යැ. ලොම් දතයුතු යැ. නිය දතයුතු යැ. දත් දතයුතු යැ. සම් දතයුතු යැ. මස් දතයුතු යැ. නහර දතයුතු යැ. ඇට දතයුතු යැ. ඇටමිඳුළු දතයුතු යැ. වකුගඩුව දතයුතු යැ. හදවත් දතයුතු යැ. අක්මාව දතයුතු යැ. දලබුව දතයුතු යැ. බඩදිව දතයුතු යැ. පපුමස දතයුතු යැ. අතුනු දතයුතු යැ. අතුනුබහන් දතයුතු යැ. නො පැසුණු අහර (උදරිය) දතයුතු යැ. පැසුණු අහර (කරීස) දතයුතු යැ. පිත් දතයුතු යැ. සෙම් දතයුතු යැ. පූයා දතයුතු යැ. ලෙහෙ දතයුතු යැ. සෝදිය දතයුතු යැ. මෙදතෙල් දතයුතු ය. කඳුළු දතයුතු යැ. වුරුණු තෙල් දතයුතු යැ. කෙළ දතයුතු යැ. මුකුණු දතයුතු යැ. සඳමිඳුළු දතයුතු යැ. සුලුදිය දතයුතු යැ. හිස්මුල් දතයුතු යි.

චක්ෂුරායතනය දතයුතු යැ. රූපායතනය දතයුතු යැ. ශ්‍රොත්‍රායතනය දතයුතු යැ. ශබ්දායතනය දතයුතු යැ. ඝ්‍රාණායතනය දතයුතු යැ. ගන්ධායතනය දතයුතු යැ. ජිහ්වායතනය දතයුතු යැ. රසායතනය දතයුතු යැ. කායායතනය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යායතනය දතයුතු යැ. මනායතනය දතයුතු යැ. ධර්මායතනය දතයුතු යි.

චක්ෂුර්ධාතුව දතයුතු යැ. රූපධාතුව දතයුතු යැ. චක්ෂුර්විඥාන ධාතුව දතයුතු යැ. ශ්‍රොත්‍රධාතුව දතයුතු යැ. ශබ්දධාතුව දතයුතු යැ. ශ්‍රොත්‍රවිඥානධාතුව දතයුතු යැ. ඝ්‍රාණධාතුව දතයුතු යැ. ගන්ධධාතුව දතයුතු යැ. ඝ්‍රාණවිඥානධාතුව දතයුතු යැ. ජිහ්වාධාතුව දතයුතු යැ. රසධාතුව දතයුතු යැ. ජිහ්වාවිඥානධාතුව දතයුතු යැ. කායධාතුව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යධාතුව දතයුතු යැ. කායවිඥානධාතුව දතයුතු යැ. මනොධාතුව දතයුතු යැ. ධර්මධාතුව දතයුතු යැ. මනොවිඥානධාතුව දතයුතු යි.

චක්ෂුරින්ද්‍රිය දතයුතු යැ. ශ්‍රොත්‍රෙන්ද්‍රිය දතයුතු යැ. ඝ්‍රාණෙන්ද්‍රිය දතයුතු යැ. ජිහ්වෙන්ද්‍රිය දතයුතු යැ. කායෙන්ද්‍රිය දතයුතු යැ. මනඉන්ද්‍රිය දතයුතු යැ. ජීවිතෙන්ද්‍රිය දතයුතු යැ. ස්ත්‍රීන්ද්‍රිය දතයුතු යැ. පුරුෂෙන්ද්‍රිය දතයුතු යැ. සුඛෙන්ද්‍රිය දතයුතු යැ. දුඃඛෙන්ද්‍රිය දතයුතු යැ. සොමනස්සින්ද්‍රිය දතයුතු යැ. දෞමනස්සින්ද්‍රිය දතයුතු යැ. උපෙක්ඛින්ද්‍රිය දතයුතු යැ. සද්ධින්ද්‍රිය දතයුතු යැ. විරියින්ද්‍රිය දතයුතු යැ. සතින්ද්‍රිය දතයුතු යැ. සමාධින්ද්‍රිය දතයුතු යැ. පඤ්ඤින්ද්‍රිය දතයුතු යැ. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය දතයුතු යැ. අඤ්ඤින්ද්‍රිය දතයුතු යැ. අඤ්ඤාතාවින්ද්‍රිය දතයුතු යි.

කාමධාතුව දතයුතු යැ. රූපධාතුව දතයුතු යැ. අරූපධාතුව දතයුතු යැ. කාමභවය දතයුතු යැ. රූපභවය දතයුතු යැ. අරූපභවය දතයුතු යැ. සංඥාභවය දතයුතු යැ. අසංඥාභවය දතයුතු යැ. නෛවසංඥානාසංඥාභවය දතයුතු යැ. එකවොකාරභවය දතයුතු යැ. චතුවොකාරභවය දතයුතු යැ. පඤ්චවොකාරභවය දතයුතු යි.

ප්‍රථමධ්‍යානය දතයුතු යැ. ද්විතීයධ්‍යානය දතයුතු යැ. තෘතීයධ්‍යානය දතයුතු යැ. චතුර්ථධ්‍යානය දතයුතු යැ. මෛත්‍රීචිත්තවිමුක්තිය දතයුතු යැ. කරුණාචිත්තවිමුක්තිය දතයුතු යැ. මුදිතාචිත්තවිමුක්තිය දතයුතු යැ. උපෙක්ෂාචිත්තවිමුක්තිය දතයුතු යැ. ආකාසානඤ්චායතන සමාපත්තිය දතයුතු යැ. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය දතයුතු යැ. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය දතයුතු යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය දතයුතු යි.

අවිජ්ජා අභිඤ්ඤෙය්‍යා, සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, නාමරූපං අභිඤ්ඤෙය්‍යං, සළායතනං අභිඤ්ඤෙය්‍යං, ඵස්සො අභිඤ්ඤෙය්‍යො, වෙදනා අභිඤ්ඤෙය්‍යා, තණ්හා අභිඤ්ඤෙය්‍යා, උපාදානං අභිඤ්ඤෙය්‍යං, භවො අභිඤ්ඤෙය්‍යො, ජාති අභිඤ්ඤෙය්‍යා, ජරාමරණං අභිඤ්ඤෙය්‍යං.

දුක්ඛං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා.

රූපං අභිඤ්ඤෙය්‍යං, රූපසමුදයො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා.

වෙදනා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා -පෙ- විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං -පෙ-

චක්ඛුං[1] අභිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං අභිඤ්ඤෙය්‍යං, ජරාමරණසමුදයො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා.

දුක්ඛස්ස පරිඤ්ඤට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛසමුදයස්ස පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධස්ස සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

රූපස්ස පරිඤ්ඤට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපසමුදයස්ස පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධස්ස සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනියා පටිපදාය භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස -පෙ- චක්ඛුස්ස -පෙ- ජරාමරණස්ස පරිඤ්ඤට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණසමුදයස්ස පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධස්ස සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනියා පටිපදාය භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

දුක්ඛස්ස පරිඤ්ඤාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛසමුදයස්ස පහානපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධස්ස සච්ඡිකිරියාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය භාවනාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො.

රූපස්ස පරිඤ්ඤාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපසමුදයස්ස පහානපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධස්ස සච්ඡිකිරියාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනියා පටිපදාය භාවනාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස -පෙ- චක්ඛුස්ස -පෙ- ජරාමරණස්ස පරිඤ්ඤාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණසමුදයස්ස පහානපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධස්ස සච්ඡිකිරියාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනියා පටිපදාය භාවනාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො.

1 චක්ඛු - මජසං.

අවිද්‍යාව දතයුතු යැ. සංස්කාරයෝ දතයුත්තාහ. විඥානය දතයුතු යැ. නාමරූපය දතයුතු යැ. ෂඩායතනය දතයුතු යැ. ස්පර්ශය දතයුතු යැ. වේදනාව දතයුතු යැ. තෘෂ්ණාව දතයුතු යැ. උපාදානය දතයුතු යැ. භවය දතයුතු යැ. ජාතිය දතයුතු යැ. ජරාමරණ දතයුතු යි.

දුඃඛය දතයුතු යැ. දුඃඛසමුදය දතයුතු යැ. දුඃඛනිරොධය දතයුතු යැ. දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා දතයුතු යැ. රූපය දතයුතු යැ. රූපසමුදය දතයුතු යැ. රූපනිරොධය දතයුතු යැ. රූපනිරොධගාමිනී ප්‍රතිපදා දතයුතු යැ.

වේදනාව දතයුතු යැ ... සංඥාව දතයුතු යැ ... සංස්කාරයෝ දතයුත්තාහ ... විඥානය දතයුතු යි. ..

චක්ෂුස දතයුතු යැ ... ජරාමරණ දතයුතු යැ. ජරාමරණසමුදය දතයුතු යැ. ජරාමරණනිරොධය දතයුතු යැ. ජරාමරණනිරොධගාමිනී ප්‍රතිපදා දතයුතු යි.

දුඃඛයාගේ පරිඥෙය්‍යය දතයුතු යැ. දුඃඛසමුදයාගේ ප්‍රහාණෙය්‍යය දතයුතු යැ. දුඃඛනිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාෙය්‍යය දතයුතු යැ. දුඃඛනිරොධ-ගාමිනීප්‍රතිපදාවගේ භාවනාෙය්‍යය දතයුතු යි.

රූපයාගේ පරිඥෙය්‍යය දතයුතු යැ. රූපසමුදයාගේ ප්‍රහාණෙය්‍යය දතයුතු යැ. රූපනිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාෙය්‍යය දතයුතු යැ. රූපනිරොධගාමිනී ප්‍රතිපදාවගේ භාවනාෙය්‍යය දතයුතු යි.

වේදනාවගේ ... සංඥාවගේ සංස්කාරයන්ගේ ... විඥානයාගේ ... චක්ෂුස්හුගේ ... ජරාමරණයාගේ පරිඥෙය්‍යය දතයුතු යැ. ජරාමරණසමුද-යාගේ ප්‍රහාණෙය්‍යය දතයුතු යැ. ජරාමරණනිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාෙය්‍යය දතයුතු යැ. ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදාවගේ භාවනාෙය්‍යය දතයුතු යි.

දුඃඛයාගේ පරිඥාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. දුඃඛසමුදයාගේ ප්‍රහාණ-ප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. දුඃඛනිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාවගේ භාවනාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යි.

රූපයාගේ පරිඥාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. රූපසමුදයාගේ ප්‍රහාණ-ප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. රූපනිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. රූපනිරොධගාමිනීප්‍රතිපදාවගේ භාවනාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යි.

වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාරයන්ගේ ... විඥානයාගේ ... චක්ෂුස්හුගේ ... ජරාමරණයාගේ පරිඥාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. ජරා-මරණසමුදයාගේ ප්‍රහාණප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. ජරාමරණනිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යැ. ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදා-වගේ භාවනාප්‍රතිවෙධාෙය්‍යය දතයුතු යි.

දුක්ඛං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස සමුදයනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස ඡන්දරාගනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

රූපං අභිඤ්ඤෙය්‍යං, රූපසමුදයො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස සමුදයනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස ඡන්දරාගනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

වෙදනා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා -පෙ- විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං -පෙ- චක්ඛුං අභිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං අභිඤ්ඤෙය්‍යං, ජරාමරණසමුදයො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස සමුදයනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස ඡන්දරාගනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

දුක්ඛං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා, දුක්ඛස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

රූපං අභිඤ්ඤෙය්‍යං, රූපසමුදයො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා, රූපස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

වෙදනා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා -පෙ- විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං අභිඤ්ඤෙය්‍යං, ජරාමරණසමුදයො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, ජරමරණස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිබ්බිදානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

රූපෙ අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ නිබ්බිදානුපස්සනා[1] අභිඤ්ඤෙය්‍යා, රූපෙ විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

---

1 නිබ්බානුපස්සනා - PTS.

දුඃඛය දතයුතු යැ. දුඃඛසමුදය දතයුතු යැ. දුඃඛනිරොධය දතයුතු යැ. දුඃඛයාගේ සමුදයනිරොධය දතයුතු යැ. දුඃඛයාගේ ඡන්‍දරාග නිරොධය දතයුතු යැ. දුඃඛයාගේ ආස්වාදය දතයුතු යැ. දුඃඛයාගේ ආදීනවය දතයුතු යැ. දුඃඛයාගේ නිස්සරණය දතයුතු යි.

රූපය දතයුතු යැ. රූපසමුදය දතයුතු යැ. රූපනිරොධය දතයුතු යැ. රූපයාගේ සමුදයනිරොධය දතයුතු යැ. රූපයාගේ ඡන්‍දරාගනිරොධය දතයුතු යැ. රූපයාගේ ආස්වාදය දතයුතු යැ. රූපයාගේ ආදීනවය දතයුතු ය. රූපයාගේ නිස්සරණය දතයුතු යි.

වෙදනාව දතයුතු යැ. ... සංඥව දතයුතු යැ. ... සංස්කාරයෝ දතයුත්තාහ. ... විඥනය දතයුතු යැ. ... චක්‍ෂුස දතයුතු යැ. ... ජරාමරණ දතයුතු යැ. ජරාමරණසමුදය දතයුතු යැ. ජරාමරණනිරොධය දතයුතු යැ. ජරාමරණයාගේ සමුදයනිරොධය දතයුතු යැ. ජරාමරණයාගේ ඡන්‍දරාගනිරොධය දතයුතු යැ. ජරාමරණයාගේ ආස්වාදය දතයුතු යැ. ජරාමරණයාගේ ආදීනවය දතයුතු යැ. ජරාමරණයාගේ නිස්සරණය දතයුතු යි.

දුඃඛය දතයුතු යැ. දුඃඛසමුදය දතයුතු යැ. දුඃඛනිරොධය දතයුතු යැ. දුඃඛනිරොධගාමිනීප්‍රතිපද දතයුතු යැ. දුඃඛයාගේ ආස්වාදය දතයුතු යැ. දුඃඛයාගේ ආදීනවය දතයුතු යැ. දුඃඛයාගේ නිස්සරණය දතයුතු යි.

රූපය දතයුතු යැ. රූපසමුදය දතයුතු යැ. රූපනිරොධය දතයුතු යැ. රූපනිරොධගාමිනීප්‍රතිපදව දතයුතු යැ. රූපයාගේ ආස්වාදය දතයුතු යැ. රූපයාගේ ආදීනවය දතයුතු යැ. රූපයාගේ නිස්සරණය දතයුතු යි.

වෙදනාව දතයුතු යැ. ... සංඥව දතයුතු යැ. .. සංස්කාරයෝ දතයුත්තාහ. ... විඥනය දතයුතු යැ. ... චක්‍ෂුස දතයුතු යැ. ... ජරාමරණ දතයුතු යැ. ජරාමරණසමුදය දතයුතු යැ. ජරාමරණනිරොධය දතයුතු යැ. ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදව දතයුතු යැ. ජරාමරණයාගේ ආස්වාදය දතයුතු යැ. ජරාමරණයාගේ ආදීනවය දතයුතු යැ. ජරාමරණයාගේ නිස්සරණය දතයුතු යි.

අනිච්චානුපස්සනාව දතයුතු යැ. දුක්ඛානුපස්සනාව දතයුතු යැ. අනත්තානුපස්සනාව දතයුතු යැ. නිබ්බිදානුපස්සනාව දතයුතු යැ. විරාගානුපස්සනාව දතයුතු යැ. නිරොධානුපස්සනාව දතයුතු යැ. පටිනිස්සග්ගානුපස්සනාව දතයුතු යි.

රූපයෙහි අනිච්චානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි දුක්ඛානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි අනත්තානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි නිබ්බිදානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි විරාගානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි නිරොධානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව දතයුතු යි.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ නිබ්බිදානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

උප්පාදො අභිඤ්ඤෙය්‍යො, පවත්තං[1] අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං අභිඤ්ඤෙය්‍යං, ආයූහනා[2] අභිඤ්ඤෙය්‍යා, පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, ගති අභිඤ්ඤෙය්‍යා, නිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, උපපත්ති අභිඤ්ඤෙය්‍යා, ජාති අභිඤ්ඤෙය්‍යා, ජරා අභිඤ්ඤෙය්‍යා, ව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, මරණං අභිඤ්ඤෙය්‍යං, සොකො අභිඤ්ඤෙය්‍යො, පරිදෙවො අභිඤ්ඤෙය්‍යො, උපායාසො අභිඤ්ඤෙය්‍යො.

අනුප්පාදො අභිඤ්ඤෙය්‍යො, අප්පවත්තං අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං අභිඤ්ඤෙය්‍යං, අනායූහනා අභිඤ්ඤෙය්‍යා, අප්පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, අගති අභිඤ්ඤෙය්‍යා, අනිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, අනුපපත්ති අභිඤ්ඤෙය්‍යා, අජාති අභිඤ්ඤෙය්‍යා, අජරා අභිඤ්ඤෙය්‍යා, අව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, අමරණං අභිඤ්ඤෙය්‍යං, අසොකො අභිඤ්ඤෙය්‍යො, අපරිදෙවො අභිඤ්ඤෙය්‍යො, අනුපායාසො අභිඤ්ඤෙය්‍යො.

උප්පාදො අභිඤ්ඤෙය්‍යො, අනුප්පාදො අභිඤ්ඤෙය්‍යො, පවත්තං අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං අභිඤ්ඤෙය්‍යං, ආයූහනා අභිඤ්ඤෙය්‍යා, අනායූහනා අභිඤ්ඤෙය්‍යා, පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, අප්පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, ගති අභිඤ්ඤෙය්‍යා, අගති අභිඤ්ඤෙය්‍යා, නිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, අනිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, උපපත්ති අභිඤ්ඤෙය්‍යා, අනුපපත්ති අභිඤ්ඤෙය්‍යා, ජාති අභිඤ්ඤෙය්‍යා, අජාති අභිඤ්ඤෙය්‍යා, ජරා අභිඤ්ඤෙය්‍යා, අජරා අභිඤ්ඤෙය්‍යා, ව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, අව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, මරණං අභිඤ්ඤෙය්‍යං, අමරණං අභිඤ්ඤෙය්‍යං, සොකො අභිඤ්ඤෙය්‍යො, අසොකො අභිඤ්ඤෙය්‍යො, පරිදෙවො අභිඤ්ඤෙය්‍යො, අපරිදෙවො අභිඤ්ඤෙය්‍යො, උපායාසො අභිඤ්ඤෙය්‍යො, අනුපායාසො අභිඤ්ඤෙය්‍යො.

උප්පාදො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා[2] දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ගති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං සොකො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අගති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං.

1 පවත්ති - ස්‍යා. 2 ආයුහනා - ස්‍යා.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂු–සෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි දුඃඛානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි අනාත්තානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි නිබ්බිදානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි විරාගා–නුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි නිරොධානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව දතයුතු යි.

පූර්වකර්මප්‍රත්‍යයෙන් මෙහි ඉපැදීම දතයුතු යැ. (උපන්නහුගේ) පැවැත්ම දතයුතු යැ. සංස්කාරනිමිත්ත දතයුතු යැ. ආයතිප්‍රතිසන්ධිහෙතු වූ කර්මය දතයුතු යැ. ප්‍රතිසන්ධිය දතයුතු යැ. ගතිය දතයුතු යැ. ස්කන්ධයන්ගේ නිපැත්ම දතයුතු යැ. විපාකප්‍රවෘත්තිය දතයුතු යැ. ජාතිය දතයුතු යැ. ජරාව දතයුතු යැ. ව්‍යාධිය දතයුතු යැ. මරණය දතයුතු යැ. ශොකය දතයුතු යැ. පරිදෙවය දතයුතු යැ. උපායාසය දතයුතු යි.

අනුත්පාදය දතයුතු යැ. අප්‍රවෘත්තිය දතයුතු යැ. අනිමිත්ත දතයුතු යැ. අනායූහනය දතයුතු යැ. අප්‍රතිසන්ධිය දතයුතු යැ අගතිය දතයුතු යැ. නො නිපැත්ම දතයුතු යැ. විපාකයාගේ නො පැවැත්ම දතයුතු ය. නො පහළවීම දතයුතු යැ. නො දිරීම දතයුතු යැ. අව්‍යාධිය දතයුතු යැ. නො මැරීම දතයුතු යැ. ශොක නො කිරීම දතයුතු යැ. නො වැලපීම දතයුතු යැ. අනුපායාසය දතයුතු යි.

උත්පාදය දතයුතු යැ. අනුත්පාදය දතයුතු යැ. පැවැත්ම් දතයුතු යැ. නො පැවැත්ම දතයුතු යැ. සංස්කාරනිමිත්ත දතයුතු යැ. අනිමිත්ත දතයුතු යැ. කර්මායූහනය දතයුතු යැ. අනායූහනය දතයුතු යැ. ප්‍රතිසන්ධිය දතයුතු යැ. අප්‍රතිසන්ධිය දතයුතු යැ. ගතිය දතයුතු යැ. අගතිය දතයුතු යැ. නිර්වෘත්තිය දතයුතු යැ. අනිර්වෘත්තිය දතයුතු යැ. උපප්‍රාප්තිය දතයුතු යැ. අනුපප්‍රාප්තිය දතයුතු යැ. ජාතිය දතයුතු යැ. අජාතිය දතයුතු යැ. ජරාව දතයුතු යැ. අජරාව දතයුතු යැ. ව්‍යාධිය දතයුතු යැ. අව්‍යාධිය දතයුතු යැ. මරණය දතයුතු යැ. අමරණය දතයුතු යැ ශොකය දතයුතු යැ. අශොකය දතයුතු යැ. පරිදෙවය දතයුතු ය. අපරිදෙවය දතයුතු යැ. උපායාසය දතයුතු යැ. අනුපායාසය දතයුතු යි.

උත්පාදය දුකැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය දුකැ යි දතයුතු යැ. සඞ්ඛාර–නිමිත්ත දුකැ යි දතයුතු යැ. කර්මායූහනය දුකැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය දුකැ යි දතයුතු යැ. ගතිය දුකැ යි දතයුතු යැ. නිර්වෘත්තිය දුකැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය දුකැ යි දතයුතු යැ. ජාතිය දුකැ යි දතයුතු යැ. ජරාව දුකැ යි දතයුතු යැ ව්‍යාධිය දුකැ යි දතයුතු යැ. මරණය දුකැ යි දතයුතු යැ. ශොකය දුකැ යි දතයුතු යැ. පරිදෙවය දුකැයි දතයුතු යැ. උපායාසය දුකැ යි දතයුතු යි.

අනුත්පාදය සුඛ යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. අනිමිත්ත සුඛ යැ යි දතයුතු යැ. අනායූහනය සුඛ යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය සුඛ යැ යි දතයුතු යැ. අගතිය සුඛ යැ යි දතයුතු යැ. අනිර්වෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. අනුපප්‍රාප්තිය සුඛ යැ යි දතයුතු යැ. අජාතිය සුඛ යැ යි දතයුතු යැ. අජරාව සුඛ යැ යි දතයුතු යැ. අව්‍යාධිය සුඛ යැ යි දතයුතු යැ. අමරණය සුඛ යැ යි දතයුතු යැ. අශොකය සුඛ යැ යි දතයුතු යැ. අපරිදෙවය සුඛ යැ යි දතයුතු යැ. අනුපායාසය සුඛ යැ යි දතයුතු යි.

උප්පාදො දුක්ඛං, අනුප්පාදො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං දුක්ඛං, අප්පවත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං දුක්ඛං, අනිමිත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා දුක්ඛං, අනායූහනා[1] සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි දුක්ඛං, අප්පටිසන්ධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ගති දුක්ඛං, අගති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති දුක්ඛං, අනිබ්බත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති දුක්ඛං, අනුපපත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති දුක්ඛං, අජාති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා දුක්ඛං, අජරා සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි දුක්ඛං, අව්‍යාධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං දුක්ඛං, අමරණං[2] සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො දුක්ඛං, අසොකො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො දුක්ඛං, අපරිදෙවො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො දුක්ඛං අනුපායාසො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො භයන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං භයන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං භයන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා භයන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි භයන්ති අභිඤ්ඤෙය්‍යං, ගති භයන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති භයන්ති අභිඤ්ඤෙය්‍යං. උපපත්ති භයන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති භයන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා භයන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි භයන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං භයන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො භයන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො භයන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො භයන්ති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අගති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං[2] ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො භයං, අනුප්පාදො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං භයං, අප්පවත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං භයං. අනිමිත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා භයං, අනායූහනා[1], ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි භයං, අප්පටිසන්ධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ගති භයං, අගති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති භයං, අනිබ්බත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති භයං, අනුපපත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති භයං, අජාති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා භයං, අජරා ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි භයං, අව්‍යාධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං භයං, අමරණං,[2] ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො භයං, අසොකො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො භයං, අපරිදෙවො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො භයං, අනුපායාසො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං.

---

1. ආයූහනා - අනායූහනා - සයා.
2. අමතං - මජසං සයා, PTS.

උත්පාදය දුක යැ අනුත්පාදය සුඛ යැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය දුක යැ අප්‍රවෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත දුක යැ අනිමිත්ත සුඛ යැ යි දතයුතු යැ. කර්මායූහනය දුක යැ අනායූහනය සුඛ යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය දුක යැ අප්‍රතිසන්ධිය සුඛ යැ යි දතයුතු යැ. ගතිය දුක යැ අගතිය සුඛ යැ යි දතයුතු යැ. නිර්වෘත්තිය දුක යැ අනිර්වෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය දුක යැ අනුපප්‍රාප්තිය සුඛ යැ යි දතයුතු යැ. ජාතිය දුක යැ අජාතිය සුඛ යැ යි දතයුතු යැ. ජරාව දුක යැ අජරාව සුඛ යැ යි දතයුතු යැ. ව්‍යාධිය දුක යැ අව්‍යාධිය සුඛ යැ යි දතයුතු යැ. මරණය දුක යැ අමරණය සුඛ යැ යි දතයුතු යැ. ශෝකය දුක යැ අශෝකය සුඛ යැ යි දතයුතු යැ. පරිදේවය දුක යැ අපරිදේවය සුඛ යැ යි දතයුතු යැ. උපායාසය දුක යැ අනුපායාසය සුඛ යැ යි දතයුතු යි.

උත්පාදය බියෙකැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය බියෙකැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත බියෙකැයි දතයුතු යැ. කර්මායූහනය බියෙකැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය බියෙකැ යි දතයුතු යැ. ගතිය බියෙකැ යි දතයුතු යැ. නිර්වෘත්තිය බියෙකැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය බියෙකැ යි දතයුතු යැ. ජාතිය බියෙකැයි දතයුතු යැ. ජරාව බියෙකැ යි දතයුතු යැ. ව්‍යාධිය බියෙකැ යි දතයුතු යැ. මරණය බියෙකැ යි දතයුතු යැ. ශෝකය බියෙකැයි දතයුතු යැ. පරිදේවය බියෙකැ යි දතයුතු යැ. උපායාසය බියෙකැ යි දතයුතු යි.

අනුත්පාදය ක්ෂෙම යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනිමිත්ත ක්ෂෙම යැ යි දතයුතු යැ. අනායූහනය ක්ෂෙම යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අගතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනිර්වෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනුපප්‍රාප්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අජාතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අජරාව ක්ෂෙම යැ යි දතයුතු යැ. අව්‍යාධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අමරණය ක්ෂෙම යැ යි දතයුතු යැ. අශෝකය ක්ෂෙම යැ යි දතයුතු යැ. අපරිදේවය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනුපායාසය ක්ෂෙම යැ යි දතයුතු යි.

උත්පාදය බියෙකැ අනුත්පාදය ක්ෂෙම යැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය බියෙකැ අප්‍රවෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත බියෙකැ අනිමිත්ත ක්ෂෙම යැ යි දතයුතු යැ. ආයූහනය බියෙකැ අනායූහනය ක්ෂෙම යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය බියෙකැ අප්‍රතිසන්ධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. ගතිය බියෙකැ අගතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. නිර්වෘත්තිය බියෙකැ අනිර්වෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය බියෙකැ අනුපප්‍රාප්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. ජාතිය බියෙකැ අජාතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. ජරාව බියෙකැ අජරාව ක්ෂෙම යැ යි දතයුතු යැ. ව්‍යාධිය බියෙකැ අව්‍යාධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. මරණය බියෙකැ අමරණය ක්ෂෙම යැ යි දතයුතු යැ. ශෝකය බියෙකැ අශෝකය ක්ෂෙම යැ යි දතයුතු යැ. පරිදේවය බියෙකැ අපරිදේවය ක්ෂෙම යැ යි දතයුතු යැ. උපායාසය බියෙකැ අනුපායාසය ක්ෂෙම යැ යි දතයුතු යි.

උප්පාදො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා[1] සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ගති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අගති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං[2] නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො සාමිසං, අනුප්පාදො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සාමිසං, අප්පවත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සාමිසං, අනිමිත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා සාමිසං, අනායූහනා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සාමිසං, අප්පටිසන්ධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ගති සාමිසං, අගති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සාමිසං, අනිබ්බත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සාමිසං, අනුපපත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති සාමිසං, අජාති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා සාමිසං, අජරා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සාමිසං, අව්‍යාධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං සාමිසං, අමරණං[2] නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො සාමිසං අසොකො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො සාමිසං, අපරිදෙවො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සාමිසං, අනුපායාසො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ගති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ජාති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ජරා සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, මරණං සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, සොකො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අගති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං.

---

1 ආයූහනා - සයා    2 අමතං - මජසං, සයා, PTS.

උත්පාදය වට්ටාමිස ලොකාමිස සහිත බැවින් සාමිස යැයි දතයුතු යැ. ප්‍රවෘත්තිය සාමිස යැයි දතයුතු යැ. සංස්කාරනිමිත්ත සාමිස යැයි දතයුතු යැ. ආයූහනය සාමිස යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සාමිස යැ යි දතයුතු යැ. ගතිය සාමිස යැ යි දතයුතු යැ නිර්වෘත්තිය සාමිස යැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය සාමිස යැයි දතයුතු යැ ජාතිය සාමිස යැයි දතයුතු යැ. ජරාව සාමිස යැයි දතයුතු යැ. ව්‍යාධිය සාමිස යැයි දතයුතු යැ. මරණය සාමිස යැයි දතයුතු යැ. ශොකය සාමිස යැයි දතයුතු යැ. පරිදෙවය සාමිස යැයි දතයුතු යැ. උපායාසය සාමිස යැ යි දතයුතු යි.

අනුත්පාදය නිරාමිස යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. අනිමිත්ත නිරාමිස යැ යි දතයුතු යැ. අනායූහනය නිරාමිස යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය නිරාමිස යැ යි දතයුතු යැ. අගතිය නිරාමිස යැ යි දතයුතු යැ. නො නිපැත්ම නිරාමිස යැ යි දතයුතු යැ. අනුපප්‍රාප්තිය නිරාමිස යැ යි දතයුතු යැ. අජාතිය නිරාමිස යැ යි දතයුතු යැ. අජරාව නිරාමිස යැ යි දතයුතු යැ. අව්‍යාධිය නිරාමිස යැ යි දතයුතු යැ අමරණය නිරාමිස යැ යි දතයුතු යැ. අශොකය නිරාමිස යැ යි දතයුතු යැ. අපරි-දෙවය නිරාමිස යැ යි දතයුතු යැ. අනුපායාසය නිරාමිස යැ යි දතයුතු යි.

උත්පාදය සාමිස යැ අනුත්පාදය නිරාමිස යැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය සාමිස යැ අප්‍රවෘත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත සාමිස යැ අනිමිත්ත නිරාමිස යැ යි දතයුතු යැ. ආයූහනය සාමිස යැ අනායූහ-නය නිරාමිස යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සාමිස යැ, අප්‍රතිසන්ධිය නිරාමිස යැ යි දතයුතු යැ. ගතිය සාමිස යැ අගතිය නිරාමිස යැ යි දතයුතු යැ. නිර්වෘත්තිය සාමිස යැ අනිර්වෘත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. ජාතිය සාමිස යැ අජාතිය නිරාමිස යැ යි දතයුතු යැ. ජරාව සාමිස යැ අජරාව නිරාමිස යැ යි දතයුතු යැ. ව්‍යාධිය සාමිස යැ අව්‍යාධිය නිරාමිස යැ යි දතයුතු යැ. මරණය සාමිස යැ. අමරණය නිරාමිස යැ යි දතයුතු යැ. ශොකය සාමිස යැ අශොකය නිරාමිස යැ යි දතයුතු යැ. පරිදෙවය සාමිස යැ අපරිදෙවය නිරාමිස යැ යි දතයුතු යැ. උපායාසය සාමිස යැ. අනුපා-යාසය නිරාමිස යැ යි දතයුතු යි.

උත්පාදය සංස්කාරහ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය සංස්කාරහ යි දතයුතු යැ. නිමිත්ත සංස්කාරහ යි දතයුතු යැ. ආයූහනය සංස්කාරහ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සංස්කාරහ යි දතයුතු යැ. ගතිය සංස්කාරහ යි දතයුතු යැ. නිර්වෘත්තිය සංස්කාරහ යි දතයුතු යැ. උපප්‍රාප්තිය සංස්කාරහ යි දතයුතු යැ. ජාතිය සංස්කාරහ යි දතයුතු යැ. ජරාව සංස්කාරහ යි දතයුතු යැ. ව්‍යාධිය සංස්කාරහ යි දතයුතු යැ. මරණය සංස්කාරහ යි දතයුතු යැ. ශොකය සංස්කාරහ යි දතයුතු යැ. පරිදෙවය සංස්කාරහ යි දතයුතු යැ. උපායාසය සංස්කාරහ යි දතයුතු යි.

අනුත්පාදය නිර්වාණ යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය නිර්වාණ යැ යි දතයුතු යැ. අනිමිත්ත නිර්වාණ යැ යි දතයුතු යැ. අනායූහනය නිර්වාණ යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය නිර්වාණ යැ යි දතයුතු යැ. අගතිය නිර්වාණ යැ යි දතයුතු යැ. අනිර්වෘත්තිය නිර්වාණ යැ යි දතයුතු යැ. අනුපප්‍රාප්තිය නිර්වාණ යැ යි දතයුතු යැ. අජාතිය නිර්වාණ යැ යි දතයුතු යැ අජරාව නිර්වාණ යැ යි දතයුතු යැ. අව්‍යාධිය නිර්වාණ යැ යි දතයුතු යැ. අමරණය නිර්වාණ යැ යි දතයුතු යැ. අශොකය නිර්වාණ යැ යි දතයුතු යැ. අපරිදෙවය නිර්වාණ යැ යි දතයුතු යැ. අනුපායාසය නිර්වාණ යැ යි දතයුතු යි.

උප්පාදො සඞ්ඛාරා, අනුප්පාදො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සඞ්ඛාරා, අප්පවත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සඞ්ඛාරා, අනිමිත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා සඞ්ඛාරා, අනායූහනා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සඞ්ඛාරා, අප්පටිසන්ධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ගති සඞ්ඛාරා, අගති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සඞ්ඛාරා, අනිබ්බත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සඞ්ඛාරා, අනුපපත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති සඞ්ඛාරා, අජාති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා සඞ්ඛාරා, අජරා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සඞ්ඛාරා, අව්‍යාධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍ය, මරණං සඞ්ඛාරා, අමරණං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො සඞ්ඛාරා, අසොකො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං. පරිදෙවො සඞ්ඛාරා, අපරිදෙවො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සඞ්ඛාරා, අනුපායාසො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං.

### පඨමකභාණවාරං.

පරිග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිවාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිපූරට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, එකග්ගට්ඨො අභිඤ්ඤෙය්‍යො, අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, අවිසාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනාවිලට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනිඤ්ජනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තුපට්ඨානවසෙන[2] චිත්තස්ස ඨිතට්ඨො අභිඤ්ඤෙය්‍යො, ආරම්මණට්ඨො අභිඤ්ඤෙය්‍යො, ගොචරට්ඨො අභිඤ්ඤෙය්‍යො, පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො පරිච්චාගට්ඨො අභිඤ්ඤෙය්‍යො, වුට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිවත්තනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සන්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, පණීතට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමුත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනාසවට්ඨො අභිඤ්ඤෙය්‍යො, තරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනිමිත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, අප්පණිහිතට්ඨො අභිඤ්ඤෙය්‍යො, සුඤ්ඤතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකරසට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනතිවත්තනට්ඨො අභිඤ්ඤෙය්‍යො, යුගනන්ධට්ඨො,[3] අභිඤ්ඤෙය්‍යො, නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, හෙතුට්ඨො අභිඤ්ඤෙය්‍යො, දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ආධිපතෙය්‍යට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සමථස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, විපස්සනාය අනුපස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමථවිපස්සනානං එකරසට්ඨො අභිඤ්ඤෙය්‍යො, යුගනන්ධස්ස[4] අනතිවත්තනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සික්ඛාය සමාදානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ආරම්මණස්ස ගොචරට්ඨො අභිඤ්ඤෙය්‍යො, ලීනස්ස චිත්තස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, උද්ධතස්ස චිත්තස්ස නිග්ගහට්ඨො[5] අභිඤ්ඤෙය්‍යො, උභොවිසුද්ධානං අජ්ඣුපෙක්ඛනට්ඨො අභිඤ්ඤෙය්‍යො, භාවනා විසෙසාධිගමට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො, උත්තරි පටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්චාභිසමයට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධෙ පතිට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො.

1. පරිපූරිට්ඨො - ස, 2. එකත්තපට්ඨානවසෙන - .PTS
3. යුගනද්ධට්ඨො - මජසං, 4. යුගනද්ධස්ස - මජසං 5 විනිග්ගහට්ඨො - PTS
6. විසෙසාධිගමට්ඨො - මජසං, සහ,

උත්පාදය සංස්කාරයහ අනුත්පාදය නිවනැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය සංස්කාරයහ අප්‍රවෘත්තිය නිවනැ යි දතයුතු යැ. නිමිත්ත සංස්කාරයහ අනිමිත්ත නිවනැ යි දතයුතු යැ ආයූහනය සංස්කාරයහ අනායූහනය නිවනැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සංස්කාරයහ අප්‍රතිසන්ධිය නිවනැ යි දතයුතු යැ. ගතිය සංස්කාරයහ අගතිය නිවනැයි දතයුතු යැ. නිර්වෘත්තිය සංස්කාරයහ. අනිර්වෘත්තිය නිවනැ යි දතයුතු ය. උපප්‍රාප්තිය සංස්කාරයහ අනුපප්‍රාප්තිය නිවනැ යි දතයුතු යැ. ජාතිය සංස්කාරයහ අජාතිය නිවනැ යි දතයුතු යැ. ජරාව සංස්කාරයහ අජරාව නිවනැ යි දතයුතු යැ. ව්‍යාධිය සංස්කාරයහ අව්‍යාධිය නිවනැ යි දතයුතු යැ. මරණය සංස්කාරයහ අමරණය නිවනැ යි දතයුතු යැ. ශෝකය සංස්කාරයහ අශෝකය නිවනැ යි දතයුතු යැ. පරිදේවය සංස්කාරයහ අපරිදේවය නිවනැ යි දතයුතු යැ. උපායාසය සංස්කාරයහ අනුපායාසය නිවනැ යි දතයුතු යි.

## පළමු වන බණවර යි.

පරිග්‍රහාර්ථය (ආර්යමාර්ගසම්ප්‍රයුක්තධර්මයන් පරිග්‍රහණය කරන බව) දතයුතු යැ. (අන්‍යොන්‍ය) පරිවාරාර්ථය දතයුතු යැ. (භාවනායෙන්) වැඩීම් වශයෙන් පරිපූරාර්ථය ගතයුතු යැ. (සමාධි අරමුණෙහි) ඒකාග්‍රාර්ථය දතයුතු යැ. අවික්ෂේපාර්ථය දතයුතු යැ. (වීර්යවශයෙන්) ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. (අරමුණෙහි නො විසිරෙන) අවිසාරාර්ථය දතයුතු යැ. (නො කැළඹුණු හෙයින්) අනාවිලාර්ථය දතයුතු යැ. (අවිකම්පිත හෙයින්) අනිඤ්ජනාර්ථය දතයුතු යැ. ඒකත්වයෙහි පිහිටා සිටීම් වශයෙන් චිත්තයාගේ ස්ථිතාර්ථය දතයුතු යැ. ආලම්බනාර්ථය දතයුතු යැ. ගොචරාර්ථය දතයුතු යැ. ප්‍රහාණාර්ථය දතයුතු යැ. පරිත්‍යාගාර්ථය දතයුතු යැ. (උභතොවුට්ඨාන වශයෙන්) ව්‍යුත්ථානාර්ථය දතයුතු යැ. නිවර්තනාර්ථය දතයුතු යැ. ශාන්තාර්ථය දතයුතු යැ. ප්‍රණීතාර්ථය දතයුතු යැ. විමුක්තාර්ථය දතයුතු යැ. අනාස්‍රවාර්ථය දතයුතු යැ. තරණාර්ථය දතයුතු යැ. අනිමිත්තාර්ථය දතයුතු යැ. අප්‍රණිහිතාර්ථය දතයුතු යැ. ශූන්‍යතාර්ථය දතයුතු යැ. ඒකරසාර්ථය දතයුතු යැ. අනතිවර්තනාර්ථය දතයුතු යැ. යුගනද්ධාර්ථය දතයුතු යැ. නෛර්යාණාර්ථය දතයුතු යැ. හෙත්වර්ථය දතයුතු යැ. දර්ශනාර්ථය දතයුතු යැ. අධිපතිභාවාර්ථය දතයුතු යි.

ශමථයාගේ අවික්ෂේපාර්ථය (අවික්ෂේප ස්වභාවය) දතයුතු යැ. විදර්ශනාවගේ අනුපස්සනාර්ථය දතයුතු යැ. ශමථවිදර්ශනාවන්ගේ ඒකරසාර්ථය දතයුතු යැ. යුගනද්ධයාගේ අනතිවර්තනාර්ථය දතයුතු යි.

ශික්ෂාවගේ සමාදානාර්ථය දතයුතු යැ. ආලම්බනයාගේ ගොචරාර්ථය දතයුතු යැ. ලීනචිත්තයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. උද්ධත චිත්තයාගේ නිග්‍රහාර්ථය දතයුතු යැ. ලීනෝද්ධත දෙකින් විශුද්ධ (චිත්ත) යන්ගේ අධ්‍යුපෙක්ෂණාර්ථය දතයුතු යැ. විශේෂාධිගමාර්ථය දතයුතු යැ. (ආර්යමාර්ගයාගේ) පහළවීම් වශයෙන් උත්තරිප්‍රතිවේධාර්ථය දතයුතු යැ. (චතුස්සත්‍යප්‍රතිවේධ වශයෙන්) සත්‍යාභිසමයාර්ථය දතයුතු යැ. (ඵලසමාපත්ති වශයෙන්) නිරෝධයෙහි ප්‍රතිෂ්ඨාපකාර්ථය දතයුතු යි.

සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියින්ද්‍රියස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, සතින්ද්‍රියස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සද්ධාබලස්ස අස්සද්ධියෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියබලස්ස කොසජ්ජෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, සතිබලස්ස පමාදෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමාධිබලස්ස උද්ධච්චෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, පඤ්ඤාබලස්ස අවිජ්ජාය අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සතිසම්බොජ්ඣඞ්ගස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස පවිචයට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියසම්බොජ්ඣඞ්ගස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, පීතිසම්බොජ්ඣඞ්ගස්ස උපසමට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමාධිසම්බොජ්ඣඞ්ගස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස පටිසඞ්ඛානට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සම්මාදිට්ඨියා දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාසඞ්කප්පස්ස අභිනිරොපනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාවාචාය පරිග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාකම්මන්තස්ස සමුට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාආජීවස්ස වොදානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාවායාමස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාසතියා උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාසමාධිස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො.

ඉන්ද්‍රියානං ආධිපතෙය්‍යට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, බලානං අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, බොජ්ඣඞ්ගානං නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස හෙතුට්ඨො අභිඤ්ඤෙය්‍යො, සතිපට්ඨානානං උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මප්පධානානං පදහනට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, ඉද්ධිපාදානං ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්චානං තථට්ඨො අභිඤ්ඤෙය්‍යො, පයොගානං[3] පටිප්පස්සද්ධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඵලානං සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො.

විතක්කස්ස අභිනිරොපනට්ඨො අභිඤ්ඤෙය්‍යො, විචාරස්ස උපවිචාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, පීතියා ඵරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, සුඛස්ස අභිසන්දනට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස එකග්ගට්ඨො අභිඤ්ඤෙය්‍යො.

ආවජ්ජනට්ඨො අභිඤ්ඤෙය්‍යො, විජානනට්ඨො[4] අභිඤ්ඤෙය්‍යො, පජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සඤ්ජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, [එකාරම්මණට්ඨො අභිඤ්ඤෙය්‍යො,] එකොදට්ඨො[5] අභිඤ්ඤෙය්‍යො, අභිඤ්ඤාය ඤාතට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිඤ්ඤාය තීරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, පහානස්ස පරිච්චාගට්ඨො අභිඤ්ඤෙය්‍යො, භාවනාය එකරසට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්ඡිකිරියාය ඵස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඛන්ධානං ඛන්ධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධාතූනං ධාතුට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො, ආයතනානං ආයතනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සඞ්ඛතානං සඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො, අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො.

---

1 අධිපතෙය්‍යට්ඨො - PTS, 2 පධානට්ඨො - සු.
3. මග්ගානං - මජ්ඣං, යොගානං - සා, 4. විජානට්ඨො - ස්‍යා.
5 එකරසට්ඨො - මජ්සං, එකාරම්මණට්ඨො - සං. 6. ධාතට්ඨො - ස්‍යා.

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. සමෘතීන්ද්‍රියයාගේ (අරමුණට එළැඹ සිටීම් වශයෙන්) උපස්ථානාර්ථය දතයුතු යැ. සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනාර්ථය දතයුතු යි.

ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධායෙන් අකම්පයාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යබලයාගේ කුසීදභාවයෙන් අකම්පයාර්ථය දතයුතු යැ. සමෘතිබලයාගේ ප්‍රමාදයෙන් අකම්පයාර්ථය දතයුතු යැ. සමාධිබලයාගේ උද්ධතභාවයෙන් අකම්පයාර්ථය දතයුතු යැ. ප්‍රඥාබලයාගේ අවිද්‍යායෙන් අකම්පයාර්ථය දතයුතු යි.

සමෘතිසම්බොධ්‍යඞ්ගයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ (විමසීම් විසින්) ප්‍රවිචයාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ස්ඵුරණාර්ථය දතයුතු යැ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ ව්‍යුපශමාර්ථය දතයුතු යැ. සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රතිසංඛ්‍යානාර්ථය දතයුතු යි.

සම්‍යග්දෘෂ්ටිහුගේ දර්ශනාර්ථය දතයුතු යැ. සම්‍යක්සංකල්පයාගේ (සිත අරමුණට නැඟීම් විසින්) අභිනිරොපණාර්ථය දතයුතු යැ. සම්‍යග් වචනයාගේ (වාක්සංවර විසින්) පරිග්‍රහාර්ථය දතයුතු යැ. සම්‍යක් කර්මාන්තයාගේ (කායසංවර විසින්) සමුත්ථානාර්ථය දතයුතු යැ. සම්‍යගාජීවයාගේ පරිශුද්ධාර්ථය දතයුතු යැ. සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. සම්‍යක්සමෘතියගේ උපස්ථානාර්ථය දතයුතු යැ. සම්‍යක් සමාධිහුගේ අවික්ෂෙපාර්ථය දතයුතු යි.

ඉන්ද්‍රියයන්ගේ අධිපත්‍යාර්ථය දතයුතු යැ. බලයන්ගේ අකම්පයාර්ථය දතයුතු යැ. බොධ්‍යඞ්ගයන්ගේ නිර්‍ය්‍යාණාර්ථය දතයුතු යැ. මාර්ගයාගේ හෙත්වර්ථය දතයුතු යැ. සතිපට්ඨානයන්ගේ (අරමුණෙහි එළැඹ සිටීම් වශයෙන්) උපස්ථානාර්ථය දතයුතු යැ. සම්‍යක්ප්‍රධානයන්ගේ ප්‍රදහනාර්ථය දතයුතු යැ. සෘද්ධිපාදයන්ගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. සත්‍යයන්ගේ තථාර්ථය දතයුතු යැ. සතර ආර්‍ය්‍ය මාර්ගප්‍රයොගයන්ගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථය දතයුතු යැ. ඵලයන්ගේ සාක්ෂාත්ක්‍රියාර්ථය දතයුතු යි.

විතර්කයාගේ අභිනිරොපණාර්ථය දතයුතු යැ. විචාරයාගේ අනුමජ්ජනාර්ථය දතයුතු යැ. ප්‍රීතියගේ විස්ඵරණාර්ථය (පැතිරීම) දතයුතු යැ. සුඛයාගේ අභිසන්දන (තෙමීම්) අර්ථය දතයුතු යැ. චිත්තයාගේ (සමාධි වශයෙන්) එකාග්‍රතාර්ථය දතයුතු යි.

ආවර්ජනාර්ථය දතයුතු යැ. (විඥනයාගේ) විජානනාර්ථය දතයුතු යැ. (ප්‍රඥවගේ) ප්‍රජානනාර්ථය දතයුතු යැ. (සංඥවගේ) සඤ්ජානනාර්ථය දතයුතු යැ. (සමාධිහුගේ) එකාලම්බනාර්ථය දතයුතු යැ. අසහාය වූ උදයාර්ථය දතයුතු යැ. අභිඥ (ඥතපරිඥ) වගේ ඥතාර්ථය දතයුතු යැ. තීරණපරිඥවගේ (අනිත්‍යාදි වශයෙන්) තීරණාර්ථය දතයුතු යැ. ප්‍රහාණපරිඥවගේ (ප්‍රතිපක්ෂධර්ම) පරිත්‍යාගාර්ථය දතයුතු යැ. භාවනාවගේ එකරසාර්ථය දතයුතු යැ. සාක්ෂාත්ක්‍රියාවගේ ස්පර්ශන (විඳුන) අර්ථය දතයුතු යැ. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය දතයුතු යැ. ධාතූන්ගේ (ශූන්‍යාදි) ධාත්වර්ථය දතයුතු යැ. ආයතනයන්ගේ ආයතනාර්ථය දතයුතු යැ. සඞ්ඛත ධර්මයන්ගේ (ප්‍රත්‍යයසමවායෙන් කරන ලද විසින්) සඞ්ඛතාර්ථය දතයුතු යැ. අසඞ්ඛතධාතුහුගේ අසඞ්ඛතාර්ථය දතයුතු යි.

චිත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තානන්තරියට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස වුට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස විවට්ටනට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස හෙතුට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පච්චයට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස වත්ථුට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස භුම්මට්ඨො.[3] අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස ආරම්මණට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස ගොචරට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස චරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස ගතට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස අභිනීහාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස නිස්සරණට්ඨො අභිඤ්ඤෙය්‍යො.

එකත්තෙ ආවජ්ජනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ විජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සඤ්ජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ එකොදට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ උපනිබන්ධනට්ඨො[4] අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පක්ඛන්දනට්ඨො[5] අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පසීදනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සන්තිට්ඨනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ විමුච්චනට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ 'එතං සන්ත'න්ති පස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ යානීකතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ වත්ථුකතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ අනුට්ඨිතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පරිචිතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සුසමාරද්ධට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පරිග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පරිවාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පරිපූරට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සමොධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ අධිට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ ආසෙවනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ බහුලීකම්මට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සුසමුග්ගතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සුවිමුත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ බුජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ අනුබුජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පටිබුජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සම්බුජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ බොධනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ අනුබොධනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පටිබොධනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සම්බොධනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ බොධපක්ඛියට්ඨො[7] අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ අනුබොධපක්ඛියට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පටිබොධපක්ඛියට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සම්බොධපක්ඛියට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ ජොතනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ උජ්ජොතනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ අනුජොතනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ පටිජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තෙ සඤ්ජොතනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

---

1. චිත්තානන්තරිතට්ඨො - PTS.: 2. හෙතට්ඨො - ස්‍යා.
3. භුමට්ඨො - මජ්සං. 4. උපනිබන්ධට්ඨො - ස්‍යා 5. පක්ඛන්ධනට්ඨො - ස
6. මුච්චනට්ඨො - ස, 7 බොධිපක්ඛියට්ඨො - මජ්සං, ස්‍යා PTS

(චිත්තයාගේ ආරම්මණ චින්තනාදි) චිත්තාර්ථය දතයුතු යැ. චිත්තයාගේ අනන්තරභාවාර්ථය දතයුතු යැ. (ගොත්‍රභූ-මාර්ග) චිත්තයාගේ (නිමිත්ත-නිමිත්තප්‍රවෘත්තියෙන්) ව්‍යුත්ථානාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (නිර්වාණයෙහි) විවර්තනාර්ථය දතයුතු යැ. චිත්තයාගේ හෙත්වර්ථය දතයුතු යැ. චිත්තයාගේ (වස්ත්වාලම්බනාදීන් පිළිබඳ) ප්‍රත්‍යයාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (චක්ෂුරාදි වස්තූන්ට) වස්තුභාවාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (කාමාවචරාදි) භූම්‍යර්ථය දතයුතු යැ. චිත්තයාගේ (රූපාදි) ආලම්බනාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (ආලම්බන) ගොචරාර්ථය දතයුතු යැ. චිත්තයාගේ චර්‍යාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (දූරසන්තික ආලම්බනග්‍රහණ වශයෙන්) ගත්‍යර්ථය දතයුතු යැ. චිත්තයාගේ (අරමුණු ගැනීමට) අභිනීහරණාර්ථය දතයුතු යැ. මාර්ගචිත්තයාගේ (වට්ටයෙන්) නිර්යාණාර්ථය දතයුතු යැ. චිත්තයාගේ නිස්සරණාර්ථය දතයුතු යි.

එකත්වයෙහි (එක් අරමුණෙහි) ආවර්ජනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි විජානනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි ප්‍රජානනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි සඤ්ජානනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි එකොදයාර්ථය දතයුතු යැ. එකත්වයෙහි උපනිබන්ධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ප්‍රථමධ්‍යාන වශයෙන්) ප්‍රස්කන්දනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ද්විතීයධ්‍යාන වශයෙන්) ප්‍රසීදනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (තෘතීයධ්‍යාන වශයෙන්) සන්තිට්ඨනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (චතුර්ථධ්‍යාන වශයෙන්) විමුච්චනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ප්‍රත්‍යවෙක්ෂා වශයෙන්) 'තෙල ශාන්ත යැ'යි දර්ශනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි යානීකෘතාර්ථය (යෙදූ යානයක් මෙන් කළ අර්ථය) දතයුතු යැ. එකත්වයෙහි මැනැවින් පටන්ගන්නා ලද වීර්‍යය ඇති බව දතයුතු යැ. එකත්වයෙහි පරිග්‍රහාර්ථය දතයුතු යැ. එකත්වයෙහි පරිවාරාර්ථය දතයුතු යැ. එකත්වයෙහි පරිපූරාර්ථය දතයුතු යැ. එකත්වයෙහි සමවධානාර්ථය දතයුතු යැ. එකත්වයෙහි අධිෂ්ඨානාර්ථය දතයුතු යැ. එකත්වයෙහි ආසෙවනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි භාවනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි බහුලවශයෙන් කරන බව දතයුතු යැ. එකත්වයෙහි මොනොවට නැඟීසිටි බව දතයුතු යැ. එකත්වයෙහි මොනොවට මිදුණ බව දතයුතු යැ. එකත්වයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) අවබොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) අනුබොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අර්හත්මාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) බොධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) අනුබොධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධනාර්ථය දතයුතු යැ එකත්වයෙහි අර්හත්මාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) බොධිපාක්ෂිකාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ අනුබොධිපාක්ෂිකාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධිපාක්ෂිකාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අර්හත්මාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධිපාක්ෂිකාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (විදර්ශනාප්‍රඥාවශයෙන්) ජ්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගඥානවශයෙන්) උද්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගඥාන වශයෙන්) අනුද්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අනාගාමිමාර්ගඥානවශයෙන්) ප්‍රතිද්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අර්හත්මාර්ගඥානවශයෙන්) සංද්‍යොතනාර්ථය දතයුතුයි.

පකාසනට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, විරොචනට්ඨො අභිඤ්ඤෙය්‍යො, කිලෙසානං සන්තාපනට්ඨො අභිඤ්ඤෙය්‍යො, අමලට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමලට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිම්මලට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමයට්ඨො අභිඤ්ඤෙය්‍යො, විවෙකට්ඨො අභිඤ්ඤෙය්‍යො, විවෙකචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරාගට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරාගචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, වොස්සග්ගට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, වොස්සග්ගචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමුත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමුත්තිචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො.

ඡන්දට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

විරියට්ඨො[3] අභිඤ්ඤෙය්‍යො, විරියස්ස[4] මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

චිත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

වීමංසට්ඨො අභිඤ්ඤෙය්‍යො වීමංසාය මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

*දුක්ඛස්ස පීළනට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස සඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස සන්තාපට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස විපරිණාමට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සමුදයස්ස ආයූහනට්ඨො[5], අභිඤ්ඤෙය්‍යො, සමුදයස්ස නිදානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමුදයස්ස සඤ්ඤොගට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමුදයස්ස පලිබොධට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො.

---

1. පතාපනට්ඨො - මජසං, ස්‍යා, PTS, 2 වොසග්ගට්ඨො - මජසං,
3. විරියට්ඨො - මජසං, 4. විරියස්ස - මජසං,
5. ආයුහනට්ඨො - ස්‍යා, 6. පලිබොධනට්ඨො - PTS,
* දුක්ඛට්ඨොති ආදීනි මූලපදානි මරම්ම ඡට්ඨසඞ්ගීතිපොත්ථකාදීසු අධිකානි.

(ආයතීමාර්ගයාගේ) ප්‍රකාශනාර්ථය දතයුතු යැ. (ප්‍රභාස්වර බැවින්) විරොචනාර්ථය දතයුතු යැ. කෙලශයන්ගේ සන්තාපනාර්ථය දතයුතු යැ. (නිර්මල නිර්වාණාලම්බන බැවින්) අමලාර්ථය දතයුතු යැ. (සම්ප්‍රයුක්තමලරහිත බැවින්) විමලාර්ථය දතයුතු යැ. (ආලම්බන කරන මල රහිත බැවින්) නිර්මලාර්ථය දතයුතු යැ. (කෙලෙස් විෂම නැති බැවින්) ශමාර්ථය දතයුතු යැ. විවෙකාර්ථය දතයුතු යැ. විවෙකචර්යාර්ථය දතයුතු යැ. විරාගාර්ථය දතයුතු යැ. විරාගචර්යාර්ථය දතයුතු යැ. නිරොධාර්ථය දතයුතු යැ. නිරොධචර්යාර්ථය දතයුතු යැ. වොස්සග්ගාර්ථය දතයුතු යැ. වොස්සග්ගචර්යාර්ථය දතයුතු යැ. විමුක්ත්‍යර්ථය දතයුතු යැ. විමුක්තිචර්යාර්ථය දතයුතු.

(කර්තෘකාම්‍යතා) ඡන්දාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ මූලාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ (සහජාතයනට ප්‍රතිෂ්ඨා බැවින්) පාදාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ (අධිපති බැවින්) ප්‍රධානාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. ඡන්දයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ දර්ශනාර්ථය දතයුතු.

වීර්යාර්ථය දතයුතු යැ. වීර්යයාගේ මූලාර්ථය දතයුතු යැ. වීර්යයාගේ ප්‍රතිෂ්ඨාර්ථය දතයුතු යැ. වීර්යයාගේ ප්‍රධානාර්ථය දතයුතු යැ. වීර්යයාගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. වීර්යයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. වීර්යයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. වීර්යයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. වීර්යයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. වීර්යයාගේ දර්ශනාර්ථය දතයුතු.

(චින්තනාදි) චිත්තාර්ථය දතයුතු යැ. චිත්තයාගේ මූලාර්ථය දතයුතු යැ. චිත්තයාගේ ප්‍රතිෂ්ඨාර්ථය දතයුතු යැ. චිත්තයාගේ ප්‍රධානාර්ථය දතයුතු යැ. චිත්තයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. චිත්තයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. චිත්තයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. චිත්තයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. චිත්තයාගේ දර්ශනාර්ථය දතයුතු.

වීමංසාර්ථය දතයුතු යැ. වීමංසාවගේ මූලාර්ථය දතයුතු යැ. වීමංසාවගේ ප්‍රතිෂ්ඨාර්ථය දතයුතු යැ. වීමංසාවගේ ප්‍රධානාර්ථය දතයුතු යැ. වීමංසාවගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. වීමංසාවගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. වීමංසාවගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. වීමංසාවගේ උපස්ථානාර්ථය දතයුතු යැ. වීමංසාවගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. වීමංසාවගේ දර්ශනාර්ථය දතයුතු.

දුඃඛයාගේ පීඩනාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ සඞ්ඛතාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ සන්තාපාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ විපරිණාමාර්ථය දතයුතු.

සමුදයාගේ ආයූහනාර්ථය දතයුතු යැ. සමුදයාගේ නිදානාර්ථය දතයුතු යැ. සමුදයාගේ සංයොගාර්ථය දතයුතු යැ. සමුදයාගේ පරිබොධාර්ථය දතයුතු.

නිරොධස්ස නිස්සරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධස්ස විවෙකට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධස්ස අසඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධස්ස අමතට්ඨො අභිඤ්ඤෙය්‍යො.

මග්ගස්ස නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස හෙතුට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස ආධිපතෙය්‍යට්ඨො අභිඤ්ඤෙය්‍යො.

තථට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්චට්ඨො අභිඤ්ඤෙය්‍යො, පටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, අභිජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිජානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධම්මට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධාතුට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, ඤාතට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඵස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, අභිසමයට්ඨො අභිඤ්ඤෙය්‍යො.

නෙක්ඛම්මං අභිඤ්ඤෙය්‍යං, අබ්‍යාපාදො අභිඤ්ඤෙය්‍යො, ආලොකසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, අවික්ඛෙපො අභිඤ්ඤෙය්‍යො, ධම්මවවත්ථානං අභිඤ්ඤෙය්‍යං, ඤාණං අභිඤ්ඤෙය්‍යං, පාමොජ්ජං.[3] අභිඤ්ඤෙය්‍යං.

පඨමං ඣානං[4] අභිඤ්ඤෙය්‍යං, දුතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, තතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, චතුත්ථං ඣානං අභිඤ්ඤෙය්‍යං, ආකාසානඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා.

අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිබ්බිදානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ඛයානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, වයානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විපරිණාමානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනිමිත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අප්පණිහිතානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, සුඤ්ඤතානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අධිපඤ්ඤාධම්මවිපස්සනා අභිඤ්ඤෙය්‍යා, යථාභූතඤාණදස්සනං අභිඤ්ඤෙය්‍යං, ආදීනවානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, පටිසඞ්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විවට්ටානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

සොතාපත්තිමග්ගො අභිඤ්ඤෙය්‍යො, සොතාපත්තිඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, සකදාගාමිමග්ගො අභිඤ්ඤෙය්‍යො, සකදාගාමිඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, අනාගාමිමග්ගො අභිඤ්ඤෙය්‍යො, අනාගාමිඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, අරහත්තමග්ගො අභිඤ්ඤෙය්‍යො, අරහත්තඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා.

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං[5] අභිඤ්ඤෙය්‍යං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං.

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං අභිඤ්ඤෙය්‍යං, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං අභිඤ්ඤෙය්‍යං, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං අභිඤ්ඤෙය්‍යං, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං අභිඤ්ඤෙය්‍යං, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං අභිඤ්ඤෙය්‍යං.

---

1. හෙතට්ඨො - සයා. 2. ධාතට්ඨො - සයා, 3. පාමුජ්ජං - සයා,
4 පඨමජ්ඣානං (ආදි) සයා, PTS, විරියින්ද්‍රියං - මජසං

නිරෝධයාගේ නිස්සරණාර්ථය දතයුතු යැ. නිරෝධයාගේ විවේකාර්ථය දතයුතු යැ. නිරෝධයාගේ අසඞ්ඛතාර්ථය දතයුතු යැ. නිරෝධයාගේ අමෘතාර්ථය දතයුතු.

මාර්ගයාගේ නියර්‍යාණාර්ථය දතයුතු යැ. මාර්ගයාගේ හෙත්වර්ථය දතයුතු යැ. මාර්ගයාගේ දර්ශනාර්ථය දතයුතු යැ. මාර්ගයාගේ ආධිපත්‍යාර්ථය දතයුතු.

යථාසවභාවාර්ථය දතයුතු යැ. අනාත්මාර්ථය දතයුතු යැ. සත්‍යාර්ථය දතයුතු යැ. ප්‍රතිවේධාර්ථය දතයුතු යැ. වෙසෙසින් දතයුතු අර්ථය දතයුතු යැ. ඥාතතීරණපරිඥයෙන් දතයුතු අර්ථය දතයුතු යැ. ධර්මාර්ථය දතයුතු යැ. (ශූන්‍යතාදි) ධාත්වර්ථය දතයුතු යැ. දතහැකි අර්ථය දතයුතු යැ. සාක්ෂාත්-කර්තව්‍යාර්ථය දතයුතු යැ. ඥානයෙන් සපර්ශ කළයුතු අර්ථය දතයුතු යැ. (ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන්) මොනොවට අවබොධ කළයුතු අර්ථය දතයුතු.

නෛෂ්ක්‍රම්‍ය (කාමච්ඡන්ද ප්‍රතිපක්ෂඅලෝභ) ය දතයුතු යැ. අව්‍යාපාදය දතයුතු යැ. (ස්ත්‍යානමිද්ධප්‍රතිපක්ෂ) ආලෝකසංඥව දතයුතු යැ. අවික්ෂෙපය දතයුතු යැ. ධම්මවවත්ථාන (නිශ්චය) ය දතයුතු යැ. ඥානය දතයුතු යැ. (අරතිප්‍රතිපක්ෂ) ප්‍රාමොද්‍යය දතයුතු.

ප්‍රථමධ්‍යානය දතයුතු යැ. ද්විතීයධ්‍යානය දතයුතු යැ. තෘතීයධ්‍යානය දතයුතු යැ. චතුර්ථධ්‍යානය දතයුතු යැ. ආකාසානඤ්චායතන සමාපත්තිය දතයුතු යැ. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය දතයුතු යැ. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය දතයුතු යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය දතයුතු.

අනිත්‍යානුදර්ශනය දතයුතු යැ. දුඃඛානුදර්ශනය දතයුතු යැ. අනාත්මානුදර්ශනය දතයුතු යැ. නිර්වේදානුදර්ශනය දතයුතු යැ. විරාගානුදර්ශනය දතයුතු යැ. නිරෝධානුදර්ශනය දතයුතු යැ. ප්‍රතිනිඃසර්ගානුදර්ශනය දතයුතු යැ. ක්ෂයානුදර්ශනය දතයුතු යැ. ව්‍යයානුදර්ශනය දතයුතු යැ. විපරිණාමානු-දර්ශනය දතයුතු යැ. අනිමිත්තානුදර්ශනය දතයුතු යැ. අප්‍රණිහිතානුදර්ශනය දතයුතු යැ. ශූන්‍යතානුදර්ශනය දතයුතු යැ. අධිප්‍රඥ සඞ්ඛ්‍යාත ධර්මවිදර්ශනාව දතයුතු යැ. යථාභූතඥානදර්ශනය දතයුතු යැ. ආදීනවානුදර්ශනය දතයුතු යැ. පටිසඞ්ඛා (අනිත්‍ය-දුඃඛ-අනාත්මා)නුදර්ශනය දතයුතු යැ. විවර්තානුදර්ශන (ගොත්‍රභූඥාන)ය දතයුතු.

සෝවාන් මාර්ගය දතයුතු යැ. සෝවාන් ඵලසමාපත්තිය දතයුතු යැ. සකෘදාගාමී මාර්ගය දතයුතු යැ. සකෘදාගාමී ඵලසමාපත්තිය දතයුතු යැ. අනාගාමී මාර්ගය දතයුතු යැ. අනාගාමී ඵලසමාපත්තිය දතයුතු යැ අර්හත්මාර්ගය දතයුතු යැ. අර්හත්ඵලසමාපත්තිය දතයුතු.

අධිමොක්ෂ (නිශ්චය කිරීම්) අර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය දතයුතු යැ. ප්‍රග්‍රහ (උත්සාහ) අර්ථයෙන් වීර්යේන්ද්‍රිය දතයුතු යැ. අපිලාපන (අරමුණෙහි බැසගැනීම්) අර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය දතයුතු යැ. අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය දතයුතු යැ. දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය දතයුතු.

අශ්‍රද්ධායෙහි නො සැලෙන අර්ථයෙන් ශ්‍රද්ධාබලය දතයුතු යැ. කුසීත බැව්හි නො සැලෙන අර්ථයෙන් වීර්යබලය දතයුතු යැ. ප්‍රමාදයෙහි නො සැලෙන අර්ථයෙන් ස්මෘතිබලය දතයුතු යැ. ඖද්ධත්‍ය බැව්හි නො සැලෙන අර්ථයෙන් සමාධිබලය දතයුතු යැ. අවිද්‍යායෙහි නො සැලෙන අර්ථයෙන් ප්‍රඥාබලය දතයුතු.

උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො.

දස්සනට්ඨෙන සම්මාදිට්ඨි අභිඤ්ඤෙය්‍යා, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො අභිඤ්ඤෙය්‍යො, පරිග්ගහට්ඨෙන සම්මාවාචා අභිඤ්ඤෙය්‍යා, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො අභිඤ්ඤෙය්‍යො, වොදානට්ඨෙන සම්මාආජීවො අභිඤ්ඤෙය්‍යො, පග්ගහට්ඨෙන සම්මාවායාමො අභිඤ්ඤෙය්‍යො, උපට්ඨානට්ඨෙන සම්මාසති අභිඤ්ඤෙය්‍යා, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අභිඤ්ඤෙය්‍යො.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියා අභිඤ්ඤෙය්‍යා, අකම්පියට්ඨෙන බලා අභිඤ්ඤෙය්‍යා, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා අභිඤ්ඤෙය්‍යා, හෙතුට්ඨෙන මග්ගො අභිඤ්ඤෙය්‍යො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා අභිඤ්ඤෙය්‍යා, පදහනට්ඨෙන සම්මප්පධානා අභිඤ්ඤෙය්‍යා, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා අභිඤ්ඤෙය්‍යා, තථට්ඨෙන සච්චා අභිඤ්ඤෙය්‍යා.

අවික්ඛෙපට්ඨෙන සමථො අභිඤ්ඤෙය්‍යො, අනුපස්සනට්ඨෙන විපස්සනා අභිඤ්ඤෙය්‍යා, එකරසට්ඨෙන සමථවිපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[1] අභිඤ්ඤෙය්‍යං.

සංවරට්ඨෙන සීලවිසුද්ධි අභිඤ්ඤෙය්‍යා, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි අභිඤ්ඤෙය්‍යා, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි අභිඤ්ඤෙය්‍යා, මුත්තට්ඨෙන විමොක්ඛො අභිඤ්ඤෙය්‍යො, පටිවෙධට්ඨෙන විජ්ජා අභිඤ්ඤෙය්‍යා, පරිච්චාගට්ඨෙන විමුත්ති අභිඤ්ඤෙය්‍යා, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං අභිඤ්ඤෙය්‍යං, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං අභිඤ්ඤෙය්‍යං.

ඡන්දො මූලට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, ඵස්සො සමොධානට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, වෙදනා සමොසරණට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, සමාධි පමුඛට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, සති ආධිපතෙය්‍යට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, පඤ්ඤා තදුත්තරට්ඨෙන[2] අභිඤ්ඤෙය්‍යා, විමුත්ති සාරට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිඤ්ඤෙය්‍යං.

යෙ යෙ ධම්මා අභිඤ්ඤාතා හොන්ති, තෙ තෙ ධම්මා ඤාතා හොන්ති, තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"න්ති.

අභිඤ්ඤෙය්‍යනිද්දෙසො.

දුතියක භාණවාරං.

1 යුගනද්ධං - මජසං. 2 තතුත්තරට්ඨෙන - මජසං.

අපිලාපනාර්ථයෙන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. විමසීම් අර්ථයෙන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. පැතිරීම් අර්ථයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. සන්හිඳීම් අර්ථයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. නො විසිරීම් අර්ථයෙන් සමාධිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. අනිත්‍යාදි විසින් ප්‍රත්‍යවෙක්ෂා කිරීම් අර්ථයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය දතයුතු.

(සත්‍ය) දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය දතයුතු යැ. අරමුණට නැඟීම් අර්ථයෙන් සම්‍යක්සංකල්පය දතයුතු යැ. (සතර වාක්සංවර) පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය දතයුතු යැ. (ත්‍රිවිධ කායසංවර) සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්තය දතයුතු යැ. පරිශුද්ධාර්ථයෙන් සම්‍යගාජීවය දතයුතු යැ. ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය දතයුතු යැ. අරමුණෙහි බැසගැනීම් අර්ථයෙන් සම්‍යක්ස්මෘතිය දතයුතු යැ. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය දතයුතු.

ආධිපත්‍යාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ. අකම්ප්‍යාර්ථයෙන් බලයෝ දතයුත්තාහ. නිර්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගයෝ දතයුත්තාහ. හෙත්වර්ථයෙන් මාර්ගය දතයුතු යැ. අපිලාපනාර්ථයෙන් සතිපට්ඨානයෝ දතයුත්තාහ. උත්සාහ කිරීම් අර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ දතයුත්තාහ. නිෂ්පත්ත්‍යර්ථයෙන් ඍද්ධිපාදයෝ දතයුත්තාහ. යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ දතයුත්තාහ.

අවික්ෂෙපාර්ථයෙන් ශමථය දතයුතු යැ. (අනිත්‍යාදිවශයෙන්) පුනපුනා බැලීම් අර්ථයෙන් විදර්ශනාව දතයුතු යැ. (විමුක්තිරසයෙන්) එකකෘත්‍යාර්ථයෙන් ශමථවිදර්ශනා දතයුතු යැ. නො ඉක්ම පවත්නා අර්ථයෙන් (ශමථ විදර්ශනාවන්ගේ) යුගනද්ධය දතයුතු.

සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය දතයුතු යැ. අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය දතයුතු යැ. මිදීම් අර්ථයෙන් (තදඞ්ග) විමොක්ෂය දතයුතු යැ. ජානනාර්ථයෙන් විද්‍යාව දතයුතු යැ. පරිත්‍යාගාර්ථයෙන් ඵලවිමුක්තිය දතයුතු යැ. සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂය (මාර්ග ඥානය) දතයුතු යැ. ප්‍රතිප්‍රශ්‍රබ්ධි-අර්ථයෙන් අනුත්පාද (ඵල ඥානය) දතයුතු යැ.

(කර්තුකාම්‍යතා) ඡන්දය මූලාර්ථයෙන් දතයුතු යැ. (යොනිසො) මනසිකාරය (කුසල් දහම් නඟන බැවින්) සමුත්ථානාර්ථයෙන් දතයුතු යැ. ස්පර්ශය සමවධානාර්ථයෙන් දතයුතු යැ. වෙදනාව සමොසරණ (රැස්වීම්) අර්ථයෙන් දතයුතු යැ. සමාධිය ප්‍රමුඛාර්ථයෙන් දතයුතු යැ. ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් දතයුතු යැ. (මාර්ග) ප්‍රඥාව තදුත්තර (ශ්‍රෙෂ්ඨ) අර්ථයෙන් දතයුතු යැ. (ඵල) විමුක්තිය (සපිර බැවින්) සාරාර්ථයෙන් දතයුතු යැ. අමෘතයට ප්‍රතිෂ්ඨාභූත නිර්වාණය පර්‍යවසාන (නිෂ්ඨා) අර්ථයෙන් දතයුතු යැ.

යම් යම් ධර්ම කෙනෙක් අභිමුඛ කොට දන්නා ලද වෙත් ද ඒ ඒ ධර්මයෝ ඥාතයෝ වෙති. ඒ ධර්මයන් දන්නා අර්ථයෙන් ඥාන වෙයි ප්‍රකාරයෙන් (දන්නා අර්ථයෙන්) ප්‍රඥා වේ. එයින් කියනු ලැබෙයි: **‘ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති සොතාවධානං, තංපජානනා පඤ්ඤා, සුතමයෙ ඤාණං’යි.**

**අභිඥෙයනිර්දෙශ යි.**

**දෙවැනි බණවර යි.**

## (1)

කථං 'ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො පරිඤ්ඤෙය්‍යො: ඵස්සො සාසවො උපාදානියො.
ද්වෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා: නාමඤ්ච රූපඤ්ච.
තයො ධම්මා පරිඤ්ඤෙය්‍යා: තිස්සො වෙදනා
චත්තාරො ධම්මා පරිඤ්ඤෙය්‍යා: චත්තාරො ආහාරා
පඤ්ච ධම්මා පරිඤ්ඤෙය්‍යා: පඤ්චුපාදානක්ඛන්ධා.
ඡ ධම්මා පරිඤ්ඤෙය්‍යා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි.
සත්ත ධම්මා පරිඤ්ඤෙය්‍යා: සත්ත විඤ්ඤාණට්ඨිතියො.
අට්ඨ ධම්මා පරිඤ්ඤෙය්‍යා: අට්ඨ ලොකධම්මා.
නව ධම්මා පරිඤ්ඤෙය්‍යා: නව සත්තාවාසා.
දස ධම්මා පරිඤ්ඤෙය්‍යා: දසායතනානි.

## (2)

සබ්බං භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යං, කිඤ්ච භික්ඛවෙ, සබ්බං පරිඤ්ඤෙය්‍යං.

චක්ඛුං[1] භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යං, රූපා පරිඤ්ඤෙය්‍යා, චක්ඛුවිඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං, චක්ඛුසම්ඵස්සො පරිඤ්ඤෙය්‍යො, යම්පිදං[2] චක්ඛුසම්ඵස්ස-පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පරිඤ්ඤෙය්‍යං.

සොතං පරිඤ්ඤෙය්‍යං, සද්දා පරිඤ්ඤෙය්‍යා -පෙ- ඝානං පරිඤ්ඤෙය්‍යං, ගන්ධා පරිඤ්ඤෙය්‍යා -පෙ- ජිව්හා පරිඤ්ඤෙය්‍යා, රසා පරිඤ්ඤෙය්‍යා -පෙ- කායො පරිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බා පරිඤ්ඤෙය්‍යා -පෙ- මනො පරිඤ්ඤෙය්‍යො, ධම්මා පරිඤ්ඤෙය්‍යා, මනොවිඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං, මනොසම්ඵස්සො පරිඤ්ඤෙය්‍යො, යම්පිදං[2] මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පරිඤ්ඤෙය්‍යං.[a]

රූපං පරිඤ්ඤෙය්‍යං, වෙදනා පරිඤ්ඤෙය්‍යා, සඤ්ඤා පරිඤ්ඤෙය්‍යා, සඞ්ඛාරා පරිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං, චක්ඛුං[1] පරිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං පරිඤ්ඤෙය්‍යං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පරිඤ්ඤෙය්‍යං -පෙ-

යෙසං යෙසං ධම්මානං පටිලාභත්ථාය වායමන්තස්ස තෙ තෙ ධම්මා පටිලද්ධා හොන්ති. එවං තෙ ධම්මා පරිඤ්ඤාතා චෙව හොන්ති තීරිතා ච.

නෙක්ඛම්මං පටිලාභත්ථාය වායමන්තස්ස නෙක්ඛම්මං පටිලද්ධං හොති. එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අබ්‍යාපාදං පටිලාභත්ථාය වායමන්තස්ස අබ්‍යාපාදො පටිලද්ධො හොති එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

---

1. චක්ඛු - මජසං. 2 යදිදං - PTS
a. වෙදනාසංයුත්ත - අනිච්චවග්ග පඤ්චමං,

## (1)

කිසෙයින් 'මේ ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහ' යන දේශනාව සෝතාවධාන (ශ්‍රැත)ය වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමය ඥාන වෙයි යත්:

එක් ධර්මයෙක් පිරිසිඳ දතයුතු වෙයි: සාස්‍රව වූ උපාදානයන්ට හිත වූ ස්පර්ශය යි.
ධර්මයෝ දෙදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: නාමරූපයෝ යි.
ධර්මයෝ තිදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: තුන් වේදනාවෝ යි.
ධර්මයෝ සතර දෙනෙක් පිරිසිඳ දතයුතු වෙති. සතර ආහාරයෝ යි.
ධර්මයෝ පස්දෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: පඤ්චෝපාදානස්කන්ධයෝ යි.
ධර්මයෝ සදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: ආධ්‍යාත්මික ෂඩායතනයෝ යි.
ධර්මයෝ සත්දෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: සප්තවිඥානස්ථිතීහු යි.
ධර්මයෝ අටදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: අෂ්ටලෝකධර්මයෝ යි.
ධර්මයෝ නවදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: නවසත්ත්වාවාසයෝ යි.
ධර්මයෝ දසදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: දස ආයතනයෝ යි.

## (2)

මහණෙනි, සියල්ල පිරිසිඳ දතයුතුයැ. මහණෙනි, පිරිසිඳ දතයුතු සියල්ල කවර යත්:

මහණෙනි, චක්ෂුස පිරිසිඳ දතයුතු යැ. රූපයෝ පිරිසිඳ දතයුත්තාහ. චක්ෂුර්විඥානය පිරිසිඳ දතයුතු යැ. චක්ඛුසම්ඵස්සය පිරිසිඳ දතයුතු යැ. චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වෙදයිතයෙක් උපදී නම් එ ද පිරිසිඳ දතයුතු යැ.

ශ්‍රෝත්‍රය පිරිසිඳ දතයුතු යැ. ශබ්දයෝ පිරිසිඳ දතයුත්තාහ ... ඝ්‍රාණය පිරිසිඳ දතයුතු යැ. ගන්ධයෝ පිරිසිඳ දතයුත්තාහ ... ජිහ්වාව පිරිසිඳ දතයුතු යැ. රසයෝ පිරිසිඳ දතයුත්තාහ .. කය පිරිසිඳ දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යය පිරිසිඳ දතයුතු යැ ... මනස පිරිසිඳ දතයුතු යැ. ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහ. මනෝවිඥානය පිරිසිඳ දතයුතු යැ. මනෝසම්ඵස්සය පිරිසිඳ දතයුතු යැ. මනෝසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වෙදයිතයෙක් උපදී නම්, එ ද පිරිසිඳ දතයුතු.

රූපය පිරිසිඳ දතයුතු යැ. වේදනාව පිරිසිඳ දතයුතු යැ. සංඥාව පිරිසිඳ දතයුතු යැ. සංස්කාරයෝ පිරිසිඳ දතයුත්තාහ. විඥානය පිරිසිඳ දතයුතු යැ. චක්ෂුස .... ජරාමරණය ... අමෘතයට ප්‍රතිෂ්ඨා වූ නිර්වාණය නිෂ්ඨාර්ථයෙන් පිරිසිඳ දතයුතු යැ.

යම් යම් ධර්ම කෙනකුන් ප්‍රතිලාභය සඳහා වෑයම් කරන්නහු විසින් ඒ ඒ ධර්මයෝ ලබන ලද්දාහු වෙත් ද, මෙසේ ඒ ධර්මයෝ පිරිසිඳ දත්තාහු ද තීරණය කරන ලද්දාහු ද වෙත්.

නෛෂ්ක්‍රම්‍යය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් නෛෂ්ක්‍රම්‍යය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

අව්‍යාපාදය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් අව්‍යාපාදය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

ආලොකසඤ්ඤං පටිලාභත්ථාය වායමන්තස්ස ආලොකසඤ්ඤා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අවික්ඛෙපං පටිලාභත්ථාය වායමන්තස්ස අවික්ඛෙපො පටිලද්ධො හොති. එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ධම්මවවත්ථානං පටිලාභත්ථාය වායමන්තස්ස ධම්මවවත්ථානං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ඤාණං පටිලාභත්ථාය වායමන්තස්ස ඤාණං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පාමොජ්ජං[1], පටිලාභත්ථාය වායමන්තස්ස පාමොජ්ජං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පඨමං ඣානං[2] පටිලාභත්ථාය වායමන්තස්ස පඨමං ඣානං[2] පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං පටිලාභත්ථාය වායමන්තස්ස චතුත්ථං ඣානං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස ආකාසානඤ්චායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස විඤ්ඤාණඤ්චායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනිච්චානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අනිච්චානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

දුක්ඛානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස දුක්ඛානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනත්තානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අනත්තානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

නිබ්බිදානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස නිබ්බිදානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

---

1. පාමුජ්ජං - ස්‍යා, 2. පඨමජ්ඣානං - PTS.

ආලොකසංඥාව ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ආලොක සංඥාව ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

අවික්ෂෙපය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් අවික්ෂෙපය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

ධම්මවවත්ථාන (විචිකිත්සා ප්‍රතිපක්ෂඥාන)ය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ධම්මවවත්ථානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

(අවිද්‍යා ප්‍රතිපක්ෂ) ඥානය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ඥානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ප්‍රාමොද්‍ය(අරතිප්‍රතිපක්ෂප්‍රීති)ය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ප්‍රාමොද්‍යය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ප්‍රථමධ්‍යානය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ප්‍රථමධ්‍යානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ද්විතීයධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් චතුර්ථධ්‍යානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

ආකාසානඤ්චායතනසමාපත්තිය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ආකාසානඤ්චායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසෙ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ලබනු පිණිස වෑයම් කරන්නහු, විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනිච්චානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනිච්චානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ

දුක්ඛානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් දුක්ඛානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනත්තානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනත්තා-නුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

නිබ්බිදානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් නිබ්බිදානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

විරාගානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස විරාගානුපස්සනා පටි-ලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච

නිරොධානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස නිරොධානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පටිනිස්සග්ගානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස පටිනිස්සග්ගානු-පස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ඛයානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස ඛයානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

වයානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස වයානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

විපරිණාමානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස විපරිණාමානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනිමිත්තානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අනිමිත්තානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අප්පණිහිතානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අප්පණිහිතානු-පස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

සුඤ්ඤතානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස සුඤ්ඤතානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අධිපඤ්ඤාධම්මවිපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අධිපඤ්ඤාධම්ම-විපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච

යථාභූතඤාණදස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස යථාභූතඤාණ-දස්සනං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ආදීනවානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස ආදීනවානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පටිසඞ්ඛානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස පටිසඞ්ඛානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

විරාගානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විරාගානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

නිරොධානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් නිරො-ධානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

පටිනිස්සග්ගානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් පටිනිස්සග්ගානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ

ඛයානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ඛයානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

වයානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් වයානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

විපරිණාමානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විපරි-ණාමානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනිමිත්තානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනි-මිත්තානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අප්පණිහිතානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අප්පණිහිතානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

සුඤ්ඤතානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් සුඤ්ඤ-තානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ·

අධිපඤ්ඤාධම්මවිපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අධිපඤ්ඤාධම්මවිපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

යථාභූතඥානදර්ශනය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් යථා-භූතඥානදර්ශනය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ආදීනවානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ආදීන-වානුපස්සනාව ලද්දී වෙයි මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

පටිසඞ්ඛානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් පටි-සඞ්ඛානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

විවට්ටානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස විවට්ටානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස සොතාපත්තිමග්ගො පටිලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

සකදාගාමිමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස සකදාගාමිමග්ගො පටි-ලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනාගාමිමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස අනාගාමිමග්ගො පටිලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අරහත්තමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස අරහත්තමග්ගො පටි-ලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

යෙසං යෙසං ධම්මානං පටිලාභත්ථාය වායමන්තස්ස තෙ තෙ ධම්මා පටිලද්ධා හොන්ති, එවං තෙ ධම්මා පරිඤ්ඤාතා චෙව හොන්ති තීරිතා ච. **තං ඤාතට්ඨෙන ඤාණං**, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති "ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ"න්ති.

**පරිඤ්ඤෙය්‍යනිද්දෙසො.**

## (3)

කථං 'ඉමෙ ධම්මා පහාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො පහාතබ්බො: අස්මිමානො.

ද්වෙ ධම්මා පහාතබ්බා: අවිජ්ජා ච භවතණ්හා ච

තයො ධම්මා පහාතබ්බා: තිස්සො තණ්හා.

චත්තාරො ධම්මා පහාතබ්බා: චත්තාරො ඔඝා.

පඤ්ච ධම්මා පහාතබ්බා: පඤ්ච නීවරණානි

ඡ ධම්මා පහාතබ්බා: ඡ තණ්හාකායා.

සත්ත ධම්මා පහාතබ්බා: සත්තානුසයා.

අට්ඨ ධම්මා පහාතබ්බා: අට්ඨ මිච්ඡත්තා.

නව ධම්මා පහාතබ්බා: නව තණ්හා මූලකා

දස ධම්මා පහාතබ්බා: දස මිච්ඡත්තා.

විවට්ටානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විවට්ටානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ස්‍රොතාපත්තිමාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ස්‍රොතාපත්ති-මාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

සකෘදාගාමිමාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් සකෘදාගාමි-මාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනාගාමිමාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනාගාමි-මාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අර්හත්මාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අර්හත්මාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

යම් යම් ධර්මයන් ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ඒ ඒ ධර්මයෝ ලද්දාහු වෙති, මෙසේ ඒ ධර්මයෝ පරිඥාත ද තීරණය කරන ලද්දාහු ද වෙත්. ඒ දන්නා අර්ථයෙන් ඥාන වෙයි. ප්‍රකාරයෙන් දන්නා අර්ථයෙන් ප්‍රඥා වේ. එයින් කියනු ලැබෙයි. **"ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තං පජානනාපඤ්ඤා සුතමයෙ ඤාණං"**යි.

**පරිඥෙයනිර්දෙශ යි.**

## (3)

කිසෙයින් මේ ධර්මයෝ ප්‍රහාතව්‍යයෝ යැ යන දෙශනාව සොතාවධාන වේ ද, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමය ඥාන වේ ද යත්:

එක් ධර්මයෙක් ප්‍රහාතව්‍ය වෙයි: අස්මිමාන යි.

ධර්මයෝ දෙදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද යන දෙක යි.

ධර්මයෝ තිදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: ත්‍රිවිධ තෘෂ්ණාව යි.

ධර්මයෝ සතරදෙනෙක් ප්‍රාහතව්‍යයෝ යැ: චතුරොඝයෝ යි.

ධර්මයෝ පස්දෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: පඤ්චනීවරණයෝ යි.

ධර්මයෝ සදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: ෂට්තෘෂ්ණාකායයෝ යි.

ධර්මයෝ සත්දෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: සප්තඅනුශයධර්මයෝ යි.

ධර්මයෝ අටදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: අෂ්ටමිථ්‍යාත්වයෝ යි.

ධර්මයෝ නවදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: නව තෘෂ්ණාමූලකධර්මයෝ යි.

ධර්මයෝ දසදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: දශමිථ්‍යාත්වයෝ යි.

ද්වෙ පහානානි: සමුච්ඡෙදප්පහානං පටිප්පස්සද්ධිප්පහානං. සමුච්ඡෙදප්පහානඤ්ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො පටිප්පස්සද්ධිප්පහානඤ්ච ඵලක්ඛණෙ.

තීණි පහානානි: කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං, රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං, යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං නිරොධො, තස්ස නිස්සරණං නෙක්ඛම්මං පටිලද්ධස්ස කාමා පහීනා චෙව හොන්ති පරිච්චත්තා ච, ආරුප්පං පටිලද්ධස්ස රූපා පහීනා චෙව හොන්ති පරිච්චත්තා ච, නිරොධං පටිලද්ධස්ස සඞ්ඛාරා පහීනා චෙව හොන්ති පරිච්චත්තා ච.

චත්තාරි පහානානි: දුක්ඛසච්චං පරිඤ්ඤපටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති,[1] සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති,[1] නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති,[1] මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති.[1]

පඤ්ච පහානානි: වික්ඛම්භනප්පහානං තදඞ්ගප්පහානං සමුච්ඡෙදප්පහානං පටිප්පස්සද්ධිප්පහානං නිස්සරණප්පහානං. වික්ඛම්භනප්පහානඤ්ච නීවරණානං පඨමං ඣානං භාවයතො, තදඞ්ගප්පහානඤ්ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදප්පහානඤ්ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිප්පහානඤ්ච ඵලක්ඛණෙ, නිස්සරණප්පහානඤ්ච නිරොධො නිබ්බානං.

## (4)

"සබ්බං භික්ඛවෙ, පහාතබ්බං, කිඤ්ච භික්ඛවෙ, සබ්බං පහාතබ්බං:

චක්ඛුං[2], භික්ඛවෙ, පහාතබ්බං, රූපා පහාතබ්බා, චක්ඛුවිඤ්ඤාණං පහාතබ්බං, චක්ඛුසම්ඵස්සො පහාතබ්බො, යම්පිදං[3], චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පහාතබ්බං.

සොතං පහාතබ්බං, සද්දා පහාතබ්බා, -පෙ- ඝානං පහාතබ්බං, ගන්ධා පහාතබ්බා -පෙ- ජිව්හා පහාතබ්බා, රසා පහාතබ්බා -පෙ- කායො පහාතබ්බො, ඵොට්ඨබ්බා පහාතබ්බා -පෙ- මනො පහාතබ්බො, ධම්මා පහාතබ්බා, මනොවිඤ්ඤාණං පහාතබ්බං, මනොසම්ඵස්සො පහාතබ්බො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පහාතබ්බං.[a]

---

1. පජහති - පු, මජසං, සං. 2. චක්ඛු - මජසං.
3. යදිදං - PTS.
a. වෙදනාසංයුත්ත - අනිච්චවග්ග ඡට්ඨං.

ප්‍රහාණයෝ දෙදෙනෙකි: සමුච්ඡේදප්‍රහාණ යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ යි. ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩන්නහුට සමුච්ඡේදප්‍රහාණය ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණය ද වේ.

ප්‍රහාණයෝ තිදෙනෙකි: යම් නෛෂ්ක්‍රම්‍යයෙක් වේ ද, තෙල කාමයන්ගේ නිඃසරණ යැ. යම් අරූපධ්‍යානයෙක් වේ ද, තෙල රූපයන්ගේ නිඃසරණ යැ. උපන්නා වූ ප්‍රත්‍යයන් විසින් කරන ලද ප්‍රතීත්‍යසමුත්පන්න (ඒ ඒ ප්‍රත්‍යයන් නිසා උපන්) වූ යම්කිසි සංස්කාරයෙක් වේ ද, අර්හත්ඵල නිරොධය ඒ සංස්කාරයාගේ නිඃසරණ යි. (අශුභධ්‍යාන-අනාගාමිමාර්ග සඞ්ඛ්‍යාත) නෛෂ්ක්‍රම්‍යය ලැබුවහු විසින් කාමයෝ (විෂ්කම්භණ සමුච්ඡේද විසින්) ප්‍රහීණ කරන ලද්දාහු ද පරිත්‍යාග කරන ලද්දාහු ද වෙති. (අරූපධ්‍යාන – අර්හත්මාර්ග සඞ්ඛ්‍යාත) ආරූප්‍ය නිඃසරණය ලැබුවහු විසින් රූපයෝ (විෂ්කම්භණසමුච්ඡේද විසින්) ප්‍රහීණ කරන ලද්දාහු ද පරිත්‍යාග කරන ලද්දාහු ද වෙති. (නිර්වාණ-අර්හත්ඵල සඞ්ඛ්‍යාත) නිරොධ නිඃසරණය ලැබුවහු විසින් (නිඃසරණ-ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණයෙන්) සංස්කාරයෝ ප්‍රහීණ කරන ලද්දාහු ද පරිත්‍යාග කරන ලද්දාහු ද වෙත්.

ප්‍රහාණයෝ සතර දෙනෙකි: පරිඥාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ දුඃඛසත්‍යය දුරු කෙරෙයි. ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ සමුදයසත්‍යය දුරු කෙරෙයි. සාක්‍ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ නිරොධසත්‍යය දුරු කෙරෙයි. භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ මාර්ගසත්‍යය දුරු කෙරේ.

ප්‍රහාණයෝ පස්දෙනෙකි: විෂ්කම්භණප්‍රහාණ යැ. තදඞ්ගප්‍රහාණ යැ. සමුච්ඡේදප්‍රහාණ යැ. ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ යැ. නිඃසරණප්‍රහාණ යි. ප්‍රථමධ්‍යානය වඩන්නහුට නීවරණයන්ගේ විෂ්කම්භණප්‍රහාණය ද, විදර්ශනාසම්ප්‍රයුක්තසමාධිය වඩන්නහුට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගප්‍රහාණය ද, ලොකොත්තර වූ ක්‍ෂය (නිර්වාණ) ගාමිමාර්ගය වඩන්නහුට සමුච්ඡේදප්‍රහාණය ද, ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණය ද, නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිඃසරණප්‍රහාණය ද වේ.

## (4)

මහණෙනි, සියල්ල ප්‍රහාතව්‍ය යැ. මහණෙනි, කවර සියල්ල ප්‍රහාතව්‍ය වෙයි යත්:

"මහණෙනි, චක්‍ෂුස ප්‍රහාතව්‍ය යැ. 'රූපයෝ ප්‍රහාතව්‍යයෝ යැ. චක්‍ෂුර්විඥානය ප්‍රහාතව්‍ය යැ. චක්‍ෂුර්විඥානසම්ප්‍රයුක්ත වූ ස්පර්ශය ප්‍රහාතව්‍ය යැ. චක්‍ෂුඃස්පර්ශප්‍රත්‍යයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද ප්‍රහාතව්‍ය යැ.

ශ්‍රොත්‍රය ප්‍රහාතව්‍ය යැ. ශබ්දයෝ ප්‍රහාතව්‍යයෝ යැ. ... ඝ්‍රාණය ප්‍රහාතව්‍ය යැ. ගන්ධයෝ ප්‍රහාතව්‍යයෝ යැ ... ජිහ්වාව ප්‍රහාතව්‍ය යැ. රසයෝ ප්‍රහාතව්‍යයෝ යැ ... කාය ප්‍රහාතව්‍ය යැ. ස්ප්‍රෂ්ටව්‍යයෝ ප්‍රහාතව්‍යයෝ යැ .. මනස ප්‍රහාතව්‍ය යැ. ධර්මයෝ ප්‍රහාතව්‍යයෝ යැ. මනොවිඥානය ප්‍රහාතව්‍ය යැ. මනොවිඥානසම්ප්‍රයුක්ත වූ ස්පර්ශය ප්‍රහාතව්‍ය යැ. මනඃස්පර්ශයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද ප්‍රහාතව්‍ය යි.

රූපං පස්සන්තො පජහාති, වෙදනං පස්සන්තො පජහාති, සඤ්ඤං පස්සන්තො පජහාති, සඞ්ඛාරෙ පස්සන්තො පජහාති, විඤ්ඤාණං පස්සන්තො පජහාති, චක්ඛුං –පෙ– ජරාමරණං –පෙ– අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පස්සන්තො පජහාති.

යෙ යෙ ධම්මා පහීනා හොන්ති, තෙ තෙ ධම්මා පරිච්චත්තා හොන්ති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති. "ඉමෙ ධම්මා පහාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ"න්ති.

**පහාතබ්බනිද්දෙසො**

**තතියො භාණවාරො.**

## (5)

කථං ඉමෙ ධම්මා භාවෙතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො භාවෙතබ්බො: කායගතා සති සාතසහගතා.

ද්වෙ ධම්මා භාවෙතබ්බා: සමථො ච විපස්සනා ච.

තයො ධම්මා භාවෙතබ්බා: තයො සමාධී.

චත්තාරො ධම්මා භාවෙතබ්බා: චත්තාරො සතිපට්ඨානා.

පඤ්ච ධම්මා භාවෙතබ්බා: පඤ්චඞ්ගිකො සමාධි.[1]

ඡ ධම්මා භාවෙතබ්බා: ඡ අනුස්සතිට්ඨානානි.

සත්ත ධම්මා භාවෙතබ්බා: සත්ත බොජ්ඣඞ්ගා.

අට්ඨ ධම්මා භාවෙතබ්බා: අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

නව ධම්මා භාවෙතබ්බා: නව පාරිසුද්ධිපධානියඞ්ගානි.[2]

දස ධම්මා භාවෙතබ්බා: දස කසිණායතනානි.

---

1. සම්මා සමාධි - ස්‍යා, 2. පාරිසුද්ධිප්පධානියඞ්ගානි - ස්‍යා,

රූපය (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. වේදනාව (අනිත්‍යාදිවශයෙන්, දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. සංඥව (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. සංසකාරයන් (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. විඥනය (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. චක්ෂුස ... ජරාමරණය ... අමතොගධ නිර්වාණය නිෂ්ඨාර්ථයෙන් දක්මින් (කෙලෙසුන්) දුරු කෙරේ.

යම් යම් ධර්ම කෙනෙක් ප්‍රහීණ වූවාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ පරිත්‍යාග කරන ලද්දාහු වෙත්. එය ඥතාර්ථයෙන් ඥන යෑ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යෑ. එයින් කියනු ලැබෙයි **"ඉමෙ ධම්මා පහාතබ්බා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"** යි.

**ප්‍රහාතව්‍යනිර්දෙශ යි.**

**තුන් වැනි බණවර යි**

## (5)

කිසෙයින් **'මේ ධර්මයෝ වැඩියයුත්තාහ,** යන දෙශනාව සොතාවධාන වෙයි, එය දනගන්නා ප්‍රඥව ශ්‍රුතමයඥන වෙයි යත්:

එක් ධර්මයෙක් වැඩිය යුතු යෑ: (මධුරසුඛවෙදනා සඞ්ඛ්‍යාත) සාතය හා සම්ප්‍රයුකත කායගතාසතිය යි:

ධර්මයෝ දෙදෙනෙක් වැඩියයුත්තාහ: ශමථය ද විදර්ශනාව ද යන දෙක යි.

ධර්මයෝ තිදෙනෙක් වැඩියයුත්තාහු යෑ: (සවිතර්කසවිචාරාදි) තුන් සමාධිහු යෑ.

ධර්මයෝ සතර දෙනෙක් වැඩියයුත්තාහු යෑ: (කායානුපස්සනාදි) සතරසතිපට්ඨානයෝ යි.

ධර්මයෝ පස්දෙනෙක් වැඩිය යුත්තාහු යෑ: (පීතිඵරණතාදි) පඤ්චාඞ්ගික වූ චතුර්ථධ්‍යානසමාධිය යි.

ධර්මයෝ සදෙනෙක් වැඩියයුත්තාහු යෑ: (බුද්ධානුස්සති ආදි) සවැදෑරුම් අනුස්මෘතිස්ථානයෝ යි.

ධර්මයෝ සත්දෙනෙක් වැඩියයුත්තාහු යෑ: සප්තබොධ්‍යඞ්ගයෝ යි.

ධර්මයෝ අටදෙනෙක් වැඩියයුත්තාහු යෑ: ආර්යඅෂ්ටාඞ්ගිකමාර්ගය යි.

ධර්මයෝ නවදෙනෙක් වැඩියයුත්තාහු යෑ: (ශීලවිශුද්ධිආදි) පරිශුද්ධභාවයට ප්‍රධාන කාරණ වූ නවධර්මයෝ යි:

ධර්මයෝ දසදෙනෙක් වැඩියයුත්තාහු යෑ: දසකසිණායතනයෝ යි.

ද්වෙ භාවනා: ලොකියා ච භාවනා, ලොකුත්තරා ච භාවනා.

තිස්සො භාවනා: රූපාවචරකුසලානං ධම්මානං භාවනා, අරූපාවචරකුසලානං ධම්මානං භාවනා, අපරියාපන්න[1] කුසලානං ධම්මානං භාවනා. රූපාවචරකුසලානං ධම්මානං භාවනා අත්ථි හීනා, අත්ථි මජ්ඣිමා, අත්ථි පණීතා. අරූපාවචරකුසලානං ධම්මානං භාවනා අත්ථි හීනා, අත්ථි මජ්ඣිමා, අත්ථි පණීතා. අපරියාපන්න කුසලානං ධම්මානං භාවනා පණීතා.

චතස්සො භාවනා: දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣන්තො භාවෙති, සමුදයසච්චං පහානපටිවෙධං[2] පටිවිජ්ඣන්තො භාවෙති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣන්තො භාවෙති, මග්ගසච්චං භාවනා පටිවෙධං පටිවිජ්ඣන්තො භාවෙති. ඉමා චතස්සො භාවනා.

අපරාපි චතස්සො භාවනා. එසනා භාවනා, පටිලාභා භාවනා, එකරසා භාවනා, ආසෙවනා භාවනා.

කතමා එසනා භාවනා: සබ්බෙසං සමාධිං සමාපජ්ජන්තානං තත්ථ ජාතා ධම්මා එකරසා හොන්තීති අයං එසනා භාවනා.

කතමා පටිලාභා භාවනා: සබ්බෙසං සමාධිං සමාපන්නානං තත්ථ ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති අයං පටිලාභා භාවනා.

කතමා එකරසා භාවනා: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං භාවයතො සද්ධින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං[3] භාවයතො විරියින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං භාවයතො සතින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං භාවයතො සමාධින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං භාවයතො පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං භාවයතො සද්ධාබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං භාවයතො විරියබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං භාවයතො සතිබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං භාවයතො සමාධිබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං භාවයතො පඤ්ඤාබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා.

1 අපරියාපන්නානං - සයා. 2 පහානපපටිවෙධං - මජසං, සයා.
3 වීරියින්ද්‍රියං - මජසං.

භාවනාවෝ දෙදෙනෙකි: ලෞකිකභාවනා යැ, ලොකොත්තරභාවනා යි.

භාවනාවෝ තිදෙනෙකි: රූපාවචරකුශලධර්මයන්ගේ භාවනා යැ, අරූපාවචරකුශලධර්මයන්ගේ භාවනා යැ, අපර්‍යාපන්න (ලොකොත්තර) කුශල ධර්මයන්ගේ භාවනා යි. රූපාවචරකුශලධර්මයන්ගේ හීන වූ භාවනාවක් ඇත. මධ්‍ය වූ භාවනාවක් ඇත. ප්‍රණීත වූ භාවනාවක් ඇති. අරූපාවචර කුශලධර්මයන්ගේ හීන වූ භාවනාවක් ඇත. මධ්‍ය වූ භාවනාවක් ඇත. ප්‍රණීත වූ භාවනාවක් ඇති. අපර්‍යාපන්නකුශලධර්මයන්ගේ භාවනාව ප්‍රණීත යි.

භාවනා සතරෙකි: දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙමින් (ආර්‍යමාර්ගය) වඩයි. සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙමින් වඩයි. නිරොධසත්‍යය සාක්‍ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙමින් වඩයි. මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙමින් වඩයි. මොහු සතරභාවනා යි.

අනෙකුදු භාවනා සතරෙකි. එසනභාවනා යැ. පටිලාභභාවනා යැ. එකරසභාවනා යැ. ආසෙවනභාවනා යි.

එසනභාවනා කවර යත්: සමවතට සමවන් සියල්ලන්ගේ ඒ පූර්වභාගයෙහි උපන් ධර්මයෝ අර්ථණොත්පාදනයෙහි සමානකෘත්‍ය වෙත් නු යි මේ එසනභාවනා යැ.

ප්‍රතිලාභභාවනා කවර යත්: සමවතට සමවන් සියල්ලන්ගේ එහි උපන් ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්ම පවත්නාහු නු යි මේ ප්‍රතිලාභභාවනා යැ.

එකරසභාවනා කවර යත්: අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය වඩන්නහුට ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ (විමුක්තිරසයෙන්) එකකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යැ. ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රිය වඩන්නහුට වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අපිලාපනාර්ථයෙන් සමෘතීන්ද්‍රිය වඩන්නහුට සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වඩන්නහුට සමාධීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය වඩන්නහුට ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි.

අශ්‍රද්ධායෙහි අකම්පාර්ථයෙන් ශ්‍රද්ධාබලය වඩන්නහුට ශ්‍රද්ධාබලයාගේ වශයෙන් සතර බලයෝ සමානකෘත්‍ය වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. කෞසීද්‍යයෙහි අකම්පාර්ථයෙන් වීර්‍යබලය වඩන්නහුට වීර්‍යබලයාගේ වශයෙන් සතරබලයෝ සමානකෘත්‍ය වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රමාදයෙහි අකම්පාර්ථයෙන් සමෘතිබලය වඩන්නහුට සමෘතිබලයාගේ වශයෙන් සතර බලයෝ එකරස වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ඖද්ධත්‍යයෙහි අකම්පාර්ථයෙන් සමාධිබලය වඩන්නහුට සමාධිබලයාගේ වශයෙන් සතර බලයෝ එකරස වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අවිද්‍යායෙහි අකම්පාර්ථයෙන් ප්‍රඥාබලය වඩන්නහුට ප්‍රඥාබලයාගේ වශයෙන් සතර බලයෝ එකරස වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි.

උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගං භාවයතො සතිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවයතො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගං භාවයතො විරියසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගං භාවයතො පීතිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවයතො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගං භාවයතො සමාධිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවයතො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා.

දස්සනට්ඨෙන සම්මාදිට්ඨිං භාවයතො සම්මාදිට්ඨියා වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පං භාවයතො සම්මාසඞ්කප්පස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පරිග්ගහට්ඨෙන සම්මාවාචං භාවයතො සම්මාවාචාය වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තං භාවයතො සම්මාකම්මන්තස්ස වසෙන සත්ත මග්ගඞ්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, වොදානට්ඨෙන සම්මාආජීවං භාවයතො සම්මාආජීවස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පග්ගහට්ඨෙන සම්මාවායාමං භාවයතො සම්මාවායාමස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, උපට්ඨානට්ඨෙන සම්මාසතිං භාවයතො සම්මාසතියා වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධිං භාවයතො සම්මාසමාධිස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා. අයං එකරසා භාවනා.

කතමා ආසෙවනා භාවනා: “ඉධ භික්ඛු පුබ්බන්හසමයම්පි[1] ආසෙවති, මජ්ඣන්තිකසමයම්පි[2] ආසෙවති, සායන්හසමයම්පි ආසෙවති, පුරෙභත්තම්පි ආසෙවති, පච්ඡාභත්තම්පි ආසෙවති, පුරිමෙපි යාමෙ ආසෙවති, මජ්ඣිමෙපි යාමෙ ආසෙවති, පච්ඡිමෙපි යාමෙ ආසෙවති, රත්තිම්පි ආසෙවති, දිවාපි ආසෙවති, රත්තින්දිවාපි ආසෙවති, කාලෙපි ආසෙවති, ජුණ්හෙපි ආසෙවති, වස්සෙපි ආසෙවති, හෙමන්තෙපි ආසෙවති, ගිම්හෙපි ආසෙවති, පුරිමෙපි වයොඛන්ධෙ ආසෙවති, මජ්ඣිමෙපි වයොඛන්ධෙ ආසෙවති, පච්ඡිමෙපි වයොඛන්ධෙ ආසෙවති. අයං ආසෙවනා භාවනා.

ඉමා චතස්සො භාවනා.

1 පුබ්බණ්හසමයං - මජසං. 2 මජ්ඣණ්හිකසමයම්පි - මජසං.

අපිලාපනාර්ථයෙන් සමෘතිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට සමෘතිසම්බො-ධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ග-යන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රවිචයාර්ථයෙන් ධර්මවිචයසම්බො-ධ්‍යඞ්ගය වඩන්නහුට ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ග යෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එක-රසාර්ථයෙන් භාවනා යැ. ස්ඵරණ (පැතිරීම්) අර්ථයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. උපශමාර්ථ-යෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එක-රසාර්ථයෙන් භාවනා යැ. අවික්ෂෙපාර්ථයෙන් සමාධිසම්බොධ්‍යඞ්ගය වඩන්-නහුට සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රතිසඞ්ඛ්‍යා-නාර්ථයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග-යාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි.

දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය වඩන්නහුට සම්‍යග්දෘෂ්ටියගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සංකල්පය වඩන්නහුට සම්‍යක් සංකල්පයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ග-යන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය වඩන්නහුට සම්‍යග්වචනයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. සමුත්ථානාර්ථ-යෙන් සම්‍යක්කර්මාන්තය වඩන්නහුට සම්‍යක්කර්මාන්තයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ව්‍යවදාන (පාරිශුද්ධි) අර්ථයෙන් සම්‍යගාජීවය වඩන්නහුට සම්‍යගාජීවයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ග-යන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය වඩන්නහුට සම්‍යග්ව්‍යායාමයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. උපස්ථා-නාර්ථයෙන් සම්‍යක්සමෘතිය වඩන්නහුට සම්‍යක්සමෘතියගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථ-යෙන් භාවනා යැ. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය වඩන්නහුට සම්‍යක්සමාධිහුගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි. මේ එකරස භාවනා යි.

ආසෙවනභාවනා කවර යත්: "මෙ සස්නෙහි මහණ තෙම පෙරවරු කාලයෙහි දු (වශීප්‍රාප්තසමාධිය) ආසෙවන කෙරෙයි. මධ්‍යාහ්නකාලයෙහි දු ආසෙවන කෙරෙයි. සවස්කාලයෙහි දු ආසෙවන කෙරෙයි. පෙරබත්හි දු ආසෙවන කෙරෙයි. පසුබත්හි දු ආසෙවන කෙරෙයි. පෙරයම්හි දු ආසෙවන කෙරෙයි. මැදියම්හි දු ආසෙවන කෙරෙයි. අළුයම්හි දු ආසෙවන කෙරෙයි. රැයි දු ආසෙවන කෙරෙයි. දවල්හි දු ආසෙවන කෙරෙයි. රෑදවල්හි දු ආසෙවන කෙරෙයි. කෘෂ්ණපක්ෂයෙහි දු ආසෙවන කෙරෙයි. ශුක්ලපක්ෂ-යෙහි දු ආසෙවන කෙරෙයි. වසන්හි දු ආසෙවන කෙරෙයි. හිමන්හි දු ආසෙවන කෙරෙයි. ගිම්හන්හි දු ආසෙවන කෙරෙයි. පළමුවයස්හි දු ආසෙවන කෙරෙයි. මැදිම්වයස්හි දු ආසෙවන කෙරෙයි. පැසිම්වයස්හි දු (වශීප්‍රාප්තසමාධිය) ආසෙවන කෙරෙයි. මේ ආසෙවනභාවනා යි.

මොහු සතර භාවනා යි.

අපරාපි චතස්සො භාවනා: තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්‍ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

කථං තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා:

කාමච්ඡන්‍දං පජහතො නෙක්ඛම්මවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා. බ්‍යාපාදං පජහතො අබ්‍යාපාදවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ථීනමිද්ධං[1] පජහතො ආලොකසඤ්ඤාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, උද්ධච්චං පජහතො අවික්ඛෙපවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, විචිකිච්ඡං පජහතො ධම්මවවත්‍ථානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අවිජ්ජං පජහතො ඤාණවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අරතිං පජහතො පාමොජ්ජවසෙන[2] ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

නීවරණෙ[3]. පජහතො පඨමජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, විතක්කවිචාරෙ පජහතො දුතියජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, පීතිං පජහතො තතියජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සුඛදුක්ඛෙ පජහතො චතුත්‍ථජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

1. ථිනමිද්ධං - මජසං. 2. පාමුජ්ජවසෙන - ස්‍යා 3. නීවරණෙ - PTS සී.

අනෙකුදු භාවනා සතරෙකි· (නෙක්ඛම්මාදි) භාවනාවිශෙෂයෙහි උපන් (සමාධි පඤ්ඤා සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්මැ පවත්නා බැවින් භාවනා යැ. (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන්ගේ එකරස භාවයෙන් භාවනා යැ. තදනුවත්තික වීර්‍ය්‍යවිධුරභාවයෙන් භාවනා යැ. ආසෙවනභාවයෙන් භාවනා යි

කිසෙයින් ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් (නො ඉක්මැ පවත්නා බැවින්) වූ භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නාහට නෛෂ්ක්‍රම්‍යවශයෙන් උපන් (සමාධි-ප්‍රඥ සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ නෛෂ්ක්‍රම්‍යභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ව්‍යාපාදය දුරලන්නාහට අව්‍යාපාදවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අව්‍යාපාදභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ථිනමිද්ධය දුරලන්නාහට ආලොකසංඥවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආලොකසංඥභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණයෙන් වූ භාවනා යැ. ඖද්ධත්‍යය දුරලන්නාහට අවික්ෂෙපවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අවික්ෂෙපභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. විචිකිච්ඡාව දුරලන්නාහට ධර්මනිශ්චයවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ධම්මවවත්ථානභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අවිද්‍යාව දුරලන්නාහට ඥනවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ඥනභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අරතිය දුරලන්නාහට ප්‍රාමොද්‍යවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ප්‍රාමොද්‍යභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

නීවරණයන් දුරලන්නාහට ප්‍රථමධ්‍යානවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ප්‍රථමධ්‍යානභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ විතර්කවිචාරයන් දුරලන්නාහට ද්විතීයධ්‍යානවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ද්විතීයධ්‍යානභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ප්‍රීතිය දුරලන්නාහට තෘතීයධ්‍යානවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ තෘතීයධ්‍යානභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සුඛදුඃඛයන් දුරලන්නාහට චතුර්ථධ්‍යානවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ චතුර්ථධ්‍යානභාවනායෙහි උපන් ධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං පජහතො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආකාසානඤ්චායතනසඤ්ඤං පජහතො විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පජහතො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පජහතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

නිච්චසඤ්ඤං පජහතො අනිච්චානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සුඛසඤ්ඤං පජහතො දුක්ඛානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අත්තසඤ්ඤං පජහතො අනත්තානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, නන්දිං පජහතො නිබ්බිදානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, රාගං පජහතො විරාගානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සමුදයං පජහතො නිරොධානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආදානං පජහතො පටිනිස්සග්ගානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඝනසඤ්ඤං[1] පජහතො ඛයානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආයූහනං[2] පජහතො වයානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ධුවසඤ්ඤං පජහතො විපරිණාමානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, නිමිත්තං පජහතො අනිමිත්තානු-

1. ඝානසඤ්ඤං - PTS 2. ආයුහනං - සං PTS

රූපසංඥාව – ප්‍රතිඝසංඥාව – නානාත්වසංඥාව දුරලන්නාහට ආකාසා-
නඤ්චායතන සමාපත්තිවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන්
නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආකාසානඤ්චායතන සමාපත්තිභාවනා-
යෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.
ආකාසානඤ්චායතනසංඥාව දුරලන්නාහට විඤ්ඤාණඤ්චායතනසමාපත්ති
වශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු
නු යි ඒ විඤ්ඤාණඤ්චායතනසමාපත්තිභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන්
අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. විඤ්ඤාණඤ්චායතනසංඥාව දුර-
ලන්නාහට ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ
ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති
භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.
ආකිඤ්චඤ්ඤායතනසංඥාව දුරලන්නාහට නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමා-
පත්තිවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්-
නාහු නු යි ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතනභාවනායෙහි උපන් යුගනද්ධ
ධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

නිත්‍යසංඥාව දුරලන්නාහට අනිත්‍යානුදර්ශනාවශයෙන් උපන් යුග-
නද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනිත්‍යානු-
දර්ශනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.
සුඛසංඥාව දුරලන්නාහට දුඃඛානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ
ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ දුඃඛානුදර්ශනායෙහි උපන්
යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආත්මසංඥාව දුර-
ලන්නාහට අනාත්මානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන්
නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනාත්මානුදර්ශනාභාවනායෙහි උපන්
යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. නන්දිය (සප්‍රීතික-
තෘෂ්ණාව) දුරලන්නාහට නිර්වේදානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ
ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ නිර්වේදානුදර්ශනාභාවනායෙහි
උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ, රාගය (නිෂ්ප්‍රී-
තිකතෘෂ්ණාව) දුරලන්නාහට විරාගානුදර්ශනා වශයෙන් උපන් යුගනද්ධ
ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්ම පවත්නාහු නු යි ඒ විරාගානුදර්ශනා
භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.
සමුදය දුරලන්නාහට නිරෝධානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ
ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ නිරෝධානුදර්ශනාභාවනායෙහි
උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආදානය
(ග්‍රහණය) දුරලන්නාහට පටිනිස්සග්ගානුපස්සනාවශයෙන් උපන් යුග-
නද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ පටිනිස්සග්ගා-
නුපස්සනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන්
වූ භාවනා යැ. ඝනසංඥාව දුරලන්නාහට ක්ෂයානුදර්ශනාවශයෙන් උපන්
යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ක්ෂයානු-
දර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ
භාවනා යැ. කර්මායූහනය දුරලන්නාහට ව්‍යයානුදර්ශනාවශයෙන් උපන්
යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ව්‍යයානු-
දර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ
භාවනා යැ. ධ්‍රැවසංඥාව දුරලන්නාහට විපරිණාමානුදර්ශනාවශයෙන් උපන්
යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ විපරිණා-
මානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන්

පස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, පණිධිං පජහන්තො අප්පණිහිතානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අභිනිවෙසං පජහන්තො සුඤ්ඤතානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සාරාදානාභිනිවෙසං පජහන්තො අධිපඤ්ඤාධම්මවිපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සම්මොහාභිනිවෙසං පජහන්තො යථාභූතඤාණදස්සනවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආලයාභිනිවෙසං පජහන්තො ආදීනවානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අප්පටිසඞ්ඛං පජහන්තො පටිසඞ්ඛානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සඤ්ඤොගාභිනිවෙසං පජහන්තො විවට්ටනානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

දිට්ඨෙකට්ඨෙ කිලෙසෙ පජහන්තො සොතාපත්තිමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඔළාරිකෙ කිලෙසෙ පජහන්තො සකදාගාමිමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අණුසහගතෙ කිලෙසෙ පජහන්තො අනාගාමිමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

එවං තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

වූ භාවනා යැ. (නිත්‍ය) නිමිත්තසංඥව දුරලන්නාහට අනිමිත්තානුදර්ශනා-වශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනිමිත්තානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ප්‍රණිධිය (සුඛ ප්‍රාර්ථනාව) දුරලන්නාහට අප්‍රණිහිතානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අප්‍රණිහිතානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආත්මාභිනිවේශය දුරලන්නාහට ශුන්‍යතානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවු-නොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ශුන්‍යතානුදර්ශනා භාවනා-යෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. නිත්‍යසාරආත්මසාරාදි විසින් ග්‍රහණයාගේ අභිනිවේශය දුරලන්නාහට අධිප්‍රඥධර්මවිදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අධිප්‍රඥධර්මවිදර්ශනාභාවනායෙහි උපන් යුග-නද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සම්මෝහාභිනිවේශය දුරලන්නාහට යථාභූතඥනදර්ශනවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවු-නොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ යථාභූතඥනදර්ශනභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආලයාභි-නිවේශය දුරලන්නාහට ආදීනවානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආදීනවානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අනුපාය-ග්‍රහණය දුරලන්නාහට පටිසඞ්ඛානුපස්සනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ පටිසඞ්ඛානුපස්සනාභාවනා-යෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සංයෝගාභිනිවේශය (කාමයෝගාදික්ලේශප්‍රවෘත්තිය) දුරලන්නාහට විවර්තා-නුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නා-හු නු යි ඒ විවර්තානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණ භාවයෙන් වූ භාවනා යැ.

දෘෂ්ටීන් හා සමග එක් තැන්හි සිටි ක්ලේශයන් දුරලන්නාහට ස්‍රොතා-පත්තිමාර්ගවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ස්‍රොතාපත්තිමාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ ඖදරික (කාමරාගව්‍යාපාද) ක්ලේශයන් දුරලන්නාහට සකෘදගාමිමාර්ගවශයෙන් උපන් යුගනද්ධ ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ සකෘදගාමිමාර්ග භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අණුසහගත (කාමරාග-ව්‍යාපාද) ක්ලේශයන් දුරලන්නාහට අනාගාමිමාර්ග වශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනාගාමිමාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණ-භාවයෙන් වූ භාවනා යැ. සියලු ක්ලේශයන් දුරලන්නාහට අර්හත්මාර්ග වශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අර්හත්මාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාව-යෙන් වූ භාවනා යි.

මෙසෙයින් ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධ ධර්මයන් අනතික්‍ර-මණභාවයෙන් වූ භාවනා යි.

කථං ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන පඤ්චින්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, බ්‍යාපාදං පජහතො අබ්‍යාපාදවසෙන පඤ්චින්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා -පෙ- සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

එවං ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

කථං තදුපගවිරියවාහනට්ඨෙන භාවනා:

කාමච්ඡන්දං පජහන්තො[1] නෙක්ඛම්මවසෙන විරියං[2] වාහෙතීති තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, බ්‍යාපාදං පජහන්තො[1] අබ්‍යාපාදවසෙන විරියං[2] වාහෙතීති තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන විරියං[2] වාහෙතීති තදුපගවිරියවාහනට්ඨෙන භාවනා.

එවං තදුපගවිරියවාහනට්ඨෙන භාවනා.

කථං ආසෙවනට්ඨෙන භාවනා:

කාමච්ඡන්දං පජහන්තො[1] නෙක්ඛම්මං ආසෙවතීති ආසෙවනට්ඨෙන භාවනා, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදං ආසෙවතීති ආසෙවනට්ඨෙන භාවනා -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගං ආසෙවතීති ආසෙවනට්ඨෙන භාවනා.

එවං ආසෙවනට්ඨෙන භාවනා. ඉමා චතස්සො භාවනා.

රූපං පස්සන්තො භාවෙති, වෙදනං පස්සන්තො භාවෙති, සඤ්ඤං පස්සන්තො භාවෙති, සඞ්ඛාරෙ පස්සන්තො භාවෙති, විඤ්ඤාණං පස්සන්තො භාවෙති. චක්ඛුං -පෙ- ජරාමරණං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පස්සන්තො භාවෙති.

යෙ යෙ ධම්මා භාවිතා හොන්ති, තෙ තෙ ධම්මා එකරසා හොන්ති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "ඉමෙ ධම්මා භාවෙතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ''න්ති.

**භාවෙතබ්බනිද්දෙසො**

**චතුත්ථො භාණවාරො.**

1. පජහතො - මජසං සයා 2 විරියං - මජසං.

කිසෙයින් ඉන්ද්‍රියයන්ගේ එකරස (කෘත්‍ය) භාවයෙන් භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නාහට නෛෂ්ක්‍රම්‍යවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ (විමුක්තිරසයෙන් හෝ කෘත්‍යරසයෙන්) එකරස වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යැ. ව්‍යාපාදය දුරලන්නාහට අව්‍යාපාදවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ එකරස වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යැ ... සියලු ක්ලේශයන් දුරලන්නාහට අර්හත්මාර්ගවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ එකරස වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යි.

මෙසෙයින් ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා වේ.

කිසෙයින් තදනුවච්ඡිකවීර්යධුරභාවයෙන් භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නේ නෛෂ්ක්‍රම්‍යවශයෙන් වීර්යය පවත්වා නු යි. තදනුවච්ඡිකවීර්යධුරභාවයෙන් භාවනා යැ. ... ව්‍යාපාදය දුරලන්නේ අව්‍යාපාදවශයෙන් වීර්යය පවත්වා නු යි තදනුවච්ඡිකවීර්යධුරභාවයෙන් භාවනා යැ. ... සියලු ක්ලේශයන් දුරලන්නේ අර්හත්මාර්ගවශයෙන් වීර්යය පවත්වා නු යි තදනුවච්ඡිකවීර්යධුරභාවයෙන් භාවනා යි.

මෙසෙයින් තදනුවච්ඡිකවීර්යධුරභාවයෙන් භාවනා වේ.

කිසෙයින් ආසෙවනාර්ථයෙන් භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නේ නෛෂ්ක්‍රම්‍යය ආසෙවන කෙරේ නු යි ආසෙවනාර්ථයෙන් භාවනා යැ. ව්‍යාපාදය දුරලන්නේ අව්‍යාපාදය ආසෙවන කෙරේ නු යි ආසෙවනාර්ථයෙන් භාවනා යැ. ... සියලු ක්ලේශයන් දුරලන්නේ අර්හත්මාර්ගය ආසෙවන කෙරේ නු යි ආසෙවනාර්ථයෙන් භාවනා යි.

මෙසෙයින් ආසෙවනාර්ථයෙන් භාවනා වේ. මොහු සතර භාවනා යි.

රූපය (අනිත්‍යාදි වශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. වේදනාව (අනිත්‍යාදිවශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. සංඥාව (අනිත්‍යාදිවශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. සංස්කාරයන් (අනිත්‍යාදිවශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. විඥානය (අනිත්‍යාදි වශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. චක්ෂුස ... ජරාමරණය ... අමතොගධනිර්වාණය නිෂ්ඨාර්ථයෙන් දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි.

යම් යම් ධර්ම කෙනෙක් වඩනා ලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ එකරස වෙත්. එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යැ. එයින් කියනු ලැබෙයි. **"ඉමෙ ධම්මා භාවෙතබ්බා'ති සොතාවධානං තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"**යි.

**භාවෙතබ්බනිද්දෙස යි.**

**සතරවැනි බණවර යි.**

## (6)

කථං ‘ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො සච්ඡිකාතබ්බො: අකුප්පා චෙතොවිමුත්ති.

ද්වෙ ධම්මා සච්ඡිකාතබ්බා: විජ්ජා ච විමුත්ති ච.

තයො ධම්මා සච්ඡිකාතබ්බා: තිස්සො විජ්ජා.

චත්තාරො ධම්මා සච්ඡිකාතබ්බා: චත්තාරි සාමඤ්ඤඵලානි.

පඤ්ච ධම්මා සච්ඡිකාතබ්බා: පඤ්ච ධම්මක්ඛන්ධා.

ඡ ධම්මා සච්ඡිකාතබ්බා: ඡ අභිඤ්ඤා.

සත්ත ධම්මා සච්ඡිකාතබ්බා: සත්ත ඛීණාසවබලානි.

අට්ඨ ධම්මා සච්ඡිකාතබ්බා: අට්ඨ විමොක්ඛා.

නව ධම්මා සච්ඡිකාතබ්බා: නව අනුපුබ්බනිරොධා.

දස ධම්මා සච්ඡිකාතබ්බා: දස අසෙක්ඛා ධම්මා.

“සබ්බං භික්ඛවෙ, සච්ඡිකාතබ්බං, කිඤ්ච භික්ඛවෙ, සබ්බං සච්ඡිකාතබ්බං:

චක්ඛුං[1] භික්ඛවෙ, සච්ඡිකාතබ්බං, රූපා සච්ඡිකාතබ්බා, චක්ඛුවිඤ්ඤාණං සච්ඡිකාතබ්බං, චක්ඛුසම්ඵස්සො සච්ඡිකාතබ්බො, යම්පිදං.[2] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි සච්ඡිකාතබ්බං.

සොතං සච්ඡිකාතබ්බං, සද්දා සච්ඡිකාතබ්බා -පෙ- ඝානං සච්ඡිකාතබ්බං, ගන්ධා සච්ඡිකාතබ්බා -පෙ- ජිව්හා සච්ඡිකාතබ්බා, රසා සච්ඡිකාතබ්බා -පෙ- කායො සච්ඡිකාතබ්බො, ඵොට්ඨබ්බා සච්ඡිකාතබ්බා -පෙ- මනො සච්ඡිකාතබ්බො, ධම්මා සච්ඡිකාතබ්බා, මනොවිඤ්ඤාණං සච්ඡිකාතබ්බං, මනොසම්ඵස්සො සච්ඡිකාතබ්බො, යම්පිදං[2] මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සච්ඡිකාතබ්බං.[a]

රූපං පස්සන්තො සච්ඡිකරොති, වෙදනං පස්සන්තො සච්ඡිකරොති, සඤ්ඤං පස්සන්තො සච්ඡිකරොති, සඞ්ඛාරෙ පස්සන්තො සච්ඡිකරොති, විඤ්ඤාණං පස්සන්තො සච්ඡිකරොති, චක්ඛුං -පෙ- ජරාමරණං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පස්සන්තො සච්ඡිකරොති.

---

1 චක්ඛු - මජසං. 2 යදිදං - PTS.

a වෙදනාසංයුත්ත - අනිච්චවග්ග - සත්තමං

## (6)

කිසෙයින් මේ ධර්මයෝ සාක්‍ෂාත්කර්තව්‍යහ යන දෙශනාව සොතාවධාන (ශ්‍රැතය) වේ ද, එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන වෙයි යත්:

එක් ධර්මයෙක් සාක්‍ෂාත්කර්තව්‍ය යැ: අකීත්ඵල විමුක්තිය යි.

ධර්මයෝ දෙදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: ත්‍රිවිද්‍යා ද අකීත්ඵලය ද යන දෙක යි.

ධර්මයෝ තුන් දෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: ත්‍රිවිද්‍යා යි.

ධර්මයෝ සතරදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: සතර ශ්‍රාමණ්‍ය ඵලයෝ යි.

ධර්මයෝ පස්දෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: පඤ්චවිධ ධර්මස්කන්ධයෝ යි.

ධර්මයෝ සදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: ෂට්අභිඥවෝ යි.

ධර්මයෝ සත්දෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: සප්ත ක්‍ෂීණාස්‍රව බලයෝ යි.

ධර්මයෝ අටදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: අෂ්ටවිමොක්‍ෂයෝ යි.

ධර්මයෝ නවදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: නවඅනුපූර්වනිරොධයෝ යි.

ධර්මයෝ දසදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: දශඅශෛක්‍ෂ ධර්මයෝ යි.

## (7)

මහණෙනි, සියල්ල සාක්‍ෂාත්කර්තව්‍ය යැ. මහණෙනි, කවර සියල්ල සාක්‍ෂාත්කර්තව්‍ය වෙයි යත්:

මහණෙනි, චක්‍ෂුස සාක්‍ෂාත්කර්තව්‍ය යැ. රූපයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ. චක්‍ෂුර්විඥනය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. චක්‍ෂුර්විඥනසම්ප්‍රයුක්ත ස්පර්ශය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. චක්‍ෂුඃස්පර්ශප්‍රත්‍යයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද සාක්‍ෂාත්කර්තව්‍ය යි.

ශ්‍රොත්‍රය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ශබ්දයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... ඝ්‍රාණය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ගන්ධයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... ජිහ්වාව සාක්‍ෂාත්කර්තව්‍ය යැ. රසයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... කය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ස්ප්‍රෂ්ටව්‍යයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... මනස සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ධර්මයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ. මනොවිඥනය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. මනඃස්පර්ශය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. මනඃස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද සාක්‍ෂාත්කර්තව්‍ය යි.

රූපය (අනිත්‍යාදි වශයෙන්) දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. වෙදනාව දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. සංඥව දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. සංස්කාරයන් දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. විඥනය දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. චක්‍ෂුස ... ජරාමරණ ... අමතොගධ නිර්වාණය නිෂ්ඨාර්ථයෙන් දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරේ.

යෙ යෙ ධම්මා සච්ඡිකතා හොන්ති, තෙ තෙ ධම්මා ඵස්සිතා හොන්ති, තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති "ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ"න්ති.

**සච්ඡිකාතබ්බ නිද්දෙසො.**

## (8)

**කථං** "ඉමෙ ධම්මා හානභාගියා, ඉමෙ ධම්මා ඨිතිභාගියා, ඉමෙ ධම්මා විසෙසභාගියා, ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

**පඨමස්ස ඣානස්ස**[1] ලාභිං කාමසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගියො ධම්මො. අවිතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

**දුතියස්ස ඣානස්ස**[2] ලාභිං විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. උපෙක්ඛාසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

**තතියස්ස ඣානස්ස**[3] ලාභිං පීතිසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. අදුක්ඛමසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

**චතුත්ථස්ස ඣානස්ස**[4] ලාභිං උපෙක්ඛාසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

---

1 පඨමජ්ඣානස්ස - ස්‍යා, PTS  2 දුතියජ්ඣානස්ස - ස්‍යා, PTS.
3 තතියජ්ඣානස්ස - ස්‍යා, PTS.  4 චතුත්ථජ්ඣානස්ස - ස්‍යා, PTS.

යම් යම් ධර්ම කෙනෙක් (ආලම්බන-ප්‍රතිලාභ විසින්) ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ ස්පර්ශ කරන ලද්දාහු වෙත්. එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි **"ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා, සුතමයෙ ඤාණං"** යි.

**සච්ඡිකාතබ්බනිද්දෙස යි.**

## (8)

කිසෙයින් 'මේ ධර්මයෝ පරිහාණිය සෙවුනාහ, මේ ධර්මයෝ ස්ථිතිය සෙවුනාහ, මේ ධර්මයෝ විශෙෂය සෙවුනාහ, මේ ධර්මයෝ නිර්වේධය සෙවුනාහ යන දෙශනාව සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන වෙයි යත්:

ප්‍රථමධ්‍යානලාභීහට කාමසහගත (වස්තුකාම-ක්ලෙශකාමාලම්බන) සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ ප්‍රථමධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. අවිතර්ක සහගත (ද්විතීයධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත (විදර්ශනාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

ද්විතීයධ්‍යානලාභීහට විතර්කසහගත (ප්‍රථමධ්‍යානාලම්බන) වූ සංඥා-මනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ ද්විතීයධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. උපෙක්ෂා සහගත (තෘතීයධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකා-රයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

තෘතීයධ්‍යානලාභීහට ප්‍රීතිසුඛසහගත (ද්විතීයධ්‍යානාලම්බන) වූ සංඥා-මනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ තෘතීයධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. උපෙක්ෂා-සුඛසහගත (චතුර්ථධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකා-රයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

චතුර්ථධ්‍යානලාභීහට උපෙක්ෂාසුඛසහගත (තෘතීයධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ චතුර්ථධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. ආකාසා-නඤ්චායතනාරම්මණ වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගිය ධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත (විදර්ශනාලම්බන) වූ සංඥා-මනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

ආකාසානඤ්චායතනස්ස ලාභිං රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

විඤ්ඤාණඤ්චායතනස්ස ලාභිං ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

ආකිඤ්චඤ්ඤායතනස්ස ලාභිං විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: "ඉමෙ ධම්මා හානභාගියා, ඉමෙ ධම්මා ඨිතිභාගියා, ඉමෙ ධම්මා විසෙසභාගියා, ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණන්ති."

හානභාගියචතුක්කනිද්දෙසො.

## (9)

කථං "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං."

'රූපං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සොතාවධානං. තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං."

ලක්ඛණත්තිකනිද්දෙසො.

ආකාසානඤ්චායතනලාභීහට රූපසහගත (රූපධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගිය ධර්ම වෙයි, ඒ ආකාසානඤ්චායතනය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. විඤ්ඤාණඤ්චායතන සහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගූපසංහිත වූ නිර්වේදසහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

විඤ්ඤාණඤ්චායතනලාභීහට ආකාසානඤ්චායතන සහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි, ඒ විඤ්ඤාණඤ්චායතනය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. ආකිඤ්චඤ්ඤායතනසහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගූපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

ආකිඤ්චඤ්ඤායතනලාභීහට විඤ්ඤාණඤ්චායතන සහගත වූ සංඥාමනසිකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ ආකිඤ්චඤ්ඤායතනය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගූපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන නමි. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා නමි. එයින් කියනු ලැබෙයි: **"ඉමෙ ධම්මා හානභාගියා, ඉමෙ ධම්මා ඨිතිභාගියා, ඉමෙ ධම්මා විසෙසභාගියා, ඉමෙ ධම්මා නිබ්බෙධභාගියාති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"** යි.

**හානභාගියචතුක්කනිද්දෙස යි.**

## (9)

කිසෙයින් සියලු සංසකාරයෝ අනිත්‍යයෝ යැ සියලු සංසකාරයෝ දුඃඛයෝ යැ සියලු ධර්මයෝ අනාත්මයෝ යැ යන දෙශනාව සොතාවධාන වේ ද, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන වේ ද යත්:

රූපය ක්ෂය වන බැවින් අනිත්‍ය යැ. ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ. ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යනු සොතාවධාන (ශ්‍රැත) යැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන යි.

වෙදනාව ... සංඥාව ... සංසකාරයෝ විඥානය ... චක්ෂුස ... ජරාමරණය ක්ෂය වන බැවින් අනිත්‍ය යැ. ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ. ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යනු සොතාවධාන යැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන යි. එය ඥාතාර්ථයෙන් ඥාන නමි. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා නමි. එයින් කියනු ලැබෙයි: **"සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"** යි.

**ලක්ඛණත්තිකනිද්දෙස යි.**

## (10)

**කථං** 'ඉදං දුක්ඛං අරියසච්චං, ඉදං දුක්ඛසමුදයො අරියසච්චං, ඉදං දුක්ඛනිරොධො[1] අරියසච්චං, ඉදං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්ච'න්ති සොතාවධානං. තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

**තත්ථ** කතමං දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා[2] දුක්ඛා.

**තත්ථ** කතමා ජාති: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චති ජාති.

**තත්ථ** කතමා ජරා: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා.

**තත්ථ** කතමං මරණං: යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස[3] නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො, ඉදං වුච්චති මරණං.

**තත්ථ** කතමො සොකො: යො ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං, අයං වුච්චති සොකො.

**තත්ථ** කතමො පරිදෙවො: යො ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං, අයං වුච්චති පරිදෙවො.

---

1 දුක්ඛනිරොධං - මජසං. 2 ඛන්ධාපි - PTS

3. කළෙබරස්ස - මජසං, සයා

(10)

කිසෙයින් මේ දුඃඛාර්‍ය්‍යසත්‍ය යැ, මේ දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය යැ, මේ දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍ය යැ, මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යැ යන දෙශනාව සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥව ශ්‍රුතමයඥාන වෙයි යත්:

එහි **'දුඃඛාර්‍ය්‍යසත්‍යය'** කවරෙ යත්: ජාතිය ද දුක යැ, ජරාව ද දුක යැ, මරණය ද දුක යැ, සොකපරිදෙවදුක්ඛදෞර්මනස්‍යෝපායාසයෝ ද දුඃඛයෝ යැ, අප්‍රියයන් හා සමග එක්වීම දුක යැ, ප්‍රියයන් කෙරෙන් වෙන්වීම දුක යැ, යම් හෙයෙකින් ඉස්තේ නො ලබා නම් හෙ ද දුක යැ, සැකෙවින් පඤ්චෝපාදානස්කන්ධයෝ දුඃඛයෝ යි.

එහි **'ජාති'** කවර යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් ඉපදීමෙක් මොනොවට ඉපදීමෙක් අවක්‍රාන්තියෙක් ප්‍රකට වැ පහළ-වීමෙක් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ආයතනයන්ගේ පහළවීමෙක් වේ ද මේ 'ජාති' යයි කියනු ලැබේ.

එහි **'ජරා'** කවර යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමෙක් දිරන බවෙක් (දන්තාදීන්ගේ) කැඩුණු බවෙක් (කෙශාදීන්ගේ) පැසුණු බවෙක් ඇඟරැළි වැටුණු බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් ඉන්ද්‍රිය-යන්ගේ මිහිකිරීමෙක් වේ ද මේ 'ජරා' ය යි කියනු ලැබේ.

එහි **'මරණ'** කවරෙ යත් ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකා-යෙන් යම් ච්‍යුතියෙක් ච්‍යුත වන බවෙක් (ස්කන්ධයන්ගේ) බිඳීමෙක් අතුරුදහන් වීමෙක් මෘත්‍යු සඞ්ඛ්‍යාත මරණයෙක් කාලක්‍රියායෙක් ස්කන්ධයන්ගේ භෙදයෙක් කලෙවරයාගේ නික්ෂෙපයෙක් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙක් වේ ද මේ 'මරණ' යයි කියනු ලැබේ.

එහි **'ශොක'** කවරෙ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටිව්‍යසන-යෙන් හෝ පහස්නා ලද්දහුගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් සමන්විත-වූවහුගේ අන්‍යතරාන්‍යතර දුඃඛහෙතුවෙකින් පහස්නා ලද්දහුගේ යම් ශොකයෙක් ශොක කරන අයුරෙක් ශොක කළ බවෙක් ඇතුළත ශොකයෙක් ඇතුළත පරිශොකයෙක් චිත්තයාගේ හාත්පස දැවීමෙක් දෞර්මනස්‍යෙක් ශොකශල්‍යයෙක් වේ ද මේ 'ශොක' යයි කියනු ලැබේ.

එහි **'පරිදෙව'** කවරෙ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටි-ව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ අන්‍යතරාන්‍යතරව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ අන්‍යතරාන්‍යතර දුක් හෙතුවෙකින් පහස්නා ලද්දහුගේ යම් නම කියා හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් නම කියා හඬන අයුරෙක් ගුණ කියා හඬන අයුරෙක් නම කියා හඬන බවෙක් ගුණ කියා හඬන බවෙක් වචනයෙක් ප්‍රලාපයෙක් විප්‍රලාපයෙක් පුනපුනා ලපනයෙක් ලපනාකාරයෙක් ලාලප්පිත බවෙක් වේ ද මේ 'පරිදෙව' යි කියනු ලැබේ.

තත්ථ කතමං දුක්ඛං: යං කායිකං අසාතං, කායිකං දුක්ඛං, කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං, කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දුක්ඛං.

තත්ථ කතමං දොමනස්සං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං, චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දොමනස්සං.

තත්ථ කතමො උපායාසො: යො ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො[1] ආයාසිතත්තං උපායාසිතත්තං, අයං වුච්චති උපායාසො.

තත්ථ කතමො අප්පියෙහි සම්පයොගො දුක්ඛො: ඉධ යාස්ස[2] තෙ හොන්ති අනිට්ඨා අකන්තා අමනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, යෙ වා පනස්ස තෙ හොන්ති අනත්ථකාමා අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා, යා තෙහි[3] සඞ්ගති සමාගමො සමොධානං මිස්සීභාවො, අයං වුච්චති අප්පියෙහි සම්පයොගො දුක්ඛො.

තත්ථ කතමො පියෙහි විප්පයොගො දුක්ඛො: ඉධ යාස්ස[2] තෙ හොන්ති, ඉට්ඨා කන්තා මනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, යෙ වා පනස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා මාතා වා පිතා වා භාතා වා භගිනී වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා[4] යා තෙහි[3] අසඞ්ගති අසමාගමො අසමොධානං අමිස්සීභාවො, අයං වුච්චති පියෙහි විප්පයොගො දුක්ඛො.

තත්ථ කතමං යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං: ජාතිධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති: 'අහො වත මයං න ජාතිධම්මා අස්සාම, න ච වත නො ජාති ආගච්ඡෙය්‍යා'ති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. ජරාධම්මානං සත්තානං -පෙ- ව්‍යාධිධම්මානං සත්තානං -පෙ- මරණධම්මානං සත්තානං -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති: 'අහොවත මයං න සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසධම්මා අස්සාම, න ච වත නො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා ආගච්ඡෙය්‍යු'න්ති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

---

1 'ආයාසනා උපායාසනා' ඉති - මජසං, PTS. 2 යස්ස - මජසං

3 තෙහි සද්ධිං - මජසං. 4 මිත්තාමච්චා වා ඤාතිසාලොහිතා වා - විප.

එහි **'දුක්ඛ'** කවරේ යත්: කායික වූ යම් නොමිහිරෙක් කායික වූ දුකෙක් කායසම්ඵස්සයෙහි උපන් අසාත වූ දුඃඛවේදයිතයෙක් කායසම්ඵස්සයෙහි උපන් අසාත වූ දුඃඛවේදනායෙක් වේ ද මේ 'දුක්ඛ' යි කියනු ලැබේ.

එහි **'දෝමනස්ස'** කවරේ යත්: චෛතසික වූ යම් නොමිහිරෙක් චෛතසික වූ දුකෙක් චිත්තසම්ඵස්සයෙහි උපන් අසාත වූ දුඃඛවේදයිතයෙක් චිත්තසම්ඵස්සයෙහි උපන් අසාත වූ දුඃඛවේදනායෙක් වේ ද මේ 'දෝමනස්ස' යි කියනු ලැබේ.

එහි **'උපායාස'** කවරේ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භෝගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ රෝගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ අන්‍යතරාන්‍යතර දුක් හේතුවෙකින් පහස්නා ලද්දහුගේ යම් ආයාසයෙක් දැඩි ආයාසයෙක් ආයාසිත බවෙක් උපායාසිත බවෙක් වේ ද මේ 'උපායාස' යි කියනු ලැබේ.

එහි **'අප්‍රියසම්ප්‍රයෝගදුඃඛ'** කවරේ යත්: මෙලොවැ යම් අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙක් වෙත් ද, තවද යම් අවැඩ කැමැති වූ අහිත කැමැති වූ නොසුව කැමැති වූ අයෝගක්ෂෙම කැමැති වූ සත්ත්ව කෙනෙක් හෝ වෙත් ද ඔවුන් සමග යම් සඞ්ගතියෙක් (එක් වීමෙක්) සමාගමයෙක් සමවධානයෙක් මිශ්‍රීභාවයෙක් (මුසු වීමෙක්) වේ ද මේ 'අප්‍රියසම්ප්‍රයෝගදුඃඛ' යි කියනු ලැබේ.

එහි **'ප්‍රියවිප්‍රයෝගදුඃඛ'** කවරේ යත්: මෙලොවැ යම් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙක් වෙත් ද, තවද මවු හෝ පියා හෝ බෑයා හෝ බූන හෝ මිත්‍රයෝ හෝ යහළුවෝ හෝ නෑසහලේනැයෝ හෝ වැඩ කැමැති වූ හිත කැමැති වූ සුව කැමැති වූ යම් කෙනෙක් වෙත් ද ඔවුන් සමග යම් නො එක්වීමෙක් අසමාගමයෙක් අසහභාවයෙක් අමිශ්‍රීභාවයෙක් වේ ද මේ 'ප්‍රියවිප්‍රයෝගදුඃඛ' යි කියනු ලැබේ.

එහි **යමක් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක යැ** යනු කවරේ යත්: ජාතිය සවභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු තෘෂ්ණාවක් උපදී: 'ඇපි ජාතිය සවභාව කොට ඇතියමෝ නො වන්නමෝ නම් එකැහින් අපට ජාතිය නො ද පැමිණේ නම් ඉතා යෙහෙකැ'යි. එතෙකුදු වත් තෙල ඉච්ඡායෙන් නො ලැබියැහැකි වෙයි. මෙ ද 'යමක් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක' නම් වෙයි. ජරාව සවභාව කොට ඇති සත්ත්වයනට ... ව්‍යාධිය සවභාව කොට ඇති සත්ත්වයනට ... මරණය සවභාව කොට ඇති සත්ත්වයනට ... සොකපරිදෙවදුක්ඛදෙමනස්ස - උපයාසයන් සවභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු ඉච්ඡායෙක් උපදී: 'ඇපි සොකපරිදෙවදුක්ඛදෙමනස්ස උපායාස සවභාව කොට ඇතියමෝ නො වන්නමෝ නම් අපට සොකපරිදෙවදුක්ඛදෙමනස්ස උපායාසයෝ නො ද පැමිණෙන්නාහු නම් ඉතායෙහෙකැ'යි. එතෙකුදු වත් තෙල ඉච්ඡායෙන් නො ලැබියහැකි වෙයි. 'මෙ ද යමක් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක' නම් වෙයි.

තත්ථ කතමෙ[1]. සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා: සෙය්‍යථීදං[2] රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්ති සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චති දුක්ඛං අරියසච්චං.

**දුක්ඛසච්චනිද්දෙසො.**

තත්ථ කතමං දුක්ඛසමුදයො[3] අරියසච්චං:

යායං තණ්හා පොනොභවිකා[4] නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං:[2] කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. සා ඛො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති, කත්ථ නිවිසමානා නිවිසති: යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං: චක්ඛුං[5] ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. සොතං ලොකෙ -පෙ- ඝානං ලොකෙ -පෙ- ජිව්හා ලොකෙ -පෙ- කායො ලොකෙ -පෙ- මනො ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

රූපං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, සද්දා ලොකෙ -පෙ- ධම්මා ලොකෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං ලොකෙ -පෙ- මනොවිඤ්ඤාණං ලොකෙ -පෙ- චක්ඛුසම්ඵස්සො ලොකෙ -පෙ- මනොසම්ඵස්සො ලොකෙ -පෙ- චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ -පෙ- මනොසම්ඵස්සජා වෙදනා ලොකෙ -පෙ- රූපසඤ්ඤා ලොකෙ -පෙ- ධම්මසඤ්ඤා ලොකෙ -පෙ- රූපසඤ්චෙතනා ලොකෙ -පෙ- ධම්මසඤ්චෙතනා ලොකෙ -පෙ- රූපතණ්හා ලොකෙ -පෙ- ධම්මතණ්හා ලොකෙ -පෙ- රූපවිතක්කො ලොකෙ -පෙ- ධම්මවිතක්කො ලොකෙ -පෙ- රූපවිචාරො ලොකෙ -පෙ- ධම්මවිචාරො ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ඉදං වුච්චති දුක්ඛසමුදයො[3] අරියසච්චං.

**සමුදයසච්චනිද්දෙසො.**

තත්ථ කතමං දුක්ඛනිරොධො[6] අරියසච්චං:

යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, සා ඛො පනෙසා තණ්හා කත්ථ පහීයමානා[7] පහීයති, කත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති: යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

---

1. කතමා – PTS 2. සෙය්‍යථිදං - මජසං. 3. දුක්ඛසමුදයං - මජසං
4. පොනොබ්භවිකා - සයා 5 චක්ඛු – මජසං. 6. දුක්ඛනිරොධං - මජසං
7. පජීයමානා - සයා

එහි 'සැකෙවින් පඤ්චොපාදානස්කන්ධදුඃඛයෝ' කවරහ යත්: හෙ මෙසේ යැ: රූපොපාදානස්කන්ධ යැ. වෙදනොපාදානස්කන්ධ යැ සංඥොපාදානස්කන්ධ යැ සංස්කාරොපාදානස්කන්ධ යැ විඥානොපාදානස්කන්ධ යි. මොහු 'සැකෙවින් පඤ්චොපාදානස්කන්ධයෝ දුඃඛයෝ' යැ යි කියනු ලැබෙත්. මේ දුඃඛාර්‍ය්‍යසත්‍ය යැ යි කියනු ලැබේ.

**දුක්ඛසච්චනිද්දෙස යි.**

එහි දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය' කවරේ යත්:

පුනර්භවය ඇතිකරන්නා වූ නන්දිරාගය හා එක් වැ යෙදුණු ඒ ඒ භවයෙහි ඇලෙනසුලු වූ යම් තෘෂ්ණාවක් වේ ද, ඒ මෙසේ යැ: කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. ඒ තෘෂ්ණාව උපදනී කොතන්හි උපදී ද පිහිටාසිටින්නී කොතන්හි පිහිටාසිටී ද යත්: ලොව්හි යම් ප්‍රියස්වභාවයෙක් මධුරස්වභාවයෙක් වේ ද තෙල ප්‍රියමධුරස්වභාවයෙහි උපදනා වූ, ඒ තෘෂ්ණාව උපදී. පවත්නී වූ ඒ තෘෂ්ණාව තෙල ප්‍රියමධුරස්වභාවයෙහි පවත්නී ය.

ලොකයෙහි ප්‍රියස්වභාවය මධුරස්වභාවය කිමැ යත්: ලොව්හි චක්ෂුස ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යි. ඒ තෘෂ්ණාව උපදනී තෙල චක්ෂුසෙහි උපදී. පවත්නී තෙල චක්ෂුසෙහි පවතී. ලොව්හි ශ්‍රොත්‍රය ... ලොව්හි ඝ්‍රාණය ... ලොව්හි ජිහ්වාව ... ලොව්හි මනස ප්‍රියරූප යැ සාතරූප යි. ඒ තෘෂ්ණාව උපදනී තෙල මනසෙහි උපදී. පවත්නී තෙල මනසෙහි පවතී.

ලොකයෙහි රූපය ප්‍රියරූප යැ සාතරූප යි. ඒ තෘෂ්ණාව උපදනී තෙල රූපයෙහි උපදී. පවත්නී තෙල රූපයෙහි පවතී. ලොව්හි ශබ්දයෝ... ලොව්හි ධර්මයෝ ... ලොව්හි චක්ෂුර්විඥානය... ලොව්හි මනොවිඥානය ... ලොව්හි චක්ෂුඃස්පර්ශය ... ලොව්හි මනඃස්පර්ශය ... ලොව්හි චක්ෂුඃස්පර්ශයෙන් උපන් වෙදනාව .. ලොව්හි මනඃස්පර්ශයෙන් උපන් වෙදනාව ... ලොව්හි රූපසංඥාව ... ලොව්හි ධර්මසංඥාව ... ලොව්හි රූපසඤ්චෙතනාව ... ලොව්හි ධර්මසඤ්චෙතනාව ... ලොව්හි රූපතෘෂ්ණාව ... ලොව්හි ධර්මතෘෂ්ණාව ... ලොව්හි රූපවිතර්කය ... ලොව්හි ධර්මවිතර්කය ... ලොව්හි රූපවිචාරය .. ලොව්හි ධර්මවිචාරය ප්‍රියරූප යැ සාතරූප යි. උපදනා වූ ඒ තෘෂ්ණාව තෙල ධර්මවිචාරයෙහි උපදී. බැසසිටුනා ඒ තෘෂ්ණාව තෙල ධර්මවිචාරයෙහි පවතී. මේ 'දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය යැ'යි කියනු ලැබේ.

**සමුදයසච්චනිද්දෙස යි.**

එහි 'දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය' කවරේ යත්:

ඒ තෘෂ්ණාවගේ මැ යම් අශෙෂ කොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙක් ත්‍යාගයෙක් දුරලීමෙක් මිදීමෙක් නො ඇලීමෙක් වේ ද එය යි. යළි ප්‍රහීණ වන්නා වූ ඒ තෘෂ්ණාව කොහි ප්‍රහීණ වේ ද නිරුද්ධ වන්නී කොහි නිරුද්ධ වේ ද යත්. ලොව්හි යම් ප්‍රියස්වභාවයෙක් මධුරස්වභාවයෙක් වේ ද ප්‍රහීණ වන මේ තෘෂ්ණාව තෙල ප්‍රියමධුර ස්වභාවයෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී තෙල ප්‍රියමධුරස්වභාවයෙහි නිරුද්ධ වෙයි.

කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං: චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති -පෙ- ධම්මවිචාරො ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ඉදං වුච්චති දුක්ඛනිරොධො අරියසච්චං.

## නිරොධසච්චනිද්දෙසො.

තත්ථ කතමං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං:

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති සම්මාදිට්ඨි.

තත්ථ කතමො සම්මාසඞ්කප්පො: නෙක්ඛම්මසඞ්කප්පො, අබ්‍යාපාදසඞ්කප්පො, අවිහිංසාසඞ්කප්පො අයං වුච්චති සම්මාසඞ්කප්පො.

තත්ථ කතමා සම්මාවාචා: මුසාවාදා වෙරමණී, පිසුනාවාචා වෙරමණී, ඵරුසාවාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති සම්මාවාචා.

තත්ථ කතමො සම්මාකම්මන්තො: පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චති සම්මාකම්මන්තො.

තත්ථ කතමො සම්මා ආජීවො: ඉධ අරියසාවකො මිච්ඡා ආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං[1] කප්පෙති, අයං වුච්චති සම්මාආජීවො.

තත්ථ කතමො සම්මාවායාමො: ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති, -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, අයං වුච්චති සම්මාවායාමො.

1. ජීවිතං - PTS,

ලොවැ ප්‍රියස්වභාවය මධුරස්වභාවය කිමැ යත්: ලොවැ චක්ෂුස ප්‍රියරූප යැ සාතරූප යි. මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී තෙල චක්ෂුසෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී තෙල චක්ෂුසෙහි නිරුද්ධ වේ .. ලොවැ ධර්මවිචාරය ප්‍රියරූප යැ සාතරූප යි. ප්‍රහීණ වන ඒ තෘෂ්ණාව තෙල ධර්මවිචාරයෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී තෙල ධර්මවිචාරයෙහි නිරුද්ධ වේ. මේ 'දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍ය' යැ යි කියනු ලැබේ.

**නිරොධසච්චනිද්දෙස යි.**

එහි **'දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය'** කවරෙ යත්:

මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය මැ යි. ඒ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි.

එහි **'සම්‍යග්දෘෂ්ටි'** කවර යත්: දුඃඛසත්‍යයෙහි ඥාන යැ දුඃඛසමුදයසත්‍යයෙහි ඥාන යැ දුඃඛනිරොධයෙහි ඥාන යැ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදායෙහි ඥාන යි.

එහි **'සම්‍යක්සංකල්ප'** කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍යසංකල්ප යැ අව්‍යාපාදසංකල්ප යැ අවිහිංසා සංකල්ප යි. මේ 'සම්‍යක්සංකල්ප'යයි කියනු ලැබේ.

එහි **'සම්‍යග්වාචා'** කවර යත්: මෘෂාවාදයෙන් වෙන්වීම යැ පිසුනු වචනයෙන් වෙන්වීම යැ ඵරුෂවචනයෙන් වෙන්වීම යැ ප්‍රලාප බසින් වෙන්වීම යි. මේ 'සම්‍යග්වචන' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යක්කර්මාන්ත'** කවරෙ යත්: ප්‍රාණඝාතයෙන් වෙන්වීම යැ අදත්තාදානයෙන් වෙන්වීම යැ කාමමිථ්‍යාචාරයෙන් වෙන්වීම යි. මේ 'සම්‍යක්කර්මාන්ත' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යගාජීව'** කවරෙ යත්: මෙ ලොවැ ආර්‍ය්‍යශ්‍රාවක තෙම මිථ්‍යාආජීවය හැරපියා සම්‍යගාජීවයෙන් ජීවිකාව කෙරෙයි, මේ 'සම්‍යගාජීව' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යග්ව්‍යායාම'** කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම නූපන් ලාමක වූ අකුශලධර්මයන්ගේ නො ඉපැදීම පිණිස වීර්‍ය්‍යච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත දැඩි කොට ගනී, ප්‍රධන්වීර්‍ය්‍යය පවත්වයි, උපන් ලාමක වූ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස ... නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස ... උපන් කුශලධර්මයන්ගේ (නැවත නැවත ඉපදීම්වශයෙන්) සිටීතිය පිණිස අවිනාශය පිණිස බහුල බව පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණ වීම පිණිස වීර්‍ය්‍යච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි කොට පිහිටුවයි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. මේ 'සම්‍යග්ව්‍යායාම' යයි කියනු ලැබේ.

තත්ථ කතමා සම්මාසති: ඉධ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී -පෙ- චිත්තෙ චිත්තානුපස්සී -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති සම්මාසති.

තත්ථ කතමො සම්මාසමාධි: ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1], උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං[2] උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති සම්මාසමාධි. ඉදං වුච්චති දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං.

### මග්ගසච්චනිද්දෙසො

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: "ඉදං දුක්ඛං අරියසච්චං, ඉදං දුක්ඛසමුදයො අරියසච්චං, ඉදං දුක්ඛනිරොධො අරියසච්චං, ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණන්ති."

එවං සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං.

### චතුසච්චනිද්දෙසො.

### සුතමයඤාණනිද්දෙසො.

1. පඨමජ්ඣානං - සභා, PTS, සීමු
2. සුඛවිහාරීති තතියජ්ඣානං - බහුසු.

එහි ‘**සම්‍යක් ස්මෘති**’ කවර යත්: මෙ සස්නෙහි මහණ තෙම රූපකායයෙහි කෙලෙසුන් තවන වීර්ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය දුරු කොට කය අනුව බලමින් වෙසෙයි. වේදනාවන්හි වේදනා අනුව බලමින් චිත්තයෙහි සිත අනුව බලමින් ... ස්කන්ධාදි ධර්මයන්හි කෙලෙසුන් තවන වීර්යය ඇත්තේ සම්‍යග්ඥානයෙන් යුක්ත වූයෙ ස්මෘතිමත් වූයේ ස්කන්ධාදිධර්ම සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය දුරු කොට ධර්මයන් අනුව බලමින් වෙසේ මේ ‘සම්‍යක්ස්මෘති’ යයි කියනු ලැබේ.

එහි ‘**සම්‍යක් සමාධි**’ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම කාමච්ඡන්දයෙන් වෙන් වැ මැ ශේෂනීවරණ සඞ්ඛ්‍යාත අකුශලධර්මයන්ගෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන්ගේ සංහිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකොදිභාවය ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්‍ෂා ඇත්තේ වෙසෙයි, ස්මෘතිමත් වූයේ ද සම්‍යග්ඥාන ඇත්තේ නාමකායින් සුවය ද විඳියි, යම් ධ්‍යානයක් හෙතු කොට ගෙන ඒ ධ්‍යානසමඞ්ගී පුද්ගලයා උපෙක්‍ෂා ඇත්තේ යැ ස්මෘතිමත් වූයේ යැ සුඛවිහරණ ඇත්තේ යැ යි ආර්යයෝ ප්‍රකාශ කෙරෙත් ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. කායික සුඛයාගේ ද ප්‍රහාණයෙන් කායිකදුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු මැ සෞමනස් දෞර්මනස්සුන්ගේ අස්තඞ්ගමයෙන් දුක් නො වූ සුව නො වූ උපෙක්‍ෂායෙන් උපන් ස්මෘතිපාරිශුද්ධිය ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ ‘සම්‍යක්සමාධි’ යයි කියනු ලැබේ. මේ ‘දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්යසත්‍ය’ යයි කියනු ලැබේ.

### මග්ගසච්චනිද්දෙස යි

ඒ සොතාවධානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එහෙයින් කියනු ලැබෙයි “**ඉදං දුක්ඛං අරියසච්චං ඉදං දුක්ඛසමුදයො අරියසච්චං ඉදං දුක්ඛනිරොධො අරියසච්චං ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං යනු සොතාවධාන යි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමය ඥාන**” යි.

මෙසේ සොතාවධානයෙහි ප්‍රඥාව ශ්‍රුතමයඥාන යි.

### චතුසච්චනිද්දෙස යි.

### ශ්‍රුතමයඥාන නිර්දේශ යි.

## 2. සීලමයඤාණං

කථං සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං:

පඤ්ච සීලානි: පරියන්තපාරිසුද්ධිසීලං, අපරියන්තපාරිසුද්ධිසීලං, පරිපුණ්ණපාරිසුද්ධිසීලං, අපරාමට්ඨපාරිසුද්ධිසීලං, පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලන්ති.[1]

තත්ථ කතමං පරියන්තපාරිසුද්ධිසීලං: අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං ඉදං පරියන්තපාරිසුද්ධිසීලං.

කතමං අපරියන්තපාරිසුද්ධිසීලං: උපසම්පන්නානං අපරියන්තසික්ඛාපදානං ඉදං අපරියන්තපාරිසුද්ධි සීලං.

කතමං පරිපුණ්ණපාරිසුද්ධිසීලං: පුථුජ්ජනකල්‍යාණකානං කුසලධම්මෙ යුත්තානං සෙක්ඛපරියන්තෙ[2] පරිපූරකාරීනං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං පරිච්චත්තජීවිතානං ඉදං පරිපුණ්ණපාරිසුද්ධිසීලං.

කතමං අපරාමට්ඨපාරිසුද්ධි සීලං: සත්තන්නං සෙක්ඛානං[3] ඉදං අපරාමට්ඨපාරිසුද්ධිසීලං.

කතමං පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලං: තථාගතසාවකානං ඛීණාසවානං, පච්චෙකබුද්ධානං, තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, ඉදං පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලං.

අත්ථි සීලං පරියන්තං[4], අත්ථි සීලං අපරියන්තං.

තත්ථ කතමං තං සීලං පරියන්තං: අත්ථි සීලං ලාභපරියන්තං, අත්ථි සීලං යසපරියන්තං, අත්ථි සීලං ඤාතිපරියන්තං, අත්ථි සීලං අඞ්ගපරියන්තං, අත්ථි සීලං ජීවිතපරියන්තං.

කතමං තං සීලං ලාභපරියන්තං: ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ලාභපරියන්තං.

කතමං තං සීලං යසපරියන්තං: ඉධෙකච්චො යසහෙතු යසපච්චයා යසකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං යසපරියන්තං.

කතමං තං සීලං ඤාතිපරියන්තං: ඉධෙකච්චො ඤාතිහෙතු ඤාතිපච්චයා ඤාතිකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ඤාතිපරියන්තං

---

1: සීලං - PTS. 2 අසෙක්ඛපරියන්තෙ - සභා, සෙඛපරියන්තෙ - සීසි
3 සෙඛානං - වසි. 4. සපරියන්තං - විමු.

## 2. සීලමය ඥානය

කිසෙසින් ශ්‍රවණය කොට (ශ්‍රවණ හෙතුයෙන්) සංවරයෙහි පැවැති ප්‍රඥාව ශීලමයඥාන වෙයි යත්:

ශීලයෝ පස්දෙනෙක් වෙති: පර්‍ය්‍යන්ත වූ පරිශුද්ධභාවය ඇති ශීල යැ, අපර්‍ය්‍යන්ත වූ පරිශුද්ධභාවය ඇති ශීල යැ, පරිපූර්ණ බැවින් පරිශුද්ධභාවය ඇති ශීල යැ, දෘෂ්ටිපරාමර්ශ රහිත බැවින් පරිශුද්ධභාවය ඇති ශීල යැ, සියලු දරථයන් සන්හිඳීමෙන් පරිශුද්ධභාවය ඇති ශීල යි.

එහි **පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීලය** කවරෙ යත්: අනුපසපන් වූ පර්‍ය්‍යන්ත-ශික්‍ෂාපද ඇතියන්ගේ මේ ශීලය පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීල නමැ.

**අපර්‍ය්‍යන්තපාරිශුද්ධිශීලය** කවරෙ යත්: උපසපන් වූ අපර්‍ය්‍යන්ත-ශික්‍ෂාපද ඇතියන්ගේ මේ ශීලය අපර්‍ය්‍යන්තපාරිශුද්ධිශීල නමැ.

**පරිපූර්ණපාරිශුද්ධිශීලය** කවරෙ යත්: කල්‍යාණපෘථග්ජන වූ විදර්‍ශනා කුශලධර්මයෙහි යුක්තප්‍රයුක්ත වූ ශෛක්‍ෂධර්මයන් පර්‍ය්‍යන්ත කොට ඇති ධර්මයෙහි කිසි ශික්‍ෂාවකුදු නො හැර පුරන්නා වූ කයෙහි ද ජීවිතයෙහි ද නිරපෙක්‍ෂ වූ (එහෙයින් මැ ශීලපරිපූරණ පිණිස) පරිත්‍යක්ත වූ ජීවිත ඇති-යන්ගේ මේ ශීලය පරිපූර්ණපාරිශුද්ධිශීල නමැ.

**අපරාමෘෂ්ටපාරිශුද්ධිශීලය** කවරෙ යත්: සප්ත ශෛක්‍ෂයන්ගේ මේ ශීලය අපරාමෘෂ්ටපාරිශුද්ධිශීල නමැ.

**ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීලය** කවරෙ යත්: තථාගතශ්‍රාවක වූ ක්‍ෂීණාස්‍රව-යන්ගේ ද ප්‍රත්‍යෙකබුද්ධයන්ගේ ද තථාගත වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ-යන්ගේ ද මේ ශීලය ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීල නමි.

පර්‍ය්‍යන්ත වූ ශීලයෙක් ඇත. අපර්‍ය්‍යන්ත වූ ශීලයෙක් ඇති. එහි ඒ පර්‍ය්‍යන්තශීලය කවරෙ යත්: ලාභපර්‍ය්‍යන්ත වූ ශීලයෙක් ඇත. යශස් (පිරිවර) පර්‍ය්‍යන්ත වූ ශීලයෙක් ඇත. ඥාතිපර්‍ය්‍යන්තශීලයෙක් ඇත අඞ්ග-පර්‍ය්‍යන්තශීලයෙක් ඇත. ජීවිතපර්‍ය්‍යන්තශීලයෙක් ඇති.

ඒ **ලාභපර්‍ය්‍යන්තශීලය** කවරෙ යත්: මෙහි එකෙක් ලාභහෙතුයෙන් ලාභප්‍රත්‍යයෙන් ලාභකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මෙ නම් මෙ ඒ ලාභපර්‍ය්‍යන්තශීල යයි.

ඒ **යශස්පර්‍ය්‍යන්තශීලය** කවරෙ යත්: මෙහි එකෙක් යශස්හෙතුයෙන් යශස්ප්‍රත්‍යයෙන් යශස්කාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මෙ නම් මෙ ඒ යශස්පර්‍ය්‍යන්තශීල යයි.

ඒ **ඥාතිපර්‍ය්‍යන්තශීලය** කවරෙ යත්: මෙහි එකෙක් ඥාතිහෙතුයෙන් ඥාතිප්‍රත්‍යයෙන් ඥාතිකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මෙ නම් මෙ ඒ ඥාතිපර්‍ය්‍යන්තශීල යයි.

කතමං තං සීලං අඞ්ගපරියන්තං: ඉධෙකච්චො අඞ්ගහෙතු අඞ්ගපච්චයා අඞ්ගකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං අඞ්ගපරියන්තං.

කතමං තං සීලං ජීවිතපරියන්තං: ඉධෙකච්චො ජීවිතහෙතු ජීවිතපච්චයා ජීවිතකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ජීවිතපරියන්තං.

එවරූපානි සීලානි ඛණ්ඩානි ඡිද්දානි සබලානි කම්මාසානි, න භුජිස්සානි, න විඤ්ඤුප්පසත්ථානි, පරාමට්ඨානි, න සමාධිසංවත්තනිකානි,[1] න අවිප්පටිසාරවත්ථුකානි, න පාමොජ්ජවත්ථුකානි,[2] න පීතිවත්ථුකානි, න පස්සද්ධිවත්ථුකානි, න සුඛවත්ථුකානි, න සමාධිවත්ථුකානි, න යථාභූතඤාණදස්සනවත්ථුකානි, න එකන්තනිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. ඉදං තං සීලං පරියන්තං.

කතමං තං සීලං අපරියන්තං: අත්ථි සීලං න ලාභපරියන්තං, අත්ථි සීලං න යසපරියන්තං, අත්ථි සීලං න ඤාතිපරියන්තං, අත්ථි සීලං න අඞ්ගපරියන්තං, අත්ථි සීලං න ජීවිතපරියන්තං.

කතමං තං සීලං න ලාභපරියන්තං: ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නසික්ඛාපද[3] වීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න ලාභපරියන්තං

කතමං තං සීලං න යසපරියන්තං: ඉධෙකච්චො යසහෙතු යසපච්චයා යසකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න යසපරියන්තං.

කතමං තං සීලං න ඤාතිපරියන්තං: ඉධෙකච්චො ඤාතිහෙතු ඤාතිපච්චයා ඤාතිකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න ඤාති පරියන්තං.

කතමං තං සීලං න අඞ්ගපරියන්තං: ඉධෙකච්චො අඞ්ගහෙතු අඞ්ගපච්චයා අඞ්ගකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න අඞ්ගපරියන්තං.

කතමං තං සීලං න ජීවිතපරියන්තං: ඉධෙකච්චො ජීවිතහෙතු ජීවිතපච්චයා ජීවිතකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න ජීවිතපරියන්තං.

---

1. අසමාධිසංවත්තනිකානි - මජසං, සයා
2. න පාමුජ්ජවත්ථුකානි - සයා
3. යථාසමාදින්නං සික්ඛාපදං - මජසං, සයා, PTS.

ඒ **අඞ්ගපර්‍යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් අඞ්ගහෙතුයෙන් අඞ්ගප්‍රත්‍යයෙන් අඞ්ගකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ අඞ්ගපර්‍යන්තශීලය යි.

ඒ **ජීවිතපර්‍යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් ජීවිතහෙතුයෙන් ජීවිතප්‍රත්‍යයෙන් ජීවිතකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ ජීවිතපර්‍යන්තශීලය යි.

මෙබඳු ශීලයෝ කැඩුණාහු සිදුරු වූවාහු සබල (කබර) වූවාහු කල්මාෂ (කැලැල්) වූවාහු දාසව්‍යයෙන් නො මිදුණාහු විඥයන් විසින් නො පසස්නා ලද්දාහු (තෘෂ්ණාදෘෂ්ටි දෙකින්) පරාමෘෂ්ට වූවාහු සමාධිය පිණිස නො පවත්නාහු අවිප්‍රතිසාරයට කරුණු නො වූවාහු ප්‍රාමොද්‍යයට කරුණු නො වූවාහු ප්‍රීතියට වස්තු නො වූවාහු (කායචිත්ත) ප්‍රශ්‍රබ්ධියට වස්තු නො වූවාහු සුඛයට වස්තු නො වූවාහු (උපචාර අර්පණ) සමාධියට වස්තු නො වූවාහු යථාභූතඥානදර්ශනයට වස්තු නො වූවාහු ඒකාන්තනිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස නො පවත්නා හු ය. මේ ඒ පර්‍යන්තශීලය යි.

එහි ඒ **අපර්‍යන්තශීලය** කවරේ යත්: ලාභපර්‍යන්ත නොවූ ශීලයෙක් ඇත. යශස්පර්‍යන්ත නො වූ ශීලයෙක් ඇත. ඥාතිපර්‍යන්ත නො වූ ශීලයෙක් ඇත. අඞ්ගපර්‍යන්ත නො වූ ශීලයෙක් ඇත. ජීවිතපර්‍යන්ත නො වූ ශීලයෙක් ඇති.

ඒ **ලාභපර්‍යන්ත නො වූ ශීලය** කවරෙ යත්: මෙහි එකෙක් ලාභහෙතුයෙන් ලාභප්‍රත්‍යයෙන් ලාභකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ ලාභපර්‍යන්ත නො වූ ශීලය යි

ඒ **යශස්පර්‍යන්ත නො වූ ශීලය** කවරෙ යත්: මෙහි එකෙක් යශස්හෙතුයෙන් යශස්ප්‍රත්‍යයෙන් යශස් කාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මෙ ඒ යශස්පර්‍යන්ත නො වූ ශීලය යි.

ඒ **ඥාතිපර්‍යන්ත නො වූ ශීලය** කවරෙ යත් මෙහි එකෙක් ඥාතිහෙතුයෙන් ඥාතිප්‍රත්‍යයෙන් ඥාතිකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ ඥාතිපර්‍යන්ත නො වූ ශීලය යි.

ඒ **අඞ්ගපර්‍යන්ත නො වූ ශීලය** කවරෙ යත්: මෙහි එකෙක් අඞ්ගහෙතුයෙන් අඞ්ගප්‍රත්‍යයෙන් අඞ්ගකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ අඞ්ගපර්‍යන්ත නො වූ ශීල යි.

ඒ **ජීවිතපර්‍යන්ත නො වූ ශීලය** කවරෙ යත්: මෙහි එකෙක් ජීවිත හෙතුයෙන් ජීවිතප්‍රත්‍යයෙන් ජීවිතකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ ජීවිතපර්‍යන්ත නො වූ ශීල යි.

එවරූපානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි අවිප්පටි-සාරවත්ථුකානි පාමොජ්ජවත්ථුකානි පීතිවත්ථුකානි පස්සද්ධිවත්ථුකානි සුඛ-වත්ථුකානි සමාධිවත්ථුකානි යථාභූතඤාණදස්සනවත්ථුකානි එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. ඉදං තං සීලං අපරියන්තං.

කිං සීලං, කති සීලානි, කිංසමුට්ඨානං සීලං, කතිධම්මසමොධානං සීලං:

**කිං සීලන්ති**: චෙතනා සීලං, චෙතසිකං සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං.

**කති සීලානීති**: තීණි සීලානි: කුසලසීලං, අකුසලසීලං, අබ්‍යාකත සීලං.

**කිංසමුට්ඨානං සීලන්ති**: කුසලචිත්තසමුට්ඨානං කුසලසීලං, අකුසල-චිත්තසමුට්ඨානං අකුසලසීලං, අබ්‍යාකතචිත්තසමුට්ඨානං අබ්‍යාකතසීලං.

**කතිධම්මසමොධානං සීලන්ති**. සංවරසමොධානං සීලං, අවීතික්කම-සමොධානං සීලං, තථාභාවෙ ජාතචෙතනාසමොධානං සීලං.

පාණාතිපාතං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අදින්නාදානං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. කාමෙසු මිච්ඡාචාරං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. මුසාවාදං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. පිසුනං වාචං[1] සංවරට්ඨෙන සීලං, අවීතික්ක-මට්ඨෙන සීලං. ඵරුසං වාචං[2] සංවරට්ඨෙන සීලං. අවීතික්කමට්ඨෙන සීලං. සම්ඵප්පලාපං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අභිජ්ඣං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. බ්‍යාපාදං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. මිච්ඡාදිට්ඨිං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං.

නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අබ්‍යාපාදෙන බ්‍යාපාදං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. ආලොකසඤ්ඤාය ථිනමිද්ධං[3] -පෙ- අවික්ඛෙපට්ඨෙන උද්ධච්චං -පෙ- ධම්ම-වවත්ථානෙන විචිකිච්ඡං -පෙ- ඤාණෙන අවිජ්ජං -පෙ- පාමොජ්ජෙන[4] අරතිං -පෙ-

1. පිසුනාවාචං - චසි, පිසුණං-ස්‍යා PTS, 2. ඵරුසාවාචං - චසි, ඵරුසවාචං- ස්‍යා, PTS
3 ථිනමිද්ධං - මජසං. 4. පාමුජ්ජෙන - චසි, ස්‍යා.

මෙබඳු වූ ශීලයෝ අඛණ්ඩ වූවාහු අච්ඡිද්‍ර වූවාහු අශබල වූවාහු අකල්මාෂ වූවාහු අදාස වූවාහු විඥයන් විසින් ප්‍රශස්ත වූවාහු (තෘෂ්ණාදෘෂ්ටීන්) පරාමෘෂ්ට නො වූවාහු (උපචාරඅර්පණා) සමාධිය පිණිස පවත්නාහු විප්‍රතිසාරයට වස්තු නො වූවාහු ප්‍රාමොද්‍යයට වස්තු වූවාහු ප්‍රීතියට වස්තු වූවාහු ප්‍රශ්‍රබ්ධියට වස්තු වූවාහු (කායික චෛතසික) සුඛයට වස්තු වූවාහු සමාධියට වස්තු වූවාහු යථාභූතඥානදර්ශනයට වස්තු වූවාහු එකාන්තයෙන් (වර්තයෙහි) නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවත්නාහු යැ.

(ස්වරූප විසින්) සිල් නම් කිම, ශීලයෝ කෙතෙක් වූවාහු ද, ශීලය කුමක් සමුත්ථාන කොට ඇත්තේ ද, ශීලය කෙතෙක් ධර්මයන්ගේ සමවාය ඇත්තේ ද යත්:

ශීල නම් කිමැ යත්: චෛතනාසීල යැ චෛතසික සීල යැ සංවරසීල යැ අවීතික්කමසීල යි.

ශීලයෝ කෙතෙක් ද යත්: ශීලයෝ තිදෙනෙක් වෙති: කුශලශීල යැ අකුශලශීල යැ අව්‍යාකෘතශීල යි.

ශීලය කුමක් සමුත්ථාන කොට ඇත්තේ ද යත්: කුශලශීලය කුශල චිත්තය සමුත්ථාන කොට ඇත්තේ යැ. අකුශලශීලය අකුශලචිත්තය සමුත්ථාන කොට ඇත්තේ යැ. අව්‍යාකෘතශීලය අව්‍යාකෘතචිත්තය සමුත්ථාන කොට ඇත්තේ යි.

ශීලය කෙතෙක් ධර්මයන්ගේ සමවාය ඇත්තේ ද යත්: ශීලය සංවරය හා සමවාය ඇත්තේ යැ. ශීලය අව්‍යතික්‍රමය සමවාය කොට ඇත්තේ යැ. ශීලය සංවර අව්‍යතික්‍රමභාවයෙහි උපන් චෛතනා සමවාය කොට ඇත්තේ යි.

ප්‍රාණවධය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. අදත්තාදානය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. කාමමිථ්‍යාචාරය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. මෘෂාවාදය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ශූන්‍යවචනය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. පරුෂවචනය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ප්‍රලාප බස් වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. අභිධ්‍යා වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ව්‍යාපාද වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. මිථ්‍යාදෘෂ්ටි වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යි.

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ආලෝකසංඥයෙන් ථීනමිද්ධය ... අවික්ෂෙපාර්ථයෙන් උද්ධතභාවය ... ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව ... ඥානයෙන් අවිද්‍යාව ... ප්‍රාමොද්‍යයෙන් අරතිය ...

පඨමෙන ඣානෙන[1] නීවරණෙ[2] -පෙ- දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ -පෙ- තතියෙන ඣානෙන පීතිං -පෙ- චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛං -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤං -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං -පෙ-

අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤං -පෙ- දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤං -පෙ- අනත්තානුපස්සනාය අත්තසඤ්ඤං -පෙ- නිබ්බිදානුපස්සනාය නන්දිං -පෙ- විරාගානුපස්සනාය රාගං -පෙ- නිරොධානුපස්සනාය සමුදයං -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය ආදානං -පෙ- ඛයානුපස්සනාය ඝනසඤ්ඤං -පෙ-[3] වයානුපස්සනාය ආයූහනං[4] -පෙ- විපරිණාමානුපස්සනාය ධුවසඤ්ඤං -පෙ- අනිමිත්තානුපස්සනාය නිමිත්තං -පෙ- අප්පණිහිතානුපස්සනාය පණිධිං -පෙ- සුඤ්ඤතානුපස්සනාය අභිනිවෙසං -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනාය සාරාදානාභිනිවෙසං[5] -පෙ- යථාභූතඤාණදස්සනෙන සම්මොහාභිනිවෙසං -පෙ- ආදීනවානුපස්සනාය ආලයාභිනිවෙසං -පෙ- පටිසඞ්ඛානුපස්සනාය අප්පටිසඞ්ඛං -පෙ- විවට්ටානුපස්සනාය සඤ්ඤොගාභිනිවෙසං -පෙ-.

සොතාපත්තිමග්ගෙන දිට්ඨෙකට්ඨෙ කිලෙසෙ -පෙ- සකදාගාමිමග්ගෙන ඔළාරිකෙ කිලෙසෙ -පෙ- අනාගාමිමග්ගෙන අණුසහගතෙ කිලෙසෙ -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං.

පඤ්ච සීලානි: පාණාතිපාතස්ස පහානං සීලං, වෙරමණී සීලං, චෙතනා සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං. එවරූපානි සීලානි චිත්තස්ස අවිප්පටිසාරාය සංවත්තන්ති, පාමොජ්ජාය[6] සංවත්තන්ති, පීතියා සංවත්තන්ති, පස්සද්ධියා සංවත්තන්ති, සොමනස්සාය සංවත්තන්ති, ආසෙවනාය සංවත්තන්ති, භාවනාය සංවත්තන්ති, බහුලීකම්මාය සංවත්තන්ති, අලඞ්කාරාය සංවත්තන්ති, පරික්ඛාරාය සංවත්තන්ති, පරිවාරාය සංවත්තන්ති, පාරිපූරියා සංවත්තන්ති, එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

එවරූපානං සීලානං සංවරපාරිසුද්ධි අධිසීලං, සංවරපාරිසුද්ධියා ඨිතං චිත්තං න වික්ඛෙපං[7] ගච්ඡති, අවික්ඛෙපපාරිසුද්ධි අධිචිත්තං, සංවරපාරිසුද්ධිං සම්මා පස්සති, අවික්ඛෙපපාරිසුද්ධිං සම්මා පස්සති, දස්සනපාරිසුද්ධිං අධිපඤ්ඤා, යො තත්ථ සංවරට්ඨො අයං අධිසීලසික්ඛා, යො තත්ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා.

1. පඨමජ්ඣානෙන - සයා, PTS, 2. නීවරණං - PTS, 3. ඛණසඤ්ඤං - වසි
4. ආයුහනං - සයා, 5. සාරාගාභිනිවෙසං - PTS, 6 පාමුජ්ජාය - වසි, සයා.
7. අවික්ඛෙපං - මජසං

ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරයන් ... තෘතීයධ්‍යානයෙන් ප්‍රීතිය ... චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛය ... ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥාව ප්‍රතිඝසංඥාව නානාත්වසංඥාව ... විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥාව ... ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතනසංඥාව ... නෙවසංඥානාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාව ...

අනිත්‍යානුදර්ශනායෙන් නිත්‍යසංඥාව ... දුඃඛානුදර්ශනායෙන් සුඛසංඥාව ... අනාත්මානුදර්ශනායෙන් ආත්මසංඥාව ... නිර්වේදානුදර්ශනායෙන් නන්දිය .. විරාගානුදර්ශනායෙන් රාගය ... නිරොධානුදර්ශනායෙන් සමුදය ... ප්‍රතිනිඃසර්ගානුදර්ශනායෙන් ආදානය ... ක්‍ෂයානුදර්ශනායෙන් ඝනසංඥාව ... ව්‍යයානුදර්ශනායෙන් කර්මායූහනය ... විපරිණාමානුදර්ශනායෙන් ධ්‍රැවසංඥාව ... අනිමිත්තානුදර්ශනායෙන් නිමිති ... අප්‍රණිහිතානුදර්ශනායෙන් ප්‍රණිධිය ... ශූන්‍යතානුදර්ශනායෙන් අභිනිවේශය ... අධිප්‍රඥාධර්මවිදර්ශනායෙන් ආත්මය සාර කොට ගන්නා අභිනිවේශය ... යථාභූතඥානදර්ශනායෙන් සම්මොහාභිනිවේශය ... ආදීනවානුදර්ශනායෙන් ආලයාභිනිවේශය ... පටිසංඛානුපස්සනායෙන් අප්පටිසංඛාව ... විවර්තානුදර්ශනායෙන් සංයොගාභිනිවේශය ...

ස්‍රොතාපත්තිමාර්ගයෙන් දෘෂ්ටිය හා සමග එක් වැ සිටි කෙලශයන්... සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරිකකෙලශයන් ... අනාගාමිමාර්ගයෙන් අණුසහගත කෙලශයන් ...අර්හත්මාර්ගයෙන් සියලු කෙලශයන් වැලකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යි.

**ශීලයෝ පස්දෙනෙකි**: ප්‍රාණවධයාගේ ප්‍රහාණය ශීල යැ (ප්‍රාණවධයෙන්) වෙන්වීම ශීල යැ (ප්‍රාණවධයට ප්‍රතිපක්‍ෂ වූ) චෙතනාව ශීල යැ (ප්‍රාණවධයෙන්) වැලකීම ශීල යැ (ප්‍රාණවධයාගේ) අව්‍යතික්‍රමය ශීල යි. මෙබඳු ශීලයෝ චිත්තයාගේ නො විපිළිසර බව පිණිස පවතිත් ප්‍රාමොද්‍යය පිණිස පවතිත්, ප්‍රීතිය පිණිස පවතිත්, සන්හිඳීම පිණිස පවතිත්, සොම්නස පිණිස පවතිත්, ආසෙවනය පිණිස පවතිත්, වැඩීම පිණිස පවතිත්, බහුල කිරීම පිණිස පවතිත්, අලඞ්කාරය පිණිස පවතිත්, පරිෂ්කාරය පිණිස පවතිත්, පරිවාරය පිණිස පවතිත්, පරිපූර්ණභාවය පිණිස පවතිත්, එකාන්තයෙන් නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතිත්.

මෙබඳු ශීලයන්ගේ සංවර සංඛ්‍යාත පාරිශුද්ධිය අධිශීල වෙයි. සංවරපාරිශුද්ධියෙහි සිටි චිත්තය වික්‍ෂෙපයට නො යෙයි. අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිචිත්ත වෙයි සංවරපාරිශුද්ධිය මොනොවට දකී, අවික්‍ෂෙපපාරිශුද්ධිය මොනොවට දකී, (ඔහුගේ) දර්ශන සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිප්‍රඥා වෙයි. එහි යම් සංවරභාවයෙක් වේ ද මේ අධිශීලශික්‍ෂා නමු. එහි යම් අවික්‍ෂෙපභාවයෙක් වේ ද මේ අධිචිත්තශික්‍ෂා නමු. එහි යම් දර්ශනභාවයෙක් වේ ද මේ අධිප්‍රඥාශික්‍ෂා නමු.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති, පස්සන්තො සික්ඛති, පච්චවෙක්ඛන්තො සික්ඛති, චිත්තං අධිට්ඨහන්තො සික්ඛති, සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං පග්ගණ්හන්තො සික්ඛති, සතිං උපට්ඨපෙන්තො සික්ඛති, චිත්තං සමාදහන්තො සික්ඛති, පඤ්ඤාය පජානන්තො සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛති, පහාතබ්බං පජහන්තො සික්ඛති, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛති,* සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

පඤ්ච සීලානි: අදින්නාදානස්ස -පෙ- කාමෙසු මිච්ඡාචාරස්ස -පෙ- මුසාවාදස්ස-පෙ- පිසුණාය වාචාය-පෙ- ඵරුසාය වාචාය -පෙ- සම්ඵප්පලාපස්ස -පෙ- අභිජ්ඣාය -පෙ- ව්‍යාපාදස්ස -පෙ- මිච්ඡාදිට්ඨියා -පෙ-

නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස -පෙ- අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස -පෙ- ආලොකසඤ්ඤාය ථිනමිද්ධස්ස[1] -පෙ- අවික්ඛෙපෙන උද්ධච්චස්ස -පෙ- ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය -පෙ- ඤාණෙන අවිජ්ජාය -පෙ- පාමොජ්ජෙන[2] අරතියා -පෙ-

පඨමෙන ඣානෙන[3] නීවරණානං -පෙ- දුතියෙන ඣානෙන විතක්කවිචාරානං -පෙ- තතියෙන ඣානෙන පීතියා -පෙ- චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛානං -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය-පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය පෙ-- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය -පෙ-

අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය-පෙ- දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය -පෙ- අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය -පෙ- නිබ්බිදානුපස්සනාය නන්දියා -පෙ- විරාගානුපස්සනාය රාගස්ස -පෙ- නිරොධානුපස්සනාය සමුදයස්ස-පෙ- පටිනිස්සග්ගානුපස්සනාය ආදානස්ස -පෙ- ඛයානුපස්සනාය ඝනසඤ්ඤාය[4] -පෙ- වයානුපස්සනාය ආයූහනස්ස[5] -පෙ- විපරිණාමානුපස්සනාය ධුවසඤ්ඤාය -පෙ- අනිමිත්තානුපස්සනාය නිමිත්තස්ස -පෙ- අප්පණිහිතානුපස්සනාය පණිධියා -පෙ- සුඤ්ඤතානුපස්සනාය අභිනිවෙසස්ස -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනාය සාරාදානාභිනිවෙසස්ස[6] -පෙ- යථාභූතඤාණදස්සනෙන සම්මොහාභිනිවෙසස්ස -පෙ- ආදීනවානුපස්සනාය ආලයාභිනිවෙසස්ස -පෙ- පටිසඞ්ඛානුපස්සනාය අප්පටිසඞ්ඛාය -පෙ- විවට්ටානුපස්සනාය සඤ්ඤොගාභිනිවෙසස්ස -පෙ-

---

1 ථිනමිඬ්ඪස්ස - මජ්සං. 2. පාමුජ්ජෙන - ස්‍යා, වසි.
3 පඨමජ්ඣානෙන (ඉච්චාදි) - ස්‍යා - PTS. 4. ඝානසඤ්ඤාය - වසි.
5 ආයුහනස්ස - ස්‍යා. 6. සාරාගාභිනිවෙසස්ස - PTS.
* භාවෙතබ්බ - සච්ඡිකාතබ්බපදානි මජ්සං පොත්ථකෙ විපරීතානි දිස්සන්ති

මේ තුන් ශික්ෂාවන් (එකක් එකක්) ආවර්ජනා කෙරෙමින් හික්මෙයි. (ආවර්ජනා කොට) දනිමින් හික්මෙයි. (දැන පුනපුනා) බලමින් හික්මෙයි. (දැක) ප්‍රත්‍යවේක්ෂා කෙරෙමින් හික්මෙයි. (ප්‍රත්‍යවේක්ෂා කොට) සිත නිසල කොට පිහිටුවමින් හික්මෙයි. ශ්‍රද්ධායෙන් බැසගනිමින් හික්මෙයි. වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින් හික්මෙයි. සිහි එළවා තබමින් හික්මෙයි. සිත පිහිටුවමින් හික්මෙයි. ප්‍රඥයෙන් දනිමින් හික්මෙයි. ස්වභාවලක්ෂණාව-බොධයෙන් දතයුතු ධර්මජාතය වෙසෙසින් දනිමින් හික්මෙයි. සාමාන්‍ය ලක්ෂණාවබොධවශයෙන් දතයුතු ධර්මජාතය හාත්පසින් දනිමින් හික්මෙයි. ප්‍රහාතව්‍යය දුරු කෙරෙමින් හික්මෙයි. වැඩියයුත්ත වඩමින් හික්මෙයි. ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙයි.

**ශීලයෝ පස්වැදෑරුමෙකි**: අදත්තාදානයාගේ ... කාමමිථ්‍යාචාරයාගේ... මෘෂාවාදයාගේ .. පිශුනවචනයාගේ ... පරුෂවචනයාගේ... ප්‍රලාපයාගේ... අභිධ්‍යාවගේ ... ව්‍යාපාදයාගේ ... මිථ්‍යාදෘෂ්ටිහුගේ ...

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ .. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ... ආලොකසංඥයෙන් ථිනමිද්ධයාගේ ... අවික්ෂෙපයෙන් උද්ධතභාවයාගේ... ධර්මනිශ්චයයෙන් විචිකිත්සාවගේ ... ඥනයෙන් අවිද්‍යාවගේ ... ප්‍රාමොද්‍යයෙන් අරතියගේ...

ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ... ද්විතීයධ්‍යානයෙන් විතර්ක-විචාරයන්ගේ ... තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියගේ ... චතුර්ථධ්‍යානයෙන් සුඛ-දුඃඛයන්ගේ ... ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥවගේ ... ප්‍රතිඝස ඥයෙන් නානාත්වසංඥවගේ... විඤ්ඤණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥවගේ ... ආකිඤ්චඤ්ඤයතනසමාපත්තියෙන් විඤ්ඤණඤ්චායතන සංඥවගේ ... නෙවසඤ්ඤනාසඤ්ඤයතනසමාපත්ති-යෙන් ආකිඤ්චඤ්ඤයතන සංඥවගේ ...

අනිච්චානුපස්සනායෙන් නිත්‍යසංඥවගේ ... දුක්ඛානුපස්සනායෙන් සුඛ-සංඥවගේ .. අනත්තානුපස්සනායෙන් ආත්මසංඥවගේ... නිබ්බිදානුපස්සනා-යෙන් නන්දිය (තෘෂ්ණාව) ගේ.. විරාගානුපස්සනායෙන් රාගයාගේ.. නිරො-ධානුපස්සනායෙන් සමුදයාගේ.. පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදනයාගේ... ඛයානුපස්සනායෙන් ඝනසංඥවගේ වයානුපස්සනායෙන් කර්මායූහන-යාගේ ... විපරිණාමානුපස්සනායෙන් ධ්‍රැවසංඥවගේ... අනිමිත්තානුපස්සනා-යෙන් (නිත්‍ය) නිමිත්තයාගේ ... අප්පණිහිතානුපස්සනායෙන් ප්‍රණිධිහු (සුඛප්‍රාර්ථනාව) ගේ ... සුඤ්ඤතානුපස්සනායෙන් ආත්මාභිනිවේශයාගේ ... අධිපඤ්ඤධම්මවිපස්සනායෙන් ආත්මසාරාභිනිවේශයාගේ .... යථාභූතඤණ-දස්සනයෙන් සම්මූඪාභිනිවේශයාගේ ... ආදීනවානුපස්සනායෙන් ආලයා-භිනිවේශයාගේ ... පටිසඞ්ඛානුපස්සනායෙන් අනුපායග්‍රහණයාගේ ... විවට්ටානුපස්සනායෙන් සංයොගාභිනිවේශයාගේ ...

සොතාපත්තිමග්ගෙන දිට්ඨෙකට්ඨානං කිලෙසානං -පෙ- සකදාගාමි-මග්ගෙන ඔළාරිකානං කිලෙසානං -පෙ- අනාගාමිමග්ගෙන අණුසහගතානං කිලෙසානං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහානං සීලං, වෙරමණී සීලං, චෙතනා සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං. එවරූපානි සීලානි චිත්තස්ස අවිප්පටිසාරාය සංවත්තන්ති, පාමොජ්ජාය සංවත්තන්ති, පීතියා සංවත්තන්ති, පස්සද්ධියා සංවත්තන්ති, සොමනස්සාය සංවත්තන්ති, ආසෙවනාය සංවත්තන්ති, භාවනාය සංවත්තන්ති, බහුලීකම්මාය සංවත්තන්ති, අලඞ්කාරාය සංවත්තන්ති, පරික්ඛාරාය සංවත්තන්ති, පරිවාරාය සංවත්තන්ති, පාරිපූරියා සංවත්තන්ති, එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

එවරූපානං සීලානං සංවරපාරිසුද්ධි අධිසීලං, සංවරපාරිසුද්ධියා ඨිතං චිත්තං න වික්ඛෙපං[1] ගච්ඡති, අවික්ඛෙපපාරිසුද්ධි අධිචිත්තං, සංවරපාරිසුද්ධිං සම්මා පස්සති, අවික්ඛෙපපාරිසුද්ධිං සම්මා පස්සති, දස්සනපාරිසුද්ධි අධිපඤ්ඤා, යො තත්‍ථ සංවරට්ඨො අයං අධිසීලසික්ඛා, යො තත්‍ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා, යො තත්‍ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති, පස්සන්තො සික්ඛති, පච්චවෙක්ඛන්තො සික්ඛති, චිත්තං අධිට්ඨහන්තො සික්ඛති, සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං[2] පග්ගණ්හන්තො සික්ඛති, සතිං උපට්ඨපෙන්තො සික්ඛති, චිත්තං සමාදහන්තො සික්ඛති, පඤ්ඤාය පජානන්තො සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛති, පහාතබ්බං පජහන්තො සික්ඛති, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං."

සීලමයඤාණනිද්දෙසො.

## 3. සමාධිභාවනාමයඤාණං

කථං සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං:

එකො සමාධි චිත්තස්ස එකග්ගතා.

ද්වෙ සමාධී: ලොකියො සමාධි, ලොකුත්තරො සමාධි.

තයො සමාධී: සවිතක්කසවිචාරො සමාධි, අවිතක්කවිචාරමත්තො සමාධි, අවිතක්කඅවිචාරො සමාධි.

1 අවික්ඛෙපං - මජසං, 2. වීරියං - මජසං.

**සෝවාන්මගින්** දෘෂ්ටිය හා සමග **එක්** වැ සිටි කෙලශයන්ගේ ... සෙදැ-ගැමිමගින් ඖදාරික කෙලශයන්ගේ ... අනාගැමිමගින් අණුසහගත කෙලශ-යන්ගේ ... රහත්මගින් සියලු කෙලශයන්ගේ ප්‍රහාණය ශීල වෙයි. විරතිය ශීල වෙයි. චේතනාව ශීල වෙයි. සංවරය ශීල වෙයි. අව්‍යතික්‍රමය ශීල වේ. මෙබඳු ශීලයෝ චිත්තයාගේ නො විපිළිසරයට වැටෙති, ප්‍රමෝද-භාවයට වැටෙති, ප්‍රීතියට වැටෙති, සන්හිඳීමට වැටෙති, සෞම්නසට වැටෙති, ආසෙවනයට වැටෙති, භාවනාවට වැටෙති, බහුල කිරීමට වැටෙති, අලඞ්කාරයට වැටෙති, පරිෂ්කාරයට වැටෙති, පිරිවරට වැටෙති, පිරිපුන් බවට වැටෙති, එකාන්තයෙන් නිර්වේදයට විරාගයට නිරොධයට උපශමයට අභිඥවට සම්බොධයට නිර්වාණයට වැටෙත්.

මෙබඳු ශීලයන්ගේ සංවර සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිශීල නමැ. පරි-ශුද්ධභාවයෙහි සිටි චිත්තය වික්ෂෙපයට නො යෙයි. අවික්ෂෙප සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිචිත්ත නමැ. සංවරපාරිශුද්ධිය මොනොවට දකියි. අවි-ක්ෂෙපපාරිශුද්ධිය මොනවට දකියි. දර්ශන සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිප්‍රඥ නමූ. එහි යම් සංවර බවෙක් වේ ද මේ අධිශීල ශික්ෂා නමූ. එහි යම් අවික්ෂෙප බවෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා නමූ. එහි යම් දර්ශනාර්ථයෙක් වේ ද මෙ අධිප්‍රඥ ශික්ෂා නමූ.

මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙයි. දනිමින් හික්මෙයි. බලමින් හික්මෙයි. ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙයි. සිත නිසල කොට පිහිටුවමින් හික්මෙයි. ශ්‍රද්ධායෙන් බැසගනිමින් හික්මෙයි. වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින හික්මෙයි. සිහි එළවා තබමින් හික්මෙයි. සිත පිහිටුවමින් හික්මෙයි. ප්‍රඥයෙන් දනිමින් හික්මෙයි. ස්වලක්ෂණාවබොධයෙන් දතයුතු ධර්මජාතය වෙසෙසින් දැනගනිමින් හික්මෙයි. සාමාන්‍යලක්ෂණාවබොධයෙන් දතයුතු ධර්මජාතය හාත්පසින් දනිමින් හික්මෙයි. ප්‍රහාතව්‍යය ප්‍රහාණය කෙරෙමින් හික්මෙයි. භාවිතව්‍යය භාවනා කෙරෙමින් හික්මෙයි. සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් හික්මෙයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: '**සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං**'යි.

**ශීලමයඥානනිර්දෙශ යි.**

## 3. සමාධිභාවනාමය ඥානය

තිසෙයින් (ශීලයෙන්) **සංවෘත වැ සිත එකඟ කිරීමෙහි පැවැති ප්‍රඥව සමාධිභාවනාමයඥාන** වෙයි යත්:

**එක් සමාධියෙක්** වෙයි: චිත්තෛකාග්‍රතා යි.

**සමාධිහු දෙදෙනෙක්** වෙති: ලෞකිකසමාධි යැ ලොකොත්තරසමාධි යි

**සමාධිහු තිදෙනෙක්** වෙති: සවිතර්කසවිචාරසමාධි යැ. අවිතර්කවිචාර-මාත්‍රසමාධි යැ අවිතර්කඅවිචාරසමාධි යි.

චත්තාරො සමාධී: හානභාගියො සමාධි, ඨිතිභාගියො සමාධි, විසෙසභාගියො සමාධි, නිබ්බෙධභාගියො සමාධි.

පඤ්ච සමාධී: පීතිඵරණතා, සුඛඵරණතා, උපෙක්ඛාඵරණතා, ආලොකඵරණතා, පච්චවෙක්ඛනනිමිත්තං.

ඡ සමාධී: බුද්ධානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, ධම්මානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, සඞ්ඝානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, සීලානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, චාගානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, දෙවතානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි.

සත්ත සමාධී: සමාධිකුසලතා, සමාධිස්ස සමාපත්තිකුසලතා සමාධිස්ස ඨිතිකුසලතා, සමාධිස්ස වුට්ඨානකුසලතා, සමාධිස්ස කල්ලතාකුසලතා,[1] සමාධිස්ස ගොචරකුසලතා, සමාධිස්ස අභිනීහාරකුසලතා.

අට්ඨ සමාධී: පඨවිකසිණ[2]වසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, ආපොකසිණවසෙන -පෙ- තෙජොකසිණවසෙන -පෙ- වායොකසිණවසෙන -පෙ- නීලකසිණවසෙන -පෙ- පීතකසිණවසෙන -පෙ- ලොහිතකසිණවසෙන -පෙ- ඔදාතකසිණවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි.

නව සමාධී: රූපාවචරො සමාධි අත්ථි හීනො, අත්ථි මජ්ඣිමො, අත්ථි පණීතො. අරූපාවචරො සමාධි අත්ථි හීනො, අත්ථි මජ්ඣිමො, අත්ථි පණීතො. සුඤ්ඤතො සමාධි, අනිමිත්තො සමාධි, අප්පණිහිතො සමාධි.

දස සමාධී: උද්ධුමාතකසඤ්ඤාවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, විනීලකසඤ්ඤාවසෙන-පෙ විපුබ්බකසඤ්ඤාවසෙන-පෙ- විච්ඡිද්දකසඤ්ඤාවසෙන -පෙ- වික්ඛායිතකසඤ්ඤාවසෙන -පෙ- වික්ඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- හතවික්ඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- ලොහිතකසඤ්ඤාවසෙන -පෙ- පුළවකසඤ්ඤාවසෙන -පෙ- අට්ඨිකසඤ්ඤාවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි ඉමෙ පඤ්චපඤ්ඤාස සමාධී.

---

1. කල්‍යතා කුසලතා - මඡසං, PTS. කල්ලිතකුසලතා සහා, කාල්ලකුසලතා - වසි
2. පථවිකසිණ - මඡසං.

**සමාධීහු සතර දෙනෙක්** වෙති: හානභාගියසමාධි යැ ඨිතිභාගිය-සමාධි යැ විශෙෂභාගියසමාධි යැ නිර්වේදභාගියසමාධි යි.

**සමාධීහු පස්දෙනෙක්** වෙති: ප්‍රීතියගේ පැතිරීම ඇති සමාධි යැ සුඛයාගේ පැතිරීම ඇති සමාධි යැ උපෙක්‍ෂාවගේ පැතිරීම ඇති සමාධි යැ ආලොකසංඥාවගේ පැතිරීම ඇති සමාධි යැ ප්‍රත්‍යවෙක්‍ෂානිමිත්ත ඇති සමාධි යි.

**සමාධීහු සදෙනෙකි**: බුද්ධානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යැ. ධර්මානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවි-ක්‍ෂෙපසමාධි යැ. සංඝානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙ-පසමාධි යැ. ශීලානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙප සමාධි යැ. ත්‍යාගානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙප සමාධි යැ. දෙවතානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙප සමාධි යි.

**සමාධීහු සත්දෙනෙක්** වෙති: සමාධියෙහි කුශල බව යැ සමාධියට සමවැදීමෙහි කුශල බව යැ සමාධිය (රිසිසේ) තැබීමෙහි කුශල බව යැ සමාධියෙන් නැඟීසිටීමෙහි කුශල බව යැ සමාධිහුගේ කල්‍යතා (අගිලාන-භාව) යෙහි කුශල බව යැ සමාධිහුගේ ගොචර (ආරම්මණ) යෙහි කුශල බව යැ සමාධිහුගේ (මතුමත්තෙහි) සමාධියට එළැවීමෙහි කුශල බව යි.

**සමාධීහු අටදෙනෙක්** වෙති: පඨවීකසිණ වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යැ. ආපොකසිණ වශයෙන් ... තෙජොකසිණ වශයෙන් ... වායොකසිණ වශයෙන් .. නීලකසිණ වශයෙන් ... පීත-කසිණ වශයෙන් ... ලොහිතකසිණ වශයෙන් ... ඔදාතකසිණ වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යි.

**සමාධීහු නවදෙනෙක්** වෙති: රූපාවචරසමාධිය හීන වූයේ ඇත, මධ්‍යම වූයේ ඇත, ප්‍රණීත වූයේ ඇති. අරූපාවචරසමාධිය හීන වූයේ ඇත, මධ්‍යම වූයේ ඇත, ප්‍රණීත වූයේ ඇති. ශූන්‍යතසමාධි යැ අනිමිත්ත-සමාධි යැ අප්‍රණිහිතසමාධි යි.

**සමාධීහු දස දෙනෙක්** වෙති: උද්ධුමාතක සංඥාවශයෙන් චිත්තයා-ගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යැ, විනීලකසංඥාවශයෙන් ... විපුබ්බක සංඥාවශයෙන් ... විච්ඡිද්දකසංඥාවශයෙන් ... වික්ඛායිතකසංඥාවශයෙන් ... වික්ඛිත්තකසංඥාවශයෙන් ... හතවික්ඛිත්තකසංඥාවශයෙන් ... ලොහිතකසංඥාවශයෙන් ... පුළුවකසංඥාවශයෙන් ... අට්ඨිකසංඥාවශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යි. මොහු පස්පනස්සමාධීහු වෙත්.

අපි ච පඤ්චවීසති සමාධිස්ස සමාධිට්ඨා: පරිග්ගහට්ඨෙන සමාධි, පරිවාරට්ඨෙන සමාධි, පරිපූරට්ඨෙන සමාධි, එකග්ගට්ඨෙන සමාධි, අවික්ඛෙපට්ඨෙන සමාධි, අවිසාරට්ඨෙන සමාධි, අනාවිලට්ඨෙන සමාධි, අනිඤ්ජනට්ඨෙන සමාධි, විමුත්තට්ඨෙන සමාධි, එකත්තුපට්ඨානවසෙන චිත්තස්ස ඨිතත්තා සමාධි, සමං එසතීති සමාධි, විසමං නෙසතීති සමාධි, සමං එසිතත්තා සමාධි, විසමං නෙසිතත්තා සමාධි, සමං ආදියතීති සමාධි, විසමං අනාදියතීති සමාධි, සමං ආදින්නත්තා සමාධි, විසමං අනාදින්නත්තා සමාධි, සමං පටිපජ්ජතීති සමාධි, විසමං නප්පටිපජ්ජතීති සමාධි, සමං පටිපන්නත්තා සමාධි, විසමං නප්පටිපන්නත්තා සමාධි, සමං ඣායතීති සමාධි, විසමං ඣාපෙතීති සමාධි, සමං ඣාතත්තා සමාධි, විසමං ඣාපිතත්තා සමාධි, සමො ච හිතො ච සුඛො චාති සමාධි. ඉමෙ පඤ්චවීසති සමාධිස්ස සමාධිට්ඨා.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: “සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං.”

**සමාධිභාවනාමයඤාණනිද්දෙසො.**

## 4. ධම්මට්ඨිතිඤාණං

**කථං** පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං:

අවිජ්ජා සඞ්ඛාරානං උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච. ඉමෙහි නවහාකාරෙහි අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා. උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා'ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං.

අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා සඞ්ඛාරානං උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච. ඉමෙහි නවහාකාරෙහි අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා'ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

තවද සමාධිහුගේ සමාධිස්වභාවයෝ පස්විසිදෙනෙකි: පරිග්‍රහ ස්වභාවයෙන් සමාධි යැ පරිවාරස්වභාවයෙන් සමාධි යැ පරිපූර්ණස්වභාවයෙන් සමාධි යැ ඒකාග්‍රස්වභාවයෙන් සමාධි යැ අවික්ෂේපස්වභාවයෙන් සමාධි යැ අවිසාරණ (නො පැතිරීම්) ස්වභාවයෙන් සමාධි යැ නො කැළඹෙන ස්වභාවයෙන් සමාධි යැ නො සැලෙන ස්වභාවයෙන් සමාධි යැ විමුක්තස්වභාවයෙන් සමාධි යැ ඒකත්වයෙන් එළඹසිටීම් විසින් සිත සිටි බැවින් සමාධි යැ අපිණාව සොයා නු යි සමාධි යැ (ධ්‍යානප්‍රත්‍යනීක) විසමය නො සොයා නු යි සමාධි යැ සමය සොයන ලද වන බැවින් සමාධි යැ විසමය නො සොයන ලද වන බැවින් සමාධි යැ සමය ගනී නු යි සමාධි යැ විසමය නො ගනී නු යි සමාධි යැ සමය ගන්නා ලද වන බැවින් සමාධි යැ විසමය නො ගන්නා ලද වන බැවින් සමාධි යැ සමය (අපිණාව) ට පිළිපදී නු යි සමාධි යැ විසමයට නො පිළිපදී නු යි සමාධි යැ සමයට පිළිපන් බැවින් සමාධි යැ විසමයට නො පිළිපන් බැවින් සමාධි යැ සම වැ දිලියේ නු යි සමාධි යැ විසමය දවා නු යි සමාධි යැ සම වැ ජවලිත වන බැවින් සමාධි යැ විසමය දවන ලද බැවින් සමාධි යැ සම වූයේ ද හිත වූයේ ද සුඛ වූයේ ද සමාධි යි. මොහු පස්විසි දෙන සමාධිහුගේ සමාධි ස්වභාවයෝ යි.

එය ඥතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එහෙයින් කියනු ලැබෙයි: 'සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං'යි.

**සමාධිභාවනාමයඥානනිර්දෙශ යි.**

## 4. ධම්මට්ඨිති ඥානය

**කිසෙයින් ප්‍රත්‍යය පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධර්මස්ථිතිඥාන වේ ද යත්:**

අවිද්‍යාව සංස්කාරයන්ගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්ත වූ කාරණ ද ආයූහන වූ කාරණ ද සංයොග වූ කාරණ ද පළිබොධ වූ කාරණ ද සමුදය වූ කාරණ ද හෙතු වූ කාරණ ද ප්‍රත්‍යය වූ කාරණ ද වෙයි. මේ නව අයුරින් අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාරයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙත්. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අතීතකාලයෙහි ද අනාගත කාලයෙහි ද අවිද්‍යාව සංස්කාරයන්ගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්තකාරණ ද ආයූහනකාරණ ද සංයොගකාරණ ද පරිබොධකාරණ ද සමුදයකාරණ ද හෙතුකාරණ ද ප්‍රත්‍යයකාරණ ද වෙයි. මේ නව අයුරින් අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාරයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙත්. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සඞ්ඛාරා විඤ්ඤාණස්ස -පෙ- විඤ්ඤාණං නාමරූපස්ස -පෙ- නාමරූපං සළායතනස්ස -පෙ- සළායතනං ඵස්සස්ස -පෙ- ඵස්සො වෙදනාය -පෙ- වෙදනා තණ්හාය -පෙ- තණ්හා උපාදානස්ස -පෙ- උපාදානං භවස්ස -පෙ- භවො ජාතියා -පෙ- ජාති ජරාමරණස්ස උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච, ඉමෙහි නවහාකාරෙහි ජාති පච්චයො, ජරාමරණං පච්චයසමුප්පන්නං. උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාති ජරාමරණස්ස උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච. ඉමෙහි නවහාකාරෙහි ජාති පච්චයො, ජරාමණං පච්චයසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා'ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අවිජ්ජා හෙතු, සඞ්ඛාරා හෙතුසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා හෙතු, සඞ්ඛාරා හෙතුසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

සඞ්ඛාරා හෙතු, විඤ්ඤාණං හෙතුසමුප්පන්නං -පෙ- විඤ්ඤාණං හෙතු, නාමරූපං හෙතුසමුප්පන්නං -පෙ- නාමරූපං හෙතු, සළායතනං හෙතුසමුප්පන්නං -පෙ- සළායතනං හෙතු, ඵස්සො හෙතුසමුප්පන්නො -පෙ- ඵස්සො හෙතු, වෙදනා හෙතුසමුප්පන්නා -පෙ- වෙදනා හෙතු, තණ්හා හෙතුසමුප්පන්නා -පෙ- තණ්හා හෙතු, උපාදානං හෙතුසමුප්පන්නං -පෙ- උපාදානං හෙතු, භවො හෙතුසමුප්පන්නො -පෙ- භවො හෙතු, ජාති හෙතුසමුප්පන්නා -පෙ- ජාති හෙතු, ජරාමරණං හෙතුසමුප්පන්නං. උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාති හෙතු, ජරාමරණං හෙතුසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අවිජ්ජා පටිච්ච, සඞ්ඛාරා පටිච්චසමුප්පන්නා. උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා පටිච්ච, සඞ්ඛාරා පටිච්චසමුප්පන්නා. උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

සංස්කාරයෝ විඥානයාගේ ... විඥානය නාමරූපයාගේ ... නාමරූපය ෂඩායතනයාගේ ... ෂඩායතනය ස්පර්ශයාගේ ... ස්පර්ශය වේදනාවගේ ... වේදනාව තෘෂ්ණාවගේ ... තෘෂ්ණාව උපාදානයාගේ ... උපාදානය භවයාගේ ... භවය ජාතිහුගේ ... ජාතිය ජරාමරණයාගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්තකාරණ ද ආයූහනකාරණ ද සංයොගකාරණ ද පරිබොධකාරණ ද සමුදයකාරණ ද හෙතුකාරණ ද ප්‍රත්‍යයකාරණ ද වෙයි මේ නව අයුරින් ජාතිය ප්‍රත්‍යය වෙයි, ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න වේ. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අතීතකාලයෙහි ද අනාගතකාලයෙහි ද ජාතිය ජරාමරණයාගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්තකාරණ ද ආයූහනකාරණ ද සංයොගකාරණ ද පරිබොධකාරණ ද සමුදයකාරණ ද හෙතුකාරණ ද ප්‍රත්‍යයකාරණ ද වෙයි. මේ නව අයුරින් ජාතිය ප්‍රත්‍යය වෙයි. ජරාමරණ ප්‍රත්‍යය සමුත්පන්න වේ. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ'යි ප්‍රත්‍යය පරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අවිද්‍යාව (ජනකප්‍රත්‍යය හෙයින්) හෙතු යැ, සංස්කාරයෝ හෙතුසමුත්පන්න වෙති. තෙල උභයධර්මයෝ මැ හෙතුසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි ද අනාගතකාලයෙහි ද අවිද්‍යාව හෙතු වෙයි. සංස්කාරයෝ හෙතුසමුත්පන්නයෝ වෙත්. තෙල උභයධර්මයෝ මැ හෙතු සමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සංස්කාරයෝ හෙතු වෙති. විඥානය හෙතුසමුත්පන්න වෙයි ... විඥානය හෙතු යැ නාමරූපය හෙතු සමුත්පන්න යි ... නාමරූපය හෙතු යැ ෂඩායතනය හෙතුසමුත්පන්න යි ... ෂඩායතනය හෙතු යැ ස්පර්ශය හෙතුසමුත්පන්න යි ... ස්පර්ශය හෙතු යැ වේදනාව හෙතුසමුත්පන්න යි ... වේදනාව හෙතු යැ තෘෂ්ණාව හෙතුසමුත්පන්න යි ... තෘෂ්ණාව හෙතු යැ උපාදානය හෙතුසමුත්පන්න යි .. උපාදානය හෙතු යැ භවය හෙතුසමුත්පන්න යි ... භවය හෙතු යැ ජාතිය හෙතුසමුත්පන්න යි ... ජාතිය හෙතු යැ ජරාමරණ හෙතුසමුත්පන්න යි. තෙල උභයධර්මයෝ මැ හෙතුසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි දු අනාගතකාලයෙහි දු ජාතිය හෙතු යැ ජරාමරණ හෙතුසමුත්පන්න යි. තෙල උභයධර්මයෝ මැ හෙතුසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අවිද්‍යාව (සංස්කාරයන් විසින් ප්‍රතිමුඛ වැ ඉයයුතු හෙයින්) ප්‍රතීත්‍ය යැ. සංස්කාරයෝ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යි. තෙල උභයධර්මයෝ මැ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යය පරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි, අතීතකාලයෙහි දු අනාගතකාලයෙහි දු අවිද්‍යාව ප්‍රතීත්‍ය යැ, සංස්කාරයෝ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යි. තෙල උභයධර්මයෝ මැ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සඞ්ඛාරා පටිච්ච, විඤ්ඤාණං පටිච්චසමුප්පන්නං, -පෙ- විඤ්ඤාණං පටිච්ච නාමරූපං පටිච්චසමුප්පන්නං -පෙ- නාමරූපං පටිච්ච, සළායතනං පටිච්චසමුප්පන්නං -පෙ- සළායතනං පටිච්ච, ඵස්සො පටිච්චසමුප්පන්නො -පෙ- ඵස්සො පටිච්ච, වෙදනා පටිච්චසමුප්පන්නා -පෙ- වෙදනා පටිච්ච, තණ්හා පටිච්චසමුප්පන්නා -පෙ- තණ්හා පටිච්ච, උපාදානං පටිච්චසමුප්පන්නං -පෙ- උපාදානං පටිච්ච, භවො පටිච්චසමුප්පන්නො -පෙ- භවො පටිච්ච, ජාති පටිච්චසමුප්පන්නා -පෙ- ජාති පටිච්ච, ජරා මරණං පටිච්චසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාති පටිච්ච, ජරාමරණං පටිච්චසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, 'උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා'ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

සඞ්ඛාරා පච්චයො,[1] විඤ්ඤාණං පච්චයසමුප්පන්නං -පෙ- විඤ්ඤාණං පච්චයො, නාමරූපං පච්චයසමුප්පන්නං -පෙ- නාමරූපං පච්චයො, සළායතනං පච්චයසමුප්පන්නං -පෙ- සළායතනං පච්චයො, ඵස්සො-පච්චයසමුප්පන්නො -පෙ- ඵස්සො පච්චයො, වෙදනා පච්චයසමුප්පන්නා -පෙ- වෙදනා පච්චයො, තණ්හා පච්චයසමුප්පන්නා -පෙ- තණ්හා පච්චයො, උපාදානං පච්චයසමුප්පන්නං -පෙ- උපාදානං පච්චයො, භවො පච්චයසමුප්පන්නො -පෙ- භවො පච්චයො, ජාති පච්චයසමුප්පන්නා -පෙ- ජාති පච්චයො, ජරාමරණං පච්චයසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාතිපච්චයො, ජරාමරණං පච්චයසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා, ආයූහනා[2] සඞ්ඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉමෙ පඤ්ච ධම්මා පුරිමකම්මභවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා.

ඉධ පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉමෙ පඤ්ච ධම්මා ඉධූපපත්තිභවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා.

1. පච්චයා - මජසං - චඨ. 2. ආයුහනා - මජසං සහං, PTS.

සංස්කාරයෝ ප්‍රත්‍යය යැ විඥානය ප්‍රත්‍යයසමුත්පන්න යි ... විඥානය ප්‍රත්‍යය යැ නාමරූප ප්‍රත්‍යය සමුත්පන්න යි ... නාමරූප ප්‍රත්‍යය යැ ෂඩායතනය ප්‍රත්‍යයසමුත්පන්න යි ... ෂඩායතනය ප්‍රත්‍යය යැ ස්පර්ශය ප්‍රත්‍යය-සමුත්පන්න යි ... ස්පර්ශය ප්‍රත්‍යය යැ වේදනාව ප්‍රත්‍යයසමුත්පන්න යි ... වේදනාව ප්‍රත්‍යය යැ තෘෂ්ණාව ප්‍රත්‍යයසමුත්පන්න යි ... තෘෂ්ණාව ප්‍රත්‍යය යැ උපාදානය ප්‍රත්‍යයසමුත්පන්න යි ... උපාදානය ප්‍රත්‍යය යැ භවය ප්‍රත්‍යය-සමුත්පන්න යි ... භවය ප්‍රත්‍යය යැ ජාතිය ප්‍රත්‍යයසමුත්පන්න යි ... ජාතිය ප්‍රත්‍යය යැ ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න යි. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි දු ... අනාගතකාලයෙහි දු ජාතිය ප්‍රත්‍යය යැ ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න යි. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අවිද්‍යාව (උපස්ථම්භක හෙයින්) ප්‍රත්‍යය වෙයි, සංස්කාරයෝ ප්‍රත්‍යය-සමුත්පන්න වෙති. (ඒ ඒ ප්‍රත්‍යයෙන් උපන්) තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි දු අනාගතකාලයෙහි දු අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කා-රයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙති. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්න-යෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සංස්කාරයෝ ප්‍රත්‍යය වෙති. විඥානය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... විඥානය ප්‍රත්‍යය වෙයි. නාමරූප ප්‍රත්‍යයසමුත්පන්න වේ ... නාමරූප ප්‍රත්‍යය වෙයි. ෂඩායතනය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... ෂඩායතනය ප්‍රත්‍යය වෙයි. ස්පර්ශය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... ස්පර්ශය ප්‍රත්‍යය වෙයි. වේදනාව ප්‍රත්‍යයසමුත්පන්න වේ .. වේදනාව ප්‍රත්‍යය වෙයි. තෘෂ්ණාව ප්‍රත්‍යයසමුත්පන්න වේ ... තෘෂ්ණාව ප්‍රත්‍යය වෙයි. උපාදානය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... උපාදානය ප්‍රත්‍යය වෙයි. භවය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... භවය ප්‍රත්‍යය වෙයි. ජාතිය ප්‍රත්‍යය-සමුත්පන්න වේ ... ජාතිය ප්‍රත්‍යය වෙයි. ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න වේ. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි දු අනාගතකාලයෙහි දු ජාතිය ප්‍රත්‍යය වෙයි. ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න වේ. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

පූර්වකර්මභවය කරන කල්හි මෝහය අවිද්‍යා යැ, ආයූහනචේතනාවෝ සංස්කාරයෝ යැ, භවනිකාන්තිය තෘෂ්ණා යැ, දෘෂ්ටිග්‍රහණය උපාදාන යැ, චේතනාව භවය යි. මේ පඤ්චධර්මයෝ පූර්වකර්මභවය කරන කල්හි පැවැත්-තාහු වර්තමානප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වූවාහු යැ.

වර්තමානභවයෙහි ප්‍රතිසන්ධිය විඥාන යැ, (රූපාරූපධර්මයන්ගේ) අව-ක්‍රාන්තිය නාමරූප යැ, ප්‍රසාදය ආයතන යැ, අරමුණු ස්පර්ශ කෙරෙමින් උපන්නේ ස්පර්ශ යැ, (විපාක) වේදයිතය වේදනා යි. මේ පඤ්චධර්මයෝ වර්තමානවිපාකභවයෙහි පූර්වකෘතකර්මයාගේ ප්‍රත්‍යයෙන් පවත්නාහු යි.

ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජා, ආයූහනා සඞ්ඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉමෙ පඤ්ච ධම්මා ඉධ කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා.

ආයතිං[1] පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉමෙ පඤ්ච ධම්මා ආයතිං උපපත්තිභවස්මිං ඉධ කතස්ස කම්මස්ස පච්චයා.

ඉති ඉමෙ[2] චතුසඞ්ඛෙපෙ තයො අද්ධෙ වීසතියා ආකාරෙහි තිසන්ධිං පටිච්චසමුප්පාදං ජානාති, පස්සති, අඤ්ඤාති, පටිවිජ්ඣති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

ධම්මට්ඨිතිඤාණනිද්දෙසො

## 5. සම්මසනඤාණං

කථං අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං:

යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා, සබ්බං රූපං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං. දුක්ඛතො වවත්ථෙති, එකං සම්මසනං, අනත්තතො වවත්ථෙති, එකං සම්මසනං.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං. දුක්ඛතො වවත්ථෙති, එකං සම්මසනං. අනත්තතො වවත්ථෙති, එකං සම්මසනං.

චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං. දුක්ඛතො වවත්ථෙති, එකං සම්මසනං. අනත්තතො වවත්ථෙති, එකං සම්මසනං.

1 ආයති – සයා, වසී. 2. ඉතිමෙ – සයා

වර්තමානභවයෙහි ආයතනයන් මුහුකුරාගිය බැවින් මෝහය අවිද්‍යා යැ, ආයූහනචේතනාවෝ සංස්කාරයෝ යැ, භවනිකාන්තිය තෘෂ්ණා යැ, දෘෂ්-ග්‍රහණය උපාදාන යැ, ආයූහනචේතනාවෝ භව යැ යි. මේ පඤ්චධර්මයෝ වර්තමානකර්මභවයෙහි පැවැත්තාහු අනාගතභවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙත්.

අනාගතභවයෙහි ප්‍රතිසන්ධිය විඥාන යැ, (රූපාරූපධර්මයන්ගේ) අව-ක්‍රාන්තිය නාමරූප යැ, ප්‍රසාදය ආයතන යැ, අරමුණු සපර්ශ කෙරෙමින් උපන්නේ ස්පර්ශ යැ, (විපාක) වේදයිතය වේදනා යැ යි මේ පඤ්චධර්මයෝ ආයතිභාවයෙහි උපප්‍රාප්තියට වර්තමානභවයෙහි කරන ලද කර්මයාගේ ප්‍රත්‍යයෙන් පවතිත්.

මෙසේ මේ සතර සංක්ෂෙපයන් ද තුන් කාලයන් ද ත්‍රිසන්ධියක් ඇති ප්‍රතීත්‍යසමුත්පාදය ද විසි අයුරෙකින් (ශ්‍රැතානුසාරයෙන්) දනී නම් (නුව-ණින්) දකී නම් (නුවණින් දැනගනී නම්) ප්‍රතිවෙධ කෙරේ නම් ඒ දැනීම ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එහෙයින් කියනු ලැබෙයි: **'පච්චය පරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං'** යි.

**ධම්මට්ඨිතිඤාණනිර්දෙශ යි.**

## 5. සම්මර්ශන ඥානය

කිසෙයින් අතීතානාගත ප්‍රත්‍යුත්පන්න (පඤ්චස්කන්ධ) ධර්මයන් (කලාප විසින්) රැස් කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන වෙයි යත්.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වූ හෝ බාහ්‍ය වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුරු වූ හෝ ලඟ වූ හෝ යම් රූපයෙක් වේ ද, ඒ හැම රූපය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. දුක් හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. අනාත්ම හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකි.

යම් කිසි වේදනායෙක් ... යම් කිසි සංඥයෙක් ... යම් කිසි සංස්කාර කෙනෙක් ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වූ හෝ බාහ්‍ය වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, දුරු වූ හෝ ලඟ වූ හෝ යම් විඥානයෙක් වේ ද, ඒ හැම විඥානය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. දුඃඛ හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. අනාත්ම හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකි.

චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. දුක් හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. අනාත්ම හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකි.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං, 'වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්ම'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං, 'වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්ම'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

ජාතිපච්චයා ජරාමරණං, අසති ජාතියා නත්ථි ජරාමරණ'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං, අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණං, අසති ජාතියා නත්ථි ජරාමරණ'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

භවපච්චයා ජාති, අසති -පෙ- උපාදානපච්චයා භවො, අසති -පෙ- තණ්හාපච්චයා උපාදානං, අසති -පෙ- වෙදනාපච්චයා තණ්හා, අසති -පෙ- ඵස්සපච්චයා වෙදනා, අසති -පෙ- සළායතනපච්චයා ඵස්සො, අසති -පෙ- නාමරූපපච්චයා සළායතනං, අසති -පෙ- විඤ්ඤාණපච්චයා නාමරූපං, අසති -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, අසති සඞ්ඛාරෙසු -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

'අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං'.

සම්මසනඤාණනිද්දෙසො.

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය ක්‍ෂය වන බැවින් අනිත්‍ය යැ, ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ, ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ. වේදනාව ... සංඥාව ... සංස්කාරයෝ ... විඥානය ... චක්‍ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය ක්‍ෂය වන බැවින් අනිත්‍ය යැ, ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ, ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය අනිත්‍ය යැ. ප්‍රත්‍යයසමවායෙන් කරන ලද. ප්‍රත්‍යයන් නිසා උපන්නේ යැ, ක්‍ෂය වන සුලු යැ, නැසෙන සුලු යැ, නො ඇලෙන සුලු යැ, නිරුද්ධ වනසුලු යැ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ. වේදනාව ... සංඥාව ... සංස්කාරයෝ ... විඥානය ... චක්‍ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය යැ ප්‍රත්‍යයන් විසින් කරන ලද. ප්‍රත්‍යයන් නිසා උපන්නේ යැ, ක්‍ෂය වනසුලු යැ, නැසෙනසුලු යැ, නො ඇලෙනසුලු යැ, නිරුද්ධ වනසුලු යැ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ අතීතකාලයෙහි දු ... අනාගතකාලයෙහි දු ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි ... උපාදානප්‍රත්‍යයෙන් භවය වෙයි ... තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය වෙයි ... වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි ... ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වෙයි ... ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි ... නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි ... විඥානප්‍රත්‍යයෙන් නාම රූප වෙයි ... සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි ... අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැත්තාහ යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

අතීතකාලයෙහි දු ... අනාගතකාලයෙහි දු අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැත්තාහ’යි සංක්‍ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

ඒ දැනීම ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එසින් කියනු ලැබෙයි. **‘අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං’ යි.**

**සම්මර්ශනඥානනිර්දේශ යි.**

## 6. උදයබ්බයඤාණං

කථං පච්චුප්පන්නානං ධම්මානං විපරිනාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං:

ජාතං රූපං පච්චුප්පන්නං, තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිනාම ලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං.

ජාතා වෙදනා -පෙ- ජාතා සඤ්ඤා -පෙ- ජාතා සඞ්ඛාරා -පෙ- ජාතං විඤ්ඤාණං -පෙ- ජාතං චක්ඛු -පෙ- ජාතො භවො පච්චුප්පන්නො, තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිනාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං.

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති.

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො පඤ්ඤාස ලක්ඛණානි පස්සති.

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති. වෙදනාක්ඛන්ධස්ස -පෙ- සඤ්ඤාක්ඛන්ධස්ස -පෙ- සඞ්ඛාරක්ඛන්ධස්ස -පෙ- විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති.

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො දස ලක්ඛණානි පස්සති. වෙදනාක්ඛන්ධස්ස -පෙ- සඤ්ඤාක්ඛන්ධස්ස -පෙ- සඞ්ඛාරක්ඛන්ධස්ස -පෙ- විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො දස ලක්ඛණානි පස්සති.

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති: 'අවිජ්ජාසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, 'තණ්හාසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, 'කම්මසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, 'ආහාරසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස උදයං පස්සති. රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

## 6. උදයව්‍යය ඥානය

කිසෙයින් වර්තමාන ස්කන්ධධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනඥාන වෙයි යත්:

(සන්තතිවශයෙන්) උපන් රූපය ප්‍රත්‍යුත්පන්න වෙයි. ඒ රූපයාගේ නිර්වෘත්තිලක්ෂණය (අභිනවාකාරය) උදය නමැ. විපරිණාමලක්ෂණය ව්‍යය නමැ. පුනපුනා නුවණින් බැලීම උදයව්‍යයඥාන යි.

උපන් වේදනාව ... උපන් සංඥාව ... උපන් සංස්කාරයෝ ... උපන් විඥානය ... උපන් චක්ෂුස .... උපන් භවය ප්‍රත්‍යුත්පන්න වෙයි. ඒ භවයාගේ නිර්වෘත්තිලක්ෂණය උදය නමැ. විපරිණාමලක්ෂණය ව්‍යය නමැ. අනුපස්සනාව උදයව්‍යයඥාන යි.

පඤ්චස්කන්ධයන්ගේ උදය දකිනුයේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, ව්‍යය දකිනුයේ කෙතෙක් ලක්ෂණයන් දකී ද උදයව්‍යය දකිනුයේ කෙතෙක් ලක්ෂණයන් දකී ද යත්:

පඤ්චස්කන්ධයන්ගේ උදය දකිනුයේ පස්විසි ලක්ෂණයන් දකී. ව්‍යය දකිනුයේ පස්විසි ලක්ෂණයන් දකී. උදයව්‍යය දකිනුයේ පනස් ලක්ෂණයන් දකී.

රූපස්කන්ධයාගේ උදය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, ව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, උදයව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, වේදනාස්කන්ධයාගේ ... සංඥාස්කන්ධයාගේ ... සංස්කාරස්කන්ධයාගේ ... විඥානස්කන්ධයාගේ උදය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, ව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, උදයව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, යත්:

රූපස්කන්ධයාගේ උදය දක්නේ ලක්ෂණ පසක් දකී. ව්‍යය දක්නේ ලක්ෂණ පසක් දකී. උදයව්‍යය දක්නේ ලක්ෂණ දසයක් දකී. වේදනාස්කන්ධයාගේ .. සංඥාස්කන්ධයාගේ ... සංස්කාරස්කන්ධයාගේ ... විඥානස්කන්ධයාගේ උදය දක්නේ ලක්ෂණ පසක් දකී. ව්‍යය දක්නේ ලක්ෂණ පසක් දකී. උදයව්‍යය දක්නේ ලක්ෂණ දසයක් දකී.

රූපස්කන්ධයාගේ උදය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්, අවිද්‍යාසමුදයෙන් රූපයාගේ ඉපදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය දකී. තෘෂ්ණාසමුදයෙන් රූපයාගේ ඉපදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය (ඉපැදීම) දකී. කර්මසමුදයෙන් රූපයාගේ ඉපැදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය දකී. ආහාරසමුදයෙන් රූපයාගේ ඉපැදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය දකී. (අද්ධා-සන්තති-ඛණවශයෙන් රූපයාගේ) උත්පාදලක්ෂණය දක්නේ ද රූපස්කන්ධයාගේ ඉපැදීම දකී. රූපස්කන්ධයාගේ උදය දක්නේ මේ ලක්ෂණ පස දකී.

වයං පස්සන්තො කතමානි පඤ්චලක්ඛණානි පස්සති: අවිජ්ජානිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, 'තණ්හානිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, 'කම්මනිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, 'ආහාරනිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, විපරිනාමලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස වයං පස්සති, රූපක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති. 'අවිජ්ජාසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, 'තණ්හාසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, 'කම්මසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, 'ඵස්සසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති. වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

වයං පස්සන්තො කතමානි පඤ්චලක්ඛණානි පස්සති: 'අවිජ්ජානිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, 'තණ්හානිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, 'කම්මනිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, ඵස්සනිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, විපරිනාමලක්ඛණං පස්සන්තොපි වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති. වෙදනාක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

සඤ්ඤාක්ඛන්ධස්ස –පෙ– සඞ්ඛාරක්ඛන්ධස්ස –පෙ– විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති: 'අවිජ්ජාසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, 'තණ්හාසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, 'කම්මසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, 'නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති. විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

ව්‍යය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යානිරොධයෙන් රූපනිරොධය වේ යැ යි ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. තෘෂ්ණානිරොධයෙන් රූපයාගේ අනුත්පාදනිරොධය වේ යැ යි ප්‍රත්‍යයනිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. කර්මයාගේ නිරොධයෙන් රූපයාගේ අනුත්පාදනිරොධය වේ යැ යි ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. ආහාරනිරොධයෙන් රූපයාගේ අනුත්පාදනිරොධය වේ යැ යි ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. (අද්ධා-සන්තති-ඛණවශයෙන් රූපයාගේ) භඞ්ගය දක්නේ ද රූපස්කන්ධයාගේ ව්‍යය දකී රූපස්කන්ධයාගේ ව්‍යය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

උදයව්‍යය දක්නේ මේ දශලක්ෂණයන් දකී.

වෙදනාස්කන්ධයාගේ උදය දක්නේ කවර ලක්ෂණ පසක් දකී ද යත්: අවිද්‍යාසමුදයෙන් වෙදනාවගේ ඉපැදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ ඉපැදීම දකියි. තෘෂ්ණාසමුදයෙන් වෙදනාසමුදය වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ උදය දකියි කර්මසමුදයෙන් වෙදනාසමුදය වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ උදය දකියි. ස්පර්ශයාගේ සමුදයෙන් වෙදනාසමුදය වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ උදය දකියි. උත්පාදලක්ෂණය දක්නේ ද වෙදනාස්කන්ධයාගේ උදය දකී. වෙදනාස්කන්ධයාගේ උදය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

ව්‍යය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යාවගේ අනුත්පාද නිරොධයෙන් වෙදනාවගේ නිරොධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධ බැවින් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. තෘෂ්ණානිරොධයෙන් වෙදනානිරොධය වේ යැ යි ප්‍රත්‍යනිරුද්ධ බැවින් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. කර්මනිරොධයෙන් වෙදනානිරොධය වේ යැ යි ප්‍රත්‍යයනිරුද්ධ බැවින් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේ යැ යි ප්‍රත්‍යයනිරුද්ධභාවයෙන් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. විපරිණාමලක්ෂණය (වෙදනාභඞ්ගය) දක්නේ ද වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකී. වෙදනාස්කන්ධයාගේ ව්‍යය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

උදයව්‍යය දක්නේ මේ දශලක්ෂණයන් දකී.

සංඥාස්කන්ධයාගේ ... සංස්කාරස්කන්ධයාගේ ... විඥානස්කන්ධයාගේ උදය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යාසමුදයෙන් විඥානයාගේ ඉපදීම වේ යැ යි ප්‍රත්‍යයසමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. තෘෂ්ණාසමුදයෙන් විඥානසමුදය වේ යැ යි ප්‍රත්‍යයසමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. කර්මසමුදයෙන් විඥානසමුදය වේ යැ යි ප්‍රත්‍යය සමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. නාමරූපසමුදයෙන් විඥානසමුදය වේ යැ යි ප්‍රත්‍යයසමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. උත්පාදලක්ෂණය දක්නේ ද විඥානස්කන්ධයාගේ ඉපැදීම දකී. විඥානස්කන්ධයාගේ උදය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

වයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති: 'අවිජ්ජානිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, 'තණ්හානිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, 'කම්මනිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, 'නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, විපරිනාමලක්ඛණං පස්සන්තොපි විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති. විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්චලක්ඛණානි පස්සති.

උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො ඉමානි පඤ්චවීසති ලක්ඛණානි පස්සති. වයං පස්සන්තො ඉමානි පඤ්චවීසති ලක්ඛණානි පස්සති. උදයබ්බයං පස්සන්තො ඉමානි පඤ්ඤාස[1] ලක්ඛණානි පස්සති.

තං ඤාතට්ඨෙන ඤාණං පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: පච්චුප්පන්නානං ධම්මානං විපරිනාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං.

රූපක්ඛන්ධො ආහාරසමුදයො,[2] වෙදනා සඤ්ඤා සඞ්ඛාරා[3] තයො ඛන්ධා ඵස්සසමුදයා, විඤ්ඤාණක්ඛන්ධො නාමරූපසමුදයො[4].

**උදයබ්බයඤාණනිද්දෙසො**

## 7. භඞ්ගානුපස්සනාඤාණං

කථං ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං:

රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසඞ්ඛා තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති.

**අනුපස්සතීති** කථං අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො. දුක්ඛතො අනුපස්සති, නො සුඛතො. අනත්තතො අනුපස්සති, නො අත්තතො. නිබ්බින්දති, නො නන්දති. විරජ්ජති, නො රජ්ජති. නිරොධෙති, නො සමුදෙති පටිනිස්සජ්ජති, නො ආදියති.

අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති.

---

1. පඤ්ඤාසං - ස්‍යා
2. රූපක්ඛන්ධා ආහාරසමුදයා - ස්‍යා,
3. ....සඞ්ඛාරාති සෙසා - වසි, ස්‍යා
4. විඤ්ඤාණක්ඛන්ධො නාමරූපසමුදයා - වසි, ස්‍යා

ව්‍යය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යාවගේ නිරෝධයෙන් විඥානයාගේ නිරෝධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානයාගේ ව්‍යය (නැසීම) දකියි. තෘෂ්ණානිරෝධයෙන් විඥානනිරෝධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. කර්මනිරෝධයෙන් විඥානනිරෝධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. නාමරූපනිරෝධයෙන් විඥානනිරෝධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. විපරිණාමලක්ෂණය දක්නේ ද විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. විඥානස්කන්ධයාගේ ව්‍යය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

උදයව්‍යය දක්නේ මේ දශලක්ෂණයන් දකී.

පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ මේ පස්විසි ලක්ෂණයන් දකියි. ව්‍යය දක්නේ මේ පස්විසි ලක්ෂණයන් දකියි. උදයව්‍යය දක්නේ මේ පනස් ලක්ෂණයන් දකී.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං'යි.**

රූපස්කන්ධය ආහාරසමුදය කොට ඇත්තේ යැ. වේදනා යැ සංඥා යැ සංස්කාරයෝ යැ යන තුන් ස්කන්ධයෝ ස්පර්ශසමුදය කොට ඇත්තාහ. විඥානස්කන්ධය නාමරූපසමුදය කොට ඇත්තේ යි.

**උදයව්‍යයඥාන නිර්දෙශ යි.**

## 7 භඞ්ගානුදර්ශන ඥානය

කිසෙයින් රූපස්කන්ධාදි ආලම්බනය ප්‍රත්‍යවෙක්ෂා කොට භඞ්ගානුදර්ශනයෙහි ප්‍රඥාව විදර්ශනාඥාන වෙයි යත්:

රූපය අරමුණු කොට ඇති සිත ඉපැද බිඳෙයි. ඒ අරමුණ ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ චිත්තයාගේ භඞ්ගය (අපරචිත්තයෙන්) පුනපුනා දකියි.

**අනුපස්සති** යනු: කිසෙයින් පුනපුනා දකී ද යත්: අනිත්‍ය හෙයින් පුනපුනා දකියි, නිත්‍ය හෙයින් නො දකී. දුඃඛ හෙයින් දකියි, සුඛ හෙයින් නො දකී. අනාත්ම හෙයින් දකියි, ආත්ම හෙයින් නො දකී. උකටලී වෙයි. සතුටු නො වෙයි. විරක්ත වෙයි. නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි, නූපදවයි, දුරු කෙරෙයි, ග්‍රහණය නො කෙරේ.

අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරලයි. දුඃඛ හෙයින් දක්නේ සුඛසංඥාව දුරලයි. අනාත්ම හෙයින් දක්නේ ආත්මසංඥාව දුරලයි. උකටලී වනුයේ සප්‍රීතිකතෘෂ්ණාව දුරලයි. නො ඇලෙනුයේ රාගය (ශෙෂතෘෂ්ණාව) දුරලයි. නිරුද්ධ කරනුයේ සමුදය (රාගොත්පත්තිය) දුරලයි. දුරලනුයේ (ඉපදීම් වශයෙන් කෙලෙසුන්ගේ) ආදානය දුරලයි.

වේදනාරම්මණතා -පෙ- සඤ්ඤාරම්මණතා -පෙ- සඞ්ඛාරාරම්මණතා -පෙ- විඤ්ඤාණාරම්මණතා -පෙ- චක්ඛාරම්මණතා[1] -පෙ- ජරාමරණාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසඞ්ඛා තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති.

**අනුපස්සතීති** කථං අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො. දුක්ඛතො අනුපස්සති, නො සුඛතො. අනත්තතො අනුපස්සති, නො අත්තතො. නිබ්බින්දති, නො නන්දති. විරජ්ජති, නො රජ්ජති. නිරොධෙති, නො සමුදෙති. පටිනිස්සජ්ජති, නො ආදියති.

අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති.

1. වත්ථුසඞ්කමනා චෙව සඤ්ඤාය[2] ච විවට්ටනා
ආවජ්ජනාබලං චෙව පටිසඞ්ඛා විපස්සනා.

2. ආරම්මණං[3] අන්වයෙන උභො එකවවත්ථනා
නිරොධෙ අධිමුත්තතා[4] වයලක්ඛණවිපස්සනා.

3. ආරම්මණඤ්ච පටිසඞ්ඛා භඞ්ගඤ්ච අනුපස්සති
සුඤ්ඤතො ච උපට්ඨානං අධිපඤ්ඤාවිපස්සනා.

4. කුසලො තීසු අනුපස්සනාසු චතස්සො ච[5] විපස්සනාසු
තයො උපට්ඨානකුසලතා නානාදිට්ඨීසු න කම්පතී'ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං.

## භඞ්ගානුපස්සනාඤාණනිද්දෙසො.

1. චක්ඛු, චක්ඛුං - සබ්බත්ථ 2. පඤ්ඤාය - මජසං, විමහේ, PTS
3. ආරම්මණා - වසි, PTS. ආරම්මණතාවසෙනාපි - විමූ.
4 අවිමුත්තතා - PTS 5. චතුස්සු ච - සෲ, චතුසු ච - PTS.

වේදනාව අරමුණු කොට ඇති ... සංඥාව අරමුණු කොට ඇති ... සංස්කාරයන් අරමුණු කොට ඇති ... විඥානය අරමුණු කොට ඇති ... චක්ඛුස ... ජරාමරණ අරමුණු කොට ඇති සිත ඉපැද බිඳෙයි. ඒ ආලම්බනය ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ චිත්තයාගේ භඞ්ගය පුනපුනා දකී.

**අනුපස්සති** යනු: කිසෙයින් පුනපුනා දකී ද යත්: අනිත්‍ය හෙයින් දකියි, නිත්‍ය හෙයින් නො දකී. දුඃඛ හෙයින් දකියි, සුඛ හෙයින් නො දකී. අනාත්ම හෙයින් දකියි, ආත්ම හෙයින් නො දකී. උකටලී වෙයි, සතුටු නොවෙයි. විරක්ත වෙයි. නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි. නූපද-වයි. දුරලයි. ආදානය නො කෙරේ.

අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරලයි. දුඃඛ හෙයින් පුනපුනා දක්නේ සුඛසංඥාව දුරලයි. අනාත්ම හෙයින් පුනපුනා දක්නේ ආත්මසංඥාව දුරලයි. උත්කණ්ඨිත වනුයේ සප්‍රීතිකතෘෂ්ණාව දුරලයි. විරක්ත වනුයේ රාගය දුරලයි. නිරුද්ධ කරනුයේ සමුදය (රාගොත්පත්තිය) දුරලයි. දුරලනුයේ ආදානය දුරලයි.

1 පූර්වවස්තුවෙන් අපරවස්තුවකට සඞ්ක්‍රමණය ද (උදයව්‍යයවිදර්ශනා වශයෙන් පවත්නා විදර්ශනා) සංඥාවගේ (ව්‍යයග්‍රහණවශයෙන් උදයෙන්) විනිවර්තනය ද (භඞ්ගාරම්මණ වූ චිත්තයාගේ භඞ්ගය දැකීම පිණිස අනතුරුව මැ) ආවර්ජනයෙහි සමර්ථ බව ද යන (මේ තොමෝ) පටිසඞ්ඛා-විපස්සනා (භඞ්ගානුපස්සනා) නමු.

2 ආලම්බනය අනුව යැමෙන් අතීතානාගත දෙදෙනාගේ එක-ස්වභාවයෙන් නිශ්චය කිරීම ද (භඞ්ග සඞ්ඛ්‍යාත වූ) නිරෝධයෙහි මැ අධිමුක්ත බව ද යන (මේ තොමෝ) ව්‍යයලක්ෂණවිදර්ශනා නමු.

3 පූර්ව වූ ආලම්බනය ද ප්‍රත්‍යවෙක්ෂා කොට (තදාලම්බනචිත්තයාගේ) භඞ්ගයත් දකී ද, (සංස්කාරයන්) ශූන්‍ය හෙයින් වැටහීම ද යන මේ තොමෝ අධිප්‍රඥාවිදර්ශනා නමු.

4 (අනිත්‍යානුදර්ශනාදී) තුන් අනුපස්සනායෙහි දක්ෂ වූ යොගාවචර මහණ තෙම (නිබ්බිදානුපස්සනාදී) සතර අනුපස්සනායෙහි ද (ක්ෂය-ව්‍යය ශූන්‍යතා යන) ත්‍රිවිධ උපස්ථානයෙහි (වැටහීමෙහි ද) දක්ෂ බැවින් (ශාශ්වතාදී) නානාප්‍රකාර දෘෂ්ටීන්හි නො සැලේ යයි.

ඒ භඞ්ගානුදර්ශනය ඥාත බැවින් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: '**ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං**'යි.

භඞ්ගානුදර්ශනඥානනිර්දෙශ යි.

# 8. ආදීනවඤාණං

කථං භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං:

'උප්පාදො භය'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං. 'පවත්තං භය'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'නිමිත්තං භය'න්ති -පෙ- 'ආයූහනා[1] භය'න්ති -පෙ- 'පටිසන්ධි භය'න්ති -පෙ- 'ගති භය'න්ති -පෙ- 'නිබ්බත්ති භය'න්ති -පෙ- 'උපපත්ති භය'න්ති -පෙ- 'ජාති භය'න්ති -පෙ- 'ජරා භය'න්ති -පෙ- 'ව්‍යාධි භය'න්ති -පෙ- 'මරණං භය'න්ති -පෙ- 'සොකො භය'න්ති -පෙ- 'පරිදෙවො භය'න්ති -පෙ- 'උපායාසො භය'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'අනුපායාසො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො භයං, අනුප්පාදො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං භයං, අප්පවත්තං ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'උපායාසො භයං, අනුපායාසො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො දුක්ඛ'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'පවත්තං දුක්ඛ'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං -පෙ- 'උපායාසො දුක්ඛ'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං සුඛ'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'අනුපායාසො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො දුක්ඛං, අනුප්පාදො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං දුක්ඛං, අප්පවත්තං සුඛ'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'උපායාසො දුක්ඛං, අනුපායාසො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො සාමිස'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'පවත්තං සාමිස'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා -පෙ- 'උපායාසො සාමිස'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'අනුපායාසො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො සාමිසං, අනුප්පාදො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං සාමිසං, අප්පවත්තං නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'උපායාසො සාමිසං, අනුපායාසො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං.

1 ආයුහනා - මජසං, සහා, PT

# 8. ආදීනව ඥානය

කිසෙසින් උත්පාදාදීන් භයවශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන වෙයි යත්:

(පූර්වකර්මප්‍රත්‍යයෙන් මෙහි) ඉපැදීම (අක්ෂෙම හෙයින් ද භය වස්තු හෙයින් ද) භය යැ යි භය හෙයින් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන නමැ. (උපන්හුගේ)පැවැත්ම භයැ යි භය හෙයින් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන නමැ. හැම සංස්කාර නිමිත්ත භයැයි ... (අනාගතප්‍රතිසන්ධියට හෙතු වූ)කර්මය භයැ යි ... ආයතිප්‍රතිසන්ධිය භයැ යි ... ගතිය භයැ යි ... සකන්ධයන්ගේ පහළ වීම භයැ යි ... (විපාකප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත) උපප්‍රාප්තිය භයැ යි ... (භවප්‍රත්‍යයෙන් වූ) ජාතිය භයැ යි ... (සකන්ධසන්තානයාගේ පුරාණභාව සඞ්ඛ්‍යාත ජරාව භයැ යි ... ව්‍යාධිය භයැයි ... මරණය භයැ යි ... (චිත්තසන්තාප සඞ්ඛ්‍යාත) ශොකය භයැයි ... (වාක්ප්‍රලාප සඞ්ඛ්‍යාත) පරිදෙවය භයැ යි, දුක් ආයාසය භයැ යි භය හෙයින් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන නම්.

අනුත්පාද (නිවන) (නිර්භයභාවයෙන්) ක්ෂෙම යැ යි (සංස්කාරොපශම වූ) අමෘතපදයෙහි ඥාන යැ. (සංස්කාරයන්ගේ) අප්‍රවෘත්තිය (නිවන) ක්ෂෙම යැ යි ශාන්තිපදයෙහි ඥාන යැ ... අනුපායාසය ක්ෂෙම යැ යි ශාන්තිපදයෙහි ඥාන යි.

උත්පත්තිය භය යැ, අනුත්පාදය ක්ෂෙම යැ යි අමෘතපදයෙහි ඥාන යැ. ප්‍රවෘත්තිය භය යැ, අප්‍රවෘත්තිය ක්ෂෙම යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... උපායාසය භය යැ, අනුපායාසය ක්ෂෙම යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පත්තිය දුකැ යි භය හෙයින් වැටහීමෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඥාන යැ. ප්‍රවෘත්තිය දුකැ යි භය හෙයින් වැටහීමෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ ... උපායාසය දුකැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යි.

අනුත්පාදය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ. අප්‍රවෘත්තිය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... අනුපායාසය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පාදය දුක් යැ. අනුත්පාදය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ, ප්‍රවෘත්තිය දුක් යැ, අප්‍රවෘත්තිය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... උපායාසය දුක් යැ, අනුපායාසය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පාදය සාමිෂ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ. ප්‍රවෘත්තිය සාමිෂ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ ... උපායාසය සාමිෂ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යි.

අනුත්පාදය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ. අප්‍රවෘත්තිය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... අනුපායාසය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පාදය සාමිෂ යැ, අනුත්පාදය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ. ප්‍රවෘත්තිය සාමිෂ යැ, අප්‍රවෘත්තිය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... උපායාසය සාමිෂ යැ, අනුපායාසය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යි.

'උප්පාදො සඞ්ඛාරා'ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'පවත්තං සඞ්ඛාරා'ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං -පෙ- 'උපායාසො සඞ්ඛාරා'ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො නිබ්බාන'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං නිබ්බාන'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'අනුපායාසො නිබ්බාන'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො සඞ්ඛාරා, අනුප්පාදො නිබ්බාන'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං සඞ්ඛාරා අප්පවත්තං නිබ්බාන'න්ති සන්තිපදෙ ඤාණං -පෙ- 'උපායාසො සඞ්ඛාරා, අනුපායාසො නිබ්බාන'න්ති සන්තිපදෙ ඤාණං.

1. උප්පාදඤ්ච පවත්තඤ්ච නිමිත්තං දුක්ඛන්ති පස්සති
   ආයූහනං පටිසන්ධිං ඤාණං ආදීනවෙ ඉදං

2. අනුප්පාදං අප්පවත්තං අනිමිත්තං සුඛන්ති ච
   අනායූහනං අප්පටිසන්ධිං[1] ඤාණං සන්තිපදෙ ඉදං

3. ඉදං ආදීනවෙ ඤාණං පඤ්චට්ඨානෙසු ජායති
   පඤ්චට්ඨානෙ සන්තිපදෙ දස ඤාණෙ පජානාති,

   ද්වින්නං ඤාණානං කුසලතා නානාදිට්ඨීසු න කම්පතී'ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති. භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

**ආදීනවඤාණනිද්දෙසො.**

## 9. මුඤ්චිතුකම්‍යතාඤාණං

කථං මුඤ්චිතුකම්‍යතා පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං:

උප්පාදං[2] මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.[3] මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, නිමිත්තං මුඤ්චිතුකම්‍යතා -පෙ- ආයූහනං මුඤ්චිතුකම්‍යතා -පෙ- පටිසන්ධිං මුඤ්චිතුකම්‍යතා -පෙ- ගතිං මුඤ්චිතුකම්‍යතා -පෙ- නිබ්බත්තිං මුඤ්චිතුකම්‍යතා -පෙ- උපපත්තිං මුඤ්චිතුකම්‍යතා -පෙ- ජාතිං මුඤ්චිතුකම්‍යතා -පෙ- ජරං මුඤ්චිතුකම්‍යතා -පෙ- ව්‍යාධිං මුඤ්චිතුකම්‍යතා -පෙ- මරණං මුඤ්චිතුකම්‍යතා -පෙ- සොකං මුඤ්චිතුකම්‍යතා -පෙ- පරිදෙවං මුඤ්චිතුකම්‍යතා -පෙ- උපායාසං මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

---

1 අනායූහනප්පටිසන්ධි - විම    2 උප්පාදමුඤ්චි ... - සයා
3 පවත්තමුඤ්චිතු .... (ඉච්චාදි) - සයා.

උත්පාදය සංස්කාරභ'යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ. ප්‍රවෘත්තිය සංස්කාරභ'යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ ... උපායාසය සංස්කාරභ'යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යි.

අනුත්පාදය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ. අප්‍රවෘත්තිය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ ... අනුපායාසය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යි.

උත්පාදය සංස්කාරයභ, අනුත්පාදය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ, ප්‍රවෘත්තිය සංස්කාරයභ, අප්‍රවෘත්තිය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ ... උපායාසය සංස්කාරයභ, අනුපායාසය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යි.

1. උත්පත්තිය ද ප්‍රවෘත්තිය ද නිමිත්ත ද ආයූහනය ද ප්‍රතිසන්ධිය ද දුකැ යි දකී ද, මේ (පඤ්චවස්තුකඥානය) ආදීනවඥාන යැ.

2. අනුත්පාදය ද අප්‍රවෘත්තිය ද අනිමිත්ත ද අනායූහනය ද අප්‍රතිසන්ධිය ද සුව යැ යි දකී ද, මේ (පඤ්චවස්තුකඥානය) ශාන්තිපදයෙහි ඥාන යැ.

3. මේ ආදීනවඥානය (උත්පාදාදි) පඤ්චස්ථානයෙහි උපදී. අමෘතපදයෙහි ඥානය (අනුත්පාදාදි) පඤ්චස්ථානයෙහි උපදී. (යම් යෝගාවචර මහණෙක්) මේ දශඥානයන් දනී ද (ආදීනවඥාන ශාන්තිපදඥාන යන) ඥානද්වයයාගේ නිපුණ බව හෙතු කොට ගෙන ශාශ්වතාදි විවිධ දෘෂ්ටීන්හි නො සැලේ යයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං'යි.**

**ආදීනවඥානනිර්දෙශ යි.**

## 9. මුඤ්චිතුකම්‍යතා ඥානය

කිසෙයින් මුඤ්චිතුකම්‍යතා යැ ප්‍රත්‍යවෙක්ෂා යැ අධ්‍යුපෙක්ෂා යැ යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන වෙයි යත්:

උත්පත්තිය මුදනු කැමැති බව, ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමැ. ප්‍රවෘත්තිය මුදනු කැමැතිබව, ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමැ. (සංස්කාර) නිමිත්ත මුදනු කැමැති බව ... කර්මායූහනය මුදනු කැමැතිබව ... ප්‍රතිසන්ධිය මුදනු කැමැතිබව ... ගතිය මුදනු කැමැති බව ... (ස්කන්ධයන්ගේ) පහළවීම මුදනු කැමැති බව ... විපාකප්‍රවෘත්තිය මුදනු කැමැතිබව ... ජාතිය මුදනු කැමැතිබව ... ජරාව මුදනු කැමැති බව ... ව්‍යාධිය මුදනු කැමැතිබව ... මරණය මුදනු කැමැතිබව ... ශොකය මුදනු කැමැති බව ... පරිදෙවය මුදනු කැමැති බව ... උපායාසය මුදනු කැමැතිබව' ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමි.

'උප්පාදො දුක්ඛ'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. 'පවත්තං දුක්ඛ'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛා-සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. –පෙ– 'උපායාසො දුක්ඛ'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

'උප්පාදො භය'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. 'පවත්තං භය'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛා-සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. –පෙ– 'උපායාසො භය'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

'උප්පාදො සාමිස'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. 'පවත්තං සාමිස'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං –පෙ– 'උපායාසො සාමි-ස'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

'උප්පාදො සඞ්ඛාරා'ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. පවත්තං සඞ්ඛාරා'ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛා-සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. –පෙ– 'උපායාසො සඞ්ඛා-රා'ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

උප්පාදො සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා. යෙ ච සඞ්ඛාරා යා ච උපෙක්ඛා උභොපෙතෙ සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා.

පවත්තං සඞ්ඛාරා –පෙ– නිමිත්තං සඞ්ඛාරා –පෙ– ආයූහනා සඞ්ඛාරා –පෙ– පටිසන්ධි සඞ්ඛාරා –පෙ– ගති සඞ්ඛාරා –පෙ– නිබ්බත්ති සඞ්ඛාරා –පෙ– උපපත්ති සඞ්ඛාරා –පෙ– ජාති සඞ්ඛාරා –පෙ– ජරා සඞ්ඛාරා –පෙ– බ්‍යාධි සඞ්ඛාරා –පෙ– මරණං සඞ්ඛාරා –පෙ– සොකො සඞ්ඛාරා –පෙ– පරිදෙවො සඞ්ඛාරා –පෙ– උපායාසො සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා. යෙ ච සඞ්ඛාරා යා ච උපෙක්ඛා උභොපෙතෙ සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා.

කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: අට්ඨ-හාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

පුථුජ්ජනස්ස කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, සෙක්ඛස්ස කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, වීතරාගස්ස කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනී-හාරො හොති:

උත්පාදය දුක යි මුදනු කැමැති බව, ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමැ. ප්‍රවෘත්තිය දුක යි මුදනු කැමැති බව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරො-පෙක්ෂාඥාන නමැ. ... උපායාසය දුක යි මුදනු කැමැතිබව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමි.

උත්පාදය භය යැ යි මුදනු කැමැති බව ප්‍රත වෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යැ. ප්‍රවෘත්තිය භය යැ යි මුදනු කැමැති බව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරො-පෙක්ෂාඥාන යැ ... උපායාසය භය යැ යි මුදනු කැමැතිබව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යි.

උත්පාදය සාමිෂ යැ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යැ. ප්‍රවෘත්තිය සාමිෂ යැ යි මුඤ්චිතු-කම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා-ඥාන යැ ... උපායාසය සාමිෂ යැ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යු-පෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යි.

උත්පාදය සංස්කාරහ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යැ. ප්‍රවෘත්තිය සංස්කාරහ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරො-පෙක්ෂාඥාන යැ. ... උපායාසය සංස්කාරයහ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යි.

උත්පාදය සංස්කාරයහ. ඒ සංස්කාරයන් වෙසෙසින් උපෙක්ෂා කෙරේ නු යි සංස්කාරොපෙක්ෂා නමැ. යම් සංස්කාර කෙනෙක් වෙත් ද යම් උපෙක්ෂාවකුත් වේ ද තුලුහු දෙදෙන මැ සංස්කාරයෝ යැ. ඒ සංස්කාර-යන් වෙසෙසින් උපෙක්ෂා කෙරේ නු යි සංස්කාරොපෙක්ෂා නමැ.

ප්‍රවෘත්තිය සංස්කාරයහ ... (සංස්කාර) නිමිත්ත සංස්කාරයහ ... කර්මා-යූහනය සංස්කාරයහ ... ප්‍රතිසන්ධිය සංස්කාරයහ. ... ගතිය සංස්කාරයහ ... නිර්වෘත්තිය සංස්කාරයහ .. උපප්‍රාප්තිය සංස්කාරයහ ... ජාතිය සංස්කාර-යහ ... ජරාව සංස්කාරයහ ... ව්‍යාධිය සංස්කාරයහ ... මරණය සංස්කා-රයහ ... ශොකය සංස්කාරයහ ... පරිදෙවය සංස්කාරයහ ... උපායාසය සංස්කාරයහ. ඒ සංස්කාරයන් අධ්‍යුපෙක්ෂා කෙරේ නු යි., සංස්කාරො-පෙක්ෂා නමැ. යම් සංස්කාර කෙනෙක් වෙත් ද යම් උපෙක්ෂාවකුත් වේ ද තුලුහු දෙදෙන මැ සංස්කාරයෝ යැ. ඒ සංස්කාරයන් අධ්‍යුපෙක්ෂා කෙරේ නු යි සංස්කාරොපෙක්ෂා නමි.

කිහි අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය (සංස්කාරොපෙක්ෂායෙහි අභිමුඛ කොට අතිශයින් එලැවීම) වෙයි යත්: අට අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි.

පෘථග්ජනයාහට කිහි අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ ද, ශෛක්ෂයාහට කිහි අයුරෙකින් සංස්කාරො-පෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ ද, රහත්හට කිහි අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ ද යත්:

පුථුජ්ජනස්ස ද්වීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, සෙක්ඛස්ස තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, වීතරාගස්ස තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

පුථුජ්ජනස්ස කතමෙහි ද්වීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දති වා, විපස්සති වා පුථුජ්ජනස්ස ඉමෙහි ද්වීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

සෙක්ඛස්ස කතමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනී-හාරො හොති: සෙක්ඛො සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දති වා විපස්සති වා පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති, සෙක්ඛස්ස ඉමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

වීතරාගස්ස කතමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං විපස්සති වා, පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති, තදජ්ඣුපෙක්ඛිත්වා සුඤ්ඤතවිහාරෙන වා අනිමිත්තවිහාරෙන වා අප්පණිහිතවිහාරෙන වා විහරති; වීතරාගස්ස ඉමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභි-නීහාරො එකත්තං හොති: පුථුජ්ජනස්ස සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දතො චිත්තං කිලිස්සති, භාවනාය පරිපන්ථො හොති, පටිවෙධස්ස අන්තරායො හොති, ආයතිං පටිසන්ධියා පච්චයො හොති, සෙක්ඛස්සපි සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දතො චිත්තං කිලිස්සති, භාවනාය පරිපන්ථො හොති, උත්තරිං පටිවෙධස්ස අන්තරායො හොති, ආයතිං පටිසන්ධියා පච්චයො හොති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති අභිනන්දනට්ඨෙන.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං අනිච්චතොපි දුක්ඛතොපි අනත්තතොපි විපස්සති, සෙක්ඛොපි සඞ්ඛාරු-පෙක්ඛං අනිච්චතොපි දුක්ඛතොපි අනත්තතොපි විපස්සති. වීතරාගොපි සඞ්ඛාරුපෙක්ඛං අනිච්චතොපි දුක්ඛතොපි අනත්තතොපි විපස්සති එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති අභිනීහාරට්ඨෙන.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනස්ස සඞ්ඛාරුපෙක්ඛා කුසලා හොති, සෙක්ඛස්ස සඞ්ඛාරුපෙක්ඛා කුසලා හොති, වීතරාගස්ස සඞ්ඛාරුපෙක්ඛා අව්‍යාකතා හොති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති කුසලාබ්‍යාකතට්ඨෙන.

පෘථග්ජනයාහට දෙඅයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි. ශෛක්ෂයාහට තුන් අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි. රහත්හට තුන් අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

පෘථග්ජනයාහට කවර දෙඅයුරින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරොපෙක්ෂාවට සතුටු හෝ වෙයි. විදර්ශනා හෝ කෙරෙයි. පෘථග්ජනයාහට මේ දෙඅයුරින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

ශෛක්ෂයාහට කවර තුන් අයුරින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි යත්: ශෛක්ෂ තෙමේ සංස්කාරොපෙක්ෂාව අභිනන්දනය හෝ කෙරෙයි. විදර්ශනා හෝ කෙරෙයි. (අනිත්‍යාදි විසින්) ප්‍රත්‍යවෙක්ෂා කොට ඵලසමාපත්තියට හෝ සමවදියි. ශෛක්ෂයාහට මේ තුන් අයුරින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

රහත්හට කවර තුන් අයුරෙකින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි යත්: රහත් තෙමේ සංස්කාරොපෙක්ෂාව විදර්ශනා හෝ කෙරෙයි. (අනිත්‍යාදි විසින්) ප්‍රත්‍යවෙක්ෂා කොට ඵලසමවතට හෝ සමවදියි. ඒ සංස්කාරොපෙක්ෂාව (තාදෘශ වූ අන්‍ය විදර්ශනාඥානයෙකින්) අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යතවිහාරයෙන් හෝ අනිමිත්තවිහාරයෙන් හෝ අප්‍රණිහිත විහාරයෙන් හෝ වෙසෙයි. රහත්හට මේ තුන් අයුරින් සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය එකෙක් වෙයි යත්: සංස්කාරොපෙක්ෂාවට සප්‍රීතිකතෘෂ්ණාව උපදවන පෘථග්ජනයාගේ සිත කෙලෙසෙයි. (ප්‍රතිලබ්ධ) විදර්ශනාභාවනාවට උපද්‍රව වෙයි. ප්‍රතිවෙධයට අන්තරාය වෙයි. අනාගතයෙහි සුගතිප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙයි. සංස්කාරොපෙක්ෂාවට සප්‍රීතික තෘෂ්ණාව උපදවන ශෛක්ෂයාගේ ද සිත කෙලෙසෙයි. භාවනාවට උපද්‍රව වෙයි. මත්තෙහි (සත්‍ය) ප්‍රතිවෙධයට අන්තරාය වෙයි. අනාගත ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වේ. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය අභිනන්දනභාවයෙන් එකෙක් වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය එකෙක් වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරොපෙක්ෂාව අනිත්‍ය හෙයින් ද දුඃඛ හෙයින් ද අනාත්ම හෙයින් ද විදර්ශනා කෙරෙයි. ශෛක්ෂ තෙමේත් සංස්කාරොපෙක්ෂාව අනිත්‍ය හෙයින් ද දුඃඛ හෙයින් ද අනාත්ම හෙයින් ද විදර්ශනා කෙරෙයි. රහත් තෙමේ ද සංස්කාරොපෙක්ෂාව අනිත්‍ය හෙයින් ද දුඃඛ හෙයින් ද අනාත්ම හෙයින් ද විදර්ශනා කෙරේ. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය (අනිත්‍යාදි හෙයින්) අනුපස්සනභාවයෙන් එකෙක් වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජනයාගේ සංස්කාරොපෙක්ෂාව කුශල වෙයි. ශෛක්ෂයාගේ සංස්කාරොපෙක්ෂාව කුශල වෙයි. රහත්හුගේ සංස්කාරොපෙක්ෂාව අව්‍යාකෘත වේ. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය කුශලාව්‍යාකෘත භාවයෙන් නානාත්ව වේ.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනස්ස සඞ්ඛාරුපෙක්ඛා කිඤ්චි කාලෙ සුවිදිතා හොති, කිඤ්චි කාලෙ න සුවිදිතා හොති, සෙක්ඛස්සාපි සඞ්ඛාරුපෙක්ඛා කිඤ්චි කාලෙ සුවිදිතා හොති, කිඤ්චි කාලෙ න සුවිදිතා හොති, වීතරාගස්ස සඞ්ඛාරුපෙක්ඛා අච්චන්තං සුවිදිතා හොති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති විදිතට්ඨෙන ච අවිදිතට්ඨෙන ච.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං[1], අතිත්තත්තා විපස්සති, සෙක්ඛොපි සඞ්ඛාරුපෙක්ඛං[1] අතිත්තත්තා විපස්සති, වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං තිත්තත්තා විපස්සති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති තිත්තට්ඨෙන ච අතිත්තට්ඨෙන ච.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං තිණ්ණං සංයොජනානං පහානාය සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය විපස්සති, සෙක්ඛො සඞ්ඛාරුපෙක්ඛං තිණ්ණං සංයොජනානං පහීනත්තා උත්තරිපටිලාභත්ථාය විපස්සති, වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං සබ්බකිලෙසානං පහීනත්තා දිට්ඨධම්මසුඛවිහාරත්ථාය විපස්සති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අනීහාරො නානත්තං හොති පහීනට්ඨෙන ච අප්පහීනට්ඨෙන ච.

කථං සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: සෙක්ඛො සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දති වා, විපස්සති වා, පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති; වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං විපස්සති වා, පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති, තදජ්ඣුපෙක්ඛිත්වා සුඤ්ඤතවිහාරෙන වා අනිමිත්තවිහාරෙන වා අප්පණිහිතවිහාරෙන වා විහරති. එවං සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති විහාරසමාපත්තට්ඨෙන.

කති සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති, කති සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති: අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති, දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

---

1. සඞ්ඛාරුපෙක්ඛා - ස්‍යා.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජනයාගේ සංස්කාරොපෙක්‍ෂාව කිසි කලෙක (විදර්ශනාකාලයෙහි) මොනොවට දන්නා ලද වෙයි. කිසි කලෙක (අභිනන්‍දන කාලයෙහි) සුවිදිත නො වෙයි. ශෛක්‍ෂයාගේ ද සංස්කාරොපෙක්‍ෂාව කිසි කලෙක සුවිදිත වෙයි. කිසි කලෙක සුවිදිත නො වෙයි. රහත්හුගේ සංස්කාරො-පෙක්‍ෂාව එකාන්තයෙන් සුවිදිත වෙයි. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය විදිතභාවයෙන් ද අවිදිතභාවයෙන් ද නානාත්ව වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරොපෙක්‍ෂාව අතෘප්ත බැවින් විදර්ශනා කෙරෙයි. ශෛක්‍ෂ තෙමේත් සංස්කාරොපෙක්‍ෂාව අතෘප්ත බැවින් විදර්ශනා කෙරෙයි. රහත් තෙමේ සංස්කාරොපෙක්‍ෂාව තෘප්ත බැවින් විදර්ශනා කෙරෙයි. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කා-රොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය තෘප්ත බැවින් ද අතෘප්ත බැවින් ද නානාත්ව වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරොපෙක්‍ෂාව තුන් සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රොතාපත්තිමාර්ගය ලබනු පිණිස විදර්ශනා කෙරෙයි. ශෛක්‍ෂ තෙම සංස්කාරොපෙක්‍ෂාව තුන් සංයොජනයන් ප්‍රහීණ බැවින් මතුමත්-තෙහි මාර්ග ප්‍රතිලාභය පිණිස විදර්ශනා කෙරෙයි. වීතරාග තෙමේ සංස්කාරොපෙක්‍ෂාව හැම කෙලෙසුන් ප්‍රහීණ බැවින් ඉහාත්මසුඛවිහරණ පිණිස විදර්ශනා කෙරෙයි. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය ප්‍රහීණ බැවින් ද අප්‍රහීණ බැවින් ද නානාත්ව වේ.

කිසෙයින් ශෛක්‍ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: ශෛක්‍ෂ තෙම සංස්කා-රොපෙක්‍ෂාව අභිනන්‍දනය (සප්‍රීතිකතෘෂ්ණාව) හෝ කෙරෙයි, විදර්ශනා හෝ කෙරෙයි. ප්‍රත්‍යවෙක්‍ෂා කොට ඵලසමවතට හෝ සමවදී. වීතරාග තෙමෙ සංස්කාරොපෙක්‍ෂාව විදර්ශනා හෝ කෙරෙයි, ප්‍රත්‍යවෙක්‍ෂා කොට ඵලසමවතට හෝ සමවදී. ඒ සංස්කාරොපෙක්‍ෂාව අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යතවිහාරයෙන් හෝ අනිමිත්තවිහාරයෙන් හෝ අප්‍රණිහිතවිහාරයෙන් හෝ වාසය කෙරෙයි. මෙසෙයින් ශෛක්‍ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය විහාරසමාපත්තිභාව-යෙන් නානාත්ව වේ.

කෙතෙක් සංස්කාරොපෙක්‍ෂාවෝ සමාධි වශයෙන් උපදිත් ද, කෙතෙක් සංස්කාරොපෙක්‍ෂාවෝ විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: සංස්කාරොපෙක්‍ෂාවෝ අට දෙනෙක් සමාධිවශයෙන් උපදිත්. සංස්කා-රොපෙක්‍ෂාවෝ දසදෙනෙක් විදර්ශනාවශයෙන් උපදිත්.

කතමා අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති: පඨමං ඣානං[1] පටිලාභත්ථාය නීවරණෙ පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, දුතියං ඣානං පටිලාභත්ථාය විතක්කවිචාරෙ පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, තතියං ඣානං පටිලාභත්ථාය පීතිං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, චතුත්ථං ඣානං පටිලාභත්ථාය සුඛදුක්ඛෙ පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතන සඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. ඉමා අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති.

කතමා දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති: සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං[2] පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං සොතාපත්තිඵලසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං -පෙ- උපායාසං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, සකදාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- සකදාගාමිඵලසමාපත්තත්ථාය අනාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අනාගාමිඵලසමාපත්තත්ථාය -පෙ- අරහත්තමග්ගං පටිලාභත්ථාය -පෙ- අරහත්තඵලසමාපත්තත්ථාය -පෙ- සුඤ්ඤතවිහාරසමාපත්තත්ථාය -පෙ- අනිමිත්තවිහාරසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං අයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. ඉමා දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

කති සඞ්ඛාරුපෙක්ඛා කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා: පණ්ණරස සඞ්ඛාරුපෙක්ඛා කුසලා, තිස්සො සඞ්ඛාරුපෙක්ඛා අබ්‍යාකතා. නත්ථි සඞ්ඛාරුපෙක්ඛා අකුසලා.

1. ''පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා අට්ඨ චිත්තස්ස ගොචරා
පුථුජ්ජනස්ස ද්වෙ හොන්ති තයො සෙක්ඛස්ස ගොචරා
තයො ච වීතරාගස්ස යෙහි චිත්තං විවට්ටති

1 පඨමජ්ඣානං - PTS 2 ආයූහනං - සහා - PTS

කවර සංස්කාරොපෙක්ෂාවෝ අටදෙනෙක් ශමථවශයෙන් උපදිත් ද යත්: ප්‍රථමධ්‍යානප්‍රතිලාභය සඳහා පඤ්චනීවරණයන් (ප්‍රහාතව්‍යභාවයෙන්) නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව (නීවරණ සඞ්ඛ්‍යාත) සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ. ද්විතීයධ්‍යාන ප්‍රතිලාභය සඳහා විතර්කවිචාරයන් නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ. තෘතීයධ්‍යාන ප්‍රතිලාභය සඳහා ප්‍රීතිය නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ, චතුර්ථධ්‍යාන ප්‍රතිලාභය සඳහා සුඛදුඃඛයන් නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ. ආකාසානඤ්චායතනසමාපත්ති ප්‍රතිලාභය සඳහා රූපසංඥව ප්‍රතිඝසංඥව නානාත්වසංඥව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිප්‍රතිලාභය සඳහා ආකාසානඤ්චායතනසංඥව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිප්‍රතිලාභය සඳහා විඤ්ඤාණඤ්චායතනසංඥව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥන යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිප්‍රතිලාභය සඳහා ආකිඤ්චඤ්ඤායතනසංඥව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරයන්ගේ උපෙක්ෂාඥන යි මේ සංස්කාරොපෙක්ෂාවෝ අටදෙන ශමථවශයෙන් උපදිත්.

කවර සංස්කාරොපෙක්ෂාවෝ දසදෙනෙක් විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: සෝවන්මාර්ගය ලැබීම පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත කර්මායූහනය ප්‍රතිසන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශොකය පරිදෙවය උපායාසය ප්‍රත්‍යවෙක්ෂා කොට මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරොපෙක්ෂා ඥන යැ. සෝවන් ඵලසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත කර්මායූහනය ප්‍රතිසන්ධිය ... ප්‍රත්‍යවෙක්ෂා කොට මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරොපෙක්ෂා ඥන යැ. සෙදගැමි මාර්ගය ලැබීම පිණිස ... සෙදගැමි ඵලසමවත පිණිස ... අනගැමි මාර්ගය ලැබීම පිණිස ... අනගැමි ඵලසමවත පිණිස ... රහත්මග ලැබීම පිණිස ... රහත් ඵලසමවත පිණිස ... ශූන්‍යතවිහාරසමාපත්තිය පිණිස ... අනිමිත්තවිහාරසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශොකය පරිදෙවය උපායාසය ප්‍රත්‍යවෙක්ෂා කොට මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥව සංස්කාරොපෙක්ෂා ඥන යි. මේ සංස්කාරොපෙක්ෂාවෝ දසදෙන විදර්ශනාවශයෙන් උපදිත්.

කෙතෙක් සංස්කාරොපෙක්ෂාවෝ කුශලයෝ ද, කෙතෙක් අකුශලයෝද, කෙතෙක් අව්‍යාකෘතයෝ ද යත්: සංස්කාරොපෙක්ෂාවෝ පසළොස් දෙනෙක් කුශලයෝ යැ. සංස්කාරොපෙක්ෂාවෝ තිදෙනෙක් අව්‍යාකෘතයෝ යැ. අකුශල වූ සංස්කාරොපෙක්ෂායෙක් නැති.

1. යම් (සංස්කාරොපෙක්ෂාධර්මයෙකින් විතර්කවිචාරාදියෙන්) සිත අපගම වේ ද ඒ පටිසඞ්ඛා සන්තිට්ඨනා (සංස්කාරොපෙක්ෂා) ප්‍රඥවෝ (ශමථ වශයෙන්) චිත්තගොචර වූවාහු අටදෙනෙක් වෙති. පෘථග්ජනයාහට (ශමථවිදර්ශනාසමාපත්ති වශයෙන්) තිදෙනෙක් ගොචර වෙති. රහත්හට (අප්‍රණිහිත, ශූන්‍යත, ඵලසමාපත්ති වශයෙන්) තිදෙනෙක් ගොචර වෙත්.

2. අට්ඨ සමාධිස්ස පච්චයා දස ඤාණස්ස ගොචරා
අට්ඨාරස සඞ්ඛාරුපෙක්ඛා තිණ්ණං විමොක්ඛාන පච්චයා.

3. ඉමෙ අට්ඨාරසාකාරා පඤ්ඤා යස්ස පරිචිතා[1]
කුසලො සඞ්ඛාරුපෙක්ඛාසු නානාදිට්ඨීසු න කම්පතී''ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං'.

**සඞ්ඛාරුපෙක්ඛාඤාණනිද්දෙසො.**

## 10. ගොත්‍රභුඤාණං

කථං බහිද්ධා වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභු ඤාණං:

උප්පාදං අභිභුය්‍යතීති ගොත්‍රභූ, පවත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ, නිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ආයූහනං අභිභුය්‍යතීති ගොත්‍රභූ, පටිසන්ධිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ගතිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, නිබ්බත්තිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, උපපත්තිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ජාතිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ජරං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ව්‍යාධිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, මරණං අභිභුය්‍යතීති ගොත්‍රභූ, සොකං අභිභුය්‍යතීති ගොත්‍රභූ, පරිදෙවං අභිභුය්‍යතීති ගොත්‍රභූ, උපායාසං අභිභුය්‍යතීති ගොත්‍රභූ, බහිද්ධා සඞ්ඛාරනිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ.

අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ -පෙ- නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදං අභිභුය්‍යිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, පවත්තං අභිභුය්‍යිත්වා අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, නිමිත්තං අභිභුය්‍යිත්වා අනිමිත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- බහිද්ධා සඞ්ඛාර නිමිත්තං අභිභුය්‍යිත්වා නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා වුට්ඨාතීති ගොත්‍රභූ, පවත්තා වුට්ඨාතීති ගොත්‍රභූ, නිමිත්තා වුට්ඨාතීති ගොත්‍රභූ, ආයූහනා වුට්ඨාතීති ගොත්‍රභූ, පටිසන්ධියා වුට්ඨාතීති ගොත්‍රභූ, ගතියා වුට්ඨාතීති ගොත්‍රභූ, නිබ්බත්තියා වුට්ඨාතීති ගොත්‍රභූ උපපත්තියා වුට්ඨාතීති ගොත්‍රභූ, ජාතියා වුට්ඨාතීති ගොත්‍රභූ, ජරාය වුට්ඨාතීති ගොත්‍රභූ බ්‍යාධිම්හා වුට්ඨාතීති ගොත්‍රභූ, මරණා වුට්ඨාතීති ගොත්‍රභූ, සොකා වුට්ඨාතීති ගොත්‍රභූ, පරිදෙවා වුට්ඨාතීති ගොත්‍රභූ, උපායාසා වුට්ඨාතීති ගොත්‍රභූ, බහිද්ධා සඞ්ඛාරනිමිත්තා වුට්ඨාතීති ගොත්‍රභූ.

---

1. පරිච්චිතා මජසං

2. ශමථ වශයෙන් කියන ලද අටදෙන අර්පණාසමාධියට ප්‍රත්‍යය වෙති. විදර්ශනාවශයෙන් කියන ලද දසදෙන මාර්ගඥානයට ද ඵලඥානයට ද ගොචර වෙති. මේ අටළොස් සංස්කාරොපෙක්ෂාඥානයෝ (ශූන්‍යතාදි) ත්‍රිවිධ විමොක්ෂයන්ට (උපනිශ්‍රයප්‍රත්‍යයෙන්) ප්‍රත්‍යය වෙත්.

3. මේ අටළොස් වැදෑරුම් වූ ප්‍රඥාවෝ යම් යොගාවචරයක්හු විසින් පුරුදු කරන ලද්දාහු ද (හෙතෙම) සංස්කාරොපෙක්ෂාඥානයෙහි නිපුණ වූයේ (ශාශ්වතාදි) නානාදෘෂ්ටියෙහි නො සැලේ යයි.

**එය ඥාතාර්ථයෙන් ඥාන නමැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා නම්. එයින් කියනු ලැබෙයි: 'පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං' යි.**

**සංස්කාරොපෙක්ෂාඥාන නිර්දේශ යි.**

## 10. ගොත්‍රභූ ඥානය

බිහෙයින් බාහ්‍ය වූ සංස්කාර නිමිත්තෙන් නැඟී සිටුනා එයට පරාඞ්මුඛ වීමෙහි ප්‍රඥාව ගොත්‍රභූඥාන වෙයි යත්:

උත්පාදය ඉක්මවා (අභිභවනය කෙරේ) නු යි ගොත්‍රභූ නමැ. ප්‍රවෘත්තිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. නිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ආයූහනය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ප්‍රතිසන්ධිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ගතිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. නිර්වෘත්තිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. උපප්‍රාප්තිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ජාතිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ජරාව ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ව්‍යාධිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. මරණය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ශොකය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. පරිදෙවය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. උපායාසය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. වාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ නම්.

අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ, අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නුයි ගොත්‍රභූ නමැ ... නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදය ඉක්මවා අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ප්‍රව ත්තිය ඉක්මවා අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. නිමිත්ත ඉක්මවා අනිමිත්තට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ ... වාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ ප්‍රවෘත්තියෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. නිමිත්තයෙන් නැඟිසිටී නු යි ගොත්‍රභූ නමැ. කර්මායූහනයෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. ප්‍රතිසන්ධියෙන් නැඟී සිටී නු යි ගොත්‍රභූ නමැ. ගතියෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. නිර්වෘත්තියෙන් නැඟී සිටි නු යි ගොත්‍රභූ නමැ. උපප්‍රාප්තියෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. ජාතියෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. ජරායෙන් නැඟි සිටී නු යි ගොත්‍රභූ නමැ. ව්‍යාධියෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. මරණයෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. ශොකයෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. පරිදෙවයෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නමැ. උපායාසයෙන් නැඟී සිටී නු යි ගොත්‍රභූ නමැ. වාහ්‍ය සංස්කාරනිමිත්තයෙන් නැඟීසිටී නු යි ගොත්‍රභූ නම්.

අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා වුට්ඨිතත්තා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, පවත්තා වුට්ඨිතත්තා අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, නිමිත්තා වුට්ඨිතත්තා අනිමිත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, ආයූහනා වුට්ඨිතත්තා අනායූහනං පක්ඛන්දතීති ගොත්‍රභූ, පටිසන්ධියා වුට්ඨිතත්තා අප්පටිසන්ධිං පක්ඛන්දතීති ගොත්‍රභූ, ගතියා වුට්ඨිතත්තා අගතිං පක්ඛන්දතීති ගොත්‍රභූ, නිබ්බත්තියා වුට්ඨිතත්තා අනිබ්බත්තිං පක්ඛන්දතීති ගොත්‍රභූ, උපපත්තියා වුට්ඨිතත්තා අනුපපත්තිං පක්ඛන්දතීති ගොත්‍රභූ, ජාතියා වුට්ඨිතත්තා අජාතිං පක්ඛන්දතීති ගොත්‍රභූ, ජරාය වුට්ඨිතත්තා අජරං පක්ඛන්දතීති ගොත්‍රභූ, බ්‍යාධිම්හා වුට්ඨිතත්තා අබ්‍යාධිං පක්ඛන්දතීති ගොත්‍රභූ, මරණා වුට්ඨිතත්තා අමරණං පක්ඛන්දතීති ගොත්‍රභූ, සොකා වුට්ඨිතත්තා අසොකං පක්ඛන්දතීති ගොත්‍රභූ, පරිදෙවා වුට්ඨිතත්තා අපරිදෙවං පක්ඛන්දතීති ගොත්‍රභූ, උපායාසා වුට්ඨිතත්තා අනුපායාසං පක්ඛන්දතීති ගොත්‍රභූ, බහිද්ධාසඞ්ඛාරනිමිත්තා වුට්ඨිතත්තා නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා විවට්ටතීති ගොත්‍රභූ, පවත්තා විවට්ටතීති ගොත්‍රභූ, -පෙ- බහිද්ධා සඞ්ඛාරනිමිත්තා විවට්ටතීති ගොත්‍රභූ.

අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා විවට්ටිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, පවත්තා විවට්ටිත්වා අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- බහිද්ධා සඞ්ඛාරනිමිත්තා විවට්ටිත්වා නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

කති ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති, කති ගොත්‍රභූධම්මා විපස්සනා වසෙන උප්පජ්ජන්ති: අට්ඨ ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති, දස ගොත්‍රභූධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

කතමෙ[1] අට්ඨ ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති: පඨමං ඣානං[2] පටිලාභත්ථාය නිවරණෙ අභිභුය්‍යතීති ගොත්‍රභූ, දුතියං ඣානං පටිලාභත්ථාය විතක්කවිචාරෙ අභිභුය්‍යතීති ගොත්‍රභූ, තතියං ඣානං පටිලාභත්ථාය පීතිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, චතුත්ථං ඣානං පටිලාභත්ථාය සුඛදුක්ඛෙ අභිභුය්‍යතීති ගොත්‍රභූ, ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං ආභිභුය්‍යතීති ගොත්‍රභූ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ. ඉමෙ අට්ඨ ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති.

1. කතමා - සී 1. 2. පඨමජ්ඣානං - PTS සී 1.

අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ ... නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් නැඟී අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ප්‍රවෘත්තියෙන් නැඟී අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. නිමිත්තයෙන් නැඟී අනිමිත්තයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ආයූහනයෙන් නැඟී අනායූහනයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ප්‍රතිසන්ධියෙන් නැඟී අප්‍රතිසන්ධියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ගතියෙන් නැඟී අගතියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. නිර්වෘත්තියෙන් නැඟී අනිර්වෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. උපප්‍රාප්තියෙන් නැඟී අනුපප්‍රාප්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ජාතියෙන් නැඟී අජාතියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ජරායෙන් නැඟී අජරාවට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ව්‍යාධියෙන් නැඟී අව්‍යාධියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. මරණයෙන් නැඟී අමරණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ශොකයෙන් නැඟී අශොකයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. උපායාසයෙන් නැඟී අනුපායාසයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. වාහ්‍යසංස්කාර නිමිත්තෙන් නැඟී නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් අපගත වේ නු යි ගොත්‍රභූ නමැ. ප්‍රවෘත්තියෙන් අපගත වේ නු යි ගොත්‍රභූ නමැ. ... වාහ්‍ය සංස්කාර නිමිත්තෙන් අපගත වේ නු යි ගොත්‍රභූ නමැ.

අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ ... අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ ... නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් අපගත වැ අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ප්‍රවෘත්තියෙන් අපගත වැ අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ ... වාහ්‍ය සංස්කාර නිමිත්තෙන් අපගත වැ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

කෙතෙක් ගොත්‍රභූධර්මයෝ ශමථවශයෙන් උපදිත් දඃ කෙතෙක් ගොත්‍රභූධර්මයෝ විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: ගොත්‍රභූධර්මයෝ අට-දෙනෙක් ශමථවශයෙන් උපදිත්. ගොත්‍රභූධර්මයෝ දසදෙනෙක් විදර්ශනා-වශයෙන් උපදිත්.

කවර ගොත්‍රභූධර්මයෝ අටදෙනෙක් ශමථවශයෙන් උපදිත් ද යත්: ප්‍රථමධ්‍යානය ලබනු පිණිස නීවරණයන් ඉක්මවා (අභිභවනය කෙරේ) නු යි ගොත්‍රභූ යැ. ද්විතීධ්‍යානය ලබනු පිණිස විතර්කවිචාරයන් ඉක්මවා, නු යි ගොත්‍රභූ යැ. තෘතීයධ්‍යානය ලබනු පිණිස ප්‍රීතිය ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. චතුර්ථධ්‍යානය ලබනු පිණිස සුඛදුඃඛයන් ඉක්මවා නු යි ගොත්‍රභූ යැ ආකාසානඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස රූපසංඥාව ප්‍රතිඝසංඥාව නානාත්වසංඥාව ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. විඤ්ඤාණඤ්චා-යතනසමාපත්තිය ලබනු පිණිස ආකාසානඤ්චායතනසංඥාව ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ලබනු පිණිස විඤ්ඤාණඤ්චා-යතනසංඥාව ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන-සමාපත්තිය ලබනු පිණිස ආකිඤ්චඤ්ඤායතනසංඥාව ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. මේ ගොත්‍රභූධර්මයෝ අටදෙන ශමථ වශයෙන් උපදිත්.

කතමෙ දස ගොත්‍රභුධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති: සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං බ්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං බහිද්ධාසඞ්ඛාරනිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභු, සොතාපත්තිඵලසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං පටිසන්ධිං –පෙ– අභිභුය්‍යතීති ගොත්‍රභු, සකදාගාමිමග්ගං පටිලාභත්ථාය –පෙ– සකදාගාමිඵලසමාපත්තත්ථාය –පෙ– අනාගාමිමග්ගං පටිලාභත්ථාය –පෙ– අනාගාමිඵලසමාපත්තත්ථාය –පෙ– අරහත්තමග්ගං පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං බ්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං බහිද්ධාසඞ්ඛාරනිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභු, අරහත්තඵලසමාපත්තත්ථාය –පෙ– සුඤ්ඤතවිහාරසමාපත්තත්ථාය –පෙ– අනිමිත්තවිහාරසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං –පෙ– අභිභුය්‍යතීති ගොත්‍රභු, ඉමෙ දස ගොත්‍රභුධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

කති ගොත්‍රභුධම්මා කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා. පන්නරස ගොත්‍රභුධම්මා කුසලා, තයො ගොත්‍රභුධම්මා අබ්‍යාකතා, නත්ථි ගොත්‍රභුධම්මා අකුසලා.

1. "සාමිසඤ්ච නිරාමිසං පණිහිතඤ්ච අප්පණිහිතං
සුඤ්ඤතඤ්ච විසඤ්ඤුත්තං වුට්ඨිතඤ්ච අවුට්ඨිතං

2. අට්ඨ සමාධිස්ස පච්චයා දස ඤාණස්ස ගොචරා
අට්ඨාරස ගොත්‍රභුධම්මා තිණ්ණං විමොක්ඛාන පච්චයා,

3. ඉමෙ අට්ඨාරසාකාරා පඤ්ඤා යස්ස පරිචිතා
කුසලො විවට්ටෙ වුට්ඨානෙ නානාදිට්ඨීසු න කම්පතී"ති

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: "බහිද්ධාවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභු ඤාණං"

**ගොත්‍රභුඤාණනිද්දෙසො.**

## 11. මග්ගඤාණං

කථං දුභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තෙන වුච්චති: දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

කවර ගොත්‍රභූධර්මයෝ දසදෙනෙක් විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: ස්‍රොතාපත්තිමාර්ගප්‍රතිලාභය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශෝකය පරිදෙවය උපායාසය බාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. ස්‍රොතාපත්තිඵලසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ... ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. සකෘදාගාමිමාර්ගප්‍රතිලාභය පිණිස ... සකෘදාගාමිඵලසමාපත්තිය පිණිස ... අනාගාමිමාර්ගප්‍රතිලාභය පිණිස ... අනාගාමිඵලසමාපත්තිය පිණිස ... අර්හත්මාර්ගප්‍රතිලාභය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රති-සන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශෝකය පරිදෙවය උපායාසය බාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. අර්හත්ඵලසමාපත්තිය පිණිස ... ශූන්‍යතවිහාර සමාපත්තිය පිණිස ... අනිමිත්තවිහාරසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ... ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. මේ ගොත්‍රභූධර්මයෝ දසදෙන විදර්ශනාවශයෙන් උපදිත්.

කෙතෙක් ගොත්‍රභූධර්මයෝ කුශලයෝ ද කෙතෙක් අකුශලයෝ ද කෙතෙක් අව්‍යාකෘතයෝ ද යත්: ගොත්‍රභූධර්මයෝ පසළොස්දෙනෙක් කුශලයෝ යැ. ගොත්‍රභූධර්මයෝ තිදෙනෙක් අව්‍යාකෘතයෝ යැ. ගොත්‍රභූ-ධර්මයෝ අකුශල වූවාහු නැති යි.

1. නිකාන්ති සහිත බැවින් සාමිෂ යැ (නිකාන්ති රහිත බැවින්) නිරාමිෂ යැ. (නිකාන්ති ප්‍රණිධියෙන් සිටි බැවින්) ප්‍රණිහිත යැ (තදභාවයෙන්) අප්‍රණිහිත යැ (නිකාන්ති සංයොගයෙන්) සංයුක්ත යැ (තදභාවයෙන්) විසංයුක්ත යැ (නිකාන්තිය සිඳුනා බැවින්) ව්‍යුත්ථිත යැ (තදභාවයෙන්) අව්‍යුත්ථිත යි.

2. ගොත්‍රභූධර්මයෝ අටදෙනෙක් සමාධියට ප්‍රත්‍යයෝ වෙති. දසදෙනෙක් ඥානයට ගොචර වූවාහු වෙති. අටළොස් ගොත්‍රභූධර්මයෝ තුන් විමොක්ෂ-යනට ප්‍රත්‍යයෝ වෙත්.

3. මේ අටළොස් ආකාර ප්‍රඥවෝ යමක්හු විසින් පුරුදු කරන ලද්දාහු ද ඒ විවර්තයෙහි හා ව්‍යුත්ථානයෙහි නිපුණ වූයේ නානා දෘෂ්ටීන්හි නො සැලේ යයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'බහිද්ධා වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභුඤාණං' යි.

**ගොත්‍රභූඥාන නිර්දෙශ යි.**

## 11. මාර්ගඥානය

කිසෙයින් උභතොව්‍යුත්ථානවිවර්තනයෙහි ප්‍රඥාව මාර්ගඥාන වෙයි යත්:

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි සත්‍යදර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය (දෙසැට) මිථ්‍යාදෘෂ්ටියෙන් නැඟෙයි. තදනුවර්තක (මිථ්‍යාදෘෂ්ටිය අනුවැ පවත්නා) කෙලශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි. 'දුභතොවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං' යි.

අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය වුට්ඨාති, තදනුවත්තක-කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනි-මිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං

වොදානට්ඨෙන සම්මා ආජීවො මිච්ඡාආජීවා වුට්ඨාති, තදනුවත්ත-කකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා වුට්ඨාති, තදනුවත්තක-කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා වුට්ඨාති, තදනුවත්තක-කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: 'උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො වුට්ඨාති, තදනුවත්තක-කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා, අණු-සහගතා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: උභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'.

අභිනිරෝපණසවභාවයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පය කෙරෙන් නැඟෙයි. තදනුවර්තික ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. වාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

පරිග්‍රහ (සතර වාක්සංවර) සවභාවයෙන් සම්‍යග්වචනය මිථ්‍යාවචනයෙන් නැඟෙයි. තදනුවර්තික ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. වාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’ යි.

සමුට්ඨාන (කාරණ) භාවයෙන් සම්‍යක්කර්මාන්තය (ප්‍රාණවධාදි) මිථ්‍යාකර්මාන්තයෙන් නැඟෙයි. තදනුවර්තික ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙ යි. බාහ්‍ය වූ හැම සංස්කාර නිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

පරිශුද්ධභාවයෙන් සම්‍යගාජීවය මිථ්‍යාආජීවයෙන් නැඟෙයි. තදනුවර්තිකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

ප්‍රග්‍රහභාවයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයෙන් නැඟෙයි. තදනුවර්තික ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

එළඹ සිටුනා බැවින් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතියෙන් නැඟෙයි. තදනුවර්තික ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

අවික්ෂේපාර්ථසවභාවයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධියෙන් නැඟී සිටී, තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී, බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්තයන් ගෙන් ද නැඟීසිටී. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි සත්‍යදර්ශනසවභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂේපසවභාවයෙන් සම්‍යක්සමාධිය ඖදාරික වූ කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් නැඟීසිටී, තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙන් ද, ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී, බාහ්‍ය වූ ද හැම සංස්කාරනිමිත්තයන් කෙරෙන් නැඟීසිටී. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනසවභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂේපසවභාවයෙන් සම්‍යක්සමාධිය අණුසහගත (සියුම්) වූ කාමරාගසංයොජනයෙන් ද ප්‍රතිඝසංයොජනයෙන් ද අණුසහගත වූ කාමරාගානුශයෙන් ද ප්‍රතිඝානුශයෙන් ද නැඟීසිටී. තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී. බාහ්‍ය වූ ද හැම සංස්කාරනිමිත්තයන් කෙරෙන් නැඟීසිටී. එයින් කියනු ලැබෙයි: ‘දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’යි.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

1. "අජාතං ඣාපෙති[1] ජාතෙන ඣානං[2] තෙන පවුච්චති
ඣානවිමොක්ඛෙ[3] කුසලතා නානාදිට්ඨිසු න කම්පති[4]

2. සමාදහිත්වා යථා චෙ විපස්සති
විපස්සමානො තථා චෙ සමාදහෙ
විපස්සනා ච සමථො තදා අහු
සමානභාගා යුගනද්ධා වත්තරෙ.

3. දුක්ඛා සඞ්ඛාරා සුඛො නිරොධොති දස්සනං
දුභතො වුට්ඨිතා පඤ්ඤා ඵස්සෙති අමතං පදං

4. විමොක්ඛචරියං ජානාති නානත්තෙකත්ත[5] කොවිදො
ද්වින්නං ඤාණානං කුසලතා නානාදිට්ඨිසු න කම්පතී"ති,

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති "දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං."

මග්ගඤාණනිද්දෙසො.

## 12. ඵලඤාණං

කථං පයොගපටිප්පස්සද්ධිපඤ්ඤා ඵලෙ ඤාණං.

සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග[6] පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාදිට්ඨි, මග්ගස්සෙතං ඵලං.

---

1 ඤාපෙති - PTS, 2. ඤාණං - PTS, 3. ඤාණවිමොක්ඛෙ - PTS.
4. න කම්පතීති - ස්‍යා 5. නානත්තෙකත්තෙන - PTS. 6. තප්පයොග විම

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපභාවයෙන් සම්‍යක්සමාධිය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් නැගීසිටී, තදනුවර්තක වූ කෙලශයන් කෙරෙන් ද, ස්කන්ධයන් කෙරෙන් ද නැගීසිටී, බාහ්‍ය වූ ද හැම සංස්කාරනිමිත්තයන් කෙරෙන් නැගීසිටී. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

1. ස්වසන්තානයෙහි උපන් ලොකොත්තරධ්‍යානයෙන් (තත්සමඞ්ගී පුද්ගල තෙමේ) නූපන් කෙලශය දවයි, එකරුණෙන් එය ධ්‍යාන යයි කියනු ලැබේ. ඒ ආයර්‍යමාර්ගසම්ප්‍රයුක්ත වූ ධ්‍යානයෙහි ද විමොක්ෂ සඞ්ඛ්‍යාත ආයර්‍යමාර්ගයෙහි ද කුශල බව හෙතු කොටගෙන නානා දෘෂ්ටීන්හි කම්පා නො වේ.

2. ආලම්බනොපචාරක්ෂණිකසමාධීන් අතුරෙන් එක්තරා සමාධියකින් චිත්තසමාධානය කොට යම්සේ විදර්ශනා කෙරේ ද, විදර්ශනා කරනුයේ එසෙයින් ම චිත්තසමාධානය ද කරන්නේ ය. එකල්හි විදර්ශනාව ද ශමථය ද වෙති. සමභාග වූ ශමථවිදර්ශනාධර්මයෝ යුගනද්ධ වූවාහු පවත්නාහ.

3. සංස්කාරයෝ දුඃඛයෝ යැ, නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණ සුව යැ යි දර්ශන සඞ්ඛ්‍යාත ආයර්‍යමාර්ගඥානය 'දුභතො වුට්ඨානපඤ්ඤා නමු. (ඒ ප්‍රඥාව මැ) අමෘතපද සඞ්ඛ්‍යාත නිවන ආලම්බනස්පර්ශයෙන් ස්පර්ශ කෙරෙයි.

4. විමොක්ෂයන් ගේ නානාත්වයෙහි ද එකත්වයෙහි ද නිපුණ වූයේ විමොක්ෂප්‍රවෘත්තිය අසම්මූඪවශයෙන් දනගනී, දර්ශනසඞ්ඛ්‍යාත වූ ද භාවනාසඞ්ඛ්‍යාත වූ ද ඥානද්වයයාගේ නිපුණබව හෙතු කොටගෙන ශාශ්වතාදි නානාදෘෂ්ටියෙහි නො සැලේ යයි.

ඒ මාර්ගඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

**මාර්ගඥාන නිර්දෙශ යි.**

## 12. ඵලඥානය

ප්‍රයොගප්‍රතිප්‍රශ්‍රබ්ධියෙහි (-ආයර්‍යමාර්ගනිමිත්තෙන් කෙලශයන්ගේ සන්හිඳීමෙහි) ප්‍රඥාව කිසෙයින් ඵලඥාන නම් වෙයි යත්:

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ ස්‍වප්‍රතිපක්ෂයන් දර්ශනභාවයෙන් මිථ්‍යාදෘෂ්ටිය කෙරෙන් නැගීසිටී. ඒ මිථ්‍යාදෘෂ්ටිය අනුව පවත්නා කෙලශයන් කෙරෙනු දු ස්කන්ධයන් කෙරෙනු දු නැගීසිටී. (යථොක්ත කෙලශ-ස්කන්ධයන් කෙරෙන්) පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනු දු නැගීසිටී. ඒ (අජ්ඣත්තබහිද්ධා දෙකින්) වුට්ඨානාදී ප්‍රයොගය සන්හුන්වන බැවින් (මාර්ගානන්තර වැ එක් දෙ වටෙක හෝ, ඵලසමාපත්තිකාලයෙහි නො එක් වට, නිරොධයෙන් නැඟෙනුවහුට දෙවටෙක) සම්‍යග්දෘෂ්ටිය උපදී, තෙල (විපාකසම්‍යග්දෘෂ්ටිය) ආයර්‍යමාර්ගයාගේ ඵල යි.

අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා වුට්ඨාති තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග[1] පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසඞ්කප්පො, මග්ගස්සෙතං ඵලං.

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාවාචා, මග්ගස්සෙතං ඵලං.

සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාකම්මන්තො. මග්ගස්සෙතං ඵලං.

වොදානට්ඨෙන සම්මාආජීවො මිච්ඡාආජීවා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාආජීවො, මග්ගස්සෙතං ඵලං.

පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග[1] පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාවායාමො. මග්ගස්සෙතං ඵලං.

උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයො ගවිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසති, මග්ගස්සෙතං ඵලං.

අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසමාධි, මග්ගස්සෙතං ඵලං.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසංයොජනා පටිඝසංයොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තංපයොග පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසමාධි, මග්ගස්සෙතං ඵලං.

1. තප්පයොග .... විම

අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සඞ්කල්පය තෙමේ මිථ්‍යාසඞ්කල්පයෙන් නැඟීසිටී. ඒ මිථ්‍යාසඞ්කල්පය අනුව පවත්නා කෙලශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි. එයින් පිටත්හි වූ සියලු සංස්කාරනිමිත්තයෙනුදු නැඟෙයි ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්සඞ්කල්පය උපදී. තෙල විපාක සම්‍යක්සඞ්කල්පය ආර්‍ය්‍යමාර්ගයාගේ ඵල යි.

සම්‍යග්වචනය පරිග්‍රහභාවයෙන් මිථ්‍යාවචනයෙන් නැඟීසිටී ඒ මිථ්‍යාවචනය හා අනුව පවත්නා කෙලශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැඟීසිටී. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යග්වචනය උපදී, තෙල විපාක වූ සම්‍යග්වචනය ආර්‍ය්‍යමාර්ගයාගේ ඵලය යි.

සම්‍යක්කර්මාන්ත තෙමේ සමුත්ථානභාවයෙන් මිත්‍ථ්‍යාකර්මාන්තයෙන් නැඟෙයි. තදනුවර්තික වූ කෙලශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයෙනුදු නැඟෙයි. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්කර්මාන්තය උපදී. තෙල විපාක වූ සම්‍යක්කර්මාන්තය ආර්‍ය්‍යමාර්ගයාගේ ඵල යි.

සම්‍යගාජීව තෙමේ ව්‍යවදානභාවයෙන් මිත්‍ථ්‍යාආජීවයෙන් නැඟෙයි. තදනුවර්තික වූ කෙලශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයෙනුදු නැඟෙයි ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යගාජීවය උපදී. තෙල විපාක වූ සම්‍යගාජීවය ආර්‍ය්‍යමාර්ගයාගේ ඵල යි.

සම්‍යග්ව්‍යායාම තෙමේ ප්‍රග්‍රහාර්ථයෙන් මිත්‍ථ්‍යාව්‍යායාමයෙන් නැඟෙයි. තදනුවර්තික වූ කෙලශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි එයින් පිටත්හි වූ සියලු සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැඟෙයි. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යග්ව්‍යායාමය උපදී. තෙල විපාක වූ සම්‍යග්ව්‍යායාමය මාර්ගයාගේ ඵල යි.

සම්‍යක්ස්මෘති තොමෝ උපස්ථානභාවයෙන් මිත්‍ථ්‍යාස්මෘතියෙන් නැඟෙයි. තදනුවර්තික වූ කෙලශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැඟෙයි. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්ස්මෘති තොමෝ උපදී. තෙල විපාක වූ සම්‍යක්ස්මෘතිය ආර්‍ය්‍යමාර්ගයාගේ ඵල යි.

සම්‍යක්සමාධි තෙමේ අවික්ෂෙපභාවයෙන් මිත්‍ථ්‍යාසමාධිය කෙරෙන් නැඟෙයි, තදනුවර්තික වූ කෙලෙසුන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි. ඒ (කෙලශස්කන්ධයන්) කෙරෙන් පිටත් හි වූ සියලු සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැඟෙයි. ඒ (අජ්ඣත්ත-බහිද්ධා දෙකින් වුට්ඨානාදි) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්සමාධිය උපදී තෙල විපාක වූ සම්‍යක්සමාධිය ආර්‍ය්‍යමාර්ගයාගේ ඵල යි.

සකෘදාගාමිමාර්ගය උපදනා ඇසිල්ලෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ දර්ශනභාවයෙන් ... සම්‍යක්සමාධි තෙමේ අවික්ෂෙපභාවයෙන් ඖදාරික වූ කාමරාගසංයොජනය කෙරෙන් ප්‍රතිඝසංයොජනය කෙරෙන් කාමරාගානුශය කෙරෙන් ප්‍රතිඝානුශය කෙරෙන් නැඟෙයි. ඒ කාමරාගසංයොජනාදිය හා අනුව පවත්නා කෙලශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැඟෙයි. ඒ කෙලශ-ස්කන්ධයන් කෙරෙන් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැඟීසිටී. ඒ, (ව්‍යුත්ථානාදි) ප්‍රයොගය සන්හුන් වන බැවින් සම්‍යක්සමාධිය උපදී. තෙල විපාක වූ සම්‍යක්සමාධිය (සකෘදාගාමි) **ආර්‍ය්‍යමාර්ගයා** ගේ ඵල යි.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාග සඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණු-සහගතා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග-පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසමාධි, මග්ගස්සෙතං ඵලං.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙ-පට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය, මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා වුට්ඨාති, තදනුවත්තක-කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසඞ්කප්පො මග්ගස්සෙතං ඵලං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: පයොගපටිප්පස්සද්ධිපඤ්ඤා ඵලෙ ඤාණං.

ඵලඤාණනිද්දෙසො.

## 13. විමුත්තිඤාණං

කථං ඡින්නාවට්ටමනුපස්සනෙ[1] පඤ්ඤා විමුත්තිඤාණං:

සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසො, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො, අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා-සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි පඤ්චහි උපක්කිලෙසෙහි සපරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුවිමුත්තං. තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජාන-නට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: ඡින්නාවට්ටමනුපස්සනෙ[1] පඤ්ඤා විමුත්ති ඤාණං.

සකදාගාමිමග්ගෙන ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි චතූහි උපක්කිලෙසෙහි පරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුවිමුත්තං. තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති. ‘ඡින්නාවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්ති ඤාණං.

---

1. ඡින්නවටුමානුපස්සනෙ - මජසං. ඡින්න මනුපස්සනෙ - සයා, PTS.

අනාගාමිමාර්ගය උපදනා ඇසිල්ලෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ දර්ශනභාවයෙන් ... අවික්ෂෙපභාවයෙන් සම්‍යක්සමාධි තෙමේ අණුසහගත වූ කාමරාගසංයොජනයා කෙරෙන් ප්‍රතිඝසංයොජනයා කෙරෙන් අණුසහගත කාමරාගානුශයා කෙරෙන් ප්‍රතිඝානුශයා කෙරෙන් නැඟීසිටී, තදනුවර්තීක වූ කෙලශයන් කෙරෙනු ද සකන්ධයන් කෙරෙනු ද නැඟීසිටී (ඒ කෙලශ-සකන්ධයන් කෙරෙන්) පිටත්හි වූ සියලු සංසකාරනිමිත්තයන් කෙරෙනු ද නැඟීසිටී. ඒ (ව්‍යුත්ථානාදී) ප්‍රයොගය සන්හුන් වන බැවින් සම්‍යක්-සමාධිය උපදී. තෙල විපාක වූ සම්‍යක්සමාධිය අනාගාමිමාර්ගයා ගේ ඵල යි.

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනභාවයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ .. අවික්ෂෙපභාවයෙන් සම්‍යක්සමාධි තෙමේ රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් නැඟීසිටී. තදනුවර්තීක වූ කෙලශයන් කෙරෙන් ද සකන්ධයන් කෙරෙන් ද නැඟීසිටී. (ඒ කෙලශ-සකන්ධයන් කෙරෙන්) පිටත්හි වූ හැම සංසකාරනිමිත්තයන් කෙරෙනු ද නැඟීසිටී. ඒ (ව්‍යුත්ථානාදි) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්සමාධිය උපදී. තෙල විපාක වූ සම්‍යක්සමාධිය අර්හත්මාර්ගයා ගේ ඵල යි.

ඒ ඵලඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "පයොගපටිප්පසසද්ධිපඤ්ඤා ඵලෙ ඤාණං" යි.

**ඵලඥාන නිර්දෙශ යි.**

## 13. විමුක්තිඥානය

කිසෙයින් ඒ ඒ ආර්‍යමාර්ගයෙන් සමුච්ඡින්න වූ උපකෙලශයන් පසුව බැලීමෙහි ප්‍රඥාව විමුක්තිඥාන වෙයි යත්:

ස්‍රොතාපත්තිමාර්ගයෙන් සක්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීලව්‍රතපරාමර්ශ යැ දෘෂ්ටානුශය යැ විචිකිත්සානුශය යැ යන සවකීය චිත්තයාගේ උපකෙලශයෝ (සමුච්ඡෙදප්‍රහාණයෙන් අනුත්පාදනිරොධයෙන්, මැනැවින් සිඳුනා ලද්දාහු වෙති, පර්‍යුත්ථාන සහිත වූ මේ පඤ්චොපකෙලශයන් කෙරෙන් සිත විමුක්ත වූයේ සුවිමුක්ත වූයේ වෙයි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි. "ඡින්නවටුමනුපසසනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන සවකීය චිත්තයා ගේ උපකෙලශයෝ මැනැවින් සිඳුනා ලද්දාහු වෙති. පර්‍යුත්ථානකෙලශයන් සහිත වූ මේ සතර උපකෙලශයන් කෙරෙන් චිත්තය විමුක්ත සුවිමුක්ත වූයේ වෙයි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ඡින්නවටුමනු-පසසනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

අනාගාමිමග්ගෙන අණුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං අණුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි චතූහි උපක්කිලෙසෙහි සපරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුමුත්තං. තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්ති ඤාණා.

අරහත්තමග්ගෙන රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි අට්ඨහි උපක්කිලෙසෙහි සපරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුවිමුත්තං, තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං.'

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං.

**විමුත්තිඤාණනිද්දෙසො.**

## 14. පච්චවෙක්ඛනඤාණං

**කථං තදා සමුදාගතෙ[1] ධම්මෙ පස්සනෙ[2] පඤ්ඤා පච්චවෙක්ඛනෙ ඤාණං:**

සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා.[3] අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො තදා සමුදාගතො, පරිග්ගහට්ඨෙන සම්මාවාචා තදා සමුදාගතා, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො තදා සමුදාගතො, වොදානට්ඨෙන සම්මාආජීවො තදා සමුදාගතො, පග්ගහට්ඨෙන සම්මාවායාමො තදා සමුදාගතො, උපට්ඨානට්ඨෙන සම්මාසති තදා සමුදාගතා, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි තදා සමුදාගතො.

උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො.

---

1 සමුපාගතෙ - සයා
2. විපස්සනෙ - PTS
3. සමුපගතා - සයා

අනාගාමිමාර්ගයෙන් අණුසහගත වූ කාමරාගසංයෝජන යැ ප්‍රතිඝසංයෝජන යැ අණුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන ස්වකීය චිත්තයාගේ උපක්ලේශයෝ මැනැවින් සිඳුනා ලද්දාහු වෙති. පර්‍යුත්ථානක්ලේශයන් සහිත වූ මේ සතර උපක්ලේශයන් කෙරෙන් චිත්තය විමුක්ත සුවිමුක්ත වූයේ වෙයි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ඡින්නවටුමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

අර්හත්මාර්ගයෙන් රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ යන ස්වකීය චිත්තයාගේ උපක්ලේශයෝ මැනැවින් සිඳුනා ලද්දාහු වෙති. පර්‍යුත්ථානක්ලේශයන් සහිත වූ මේ අට උපක්ලේශයන් කෙරෙන් චිත්තය විමුක්ත වූයේ සුවිමුක්ත වූයේ වෙයි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ඡින්නවටුමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

ඒ විමුක්තිඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ඡින්නවටුමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

**විමුක්තිඥානනිර්දෙශ යි.**

## 14. ප්‍රත්‍යවේක්ෂා ඥානය

කිසෙයින් ඒ මාර්ග-ඵලක්ෂණයෙහි ප්‍රතිලාභ-ප්‍රතිවේධ වශයෙන් පැමිණි මාර්ගඵලධර්මයන් ද චතුස්සත්‍යධර්මයන් ද දක්නා ප්‍රඥාව ප්‍රත්‍යවේක්ෂා ඥාන වෙයි යත්:

ස්‍රෝතාපත්තිමාර්ගක්ෂණයෙහි (පරිඥාභිසමයාදි ලක්ෂණයෙන් චතුස්සත්‍ය) දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ මාර්ගක්ෂණයෙහි (හෙතුයෙන්) පහළවූ යැ, අභිනිරෝපණාර්ථයෙන් සම්‍යක්සඞ්කල්ප තෙමේ ඒ මගකෙණෙහි පහළ වූයෙ යැ, පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය ඒ මගකෙණෙහි සමුද්ගත යැ, සමුත්ථාන (කාරණ) භාවාර්ථයෙන් සම්‍යක්කර්මාන්ත තෙමේ ඒ මග කෙණෙහි සමුද්ගත යැ, පරිශුද්ධාර්ථයෙන් සම්‍යගාජීව තෙමේ මගකෙණෙහි සමුද්ගත යැ, ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාම තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘතිය ඒ මගකෙණෙහි සමුද්ගත යැ, අවික්ෂේපාර්ථයෙන් සම්‍යක්සමාධි තෙමේ ඒ මගකෙණෙහි පහළ වූයේ යැ.

උපස්ථාන (-ආරමුණට පැමිණ සිටුනා) භාවයෙන් ස්මෘතිසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, ප්‍රවිචයාර්ථයෙන් ධර්මවිචයසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, ස්ඵරණාර්ථයෙන් ප්‍රීතිසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, උපශමාර්ථයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, අවික්ෂේපාර්ථයෙන් සමාධිසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ, ප්‍රතිසංඛ්‍යානාර්ථයෙන් උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ග තෙමේ ඒ මගකෙණෙහි සමුද්ගත යැ.

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං තදා සමුදාගතං, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං තදා සමුදාගතං, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං තදා සමුදාගතං උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං තදා සමුදාගතං අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං තදා සමුදාගතං.

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං තදාසමුදාගතං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං තදා සමුදාගතං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං තදා සමුදාගතං අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං තදා සමුදාගතං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං තදා සමුදාගතං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියා තදා සමුදාගතා, අකම්පියට්ඨෙන බලා තදා සමුදාගතා නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා තදා සමුදාගතා, හෙතුට්ඨෙන[1] මග්ගො තදා සමුදාගතො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා තදා සමුදාගතා, පදහනට්ඨෙන සම්මප්පධානා තදා සමුදාගතා, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා තදා සමුදාගතා, තථට්ඨෙන සච්චා තදා සමුදාගතා, අවික්ඛෙපට්ඨෙන සමථො තදා සමුදාගතො, අනුපස්සනට්ඨෙන විපස්සනා තදා සමුදාගතා, එකරසට්ඨෙන සමථවිපස්සනා තදා සමුදාගතා, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං තදා සමුදාගතං, සංවරට්ඨෙන සීලවිසුද්ධි තදා සමුදාගතා, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි තදාසමුදාගතා, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි තදා සමුදාගතා, විමුත්තට්ඨෙන විමොක්ඛා තදා සමුදගතා, පටිවෙධට්ඨෙන විජ්ජා තදා සමුදගතා, පරිච්චාගට්ඨෙන විමුත්ති තදා සමුදාගතා, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං තදා සමුදාගතං.

ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන තදා සමුදාගතො, ඵස්සො සමොධානට්ඨෙන තදා සමුදාගතො, වෙදනා සමොසරණට්ඨෙන තදා සමුදාගතා, සමාධි පමුඛට්ඨෙන තදා සමුදාගතො, සති ආධිපතෙය්‍යට්ඨෙන තදා සමුදාගතා, පඤ්ඤා තදුත්තරට්ඨෙන තදා සමුදාගතා, විමුත්ති සාරට්ඨෙන තදා සමුදාගතා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

---

1. හෙතට්ඨෙන - ස්‍යා

අශ්‍රද්ධායෙහි අචලාර්ථයෙන් ශ්‍රද්ධාබලය ඒ මගකෙණෙහි සමුදාගත යැ, කෞසීද්‍යයෙහි අචලාර්ථයෙන් වීර්යබලය ඒ මගකෙණෙහි සමුදාගත යැ, ප්‍රමාදයෙහි අචලාර්ථයෙන් සමෘතිබලය එකෙණෙහි සමුදාගත යැ, ඖද්ධත්‍යයෙහි අචලාර්ථයෙන් සමාධිබලය එකෙණෙහි සමුදාගත යැ, අවිද්‍යායෙහි අචලාර්ථයෙන් ප්‍රඥාබලය ඒ මගකෙණෙහි සමුදාගත යැ.

අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රිය එකෙණෙහි සමුදාගත යැ, උපස්ථානාර්ථයෙන් සමෘතීන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ ඒ මාර්ගක්‍ෂණයෙහි පහළවූවාහු යැ, අචලභාවාර්ථයෙන් බලයෝ ඒ මගකෙණෙහි සමුදාගතයෝ යැ, නිර්යාණාර්ථයෙන් සම්බොධ්‍යඞ්ගයෝ ඒ මගකෙණෙහි සමුදාගතයෝ යැ, හෙත්වර්ථයෙන් මාර්ගය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රදහනයෝ ඒ මාර්ගක්‍ෂණයෙහි සමුදාගතයෝ යැ, සමෘද්ධිභාවයෙන් ඍද්ධිපාදයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, අවිසංවාදකාර්ථයෙන් සත්‍යයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, අවික්‍ෂෙපාර්ථයෙන් ශමථය එකෙණෙහි සමුදාගත යැ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා තොමෝ එකෙණෙහි සමුදාගත යැ, එකකෘත්‍යභාවයෙන් ශමථවිදර්ශනා එකෙණෙහි සමුදාගත යැ, (ඔවුනොවුන්) නො ඉක්මැ පවත්නා අර්ථයෙන් යුගනද්ධය එකෙණෙහි සමුදාගත යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය එකෙණෙහි සමුදාගත යැ, අවික්‍ෂෙපභාවයෙන් චිත්තවිශුද්ධිය එකෙණෙහි සමුදාගත යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය එකෙණෙහි සමුදාගත යැ, විමුක්ත (-කෙලෙසුන් කෙරෙන් මිදුණු) බැවින් විමොක්‍ෂයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, සත්‍ය ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව එකෙණෙහි සමුදාගත යැ, (කෙලශයන් ගේ) පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය එකෙණෙහි සමුදාගත යැ, කෙලශසමුච්ඡින්දනාර්ථයෙන් ක්‍ෂය (ආර්යමාර්ගයෙහි) ඥානය එකෙණෙහි සමුදාගත යැ.

කුශලධර්මයන් ගේ කත්තුකම්‍යතා ඡන්ද තෙමේ (ප්‍රතිපත්තියට ද නිෂ්පත්තියට ද මූල හෙයින්) මූලාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, යොනිසොමනසිකාර තෙමේ (කුශලධර්මයන් උපදවන හෙයින්) සමුත්ථානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ස්පර්ශ තෙමේ සමවධානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, වෙදනා තොමෝ සමවසරණාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, සමාධි තෙමේ ප්‍රමුඛාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ. සමෘති තොමෝ අධිපතිභාවාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ආර්යමාර්ගප්‍රඥා තොමෝ ඒ කුශලධර්මයන්ට ශ්‍රෙෂ්ඨාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ඵලවිමුක්තිය (ස්ථිර හෙයින්) සාරාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, අමෘත හෙයින් සත්නට ප්‍රතිෂ්ඨා වූ නිර්වාණය (ශාසනයාගේ නිෂ්ඨාව හෙයින්) පර්යවසානාර්ථයෙන් ඒ මාර්ගක්‍ෂණයෙහි සමුදාගත යැ, (ඵලාවසානයෙහි) නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ මාර්ගක්‍ෂණයෙහි පහළවූවාහ' යි ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.

සොතාපත්තිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො තදා සමුදාගතො, -පෙ- පටිප්පස්සද්ධට්ඨෙන[1] අනුප්පාදෙ ඤාණං තදා සමුදාගතං. ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන තදා සමුදාගතො, ඵස්සො සමොධානට්ඨෙන තදා සමුදාගතො, වෙදනා සමොසරණට්ඨෙන තදා සමුදාගතා, පඤ්ඤා තදුත්තරට්ඨෙන තදා සමුදාගතා, විමුත්ති සාරට්ඨෙන තදා සමුදාගතා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

සකදාගාමිමග්ගක්ඛණෙ -පෙ- සකදාගාමිඵලක්ඛණෙ -පෙ- අනාගාමිමග්ගක්ඛණෙ -පෙ- අනාගාමිඵලක්ඛණෙ -පෙ- අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා, -පෙ- සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං තදා සමුදාගතං. ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

අරහත්තඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා -පෙ- පටිප්පස්සද්ධට්ඨෙන[1] අනුප්පාදෙ ඤාණං තදා සමුදාගතං. ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො, -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

තං ඤාතට්ඨෙන[2] ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ[3] පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං.'

**පච්චවෙක්ඛණඤාණනිද්දෙසො.**

## 15. වත්ථුනානත්තඤාණං.

කථං අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං:

කථං අජ්ඣත්තධම්මෙ[4] වවත්ථෙති:

චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති, සොතං අජ්ඣත්තං වවත්ථෙති, ඝානං අජ්ඣත්තං වවත්ථෙති, ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති, කායං අජ්ඣත්තං වවත්ථෙති, මනං අජ්ඣත්තං වවත්ථෙති.

1. පටිපස්සද්ධට්ඨෙන - PTS.
2. තඤ්ඤාතට්ඨෙන - PTS.
3. විපස්සතො - PTS.

ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ ඵලක්ෂණයෙහි පහළවූ යැ .. (මාර්ගප්‍රයොගය නිෂ්ඨිත බැවින්) ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ, කත්තුකම්‍යතාඡන්ද තෙමේ මූලාර්ථයෙන් ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ, යොනිසොමනසිකාර තෙමේ (කුශලධර්මයන් උපදවන හෙයින්) සමුත්ථානාර්ථයෙන් ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ, ස්පර්ශ තෙමේ සමවධානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, වේදනා තොමෝ සමවසරණාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, සමාධි තෙමේ ප්‍රමුඛාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ස්මෘති තොමෝ අධිපතිභාවාර්ථයෙන් ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ, ආර්යඵලප්‍රඥා තොමෝ ඒ කුශලධර්මයන්ට ශ්‍රෙෂ්ඨාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ඵලවිමුක්ති තොමෝ සාරාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, අමතොගධ වූ නිර්වාණය පර්යවසානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ඵලාවසානයෙහි නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ ඵලක්ෂණයෙහි පහළවූහ'යි ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි.

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි ... සකෘදාගාමිඵලක්ෂණයෙහි ... අනාගාමිමාර්ගක්ෂණයෙහි ... අනාගාමිඵලක්ෂණයෙහි ... අර්හත්වමාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ මාර්ගක්ෂණයෙහි සමුදාගත යැ . කෙලශසමුච්ඡින්දනාර්ථයෙන් ක්ෂයඥානය ඒ මාර්ගක්ෂණයෙහි සමුදාගත යැ, කත්තුකම්‍යතාඡන්ද තෙමේ මූලාර්ථයෙන් ඒ මාර්ගක්ෂණයෙහි සමුදාගත යැ ... අමතොගධ වූ නිර්වාණය පර්යවසානාර්ථයෙන් ඒ මාර්ගක්ෂණයෙහි සමුදාගත යැ, ඵලාවසානයෙන් නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ මාර්ගක්ෂණයෙහි පහළවූවාහ'යි ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි.

අර්හත්වඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ ඵලක්ෂණයෙහි පහළවූ යැ ... (මාර්ගප්‍රයොගය නිෂ්ඨිත බැවින්) ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ, කත්තුකම්‍යතාඡන්ද තෙමේ මූලාර්ථයෙන් ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ ... අමතොගධ වූ නිර්වාණය පර්යවසානාර්ථයෙන් ඒ ඵලක්ෂණයෙහි සමුදාගත යැ, ඵලාවසානයෙන් නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ අර්හත්වඵලක්ෂණයෙහි පහළ වූවාහ'යි ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි.

ඒ ප්‍රත්‍යවෙක්ෂාඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **"තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං"**යි.

**ප්‍රත්‍යවෙක්ෂාඥානනිර්දේශ යි.**

## 15. වස්තුනානාත්වඥානය

කිසෙයින් අධ්‍යාත්මධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව වස්තුනානාත්වයෙහි (නානාවස්තූන්හි) ඥාන නම් වෙයි යත්:

කිසෙයින් අධ්‍යාත්මධර්මයන් පිරිසිඳ (නියම කොට) දනී ද යත්:

(සසම්භාර ප්‍රසාද සඞ්ඛ්‍යාත) අධ්‍යාත්ම චක්ෂුස නිශ්චය කෙරෙයි. (පිරිසිඳ දනී.) අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍ර නිශ්චය කෙරෙයි. අධ්‍යාත්ම වූ ඝ්‍රාණය නිශ්චය කෙරෙයි. අධ්‍යාත්ම වූ ජිහ්වාව නිශ්චය කෙරෙයි. අධ්‍යාත්ම වූ කාය නිශ්චය කෙරෙයි, අධ්‍යාත්ම වූ මනස නිශ්චය කෙරෙයි.

කථං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති: 'චක්ඛුං අවිජ්ජාසම්භූත'න්ති වවත්ථෙති, 'චක්ඛුං තණ්හාසම්භූත'න්ති වවත්ථෙති, 'චක්ඛුං කම්මසම්භූත'න්ති වවත්ථෙති, 'චක්ඛුං ආහාරසම්භූත'න්ති වවත්ථෙති, 'චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති, 'චක්ඛුං උප්පන්න'න්ති වවත්ථෙති, 'චක්ඛුං සමුදාගත'න්ති වවත්ථෙති, 'චක්ඛුං අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, චක්ඛුං අන්තවන්තතො වවත්ථෙති, 'චක්ඛුං අද්ධුවං අසස්සතං විපරිණාමධම්ම'න්ති වවත්ථෙති, 'චක්ඛුං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්ම'න්ති වවත්ථෙති.

චක්ඛුං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො, දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො; අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති. විරජ්ජති, නො රජ්ජති, නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති.

කථං සොතං අජ්ඣත්තං වවත්ථෙති: 'සොතං අවිජ්ජාසම්භූත'න්ති වවත්ථෙති, -පෙ- එවං සොතං අජ්ඣත්තං වවත්ථෙති.

කථං ඝානං අජ්ඣත්තං වවත්ථෙති: 'ඝානං අවිජ්ජාසම්භූත'න්ති වවත්ථෙති, -පෙ- එවං ඝානං අජ්ඣත්තං වවත්ථෙති.

කථං ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති: 'ජිව්හා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති, 'ජිව්හා තණ්හාසම්භූතා'ති වවත්ථෙති, 'ජිව්හා කම්මසම්භූතා'ති වවත්ථෙති, 'ජිව්හා ආහාරසම්භූතා'ති වවත්ථෙති, 'ජිව්හා චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති, 'ජිව්හා උප්පන්නා'ති වවත්ථෙති, 'ජිව්හා සමුදාගතා'ති වවත්ථෙති, 'ජිව්හා අහුත්වා සම්භූතා හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, ජිව්හා අන්තවන්තතො වවත්ථෙති, 'ජිව්හා අද්ධුවා අසස්සතා විපරිණාමධම්මා'ති වවත්ථෙති, 'ජිව්හා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති.

1. අජ්ඣත්තං ධම්මං - ස්‍යා, PTS.

අධ්‍යාත්ම වූ චක්ෂුස කිසෙයින් නිශ්චය කෙරෙයි යත්: චක්ෂුස (ඇස) අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි, ඇස තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. ඇස කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. ඇස ආහාරහෙතුයෙන් සම්භූත යැයි නිශ්චය කෙරෙයි, ඇස සතර මහාභූතයන් නිසා පැවැත්තැ'යි නිශ්චය කෙරෙයි ඇස (අධ්වාවශයෙන් හෝ සන්තතිඛණ්ඩවසයෙන් හෝ) උත්පන්න යයි නිශ්චය කෙරෙයි ඇස හෙතුයෙන් සමුත්ථිත යයි නිශ්චය කෙරෙයි, ඇස (උදයෙන් පෙර) නොතිබී හටගත. (ව්‍යයෙන් පසු) තිබී නොවන්නේ යයි නිශ්චය කෙරෙයි. ඇස අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. ඇස අස්ථිර යැ අශාශ්වත යැ (ජරාවෙන් හා මරණයෙන්) විපරිණාමස්වභාව යැයි නිශ්චය කෙරෙයි ඇස අනිත්‍ය යැ ප්‍රත්‍යයොත්පන්න යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්ෂයවන ස්වභාව යැ නැසෙන ස්වභාව යැ විරාගස්වභාව යැ නිරුද්ධවන ස්වභාව යැයි නිශ්චය කෙරෙයි.

ඇස අනිත්‍යහෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍යහෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛහෙයින් නිශ්චය කෙරෙයි, සුඛහෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්මහෙයින් නිශ්චය කෙරෙයි. ආත්මහෙයින් නිශ්චය නො කෙරෙයි. නිර්වේදයට පැමිණෙයි. සතුටු නොවෙයි. විරාගයට පැමිණෙයි. නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි නූපදවයි. දුරලයි ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍යහෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුක්ඛහෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්මහෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි උකටලී වනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ චක්ෂුස නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය නිශ්චය කෙරෙයි යත්: ශ්‍රොත්‍රය අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ ඝ්‍රාණය නිශ්චය කෙරෙයි යත්: ඝ්‍රාණය අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් අධ්‍යාත්ම වූ ඝ්‍රාණය නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ ජිහ්වාව නිශ්චය කෙරෙයි යත්: ජිහ්වාව අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව ආහාරහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව සතර මහාභූතයන් නිසා පැවැත්තැ'යි නිශ්චය කෙරෙයි. දිව (අධ්වාවශයෙන් හෝ සන්තතිඛණ්ඩවශයෙන් හෝ) උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව හෙතුයෙන් සමුත්ථිත යයි නිශ්චය කෙරෙයි. දිව (උදයෙන් පෙර) නො තිබී හටගත, (ව්‍යයයෙන් පසු) තිබී නො වන්නේ යයි නිශ්චය කෙරෙයි. දිව අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. දිව අස්ථිර යැ අශාශ්වත යැ (ජරාවෙන් හා මරණයෙන්) විපරිණාමස්වභාව යැයි නිශ්චය කෙරෙයි. දිව අනිත්‍ය යැ ප්‍රත්‍යයොත්පන්න යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්ෂයස්වභාව යැ ව්‍යයස්වභාව යැ විරාගස්වභාව යැ නිරොධස්වභාව යැයි නිශ්චය කෙරේ.

ජිව්හං අනිච්චතො වවත්ථෙති නො නිච්චතො, -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති, එවං ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති.

කථං කායං අජ්ඣත්තං වවත්ථෙති: 'කායො අවිජ්ජාසම්භූතො'ති වවත්ථෙති, කායො තණ්හාසම්භූතො'ති වවත්ථෙති, 'කායො කම්මසම්භූතො'ති වවත්ථෙති, 'කායො ආහාරසම්භූතො'ති වවත්ථෙති, කායො චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති, කායො උප්පන්නො'ති වවත්ථෙති, කායො සමුදාගතො'ති වවත්ථෙති, කායො අහුත්වා සම්භූතො, හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, කායං අන්තවන්තතො වවත්ථෙති, 'කායො අද්ධුවො අසස්සතො විපරිණාමධම්මො'ති වවත්ථෙති, කායො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො නිරොධධම්මො'ති වවත්ථෙති, කායං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො -පෙ- පටිනිස්සජ්ජති, නො ආදියති, අනිච්චතො වවත්ථෙන්තො, නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති, එවං කායං අජ්ඣත්තං වවත්ථෙති.

කථං මනං අජ්ඣත්තං වවත්ථෙති, 'මනො අවිජ්ජාසම්භූතො,ති වවත්ථෙති, මනො තණ්හාසම්භූතො'ති වවත්ථෙති, මනො කම්මසම්භූතො'ති වවත්ථෙති, මනො ආහාරසම්භූතො'ති වවත්ථෙති, මනො උප්පන්නො'ති වවත්ථෙති, මනො සමුදාගතො'ති වවත්ථෙති, 'මනො අහුත්වා සම්භූතො, හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, මනං අන්තවන්තතො වවත්ථෙති, මනො අද්ධුවො අසස්සතො විපරිණාමධම්මො'ති වවත්ථෙති, 'මනො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො'ති වවත්ථෙති. මනං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථෙති නො සුඛතො, අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති; විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති, එවං මනං අජ්ඣත්තං වවත්ථෙති, එවං අජ්ඣත්තධම්මෙ[1] වවත්ථෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: 'අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං'

**වත්ථුනානත්තඤාණනිද්දෙසො.**

---

1. අජ්ඣත්තං ධම්මෙ - සී PTS.

දිව අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි. නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි ... දුරුලයි. ආදානය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරුලයි ... දුරුලනුයේ ආදානය හැරපියයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ ජිහ්වාව නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ කය නිශ්චය කෙරෙයි යත්: කය අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. කය තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. කය කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. කය ආහාරහෙතුයෙන් සම්භූත යැයි නිශ්චය කෙරෙයි. කය සතර මහාභූතයන් නිසා පැවැත්තැ' යි නිශ්චය කෙරෙයි. කය (අද්ධා වශයෙන් හෝ සන්තතික්ෂණ වශයෙන් හෝ) උත්පන්න යැයි නිශ්චය කෙරෙයි. කය හෙතුයෙන් සමුත්ථිත යැයි නිශ්චය කෙරෙයි. කය (උදයෙන් පෙර) නො තිබී හටගත (ව්‍යයයෙන් පසු) තිබී නොවන්නේ යයි නිශ්චය කෙරෙයි. කය අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. කය අස්ථිර යැ අශාශ්වත යැ විපරිණාමස්වභාව යැයි නිශ්චය කෙරෙයි. කය අනිත්‍ය යැ ප්‍රත්‍යයෙන් උපන. ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්ෂය වන ස්වභාව යැ නැසෙන පියවි ඇත්තේ යැ නිරුද්ධ වන පියවි ඇත්තේ යැයි නිශ්චය කෙරෙයි. කය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි. නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි. සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. ... දුරුලයි. ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරුලයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරුලයි. ... හැරපියනුයේ ආදානය දුරුලයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ කය නිශ්චය කෙරේ

කිසෙයින් අධ්‍යාත්ම වූ මනස නිශ්චය කෙරෙයි යත්: (භවාඞ්ග) මනස අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස ආහාරහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස (අද්ධාසන්තති විසින්) උත්පන්න යයි නිශ්චය කෙරෙයි. මනස ප්‍රත්‍යයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස (උදයෙන් පෙර) නො තිබී හටගත, (ව්‍යයයෙන් පසු) තිබී නො වන්නේ යයි නිශ්චය කෙරෙයි. මනස අන්තවත් යයි නිශ්චය කෙරෙයි. මනස අස්ථිර යැ අශාශ්වත යැ විපරිණාම ස්වභාව යයි නිශ්චය කෙරෙයි. මනස අනිත්‍ය යැ සඞ්ඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්ෂයස්වභාව යැ ව්‍යයස්වභාව යැ විරාගස්වභාව යැ නිරොධස්වභාව යයි නිශ්චය කෙරෙයි. මනස අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි. නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි, සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කෙරෙයි, ආත්ම හෙයින් නිශ්චය නො කෙරෙයි. උකටලීවෙයි, සතුටු නො වෙයි. විරාගයට පැමිණෙයි, නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි, නූපදවයි. දුරුලයි, ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි. නිර්වේදයට පැමිණෙනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරුලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ මනස නිශ්චය කෙරෙයි, මෙසේ අධ්‍යාත්මධර්මයන් නිශ්චය කෙරේ.

ඒ වස්තුනානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි **'අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං'** යි.

**වස්තුනානාත්වඥානනිර්දේශ යි.**

# 16. ගොචරනානත්තඤාණං

කථං බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං.

කථං බහිද්ධා ධම්මෙ වවත්ථෙති: රූපෙ බහිද්ධා වවත්ථෙති, සද්දෙ බහිද්ධා වවත්ථෙති, ගන්ධෙ බහිද්ධා වවත්ථෙති, රසෙ බහිද්ධා වවත්ථෙති, ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථෙති, ධම්මෙ බහිද්ධා වවත්ථෙති.

කථං රූපෙ බහිද්ධා වවත්ථෙති, රූපා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති, රූපා තණ්හා සම්භූතා'ති වවත්ථෙති, 'රූපා කම්මසම්භූතා'ති වවත්ථෙති, 'රූපා ආහාරසම්භූතා'ති වවත්ථෙති, රූපා චතුන්නං මහාභූතානං උපාදාය'ති වවත්ථෙති, 'රූපා උප්පන්නා'ති වවත්ථෙති, 'රූපා සමුදාගතා'ති වවත්ථෙති, රූපා අභුත්වා සම්භූතා හුත්වා න භවිස්සන්තී'ති වවත්ථෙති, රූපෙ අන්තවන්තතො වවත්ථෙති, 'රූපා අද්ධුවා අසස්සතා විපරිනාමධම්මා'ති වවත්ථෙති, 'රූපා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති,

රූපෙ අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො, දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො, අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං ජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං රූපෙ බහිද්ධා වවත්ථෙති.

කථං සද්දෙ බහිද්ධා වවත්ථෙති *සද්දා චතුන්නං මහාභූතානං උපාදායාති, වවත්ථෙති, 'සද්දා උප්පන්නා'ති වවත්ථෙති, සද්දා සමුදාගතා'ති වවත්ථෙති, 'සද්දා අභුත්වා සම්භූතා, හුත්වා න භවිස්සන්තීති වවත්ථෙති, සද්දෙ අන්තවන්තතො වවත්ථෙති, 'සද්දා අද්ධුවා අසස්සතා විපරිනාමධම්මා'ති වවත්ථෙති, සද්දා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති.

සද්දෙ අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො, -පෙ- එවං සද්දෙ බහිද්ධා වවත්ථෙති.

---

*සද්දා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති -පෙ-" ඉති මජසං, සයා සී, PTS. පොත්ථකෙසු දිස්සති, තං පන පාළියා න සමෙති, සද්දස්ස උතුචිත්ත සමුට්ඨානත්තා, අට්ඨකථායපි අවිජ්ජා සම්භූතාදි චතුක්කං න වුත්ත'න්ති වුත්තං.

## 16. ගොචරනානත්වඥානය

කිසෙයින් බාහිරවිෂයයන් පිරිසිඳදැනීමේ ප්‍රඥාව ගොචරනානත්වඥාන වෙයි යත්:

කිසෙයින් බාහිරධර්මයන් නිශ්චය කෙරෙයි යත්: අධ්‍යාත්මයෙන් බාහිර වූ රූපායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ ශබ්දායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ ගන්ධායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ රසායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ ස්පෘෂ්ටව්‍යධර්මයන් නිශ්චය කෙරෙයි. (භවාඞ්ගමනසසම්ප්‍රයුක්ත) වූ බාහිර ධර්මායතනපර්‍ය්‍යාපන්න-ධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිරරූපයන් නිශ්චය කෙරෙයි යත්: රූපායතනධර්මයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ කර්මහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ ආහාරහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ (අද්ධාවශයෙන් සන්තතිඛණ වශයෙන්) උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ හෙතුයෙන් හටගත්තාහ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ (උදයෙන් පෙර) නො තිබී උපන්නාහ. (ව්‍යයයෙන් මත්තෙහි) තිබී නො වන්නාහ'යි නිශ්චය කෙරෙයි. රූපයන් අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි, රූපයෝ අස්ථිරයහ, අශාශ්වතයහ, විපරිණාමස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ අනිත්‍යයහ ප්‍රත්‍යයොත්පන්නායහ ප්‍රතීත්‍යසමුත්පන්නයහ ක්‍ෂය-ස්වභාවයහ ව්‍යයස්වභාවයහ විරාගස්වභාවයහ නිරොධස්වභාවයහ'යි නිශ්චය කෙරේ.

රූපායතනධර්මයන් අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි, සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කෙරෙයි, ආත්ම හෙයින් නිශ්චය නො කෙරෙයි. උකටලී වෙයි, සතුටු නො වෙයි. විරාගයට පැමිණෙයි, නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි, නූපදවයි. දුරු කෙරෙයි, ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි. උකටලී වනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් බාහිරරූපායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිර ශබ්දායතනධර්මයන් නිශ්චය කෙරෙයි යත්: ශබ්දයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ (අද්ධා වශයෙන් ඛණසන්තති වශයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ හෙතුයෙන් හටගත්තාහ' යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ (උදයෙන් පෙර) නොතිබී උපන්නාහ. (ව්‍යයයෙන් මත්තෙහි) තිබී නො වන්නාහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දායතන ධර්මයන් අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. ශබ්දයෝ අස්ථිරයහ අශාශ්වතයහ විපරිණාමස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ අනිත්‍යයහ ප්‍රත්‍යයොත්පන්නායහ ප්‍රතීත්‍යසමුත්පන්නයහ ක්‍ෂයස්වභාවයහ ව්‍යයස්වභාවයහ විරාගස්වභාවයහ නිරොධස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයන් අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ ශබ්දායතනධර්ම-යන් නිශ්චය කෙරේ.

කථං ගන්ධෙ බහිද්ධා වවත්ථෙති: 'ගන්ධා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති, 'ගන්ධා තණ්හාසම්භූතා'ති වවත්ථෙති, -පෙ- එවං ගන්ධෙ බහිද්ධා වවත්ථෙති.

කථං රසෙ බහිද්ධා වවත්ථෙති: 'රසා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති 'රසා තණ්හාසම්භූතාති වවත්ථෙති, -පෙ- එවං රසෙ බහිද්ධා වවත්ථෙති.

කථං ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථෙති: 'ඵොට්ඨබ්බා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති: ඵොට්ඨබ්බා තණ්හාසම්භූතාති වවත්ථෙති, 'ඵොට්ඨබ්බා කම්මසම්භූතා'ති වවත්ථෙති, ඵොට්ඨබ්බා ආහාරසම්භූතාති, වවත්ථෙති, ඵොට්ඨබ්බා උප්පන්නා'ති වවත්ථෙති, ඵොට්ඨබ්බා සමුදාගතාති වවත්ථෙති -පෙ- එවං ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථෙති.

කථං ධම්මෙ බහිද්ධා වවත්ථෙති: 'ධම්මා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති, 'ධම්මා තණ්හාසම්භූතා'ති වවත්ථෙති ධම්මා කම්ම සම්භූතාති වවත්ථෙති, ධම්මා ආහාරසම්භූති'ති වවත්ථෙති, ධම්මා චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති,* ධම්මා උප්පන්නා'ති, වවත්ථෙති, ධම්මා සමුදාගතා'ති වවත්ථෙති, 'ධම්මා අභූත්වා සම්භූතාති, හුත්වා න භවිස්සන්තී'ති වවත්ථෙති, ධම්මෙ අන්තවන්තතො වවත්ථෙති, ධම්මා අද්ධුවා අසස්සතා විපරිනාමධම්මා'ති වවත්ථෙති, ධම්මා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති.

ධම්මෙ අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථෙති නො සුඛතො; අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති; පටිනිස්සජ්ජති නො ආදියති, -පෙ- අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං ධම්මෙ බහිද්ධා වවත්ථෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං'

## ගොචරනානත්තඤාණනිද්දෙසො

* චතුන්නං මහාභූතානං උපාදායාති පදං - සයා මජ්ඣං පොත්ථකෙසු ච කෙසුචි සීහල පොත්ථකෙසු ච න ගහිතං

කිසෙයින් බාහිර වූ ගන්ධායතනධර්මයන් නිශ්චය කෙරෙයි යත්: ගන්ධයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ගන්ධයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ ගන්ධායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිර වූ රසායතනධර්මයන් නිශ්චය කෙරෙයි යත්: රසයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි රසයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ රසායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිර වූ ස්ප්‍රෂ්ටව්‍යධර්මයන් නිශ්චය කෙරෙයි යත් ස්ප්‍රෂ්ටව්‍යායතනධර්මයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ කර්මහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ස්ප්‍රෂ්ටව්‍යයෝ ආහාර හෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ (අද්ධා වශයෙන් ඛණසන්තති වශයෙන්) උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ හෙතුයෙන් හටගත්තාහ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ ස්ප්‍රෂ්ටව්‍යායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් ධර්මායතනපර්යාපන්නධර්මයන් නිශ්චය කෙරෙයි යත්: ධර්මයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ධර්මයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ කර්මහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ ආහාරහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ (අද්ධා වශයෙන් ඛණසන්තති වශයෙන්) උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ හෙතුයෙන් හටගත්තාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ (උදයෙන් පෙර) නොතිබී උපන්නාහ, තිබී (ව්‍යයෙන් මත්තෙහි) නොවන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයන් අනන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. ධර්මයෝ අස්ථිරයහ අශාශ්වතයහ. විපරිණාමස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ අනිත්‍යයහ. ප්‍රත්‍යයොත්පන්නයහ. ප්‍රතීත්‍ය-සමුත්පන්නයහ.. ක්‍ෂයස්වභාවයහ. ව්‍යයස්වභාවයහ. විරාගස්වභාවයහ නිරොධස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි.

ධර්මයන් අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි. සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කෙරෙයි. ආත්ම හෙයින් නිශ්චය නො කෙරෙයි. උකටලී වෙයි. සතුටු නො වෙයි. විරාගයට පැමිණෙයි, නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි. නූපදවයි. දුරලයි. ග්‍රහණය නො කෙරෙයි. ... අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි. උකටලී වනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. විරාගයට පැමිණෙනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් බාහිර වූ ධර්මායතනපර්යාපන්නධර්මයන් නිශ්චය කෙරේ.

ඒ ගොචරඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං'යි.

**ගොචරනානත්වඥාන නිර්දේශ යි.**

# 17. චරියානානත්තඤාණං

කථං චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං.

චරියාති තිස්සො චරියායො: විඤ්ඤාණචරියා, අඤ්ඤාණචරියා. ඤාණචරියා.

කතමා විඤ්ඤාණචරියා:[1]

රූපෙසු දස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා* රූපෙසු දස්සනත්ථො චක්ඛුවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, රූපෙසු දිට්ඨත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, රූපෙසු අභිනිරොපිතත්තා විපාකමනො විඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

සද්දෙසු සවනත්ථාය ආජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, සද්දෙසු සවනත්ථො සොතවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, සද්දෙසු සුතත්තා අභිනිරොපනා[2] විපාක මනොධාතු විඤ්ඤාණචරියා, සද්දෙසු අභිනිරොපිතත්තා විපාක මනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

ගන්ධෙසු ඝායනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, ගන්ධෙසු ඝායනත්ථො ඝානවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, ගන්ධෙසු ඝායිතත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, ගන්ධෙසු අභිනිරොපිතත්තා විපාකමනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

රසෙසු සායනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, රසෙසු සායනත්ථො ජිව්හා විඤ්ඤාණං විඤ්ඤාණචරියා, රසෙසු සායිතත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, රසෙසු අභිනිරොපිතත්තා විපකමනො විඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

ඵොට්ඨබ්බෙසු ඵුසනත්ථාය[3] ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, ඵොට්ඨබ්බෙසු ඵුසනත්ථො කායවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, ඵොට්ඨබ්බෙසු ඵුට්ඨත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, ඵොට්ඨබ්බෙසු අභිනිරොපිතත්තා විපාකමනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

ධම්මෙසු විජානනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, ධම්මෙසු විජානනත්ථො මනොවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, ධම්මෙසු විඤ්ඤාතත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, ධම්මෙසු අභිනිරොපිතත්තා විපාකමනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

---

1. කතමං විඤ්ඤාණචරියං - සී 1,
2. අභිරොපනා - ස්‍යා,
3 ඵුස්සනත්ථාය - PTS,

* 'රූපෙසු' ආදීනි සත්තම්‍යන්තපදානි සබ්බත්ථ වාක්‍යන්තෙක පයුත්තානි මජ්ඣං පොත්ථකෙ,

## 17. චර්‍යානානාත්වඥානය

**කිසෙයින් චර්‍යාවන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව චර්‍යානානාත්වඥාන වෙයි යත්:**

**චර්‍යා යනු චර්‍යා තුනෙකි: විඥානචර්‍යා යැ අඥානචර්‍යා යැ ඥාන-චර්‍යා යි.**

**විඥානචර්‍යා කවර යත්:**

රූපවිෂයෙහි රූපදර්‍ශනය සඳහා පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්‍යා යැ රූපවිෂයෙහි දර්‍ශනය මැ අර්‍ථ කොට ඇති (කුශලවිපාක වූ හෝ අකුශලවිපාක වූ හෝ) චක්‍ෂුර්විඥානය විඥානචර්‍යා යැ, රූපවිෂයෙහි (චක්‍ෂුර්විඥානයෙන් රූපාලම්බනය) දුටු බැවින් පැවැති අරමුණට නඟන කුශලාකුශලවිපාකසම්පටිච්ඡනමනොධාතුව විඥානචර්‍යා යැ රූපවිෂයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥාන-ධාතුව විඥානචර්‍යා යි.

ශබ්දාලම්බනයෙහි ශ්‍රවණය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්‍යා යැ ශබ්දාලම්බනයෙහි ශ්‍රවණය මැ අර්‍ථ කොට ඇති (කුශලාකුශල විපාක) ශ්‍රොත්‍රවිඥානය විඥානචර්‍යා යැ ශබ්දාලම්බනයෙහි (ශ්‍රොත්‍රවිඥානයෙන් ශබ්දාලම්බනය) අසනලද බැවින් අරමුණට නඟන කුශලාකුශලවිපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්‍යා යැ. ශබ්දාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්‍යා යි.

ගන්ධාලම්බනයෙහි ආඝ්‍රාණය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්‍යා යැ ගන්ධාලම්බනයෙහි ආඝ්‍රාණය මැ අර්‍ථ කොට ඇති (කුශලා-කුශලවිපාක) ඝ්‍රාණවිඥානය විඥානචර්‍යා යැ ගන්ධාලම්බනයෙහි (ඝ්‍රාණ-විඥානයෙන් ගන්ධාලම්බනය) ආඝ්‍රාණය කළ බැවින් අරමුණට නඟන කුශලාකුශලවිපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්‍යා යැ ගන්ධාලම්බ-නයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනො-විඥානධාතුව විඥානචර්‍යා යි.

රසාලම්බනයෙහි රසවිඳීම පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්‍යා යැ රසාලම්බනයෙහි රසවිඳීම මැ අර්‍ථ කොට ඇති (කුශලා-කුශලවිපාක) ජිහ්වාවිඥානය විඥානචර්‍යා යැ රසාලම්බනයෙහි (ජිහ්වා-විඥානයෙන් රසාලම්බනය) විඳිනාලද බැවින් අරමුණට නඟන කුශලාකුශල විපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්‍යා යැ. රසාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥාන-ධාතුව විඥානචර්‍යා යි.

ස්‍ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ස්පර්‍ශය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්‍යා යැ ස්‍ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ස්පර්‍ශය මැ අර්‍ථ කොට ඇති (කුශලා-කුශලවිපාක) ජිහ්වාවිඥානය විඥානචර්‍යා යැ. ස්‍ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි (කායවිඥානයෙන් ස්‍ප්‍රෂ්ටව්‍යාලම්බනය) ස්පර්‍ශ කරනලද බැවින් අරමුණට නඟන කුශලාකුශලවිපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්‍යා යැ. ස්‍ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්‍යා යි.

ධර්‍මාලම්බනයෙහි විජානනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්‍යා යැ. ධර්‍මාලම්බනයෙහි ආලම්බනය දැනගැනීම මැ අර්‍ථ කොට ඇති මනොවිඥනය විඥානචර්‍යා යැ. ධර්‍මාලම්බනයෙහි (මනොවිඥානයෙන් ධර්‍මාලම්බනය) දන්නා ලද බැවින් අරමුණට නඟන විපාකමනොධාතුව විඥානචර්‍යා යැ ධර්‍මාලම්බනයෙහි අභිනිරොපිත බැවින් විපාකමනොවිඥාන ධාතුව විඥානචර්‍යා යි.

විඤ්ඤාණධාතු තෙනට්ඨෙන විඤ්ඤාණචරියා.

නීරාගා[1] චරතීති විඤ්ඤාණචරියා, නිද්දොසා[2] චරතීති විඤ්ඤාණචරියා නිම්මොහා[3] චරතීති විඤ්ඤාණචරියා, නිම්මානා[4] චරතීති විඤ්ඤාණචරියා, නිද්දිට්ඨි[5] චරතීති විඤ්ඤාණචරියා, නිරුද්ධච්චා[6] චරතීති විඤ්ඤාණචරියා, නිබ්බිචිකිච්ඡා[7] චරතීති විඤ්ඤාණචරියා, නානුසයා චරතීති විඤ්ඤාණචරියා, රාගවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දොසවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, මොහවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, මානවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දිට්ඨිවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, උද්ධච්චවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, විචිකිච්ඡාවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, අනුසයවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, කුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, අකුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, සාවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණ චරියා, අනවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, කණ්හෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, සුක්කෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, සුඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දුක්ඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා සුඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දුක්ඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, විඤ්ඤාතෙ[8] චරතීති විඤ්ඤාණචරියා විඤ්ඤාණස්ස එවරූපා චරියා හොතීති විඤ්ඤාණ චරියා, පකතිපරිසුද්ධමිදං චිත්තං නික්කිලෙසට්ඨෙනාති විඤ්ඤාණචරියා, අයං විඤ්ඤාණචරියා.

කතමා අඤ්ඤාණචරියා:[9]

මනාපියෙසු[10] රූපෙසු රාගස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, රාගස්ස ජවනා අඤ්ඤාණචරියා අමනාපියෙසු රූපෙසු දොසස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දොසස්ස ජවනා අඤ්ඤාණචරියා, තදුභයෙන[11] අසමපෙක්ඛනස්මිං වත්ථුස්මිං මොහස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මොහස්ස ජවනා අඤ්ඤාණචරියා, විනිබන්ධස්ස මානස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මානස්ස ජවනා අඤ්ඤාණචරියා, පරාමට්ඨාය[12] දිට්ඨියා ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දිට්ඨියා ජවනා අඤ්ඤාණචරියා, වික්ඛෙපගතස්ස උද්ධච්චස්ස ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, උද්ධච්චස්ස ජවනා අඤ්ඤාණචරියා, අනිට්ඨංගතාය[13] විචිකිච්ඡාය ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, විචිකිච්ඡාය ජවනා අඤ්ඤාණචරියා, ථාමගතස්ස අනුසයස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනුසයස්ස ජවනා අඤ්ඤාණචරියා.

---

1. නිරාගා-පු, මජසං, ස්‍යා PTS, නිරාගං සී.1, 2. නිද්දොසා - PTS. නිද්දොසං - සී 1
3. නිම්මොහා - PTS, නිම්මොහං - සී 1 4. නිම්මානා - PTS, නිම්මානං - සී 1
5. නිද්දිට්ඨි - PTS, සී 1 6. නිමුද්ධච්චා-ස්‍යා, නිරුද්ධච්චං- සී1. 7. නිබ්බිචිකිච්ඡා - PTS, සී 1
8. විඤ්ඤාණෙ - PTS, 9. අඤ්ඤාණ චරියා-සී. 1 10 මනාපියෙසු- ස.
11 තදුභයෙ - සී. 1-2. 12 පරාමට්ඨාය - PTS, 13. අනිට්ඨංගතාය - ස්‍යා

**විඤ්ඤාණචරියා** යනු: කවර අරුතෙකින් විඥානචර්‍යා වී ද යත්:

රාග රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ද්වෙෂ රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මොහ රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මාන රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දෘෂ්ටි රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ඖද්ධත්‍ය රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු. විචිකිත්සා රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අනුශය රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, රාගයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ද්වෙෂයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මොහයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මානයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දෘෂ්ටියෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ඖද්ධත්‍යයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, විචිකිත්සායෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අනුශයයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, කුශලකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අකුශලකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණ චරියා නමු. සාවද්‍යකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අනවද්‍ය-කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, කෘෂ්ණකර්මයන්-ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, (කිරිඹතප් සඞ්ඛ්‍යාත) ශුක්ලකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, සුඛොදය ඇති කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දුඃඛොදය ඇති කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, සුඛවිපාක වූ කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දුඃඛවිපාක වූ කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, විඥානයෙහි (විඥානයෙන් දැනගත් අරමුණෙහි) හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, උක්තප්‍රකාර විඤ්ඤාණයාගේ මෙබඳු වූ චර්‍යා වේ නු යි විඤ්ඤාණචරියා නමු, රාගාදි කෙලෙස් නැති බැවින් මේ සිත පියවින් පිරිසුදු නු යි විඤ්ඤාණචරියා නමු. මේ විඥානචර්‍යා යි.

**අඥානචර්‍යා** කවර යත්:

මනවඩන රූපයන්හි (සන්තති වශයෙන්) රාගයාගේ ජවනය පිණිස පැවැති (චක්ෂුර්ද්වාරයෙහි අයොනිසොමනසිකාර වූ) ආවර්ජනක්‍රියාව්‍යාකෘත-මනොධාතුව විඥානචර්‍යා යැ. රාගයාගේ ජවනය අඥානචර්‍යා යි. අමනොඥ වූ රූපයන්හි ද්වෙෂයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියා-ව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. ද්වෙෂයාගේ ජවනය අඥාන-චර්‍යා යි. එ දෙකින් (රාගද්වෙෂ වශයෙන්) නො දක්නා රූපාලම්බන සඞ්ඛ්‍යාත වස්තුයෙහි (විචිකිත්සා ඖද්ධත්‍ය වශයෙන්) මොහයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජන ක්‍රියාව්‍යාකෘත මනොවිඥානධාතුව විඥානචර්‍යා යැ මොහොයාගේ ජවනය අඥානචර්‍යා යි. (උන්නති වශයෙන්) විනිබන්ධ වැ සිටි මානයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොවිඥාන-ධාතුව විඥානචර්‍යා යැ. මානයාගේ ජවනය අඥානචර්‍යා යි. පරාමෘෂ්ට වූ දෘෂ්ටියගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. දෘෂ්ටියගේ ජවනය අඥානචර්‍යා යි. (රූපාලම්බනයෙහි) වික්ෂෙපබවට ගිය ඖද්ධත්‍යයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියා-ව්‍යාකෘතමනොවිඥාන ධාතුව විඥානචර්‍යා යැ. ඖද්ධත්‍යයාගේ ජවනය අඥානචර්‍යා යි. නිශ්චය රහිත බවට ගිය විචිකිත්සාවගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. විචිකිත්සාවගේ ජවනය අඥානචර්‍යා යි. ස්ථිර බවට ගිය අනුශයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. අනුශයාගේ ජවනය අඥානචර්‍යා යි

මනාපියෙසු සද්දෙසු -පෙ- මනාපියෙසු ගන්ධෙසු -පෙ- මනාපියෙසු රසෙසු -පෙ- මනාපියෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- මනාපියෙසු ධම්මෙසු රාගස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, රාගස්ස ජවනා අඤ්ඤාණචරියා, අමනාපියෙසු ධම්මෙසු[1] දොසස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දොසස්ස ජවනා අඤ්ඤාණචරියා, තදුභයෙන අසම්පෙක්ඛනස්මිං වත්ථුස්මිං මොහස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මොහස්ස ජවනා අඤ්ඤාණචරියා, විනිබන්ධස්ස මානස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මානස්ස ජවනා අඤ්ඤාණචරියා, පරාමට්ඨාය දිට්ඨියා ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා දිට්ඨියා ජවනා අඤ්ඤාණචරියා, වික්ඛෙපගතස්ස උද්ධච්චස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, උද්ධච්චස්ස ජවනා අඤ්ඤාණචරිය, අනිට්ඨඞ්ගතාය විචිකිච්ඡාය ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, විචිකිච්ඡාය ජවනා අඤ්ඤාණචරියා, ථාමගතස්ස අනුසයස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනුසයස්ස ජවනා අඤ්ඤාණචරියා.

අඤ්ඤාණචරියාති කෙනට්ඨෙන අඤ්ඤාණචරියා:

සරාගා චරතීති අඤ්ඤාණචරියා, සදොසා චරතීති අඤ්ඤාණචරියා, සමොහා චරතීති අඤ්ඤාණචරියා, සමානා චරතීති අඤ්ඤාණචරියා, සදිට්ඨි චරතීති අඤ්ඤාණචරියා, සඋද්ධච්චා චරතීති අඤ්ඤාණචරියා, සවිචිකිච්ඡා චරතීති අඤ්ඤාණචරියා සානුසයා චරතීති අඤ්ඤාණචරියා, රාගසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දොසසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, මොහසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, මානසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දිට්ඨිසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, උද්ධච්ච සම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, විචිකිච්ඡා සම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, අනුසයසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, කුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, අකුසලෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, සාවජ්ජෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, අනවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, කණ්හෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, සුක්කෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, සුඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දුක්ඛුද්‍රයෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, සුඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දුක්ඛවිපාකෙහි කම්මෙහි සම්පයුත්තා[2] අඤ්ඤාතෙ[3] චරතීති අඤ්ඤාණචරියා, අඤ්ඤාණස්ස එවරූපා චරියා හොතීති අඤ්ඤාණචරියා, අයං අඤ්ඤාණචරියා.

1. රූපෙසු - PTS
2. විප්පයුත්තා - PTS
3. අඤ්ඤාණෙ - සී 1-2

මනවඩන ශබ්දයන්හි ... මනවඩන ගන්ධයන්හි ... මනවඩන රසයන්හි ... මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයන්හි ... මනවඩන (රූපාදි වූ හෝ ධර්මාලම්බන වූ හෝ) ධර්මයන්හි රාගයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යායි යැ රාගයාගේ ජවනය අඥානචර්‍යායි යි. අමනොඥ වූ ධර්මයන්හි ද්වෙෂයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යායි යැ ද්වෙෂයාගේ ජවනය අඥානචර්‍යායි යි. එදෙකින් (රාගද්වෙෂ වශයෙන්) නො දක්නා ධර්මාලම්බන සඞ්ඛ්‍යාත වස්තුයෙහි මොහයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්‍යායි යැ මොහයාගේ ජවනය අඥානචර්‍යායි යි. විනිබන්ධ වූ මානයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්‍යායි යැ මානයාගේ ජවනය අඥානචර්‍යායි යි. පරාමෘෂ්ට වූ දෘෂ්ටියගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යායි යැ දෘෂ්ටියගේ ජවනය අඥානචර්‍යායි යි. වික්ෂෙපයට පැමිණි ඖද්ධත්‍යයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්‍යායි යැ ඖද්ධත්‍යයාගේ ජවනය අඥානචර්‍යායි යි. අනිෂ්ඨාවට ගිය විචිකිත්සාවගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යායි යැ විචිකිත්සාවගේ ජවනය අඥානචර්‍යායි යි. ස්ථිර බවට ගිය අනුශයයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යායි යැ අනුශයයාගේ ජවනය අඥානචර්‍යායි යි.

**අඥානචර්‍යා** යනු: කුමක් හෙයින් අඥානචර්‍යායි වී ද යත්:

රාගසහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ ද්වෙෂ සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ මොහ සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ මාන සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ දෘෂ්ටි සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ ඖද්ධත්‍යය සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ විචිකිත්සා සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ අනුශය සහිත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ රාගසම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි, යැ ද්වෙෂසම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ මොහසම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ මාන සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ දෘෂ්ටි සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ ඖද්ධත්‍ය සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ විචිකිත්සා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ අනුශය සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ. කුශලකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ අකුශලකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ සාවද්‍යකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ අනවද්‍යකර්මයන් හා, විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ කෘෂ්ණකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ ශුක්ලකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ සුඛොදය ඇති කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ දුඃඛොදය ඇති කර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ සුඛවිපාක වූ කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ දුඃඛවිපාක වූ කර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්‍යායි යැ (යථාස්වභාවයෙන්) අඥාත වූ ආලම්බනයෙහි හැසිරේ නු යි අඥානචර්‍යායි යැ උක්තප්‍රකාර වූ අඥානයාගේ මෙබඳු වූ චර්‍යායි වේ නු යි අඥානචර්‍යායි නමු. මේ අඥානචර්‍යායි යි.

කතමා ඤාණචරියා.

අනිච්චානුපස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනිච්චානුපස්සනා ඤාණචරියා, දුක්ඛානුපස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දුක්ඛානුපස්සනා ඤාණචරියා, අනත්තානුපස්සනත්ථාය අවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනත්තානුපස්සනා ඤාණචරියා, නිබ්බිදානුපස්සනත්ථාය -පෙ- විරාගානුපස්සනත්ථාය -පෙ- නිරොධානුපස්සනත්ථාය -පෙ- පටිනිස්සග්ගානුපස්සනත්ථාය -පෙ- ඛයානුපස්සනත්ථාය -පෙ- වයානුපස්සනත්ථාය -පෙ- විපරිණාමානුපස්සනත්ථාය -පෙ- අනිමිත්තානුපස්සනත්ථාය -පෙ- අප්පණිහිතානුපස්සනත්ථාය -පෙ- සුඤ්ඤතානුපස්සනත්ථාය -පෙ- අධිපඤ්ඤාධම්මානුපස්සනත්ථාය -පෙ- යථාභූතඤාණදස්සනත්ථාය -පෙ- ආදීනවානුපස්සනත්ථාය -පෙ- පටිසඞ්ඛානුපස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, පටිසඞ්ඛානුපස්සනා ඤාණචරියා, විවට්ටානුපස්සනා ඤාණචරියා, සොතාපත්තිමග්ගො ඤාණචරියා සොතාපත්තිඵලසමාපත්ති ඤාණචරියා, සකදාගාමිමග්ගො ඤාණචරියා, සකදාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අනාගාමිමග්ගො ඤාණචරියා, අනාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අරහත්තමග්ගො ඤාණචරියා අරහත්තඵලසමාපත්ති ඤාණචරියා.

ඤාණචරියා කෙනට්ඨෙන ඤාණචරියා.

නීරාගා චරන්තීති ඤාණචරියා, නිද්දොසා චරන්තීති ඤාණචරියා නිම්මොහා චරන්තීති ඤාණචරියා, නිම්මානා චරන්තීති ඤාණචරියා, නිද්දිට්ඨී චරන්තීති ඤාණචරියා, නිරුද්ධච්චා චරන්තීති ඤාණචරියා, නිබ්බිචිකිච්ඡා චරන්තීති ඤාණචරියා, නානුසයා චරන්තීති ඤාණචරියා, රාගවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, දොසවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා මොහවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, මානවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, දිට්ඨිවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, උද්ධච්චවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, විචිකිච්ඡාවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, අනුසයවිප්පයුත්තා චරන්තීති ඤාණචරියා, කුසලෙහි කම්මෙහි සම්පයුත්තා[1] චරන්තීති ඤාණචරියා, අකුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරන්තීති ඤාණචරියා, සාවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරන්තීති ඤාණචරියා, අනවජ්ජෙහි කම්මෙහි සම්පයුත්තා චරන්තීති ඤාණචරියා, කණ්හෙහි කම්මෙහි විප්පයුත්තා චරන්තීති ඤාණචරියා, සුක්කෙහි කම්මෙහි සම්පයුත්තා[1] චරන්තීති ඤාණචරියා, සුඛුද්‍රයෙහි කම්මෙහි සම්පයුත්තා චරන්තීති ඤාණචරියා, දුක්ඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරන්තීති ඤාණචරියා, සුඛවිපාකෙහි කම්මෙහි සම්පයුත්තා[1] චරන්තීති ඤාණචරියා, දුක්ඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරන්තීති ඤාණචරියා, ඤාතෙ[2] චරන්තීති ඤාණචරියා, ඤාණස්ස එවරූපා චරියා හොතීති ඤාණචරියා, අයං ඤාණචරියා.

අඤ්ඤා විඤ්ඤාණචරියා, අඤ්ඤා අඤ්ඤාණචරියා, අඤ්ඤා ඤාණචරියාති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං.

**චරියානානත්තඤාණනිද්දෙසො.**

---

1. විප්පයුත්තා - PTS, 2. ඤාණෙ - සී. 1, 2.

**ඥානචර්‍ය්‍යා** කවර යත්:

අනිත්‍යානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍ය්‍යා යැ අනිත්‍යානුදර්ශනය ඥානචර්‍ය්‍යා යි. දුඃඛානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍ය්‍යා යැ දුඃඛානුදර්ශනය ඥානචර්‍ය්‍යා යි අනාත්මානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත-මනොධාතුව විඥානචර්‍ය්‍යා යැ අනාත්මානුදර්ශනය ඥානචර්‍ය්‍යා යි. නිර්වේදානු-දර්ශනය පිණිස විරාගානුදර්ශනය පිණිස ... නිරොධානුදර්ශනය පිණිස ... පටිනිස්සග්ගානුදර්ශනය පිණිස ... ක්ෂයානුදර්ශනය පිණිස .. ව්‍යයානුදර්ශනය පිණිස ... විපරිණාමානුදර්ශනය පිණිස ... අනිමිත්තානුදර්ශනය පිණිස ... අප්‍රණිහිතානුදර්ශනය පිණිස ... ශූන්‍යතානුදර්ශනය පිණිස ... අධිප්‍රඥාධර්මානු-දර්ශනය පිණිස ... යථාභූතඥානදර්ශනය පිණිස ... ආදීනවානුදර්ශනය පිණිස ... පටිසඞ්ඛානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්‍ය්‍යා යැ පටිසඞ්ඛානුදර්ශනය ඥානචර්‍ය්‍යා යි. විවට්ටනානුදර්ශනය ඥානචර්‍ය්‍යා යැ ස්‍රොතාපත්තිමාර්ගය ඥානචර්‍ය්‍යා යැ ස්‍රොතාපත්තිඵලසමා-පත්තිය ඥානචර්‍ය්‍යා යැ සකෘදාගාමිමාර්ගය ඥානචර්‍ය්‍යා යැ සකෘදාගාමි ඵලසමාපත්තිය ඥානචර්‍ය්‍යා යැ අනාගාමිමාර්ගය ඥානචර්‍ය්‍යා යැ අනාගාමිඵල-සමාපත්තිය ඥානචර්‍ය්‍යා යැ අර්හත්ත්වමාර්ගය ඥානචර්‍ය්‍යා යැ අර්හත්ඵල-සමාපත්තිය ඥානචර්‍ය්‍යා යි.

**ඥානචර්‍ය්‍යා** යනු: කවර අරුතෙකින් ඥානචර්‍ය්‍යා වෙයි යත්:

රාග රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, ද්වෙෂ රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, මොහ රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, මාන රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, දෘෂ්ටි රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, ඖද්ධත්‍ය රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, විචිකිත්සා රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, අනුශය රහිත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, රාගයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, ද්වෙෂයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, මොහයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, මානයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, දෘෂ්ටියෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, ඖද්ධත්‍යයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, විචිකිත්සායෙන් විප්‍රයුතක වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, අනුශයයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, කුශලකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, අකුශලකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥාන-චර්‍ය්‍යා යැ, සාවද්‍යකර්මයන්ගෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, අනවද්‍යකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, කෘෂ්ණ-කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ ශුක්ලකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, සුඛොදයකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, දුඃඛොදයකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, සුඛවිපාක වූ කර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, දුඃඛවිපාක වූ කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, යථාස්වභාවය වූ ඥානාලම්බනයෙහි හැසිරේ නු යි ඥානචර්‍ය්‍යා යැ, උක්තප්‍රකාර වූ ඥානයාගේ මෙබඳු වූ චර්‍ය්‍යාව වේ නු යි ඥානචර්‍ය්‍යා යැ. මේ ඥානචර්‍ය්‍යා යි.

විඥානචර්‍ය්‍යාව අනෙකක, අඥානචර්‍ය්‍යාව අනෙකක, ඥානචර්‍ය්‍යාව අනෙකකැ'යි ඒ චර්‍ය්‍යානානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජා-නනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "**චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං**"යි.

**චර්‍ය්‍යානානාත්වඥානනිර්දේශ යි.**

## 18. භූමිනානත්තඤාණං

කථං චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං.

චතස්සො භූමියො: කාමාවචරා භූමි, රූපාවචරා භූමි, අරූපාවචරා භූමි, අපරියාපන්නා භූමි.

කතමා කාමාවචරා භූමි: හෙට්ඨතො අවීචිනිරයං පරියන්තං කරිත්වා, උපරිතො පරනිම්මිතවසවත්තී දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතුආයතනා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, අයං කාමාවචරා භූමි.

කතමා රූපාවචරා භූමි: හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කරිත්වා, උපරිතො අකනිට්ඨෙ දෙවෙ අන්තො කරිත්වා, යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස[1] වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා, අයං රූපාවචරා භූමි.

කතමා අරූපාවචරා භූමි. හෙට්ඨතො ආකාසානඤ්චායතනූපගෙ දෙවෙ පරියන්තං කරිත්වා උපරිතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා, යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස[1] වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා, අයං අරූපාවචරා භූමි.

කතමා අපරියාපන්නා භූමි. අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, අයං අපරියාපන්නා භූමි, ඉමා චතස්සො භූමියො.

අපරාපි චතස්සො භූමියො: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, චත්තාරි ඣානානි, චතස්සො අප්පමඤ්ඤායො, චතස්සො අරූපසමාපත්තියො, චතස්සො පටිසම්භිදා, චතස්සො පටිපදා, චත්තාරි ආරම්මණානි, චත්තාරි අරියවංසානි, චත්තාරි සඞ්ගහවත්ථූනි, චත්තාරි චක්කානි, චත්තාරි ධම්මපදානි, ඉමා චතස්සො භූමියො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං.

**භූමිනානත්තඤාණනිද්දෙසො**

1 උපපත්තස්ස - මජසං, සත, PTS;

## 18. භූමිනානාත්වඥනය

කිසෙයින් සතර ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥව භූමිනානාත්වඥන වෙයි යත්:

භූමි සතරෙකි: කාමාවචරභූමි යැ රූපාවචරභූමි යැ අරූපාවචරභූමි යැ අපරියාපන්නභූමි යි.

කාමාවචරභූමි කවර යත්: යටින් අවීචිනිරය පිරියත් කොට මතු-භාගයෙන් පරනිර්මිතවශවර්තිදෙවියන් ඇතුළු කොට තෙල අවකාශයෙහි මෙහි හැසිරෙන්නා වූ මෙහි පර්යාපන්න වූ යම් ස්කන්ධධාතුආයතන කෙනෙක් වෙත් ද රූප – වෙදනා – සංඥ – සංස්කාර – විඥන කෙනෙක් වෙත් ද මේ කාමාවචරභූමි නම.

රූපාවචරභූමි කවර යත්: යටින් බ්‍රහ්මලොව පිරියත් කොට මතුභාග-යෙන් අකනිට්ඨාදෙවියන් ඇතුළු කොට තෙල අවකාශයෙහි මෙහි හැසිරෙන්නා වූ මෙහි පර්යාපන්න වූ සමවතට සමවත්හුගේ හෝ (විපාක විසින් බ්‍රහ්මලොව) උපන්නහු ගේ හෝ ඉහාත්මසුඛවිහරණ ඇත්තහු (රහත්හු) ගේ හෝ යම් චිත්තචෛතසිකධර්ම කෙනෙක් වෙත් ද මේ රූපාවචරභූමි නම.

අරූපාවචරභූමි කවර යත්: යටින් ආකාසානඤ්චායතනූපගදෙවියන් පිරියත් කොට මතුභාගයෙන් නෛවසංඥනාසංඥයතනදෙවියන් ඇතුළු කොට තෙල අවකාශයෙහි මෙහි හැසිරෙන්නා වූ මෙහි පර්යාපන්න වූ සමවතට සමවත්හුගේ හෝ (විපාක විසින් අරූතලයෙහි) උපන්නහුගේ හෝ ඉහාත්මසුඛවිහරණ ඇත්තහු (රහත්හු) ගේ හෝ යම් චිත්තචෛත-සිකධර්ම කෙනෙක් වෙත් ද මේ අරූපාවචරභූමි නම.

අපර්යාපන්නභූමි කවර යත්: මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛත-ධාතුව ද අපර්යාපන්නයෝ යැ. මේ අපර්යාපන්නභූමි නම්.

මොහු සතර භූමි නම් වෙත්.

අනෙකුදු භූමි සතරෙකි: සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක් ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ සතර ධ්‍යානයෝ යැ සතර අප්‍ර-මාණ්‍යයෝ යැ සතර අරූපසමාපත්තිහු යැ සතර ප්‍රතිසංවිද්හු යැ සතර ප්‍රතිපත්හු යැ සතර ආලම්බනයෝ යැ සතර ආර්‍යවංශයෝ යැ සතර සඞ්ග්‍රහවස්තුහු යැ චතුශ්චක්‍රයෝ යැ සතර ධර්මපදයෝ යි. මොහු සතරභූමි නම් වෙත්.

ඒ භූමිනානාත්වඥනය ඥතාර්ථයෙන් ඥන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං'**යි.

**භූමිනානාත්වඥනනිර්දේශ යි.**

# 19. ධම්මනානත්තඤාණං

කථං නවධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං:

කථං ධම්මෙ වවත්ථෙති: කාමවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අකුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. රූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. අරූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. අපරියාපන්නෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං කාමාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අකුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති: දස කුසලකම්මපථෙ කුසලතො වවත්ථෙති, දස අකුසලකම්මපථෙ අකුසලතො වවත්ථෙති, රූපඤ්ච විපාකඤ්ච කිරියඤ්ච අබ්‍යාකතතො වවත්ථෙති. එවං කාමාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අකුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං රූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති අබ්‍යාකතතො වවත්ථෙති: ඉධට්ඨස්ස චත්තාරි ඣානානි කුසලතො වවත්ථෙති, තත්‍රූපපන්නස්ස චත්තාරි ඣානානි අබ්‍යාකතතො වවත්ථෙති. එවං රූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං අරූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති: ඉධට්ඨස්ස චතස්සො අරූපාවචරසමාපත්තියො කුසලතො වවත්ථෙති, තත්‍රූපපන්නස්ස චතස්සො අරූපාවචරසමාපත්තියො අබ්‍යාකතතො වවත්ථෙති. එවං අරූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං අපරියාපන්නෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති: චත්තාරො අරියමග්ගෙ කුසලතො වවත්ථෙති, චත්තාරි ච සාමඤ්ඤඵලානි නිබ්බානඤ්ච අබ්‍යාකතතො වවත්ථෙති. එවං අපරියාපන්නෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. එවං ධම්මෙ වවත්ථෙති.

නව පාමොජ්ජමූලකා ධම්මා: අනිච්චතො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ යථාභූතං ජානාති[1] පස්සති, යථාභූතං ජානං පස්සං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. දුක්ඛතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- අනත්තතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ-

1. පජානාති - මජසං, සයා, PTS

# 19. ධර්මනානාත්වඥානය

කිසෙයින් නවධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධර්මනානාත්වඥාන වෙයි යත්:

කිසෙයින් ධර්මයන් ව්‍යවස්ථා කෙරේ ද යත්: කාමාවචර ධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. රූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අරූපාවචර ධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අපර්‍යාපන්නධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි.

කිසෙයින් කාමාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරේ ද, අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරේ ද, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ ද යත්: දශකුශලකර්මපථයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, දශ අකුශල කර්මපථයන් අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. රූපය ද විපාකය ද ක්‍රියාව ද අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් කාමාවචර-ධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ.

කිසෙයින් රූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි යත්: මෙ මිනිස්ලොවැ සිටියහුගේ සතර ධ්‍යානයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. (විපාක වශයෙන්) එ බඹලොවැ උපන්නහුගේ සතර විපාකධ්‍යානයන් අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් රූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ.

කිසෙයින් අරූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි යත්: මෙ මිනිස්ලොවැ සිටියහුගේ සතර අරූපාවචරසමාපත්තීන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, ඒ අරූතලයෙහි උපන්නහුගේ සතර විපාක අරූපාවචරසමාපත්තීන් අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් අරූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ.

කිසෙයින් අපර්‍යාපන්නධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි යත්: සතර ආර්‍යමාර්ගයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. සතර ශ්‍රාමණ්‍යඵලයන් ද නිර්වාණය ද අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් අපර්‍යාපන්නධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් ධර්මයන් ව්‍යවස්ථා කෙරේ.

ප්‍රාමොද්‍යමූලකධර්මයෝ නව දෙනෙකි: අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ නාමකාය සන්හුන් දරථ ඇත්තේ වෙයි. නිවුණුකය ඇත්තේ චෛතසික සුඛය විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. සිත එකඟ වූ කල්හි (උදයව්‍යයඥානාදි වශයෙන් සංස්කාරයන්) යථා-ස්වභාවයෙන් දැනැගනී. නුවණැසින් දකී. යථාස්වභාවයෙන් දන්නේ නුවනැසින් දක්නේ සංස්කාරයන්හි උකටලී වෙයි. උත්කණ්ඨිත වනුයේ සංස්කාරයන් කෙරෙන් විරක්ත වෙයි. විරාගය හෙතු කොට ගෙන නිර්වාණයෙහි (අධිමොක්ෂයෙන්) මිදෙයි. දුඃඛ වශයෙන් මෙනෙහිකරන්නා-හට ප්‍රාමොද්‍යය උපදී. ... අනාත්ම වශයෙන් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ...

රූපං අනිච්චතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං දුක්ඛතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං අනත්තතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං දුක්ඛතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං අනත්තතො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ යථාභූතං ජානාති පස්සති, යථාභූතං ජානං පස්සං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. ඉමෙ නව පාමොජ්ජමූලකා ධම්මා.

නව යොනිසොමනසිකාරමූලකා ධම්මා: අනිච්චතො යොනිසො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො-පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙන චිත්තෙන 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

දුක්ඛතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙන චිත්තෙන 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

අනත්තතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං අනිච්චතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං දුක්ඛතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං අනත්තතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං දුක්ඛතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං අනත්තතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙන චිත්තෙන 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ නව යොනිසොමනසිකාරමූලකා ධම්මා.

රූපය අනිත්‍ය වශයෙන් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... ජරාමරණය දුඃඛ වශයෙන් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... ජරාමරණය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ නාමකාය සන්හුන් දරථ ඇත්තේ වෙයි. සැහැල්ලු වූ කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. සිත එකඟ වූ කල්හි (සංස්කාරයන්) යථාස්වභාවයෙන් දැනගනී. නුවණැසින් දකී. යථාස්වභාවයෙන් දක්නේ නුවණැසින් දක්නේ උකටලී වෙයි. උකටලීත වනුයේ සංස්කාරයන් කෙරෙන් විරක්ත වෙයි. විරාගය හෙතු කොට ගෙන නිර්වාණයෙහි (අධිමොක්ෂයෙන්) මිදෙයි. මොහු නවදෙන **ප්‍රාමොද්‍යමූලකධර්මයෝ** යි.

යොනිසොමනසිකාරමූලකධර්මයෝ නව දෙනෙකි: අනිත්‍ය වශයෙන් නුවණින් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ නාමකාය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත අරමුණෙහි සමාහිත වෙයි. සමාහිත වූ සිතින් 'මේ දුකැ' යි යථාස්වභාවයෙන් (නුවණින්) දැනගනී. මේ 'දුඃඛසමුදය'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛනිරොධය'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා' යැ යි යථාස්වභාවයෙන් දැනගනී.

දුඃඛ විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී, ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ නාමකය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත සමාහිත වෙයි. සමාහිත වූ සිතින් 'මේ දුකැ'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛසමුදය'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛනිරොධය'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා'යැ යි යථාස්වභාවයෙන් දැනගනී.

අනාත්ම විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... රූපය අනිත්‍ය විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී.... රූපය දුඃඛ විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... රූපය අනාත්ම විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... ජරාමරණය දුඃඛ විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... ජරාමරණය අනාත්ම විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ නාමකය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත සමාහිත වෙයි. සමාහිත වූ සිතින් 'මේ දුකැ'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛසමුදය'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛනිරොධය'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා'යි යථාස්වභාවයෙන් දැනගනී. මොහු නවදෙන **යොනිසොමනසිකාරමූලකධර්මයෝ** යි.

නව නානත්තා: ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං, වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සඞ්කප්පනානත්තං, සඞ්කප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං, ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං, පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං, පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති ලාභනානත්තං. ඉමෙ නවනානත්තා.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'නව ධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං'.

**ධම්මනානත්තඤාණනිද්දෙසො.**

## 20-24. ඤාණපඤ්චකං

කථං අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ[1] ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ[2] ඤාණං, පහානපඤ්ඤා පරිච්චාගට්ඨෙ[3] ඤාණං, භාවනාපඤ්ඤා එකරසට්ඨෙ[4] ඤාණං, සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ[5] ඤාණං:

යෙ යෙ ධම්මා අභිඤ්ඤාතා හොන්ති තෙ තෙ ධම්මා ඤාතා හොන්ති, යෙ යෙ ධම්මා පරිඤ්ඤාතා හොන්ති තෙ තෙ ධම්මා තීරිතා හොන්ති, යෙ යෙ ධම්මා පහීනා හොන්ති තෙ තෙ ධම්මා පරිච්චත්තා හොන්ති, යෙ යෙ ධම්මා භාවිතා හොන්ති තෙ තෙ ධම්මා එකරසා හොන්ති, යෙ යෙ ධම්මා සච්ඡිකතා හොන්ති තෙ තෙ ධම්මා ඵස්සිතා[6] හොන්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං, පහානපඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං, භාවනාපඤ්ඤා එකරසට්ඨෙ ඤාණං, සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං'

**ඤාණපඤ්චකනිද්දෙසො**

---

1. ඤාතට්ඨෙන - සී 1,2,3, ස්‍යා 2 තීරණට්ඨෙන - සී 1, 2, 3. ස්‍යා
3 පරිච්චාගට්ඨෙන - සී 1,2,3, ස්‍යා 4 එකරසට්ඨෙන - සී. 1,2,3, ස්‍යා.
5. ඵස්සනට්ඨෙන - සී 1,2,3, ස්‍යා. 6. ඵුසිතා - ස්‍යා, මජසං.

නානාත්වයෝ නවදෙනෙකි: ධාතුනානාත්වය නිසා ස්පර්ශනානාත්වය උපදී. ස්පර්ශනානාත්වය නිසා වේදනානානාත්වය උපදී. වේදනානානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සංකල්පනානාත්වය උපදී. සංකල්පනානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා පර්යේෂණනානාත්වය උපදී. පර්යේෂණනානාත්වය නිසා ලාභනානාත්වය උපදී. මොහු **නව නානාත්වයෝ** යි.

ඒ ධර්මනානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'නව ධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං'යි.

**ධර්මනානාත්වඥානනිර්දේශ** යි.

## 20-24. ඥානපඤ්චකය

කිසෙයින් අභිඥාප්‍රඥාව ඥාතාර්ථඥාන වෙයි, පරිඥාප්‍රඥාව තීරණාර්ථඥාන වෙයි, ප්‍රහාණප්‍රඥාව පරිත්‍යාගාර්ථඥාන වෙයි, භාවනාප්‍රඥාව එකරසාර්ථඥාන වෙයි, සාක්ෂාත්ක්‍රියාප්‍රඥාව ස්පර්ශනාර්ථඥාන වෙයි යත්:

යම් යම් ධර්ම කෙනෙක් (ධර්මස්වභාවලක්ෂණ දැනීම් වශයෙන්) මොනො-වට දන්නාලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ දන්නාලද්දාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් (සාමාන්‍ය ලක්ෂණ වශයෙන්) හාත්පසින් දන්නාලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ තීරණය කරනලද්දාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් (භඞ්ගානුදර්ශනයෙහි පටන්) ප්‍රහීණ වූවාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ පරිත්‍යක්ත වූවාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් වඩනලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ එකකෘත්‍ය වූවාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කරනලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ (ප්‍රතිලාභප්‍රතිවෙධස්පර්ශ-යෙන්) ස්පර්ශ කරනලද්දාහු වෙත්.

ඒ ඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං, පහාණපඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං, භාවනාපඤ්ඤා එකරසට්ඨෙ ඤාණං, සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං**'යි

**පඤ්චකඥානනිර්දේශ** යි.

# 25-28. පටිසම්භිදාඤාණං

කථං අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

සද්ධින්ද්‍රියං ධම්මො, විරියින්ද්‍රියං ධම්මො, සතින්ද්‍රියං ධම්මො, සමාධින්ද්‍රියං ධම්මො, පඤ්ඤින්ද්‍රියං ධම්මො, අඤ්ඤං සද්ධින්ද්‍රියං ධම්මො[1] අඤ්ඤං විරියින්ද්‍රියං ධම්මො, අඤ්ඤං සතින්ද්‍රියං ධම්මො, අඤ්ඤං සමාධින්ද්‍රියං ධම්මො, අඤ්ඤං පඤ්ඤින්ද්‍රියං ධම්මො, යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ධම්මා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'.

අධිමොක්ඛට්ඨො අත්ථො පග්ගහට්ඨො අත්ථො, උපට්ඨානට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො, දස්සනට්ඨො අත්ථො. අඤ්ඤො අධිමොක්ඛට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, අඤ්ඤො දස්සනට්ඨො අත්ථො යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටි-සම්භිදෙ ඤාණං'.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානා නිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානා නිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානා ඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ඤාණා පටිවිදිතාති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

සද්ධාබලං ධම්මො, විරියබලං ධම්මො, සතිබලං ධම්මො, සමාධිබලං ධම්මො, පඤ්ඤාබලං ධම්මො. අඤ්ඤං සද්ධාබලං ධම්මො, අඤ්ඤං විරිය-බලං ධම්මො, අඤ්ඤං සතිබලං ධම්මො, අඤ්ඤං සමාධිබලං ධම්මො, අඤ්ඤං පඤ්ඤාබලං ධම්මො. යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ධම්මා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං.'

---

1. සද්ධින්ද්‍රිය ධම්මො (ඉච්චාදි) - සී 1. 3.

# 25-28. ප්‍රතිසංවිද්ඥනය

කිසෙයින් අර්ථනානාත්වයෙහි ප්‍රඥව අර්ථප්‍රතිසංවිද්ඥන වෙයි, ධර්මනානාත්වයෙහි ප්‍රඥව ධර්මප්‍රතිසංවිද්ඥන වෙයි, නිරුක්තිනානාත්වයෙහි ප්‍රඥව නිරුක්තිප්‍රතිසංවිද්ඥන වෙයි, ප්‍රතිභානනානාත්වයෙහි ප්‍රඥව ප්‍රතිභානප්‍රතිසංවිද්ඥන වෙයි යත්:

ශ්‍රද්ධෙන්ද්‍රිය ධර්මයෙක, වීර්යෙන්ද්‍රිය ධර්මයෙක, සමාධීන්ද්‍රිය ධර්මයෙක, ප්‍රඥෙන්ද්‍රිය ධර්මයෙකි. ශ්‍රද්ධෙන්ද්‍රියධර්මය අනෙකෙක, වීර්යෙන්ද්‍රියධර්මය අනෙකෙක, සමාධීන්ද්‍රියධර්මය අනෙකෙක, ප්‍රඥෙන්ද්‍රියධර්මය අනෙකෙකි. යම් ඥනයෙකින් මේ නානාධර්මයෝ දන්නාලද්දහු ද ඒ ඥනයෙන් මැ මේ නානාධර්මයෝ අභිමුඛභාවයෙන් දන්නාලද්දහු වෙත්. එයින් කියනු ලැබෙයි: **‘ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං’යි**

අධිමොක්ෂකෘත්‍යය අර්ථයෙක, ප්‍රග්‍රහකෘත්‍යය අර්ථයෙක, උපස්ථාන (එළඹිම්) කෘත්‍යය අර්ථයෙක, අවික්ෂෙපකෘත්‍යය අර්ථයෙක, දර්ශනකෘත්‍යය අර්ථයෙකි. අධිමොක්ෂකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙක, ප්‍රග්‍රහකෘත්‍යසංඛ්‍යාත අර්ථය අනෙකෙක, උපස්ථානකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙක, අවික්ෂෙපකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙක, දර්ශනකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙකි. යම් ඥනයෙකින් මේ නානාර්ථයෝ දන්නා ලද්දහු ද, එ මැ ඥනයෙන් මේ නානාර්ථයෝ ප්‍රකට වූවාහු වෙත් යයි. එයින් කියනු ලැබෙයි: **“අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං’** යි.

සද්ධින්ද්‍රියාදි පඤ්චධර්මයන් (පරහට) දක්වනු සඳහා චතුර්විධ නාමව්‍යඤ්ජන නාමනිරුක්ති නාමාභිලාපයෝ වෙති. (අධිමොක්ෂාදි) පඤ්චාර්ථයන් දක්වනු සඳහා නාමව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ, අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥනයෙකින් මේ විවිධ වූ නිරුක්තීහු දන්නා ලද්දහු වෙත් ද, එ මැ ඥනයෙන් මේ නානානිරුක්තීහු ප්‍රකට කොට දන්නා ලද්දහු වෙත් යයි. එයින් කියනු ලැබෙයි: **“නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං”**යි.

පඤ්චධර්මයෙහි ඥනයෝ යැ, පඤ්චඅර්ථයෙහි ඥනයෝ යැ, දශනිරුක්තියෙහි ඥනයෝ යි. ධර්මයෙහි ඥනයෝ අන්‍යයෝ යැ, අර්ථයෙහි ඥනයෝ අන්‍යයෝ යැ, නිරුක්තියෙහි ඥනයෝ අන්‍යයෝ යි. යම් ඥනයෙකින් මේ විවිධ වූ ඥනයෝ දන්නා ලද්දහු වෙත් ද, එ මැ ඥනයෙන් මේ විවිධ වූ ඥනයෝ දන්නා ලද්දහු වෙත් යයි. එයින් කියනු ලැබෙයි: **“පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං”** යි.

ශ්‍රද්ධාබලය ධර්මයෙක, වීර්යබලය ධර්මයෙක, සමෘතිබලය ධර්මයෙක, සමාධිබලය ධර්මයෙක, ප්‍රඥබලය ධර්මයෙකි. ශ්‍රද්ධාබලය අන්‍යධර්මයෙක, වීර්යබලය අන්‍යධර්මයෙක, සමෘතිබලය අන්‍යධර්මයෙක, සමාධිබලය අන්‍යධර්මයෙක, ප්‍රඥබලය අන්‍යධර්මයෙකි. යම් ඥනයෙකින් මේ විවිධ ධර්මයෝ දන්නා ලද්දහු ද, එ මැ ඥනයෙන් මේ නානාධර්මයෝ ප්‍රකට කොට දන්නා ලද්දහු යයි. එයින් කියනු ලැබෙයි. **“ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං”** යි.

අස්සද්ධියෙ අකම්පියට්ඨො අත්ථො, කොසජ්ජෙ අකම්පියට්ඨො අත්ථො, පමාදෙ අකම්පියට්ඨො අත්ථො, උද්ධච්චෙ අකම්පියට්ඨො අත්ථො, අවිජ්ජාය අකම්පියට්ඨො අත්ථො. අඤ්ඤො අස්සද්ධියෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො කොසජ්ජෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො පමාදෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො උද්ධච්චෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො අවිජ්ජාය අකම්පියට්ඨො අත්ථො. යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානා නිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානා නිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානාඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ඤාණා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, විරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො. අඤ්ඤො සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො විරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො අඤ්ඤො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො. යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාධම්මා පටිවිදිතා'ති තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං.'

උපට්ඨානට්ඨො අත්ථො, පවිචයට්ඨො අත්ථො, පග්ගහට්ඨො අත්ථො, ඵරණට්ඨො අත්ථො, උපසමට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො, පටිසඞ්ඛානට්ඨො අත්ථො. අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො පවිචයට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො ඵරණට්ඨො අත්ථො, අඤ්ඤො උපසමට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, අඤ්ඤො පටිසඞ්ඛානට්ඨො අත්ථො. යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං.'

අශ්‍රද්ධායෙන් අකම්පාභාවය අර්ථයෙක, කෞසීද්‍යයෙන් අකම්පාභාවය අර්ථයෙක, ප්‍රමාදයෙන් අකම්පාභාවය අර්ථයෙක, ඖද්ධත්‍යයෙන් අකම්පාභාවය අර්ථයෙක, අවිද්‍යායෙන් අකම්පාභාවය අර්ථයෙකි. අශ්‍රද්ධායෙන් අකම්පාභාවාර්ථය අනෙකෙක, කෞසීද්‍යයෙන් අකම්පාභාවාර්ථය අනෙකෙක, ප්‍රමාදයෙන් අකම්පාභාවාර්ථය අනෙකෙක, ඖද්ධත්‍යයෙන් අකම්පාභාවාර්ථය අනෙකෙක, අවිද්‍යායෙන් අකම්පාභාවාර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාර්ථයෝ දන්නා ලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ නානාර්ථයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **"අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං"** යී.

ශ්‍රද්ධාබලාදි පඤ්චධර්මයන් දක්වනු සඳහා ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. පඤ්ච අර්ථයන් දක්වනු සඳහා ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධනිරුක්තීහු දන්නාලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ විවිධ නිරුක්තීහු ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **"නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං"** යි.

පඤ්චධර්මයෙහි ඥානයෝ යැ, පඤ්චඅර්ථයෙහි ඥානයෝ යැ, දශනිරුක්තියෙහි ඥානයෝ යි. ධර්මඥානයෝ අන්‍යයෝ යැ, අර්ථඥානයෝ අන්‍යයෝ යැ, නිරුක්තිඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධඥානයෝ දන්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ විවිධඥානයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'** යී.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, සමාධිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ගය ධර්මයෙකි. ස්මෘතිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, සමාධිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ විවිධධර්මයෝ දන්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ විවිධධර්මයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **"ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං"** යී.

උපස්ථාන (එළඹිසිටි) ස්වභාවය අර්ථයෙක, ප්‍රවිචය ස්වභාවය අර්ථයෙක, ප්‍රග්‍රහස්වභාවය අර්ථයෙක, පැතිරීම් ස්වභාවය අර්ථයෙක, උපශම ස්වභාවය අර්ථයෙක, අවික්‍ෂෙප ස්වභාවය අර්ථයෙක, මධ්‍යස්ථ ස්වභාවය අර්ථයෙකි. උපස්ථානස්වභාවාර්ථය අනෙකෙක, ප්‍රවිචයස්වභාවාර්ථය අනෙකෙක, ප්‍රග්‍රහස්වභාවාර්ථය අනෙකෙක, පැතිරීම් ස්වභාවාර්ථය අනෙකෙක, උපශමස්වභාවාර්ථය අනෙකෙක, අවික්‍ෂෙපස්වභාවාර්ථය අනෙකෙක, මධ්‍යස්ථස්වභාවාර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ ඥානාර්ථයෝ දන්නාලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ නානාර්ථයෝ අභිමුඛ කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි **'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'** යී.

සත්ත ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, සත්ත අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො, යෙන ඤාණෙන ඉමා නානානිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානානිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

සත්තසු ධම්මෙසු ඤාණානි, සත්තසු අත්ථෙසු ඤාණානි, චුද්දසසු නිරුත්තිසු ඤාණානි, අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තිසු ඤාණානි, යෙන ඤාණෙන ඉමෙ නානාඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාඤාණා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'පටිභාන-නානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

සම්මාදිට්ඨි ධම්මො, සම්මාසඞ්කප්පො ධම්මො, සම්මාවාචා ධම්මො, සම්මාකම්මන්තො ධම්මො සම්මාආජීවො ධම්මො, සම්මාවායාමො ධම්මො, සම්මාසති ධම්මො, සම්මාසමාධි ධම්මො. අඤ්ඤො සම්මාදිට්ඨි ධම්මො, අඤ්ඤො සම්මාසඞ්කප්පො ධම්මො, අඤ්ඤො සම්මාවාචා ධම්මො, අඤ්ඤො සම්මා-කම්මන්තො ධම්මො, අඤ්ඤො සම්මාආජීවො ධම්මො, අඤ්ඤො සම්මාවායාමො ධම්මො, අඤ්ඤො සම්මාසති ධම්මො, අඤ්ඤො සම්මාසමාධි ධම්මො, යෙන ඤාණෙන ඉමෙ නානාධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාධම්මා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'.

දස්සනට්ඨො අත්ථො, අභිනිරොපනට්ඨො අත්ථො, පරිග්ගහට්ඨො අත්ථො, සමුට්ඨානට්ඨො අත්ථො, වොදානට්ඨො අත්ථො, පග්ගහට්ඨො අත්ථො, උපට්ඨානට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො. අඤ්ඤො දස්සනට්ඨො අත්ථො, අඤ්ඤො අභිනිරොපනට්ඨො අත්ථො, අඤ්ඤො පරිග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො සමුට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො වොදානට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'.

අට්ඨ ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, අට්ඨ අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානානිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානානිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

සතිසම්බොජ්ඣඞ්ගාදි සප්තධර්මයන් දක්වනු සඳහා ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. උපස්ථානාදි සප්තාර්ථයන් දක්වනු සඳහා ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ, අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ නානා නිරුක්තීහු දන්නාලද්දාහු වෙත් ද, එ මැ ඥානයෙන් මේ නානා නිරුක්තීහු ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'** යි.

සප්තධර්මඥානයෝ යැ සප්ත අර්ථඥානයෝ යැ. තුදුස්නිරුක්තිඥානයෝ යි. ධර්මඥානයෝ අන්‍යයෝ යැ, අර්ථඥානයෝ අන්‍යයෝ යැ. නිරුක්තිඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධඥානයෝ දන්නා ලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ විවිධඥානයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'** යි.

සම්‍යග්දෘෂ්ටිය ධර්මයෙක, සම්‍යක්සංකල්පය ධර්මයෙක, සම්‍යග්වචනය ධර්මයෙක, සම්‍යක්කර්මාන්තය ධර්මයෙක, සම්‍යගාජීවය ධර්මයෙක, සම්‍යග්ව්‍යායාමය ධර්මයෙක, සම්‍යක්ස්මෘතිය ධර්මයෙක, සම්‍යක්සමාධිය ධර්මයෙකි. සම්‍යග්දෘෂ්ටිධර්මය අනෙකෙක, සම්‍යක්සංකල්පධර්මය අනෙකෙක, සම්‍යග්වචනධර්මය අනෙකෙක, සම්‍යක්කර්මාන්තධර්මය අනෙකෙක, සම්‍යගාජීවධර්මය අනෙකෙක, සම්‍යග්ව්‍යායාමධර්මය අනෙකෙක, සම්‍යක්ස්මෘතිධර්මය අනෙකෙක, සම්‍යක්සමාධිධර්මය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාධර්මයෝ දන්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ නානාධර්මයෝ ප්‍රකට කොට දන්නා ලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'** යි.

දර්ශනස්වභාවය අර්ථයෙක, අභිනිරෝපණ (සිත අරමුණට නඟන) ස්වභාවය අර්ථයෙක, පරිග්‍රහ (චතුර්විධ වාක්සංවර) ස්වභාවය අර්ථයෙක, සමුත්ථාන (ත්‍රිවිධ කායසංවර) ස්වභාවය අර්ථයෙක, පරිශුද්ධස්වභාවය අර්ථයෙක, (වීර්‍ය්‍ය වශයෙන්) ප්‍රග්‍රහ ස්වභාවය අර්ථයෙක, උපස්ථානාර්ථය අර්ථයෙක, අවික්ෂෙපාර්ථය අර්ථයෙකි. දර්ශනස්වභාවාර්ථය අනෙකෙක, අභිනිරොපණස්වභාවාර්ථය අනෙකෙක, පරිග්‍රහස්වභාවාර්ථය අනෙකෙක, සමුත්ථානස්වභාවාර්ථය අනෙකෙක, පරිශුද්ධස්වභාවාර්ථය අනෙකෙක, ප්‍රග්‍රහස්වභාවාර්ථය අනෙකෙක, උපස්ථානස්වභාවාර්ථය අනෙකෙක, අවික්ෂෙපස්වභාවාර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාඅර්ථයෝ දන්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ නානා අර්ථයෝ ප්‍රකට කොට දන්නා ලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'** යි.

අෂ්ටධර්මයන් (මෙරමාහට) දක්වනු පිණිස ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. අෂ්ටඅර්ථයන් දක්වනු පිණිස ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ, අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ නානානිරුක්තීහු දන්නා ලද්දාහු ද එ මැ ඥානයෙන් මේ නානානිරුක්තීහු ප්‍රකට කොට දන්නා ලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'** යි.

අට්ඨසු ධම්මෙසු ඤාණානි, අට්ඨසු අත්ථෙසු ඤාණානි, සොළසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානාඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාඤාණා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

**පටිසම්භිදාඤාණනිද්දෙසො.**

## 29-31. ඤාණත්තයං

කථං විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං, විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං:

නිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති අනිමිත්තො විහාරො, පණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති අප්පණිහිතො විහාරො, අභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති සුඤ්ඤතො විහාරො.

නිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා සමාපත්ති. පණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා සමාපත්ති. අභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා සමාපත්ති.

අෂ්ටධර්මඥානයෝ යැ අෂ්ටඅර්ථඥානයෝ යැ සොළොස් නිරුක්ති-ඥානයෝ යි. ධර්මඥානයෝ අන්‍යයෝ යැ. අර්ථඥානයෝ අන්‍යයෝ යැ. නිරුක්තිඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධඥානයෝ දත්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ විවිධඥානයෝ මොනොවට දත්නා ලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'**යි.

ඒ ඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්ම-නානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටි-සම්භිදෙ ඤාණං'යි.

**ප්‍රතිසංවිද්ඥානනිර්දේශ යි.**

## 29-31. ඥානත්‍රය

කිසෙයින් (අනිත්‍යානුදර්ශනාදි) විහාරනානාත්වයෙහි ප්‍රඥාව විහාරාර්ථ-ඥාන වෙයි, (අනිමිත්තාදි) සමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව සමාපත්ත්‍යර්ථ ඥාන වෙයි, විහාරසමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව විහාරසමාපත්ත්‍යර්ථඥාන වෙයි යත්:

සංස්කාරනිමිත්ත භය විසින් මොනොවට දක්නේ සංස්කාරනිමිත්ත-ප්‍රතිපක්ෂ නිර්වාණයෙහි අධිමුක්ත (නිම්න) බැවින් (සංස්කාරනිමිත්ත නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය (විදර්ශනාඥානයෙන්) දකී නම් (ඒ) අනිමිත්තවිහාර නම් වෙයි. තෘෂ්ණාව භය විසින් මොනොවට දක්නේ (තෘෂ්ණාප්‍රතිපක්ෂ) නිර්වාණයෙහි අධිමුක්ත බැවින් (තෘෂ්ණාව නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය දකී නම් (ඒ) අප්‍රණිහිත-විහාර නම් වෙයි. ආත්මාභිනිවේශය භය විසින් මොනොවට දක්නේ (ආත්මවිරහිත වූ) නිර්වාණයෙහි අධිමුක්ත බැවින් (අභිනිවේශය නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය දකී නම් (ඒ) ශූන්‍යතවිහාර නම් වේ.

නිමිත්ත භය විසින් මොනොවට දක්නේ අනිමිත්ත(නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට නිමිත්තප්‍රති-පක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අනිමිත්තසමාපත්ති නම් වෙයි. ප්‍රණිධිය භය විසින් මොනොවට දක්නේ අප්‍රණිහිත (නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට තෘෂ්ණාප්‍රතිපක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අප්‍රණිහිත-සමාපත්ති නම් වෙයි. ආත්මාභිනිවේශය භය විසින් මොනොවට දක්නේ ශූන්‍යත(නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) ශූන්‍යතසමාපත්ති නම් වේ.

නිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා විහාරසමාපත්ති. පණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා විහාරසමාපත්ති. අභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා විහාරසමාපත්ති.

රූපනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අනිමිත්තො විහාරො. රූපපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අප්පණිහිතො විහාරො. රූපාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, සුඤ්ඤතො විහාරො.

රූපනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා සමාපත්ති. රූපපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා සමපත්ති. රූපාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා සමාපත්ති.

රූපනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා විහාරසමාපත්ති. රූපපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා විහාරසමාපත්ති. රූපාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා විහාරසමාපත්ති.

නිමිත්ත භය විසින් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (සංස්කාරනිමිත්ත නුවණින් සපශී කොට කොට (එහි) භඞ්ගය දකී නම්, (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට නිමිත්තප්‍රතිපක්‍ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අනිමිත්තවිහාරසමාපත්ති නම් වෙයි. ප්‍රණිධිය භය විසින් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් (තෘෂ්ණාව නුවණින්) සපශී කොට කොට භඞ්ගය දකී නම්, විපාක ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අප්‍රණිහිත විහාරසමාපත්ති නම් වෙයි. ආත්මාභිනිවෙශය භය විසින් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් (ආත්මාභිනිවෙශය නුවණින්) සපශී කොට කොට (එහි) භඞ්ගය දකී නම්, (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) ශූන්‍යතවිහාර සමාපත්ති නම් වේ.

රූපනිමිත්ත භය විසින් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (රූපනිමිත්ත නුවණින්) සපශී කොට කොට භඞ්ගය දකී නම්, අනිමිත්තවිහාර නම් වෙයි. රූපතෘෂ්ණාව භය විසින් මොනොවට දක්නේ අප්‍රණිහිත (නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (රූපප්‍රණිධිය නුවණින්) සපශී කොට කොට භඞ්ගය දකී නම්, අප්‍රණිහිතවිහාර නම් වෙයි. රූපාභිනිවෙශය භය විසින් මොනොවට දක්නේ ශූන්‍යත(නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (රූපාභිනිවෙශය නුවණින්) සපශී කොට කොට භඞ්ගය දකී නම්, ශූන්‍යතවිහාර නම් වේ.

රූපනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට නිමිත්තප්‍රතිපක්‍ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්ත සමාපත්ති නම් වෙයි. රූපප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතසමාපත්ති නම් වෙයි. රූපාභිනිවෙශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් ශූන්‍යතසමාපත්ති නම් වේ.

රූපනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (රූපනිමිත්ත නුවණින්) සපශී කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට නිමිත්තප්‍රතිපක්‍ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්තවිහාරසමාපත්ති නම් වෙයි. රූපප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් (රූපප්‍රණිධිය නුවණින්) සපශී කොට කොට භඞ්ගය දකී නම් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතවිහාරසමාපත්ති නම් වෙයි. රූපාභිනිවෙශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් සපශී කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් ශූන්‍යතවිහාරසමාපත්ති නම් වේ.

වේදනානිමිත්තං -පෙ- සඤ්ඤානිමිත්තං -පෙ- සඞ්ඛාරනිමිත්තං -පෙ- විඤ්ඤාණ නිමිත්තං -පෙ- චක්ඛුනිමිත්තං -පෙ- ජරාමරණනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අනිමිත්තො විහාරො. ජරාමරණපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අප්පණිහිතො විහාරො. ජරාමරණාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, සුඤ්ඤතො විහාරො.

ජරාමරණනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා සමාපත්ති. ජරාමරණපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා සමාපත්ති. ජරාමරණාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති සුඤ්ඤතා සමාපත්ති.

ජරාමරණනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති අනිමිත්තා විහාරසමාපත්ති. ජරාමරණපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා විහාරසමාපත්ති. ජරාමරණාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා විහාරසමාපත්ති.

අඤ්ඤො අනිමිත්තො විහාරො, අඤ්ඤො අප්පණිහිතො විහාරො, අඤ්ඤො සුඤ්ඤතො විහාරො. අඤ්ඤා අනිමිත්තා සමාපත්ති, අඤ්ඤා අප්පණිහිතා සමාපත්ති, අඤ්ඤා සුඤ්ඤතා සමාපත්ති. අඤ්ඤා අනිමිත්තා විහාරසමාපත්ති, අඤ්ඤා අප්පණිහිතා විහාරසමාපත්ති, අඤ්ඤා සුඤ්ඤතා විහාරසමාපත්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං, විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං.'

ඤාණත්තයනිද්දෙසො.

වේදනානිමිත්ත ... සංඥානිමිත්ත ... සංස්කාරනිමිත්ත ... විඥානනිමිත්ත ... චක්ඛුනිමිත්ත ... ජරාමරණනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණනිමිත්ත) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, අනිමිත්තවිහාර නම් වෙයි. ජරාමරණප්‍රණිධිය භය-වශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණ ප්‍රණිධිය) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම් අප්‍රණිහිතවිහාර නම් වෙයි. ජරාමරණාභිනිවේශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණාභිනිවේශය) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම් ශූන්‍යතවිහාර නම් වේ.

ජරාමරණනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අනිමිත්ත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්ත සමාපත්ති නම් වෙයි. ජරාමරණප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතසමාපත්ති නම් වෙයි. ජරාමරණාභිනිවේශය භය-වශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් ශූන්‍යතසමාපත්ති නම් වේ.

ජරාමරණනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණනිමිත්ත) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට නිමිත්තප්‍රතිපක්‍ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්තවිහාර-සමාපත්ති නම් වෙයි. ජරාමරණප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණප්‍රණිධිය) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතවිහාරසමාපත්ති නම් වෙයි. ජරාමරණාභිනිවේශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණාභිනි-වේශය) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵල-සමවතට සමවදී නම් ශූන්‍යතවිහාරසමාපත්ති නම් වේ.

අනිමිත්තවිහාරය අනෙකෙක, අප්‍රණිහිතවිහාරය අනෙකෙක, ශූන්‍යත-විහාරය අනෙකෙකි. අනිමිත්තසමාපත්තිය අනෙකක, අප්‍රණිහිතසමා-පත්තිය අනෙකක, ශූන්‍යතසමාපත්තිය අනෙකකි. අනිමිත්තවිහාරසමා-පත්තිය අනෙකක, අප්‍රණිහිතවිහාරසමාපත්තිය අනෙකක, ශූන්‍යත විහාරසමාපත්තිය අනෙකකි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනා-නත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං, විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං'යි**

**ඥානත්‍රයනිර්දේශ යි.**

# 32. ආනන්තරිකසමාධිඤාණං

කථං අවික්ඛෙපපරිසුද්ධත්තා[1] ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං[2] ඤාණං:

නෙක්ඛම්මවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, තස්ස සමාධිස්ස වසෙන උප්පජ්ජති ඤාණං, තෙන ඤාණෙන ආසවා ඛීයන්ති, ඉති පඨමං සමථො, පච්ඡා ඤාණං, තෙන ඤාණෙන ආසවානං ඛයො හොති. තෙන වුච්චති: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං[3] ඤාණං'.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො, භවාසවො, දිට්ඨාසවො අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙතෙ අසවා ඛීයන්ති.

අබ්‍යාපාදවසෙන -පෙ- ආලොකසඤ්ඤාවසෙන -පෙ- අවික්ඛෙපවසෙන -පෙ- ධම්මවවත්ථානවසෙන -පෙ- ඤාණවසෙන -පෙ- පාමොජ්ජවසෙන -පෙ- පඨමජ්ඣානවසෙන -පෙ- දුතියජ්ඣානවසෙන -පෙ- තතියජ්ඣානවසෙන -පෙ- චතුත්ථජ්ඣානවසෙන -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තිවසෙන -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවසෙන -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවසෙන -පෙ- පඨවිකසිණවසෙන -පෙ- ආපොකසිණවසෙන -පෙ- තෙජොකසිණවසෙන -පෙ- වායොකසිණවසෙන -පෙ- නීලකසිණවසෙන -පෙ- පීතකසිණවසෙන -පෙ- ලොහිතකසිණවසෙන -පෙ- ඔදාතකසිණවසෙන -පෙ- ආකාසකසිණවසෙන -පෙ- විඤ්ඤාණකසිණවසෙන -පෙ- බුද්ධානුස්සතිවසෙන -පෙ- ධම්මානුස්සතිවසෙන -පෙ- සඞ්ඝානුස්සතිවසෙන -පෙ- සීලානුස්සතිවසෙන -පෙ- චාගානුස්සතිවසෙන -පෙ- දෙවතානුස්සතිවසෙන -පෙ- ආනාපානසති[4]වසෙන -පෙ- මරණසති[5]වසෙන -පෙ- කායගතාසතිවසෙන -පෙ- උපසමානුස්සතිවසෙන -පෙ- උද්ධුමාතකසඤ්ඤාවසෙන -පෙ- විනීලකසඤ්ඤාවසෙන -පෙ- විපුබ්බකසඤ්ඤාවසෙන -පෙ- විච්ඡිද්දකසඤ්ඤාවසෙන -පෙ- වික්ඛායිතකසඤ්ඤාවසෙන -පෙ-

---

1. පාරිසුද්ධත්තා - සී, 2. සමාධිම්හි - මජ්සං, 3. ආනන්තරියසමාධිස්මිං - සී 1,2.
4. ආනාපානස්සති - PTS 5. මරණස්සති - PTS

# 32. ආනන්තරිකසමාධිඥානය

කිසෙයින් අවික්ෂෙපපරිශුද්ධභාවයෙන් කාමාදි ආශ්‍රවයන්ගේ සමුච්ඡේදයෙහි ප්‍රඥව ආනන්තරික (මාර්ග) සමාධිඥාන වෙයි යත්:

නෛෂ්ක්‍රම්‍යවශයෙන් සිතෙහි එකග බව යයි කියනලද අවික්ෂෙපසමාධිය වෙයි. ඒ සමාධිහුගේ වශයෙන් මාර්ගඥානය (යථාක්‍රමයෙන්) උපදී. ඒ ඥානයෙන් ආස්‍රවයෝ (සමුච්ඡේදවශයෙන්) ක්‍ෂය වෙත්. මෙසේ පූර්වභාගයෙහි ශමථය වෙයි. අපරභාගයෙහි (මාර්ගක්‍ෂණයෙහි) ඥානය වේ. ඒ මාර්ගඥානයෙන් ආස්‍රවයන්ගේ ක්‍ෂය වේ. එයින් කියනු ලැබෙයි: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිසම්ඤාණං'යි.

ආසවා යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

කොතැන්හි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙති යත්: සෝවන්මඟින් අනවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙති.

සෙදගැම්මඟින් ඖදාරික වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා සමග එක්වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙති.

අනැගැම්මඟින් අනවශෙෂ වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. ඒ හා එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙති.

රහත්මඟින් අනවශෙෂ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි අනවශෙෂ වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

අව්‍යාපාදවශයෙන් ... ආලොකසංඥවශයෙන් ... අවික්ෂෙපවශයෙන්... ධම්මවවත්ථානවශයෙන් ... ඥනවශයෙන් ... ප්‍රාමොද්‍යවශයෙන්... ප්‍රථමධ්‍යාන වශයෙන් ... ද්විතීයධ්‍යානවශයෙන් ... තෘතීයධ්‍යානවශයෙන් ... චතුර්ථධ්‍යානවශයෙන් ... ආකාසානඤ්චායතනසමාපත්තිවශයෙන් ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවශයෙන් ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවශයෙන් ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවශයෙන් ... පඨවිකසිණවශයෙන් ... ආපොකසිණ වශයෙන් ... තෙජොකසිණ වශයෙන් ... වායොකසිණ වශයෙන් ... නීලකසිණ වශයෙන් ... පීතකසිණ වශයෙන් ... ලොහිතකසිණ වශයෙන් ඔදාතකසිණ වශයෙන් ... ආකාසකසිණ වශයෙන් ... විඤ්ඤාණකසිණ වශයෙන් ... බුද්ධානුස්සති වශයෙන් ... ධම්මානුස්සති වශයෙන් ... සඞ්ඝානුස්සති වශයෙන් ... සීලානුස්සති වශයෙන් ... චාගානුස්සති වශයෙන්... දෙවතානුස්සති වශයෙන් ... ආනාපානසති වශයෙන් ... මරණසති වශයෙන් ... කායගතාසති වශයෙන් ... උපසමානුස්සති වශයෙන් ... උද්ධුමාතක සංඥ වශයෙන් ... විනීලක සංඥ වශයෙන් ... විපුබ්බක සංඥ වශයෙන් ... විච්ඡිද්දක සංඥ වශයෙන් ... වික්ඛායිතක සංඥ වශයෙන් ...

වික්ඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- හතවික්ඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- ලොහිතකසඤ්ඤාවසෙන -පෙ- පුළුවකසඤ්ඤාවසෙන -පෙ- අට්ඨිකසඤ්ඤාවසෙන -පෙ- දීඝං අස්සාසවසෙන -පෙ- දීඝං පස්සාසවසෙන -පෙ- රස්සං අස්සාසවසෙන -පෙ- රස්සං පස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං පස්සාසවසෙන -පෙ- පීතිපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- පීතිපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- සුඛපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සුඛපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සාසවසෙන -පෙ- චිත්තපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- අභිප්පමොදයං චිත්තං අස්සාසවසෙන -පෙ- අභිප්පමොදයං චිත්තං පස්සාසවසෙන -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං -පෙ- අනිච්චානුපස්සී -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි. තස්ස සමාධිස්ස වසෙන උප්පජ්ජති ඤාණං, තෙන ඤාණෙන ආසවා ඛීයන්ති. ඉති පඨමං සමථො, පච්ඡා ඤාණං, තෙන ඤාණෙන ආසවානං ඛයො හොති. තෙන වුච්චති: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිම්හි ඤාණං'.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො, භවාසවො, දිට්ඨාසවො අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිම්හි ඤාණං'.

ආනන්තරිකසමාධිඤාණනිද්දෙසො.

විකම්පිතත්ත සංඥා වශයෙන් ... හතවිකම්පිතත්ත සංඥා වශයෙන් ... පුලවක සංඥාවශයෙන් ... අට්ඨික සංඥා වශයෙන් ... දීර්ඝ කොට ආශ්වාස කිරීම් වශයෙන් .. දීර්ඝ කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් . හ්‍රස්ව කොට ආශ්වාස කිරීම් වශයෙන්... හ්‍රස්ව කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... සියලු ආශ්වාස ප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... සියලු ආශ්වාස ප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් .. (ඖදාරික වූ ආශ්වාසප්‍රශ්වාස සඞ්ඛ්‍යාත) කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන් ... කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... සුඛය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... සුඛය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... (සංඥාවේදනා සඞ්ඛ්‍යාත) චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... චිත්තසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්තසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... චිත්තය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... චිත්තය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... සිත සතුටු කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... සිත සතුටු කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... (අරමුණෙහි) සිත සම වැ තබමින් ... සිත (නීවරණාදියෙන්) මුදමින් ... අනිත්‍යානුපස්සනා වශයෙන් බලමින් ... විරාගානුපස්සනා වශයෙන් බල-මින් ... නිරොධානුපස්සනා වශයෙන් බලමින් ... ව්‍යුත්ථානගාමිනීවිපස්සනා වශයෙන් බලමින් ආශ්වාස කිරීම් වශයෙන් ... ව්‍යුත්ථානගාමිනීවිපස්සනා වශයෙන් බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තෛකාග්‍රතාව අවික්ෂෙප-සමාධි නම් වෙයි. ඒ සමාධිහුගේ වශයෙන් මාර්ගඥානය උපදී. ඒ ඥානයෙන් ආස්‍රවයෝ ක්‍ෂය වෙත්. මෙසේ පූර්වභාගයෙහි ශමථය වෙයි. අපරභාග-යෙහි ඥානය වෙයි. ඒ ඥානයෙන් ආස්‍රවයන්ගේ ක්‍ෂය වෙයි. එයින් කියනු ලැබෙයි: **'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිම්හි ඤාණං'**යි.

**ආසවා** යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

**කොතැන්හි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත් ද** යත්: සෝවාන්මඟින් අනවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

සෙදගැමිමඟින් ඖදාරික වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

අනාගැමි මඟින් අනවශෙෂ වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

රහත්මඟින් අනවශෙෂ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි. අනවශෙෂ වූ අවිද්‍යා-ස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

ඒ ඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි **"අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිම්හි ඤාණං'** යි.

**ආනන්තරිකසමාධිඥාන නිර්දේශ යි.**

# 33. අරණවිහාරඤාණං

කථං දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං:

**දස්සනාධිපතෙය්‍යන්ති** අනිච්චානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, දුක්ඛානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, අනත්තානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, රූපෙ අනිච්චානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, රූපෙ දුක්ඛානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, රූපෙ අනත්තානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, වෙදනාය –පෙ– සඤ්ඤාය –පෙ– සඞ්ඛාරෙසු –පෙ– විඤ්ඤාණෙ –පෙ– චක්ඛුස්මිං –පෙ– ජරාමරණෙ අනිච්චානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, ජරාමරණෙ දුක්ඛානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, ජරාමරණෙ අනත්තානුපස්සනා දස්සනාධිපතෙය්‍යං.

**සන්තො ච විහාරාධිගමොති** සුඤ්ඤතො විහාරො සන්තො විහාරාධිගමො, අනිමිත්තො විහාරො සන්තො විහාරාධිගමො, අප්පණිහිතො විහාරො සන්තො විහාරාධිගමො.

**පණීතාධිමුත්තතාති** සුඤ්ඤතෙ අධිමුත්තතා පණීතාධිමුත්තතා, අනිමිත්තෙ අධිමුත්තතා පණීතාධිමුත්තතා, අප්පණිහිතෙ අධිමුත්තතා පණීතාධිමුත්තතා.

**අරණවිහාරොති** පඨමං ඣානං[1] අරණවිහාරො, දුතියං ඣානං අරණවිහාරො, තතියං ඣානං අරණවිහාරො, චතුත්ථං ඣානං අරණවිහාරො, ආකාසානඤ්චායතනසමාපත්ති අරණවිහාරො –පෙ– නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති අරණවිහාරො.

**අරණවිහාරොති** කෙනට්ඨෙන අරණවිහාරො: පඨමෙන ඣානෙන[2] නීවරණෙ හරතීති අරණවිහාරො, දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ හරතීති අරණවිහාරො, තතියෙන ඣානෙන පීතිං හරතීති අරණවිහාරො, චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛෙ හරතීති අරණවිහාරො, ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං හරතීති අරණවිහාරො, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤං හරතීති අරණවිහාරො, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං හරතීති අරණවිහාරො, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤං හරතීති අරණවිහාරො. අයං අරණවිහාරො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං'.

**අරණවිහාරඤාණනිද්දෙසො.**

---

1. පඨමජ්ඣානං - මජ්සං. 2 පඨමජ්ඣානෙන - මජ්සං.

## 33. අරණවිහාරඥානය

කිසෙයින් දර්ශනාධිපතිභාවය ද ශාන්තවිහාරාධිගමය ද ප්‍රණීතාදි-මුක්තතා ද යන (ත්‍රිවිධ) ප්‍රඥාව අරණවිහාරඥාන වෙයි යත්:

**දස්සනාධිපතෙය්‍යං** යනු: අනිත්‍යානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. දුඃඛානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. අනාත්මානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. රූපයෙහි අනිත්‍යානුදර්ශනය දස්සනාධි-පතෙය්‍ය නම් වෙයි. රූපයෙහි දුඃඛානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. රූපයෙහි අනාත්මානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිත්‍යානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. ජරාමරණයෙහි දුඃඛානු-දර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. ජරාමරණයෙහි අනාත්මානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වේ.

**සන්තො ච විහාරාධිගමො** යනු: ශූන්‍යතාකාරයෙන් පැවැති අග්‍රඵල-සමාපත්තිය ශාන්තවිහාරාධිගම නම් වෙයි. අනිමිත්තාකාරයෙන් පැවැති අග්‍රඵලසමාපත්තිය ශාන්තවිහාරාධිගම නම් වෙයි. අප්‍රණිහිතාකාරයෙන් පැවැති අග්‍රඵලසමාපත්තිය ශාන්තවිහාරාධිගම නම් වේ.

**පණීතාධිමුත්තතා** යනු: ශූන්‍යතඵලසමාපත්තියෙහි (පූර්වභාගප්‍රඥ වශ-යෙන්) අධිමුක්ත බව ප්‍රණීතාධිමුක්තතා නම් වෙයි. අනිමිත්තඵලසමාපත්ති-යෙහි අධිමුක්ත බව ප්‍රණීතාධිමුක්තතා නම් වෙයි. අප්‍රණිහිතඵලසමාපත්තියෙහි අධිමුක්ත බව ප්‍රණීතාධිමුක්තතා නම් වේ.

**අරණවිහාරො** යනු: (අග්‍රඵලසමාපත්තියට සමවදිනු කැමැත්තහු-ගේ විදර්ශනාවට අරමුණු වූ) ප්‍රථමධ්‍යානසමාපත්තිය අරණවිහාර නම් වෙයි. ද්විතීයධ්‍යාන සමාපත්තිය අරණවිහාර නම් වෙයි. තෘතීයධ්‍යාන-සමාපත්තිය අරණවිහාර නම් වෙයි. චතුර්ථධ්‍යානසමාපත්තිය අරණවිහාර නම් වෙයි. ආකාසානඤ්චායතන සමාපත්තිය අරණවිහාර නම් වෙයි ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය අරණවිහාර නම් වේ.

**අරණවිහාරො** යනු කවර අර්ථයෙකින් අරණවිහාර වේ ද යත්: ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරයන් දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. තෘතියධ්‍යානයෙන් ප්‍රීතිය දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛයන් දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥව ප්‍රතිඝසංඥව නානාත්ව-සංඥව දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. විඤ්ඤාණඤ්චායතන-සමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥව දුරු කෙරේ නු යි අරණ-විහාර නම් වෙයි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සංඥව දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනසමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතනසංඥව දුරු කෙරේ නු යි අරණ-විහාර නම් වෙයි. මේ අරණවිහාර යි.

ඒ අරණවිහාරඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: 'දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධි-ගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං' යි.

**අරණවිහාරඥාන නිර්දේශ යි.**

# 34. නිරොධසමාපත්තිඤාණං

**කථං** ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං **පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතා පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං:**

**ද්වීහි බලෙහීති** ද්වෙ බලානි: සමථබලං, විපස්සනාබලං.

කථං සමථබලං: නෙක්ඛම්මවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, අබ්‍යාපාදවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, ආලොකසඤ්ඤාවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, අවික්ඛෙපවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං.

**සමථබලන්ති** කෙනට්ඨෙන සමථබලං: පඨමෙන ඣානෙන නීවරණෙ න කම්පතීති සමථබලං, දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ න කම්පතීති සමථබලං, තතියෙන ඣානෙන පීතියා න කම්පතීති සමථබලං, චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛෙ න කම්පතීති සමථබලං, ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය න කම්පතීති සමථබලං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, උද්ධච්චෙ ච උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති, න චලති, න වෙධතීති සමථබලං. ඉදං සමථබලං.

කතමං විපස්සනාබලං: අනිච්චානුපස්සනා විපස්සනාබලං, දුක්ඛානුපස්සනා විපස්සනාබලං, අනත්තානුපස්සනා විපස්සනාබලං, නිබ්බිදානුපස්සනා විපස්සනාබලං, විරාගානුපස්සනා විපස්සනාබලං, නිරොධානුපස්සනා විපස්සනාබලං, පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං. රූපෙ අනිච්චානුපස්සනා විපස්සනාබලං -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං.

# 34. නිරොධසමාපත්තිඥානය

කිසෙසිත් (ශමථවිදර්ශනා යන) බල දෙකින් සමන්‍වාගතවන බැවින් (වාචාදි) තුන් සංස්කාරයන්ගේ ද නිරුද්ධ කිරීමෙන් ෂොඩශඥානචර්‍යායෙන් නව සමාධිචර්‍යායෙන් වශීභාවය ඇති ප්‍රඥාව නිරොධසමාපත්තිඥාන වෙයි යත්:

**ද්වීහි බලෙහි** යනු බල දෙකෙකි: ශමථබල යැ විදර්ශනාබල යි.

ශමථබලය කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍ය වශයෙන් චිත්තෛකාග්‍රතා-සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. අව්‍යාපාද වශයෙන් චිත්තෛකා-ග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. ආලොකසංඥා වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. අවික්ෂෙප වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි ... ව්‍යුත්ථානගාමිනීවිපස්සනා වශයෙන් බලමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. ව්‍යුත්ථානගාමිනී විපස්සනා වශයෙන් බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වේ.

**සමථබලං** යනු: කවර අරුතෙකින් ශමථබල වෙයි යත්: ප්‍රථම-ධ්‍යානයෙන් නීවරණයෙහි (නීවරණ නිමිති කොට) නො සැලේ නු යි ශමථබල නම් වෙයි. ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරයෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. චතුර්ථධ්‍යානයෙන් සුඛදුක්ඛයෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥායෙහි ප්‍රතිඝසංඥායෙහි නානාත්වසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතනසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතනසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. ඖද්ධත්‍යයෙහි ද ඖද්ධත්‍ය-සහගතක්ලේශයෙහි ද (ඖද්ධත්‍යසම්ප්‍රයුක්ත) සතර නාමස්කන්ධයෙහි ද කම්පා නො වෙයි නො සැලෙයි නො වෙවුලා නු යි ශමථබල නම්. මේ ශමථබල යි.

**විදර්ශනාබල** කවරෙ යත්: අනිත්‍යානුදර්ශනය විදර්ශනාබල යැ. දුඃඛානු-දර්ශනය විදර්ශනාබල යැ. අනාත්මානුදර්ශනය විදර්ශනාබල යැ. නිර්වේදානුදර්ශනය විදර්ශනාබල යැ. විරාගානුදර්ශනය විදර්ශනාබල යැ. නිරොධානුපස්සනාව විදර්ශනාබල යැ. පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ. රූපයෙහි අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ. වෙදනායෙහි ... සංඥායෙහි සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යි.

**විපස්සනාබලන්ති** කෙනට්ඨෙන විපස්සනාබලං: අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, නිබ්බිදානුපස්සනාය නන්දියා න කම්පතීති විපස්සනාබලං, විරාගානුපස්සනාය රාගෙ න කම්පතීති විපස්සනාබලං, නිරොධානුපස්සනාය සමුදයෙ න කම්පතීති විපස්සනාබලං, පටිනිස්සග්ගානුපස්සනාය ආදානෙ න කම්පතීති විපස්සනාබලං, අවිජ්ජාය ච අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති, න චලති, න වෙධතීති විපස්සනාබලං. ඉදං වුච්චති විපස්සනාබලං.

**තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියොති** කතමෙසං තිණ්ණන්නං සඞ්ඛාරානං පටිප්පස්සද්ධියො: දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා වචීසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්ති, චතුත්ථජ්ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා කායසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්ති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්ති, ඉමෙසං තිණ්ණන්නං සඞ්ඛාරානං පටිප්පස්සද්ධියො.

**සොළසහි ඤාණචරියාහීති** කතමෙහි සොළසහි ඤාණචරියාහි: අනිච්චානුපස්සනා ඤාණචරියා, දුක්ඛානුපස්සනා ඤාණචරියා, අනත්තානුපස්සනා ඤාණචරියා, නිබ්බිදානුපස්සනා ඤාණචරියා, විරාගානුපස්සනා ඤාණචරියා, නිරොධානුපස්සනා ඤාණචරියා, පටිනිස්සග්ගානුපස්සනා ඤාණචරියා, විවට්ටානුපස්සනා ඤාණචරියා, සොතාපත්තිමග්ගො ඤාණචරියා, සොතාපත්තිඵලසමාපත්ති ඤාණචරියා, සකදාගාමිමග්ගො ඤාණචරියා, සකදාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අනාගාමිමග්ගො ඤාණචරියා, අනාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අරහත්තමග්ගො ඤාණචරියා, අරහත්තඵලසමාපත්ති ඤාණචරියා. ඉමෙහි සොළසහි ඤාණචරියාහි.

**නවහි සමාධිචරියාහීති** කතමෙහි නවහි සමාධිචරියාහි: පඨමං ඣානං සමාධිචරියා, දුතියං ඣානං සමාධිචරියා, තතියං ඣානං සමාධිචරියා, චතුත්ථං ඣානං සමාධිචරියා, ආකාසානඤ්චායතනසමාපත්ති -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්ති -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති සමාධිචරියා, පඨමං ඣානං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛං ච චිත්තෙකග්ගතා ච -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛං ච චිත්තෙකග්ගතා ච. ඉමාහි නවහි සමාධිචරියාහි

**විපස්සනාබලං** යනු කවර අරුතෙකින් විදර්ශනාබල නම් වෙයි යත්: අනිච්චානුපස්සනායෙන් නිත්‍යසංඥයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, දුක්ඛානුපස්සනායෙන් සුඛසංඥයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, අනත්තානුපස්සනායෙන් ආත්මසංඥයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, නිබ්බිදනුපස්සනායෙන් තෘෂ්ණායෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, විරාගානුපස්සනායෙන් රාගයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, නිරොධානුපස්සනායෙන් සමුදයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදානයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, අවිද්‍යායෙහි ද අවිද්‍යාසහගත කෙලශයෙහි ද සතර නාමස්කන්ධයෙහි ද කම්පා නො වෙයි, නො සැලෙයි, නො වෙව්ලා නු යි විදර්ශනාබල යි. මේ විදර්ශනා බල නම් වේ.

**තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා** යනු: කවර තුන් සංස්කාරයන්ගේ සන්හිඳීමෙනැ යත්: ද්විතීයධ්‍යානයට සමවත්හුගේ විතර්කවිචාර සඞ්ඛ්‍යාත වාක්සංස්කාරයෝ ද සන්හිඳුනාහු වෙති. චතුර්ථධ්‍යානයට සමවත්හුගේ ආශ්වාස ප්‍රශ්වාස සඞ්ඛ්‍යාත කායසංස්කාරයෝ සන්හිඳුනාහු වෙති. සංඥවෙදයිතනිරොධසමාපත්තියට සමවත්හුගේ සංඥව ද වෙදනාව ද යන චිත්තසංස්කාරයෝ සන්හිඳුනාහු වෙත්. මේ තුන් සංස්කාරයන්ගේ සන්හිඳීමෙයි.

**සොළසහි ඤාණචරියාහි** යනු: කවර සොළොස් ඥානචර්‍යායෙන යත්: අනිච්චානුපස්සනාව ඥානචර්‍යා යැ, දුක්ඛානුපස්සනාව ඥානචර්‍යා යැ, අනත්තානුපස්සනාව ඥානචර්‍යා යැ, නිබ්බිදනුපස්සනාව ඥානචර්‍යා යැ, විරාගානුපස්සනාව ඥානචර්‍යා යැ, නිරොධානුපස්සනාව ඥානචර්‍යා යැ, පටිනිස්සග්ගානුපස්සනාව ඥානචර්‍යා යැ, විවට්ටානුපස්සනාව ඥානචර්‍යා යැ, ස්‍රොතාපත්තිමාර්ගය ඥානචර්‍යා යැ, ස්‍රොතාපත්තිඵලසමාපත්තිය ඥානචර්‍යා යැ, සකෘදාගාමිමාර්ගය ඥානචර්‍යා යැ, සකෘදාගාමිඵලසමාපත්තිය ඥානචර්‍යා යැ, අනාගාමිමාර්ගය ඥානචර්‍යා යැ, අනාගාමිඵලසමාපත්තිය ඥානචර්‍යා යැ, අර්හත්මාර්ගය ඥානචර්‍යා යැ, අර්හත්ඵලසමාපත්තිය ඥානචර්‍යා යි. මේ සොළොස් ඥානචර්‍යායෙනි.

**නවහි සමාධිචරියාහි** යනු: කවර නව සමාධිචර්‍යායෙනැ යත්: ප්‍රථමධ්‍යානය සමාධිචර්‍යා යැ, ද්විතීයධ්‍යානය සමාධිචර්‍යා යැ, තෘතීයධ්‍යානය සමාධිචර්‍යා යැ, චතුර්ථධ්‍යානය සමාධිචර්‍යා යැ, ආකාසානඤ්චායතනසමාපත්තිය ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය සමාධිචර්‍යා යැ. ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෙකාග්‍රතාව ද ... නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෙකාග්‍රතාව ද, (සමාධිචර්‍යා යි.) මේ නව සමාධිචර්‍යායෙනි.

**වසීති** පඤ්ච වසියො: ආවජ්ජන[1] වසී, සමාපජ්ජනවසී, අධිට්ඨානවසී, වුට්ඨානවසී, පච්චවෙක්ඛන[2]වසී.

පඨමං ඣානං යත්ථිච්ඡකං[3] යදිච්ඡකං යාවතිච්ඡකං ආවජ්ජති, ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති ආවජ්ජනවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති, සමාපජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති සමාපජ්ජනවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං අධිට්ඨාති. අධිට්ඨානෙ දන්ධායිතත්තං නත්ථීති අධිට්ඨානා වසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං වුට්ඨාති, වුට්ඨානෙ දන්ධායිතත්තං නත්ථීති වුට්ඨානවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං පච්චවෙක්ඛති, පච්චවෙක්ඛනාය දන්ධායිතත්තං නත්ථීති පච්චවෙක්ඛනවසී.

දුතියං ඣානං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං ආවජ්ජති, ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති ආවජ්ජනවසී, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති -පෙ- අධිට්ඨාති -පෙ- වුට්ඨාති -පෙ- පච්චවෙක්ඛති, පච්චවෙක්ඛනාය දන්ධායිතත්තං නත්ථීති පච්චවෙක්ඛනවසී. ඉමා පඤ්චවසියො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතා පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං'.

**නිරොධසමාපත්තිඤාණනිද්දෙසො.**

## 35. පරිනිබ්බානඤාණං

**කථං සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං:**

ඉධ සම්පජානො නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පවත්තං පරියාදියති, අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස පවත්තං පරියාදියති, ආලොකසඤ්ඤාය ථීනමිද්ධස්ස පවත්තං පරියාදියති, අවික්ඛෙපෙන උද්ධච්චස්ස පවත්තං පරියාදියති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය -පෙ- ඤාණෙන අවිජ්ජාය -පෙ- පාමොජ්ජෙන අරතියා -පෙ- පඨමෙන ඣානෙන නීවරණානං පවත්තං පරියාදියති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පවත්තං පරියාදියති.

1. ආවජ්ජනා . . . සමාපජ්ජනා - PTS, 2. පච්චවෙක්ඛණා - මජසං, සී 1, PTS
3 යථිච්ඡකං - PTS,

**වසී** යනු: පඤ්චවශීහු යැ: ආවර්ජනවශී යැ සමාපජ්ජනවශී යැ අධිෂ්ඨානවශී යැ ව්‍යුත්ථානවශී යැ ප්‍රත්‍යවේක්‍ෂණවශී යයි.

ප්‍රථමධ්‍යානය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද ඒ තාක් ආවර්ජන කෙරේ නම් මනොද්වාරාවර්ජනයෙහි අවශයෙහි පවත්නා (දන්ධායිත) බවෙක් නැත් නු යි ආවජ්ජන වසී නම. ප්‍රථමධ්‍යානය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් සමවදී නම් සමවැදීමෙහි දන්ධායිත බවෙක් නැත් නු යි සමාපජ්ජනවසී නම. ප්‍රථමධ්‍යානය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද ඒ තාක් අධිෂ්ඨාන කෙරේ නම් අධිෂ්ඨානයෙහි දන්ධායිත බවෙක් නැත් නු යි අධිට්ඨානවසී නම. ප්‍රථමධ්‍යානයෙන් යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් නැඟීසිටී නම් නැඟීසිටීමෙහි දන්ධායිත බවෙක් නැත් නු යි වුට්ඨානවසී නම. ප්‍රථමධ්‍යානයෙන් නැඟී යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද ඒ තාක් ප්‍රත්‍යවේක්‍ෂා කෙරේ නම් ප්‍රත්‍යවේක්‍ෂායෙහි දන්ධායිත බවෙක් නැත් නු යි පච්චවෙක්ඛනා වසී නම්.

ද්විතීයධ්‍යානය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය යම් යම් තැනෙකැ කැමැති වේ ද, යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් ආවජ්නා කෙරේ නම් ආවජ්නායෙහි දන්ධායිත බවෙක් නැත් නු යි ආවජ්ජන වසී නම. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් සමවදී නම් ... අධිෂ්ඨාන කෙරේ නම් ... නැඟීසිටී නම් ... ප්‍රත්‍යවේක්‍ෂා කෙරේ නම් ප්‍රත්‍යවේක්‍ෂායෙහි දන්ධායිත බවෙක් නැත් නු යි පච්චවෙක්ඛන වසී නම. මොහු පඤ්චවශීහු යැ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතාපඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං'** යි.

**නිරොධසමාපත්තිඥානනිර්දේශ යි.**

## 35. පරිනිර්වාණඥානය

කිසෙයින් සම්‍යග්ඥාන ඇත්තහු ගේ කෙලශ-ස්කන්ධප්‍රවෘත්ති ක්‍ෂය කිරීමෙහි ප්‍රඥාව පරිනිර්වාණඥාන වෙයි යත්:

මෙ සස්නෙහි සම්‍යග්ඥාන ඇත්තේ නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ (අනුශය වශයෙන්) පැවැත්ම ක්‍ෂය කෙරෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ පැවැත්ම ක්‍ෂය කෙරෙයි. ආලෝක සංඥායෙන් ථිනමිද්ධයාගේ පැවැත්ම ක්‍ෂය කෙරෙයි. අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යයාගේ පැවැත්ම ක්‍ෂය කෙරෙයි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාවගේ ... ඥානයෙන් අවිද්‍යාවගේ ... ප්‍රාමොද්‍යයෙන් අරතියගේ ... ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ පැවැත්ම ක්‍ෂය කෙරෙයි .. අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන්ගේ පැවැත්ම ක්‍ෂය කෙරේ.

අථවා පන සම්පජානස්ස අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්තස්ස ඉදඤ්චෙව චක්ඛුපවත්තං[1] පරියාදියති, අඤ්ඤඤ්ච චක්ඛුපවත්තං න උප්පජ්ජති, ඉදඤ්චෙව සොතපවත්තං -පෙ- ඝානපවත්තං -පෙ- ජිව්හාපවත්තං -පෙ- කායපවත්තං -පෙ- මනොපවත්තං පරියාදියති, අඤ්ඤඤ්ච මනොපවත්තං න උප්පජ්ජති, ඉදං සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං'.

**පරිනිබ්බානඤාණනිද්දෙසො.**

## 36. සමසීසට්ඨඤාණං

කථං සබ්බධම්මානං සම්මාසමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං:

**සබ්බධම්මානන්ති**: පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරසධාතුයො, කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා, කාමාවචරා ධම්මා, රූපාවචරා ධම්මා, අරූපාවචරා ධම්මා, අපරියාපන්නා ධම්මා.

**සම්මාසමුච්ඡෙදෙති**: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සම්මා සමුච්ඡින්දති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං සම්මා සමුච්ඡින්දති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං සම්මා සමුච්ඡින්දති, අවික්ඛෙපෙන උද්ධච්චං සම්මා සමුච්ඡින්දති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං සම්මා සමුච්ඡින්දති, ඤාණෙන අවිජ්ජං සම්මා සමුච්ඡින්දති, පාමොජ්ජෙන අරතිං සම්මා සමුච්ඡින්දති, පඨමෙන ඣානෙන නීවරණෙ සම්මා සමුච්ඡින්දති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සම්මා සමුච්ඡින්දති.

**නිරොධෙති**: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං නිරොධෙති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං නිරොධෙති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං නිරොධෙති, අවික්ඛෙපෙන උද්ධච්චං නිරොධෙති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං නිරොධෙති, ඤාණෙන අවිජ්ජං නිරොධෙති, පාමොජ්ජෙන අරතිං නිරොධෙති, පඨමෙන ඣානෙන නීවරණෙ නිරොධෙති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ නිරොධෙති.

**අනුපට්ඨානතාති**: නෙක්ඛම්මං පටිලද්ධස්ස කාමච්ඡන්දො න උපට්ඨාති, අබ්‍යාපාදං පටිලද්ධස්ස බ්‍යාපාදො න උපට්ඨාති, ආලොකසඤ්ඤං පටිලද්ධස්ස ථිනමිද්ධං න උපට්ඨාති, අවික්ඛෙපං පටිලද්ධස්ස උද්ධච්චං න උපට්ඨාති, ධම්මවවත්ථානං පටිලද්ධස්ස විචිකිච්ඡා න උපට්ඨාති, ඤාණං පටිලද්ධස්ස අවිජ්ජා න උපට්ඨාති, පාමොජ්ජං පටිලද්ධස්ස අරති න උපට්ඨාති, පඨමං ඣානං පටිලද්ධස්ස නීවරණා න උපට්ඨහන්ති[2] -පෙ- අරහත්තමග්ගං පටිලද්ධස්ස සබ්බකිලෙසා න උපට්ඨහන්ති.[3]

1. චක්ඛුඤ්ච පවත්තං - සී 1, 2,
2. නීවරණා න උප්පජ්ජන්ති - සී 2. උපට්ඨන්ති - PTS, ස්‍යා
3. සබ්බකිලෙසා න උප්පජ්ජන්ති - සී 1, උප්පජ්ජන්ති - සී 2, උපට්ඨන්ති - PTS, ස්‍යා

නොහොත් සම්‍යග්ඥාන ඇති අනුපාදිශෙෂනිර්වාණධාතුයෙන් පිරිනිවෙන්නහුගේ මේ චක්ෂුෂ්ප්‍රවෘත්තිය ද ක්‍ෂය වෙයි. අන්‍ය වූ ද චක්ෂුෂ්ප්‍රවෘත්තියෙක් නූපදී. මේ ශ්‍රොත්‍රප්‍රවෘත්තිය ද ... ඝ්‍රාණප්‍රවෘත්තිය ... ජිහ්වාප්‍රවෘත්තිය ... කායප්‍රවෘත්තිය ... මනඃප්‍රවෘත්තිය ක්‍ෂය වෙයි. අන්‍ය වූ ද මනඃප්‍රවෘත්තියෙක් නූපදී. මේ සම්‍යග්ඥාන ඇත්තහුගේ කෙලශසකන්ධප්‍රවෘත්ති ක්‍ෂය කිරීමෙහි ප්‍රඥාව පරිනිර්වාණඥාන නම් වේ.

ඒ පරිනිර්වාණඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං'** යි.

**පරිනිර්වාණඥානනිර්දේශ යි.**

## 36. සමශීර්ෂාර්ථඥානය

කිසෙයින් සියලු ත්‍රෛභූමකධර්මයන් මොනොවට නිරුද්ධ කිරීමෙහි ද නිරුද්ධ කල කල්හි නැවැත නො ඉපදීමෙහි ද ප්‍රඥාව සමශීර්ෂාර්ථඥාන වෙයි යත්:

**සබ්බධම්මානං** යනු: පඤ්චසකන්ධ යැ දොළොස් ආයතනයෝ යැ අටළොස් ධාතු යැ කුශලධර්මයෝ යැ අකුශලධර්මයෝ යැ අව්‍යාකෘතධර්මයෝ යැ කාමාවචරධර්මයෝ යැ රූපාවචරධර්මයෝ යැ අරූපාවචරධර්මයෝ යැ අපර්‍යාපන්නධර්මයෝ යි.

**සම්මාසමුච්ඡෙදෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය (විෂ්කම්භණවශයෙන්) මොනොවට සිඳියි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය මොනොවට සිඳියි. ආලොකසංඥයෙන් ස්ත්‍යානමිද්ධය මොනොවට සිඳියි. අවික්‍ෂෙපයෙන් ඖද්ධත්‍යය මොනොවට සිඳියි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව (තදඞ්ගවශයෙන්) මොනොවට සිඳියි. (මාර්ග) ඥානයෙන් අවිද්‍යාව (සමුච්ඡෙදවශයෙන්) මොනොවට සිඳියි. ප්‍රාමොද්‍යයෙන් අරතිය මොනොවට සිඳියි. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් (විෂ්කම්භණ වශයෙන්) මොනොවට සිඳියි. ... අර්හත්මාර්ගයෙන් සියලු කෙලශයන් (සමුච්ඡෙදවශයෙන්) මොනොවට සිඳී.

**නිරොධෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කෙරෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නිරුද්ධ කෙරෙයි. ආලොකසංඥයෙන් ස්ත්‍යානමිද්ධය නිරුද්ධ කෙරෙයි. අවික්‍ෂෙපයෙන් ඖද්ධත්‍යය නිරුද්ධ කෙරෙයි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව නිරුද්ධ කෙරෙයි. ඥානයෙන් අවිද්‍යාව නිරුද්ධ කෙරෙයි. ප්‍රාමොද්‍යයෙන් අරතිය නිරුද්ධ කෙරෙයි. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් නිරුද්ධ කෙරෙයි ... අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන් නිරුද්ධ කෙරේ.

**අනුපට්ඨානතා** යනු: නෛෂ්ක්‍රම්‍යය ලද්දහුට කාමච්ඡන්දය නූපදියි. අව්‍යාපාදය ලද්දහුට ව්‍යාපාදය නූපදියි. ආලොකසංඥාව ලද්දහුට ස්ත්‍යානමිද්ධය නූපදියි. අවික්‍ෂෙපය ලද්දහුට ඖද්ධත්‍යය නූපදියි. ධර්මනිශ්චය ලද්දහුට විචිකිත්සාව නූපදියි. ඥානය ලද්දහුට අවිද්‍යාව නූපදියි. ප්‍රාමොද්‍යය ලද්දහුට අරතිය නූපදියි. ප්‍රථමධ්‍යානය ලද්දහුට නීවරණයෝ නූපදිති ... අර්හත්මාර්ගය ලද්දහුට සියලු කෙලශයෝ නූපදිත්

**සමන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං සමං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො සමං, ථීනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤා සමං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපො සමං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානං සමං, අවිජ්ජාය පහීනත්තා ඤාණං සමං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො සමං.

**සීසන්ති** තෙරස සීසානි: පලිබොධසීසඤ්ච තණ්හා, විනිබන්ධනසීසඤ්ච[1] මානො, පරාමාසසීසඤ්ච දිට්ඨි, වික්ඛෙපසීසඤ්ච උද්ධච්චං, කිලෙසසීසඤ්ච[2] අවිජ්ජා, අධිමොක්ඛසීසඤ්ච සද්ධා, පග්ගහසීසඤ්ච විරියං, උපට්ඨානසීසඤ්ච සති, අවික්ඛෙපසීසඤ්ච සමාධි, දස්සනසීසඤ්ච පඤ්ඤා, පවත්තසීසඤ්ච ජීවිතින්ද්‍රියං, ගොචරසීසඤ්ච විමොක්ඛො, සඞ්ඛාරසීසඤ්ච නිරොධො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'සබ්බධම්මානං සම්මා සමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං'.

**සමසීසට්ඨඤාණනිද්දෙසො.**

## 37. සල්ලෙඛට්ඨඤාණං

කථං පුථුනානත්තෙකත්තතෙජපරියාදනෙ[3] පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං:

**පුථූති** රාගො පුථු, දොසො පුථු, මොහො පුථු, කොධො -පෙ- උපනාහො -පෙ- මක්ඛො -පෙ- පළාසො -පෙ- ඉස්සා -පෙ- මච්ඡරියං -පෙ- මායා -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භො -පෙ- සාරම්භො -පෙ- මානො -පෙ- අතිමානො -පෙ- මදො -පෙ- පමාදො -පෙ- සබ්බෙ කිලෙසා -පෙ- සබ්බෙ දුච්චරිතා -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරා -පෙ- සබ්බෙ භවගාමී කම්මා පුථු.

**නානත්තෙකත්තන්ති** කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං එකත්තං. බ්‍යාපාදො නානත්තං, අබ්‍යාපාදො එකත්තං. ථීනමිද්ධං නානත්තං, ආලොකසඤ්ඤා එකත්තං. උද්ධච්චං නානත්තං, අවික්ඛෙපො එකත්තං. විචිකිච්ඡා නානත්තං, ධම්මවවත්ථානං එකත්තං. අවිජ්ජා නානත්තං, ඤාණං එකත්තං. අරති නානත්තං, පාමොජ්ජං එකත්තං. නීවරණා නානත්තං, පඨමං ඣානං එකත්තං -පෙ- සබ්බෙ කිලෙසා නානත්තං, අරහත්තමග්ගො එකත්තං.

**තෙජොති** පඤ්ච තෙජා: චරණතෙජො, ගුණතෙජො, පඤ්ඤාතෙජො, පුඤ්ඤතෙජො, ධම්මතෙජො, චරණතෙජෙන තෙජිතත්තා දුස්සීල්‍යතෙජං පරියාදියති, ගුණතෙජෙන තෙජිතත්තා අගුණතෙජං පරියාදියති, පඤ්ඤාතෙජෙන තෙජිතත්තා දුප්පඤ්ඤතෙජං පරියාදියති, පුඤ්ඤතෙජෙන තෙජිතත්තා අපුඤ්ඤතෙජං පරියාදියති, ධම්මතෙජෙන තෙජිතත්තා අධම්මතෙජං පරියාදියති.

1 බන්ධනසීසඤ්ච - ස්‍යා, සී  2 සංකිලෙසසීසඤ්ච - මජ්ඣං
3. පුථුනානතෙජ . - කත්ථචි

**සමං** යනු: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යය සම යැ ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදය සම යැ ස්ත්‍යානමිද්ධය ප්‍රහීණ බැවින් ආලොකසංඥාව සම යැ ඖද්ධත්‍යය ප්‍රහීණ බැවින් අවික්ෂෙපය සම යැ විචිකිත්සාව ප්‍රහීණ බැවින් ධර්මනිශ්චය සම යැ අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥානය සම යැ අරතිය ප්‍රහීණ බැවින් ප්‍රාමොද්‍යය සම යැ නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යානය සම යැ ... සියලු කෙලෙසුන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගය සම යි.

**සීසං** යනු: තෙළෙස් ශීර්ෂ කෙනෙක් වෙති: තෘෂ්ණාව පරිබොධශීර්ෂ ද මානය විනිබන්ධශීර්ෂ ද දෘෂ්ටිය පරාමර්ශශීර්ෂ ද ඖද්ධත්‍යය වික්ෂෙපශීර්ෂ ද අවිද්‍යාව ක්ලෙශශීර්ෂ ද ශ්‍රද්ධාව අධිමොක්ෂශීර්ෂ ද වීර්‍ය්‍යය ප්‍රග්‍රහශීර්ෂ ද ස්මෘතිය උපස්ථානශීර්ෂ ද සමාධිය අවික්ෂෙපශීර්ෂ ද ප්‍රඥාව දර්ශනශීර්ෂ ද ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්තිශීර්ෂ ද විමොක්ෂය ගොචරශීර්ෂ ද නිරොධය සංස්කාරශීර්ෂ ද වේ.

ඒ සමශීර්ෂඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි එයින් කියනු ලැබෙයි: **‘සබ්බධම්මානං සම්මාසමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං.’** යි.

**සමශීර්ෂාර්ථඥාන නිර්දේශ** යි.

## 37. සංලෙඛාර්ථඥානය

කිසෙයින් පෘථග්රාගාදීන් ද නානාස්වභාව වූ කාමච්ඡන්දාදීන් ද එක-ස්වභාව වූ නෛෂ්ක්‍රම්‍යාදීන් ද තෙජස් සඞ්ඛ්‍යාත දුශ්ශීල්‍යාදීන් ද ක්ෂය කිරීමෙහි ප්‍රඥාව සංලෙඛාර්ථඥාන වෙයි යත්:

**පුථු** යනු: රාගය (ලොකොත්තරයෙන්) අසම්මිශ්‍ර යැ ද්වෙෂය අසම්මිශ්‍ර යැ මොහය අසම්මිශ්‍ර යැ ක්‍රොධය .. බද්ධවෛරය ... ගුණමකු බව ... යුගග්‍රාහය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්‍ය්‍ය ... මායාව ... සඨ බව ... සිත ඉදිමුණු බව ... කරණොත්තරියකරණය ... මානය ... අතිමානය ... මදය .. ප්‍රමාදය ... සියලු ක්ලෙශයෝ ... සියලු දුශ්චරිතයෝ ... සියලු අභිසංස්කාරයෝ ... සියලු භවගාමිකර්මයෝ අසම්මිශ්‍රයෝ යි.

**නානත්තෙකත්තං** යනු: කාමච්ඡන්දය නානාස්වභාව යැ නෛෂ්ක්‍රම්‍යය එකස්වභාව යැ ව්‍යාපාදය නානාස්වභාව යැ අව්‍යාපාදය එකස්වභාව යැ ස්ත්‍යානමිද්ධය නානාස්වභාව යැ ආලොකසංඥාව එකස්වභාව යැ ඖද්ධත්‍යය නානාස්වභාව යැ අවික්ෂෙපය එකස්වභාව යැ විචිකිත්සාව නානාස්වභාව යැ ධර්මනිශ්චය එකස්වභාව යැ අවිද්‍යාව නානාස්වභාව යැ ඥානය එකස්වභාව යැ අරතිය නානාස්වභාව යැ ප්‍රාමොද්‍යය එකස්වභාව යැ නීවරණයෝ නානාස්වභාව යැ ප්‍රථමධ්‍යානය එකස්වභාව යැ ... සියලු ක්ලෙශයෝ නානාස්වභාව යැ අර්හත්මාර්ගය එකස්වභාව යි.

**තෙජො** යනු: තෙජස් පසෙකි: ශීල සඞ්ඛ්‍යාත චරණතෙජස යැ සමාධි සඞ්ඛ්‍යාත ගුණතෙජස යැ විදර්ශනා සඞ්ඛ්‍යාත ප්‍රඥාතෙජස යැ ආර්‍ය්‍යමාර්ගකුශල සඞ්ඛ්‍යාත පුණ්‍යතෙජස යැ බුද්ධවචනසඞ්ඛ්‍යාත ධර්ම-තෙජස යි. ශීලතෙජසින් තියුණු කළ බැවින් දුශ්ශීලභාව සඞ්ඛ්‍යාත තෙජස ක්ෂය කෙරෙයි. සමාධිතෙජසින් තියුණු කළ බැවින් වික්ෂෙප සඞ්ඛ්‍යාත අගුණතෙජස ක්ෂය කෙරෙයි. විදර්ශනාතෙජසින් තියුණු කළ බැවින් මොහතෙජස ක්ෂය කෙරෙයි. ආර්‍ය්‍යමාර්ග කුශලතෙජසින් තියුණු කළ බැවින් අකුශලකර්මතෙජස ක්ෂය කෙරෙයි. ධර්මතෙජසින් තියුණු කළ බැවින් නානාතීර්ථකසමයවචන සඞ්ඛ්‍යාත අධර්මතෙජස ක්ෂය කෙරේ.

**සල්ලෙඛොති** කාමච්ඡන්දො අසල්ලෙඛො, නෙක්ඛම්මං සල්ලෙඛො, බ්‍යාපාදො අසල්ලෙඛො, අබ්‍යාපාදො සල්ලෙඛො, ථීනමිද්ධං අසල්ලෙඛො, ආලොකසඤ්ඤා සල්ලෙඛො, උද්ධච්චං අසල්ලෙඛො, අවික්ඛෙපො සල්ලෙඛො, විචිකිච්ඡා අසල්ලෙඛො, ධම්මවවත්ථානං සල්ලෙඛො, අවිජ්ජා අසල්ලෙඛො, ඤාණං සල්ලෙඛො, අරති අසල්ලෙඛො, පාමොජ්ජං සල්ලෙඛො, නීවරණා අසල්ලෙඛො, පඨමං ඣානං සල්ලෙඛො -පෙ- සබ්බෙ කිලෙසා අසල්ලෙඛො, අරහත්තමග්ගො සල්ලෙඛො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'පුථුනානත්තතෙජපරියාදනෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං'.

**සල්ලෙඛට්ඨඤාණනිද්දෙසො.**

## 38 විරියාරම්භඤාණං

කථං අසල්ලීනත්තපහිතත්තපග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං:

අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං.

අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස අනුප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, අනුප්පන්නස්ස නෙක්ඛම්මස්ස උප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නස්ස නෙක්ඛම්මස්ස ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං -පෙ- අනුප්පන්නානං සබ්බකිලෙසානං අනුප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නානං සබ්බකිලෙසානං පහානාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, අනුප්පන්නස්ස අරහත්තමග්ගස්ස උප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං. උප්පන්නස්ස අරහත්තමග්ගස්ස ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අසල්ලීනත්තපහිතත්තපග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං'.

**විරියාරම්භඤාණනිද්දෙසො.**

**සල්ලෙඛො** යනු: කාමච්ඡන්දය අසල්ලේඛ යැ. නෛෂ්ක්‍රම්‍යය සල්ලේඛ යැ. ව්‍යාපාදය අසල්ලේඛ යැ. අව්‍යාපාදය සල්ලේඛ යැ. ස්ත්‍යානමිද්ධය අසල්ලේඛ යැ. ආලෝකසංඥාව සල්ලේඛ යැ. ඖද්ධත්‍යය අසල්ලේඛ යැ. අවික්ෂේපය සල්ලේඛ යැ. විචිකිත්සාව අසල්ලේඛ යැ. ධර්මනිශ්චය සල්ලේඛ යැ. අවිද්‍යාව අසල්ලේඛ යැ. ඥානය සල්ලේඛ යැ. අරතිය අසල්ලේඛ යැ. ප්‍රාමෝද්‍යය සල්ලේඛ යැ. නීවරණයෝ අසල්ලේඛ යැ. ප්‍රථමධ්‍යානය සල්ලේඛ යැ. සියලු කෙලෙසයෝ අසල්ලේඛ යැ. අර්හත්මාර්ගය සල්ලේඛ යි.

ඒ සල්ලේඛඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'පුථුනානත්තෙකත්තතෙජපරියාදානෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං'** යි.

**සංලේඛාර්ථඥානනිර්දේශ යි.**

## 38. වීර්‍ය්‍යාරම්භඥානය

හීනසිත් නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන වෙයි යත්:

නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. උපන් ලාමක අකුශලධර්මයන් දුරුකරනු පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. නූපන් කුශලධර්මයන් උපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. උපන් කුශලධර්මයන් සිටුනා පිණිස නො නස්නා පිණිස පුනපුනා උපදනා පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූරණය පිණිස නො හැකුළුණුසිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යි.

නූපන් කාමච්ඡන්දය නූපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. උපන් කාමච්ඡන්දය දුරු කරනු පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. නූපන් නෛෂ්ක්‍රම්‍යය උපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. උපන් නෛෂ්ක්‍රම්‍යය සිටුනා පිණිස නො නස්නා පිණිස පුනපුනා උපදනා පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූරණය පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. නූපන් සියලු කෙලෙසුන් නූපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. උපන් සියලු කෙලෙසුන් දුරු කරනු පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. නූපන් අර්හත්මාර්ගය උපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යැ. උපන් අර්හත්මාර්ගය (සම්පත්ති-ක්ෂණයෙහි) සිටුනා පිණිස නො නස්නා පිණිස බහුලභාවය පිණිස විපුල-බව පිණිස වැඩීම පිණිස පරිපූරණය පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍ය්‍යාරම්භඥාන යි.

ඒ වීර්‍ය්‍යාරම්භඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'අසල්ලීනත්තපහිතත්තපග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං'** යි.

**වීර්‍ය්‍යාරම්භඥානනිර්දේශ යි.**

## 39. අත්ථසන්දස්සනඤාණං

කථං නානාධම්මපකාසනතා පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං:

**නානාධම්මාති** පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරස ධාතුයො, කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා, කාමාවචරා ධම්මා, රූපාවචරා ධම්මා, අරූපාවචරා ධම්මා, අපරියාපන්නා ධම්මා.

**පකාසනතාති** රූපං අනිච්චතො පකාසෙති, රූපං දුක්ඛතො පකාසෙති, රූපං අනත්තතො පකාසෙති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො පකාසෙති, ජරාමරණං දුක්ඛතො පකාසෙති, ජරාමරණං අනත්තතො පකාසෙති.

**අත්ථසන්දස්සනෙති** කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මත්ථං සන්දස්සෙති, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදත්ථං සන්දස්සෙති, ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤත්ථං සන්දස්සෙති, උද්ධච්චං පජහන්තො අවික්ඛෙපත්ථං සන්දස්සෙති, විචිකිච්ඡං පජහන්තො ධම්මවවත්ථානත්ථං සන්දස්සෙති, අවිජ්ජං පජහන්තො ඤාණත්ථං සන්දස්සෙති, අරතිං පජහන්තො පාමොජ්ජත්ථං සන්දස්සෙති, නීවරණෙ පජහන්තො පඨමජ්ඣානත්ථං සන්දස්සෙති -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගත්ථං සන්දස්සෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'නානාධම්මපකාසනතා පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං'.

**අත්ථසන්දස්සනඤාණනිද්දෙසො.**

## 40. දස්සනවිසුද්ධිඤාණං

කථං සබ්බධම්මානං එකසඞ්ගහතා[1]නානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සනවිසුද්ධිඤාණං:

**සබ්බධම්මානන්ති** පඤ්චක්ඛන්ධා -පෙ- අපරියාපන්නා ධම්මා.

**එකසඞ්ගහතාති**[1] ද්වාදසහි ආකාරෙහි සබ්බෙ ධම්මා[2] එකසඞ්ගහිතා තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන අභිජානනට්ඨෙන පරිජානනට්ඨෙන ධම්මට්ඨෙන ධාතුට්ඨෙන[3] ඤාතට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵුසනට්ඨෙන අභිසමයට්ඨෙන ඉමෙහි ද්වාදසහි ආකාරෙහි සබ්බෙ ධම්මා එකසඞ්ගහිතා.

---

1. එකසඞ්ගහිතා සී, 1, 2   2 සබ්බධම්මා - සී 1, 2.
3 ධාතට්ඨෙන - ස්‍යා

## 39. අර්ථසන්දර්ශනඥානය

කිසෙයින් නානාධර්මයන් ප්‍රකාශ කරන ප්‍රඥාව අර්ථසන්දර්ශනඥාන වෙයි යත්:

**නානාධම්මා** යනු: පඤ්චස්කන්ධයෝ යැ දොළොස් ආයතනයෝ යැ අටළොස් ධාතූහු යැ කුශලධර්මයෝ යැ අකුශලධර්මයෝ යැ අව්‍යාකෘත ධර්මයෝ යැ කාමාවචරධර්මයෝ යැ රූපාවචරධර්මයෝ යැ අරූපාවචර ධර්මයෝ යැ අපර්‍යාපන්නධර්මයෝ යි.

**පකාසනතා** යනු රූපය අනිත්‍ය විසින් ප්‍රකාශ කෙරෙයි. රූපය දුඃඛ විසින් ප්‍රකාශ කෙරෙයි. රූපය අනාත්ම විසින් ප්‍රකාශ කෙරෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය විසින් ප්‍රකාශ කෙරෙයි. ජරාමරණය දුඃඛ විසින් ප්‍රකාශ කෙරෙයි. ජරාමරණය අනාත්ම විසින් ප්‍රකාශ කෙරේ.

**අත්ථසන්දස්සනෙ** යනු: කාමච්ඡන්දය දුරු කරවනුයේ නෛෂ්ක්‍රම්‍යාර්ථය (ශ්‍රොතෘන්ට) මොනොවට දක්වයි. ව්‍යාපාදය දුරු කරවනුයේ අව්‍යාපාදාර්ථය මොනොවට දක්වයි. ස්ත්‍යානමිද්ධය දුරු කරවනුයේ ආලොකසංඥාර්ථය මොනොවට දක්වයි. ඖද්ධත්‍යය දුරු කරවනුයේ අවික්ෂෙපාර්ථය මොනොවට දක්වයි. විචිකිත්සාව දුරු කරනුවයේ ධර්මනිශ්චයාර්ථය මොනොවට දක්වයි. අවිද්‍යාව දුරු කරවනුයේ ඥානාර්ථය මොනොවට දක්වයි. අරතිය දුරු කරවනුයේ ප්‍රාමොද්‍යාර්ථය මොනොවට දක්වයි. නීවරණයන් දුරු කරවනුයේ ප්‍රථමධ්‍යානාර්ථය මොනොවට දක්වයි. ... සියලු කෙලෙසුන් දුරු කරවනුයේ අර්හත්මාර්ගාර්ථය මොනොවට දක්වයි.

ඒ අර්ථසන්දර්ශනඥානය ඥානාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: '**නානාධම්මපකාසනතා පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං**' යි.

**අර්ථසන්දර්ශනඥානනිර්දේශ යි.**

## 40. දර්ශනවිශුද්ධිඥානය

කිසෙයින් සියලු සංඛතාසංඛතධර්මයන් ගේ එකසංග්‍රහත්වය ද කාමච්ඡන්දාදීන් ගේ නානාත්වය ද නෛෂ්ක්‍රම්‍යාදීන් ගේ එකත්වය ද ප්‍රතිවෙධ කිරීමෙහි ප්‍රඥාව දර්ශනවිශුද්ධි ඥාන වෙයි යත්:

**සබ්බධම්මානං** යනු: පඤ්චස්කන්ධයෝ යැ ... අපර්‍යාපන්නධර්මයෝ යි.

**එකසඞ්ගහතා** යනු: දොළොස් අයුරෙකින් සියලු සංඛතාසංඛතධර්මයෝ එකසංඛ්‍යායෙන් පිරිසිඳුනාලදහ: විද්‍යමානස්වභාවයෙනැ අනාත්මස්වභාවයෙනැ සත්‍යස්වභාවයෙනැ ප්‍රතිවෙධ කළයුතු ස්වභාවයෙනැ අභිජානනස්වභාවයෙනැ පරිජානනස්වභාවයෙනැ (ස්වභාවධාරණාදි) ධර්මාර්ථයෙනැ (නිජ්ජීවතාදි) ධාතුස්වභාවයෙනැ දතහැකි ස්වභාවයෙනැ සාක්ෂාත්කර්තව්‍යස්වභාවයෙනැ ස්පර්ශ කළයුතු ස්වභාවයෙනැ අභිසමයස්වභාවයෙනි. මේ දොළොස් අයුරින් සියලු සංඛතාසංඛතධර්මයෝ එක සංඛ්‍යායෙන් පිරිසිඳුනාලදහ.

**නානත්තෙකත්තන්ති** කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං එකත්තං, -පෙ- සබ්බකිලෙසා නානත්තං, අරහත්තමග්ගො එකත්තං

**පටිවෙධෙති** දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති.

**දස්සනවිසුද්ධීති** සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, සොතාපත්තිඵලක්ඛණෙ දස්සනං විසුද්ධං, සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, සකදාගාමිඵලක්ඛණෙ දස්සනං විසුද්ධං, අනාගාමිමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, අනාගාමිඵලක්ඛණෙ දස්සනං විසුද්ධං, අරහත්තමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, අරහත්තඵලක්ඛණෙ දස්සනං විසුද්ධං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'සබ්බධම්මානං එකසඞ්ගහතානානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සනවිසුද්ධි ඤාණං'.

**දස්සනවිසුද්ධිඤාණනිද්දෙසො.**

## 41. ඛන්තිඤාණං

**කථං විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං:**

රූපං අනිච්චතො විදිතං, රූපං දුක්ඛතො විදිතං, රූපං අනත්තතො විදිතං, යං යං විදිතං තං තං ඛමතීති විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො විදිතං, ජරාමරණං දුක්ඛතො විදිතං, ජරාමරණං අනත්තතො විදිතං, යං යං විදිතං තං තං ඛමතීති විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං'.

**ඛන්තිඤාණනිද්දෙසො**

**නානත්තෙකත්තං** යනු: කාමච්ඡන්දය නානාත්ව යැ නෛෂ්ක්‍රම්‍යය එකත්ව යැ ... සියලු කෙලශයෝ නානාත්ව යැ රහත්මග එකත්ව යි.

**පටිවෙධෙ** යනු: දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. මාර්ගසත්‍යය භාවනාප්‍රති-වෙධයෙන් ප්‍රතිවෙධ කෙරේ.

**දස්සනවිසුද්ධි** යනු: ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි (ඥාන) දර්ශනය විශුද්ධ වෙයි. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි ඥානදර්ශනය විශුද්ධ වූයේ වෙයි. සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වෙයි. සකෘදාගාමිඵලක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වූයේ වෙයි. අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වෙයි. අනාගාමිඵලක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වූයේ වෙයි. අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වෙයි. අර්හත්ඵලක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වූයේ වේ.

ඒ දර්ශනවිශුද්ධිඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'සබ්බධම්මානං එකසඞ්ගහතානානත්තෙකත්ත-පටිවෙධෙ පඤ්ඤා දස්සනවිසුද්ධිඤාණං'** යි.

**දර්ශනවිශුද්ධිඥානනිර්දේශ යි.**

## 41. ඛන්තිඥානය

කිසෙයින් (රූපස්කන්ධාදිය අනිත්‍යාදිවශයෙන්) විදිතභාවයෙන් පැවැති ප්‍රඥාව ක්ෂාන්තිඥාන වෙයි යත්:

රූපය අනිත්‍ය විසින් (අනිත්‍යානුදර්ශනයෙන්) දන්නාලද යැ. රූපය දුඃඛ විසින් (දුඃඛානුදර්ශනයෙන්) දන්නාලද යැ. රූපය අනාත්ම විසින් (අනාත්මානුදර්ශනයෙන්) දන්නාලද යැ. යම් යම් රූපයෙක් (අනිත්‍යාදි විසින්) දන්නාලද ද ඒ ඒ (රූපය අනිත්‍යාදි විසින්) රිසි වේ නු යි විදිත-භාවයෙන් පැවැති ප්‍රඥාව ක්ෂාන්තිඥාන නම් වෙයි. වෙදනාව ... සංඥාව-සංස්කාරයෝ - විඥානය - චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය විසින් දන්නාලද යැ. ජරාමරණය දුඃඛ විසින් දන්නාලද යැ. ජරාමරණය අනාත්ම විසින් දන්නාලද යැ. යම් යම් ජරාමරණයෙක් (අනිත්‍යාදි විසින්) දන්නාලද ද ඒ ඒ ජරාමරණය (අනිත්‍යාදි විසින්) රිසි වේ නු යි විදිතභාවයෙන් පැවැති ප්‍රඥාව ක්ෂාන්තිඥාන නම් වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං'** යි.

**ක්ෂාන්තිඥානනිර්දේශ යි.**

## 42. පරියොගාහනඤාණං

කථං ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං:

රූපං අනිච්චතො ඵුසති, රූපං දුක්ඛතො ඵුසති, රූපං අනත්තතො ඵුසති, යං යං ඵුසති තං තං පරියොගාහතීති ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො ඵුසති, ජරාමරණං දුක්ඛතො ඵුසති, ජරාමරණං අනත්තතො ඵුසති, යං යං ඵුසති තං තං පරියොගාහතීති ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං'.

**පරියොගාහනඤාණනිද්දෙසො**

## 43. පදෙසවිහාරඤාණං

කථං සමොදහනෙ[1] පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං:

මිච්ඡාදිට්ඨිපච්චයාපි වෙදයිතං, මිච්ඡාදිට්ඨිවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිවූපසමපච්චයාපි වෙදයිතං, මිච්ඡාසඞ්කප්පපච්චයාපි වෙදයිතං, මිච්ඡාසඞ්කප්පවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාසඞ්කප්පපච්චයාපි වෙදයිතං, සම්මාසඞ්කප්පවූපසමපච්චයාපි වෙදයිතං, -පෙ- මිච්ඡාවිමුත්තිපච්චයාපි වෙදයිතං, මිච්ඡාවිමුත්තිවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාවිමුත්තිපච්චයාපි වෙදයිතං, සම්මාවිමුත්තිවූපසමපච්චයාපි වෙදයිතං, ඡන්දපච්චයාපි වෙදයිතං, ඡන්දවූපසමපච්චයාපි වෙදයිතං, විතක්කපච්චයාපි වෙදයිතං, විතක්කවූපසමපච්චයාපි වෙදයිතං, සඤ්ඤාපච්චයාපි වෙදයිතං, සඤ්ඤාවූපසමපච්චයාපි වෙදයිතං.

ඡන්දො ච අවූපසන්තො හොති, විතක්කො ච අවූපසන්තො හොති, සඤ්ඤා ච අවූපසන්තා[2] හොති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කො ච අවූපසන්තො හොති, සඤ්ඤා ච අවූපසන්තා හොති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කො ච වූපසන්තො හොති, සඤ්ඤා ච අවූපසන්තා හොති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කො ච වූපසන්තො හොති, සඤ්ඤා ච වූපසන්තා හොති, තප්පච්චයාපි වෙදයිතං, අප්පත්තස්ස පත්තියා අත්ථි ආසවං[3] තස්මිම්පි ඨානෙ අනුප්පත්තෙ තප්පච්චයාපි වෙදයිතං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'සමොදහනෙ[1] පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං.'

**පදෙසවිහාරඤාණනිද්දෙසො.**

---

1 සමොධහනෙ PTS.
2 අවූපසන්තා - සී. 1, 2, PTS.
3 ආසාවං - සු, ආසවං - මජසං, ස,

## 42. පර්‍යොගාහණඥානය

කිසෙයින් (රූපස්කන්ධාදිය අනිත්‍යාදිවශයෙන් ඥානස්පර්ශයෙන්) ස්පර්ශ කළ බැවින් පැවැති ප්‍රඥාව පර්‍යොගාහණඥාන වෙයි යත්:

රූපය අනිත්‍යවශයෙන් (විදර්ශනාඥානස්පර්ශයෙන්) ස්පර්ශ කෙරෙයි. රූපය දුඃඛවශයෙන් ස්පර්ශ කෙරෙයි. රූපය අනාත්මවශයෙන් ස්පර්ශ කෙරෙයි. යම් යම් රූපයක් (අනිත්‍යාදිවශයෙන්) ස්පර්ශ කෙරේ ද ඒ ඒ රූපයට (අනිත්‍යාදිවශයෙන්) පිවිසේ නු යි ස්පර්ශ කළ බැවින් පැවැති ප්‍රඥාව පර්‍යොගාහණ ඥාන නම් වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහණෙ ඤාණං'** යි.

**පර්‍යොගාහණඥානනිර්දේශ යි.**

## 43. ප්‍රදේශවිහාරඥානය

කිසෙයින් (ස්කන්ධාදීන්ගේ එකදෙශ වූ වෙදනාධර්මය) පිඬු කරන ප්‍රඥාව ප්‍රදෙශවිහාරඥාන වෙයි යත්:

මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. මිථ්‍යාදෘෂ්ටිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සම්‍යග්දෘෂ්ටිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. මිථ්‍යාසඞ්කල්පප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. මිථ්‍යාසඞ්කල්පය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සම්‍යක්සඞ්කල්පප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සම්‍යක්සඞ්කල්පය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. ... මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. මිථ්‍යාවිමුක්තිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සම්‍යග්විමුක්තිප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සම්‍යග්විමුක්තිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි: ලොභප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. ලොභය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. විතර්කප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. විතර්කය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සංඥාප්‍රත්‍යයෙනුදු වෙදයිතය වෙයි. සංඥාව සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වෙදයිතය වේ.

ඉදින් ඡන්දය (ලොභය) ද නො සන්හිඳුණේ වේ නම් විතර්කය ද නො සන්හිඳුණේ වේ නම් සංඥාව ද නො සන්හිඳුණේ වේ නම් එකරුණෙනුදු වෙදයිතය වෙයි. ඡන්දය සන්හිඳුණේ වේ නම් විතර්කය ද නො සන්හිඳුණේ වේ නම් සංඥාව ද නො සන්හිඳුණේ වේ නම් එකරුණෙනුදු වෙදයිතය වෙයි. ඡන්දය ද ව්‍යුපශාන්ත වේ නම් විතර්කය ද ව්‍යුපශාන්ත වේ නම් සංඥාව අව්‍යුපශාන්ත වේ නම් එකරුණෙනුදු වෙදයිතය වෙයි. ඡන්දය ද ව්‍යුපශාන්ත වේ නම් විතර්කය ද ව්‍යුපශාන්ත වේ නම් සංඥාව ද ව්‍යුපශාන්ත වේ නම් එකරුණෙනුදු වෙදයිතය වෙයි. නො පත් රහත්ඵලයට පැමිණෙනු පිණිස වියර්‍යයෙක් ඇති, එ (රහත්ඵලයට) කරුණු වූ ආර්‍යමාර්ගය පැමිණි කල්හි එකරුණෙනුදු වෙදයිතය වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'සමොදහනෙ පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං'** යි.

**ප්‍රදෙශවිහාරඥානනිර්දේශ යි.**

# 44-49, විවට්ටඤාණඡක්කං.

## (44 සඤ්ඤාවිවට්ටඤාණං)

කථං අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං:

නෙක්ඛම්මාධිපතත්තා[1] පඤ්ඤා කාමච්ඡන්දතො සඤ්ඤාය විවට්ටතීති[2] අධිපතත්තා[3] පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ[4] ඤාණං, අබ්‍යාපාදධිපතත්තා පඤ්ඤා බ්‍යාපාදතො සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, ආලොකසඤ්ඤාධිපතත්තා පඤ්ඤා ථිනමිද්ධතො සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, අවික්ඛෙපාධිපතත්තා පඤ්ඤා උද්ධච්චතො සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, ධම්මවවත්ථානාධිපතත්තා පඤ්ඤා විචිකිච්ඡාය සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, ඤාණාධිපතත්තා පඤ්ඤා අවිජ්ජාය සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, පාමොජ්ජාධිපතත්තා පඤ්ඤා අරතියා සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, පඨමජ්ඣානාධිපතත්තා පඤ්ඤා නීවරණෙහි සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤා විවට්ටෙ ඤාණං -පෙ- අරහත්තමග්ගත්තා පඤ්ඤා සබ්බකිලෙසෙහි සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤා විවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං'.

## (45. චෙතොවිවට්ටඤාණං)

කථං නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං:

කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං[5] එකත්තං, නෙක්ඛම්මෙකත්තං චෙතයතො කාමච්ඡන්දතො චිත්තං විවට්ටතීති[2] නානත්තෙ පඤ්ඤා-චෙතොවිවට්ටෙ ඤාණං. බ්‍යාපාදො නානත්තං, අබ්‍යාපාදො එකත්තං, අබ්‍යාපාදෙකත්තං චෙතයතො බ්‍යාපාදතො චිත්තං විවට්ටතීති නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං. ථිනමිද්ධං නානත්තං, අලොකසඤ්ඤා එකත්තං, ආලොකසඤ්ඤෙකත්තං චෙතයතො ථිනමිද්ධතො චිත්තං විවට්ටතීති නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං -පෙ- සබ්බකිලෙසා නානත්තං,[6] අරහත්තමග්ගො එකත්තං, අරහත්තමග්ගෙකත්තං චෙතයතො සබ්බකිලෙසෙහි චිත්තං විවට්ටතීති නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං'.

---

1 නෙක්ඛම්මාධිපවත්තා - ස. 2 විවත්තතීති - සී 1,2
3. අධිපවත්තා - ස. 4 සඤ්ඤාවිවත්තෙ - සී 1, 2,
5 නික්ඛම්මං - සී 1, 2 6. නානත්තෙ - සී 2.

# 44-49. විවර්තඥානෂට්කය

## (44. සඤ්ඤාවිවට්ටඤාණය)

කිසෙයින් (නෛෂ්ක්‍රම්‍යාදිය) අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥා-විවර්තඥාන වෙයි යත්:

නෛෂ්ක්‍රම්‍යය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන කාමච්ඡන්දයෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. අව්‍යාපාදය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන ව්‍යාපාදයෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. ආලොකසංඥාව අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන ථිනමිද්ධයෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. අවික්ෂෙපය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන ඖද්ධත්‍යයෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. ධර්ම-නිශ්චය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන විචිකිත්සායෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. ඥානය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥා-සම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන අවිද්‍යායෙන් පෙරළේ නු යි අධික-භාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. ප්‍රාමොද්‍යය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන අරති-යෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. ප්‍රථමධ්‍යානය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන නීවරණයන් කෙරෙන් පෙරළේ නු යි අධිකභාව-යෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වෙයි. ... අර්හත්මාර්ගය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන සියලු කෙලෙසුන් කෙරෙන් පෙරළේ නු යි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන නම් වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං'** යි.

## (45. චෙතොවිවට්ටඤාණය)

කිසෙයින් නානා ස්වභාවයෙහි පැවැති ප්‍රඥාව චෙතොවිවර්තඥාන වෙයි යත්:

කාමච්ඡන්දය නානාස්වභාව යැ නෛෂ්ක්‍රම්‍යය එක ස්වභාව යැ (කාමච්ඡන්දයෙහි ආදීනව දැක්මෙන්) නෛෂ්ක්‍රම්‍යයාගේ එකස්වභාවය සිතන්නහුට (නෛෂ්ක්‍රම්‍යක්ෂණයෙහි) කාමච්ඡන්දයෙන් සිත පරාවර්තනය වේ නු යි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවර්තඥාන වෙයි. ව්‍යාපාදය නානා ස්වභාව යැ අව්‍යාපාදය එක ස්වභාව යැ (ව්‍යාපාදයාගේ ආදීනව දැක්මෙන්) අව්‍යාපාදයාගේ එකත්වය සිතන්නහුට ව්‍යාපාදයෙන් සිත පරාවර්තනය වේ නු යි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවර්තඥාන වෙයි. ථිනමිද්ධය නානා ස්වභාව යැ ආලොකසංඥාව එකස්වභාව යැ (ථිනමිද්ධයාගේ ආදීනව දැක්මෙන්) ආලොකසංඥාවගේ එකත්වය සිතන්නහුට ථිනමිද්ධයෙන් සිත පරාවර්තනය වේ නු යි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවර්තඥාන වෙයි. සියලු කෙලෙශයෝ නානාස්වභාව යැ අර්හත්මාර්ගය එකස්වභාව යැ (සියලු කෙලෙසුන්ගේ ආදීනව දැක්මෙන්) අර්හත්මාර්ගයාගේ එකත්වය සිතන්නහුට සියලු කෙලෙසුන් කෙරෙන් සිත පරාවර්තනය වේ නු යි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවර්තඥාන වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං'** යි.

(46. චිත්තවිවට්ටඤාණං)

කථං අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං:

කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං. බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං. ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං. -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං'.

(47. ඤාණවිවට්ටඤාණං)

කථං සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං:

චක්ඛුං සුඤ්ඤං[1] අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වාති යථාභූතං ජානතො[2] පස්සතො චක්ඛාභිනිවෙසතො[3] ඤාණං විවට්ටතීති සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං. 'සොතං සුඤ්ඤං -පෙ- ඝානං සුඤ්ඤං -පෙ- ජිව්හා සුඤ්ඤා -පෙ- කායො සුඤ්ඤො -පෙ- මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා'ති යථාභූතං ජානතො[2] පස්සතො මනාභිනිවෙසතො[3] ඤාණං විවට්ටතීති සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං'.

(48. විමොක්ඛවිවට්ටඤාණං)

කථං වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං:

නෙක්ඛම්මෙන කාමච්ඡන්දං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං වොස්සජ්ජතී'ති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, අවික්ඛෙපෙන උද්ධච්චං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං'

1 චක්ඛු සුඤ්ඤං - මජසං, ස 2. පජානතො - සතා.

3 පස්සතො චක්ඛාභිනිවෙසතො - සතා

## (46 චිත්තවිවර්තඥානය)

කිසෙයින් (නෛෂ්ක්‍රම්‍යාදි වශයෙන්) සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන වෙයි යත්:

කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍යයාගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ. ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාදයාගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ ථිනමිද්ධය දුරු කරනුයේ ආලොකසංඥාවගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ. ... සියලු කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගයාගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං'** යි.

## (47. ඥානවිවර්තඥානය)

කිසෙයින් ශූන්‍යත (අනාත්මානුදර්ශන) ප්‍රඥාව ඥානවිවර්තඥාන වෙයි යත්:

චක්ෂුස ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාමස්වභාව හෙයින් හෝ ශූන්‍ය යැ යි යථාස්වභාවයෙන් දන්නාහට දක්නාහට චක්ෂුසෙහි බැස-ගැනීමෙන් ඥානය පෙරළේ නු යි ශූන්‍යත ප්‍රඥාව ඥානවිවර්තඥාන වෙයි. ශ්‍රොත්‍රය ශූන්‍ය යැ ඝ්‍රාණය ශූන්‍ය යැ .. ජිහ්වාව ශූන්‍ය යැ ... කය ශූන්‍ය යැ ... මනස ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාමධර්ම හෙයින් හෝ ශූන්‍ය යැ යි යථාස්වභාවයෙන් දන්නාහට දක්නාහට මනසෙහි බැසැගැනිමෙන් ඥානය පෙරළේ නු යි ශූන්‍යතප්‍රඥාව ඥානවිවර්තඥාන වේ

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං'** යි.

## (48. විමොක්ෂවිවර්තඥානය)

කිසෙයින් (කාමච්ඡන්දාදිය) දුරලීමෙහි පැවැති ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි යත්:

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය හැරපියා නු යි. හැරපී-මෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. ආලොකසංඥයෙන් ථිනමිද්ධය හැරපියා නු යි. හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. අවික්ෂෙප-යෙන් ඖද්ධත්‍යය හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. ධර්මනිශ්වයෙන් විචිකිත්සාව හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂ-විවර්තඥාන වෙයි ... අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන් හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං'** යි.

## (49. සච්චවිවට්ටඤාණං)

කථං තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං:

දුක්ඛස්ස පීළනට්ඨං සඞ්ඛතට්ඨං සන්තාපට්ඨං විපරිණාමට්ඨං පරිජානන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං, සමුදයස්ස ආයූහනට්ඨං නිදානට්ඨං සඤ්ඤොගට්ඨං පලිබොධට්ඨං පජහන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං, නිරොධස්ස නිස්සරණට්ඨං විවෙකට්ඨං අසඞ්ඛතට්ඨං අමතට්ඨං සච්ඡිකරොන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං, මග්ගස්ස නිය්‍යානට්ඨං හෙතුට්ඨං[1] දස්සනට්ඨං ආධිපතෙය්‍යට්ඨං භාවෙන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං.

සඤ්ඤාවිවට්ටො,[2] චෙතොවිවට්ටො, චිත්තවිවට්ටො, ඤාණවිවට්ටො, විමොක්ඛවිවට්ටො, සච්චවිවට්ටො. සඤ්ජානන්තො විවට්ටතීති සඤ්ඤාවිවට්ටො, චෙතයන්තො විවට්ටතීති චෙතොවිවට්ටො විජානන්තො විවට්ටතීති චිත්තවිවට්ටො, ඤාණං කරොන්තො විවට්ටතීති ඤාණවිවට්ටො, වොස්සජ්ජන්තො විවට්ටතීති විමොක්ඛවිවට්ටො, තථට්ඨෙ විවට්ටතීති සච්චවිවට්ටො.

යත්ථ සඤ්ඤාවිවට්ටො තත්ථ චෙතොවිවට්ටො. යත්ථ චෙතොවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො තත්ථ චිත්තවිවට්ටො, යත්ථ චිත්තවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො තත්ථ ඤාණවිවට්ටො, යත්ථ ඤාණවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො තත්ථ විමොක්ඛවිවට්ටො, යත්ථ විමොක්ඛවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො තත්ථ සච්චවිවට්ටො, යත්ථ සච්චවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං.'

**විවට්ටඤාණඡක්කනිද්දෙසො.**

---

1 හෙතට්ඨං - සයා

2. සඤ්ඤාවිවත්තතා (පුබ්බාදි) - සී 1, 2.

## (49. සත්‍යාවිවට්ටඥානය)

කිසෙයින් (චතුසසත්‍යයන්ගේ) අවිපරීතසවභාවයෙහි පැවැති ප්‍රඥාව සත්‍යවිවට්ටඥාන වෙයි යත්:

දුඃඛයාගේ පීඩනසවභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ කරන ලද සවභාවය සන්තාපසවභාවය පෙරළෙන සවභාවය දකිමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතසවභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවට්ටඥාන වෙයි. සමුදයාගේ දුක් රැස් කරන සවභාවය දුකට කරුණු වන සවභාවය සංයොග (යොදන) සවභාවය වළකන සවභාවය දකිමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීත-සවභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවට්ටඥාන වෙයි. නිරොධයාගේ සසරින් පහවූ සවභාවය සියලු සංසකාරයන් කෙරෙන් ශූන්‍ය සවභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ නො කරන ලද සවභාවය අමරණ සවභාවය සාක්ෂාත් කෙරෙමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතසවභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවට්ටඥාන වෙයි. මාර්ගයාගේ නිර්යාණසවභාවය හෙතු සවභාවය දර්ශනසවභාවය සම්ප්‍රයුක්තයන් තමා වශයෙහි පවත්වන සවභාවය වඩමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතසවභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවට්ටඥාන වේ

සංඥාවිවට්ට යැ චෙතොවිවට්ට යැ චිත්තවිවට්ට යැ ඥානවිවට්ට යැ විමොක්ෂවිවට්ට යැ සත්‍යවිවට්ට යි. (නෛෂ්ක්‍රම්‍යාදිය අධිපතිභාවයෙන්) හැඳිනගනිමින් (කාමච්ඡන්දාදියෙන්) පරාවර්තනය කෙරේ නු යි සංඥාවිවට්ට නම. (නෛෂ්ක්‍රම්‍යාදිය) සිතමින් (කාමච්ඡන්දාදියෙන්) පරාවර්තනය කෙරේ නු යි චෙතොවිවට්ට නම. (නෛෂ්ක්‍රම්‍යාදිවශයෙන්) දැනගන්මින් (කාමච්ඡන්දාදියෙන්) පරාවර්තනය කෙරේ නු යි චිත්තවිවට්ට නම. (ආධ්‍යාත්මිකායතන ශූන්‍යත හෙයින්) අවබොධ කෙරෙමින් (දෘෂ්ට්‍යභිනිවෙශයෙන්) පරාවර්තනය කෙරේ නු යි ඥානවිවට්ට නම. (නෛෂ්ක්‍රම්‍ය-කාමච්ඡන්දාදිය) දුරලමින් (කාමච්ඡන්දයෙන්) පරාවර්තනය කෙරේ නු යි විමොක්ෂවිවට්ට නම. යථාසවභාවයෙහි (දුභතොවුට්ඨාන වශයෙන්) පරාවර්තනය කෙරේ නු යි සත්‍යවිවට්ට නමි.

යම් තැනෙක සංඥාවිවට්ටය වේ ද එහි චෙතොවිවට්ටය වෙයි. යම් තැනෙක චෙතොවිවට්ටය වේ ද එහි සංඥාවිවට්ටය වෙයි. යම් තැනෙක සංඥාවිවට්ටය චෙතොවිවට්ටය වෙත්ද එහි චිත්තවිවට්ටය වෙයි. යම් තැනෙක චිත්තවිවට්ටය වේ ද එහි සංඥාවිවට්ට චෙතොවිවට්ට වෙති. යම් තැනෙක සංඥාවිවට්ට චෙතොවිවට්ට චිත්තවිවට්ට වෙත් ද එහි ඥානවිවට්ටය වෙයි. යම් තැනෙක ඥානවිවට්ටය වේ ද එහි සංඥාවිවට්ට චෙතොවිවට්ට චිත්තවිවට්ට වෙති. යම් තැනෙක සංඥාවිවට්ට චෙතොවිවට්ට චිත්තවිවට්ට ඥානවිවට්ට වෙත් ද එහි විමොක්ෂවිවට්ටය වෙයි. යම් තැනෙක විමොක්ෂවිවට්ටය වේ ද එහි සංඥාවිවට්ට චෙතොවිවට්ට චිත්තවිවට්ට ඥානවිවට්ට වෙති. යම් තැනෙක සංඥාවිවට්ට චෙතොවිවට්ට චිත්තවිවට්ට ඥානවිවට්ට විමොක්ෂවිවට්ට වෙත් ද එහි සත්‍යවිවට්ටය වෙයි. යම් තැනෙක සත්‍යවිවට්ටය වේ ද එහි සංඥාවිවට්ට චෙතොවිවට්ට චිත්තවිවට්ට ඥානවිවට්ට විමොක්ෂවිවට්ට වෙත්.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'තථට්ඨෙ සඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං'යි

**විවට්ටඥානනිර්දේශ යි.**

## 50. ඉද්ධිවිධඤාණං

කථං කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං කායම්පි චිත්තෙ සමොදහති, චිත්තම්පි කායෙ සමොදහති, කායවසෙන චිත්තං පරිනාමෙති, චිත්තවසෙන කායං පරිනාමෙති, කායවසෙන චිත්තං අධිට්ඨාති, චිත්තවසෙන කායං අධිට්ඨාති, කායවසෙන චිත්තං පරිනාමෙත්වා, චිත්තවසෙන කායං පරිනාමෙත්වා, කායවසෙන චිත්තං අධිට්ඨහිත්වා, චිත්තවසෙන කායං අධිට්ඨහිත්වා, සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ ඔක්කමිත්වා විහරති. සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන ඉද්ධිවිධඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි[1] උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති[2] සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවං-මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨාන-වසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං'.

ඉද්ධිවිධඤාණනිද්දෙසො.

---

1. පඨවියාපි - මජසං, චඞ්කමති - සයා,

# 50. ඍද්ධිවිධඥානය

කිසෙයින් රූපකාය ද පාදකධ්‍යානචිත්තය ද (පරිකර්මචිත්තයෙන්) එක් කොට තැබීමෙන් සුඛසංඥව ද ලඝුසංඥව ද අධිෂ්ඨානවශයෙන් සමෘද්ධ වන ප්‍රඥව ඍද්ධිවිධඥන වෙයි යත්:

මෙසස්නෙහි මහණ තෙම ඡන්දය අධික කොට ඇති සමාධිය හා ප්‍රධන් වීර්‍ය්‍යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධික කොට ඇති සමාධිය ... චිත්තය අධික කොට ඇති සමාධිය ... වීමංසාව අධික කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩයි දමනය කෙරෙයි. මෘදු වූ (එහෙයින් මැ) කර්මණ්‍ය වූවක් කෙරෙයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩා දමනය කොට මෘදුවූවක් කර්මණ්‍ය වූවක් කොට (තමාගේ) කරජකාය ද පාදකධ්‍යාන-චිත්තයෙහි ප්‍රවේශ කෙරෙයි. පාදකධ්‍යානචිත්තය ද (තමාගේ) කරජ-කායයෙහි ප්‍රවේශ කෙරෙයි. කායවශයෙන් සිත පිරිනමයි. චිත්තවශයෙන් කාය පිරිනමයි. කායවශයෙන් චිත්තය අධිෂ්ඨාන කෙරෙයි. චිත්තවශ-යෙන් කාය අධිෂ්ඨාන කෙරෙයි. කායවශයෙන් සිත පිරිනමා චිත්ත වශයෙන් කාය පිරිනමා කායවශයෙන් චිත්තය අධිෂ්ඨාන කොට චිත්ත-වශයෙන් කාය අධිෂ්ඨාන කොට සුඛසංඥව ද ලඝුසංඥව ද කරජකායෙහි ප්‍රවේශ කොට වාසය කෙරෙයි. හෙතෙම එසෙයින් වඩනලද පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් ඍද්ධිවිධඥනය ලැබීම පිණිස (පරිකර්ම) සිත එළවයි. නැඹුරු කෙරෙයි.

හෙතෙම අනෙක ප්‍රකාර වූ ඍද්ධිකොට්ඨාසය ස්පර්ශ කෙරේ: එකෙක් මැ බහුප්‍රකාර වෙයි. බහුප්‍රකාර වී එකෙක් වෙයි. ප්‍රකට බවට ප්‍රතිච්ඡන්න බවට ගෙබිත්තින් ඔබට පවුරින් ඔබට පව්වෙන් ඔබට අහස්හි සෙයින් නො ලැගෙමින් යෙයි පොළොව්හි දු දියෙහි සෙයින් ගැලීම් නැගීම් කෙරෙයි. නො බිඳෙන දියෙහි දු පොළොව්හි සෙයින් යෙයි. අහස්හි දු පියා ඇති ලිහිණියකු සෙයින් පලගින් යෙයි. මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ද අත්තලින් පරාමර්ශ කෙරෙයි. පිරිමදියි. බඹලොව දක්වාත් වශයෙහි පවත්වයි.

එය ඥතාර්ථයෙන් ඥන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහු-සඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං'**සි.

**ඍද්ධිවිධඥානනිර්දේශ සි.**

# 51. සොතධාතුවිසුද්ධිඤාණං

කථං විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්තසද්දනිමිත්තානං පරියොගාහනෙ පඤ්ඤා සොතධාතුවිසුද්ධිඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි -පෙ- විරියසමාධි -පෙ- චිත්ත සමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං, දූරෙපි සද්දානං[1] සද්දනිමිත්තං මනසි කාරොති, සන්තිකෙපි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, ඔළාරිකානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, සුඛුමානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, සණ්හසණ්හානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පුරත්ථිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පච්ඡිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, උත්තරායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, දක්ඛිණායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පුරත්ථිමායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පච්ඡිමායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, උත්තරායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, දක්ඛිණායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, හෙට්ඨිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, උපරිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන සොතධාතු[2] විසුද්ධිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[3] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ ච සන්තිකෙ ච.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්තසද්දනිමිත්තානං පරියොගාහනෙ පඤ්ඤා සොතධාතුවිසුද්ධිඤාණං'.

**සොතධාතුවිසුද්ධිඤාණනිද්දෙසො**

# 52. චෙතොපරියඤාණං

කථං තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියාපරියොගාහනෙ පඤ්ඤා චෙතොපරියඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි -පෙ- විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු භාවිතෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං එවං ජානාති:[4] 'ඉදං රූපං සොමනස්සින්ද්‍රියසමුට්ඨිතං, ඉදං රූපං දොමනස්සින්ද්‍රියසමුට්ඨිතං, ඉදං රූපං උපෙක්ඛින්ද්‍රියසමුට්ඨිත'න්ති.

---

1. සන්තානං - සී. 1 2. සොතධාතුයා - ස්‍යා
3. අතික්කන්තමානුසකාය - ස 4. පජානාති - මජසං, PTS

# 51 ශ්‍රොත්‍රධාතුවිශුද්ධිඥානය

කිසෙයිත් විතර්කවිෂ්ඵාරවශයෙන් නානාත්ව වූ ද එකත්ව වූ ද ශබ්ද-නිමිත්තයන්ට බැසගැනීමෙහි ප්‍රඥාව ශ්‍රොත්‍රධාතු විශුද්ධිඥාන වෙයි යත්:

මෙ සස්නෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධිය .. වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධිය ... චිත්තය අධිපති කොට ඇති සමාධිය ... වීමංසාව අධිපති කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. හේ මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුන පුනා වඩයි, දමනය කෙරෙයි, මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කෙරෙයි. හේ මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුන පුනා වඩා දමනය කොට මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට දුර වූ ද ශබ්දයන් ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. ළඟ වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. ඖදාරික වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. සූක්‍ෂම වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. අතිසූක්‍ෂම වූ ද ශබ්දයන්ගේ ශබ්ද-නිමිත්ත මෙනෙහි කෙරෙයි. පැදුම්දිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. පැළදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. උතුරුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. දකුණුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. පැදුම් අනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. පැසුම් අනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. උතුරඅනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. දකුණුඅනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්ද නිමිත්ත මෙනෙහි කෙරෙයි. යට දිශායෙහි වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. උඩ දිශායෙහි වූ ද ශබ්දයන් ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරේ.

හේ එසේ භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් ශ්‍රොත්‍රධාතු විශුද්ධි-ඥානය පිණිස සිත එළවයි නැඹුරු කෙරෙයි. හෙතෙම විශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිව්‍යශ්‍රොත්‍රධාතුයෙන් දුර වූ ද ළඟ වූ ද දෙවියන්ගේ ද මිනිසුන් ගේ ද උභයශබ්දයන් අසයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්තසද්දනිමිත්තානං පරියොගාහණෙ පඤ්ඤා සොතධාතුවිසුද්ධි ඤාණං'** යි.

**ශ්‍රොත්‍රධාතු විශුද්ධිඥානනිර්දේශ යි.**

# 52. චෙතොපරියඥානය

කිසෙයිත් (සොමනස්සසහගතාදි) ත්‍රිවිධ චිත්තයන්ගේ වෙගය හෙතු කොට ගෙන ඉන්ද්‍රියයන්ගේ ප්‍රසාද වශයෙන් නානාස්වභාව එකස්වභාව වූ එකුන් අනූ චිත්තයාගේ පැවැත්ම දන්නා ප්‍රඥාව චෙතොපරියඥාන වෙයි යත්:

මෙසස්නෙහි මහණ ඡන්දසමාධිය ... වීර්‍ය්‍යසමාධිය .. චිත්තසමාධිය ... වීමංසාසමාධිය ... වඩා ද හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුන-පුනා වඩයි දමනය කෙරෙයි. මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කෙරෙයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩා දමනය කොට මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට මෙසේ දැනගනියි. මේ සිත සොමනස්සින්ද්‍රිය යෙන් උපන. මේ සිත දෞර්මනස්සින්ද්‍රියයෙන් උපන, මේ සිත උපෙක්ඛින්ද්‍රි යෙන් උපනැ'යි.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං 'සරාගං චිත්ත'න්ති පජානාති, වීතරාගං වා චිත්තං 'වීතරාගං චිත්ත'න්ති පජානාති, සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සඞ්ඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං -පෙ- අවිමුත්තං වා චිත්තං 'අවිමුත්තං චිත්ත'න්ති පජානාති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියාපරියොගාහනෙ පඤ්ඤා චෙතොපරියඤාණං'.

චෙතොපරියඤාණනිද්දෙසො.

## 53. පුබ්බෙනිවාසානුස්සතිඤාණං

කථං පච්චයපවත්තානං[1] ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහනෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සතිඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි -පෙ- මුදුං කරිත්වා කම්මනියං එවං ජානාති:[2] 'ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති: සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො, දසපි ජාතියො, වීසම්පි ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාලීසම්පි ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛප්පටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'පච්චය පවත්තානං ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහනෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සතිඤාණං.'

පුබ්බෙනිවාසානුස්සතිඤාණ නිද්දෙසො.

---

1. පච්චයාකං පවත්තානං - සී    2 පජානාති - සයා, PTS

හෙතෙම එපරිද්දෙන් භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් චෙතොපරියඥානය පිණිස සිත එළවයි. නැඹුරු කෙරෙයි. හෙතෙම පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දැනගනී යි: සරාග වූ සිත ද 'සරාග සිතැ'යි දැනගනියි, වීතරාග වූ සිත ද 'වීතරාග සිතැ'යි දැනගනියි, සද්වෙස වූ සිත ද 'සද්වෙස සිතැ'යි දැනගනියි, වීතද්වෙස වූ සිත ද ... සමොහ වූ සිත ද ... වීතමොහ වූ සිත ද ... (ථිනමිද්ධ වශයෙන්) හැකුළුණු සිත ද ... (උද්ධච්ච වශයෙන්) විසුරුණු සිත ද ... මහද්ගත වූ සිත ද ... මහද්ගත නො වූ සිත ද ... ස උත්තර වූ සිත ද ... අනුත්තර වූ සිත ද ... සමාහිත වූ සිත ද අසමාහිත වූ සිත ද ... විමුක්ත වූ සිත ද ... අවිමුක්ත වූ සිත ද 'අවිමුක්ත වූ සිතැ' යි දැනගනී.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියා පරියොගාහණෙ පඤ්ඤා චෙතොපරියඤාණං'යි.**

**චෙතොපරියඥානනිර්දෙශ යි.**

## 53. පූර්වනිවාසානුස්මෘතිඥානය

කිසෙයින් ප්‍රත්‍යයොත්පන්නධර්මයන්ගේ නානාත්ව එකත්ව කර්මවෙගවශයෙන් දැනගැනීමෙහි ප්‍රඥාව පූර්වනිවාසානුස්මෘතිඥාන වෙයි යත්:

මෙ සස්නෙහි මහණ ඡන්දසමාධිය ... මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට මෙසේ දැනගනියි: මේ ප්‍රත්‍යය ඇති කල්හි මේ ප්‍රත්‍යයොත්පන්නය වෙයි, මේ ප්‍රත්‍යයාගේ උත්පාදය හෙතු කොට ගෙන මේ ප්‍රත්‍යයොත්පන්නය උපදී. ඒ මෙසේ යැ: අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ උපදිති. සංස්කාරප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධිවිඥානය උපදියි. විපාකවිඥානප්‍රත්‍යයෙන් නාමරූපය උපදියි. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය උපදියි. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය උපදියි. ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව උපදියි. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව උපදියි. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය උපදියි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය උපදියි. කර්මභවප්‍රත්‍යයෙන් ජාතිය උපදියි. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය උපදියි. ශොකපරිදෙව දුඃඛදෞර්මනස්‍යොපායාසයෝ උපදිත්. මෙසේ තෙල අසම්මිශ්‍ර වූ දුඃඛරාශිහුගේ සමුදය වේ. හෙතෙම එසේ භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් පූර්වනිවාසානුස්මෘතිඥානය පිණිස සිත එළවයි, නැඹුරු කෙරෙයි.

හෙතෙම අනෙක ප්‍රකාර වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. ඒ මෙසේ යි: එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතළිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සුවහසකුදු නොයෙක් සංවර්තකල්පයකුදු නොයෙක් විවර්තකල්පයකුදු නොයෙක් සංවර්තවිවර්තකල්පයකුදු අසුවල් තැන මෙබඳු නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු පැහැසටහන් ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුවදුක් විඳුනාසුලු වූයෙම් මෙබඳු ආයුපරිච්ඡෙද ඇතියෙම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපන්මි'යි. මෙසේ (නම්ගොත් විසින්) උද්දෙශ සහිත වූ (පැහැසටහන් විසින්) ආකාර සහිත වූ නානාප්‍රකාර වූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'පච්චයපවත්තානං ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහණෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සති ඤාණං'යි**

**පූර්වනිවාසානුස්මෘතිඥානනිර්දෙශ යි**

## 54. දිබ්බචක්ඛුඤාණං.

කථං ඕභාසවසෙන නානත්තෙකත්තරූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධි පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මඤ්ඤං. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං ආලොකසඤ්ඤං මනසිකරොති, දිවාසඤ්ඤං අධිට්ඨාති, 'යථා දිවා තථා රත්ති, යථා රත්ති තථා දිවා' ඉති විවටෙන[1] චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති, සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ[3] දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ඕභාසවසෙන නානත්තෙකත්ත රූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං.'

**දිබ්බචක්ඛුඤාණනිද්දෙසො**

1. වි· තෙනත - සී, 2, 2. උපපජ්ජමානෙ - මජසං, සයා PTS.
3. සවණ්ණෙ - PTS.

# 54. දිව්‍යචක්ෂුර්ඥානය

**කිසෙයින් කසිණෝභාස වශයෙන් නානාස්වභාව එකස්වභාව වර්ණායතනය දක්නා ස්වභාව වූ ප්‍රඥාව දිව්‍යචක්ෂුර්ඥාන වෙයි යත්:**

මෙ සස්නෙහි මහණ ඡන්දය අධික කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. වීර්යය අධික කොට ඇති සමාධිය ... චිත්තය අධික කොට ඇති සමාධිය ... වීමංසාව අධික කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩයි. දමනය කෙරෙයි මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කෙරෙයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩා දමනය කොට මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට ආලෝක සංඥාව මෙනෙහි කෙරෙයි. 'දවාලැ'යි යන සංඥාව ඉටයි. යම්සේ දහවල්හි අලෝකය දක්නාලද ද එසේ මැ රාත්‍රියෙහි ද මෙනෙහි කෙරෙයි. යම්සේ රාත්‍රියෙහි දිබ්බචක්ඛුආලෝකයෙන් දක්නාලද ද එසේ මැ දහවල්හි ද මෙනෙහි කෙරෙයි. මෙසේ විවෘත වූ හාත්පසින් නො වැසුණු සිතින් අවභාස සහිත වූ සිත වඩයි.

හේ එසෙයින් භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් සත්ත්වයන්ගේ ච්‍යුතිඋත්පත්ති දන්නා ඥානය පිණිස සිත එළවයි, නැඹුරු කෙරෙයි. හේ පරිශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිවැසින් ච්‍යුත වන්නා වූ උපදනා වූ හීන වූ ප්‍රණීත වූ සුන්දරවර්ණ වූ දුර්වර්ණ වූ සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකී. කර්ම වූ පරිද්දෙන් පරලොව ගිය සත්ත්වයන් දැනගනියි; 'එකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්යෝපවාදක වූවාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මත්තෙහි සැපයෙන් පහ වූ දුක ටගති වූ විවශ ව පතිත වන නිරයට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියාහු ය. තවද මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්යෝපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්මසමාදාන ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මත්තෙහි සුන්දරගති ඇති සුවයෙන් අග්‍ර වූ දෙව්ලොවට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියාහු' යයි. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිවැසින් ච්‍යුත වන්නා වූ උපදනා වූ හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකී. කර්ම වූ පරිද්දෙන් පරලොව ගිය සත්ත්වයන් දැනගනී.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'ඔභාසවසෙන නානත්තෙකත්තරූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං'** යි.

**දිව්‍යචක්ෂුර්ඥානනිර්දෙශ යි.**

## 55. ආසවක්ඛයඤාණං.

කථං චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං[1] ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං:

කතමෙසං තිණ්ණං[1] ඉන්ද්‍රියානං: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස, අඤ්ඤින්ද්‍රියස්ස, අඤ්ඤාතාවින්ද්‍රියස්ස.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤාතාවින්ද්‍රියං කති ඨානානි ගච්ඡති: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං එකං ඨානං ගච්ඡති: සොතාපත්තිමග්ග . අඤ්ඤින්ද්‍රියං ඡ ඨානානි ගච්ඡති: සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගං, සකදාගාමිඵලං අනාගාමි මග්ගං අනාගාමිඵලං, අරහත්තමග්ගං. අඤ්ඤාතාවින්ද්‍රියං එකං ඨානං ගච්ඡති: අරහත්තඵලං.

සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං පග්ගහපරිවාරං හොති, සතින්ද්‍රියං උපට්ඨානපරිවාරං හොති, සමාධින්ද්‍රියං අවික්ඛෙපපරිවාරං හොති, පඤ්ඤින්ද්‍රියං දස්සනපරිවාරං හොති, මනින්ද්‍රියං විජානනපරිවාරං හොති, සොමනස්සින්ද්‍රියං අභිසන්දනපරිවාරං[2] හොති, ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. සොතාපත්තිමග්ගක්ඛණෙ ජාතා ධම්මා ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං සබ්බෙව කුසලා හොන්ති, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව නිය්‍යානිකා හොන්ති, සබ්බෙව අපචයගාමිනො හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති, සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති. සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.

සොතාපත්තිඵලක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං පග්ගහපරිවාරං හොති, සතින්ද්‍රියං උපට්ඨානපරිවාරං හොති, සමාධින්ද්‍රියං අවික්ඛෙපපරිවාරං හොති, පඤ්ඤින්ද්‍රියං දස්සනපරිවාරං හොති, මනින්ද්‍රියං විජානනපරිවාරං හොති, සොමනස්සින්ද්‍රියං අභිසන්දනපරිවාරං[2] හොති, ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති, සොතාපත්ති ඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති, සොතාපත්තිඵලක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.

1. තිණ්ණන්නං මජ්ඣං, - සයා PTS,
2 අභිනන්දනපරිවාරං - සයා, PTS, සී 1, 2

## 55 ආස්‍රවක්ෂයඥානය

කිසෙයින් සුසැට අයුරින් (අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි) තුන් ඉන්ද්‍රියයන්ගේ වශීභාවයෙන් පැවැති ප්‍රඥාව ආස්‍රවක්ෂයඥාන වෙයි යත්:

කවර තුන් ඉන්ද්‍රියයන්ගේ ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයාගේ යැ අඤ්ඤින්ද්‍රියයාගේ යැ අඤ්ඤාතාවින්ද්‍රියයාගේ යි.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය කිහි තැනෙක උපදී ද, අඤ්ඤින්ද්‍රියය කිහි තැනෙක උපදී ද, අඤ්ඤාතාවින්ද්‍රියය කිහි තැනෙක උපදී ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය එක් තැනෙකැ උපදියි: ස්‍රොතාපත්තිමාර්ගයෙහි යැ. අඤ්ඤින්ද්‍රියය සතැනෙකැ උපදියි: ස්‍රොතාපත්තිඵලයෙහි යැ සකෘදාගාමිමාර්ගයෙහි යැ සකෘදාගාමිඵලයෙහි යැ අනාගාමිමාර්ගයෙහි යැ අනාගාමිඵලයෙහි යැ අර්හත්මාර්ගයෙහි යි. අඤ්ඤාතාවින්ද්‍රියය එක් තැනෙකැ උපදියි: අර්හත්ඵලයෙහි යි.

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි, වීර්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහභාවයෙන් පරිවාර වෙයි, ස්මෘතීන්ද්‍රියය උපස්ථානභාවයෙන් පරිවාර වෙයි, සමාධීන්ද්‍රියය අවික්ෂෙපභාවයෙන් පරිවාර වෙයි. ප්‍රඥෙන්ද්‍රියය දර්ශනභාවයෙන් පරිවාර වෙයි. මනින්ද්‍රියය විජානනභාවයෙන් පරිවාර වෙයි, සොමනස්සින්ද්‍රියය අභිස්‍යන්දනභාවයෙන් පරිවාර වෙයි, ජීවිතින්ද්‍රියය වර්තමානසන්තතියට අධිපතිභාවයෙන් පරිවාර වේ. ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ කුශල වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ නෛර්‍යාණික වෙති, සියල්ලෝ මැ අපචයගාමී වෙති, සියල්ලෝ මැ ලොකුත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති. ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට මේ අට ඉන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යොන්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙත්. ඒ අෂ්ට ඉන්ද්‍රියයෝ මැ ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි, වීර්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහභාවයෙන් පරිවාර වෙයි, ස්මෘතීන්ද්‍රියය උපස්ථානභාවයෙන් පරිවාර වෙයි, සමාධීන්ද්‍රියය අවික්ෂෙපභාවයෙන් පරිවාර වෙයි, ප්‍රඥෙන්ද්‍රියය දර්ශනභාවයෙන් පරිවාර වෙයි, මනින්ද්‍රියය විජානනභාවයෙන් පරිවාර වෙයි, සොමනස්සින්ද්‍රියය අභිස්‍යන්දනභාවයෙන් පරිවාර වෙයි, ජීවිතෙන්ද්‍රියය වර්තමානසන්තතියට අධිපතිභාවයෙන් පරිවාර වේ. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ අව්‍යාකෘත වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියට මේ අෂ්ට ඉන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යොන්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙත්. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අඤ්ඤින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

සකදාගාමිමග්ගක්ඛණෙ -පෙ- සකදාගාමිඵලක්ඛණෙ -පෙ- අනාගාමිමග්ගක්ඛණෙ -පෙ- අනාගාමිඵලක්ඛණෙ -පෙ- අරහත්තමග්ගක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති -පෙ- ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති.

අරහත්තමග්ගක්ඛණෙ ජාතා ධම්මා ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං සබ්බෙව කුසලා හොන්ති, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව නිය්‍යානිකා හොන්ති, සබ්බෙව අපචයගාමිනො හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති අරහත්තමග්ගක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.

අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං -පෙ- ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. අරහත්තඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති, ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති. අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච. ඉති ඉමානි අට්ඨට්ඨකානි චතුසට්ඨි හොන්ති.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො, භවාසවො, දිට්ඨාසවො, අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං'.

**ආසවක්ඛයඤාණනිද්දෙසො.**

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි ... සකෘදාගාමිඵලක්ෂණයෙහි ... අනාගාමි-මාර්ගක්ෂණයෙහි.... අනාගාමිඵලක්ෂණයෙහි ... අර්හත්මාර්ගක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රි-යට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි ... ජීවිතෙන්ද්‍රියය වර්තමානසන්තතියට අධිපතිභාවයෙන් පරිවාර වේ.

අර්හත්මාර්ගක්ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ කුශල වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ නෛර්‍ය්‍යාණික වෙති, සියල්ලෝ මැ අපචයගාමී වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්‍වාණාලම්බන වෙති. අර්හත්මාර්ගක්ෂ-ණයෙහි අඤ්ඤින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යෝ’න්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති. සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙති. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අඤ්ඤින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

අර්හත්ඵලක්ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි, වීර්‍ය්‍යෙන්ද්‍රියය ... ජීවිතෙන්ද්‍රියය වර්තමානසන්තතියට අධිපති-භාවයෙන් පරිවාර වේ. අර්හත්ඵලක්ෂණයෙහි උපන් ධර්මයෝ සියල්ලෝ මැ අව්‍යාකෘත වෙති, චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්‍වාණාලම්බන වෙත්. අර්හත්ඵලක්ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යෝ’න්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙත්. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අඤ්ඤාතාවින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්. මෙසේ මේ අෂ්ටාෂ්ටකය සූසැටෙක් වේ.

**ආසවා** යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

තෙල ආස්‍රවයෝ කොහි ක්ෂය වෙති යත්: සෝවාන්මඟින් අනවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්ෂය වෙයි, අපායගාමී වූ කාමාස්‍රවය ක්ෂය වෙයි, අපායගාමී වූ භවාස්‍රය ක්ෂය වෙයි, අපායගාමී වූ අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

සෙදගැමිමඟින් ඖදාරික වූ කාමාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි භවාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

අනගැමි මඟින් අනවශෙෂ වූ කාමාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි භවාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

අර්හත්මාර්ගයෙන් අනවශෙෂ වූ භවාස්‍රවය ක්ෂය වෙයි, අනවශෙෂ වූ අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: ‘**චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං**’ යි.

**ආස්‍රවක්ෂයඥාන නිර්දෙශ යි.**

## 56-63. සච්චඤාණචතුක්කද්වයං

කථං පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං, පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං, සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං, භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං:

දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො පරිඤ්ඤට්ඨො.

සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සඤ්ඤොගට්ඨො පළිබොධට්ඨො පහානට්ඨො.

නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො සච්ඡිකිරියට්ඨො.

මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො භාවනට්ඨො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං, පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං, සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං, භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'.

කථං දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං:

මග්ගසමඞ්ගිස්ස ඤාණං දුක්ඛෙපෙතං ඤාණං, දුක්ඛසමුදයෙපෙතං ඤාණං, දුක්ඛනිරොධෙපෙතං ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදායපෙතං ඤාණං.

තත්ථ කතමං දුක්ඛෙ ඤාණං: දුක්ඛං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උප-පරික්ඛා භූරී මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. ඉදං වුච්චති දුක්ඛෙ ඤාණං. දුක්ඛසමුදයං ආරබ්භ -පෙ- දුක්ඛනිරොධං ආරබ්භ -පෙ- දුක්ඛනිරොධගාමිනිං පටිපදං ආරබ්භ -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. ඉදං වුච්චති දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධ-ගාමිනියා පටිපදාය ඤාණං'.

සච්චඤාණචතුක්කද්වයනිද්දෙසො.

## 56-63. සත්‍යඥානචතුෂ්කද්වය

කිසෙයින් (දුඃඛයාගේ පීඩනාදි චතුර්විධ අර්ථයන්) පරිඥෙයසවභාව-යෙහි ප්‍රඥව දුඃඛඥන වෙයි, ප්‍රහාතව්‍යසවභාවයෙහි ප්‍රඥව සමුදයඥාන වෙයි, සාක්ෂාත්කර්තව්‍යසවභාවයෙහි ප්‍රඥව නිරොධඥන වෙයි, භාවිතව්‍ය සවභාවයෙහි ප්‍රඥව මාර්ගඥන වෙයි යත්:

දුඃඛයාගේ පීඩනසවභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ කරනලද සවභාවය සන්තාපසවභාවය පෙරළෙන සවභාවය පරිඥෙයසවභාව වෙයි.

සමුදයාගේ දුක් රැස් කරන සවභාවය දුකට කරුණු වන සවභාවය සංයොග සවභාවය වළහන සවභාවය ප්‍රහාතව්‍ය සවභාව වෙයි.

නිරොධයාගේ සසරින් පහවූ සවභාවය සංසකාරයන් කෙරෙන් ශූන්‍ය සවභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ නො කරනලද සවභාවය අමරණ සවභාවය සාක්ෂාත්කර්තව්‍ය සවභාව වෙයි.

මාර්ගයාගේ නියර්‍යාණසවභාවය හෙතුසවභාවය දර්ශනසවභාවය ආධිපත්‍යසවභාවය භාවිතව්‍යසවභාව වේ.

එය ඥතාර්ථයෙන් ඥන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'පරිඤ්ඤෙය්‍යට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං පහාතබ්බට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං සච්ඡිකාතබ්බට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'**යි.

කිසෙයින් දුඃඛඥන, දුඃඛසමුදයඥන, දුඃඛනිරොධඥන, දුඃඛනිරොධ-ගාමිනීප්‍රතිපදඥන වෙයි යත්:

මාර්ගසමඞ්ගීහුගේ යම් ඥනයෙක් වේ ද තෙල දුඃඛඥන නමුදු වෙයි තෙල දුඃඛසමුදයඥන නමුදු වෙයි, තෙල දුඃඛනිරොධඥන නමුදු වෙයි, තෙල දුඃඛනිරොධගාමිනීප්‍රතිපදඥන නමුදු වේ.

එහි දුඃඛඥනය කවරෙ යත්: දුඃඛසත්‍යය අරමුණු කොට යම් ප්‍රඥ-යෙක් ප්‍රජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකාරයෙන් විමසීමෙක් ධර්මසඞ්ගහම් විමසීමෙක් (අනිත්‍යාදිය ලක්ෂණ විසින්) සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කුශලභාවයෙක් නිපුණභාවයෙක් (අනිත්‍යාදිය) විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥයෙක් මෙධායෙක් (යථාසවභාව ප්‍රතිවෙධයෙහි නැමෙන) පරිණායිකායෙක් විදර්ශනායෙක් (අනිත්‍යාදිය ප්‍රකාරයෙන් දන්නා) සම්‍යග්ඥනයෙක් පතොද-ප්‍රඥයෙක් ප්‍රඥසඞ්ඛ්‍යාත ඉන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥ ප්‍රාසාදයෙක් ප්‍රඥ ආලොකයෙක් ප්‍රඥ අවභාසයෙක් ප්‍රඥ ප්‍රද්‍යොතයෙක් ප්‍රඥ රත්නයෙක් අමොහයෙක් ධම්මවිචයෙක් සම්‍යග්දෘෂ්ටියක් උපදී ද මේ දුඃඛඥන යැ යි කියනු ලැබේ. දුඃඛසමුදයසත්‍යය අරමුණු කොට ... දුඃඛ නිරොධසත්‍යය අරමුණු කොට ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදසත්‍යය අරමුණු කොට යම් ප්‍රඥයෙක් ප්‍රජානනාකාරයෙක් .. අමොහයෙක් ධම්මවිචයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදඥන යැ යි කියනු ලැබේ.

එය ඥතාර්ථයෙන් ඥන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං'** යි.

**සත්‍යඥානචතුෂ්කද්වයනිර්දෙශ යි.**

## 64-67 සුද්ධිකපටිසම්භිදාඤාණං

කථං අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං:

අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා, පටිභානෙසු ඤාණං පටිභානපටි-සම්භිදා.

අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං.

අත්ථවවත්ථානෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිවවත්ථානෙ පඤ්ඤා නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානවවත්ථානෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථසල්ලක්ඛණෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මසල්ලක්ඛණෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිසල්ලක්ඛණෙ පඤ්ඤා නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානසල්ලක්ඛණෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථූපලක්ඛණෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මූපලක්ඛණෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තූපලක්ඛණෙ පඤ්ඤා නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානූපලක්ඛණෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථප්පභෙදෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මප්පභෙදෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිප්පභෙදෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානප්පභෙදෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථප්පභාවනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මප්පභාවනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිප්පභාවනෙ පඤ්ඤා නිරුත්තිපටි-සම්භිදෙ ඤාණං, පටිභානප්පභාවනෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථජොතනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මජොතනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිජොතනෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානජොතනෙ පඤ්ඤා පටිභාන පටිසම්භිදෙ ඤාණං.

## 64-67. ශුද්ධිකප්‍රතිසංවිද්ඥානය

කිසෙයින් අර්ථප්‍රතිසංවිද්ඥාන, ධර්මප්‍රතිසංවිද්ඥාන, නිරුක්තිප්‍රතිසංවිද්ඥාන, ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන වෙයි යත්:

හෙතුඵල (අර්ථ)යන්හි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද් යෑ ප්‍රත්‍යය (ධර්ම) යන්හි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද් යෑ නිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගත ඥානය නිරුක්තිප්‍රතිසංවිද් යෑ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද් යෑ.

අර්ථනානාත්වයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මනානාත්වයෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිනානාත්වයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥානයෑ ඥානනානාත්වයෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානයි.

අර්ථය අත්‍යර්ථයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය අත්‍යර්ථයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය අත්‍යර්ථයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය අත්‍යර්ථයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථප්‍රභෙදයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මප්‍රභෙදයෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිප්‍රභෙදයෙහි ප්‍රභෙදගත ඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානප්‍රභෙදයෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි

අර්ථය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අත්ථවිරොචනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මවිරොචනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිවිරොචනෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානවිරොචනෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථප්පකාසනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මප්පකාසනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිප්පකාසනෙ පඤ්ඤා නිරුත්ති පටිසම්භිදෙ ඤාණං, පටිභානප්පකාසනෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං'.

**සුද්ධිකපටිසම්භිදාඤාණනිද්දෙසො.**

## 68 ඉන්ද්‍රියපරොපරියත්තඤාණං.

කතමං තථාගතස්ස ඉන්ද්‍රියපරොපරියත්ත[1] ඤාණං.

ඉධ තථාගතො සත්තෙ පස්සති: අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙති** සද්ධො පුග්ගලො අප්පරජක්ඛො, අස්සද්ධො[2] පුග්ගලො මහාරජක්ඛො; ආරද්ධවිරියො පුග්ගලො අප්පරජක්ඛො, කුසීතො පුග්ගලො මහාරජක්ඛො; උපට්ඨිතස්සති පුග්ගලො අප්පරජක්ඛො, මුට්ඨස්සති පුග්ගලො මහාරජක්ඛො; සමාහිතො පුග්ගලො අප්පරජක්ඛො, අසමාහිතො පුග්ගලො මහාරජක්ඛො; පඤ්ඤවා පුග්ගලො අප්පරජක්ඛො, දුප්පඤ්ඤො පුග්ගලො මහාරජක්ඛො.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙති** සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො, අස්සද්ධො පුග්ගලො මුදින්ද්‍රියො; ආරද්ධවිරියො පුග්ගලො තික්ඛින්ද්‍රියො, කුසීතො පුග්ගලො මුදින්ද්‍රියො; උපට්ඨිතස්සති පුග්ගලො තික්ඛින්ද්‍රියො, මුට්ඨස්සති පුග්ගලො මුදින්ද්‍රියො; සමාහිතො පුග්ගලො තික්ඛින්ද්‍රියො අසමාහිතො පුග්ගලො මුදින්ද්‍රියො; පඤ්ඤවා පුග්ගලො තික්ඛින්ද්‍රියො, දුප්පඤ්ඤො පුග්ගලො මුදින්ද්‍රියො.

---

1. ඉන්ද්‍රියානං පරොපරියත්තං - ස්‍යා, ඉන්ද්‍රියපරොපරියත්තෙ - මජසං, PTS, සී 1,2,3
2. අසද්ධො - PTS,

අර්ථය විවිධ කොට දිපන කිරීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්-ඥාන යැ ධර්මය විවිධ කොට දීපන කිරීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රති-සංවිද්ඥාන යැ නිරුක්තිය විවිධ කොට දීපන කිරීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යැ ඥානය විවිධ කොට දීපන කිරීමෙහි ප්‍රභෙද-ගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථප්‍රකාශනයෙහිප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යැ ධර්මප්‍රකාශන-යෙහි ප්‍රභෙගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යැ නිරුක්තිප්‍රකාශනයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යැ ඥානප්‍රකාශනයෙහි ප්‍රභෙද-ගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං'යි.**

**සුද්ධිකපටිසම්භිද ඥානනිර්දෙශ යි.**

## 68. ඉන්ද්‍රියපරාවරතාඥානය

තථාගතයන් වහන්සේගේ (සත්ත්වයන් පිළිබඳ) ඉන්ද්‍රියපරාවරතාඥානය කවරේ යත්:

මෙහි තථාගත තෙම අල්ප වූ කෙලෙස් රජස් ඇති මහත් වූ කෙලෙස් රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන් ඇති මෘදු වූ ඉන්ද්‍රියයන් ඇති සුන්දර වූ ආකාර ඇති කුත්සිත වූ ආකාර ඇති සුවසේ හැඟැවිය හැකි දුකසේ හැඟවිය හැකි සත්ත්වයන් පරලොව ද (රාගාදි) වද්‍යය ද භය වශයෙන් දක්නා වූ ඇතැම් සත්ත්වයන් පරලොව ද (රාගාදි) වද්‍යය ද භය වශයෙන් නො දක්නා වූ ඇතැම් සත්ත්වයන් (ඉන්ද්‍රියපරාවරතාඥානයෙන්) දකී.

**අප්පරජක්ඛ මහාරජක්ඛ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම අල්ප-රජසක යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම මහාරජසක යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම අල්පරජසක යැ කුසීද පුද්ගල තෙම මහාරජසක යැ එළඹ සිටි සිහි ඇති පුද්ගල තෙම අල්පරජසක යැ මුළාසිහි ඇති පුද්ගල තෙම මහාරජසක යැ සමාහිතපුද්ගල තෙම අල්පරජසක යැ අසමාහිතපුද්ගල තෙම මහාරජසක යැ (උදයව්‍යයගාමිනී) ප්‍රඥාව ඇති පුද්ගල තෙම අල්ප-රජසක යැ දුෂ්ප්‍රාඥ පුද්ගල තෙම මහාරජසක යි.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රිය ඇත්තේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ රැකුළු වැර ඇති පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ කුසීත වූ පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ මුළාසිහි ඇති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ සමාහිත වූ පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ අසමාහිත වූ පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ ප්‍රඥාව ඇති පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ දුෂ්ප්‍රාඥ වූ පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යි.

**ස්වාකාරෙ ද්වාකාරෙති** සද්ධො පුග්ගලො ස්වාකාරො, අස්සද්ධො පුග්ගලො ද්වාකාරො; ආරද්ධවිරියො පුග්ගලො ස්වාකාරො, කුසීතො පුග්ගලො ද්වාකාරො; උපට්ඨිතස්සති පුග්ගලො ස්වාකාරො, මුට්ඨස්සති පුග්ගලො ද්වාකාරො; සමාහිතො පුග්ගලො ස්වාකාරො, අසමාහිතො පුග්ගලො ද්වාකාරො; පඤ්ඤවා පුග්ගලො ස්වාකාරො, දුප්පඤ්ඤො පුග්ගලො ද්වාකාරො

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙති** සද්ධො පුග්ගලො සුවිඤ්ඤාපයො, අස්සද්ධො පුග්ගලො දුවිඤ්ඤාපයො; ආරද්ධවිරියො පුග්ගලො සුවිඤ්ඤාපයො කුසීතො පුග්ගලො දුවිඤ්ඤාපයො; උපට්ඨිතස්සති පුග්ගලො සුවිඤ්ඤාපයො, මුට්ඨස්සති පුග්ගලො දුවිඤ්ඤාපයො; සමාහිතො පුග්ගලො සුවිඤ්ඤාපයො, අසමාහිතො පුග්ගලො දුවිඤ්ඤාපයො; පඤ්ඤවා පුග්ගලො සුවිඤ්ඤාපයො, දුප්පඤ්ඤො පුග්ගලො දුවිඤ්ඤාපයො.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනොති** සද්ධො පුග්ගලො පරලොකවජ්ජභය-දස්සාවී, අස්සද්ධො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී; ආරද්ධවිරියො පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, කුසීතො පුග්ගලො න පරලොක-වජ්ජභයදස්සාවී; උපට්ඨිතස්සති පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, මුට්ඨස්සති පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී; සමාහිතො පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, අසමාහිතො පුග්ගලො න පරලොකවජ්ජ-භයදස්සාවී; පඤ්ඤවා පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, දුප්පඤ්ඤො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී.

**ලොකොති** ඛන්ධලොකො, ධාතුලොකො, ආයතනලොකො, විපත්ති-භවලොකො, විපත්තිසම්භවලොකො, සම්පත්තිභවලොකො, සම්පත්ති-සම්භවලොකො.

එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා: නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා: තිස්සො වෙදනා, චත්තාරො ලොකා: චත්තාරො ආහාරා, පඤ්ච ලොකා: පඤ්චුපාදානක්ඛන්ධා, ඡ ලොකා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත ලොකා: සත්ත විඤ්ඤාණට්ඨිතියො, අට්ඨ ලොකා: අට්ඨ ලොකධම්මා, නව ලොකා: නව සත්තාවාසා, දස ලොකා: දසායතනානි, ද්වාදස ලොකා: ද්වාදසායතනානි, අට්ඨාරස ලොකා: අට්ඨාරස ධාතුයො.

**වජ්ජන්ති** සබ්බෙ කිලෙසා වජ්ජා, සබ්බෙ දුච්චරිතා වජ්ජා, සබ්බෙ අභිසඞ්ඛාරා වජ්ජා, සබ්බෙ භවගාමී කම්මා වජ්ජා.

**ස්වාකාරෙ ද්වාකාරෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ කුත්සිත වූ පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ එළඹසිටිසිහි ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ මුලාසිහි ඇති පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ සමාහිත වූ පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ අසමාහිත වූ පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ ප්‍රඥ ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ දුෂ්ප්‍රාඥ වූ පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යි.

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ** යනු: සැදැහැති පුද්ගල තෙම සුවිඥෙප්‍ය (සුවසේ හැඟැවිය හැකි) යැ සැදැහැ නැති පුද්ගල තෙම දුර්විඥෙප්‍ය (දුකසේ හැඟැවිය හැකි) යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම සුවිඥෙප්‍ය යැ කුසීද වූ පුද්ගල තෙම දුර්විඥෙප්‍ය යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම සුවිඥෙප්‍ය යැ මුලාසිහි ඇති පුද්ගල තෙම දුර්විඥෙප්‍ය යැ සමාහිත පුද්ගල තෙම සුවිඥෙප්‍ය යැ අසමාහිත පුද්ගල තෙම දුර්විඥෙප්‍ය යැ ප්‍රාඥ පුද්ගල තෙම සුවිඥෙප්‍ය යැ දුෂ්ප්‍රාඥ පුද්ගල තෙම දුර්විඥෙප්‍ය යි.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො** යනු: සැදැහැති පුද්ගල තෙම පරලොව හා (රාගාදි) වද්‍යය භය වශයෙන් දක්නේ (දක්නාසුලු) යැ සැදැහැ නැති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්නේ යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්නේ යැ කුසීදපුද්ග තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්නේ යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්නේ යැ මුලාසිහි ඇති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්නේ යැ සමාහිත පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්නේ යැ අසමාහිතපුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්නේ යැ ප්‍රාඥපුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්නේ යැ දුෂ්ප්‍රාඥ පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්නේ යි.

**ලොකො** යනු: ස්කන්ධලොක යැ ධාතුලොක යැ ආයතනලොක යැ විපත්තිභව (අපාය) ලොක යැ විපත්තිසම්භව (අපායූපගකම්ම) ලොක යැ සම්පත්තිභව (සුගති) ලොක යැ සම්පත්තිසම්භව (සුගතූපගකම්ම) ලොක යි.

එක් ලොවෙකැ: හැම සත්හු ආහාරයෙන් සිටුනාහු යැ. ලොකයෝ දෙදෙනෙකැ: නාමයත් රූපයත් යැ. ලොකයෝ තුන්දෙනෙකැ: තුන් වෙදනා යැ. ලොකයෝ සතරදෙනෙකැ: සතර ආහාරයෝ යැ. ලොකයෝ පස්දෙනෙකැ: පඤ්චොපාදානස්කන්ධයෝ යැ. ලොකයෝ සදෙනෙකැ: ආධ්‍යාත්මික ආයතනයෝ සදෙන යැ. ලොකයෝ සත්දෙනෙකැ: සප්ත විඥානස්ථිතිහු යැ. ලොකයෝ අටදෙනෙකැ: අෂ්ටලොකධර්මයෝ යැ ලොකයෝ නවදෙනෙකැ: නවසත්ත්වාවාසයෝ යැ. ලොකයෝ දසදෙනෙකැ. දසආයතනයෝ යැ. ලොකයෝ දොළොස්දෙනෙකැ: දොළොස් ආයතනයෝ යැ. ලොකයෝ අටළොස්දෙනෙකැ: අටළොස් ධාතුහු යි.

**වජ්ජං** යනු: හැම ක්ලෙශයෝ වද්‍යයෝ යැ හැම දුශ්චරිතයෝ වද්‍යයෝ යැ හැම අභිසංස්කාරයෝ වද්‍යයෝ යැ හැම භවගාමිකර්මයෝ වද්‍යයෝ යි.

ඉති ඉමස්මිඤ්ච ලොකෙ ඉමස්මිඤ්ච වජ්ජෙ තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ. ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි ජානාති, පස්සති, අඤ්ඤාති, පටිවිජ්ඣති.

ඉදං තථාගතස්ස ඉන්ද්‍රියපරොපරියත්තඤාණං.

**ඉන්ද්‍රියපරොපරියත්තඤාණනිද්දෙසො.**

## 69 ආසයානුසයඤාණං.

කතමං තථාගතස්ස සත්තානං ආසයානුසයඤාණං:

ඉධ තථාගතො සත්තානං ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති, භබ්බාභබ්බෙ සත්තෙ ජානාති.

කතමො ච සත්තානං ආසයො: 'සස්සතො ලොකො'ති වා 'අසස්සතො ලොකො'ති වා 'අන්තවා ලොකො'ති වා 'අනන්තවා ලොකො'ති වා තං ජීවං තං සරීරන්ති වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති වා 'හොති තථාගතො පරම්මරණාති' වා 'න හොති තථාගතො පරම්මරණා'ති වා 'හොති ච න හොති ච[1] තථාගතො පරම්මරණා'ති වා 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා. ඉති භවදිට්ඨිසන්නිස්සිතා වා සත්තා හොන්ති විභවදිට්ඨිසන්නිස්සිතා වා.

එතෙ වා පන උභො අන්තෙ අනුපගම්ම ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අනුලොමිකා ඛන්ති[2] පටිලද්ධා හොති, යථාභූතං වා ඤාණං.

කාමං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො කාමගරුකො කාමාසයො කාමාධිමුත්තො'ති, කාමං[3] සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො නෙක්ඛම්මගරුකො නෙක්ඛම්මාසයො නෙක්ඛම්මාධිමුත්තො'ති, නෙක්ඛම්මං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො නෙක්ඛම්මගරුකො නෙක්ඛම්මාසයො නෙක්ඛම්මාධිමුත්තො'ති, නෙක්ඛම්මං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො කාමගරුකො කාමාසයො කාමාධිමුත්තො'ති.

බ්‍යාපාදං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො බ්‍යාපාදගරුකො බ්‍යාපාදාසයො බ්‍යාපාදාධිමුත්තො'ති, බ්‍යාපාදං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො අබ්‍යාපාදගරුකො අබ්‍යාපාදාසයො අබ්‍යාපාදාධිමුත්තො'ති, අබ්‍යාපාදං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො අබ්‍යාපාදගරුකො අබ්‍යාපාදාසයො අබ්‍යාපාදාධිමුත්තො'ති, අබ්‍යාපාදං සෙවන්තමෙව ජානාති 'අයං පුග්ගලො බ්‍යාපාදගරුකො බ්‍යාපාදාසයො බ්‍යාපාදාධිමුත්තො'ති.

---

1 හොති ච න ච හොති - මජසං, සතා    2 අනුලොමිඛන්ති - සී 1, 2,

3. කායං, PTS

මෙසෙයින් මේ ලෝකයෙහි ද මේ වද්‍යයෙහි ද බලවත් භයසංඥව නගනලද අසිපත ඇති වධකයකු කෙරෙහි සෙයින් එළඹසිටියා වෙයි. මේ පනස් අයුරින් මේ (ශ්‍රද්ධාදී) පඤ්චේන්ද්‍රියයන් (නුවණින්) දනියි (දිවැසින්) දකියි. හාත්පසින් දනියි. ප්‍රතිවේධ කෙරේ.

මේ තථාගතයන් වහන්සේගේ (සත්ත්වයන් පිළිබඳ) ඉන්ද්‍රියපරෝපරියත්ත-ඥාන නම්.

**ඉන්ද්‍රියපරෝපරියත්තඥානනිර්දෙශ යි.**

## 69. ආශයානුශයඥානය

තථාගතයන් වහන්සේගේ සත්ත්වයන් පිළිබඳ ආශයඅනුශය දන්නා නුවණ කවරෙ යත්:

මෙහි තථාගත තෙම සත්ත්වයන්ගේ ආශය (සන්තානය) දැනැගනී. අනුශය (ථාමගත කාමරාගාදිය) දැනැගනී. චරිතය (පූර්වකෘතකර්ම) දැනැගනී. අධිමුක්තිය දැනැගනී. භව්‍යාභව්‍යසත්ත්වයන් දැනැගනී.

සත්ත්වයන්ගේ ආශය කවරෙ යත්: 'ලෝකය ශාශ්වතැ' යි හෝ 'ලෝකය අශාශ්වතැ' යි හෝ 'ලෝකය අන්ත ඇත්තේ යැ' යි හෝ 'ලෝකය අනන්ත නැත්තේ යැ' යි හෝ 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ' යි හෝ 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ' යි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වේ' යයි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යයි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වන්නේත් නො වන්නේත් වේ' යයි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි හෝ මෙසෙයින් සත්ත්වයෝ ශාශ්වතදෘෂ්ටිය ඇසිරි කළාහු හෝ වෙති. උච්ඡේදදෘෂ්ටිය ඇසිරි කළාහු හෝ වෙත්.

මේ උභයාන්තයට ද නො පැමිණ ඉදම්ප්‍රත්‍යතාප්‍රතීත්‍යසමුත්පන්න-ධර්මයන්හි අනුලෝමඥානය ලබනලද වෙයි. යථාභූතඥානය හෝ ලබන ලද්දේ වේ.

කාමය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම කාමගරුක යැ කාමාශය ඇත්තේ යැ කාමාධිමුක්ත යැ'යි දනගනියි. කාමය සෙවුණහු මැ මේ පුද්ගල තෙම නෛෂ්ක්‍රම්‍යගරුක යැ නෛෂ්ක්‍රම්‍යාශය ඇත්තේ යැ නෛෂ්ක්‍රම්‍යාධි-මුක්ත යැ' යි දනගනියි. නෛෂ්ක්‍රම්‍යය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම නෛෂ්ක්‍රම්‍යගරුක යැ නෛෂ්ක්‍රම්‍යාශය ඇත්තේ යැ නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත යැ' යි දනගනියි. නෛෂ්ක්‍රම්‍යය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම කාම ගරුක යැ කාමාශය ඇත්තේ යැ කාමාධිමුක්ත යැ' යි දැනැගනී.

ව්‍යාපාදය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම ව්‍යාපාදගරුක යැ ව්‍යාපාද-ශය ඇත්තේ යැ ව්‍යාපාදධිමුක්ත යැ' යි දනගනියි. ව්‍යාපාදය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම අව්‍යාපාදගරුක යැ අව්‍යාපාදශය ඇත්තේ යැ අව්‍යාපාදධි-මුක්ත යැ' යි දනගනියි. අව්‍යාපාදය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම අව්‍යාපාදගරුක යැ අව්‍යාපාදශය ඇත්තේ යැ අව්‍යාපාදධිමුක්ත යැ' යි දනගනියි. අව්‍යාපාදය සෙවුණහු මැ 'මේ පුද්ගල තෙම ව්‍යාපාදගරුක යැ ව්‍යාපාදශය ඇත්තේ යැ ව්‍යාපාදධිමුක්ත යැ' යි දැනැගනී,

ථිනමිද්ධං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ථිනමිද්ධගරුකො ථිනමිද්ධාසයො ථිනමිද්ධාධිමුත්තො'ති, ථිනමිද්ධං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ආලොකසඤ්ඤාගරුකො ආලොකසඤ්ඤාසයො අලොකසඤ්ඤාධිමුත්තො'ති, ආලොකසඤ්ඤං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ආලොකසඤ්ඤාගරුකො ආලොකසඤ්ඤාසයො ආලොකසඤ්ඤාධිමුත්තො'ති, ආලොකසඤ්ඤං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ථිනමිද්ධගරුකො ථිනමිද්ධාසයො ථිනමිද්ධාධිමුත්තො'ති*. අයං සත්තානං ආසයො.

කතමො ච සත්තානං අනුසයො: සත්තානුසයා, කාමරාගානුසයො, පටිඝානුසයො, මානානුසයො, දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො.

යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථ සත්තානං කාමරාගානුසයො අනුසෙති; යං ලොකෙ අප්පියරූපං[1] අසාතරූපං, එත්ථ සත්තානං පටිඝානුසයො අනුසෙති; ඉති ඉමෙසු ද්වීසු ධම්මෙසු අවිජ්ජා අනුපතිතා තදෙකට්ඨො මානො ච දිට්ඨි ච විචිකිච්ඡා ච දට්ඨබ්බා. අයං සත්තානං අනුසයො.

කතමං ච සත්තානං චරිතං: පුඤ්ඤාභිසඞ්ඛාරො, අපුඤ්ඤාභිසඞ්ඛාරො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො පරිත්තභූමකො වා මහාභූමකො වා, ඉදං සත්තානං චරිතං.

කතමා ච සත්තානං අධිමුත්ති: සන්ති සත්තා හීනාධිමුත්තිකා, සන්ති සත්තා පණීතාධිමුත්තිකා, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති භජන්ති පයිරුපාසන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති භජන්ති පයිරුපාසන්ති. අතීතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිංසු භජිංසු පයිරුපාසිංසු, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිංසු භජිංසු පයිරුපාසිංසු, අනාගතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති භජිස්සන්ති පයිරුපාසිස්සන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති භජිස්සන්ති පයිරුපාසිස්සන්ති. අයං සත්තානං අධිමුත්ති.

කතමෙ සත්තා අභබ්බා: යෙ තෙ සත්තා කම්මාවරණෙන සමන්නාගතා, කිලෙසාවරණෙන සමන්නාගතා, විපාකාවරණෙන සමන්නාගතා, අසද්ධා අච්ඡන්දිකා, දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමෙ තෙ සත්තා අභබ්බා.

කතමෙ සත්තා භබ්බා: යෙ තෙ සත්තා න කම්මාවරණෙන සමන්නාගතා, න කිලෙසාවරණෙන සමන්නාගතා, න විපාකාවරණෙන සමන්නාගතා, සද්ධා ඡන්දිකා පඤ්ඤවන්තො, භබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමෙ තෙ සත්තා භබ්බා.

ඉදං තථාගතස්ස සත්තානං ආසයානුසයෙ ඤාණං.

ආසයානුසයඤාණනිද්දෙසො.

---

* 'කාම'න්තිච්චාදි වාක්‍යප්පදෙසො - ස්‍යා PTS පොත්ථකෙසු ච කත්ථචි සිහළක්ඛර පොත්ථකෙසු ච ව්‍යාකුලො විසදිසො ච දිස්සතෙ.

1 අපියරූපං - PTS.

ථීනමිද්ධය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම ථීනමිද්ධගරුක යැ ථීනමිද්ධාසය ඇත්තේ යැ ථීනමිද්ධාධිමුක්ත යැ'යි දැනගනියි. ථීනමිද්ධය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම ආලොකසංඥාගරුක යැ ආලොකසංඥාශය අත්තේ යැ ආලොකසංඥාධිමුක්ත යැ'යි දැනගනියි. ආලොකසංඥාව සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම ආලොකසංඥාගරුක යැ ආලොකසංඥාශය ඇත්තේ යැ ආලොකසංඥාධිමුක්ත යැ'යි දැනගනියි. ආලොකසංඥාව සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම ථීනමිද්ධගරුක යැ ථීනමිද්ධාසය ඇත්තේ යැ ථීනමිද්ධාධිමුක්ත යැ'යි දැනැගනී. මේ සත්ත්වයන්ගේ ආශය වේ.

සත්ත්වයන්ගේ අනුශය කවරෙ යත්: අනුශයයෝ සත්දෙනෙකි: කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ මානානුශය යැ දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යි.

යමක් ලොකයෙහි ප්‍රියස්වභාව සාතස්වභාව ඇත්තේ ද මෙහි සත්ත්වයන්ගේ කාමරාගානුශය ලැගසිටී. යමෙක් ලොකයෙහි අප්‍රියස්වභාව අසාතස්වභාව ඇත්තේ ද මෙහි සත්ත්වයන්ගේ ප්‍රතිඝානුශය ලැගසිටී. මෙසෙයින් මේ දෙදහම්හි අවිද්‍යාව අනුවගියා ය. ඒ අවිද්‍යාව හා සමග (සහජෙකට්ඨවශයෙන්) එක් වැ සිටි මානය ද දෘෂ්ටිය ද විචිකිත්සාව ද දතයුත්තාහ. මේ සත්ත්වයන්ගේ අනුශය වේ.

සත්ත්වයන්ගේ චරිතය කවරෙ යත්: පරිත්තභූමක වූ හෝ මහාභූමක වූ හෝ පුණ්‍යාභිසංසකාර යැ අපුණ්‍යාභිසංසකාර යැ ආනෙඤ්ජාභිසංසකාර යි. මේ සත්ත්වයන්ගේ චරිත යි.

සත්ත්වයන්ගේ අධිමුක්ති කවර යත්: හීන වූ අධිමුක්ති (අදහස්) ඇති සත්ත්වයෝ ඇත්තාහ. ප්‍රණීත වූ අධිමුක්ති ඇති සත්ත්වයෝ ඇත්තාහ. හීනාධිමුක්තික සත්ත්වයෝ හීනාධිමුක්තික සත්ත්වයන් සෙවන - භජන - පර්යුපාසන කෙරෙති. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවන භජන පර්යුපාසන කෙරෙති. අතීතකාලයෙහි ද හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධිමුක්තිකසත්ත්වයන් සෙවන -භජන- පර්යුපාසන කළහ. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවන -භජන- පර්යුපාසන කළහ. අනාගතකාලයෙහි ද හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධිමුක්තිකසත්ත්වයන් සෙවන --භජන- පර්යුපාසන කරන්නාහ. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවන -භජන- පර්යුපාසන කරන්නාහු යි. මේ සත්ත්වයන්ගේ අධිමුක්ති යි.

අභව්‍යසත්ත්වයෝ කවරහ යත්: යම් සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් සමන්නාගතයෝ ද ක්ලෙශාවරණයෙන් සමන්නාගතයෝ ද විපාකාවරණයෙන් සමන්නාගතයෝ ද සැදැහැ නැත්තාහු ද කර්තුකාම්‍යතාකුශලච්ඡන්ද නැත්තාහු ද භවාඞ්ගප්‍රඥා රහිතයෝ ද කුශලධර්මයන්හි සම්‍යක්ත්වනියාම සඞ්ඛ්‍යාත ආර්යමාර්ගයට බැසැගන්නට අභව්‍යයෝ ද මේ සත්ත්වයෝ අභව්‍යයෝ යි.

භව්‍යසත්ත්වයෝ කවරහ යත්: යම් සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් සමන්නාගත නො වූවාහු ක්ලෙශාවරණයෙන් සමන්නාගත නො වූවාහු විපාකාවරණයෙන් සමන්නාගත නො වූවාහු සැදැහැ ඇත්තාහු කර්තුකාම්‍යතාකුශලච්ඡන්ද ඇත්තාහු භවාඞ්ගප්‍රඥා ඇත්තාහු කුශලධර්මයන්හි සම්‍යක්ත්වනියාම සඞ්ඛ්‍යාත ආර්යමාර්ගයට බැසැගන්නට භව්‍ය වෙත් ද මේ සත්ත්වයෝ භව්‍යයෝ යි.

මේ තථාගතයන් වහන්සේගේ සත්ත්වයන් පිළිබඳ ආශය අනුශය දන්නා නුවණ යි.

ආශයානුශයඥානනිර්දෙශ යි.

# 70 යමකපාටිහීරඤාණං

කතමං තථාගතස්ස යමකපාටිහීරෙ ඤාණං.

ඉධ තථාගතො යමකපාටිහීරං කරොති අසාධාරණං සාවකෙහි. උපරිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, හෙට්ඨිමකායතො උදකධාරා පවත්තති; හෙට්ඨිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, උපරිමකායතො උදකධාරා පවත්තති; පුරත්ථිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, පච්ඡිමකායතො උදකධාරා පවත්තති; පච්ඡිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, පුරත්ථිමකායතො උදකධාරා පවත්තති; දක්ඛිණක්ඛිතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමක්ඛිතො උදකධාරා පවත්තති; වාමක්ඛිතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණක්ඛිතො උදකධාරා පවත්තති. දක්ඛිණකණ්ණසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමකණ්ණසොතතො උදකධාරා පවත්තති; වාමකණ්ණසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණකණ්ණසොතතො උදකධාරා පවත්තති, දක්ඛිණනාසිකාසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමනාසිකාසොතතො උදකධාරා පවත්තති; වාමනාසිකාසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණනාසිකාසොතතො උදකධාරා පවත්තති; දක්ඛිණංසකූටතො[1] අග්ගික්ඛන්ධො පවත්තති, වාමංසකූටතො[2] උදකධාරා පවත්තති; වාමංසකූටතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණංසකූටතො උදකධාරා පවත්තති; දක්ඛිණහත්ථතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමහත්ථතො උදකධාරා පවත්තති; වාමහත්ථතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණහත්ථතො උදකධාරා පවත්තති; දක්ඛිණපස්සතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමපස්සතො උදකධාරා පවත්තති; වාමපස්සතො අග්ගික්ඛන්ධො- පවත්තති, දක්ඛිණපස්සතො උදකධාරා පවත්තති; දක්ඛිණපාදතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමපාදතො උදකධාරා පවත්තති; වාමපාදතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණපාදතො උදකධාරා පවත්තති, අඞ්ගුලඞ්ගුලෙහි අග්ගික්ඛන්ධො පවත්තති, අඞ්ගුලන්තරිකාහි උදකධාරා පවත්තති; අඞ්ගුලන්තරිකාහි අග්ගික්ඛන්ධො පවත්තති, අඞ්ගුලඞ්ගුලෙහි උදකධාරා පවත්තති; එකෙකලොමතො අග්ගික්ඛන්ධො පවත්තති, එකෙකලොමතො උදකධාරා පවත්තති, ලොමකූපතො ලොමකූපතො අග්ගික්ඛන්ධො පවත්තති, ලොමකූපතො ලොමකූපතො උදකධාරා පවත්තති, ඡන්නං වණ්ණානං නීලානං පීතකානං ලොහිතකානං ඔදාතානං මඤ්ජිට්ඨානං[3] පභස්සරානං.

භගවා චඞ්කමති,* නිම්මිතො තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති. භගවා තිට්ඨති, නිම්මිතො චඞ්කමති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති; භගවා නිසීදති, නිම්මිතො චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා; නිම්මිතො චඞ්කමති, භගවා තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති; නිම්මිතො තිට්ඨති, භගවා චඞ්කමති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති; නිම්මිතො නිසීදති, භගවා චඞ්කමති වා තිට්ඨති වා සෙය්‍යං වා කප්පෙති; නිම්මිතො සෙය්‍යං කප්පෙති, භගවා චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වාති'.

ඉදං තථාගතස්ස යමකපාටිහීරෙ ඤාණං.

**යමකපටිහීරඤාණනිද්දෙසො**

---

1. දක්ඛිණමංසකූටතො - PTS, දක්ඛිණඅංස ... මජසං,
2. වාමමංසකූටතො - PTS, වාමඅංස ... මජසං, 3. මඤ්ජෙට්ඨානං - PTS,

*. පාළිපාඨදෙසො'ත්‍ර සබ්බා මුද්දිතපොත්ථකෙ විසදිසො දිස්සති.

## 70 යමකප්‍රාතිහාර්‍ය්‍යඥානය

තථාගතයන් වහන්සේගේ යමකප්‍රාතිහාර්‍ය්‍යඥානය කවරේ යත්:

මෙහි තථාගත තෙම ශ්‍රාවකයන් හා අසාධාරණ වූ යමකප්‍රාතිහාර්‍ය්‍යය කෙරෙයි. උඩුකයින් ගිනිකඳ පවත්වයි, යටිකයින් දියදහර පවත්වයි, යටිකයින් ගිනිකඳ පවත්වයි, උඩුකයින් දියදහර පවත්වයි; පෙරපසින් ගිනිකඳ පවත්වයි, පසුපසින් දියදහර පවත්වයි; පසුපසින් ගිනිකඳ පවත්වයි, පෙරපසින් දියදහර පවත්වයි; දකුණැසින් ගිනිකඳ පවත්වයි, වමැසින් දියදහර පවත්වයි; වමැසින් ගිනිකඳ පවත්වයි, දකුණැසින් දියදහර පවත්වයි; දකුණුකන්සිළින් ගිනිකඳ පවත්වයි, වම්කන්සිළින් දියදහර පවත්වයි; වම්කන්සිළින් ගිනිකඳ පවත්වයි, දකුණුකන්සිළින් දියදහර පවත්වයි; දකුණුනැහැසිළින් ගිනිකඳ පවත්වයි, වම්නැහැසිළින් දියදහර පවත්වයි; වම්නැහැසිළින් ගිනිකඳ පවත්වයි, දකුණුනැහැසිළින් දියදහර පවත්වයි; දකුණුදසරියෙන් ගිනිකඳ පවත්වයි, වම්දසරියෙන් දියදහර පවත්වයි; වම්දසරියෙන් ගිනිකඳ පවත්වයි, දකුණුදසරියෙන් දියදහර පවත්වයි; දකුණතින් ගිනිකඳ පවත්වයි, වමතින් දියදහර පවත්වයි; වමතින් ගිනිකඳ පවත්වයි, දකුණතින් දියදහර පවත්වයි; දකුණුපසින් ගිනිකඳ පවත්වයි, වම්පසින් දියදහර පවත්වයි; වම්පසින් ගිනිකඳ පවත්වයි, දකුණුපසින් දියදහර පවත්වයි; දකුණුපයින් ගිනිකඳ පවත්වයි, වම්පයින් දියදහර පවත්වයි; වම්පයින් ගිනිකඳ පවත්වයි, දකුණුපයින් දියදහර පවත්වයි; එකෙකි ඇඟිල්ලෙන් ගිනිකඳ පවත්වයි, ඇඟිලි අතුරින් දියදහර පවත්වයි; ඇඟිලි අතුරින් ගිනිකඳ පවත්වයි, එකෙකි ඇඟිල්ලෙන් දියදහර පවත්වයි; එකෙකි රෝමයෙන් ගිනිකඳ පවත්වයි, එකෙකි රෝමයෙන් දියදහර පවත්වයි; එකෙකි රෝමකූපයෙන් ගිනිකඳ පවත්වයි, එකෙකි රෝමකූපයෙන් දිය-දහර පවත්වයි; නීල යැ පීත යැ ලෝහිත යැ අවදාත යැ මාඤ්ජිෂ්ඨ යැ ප්‍රභාස්වර යැ යන ෂඩ්වර්ණයන්ගේ රශ්මිහු යුගව වැ පවතිත්.

බුදුහු සක්මන් කෙරෙති, නිර්මිත බුදුහු සිටිති හිඳිති ශයනය හෝ කෙරෙති; බුදුහු සිටිති, නිර්මිත බුදුහු සක්මන් කෙරෙති හිඳිති ශයනය හෝ කෙරෙති; බුදුහු හිඳිති, නිර්මිත බුදුහු සක්මන් කෙරෙති සිටිති ශයනය හෝ කෙරෙති; බුදුහු ශයනය කෙරෙති, නිර්මිත බුදුහු සක්මන් කෙරෙති සිටිති නිසීදනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු සක්මන් කෙරෙති, බුදුහු සිටිති හිඳිති ශයනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු සිටිති, බුදුහු සක්මන් කෙරෙති හිඳිති ශයනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු හිඳිති, බුදුහු සක්මන් කෙරෙති සිටිති ශයනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු ශයනය කෙරෙති, බුදුහු සක්මන් කෙරෙති සිටිති නිසී-දනය හෝ කෙරෙත් යයි.

මේ තථාගතයන් වහන්සේගේ යමකප්‍රාතිහාර්‍ය්‍යඥාන යි.

**යමකප්‍රාතිහාර්‍ය්‍යඥාන නිර්දෙශ යි.**

# 71. මහාකරුණාසමාපත්තිඤාණං

කතමං තථාගතස්ස මහාකරුණාසමාපත්තියා ඤාණං:

බහුකෙහි ආකාරෙහි පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති: 'ආදිත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'උය්‍යුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'පයාතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'කුම්මග්ගපටිපන්නො.[1] 'ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'උපනීයති ලොකො අද්ධුවො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'අතාණො[2] ලොකො අනභිස්සරො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'අස්සකො ලොකො සබ්බං පහාය ගමනීය'න්ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'අතායනො[3] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අලෙණො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අසරණො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අසරණීභූතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

'උද්ධතො ලොකො අවූපසන්තො'ති පස්සන්තානං -පෙ- 'සසල්ලො ලොකසන්නිවාසො විද්ධො පුථුසල්ලෙහි, තස්ස නත්‍ථඤ්ඤො කොචි සල්ලානං උද්ධාතා[4] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'අවිජ්ජන්ධකාරාවරණො ලොකසන්නිවාසො[5] කිලෙසපඤ්ජරපක්ඛිත්තො,[6] තස්ස නත්‍ථඤ්ඤො කොචි ආලොකං දස්සෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'අවිජ්ජාගතො ලොකසන්නිවාසො අණ්ඩභූතො[7] පරියොනද්ධො[8] තන්තාකුලකජාතො[9] ගුලාගුණ්ඨිකජාතො[10] මුඤ්ජබබ්බජභූතො[11] අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තතී'ති පස්සන්තානං -පෙ- 'අවිජ්ජාවිසදොසසංලිත්තො[12] ලොකසන්නිවාසො කිලෙසකලලීභූතො'ති[13] පස්සන්තානං -පෙ-

'රාගදොසමොහජටාජටිතො[14] ලොකසන්නිවාසො, තස්ස නත්‍ථඤ්ඤො කොචි ජටං විජටෙතා[15] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසඞ්ඝාටපටිමුක්කො[16] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාජාලෙන ඔත්‍ථටො[17] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසොතෙන වුය්හති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසංයොජනෙන සංයුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හානුසයෙන අනුසටො[18] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසන්තාපෙන සන්තප්පති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- තණ්හාපරිළාහෙන පරිඩය්හති[19] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

---

1. කුමග්ගපටිපන්නො - PTS, 2. අප්පතාණො - ස්‍යා, 3. අතාණො - PTS
4. උද්ධතා - මජ්සං, උද්ධත්තා - PTS, උද්ධරකො - සී 2, උද්ධුතා - ස්‍යා,
5. ...සන්නිවාසො අණ්ඩභූතො - මජ්සං, 6. පඤ්ජරං පක්ඛිත්තො - ස්‍යා,
7. අන්ධභූතො - PTS, 8. පරියොනන්ධො - PTS. 9. තන්තාකුලජාතො - ස්‍යා, PTS
10. කුලාගුණ්ඨිකජාතො-මජ්සං, ගුලාගුණ්ඨිකා - ස්‍යා 11. පබ්බජභූතො - PTS,
12. ...දොසසලිත්තො - PTS, 13. කිලෙසකලිභූතො - PTS,
14. මොහජටිතො - PTS. ස්‍යා 15. විජටිතා - ස්‍යා. PTS.
16. සඞ්ඝාතපටිමුක්කො - සී 1,2, 17. ඔත්තතො - PTS,
18. අනුසහගතො - PTS, සී 2. 19. පරිළිය්හති - PTS.

## 71 මහාකරුණාසමාපත්තිඥානය

තථාගතයන් වහන්සේගේ මහාකරුණාසමාපත්තිඥානය කවරේ යත්:

බහුප්‍රකාරයෙන් (නුවණැසින් හා බුදු ඇසින් හා) බලන්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී: ‘ලොකසන්නිවාසය තෙම (රාගාදීන් විසින්) ආදීප්ත යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලොකසන්නිවාසය තෙම (නොයෙක් කටයුත්තෙහි) උත්සාහ සහිත යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලොකසන්නිවාසය තෙම මරණයට නික්මැගියේ යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලොකසන්නිවාසය තෙම නො මඟට පිළිපන්නේ යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ලෝවැසි තෙම අස්ථිර වූයේ ජරාවශයෙන් මරණයට ගෙනයනු ලැබේ ය’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලෝවැසි තෙම අස්වසාලිය හැක්කෙක් නැත්තේ අනාරක්‍ෂක වූයේ යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලෝවැසි තෙම (අයැති යයි ගන්නාලද) සියල්ල හැරපියා යායුතු යැ (එහෙයින් මැ) තමා අයැතියක් නැත්තේ යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලෝවැසි තෙම තෘෂ්ණාවට දස වූයේ නො තිත් වූයේ ඌන වූයේ යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ‘ලොකසන්නිවාසය තෙම අනාරක්‍ෂක යැ’යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ලොකසන්නිවාසය තෙම නිශ්‍රය රහිත යැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම අසරණ යැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම අසරණ වූයේ යැ’යි දක්නා වූ ...

‘ලෝවැසි තෙම නො සන්හුන් වූයේ උද්ධත යැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම බොහෝ වූ හුලින් විදුනා ලද්දේ සශල්‍ය වූයේ යැ. මා තබා ඒ ලොකසන්නිවාසයාගේ හුල් උදුරන අන් කිසිවෙක් නැතැ’යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම කෙලෙස්මැදිරියෙහි බහාලනලද්දේ අවිද්‍යාන්ධකාර නැමැති ආවරණ ඇත්තේයැ, මා තබා ඒ ලොකසන්නිවාසයට ආලොකය දක්වනසුලු අන් කිසිවෙක් නැතැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම අවිද්‍යාවට පිවිසියේ අවිද්‍යාණ්ඩකොෂයෙහි උපන්නේ හාත්පසින් බඳනාලද්දේ හුවටක් සෙයින් ආකුල වූයේ ලිහිණිකසල්ලක් බදු වූයේ මුදුතණබබුස්තණ බදු වූයේ අය සඞ්ඛ්‍යාත සැපයෙන් පහවූ දුකට ගති වූ විවස වැ පතිත වන සසර නො ඉක්මේ’යයි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම අවිද්‍යා සඞ්ඛ්‍යාත විෂදොෂයෙන් මොනොවට තැවැරුණේ හටගත් කෙලෙස්කලල් ඇත්තේ යැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම රාගද්වෙෂමොහ සඞ්ඛ්‍යාත ජටායෙන් මැසුණේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසයාගේ (කෙලෙස්) ජටා සිඳුනා අන් කිසිවෙක් නැතැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණා නැමැති සඟුළුයෙහි පිවිසියේ යැ’යි දක්නා වූ ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණා නැමැති දැලින් හාත්පසින් වෙළන ලද්දේ යැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාස්‍රොතසින් අදනාලැබේ ය’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාසංයොජනයෙන් බඳනාලද්දැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණානුශයයෙන් අනුගත යැ’යි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාසන්තාපයෙන් තවනු ලැබේ’යයි දක්නා වූ ... ‘ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාපරිදාහයෙන් දවනුලැබේ’යයි දක්නා වූ ...

'දිට්ඨිසඞ්ඝාටපටිමුක්කො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- දිට්ඨිජාලෙන ඔත්ථටො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨිසොතෙන වුය්හති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨිසංයොජනෙන සඤ්ඤුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨානුසයෙන අනුසටො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨිසන්තාපෙන සන්තප්පති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- දිට්ඨිපරිළාහෙන පරිඩය්හති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

'ජාතියා අනුගතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ජරාය අනුසටො[1] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'බ්‍යාධිනා අභිභූතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- මරණෙන අබ්භාහතො[2] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- දුක්ඛෙ පතිට්ඨිතො[3] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

'තණ්හාය උඩ්ඩිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ජරාපාකාරපරික්ඛිත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'මච්චුපාසෙන[4] පරික්ඛිත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං පෙ- 'මහාබන්ධනබද්ධො[5] ලොකසන්නිවාසො රාගබන්ධනෙන දොසබන්ධනෙන මොහබන්ධනෙන මානබන්ධනෙන දිට්ඨිබන්ධනෙන කිලෙසබන්ධනෙන දුච්චරිතබන්ධනෙන, තස්ස නත්ථඤ්ඤො කොචි බන්ධනං මොචෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාසම්බාධපටිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි ඔකාසං දස්සෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාපලිබොධෙන පලිබුද්ධො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි පලිබොධං ඡෙත්තා[6] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාපපාතෙ පතිතො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි පපාතා උද්ධාතා[7] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාකන්තාරපටිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි කන්තාරං තාරෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාසංසාරපටිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි සංසාරමොචෙතා[8] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාවිදුග්ගෙ සම්පරිවත්තති ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි විදුග්ගා උද්ධාතා[7] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාපලිපෙ පලිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි පලිපා උද්ධාතා[7] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ-

'අබ්භාහතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ආදිත්තො ලොකසන්නිවාසො රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා ජාතියා ජරාමරණෙන[9] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, තස්ස නත්ථඤ්ඤො කොචි නිබ්බාපෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- උන්නීතකො[10] ලොකසන්නිවාසො හඤ්ඤති නිච්චමත්තාණො[11] පත්තදණ්ඩො

1 අනුසහගතො - PTS    2 අභිහතො - සයා, PTS
3 දුක්ඛපතිතො - සයා. PTS    4 පච්චුපාසෙන - PTS,    5 බන්ධො - PTS,
6 ඡොදිතා - මජසං, ඡෙදෙතා සයා, PTS.    7 උද්ධතා - මජසං. උද්ධත්තා සයා,
8 සංසාරා මොචෙතා - මජසං, PTS,    9 ජරාය මරණෙන - මජසං,
10 උන්නිතකො - සයා    11 නිච්චමත්තාණො - සයා

'ලෝකසන්නිවාසය තෙම දෘෂ්ටි නැමැති හගුළුයෙහි පිවිසියේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දෘෂ්ටිජාලයෙන් වෙළනලද්දැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දෘෂ්ටිස්‍රොතසින් අඳනාලැබේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දෘෂ්ටිසංයෝජනයෙන් බඳනාලද්දැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම දෘෂ්ට්‍යනුශයයෙන් අනුගත යැ'යි දක්නා වූ . ලෝකසන්නිවාසය තෙම දෘෂ්ටිසන්තාපයෙන් තැවේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දෘෂ්ටිපරිදාහයෙන් දැවේ'යයි දක්නා වූ ..

'ලෝකසන්නිවාසය තෙම ජාතියෙන් අනුගත වූයේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම ජරායෙන් ලුහුබඳනා ලදැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම ව්‍යාධියෙන් මඩනාලද්දේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම මරණයෙන් පහරන ලද්දේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දුකෙහි පිහිටියේ යැ'යි දක්නා වූ ...

'ලෝකසන්නිවාසය තෙම තෘෂ්ණායෙන් නඟනලද්දයේ යැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම ජරා නැමැති ප්‍රාකාරයෙන් පරික්‍ෂිප්ත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම මරණපාශයෙන් පරික්‍ෂිප්ත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම මහාබන්ධනයෙන් බැඳුණේ යැ රාගබන්ධනයෙන් ද්වේෂබන්ධනයෙන් මොහබන්ධනයෙන් මානබන්ධනයෙන් දෘෂ්ටිබන්ධනයෙන් ක්ලේශබන්ධනයෙන් දුශ්චරිතබන්ධනයෙන් බැඳුණේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසයාගේ බන්ධනය මුදනා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම මහත් වූ ක්ලේශසම්බාධයට පිළිපන්නේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසයට අවකාශ දක්වන අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම මහාපළිබොධයෙන් ඇවුරුණේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසයාගේ පළිබොධ සිඳුනා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම පඤ්චගති සඞ්ඛ්‍යාත මහාප්‍රපාතයෙහි වැටුණේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය ප්‍රපාතයෙන් නඟන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම (ජාත්‍යාදි) මහකතරට පිළිපන්නේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය කතර තරවන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම මහසසරට පිළිපන්නේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය සසරින් මුදන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සංසාර සඞ්ඛ්‍යාත මහාදුර්ගයෙහි පරිවර්තන වෙයි, මා තබා ඒ ලෝකසන්නිවාසය දුර්ගයෙන් නඟාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම මහමඩෙහි ලැගුණේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය මඩෙන් නඟාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ...

'ලෝකසන්නිවාසය තෙම (හැම උවදුරින්) මඩනාලද්දේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම රාගාග්නියෙන් ද්වේෂාග්නියෙන් මොහාග්නියෙන් ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුක්න් දෙම්නසින් දැඩිආයාසයෙන් ඇවිළගත්තේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය නිවාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම (ජාතිය විසින් ජරාදි උපද්‍රවයට) ඔසවාගෙනයනලද්දේ පැමිණි දඬුවම් ඇති සොර වූයේ නිරතුරු අනාරක්‍ෂක වැ පෙළේ යැ'යි

තක්කරො’ති පස්සන්තානං -පෙ- ‘වජ්ජබන්ධනබද්ධො ලොකසන්නිවාසො ආඝාතනපච්චුපට්ඨිතො, තස්ස නත්ථඤ්ඤො කොචි මොචෙතා[1] අඤ්ඤත්‍ර මයා’ති පස්සන්තානං -පෙ- ‘අනාථො ලොකසන්නිවාසො පරමකාපඤ්ඤප්පත්තො[2] තස්ස නත්ථඤ්ඤො කොචි තායෙතා[3] අඤ්ඤත්‍ර මයා’ති පස්සන්තානං -පෙ- ‘දුක්ඛාභිතුන්නො[4] ලොකසන්නිවාසො චිරරත්තපීළිතො’ති[5] පස්සන්තානං -පෙ- ‘නිච්චගධිතො[6] ලොකසන්නිවාසො නිච්චපිපාසිතො’ති[7] පස්සන්තානං -පෙ-

‘අන්ධො ලොකසන්නිවාසො අචක්ඛුකො’ති පස්සන්තානං -පෙ- ‘හතනෙත්තො ලොකසන්නිවාසො අපරිනායකො’ති පස්සන්තානං -පෙ- ‘විපථපක්ඛන්තො[8] ලොකසන්නිවාසො අඤ්ජසාපරද්ධො, තස්ස නත්ථඤ්ඤො කොචි අරියපථං ආනෙතා අඤ්ඤත්‍ර මයා’ති පස්සන්තානං -පෙ- ‘මහොඝපක්ඛන්තො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි ඔඝා උද්ධාතා[9] අඤ්ඤත්‍ර මයා’ති පස්සන්තානං -පෙ-

‘ද්වීහි දිට්ඨිගතෙහි පරියුට්ඨිතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘තීහි දුච්චරිතෙහි විප්පටිපන්නො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘චතූහි යොගෙහි යුත්තො[10] ලොකසන්නිවාසො චතුයොගයොජිතො’ති පස්සන්තානං -පෙ- ‘චතූහි ගන්ථෙහි ගන්ථිතො[11] ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘චතූහි උපාදානෙහි උපාදීයති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘පඤ්චගතිසමාරුළ්හො ලොකසන්නිවාසො’ති පස්සන්තනන්තානං -පෙ- ‘පඤ්චහි කාමගුණෙහි රජ්ජති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘පඤ්චහි නීවරණෙහි ඔත්ථටො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘ඡහි විවාදමූලෙහි විවදති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘ඡහි තණ්හාකායෙහි රජ්ජති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘ඡහි දිට්ඨිගතෙහි පරියුට්ඨිතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘සත්තහි අනුසයෙහි අනුසටො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘සත්තහි සංයොජනෙහි සඤ්ඤුත්තො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘සත්තහි මානෙහි උන්නතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘අට්ඨහි ලොකධම්මෙහි සම්පරිවත්තති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘අට්ඨහි මිච්ඡත්තෙහි නිය්‍යාතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘අට්ඨහි පුරිසදොසෙහි දුස්සති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘නවහි ආඝාතවත්ථූහි ආඝාතිතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘නවවිධමානෙහි උන්නතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘නවහි තණ්හාමූලකෙහි ධම්මෙහි රජ්ජති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘දසහි කිලෙසවත්ථූහි කිලිස්සති ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘දසහි ආඝාතවත්ථූහි ආඝාතිතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘දසහි අකුසලකම්මපථෙහි සමන්නාගතො ලොසකන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘දසහි සඤ්ඤොජනෙහි සඤ්ඤුත්තො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ-

---

1. බන්ධනං මොචෙතා - මජසං, 2. පරමකාරුඤ්ඤප්පත්තො - මජසං, සයා PTS
3 තායිතා - තායිතාති වා පාඨො සුන්දරො - ස. (අට්ඨකථා)
4. දුක්ඛාභිතුණ්ණො PTS ස 5 චිරරත්තං පීළිතො - මජසං 6. ගධිතො - මජසං
7. නිච්චං පිපාසිතො මජසං 8 පක්ඛන්දො - මජසං, පක්ඛන්තො - බහුසු
9. උද්ධතා - මජසං. PTS, උද්ධත්තා - සයා' 10 පූරිතො - සයා,
11 ගණ්ඨෙහි ගණ්ඨිතො - සයා

දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම (රාගාදී) වන්‍ධබන්ධනයෙන් බඳනා-ලදුයේ දම්ගෙඩිය කරා එළඹ සිටියේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය මුදලන අන් කිසිවෙක් නැතැ' යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අනාථ වූයේ පරම දිළිඳු බවට පැමිණියේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය රක්නා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ .. 'ලෝක-සන්නිවාසය තෙම දුකින් පෙළනලදුයේ දිගුකලක් පෙළුණේ යැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම (තෘෂ්ණායෙන්) නිරතුරු ගිජු වූයේ නිරතුරු හටගත් පවස් ඇත්තේ යැ'යි දක්නා වූ ...

'ලෝකසන්නිවාසය තෙම (ප්‍රඥාවගේ අභාවයෙන්) අන්ධ වූයේ යැ ඇස් නැත්තේ යැ'යි දක්නා වූ .. ලෝකසන්නිවාසය තෙම නට ඇස් ඇත්තේ පරිනායකයකු රහිත වූයේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නි-වාසය තෙම විපරීතමාර්ගයට බටුයේ ඍජුමාර්ගයෙහි වැරැද්දේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය ආර්යමාර්ගයට ගෙන එන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ 'ලෝකසන්නිවාසය තෙම (කාමාදී) මහාඔඝයට පිවිසියේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය ඔඝයෙන් නගාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ...

'ලෝකසන්නිවාසය තෙම (ශාශ්වත-උච්ඡෙද) දෘෂ්ටි දෙකින් පර්‍යුත්ථිත වූයේ (හාත්පසින් ගෙන සිටියේ) යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම තුන් දුශ්චරිතයන් විසින් විප්‍රතිපන්න යැ'යි දක්නා වූ ... ලෝක-සන්නිවාසය තෙම (කාමාදී) සතර යොගයන් ගෙන් යුක්ත වූයේ සතර යොගයන් විසින් බඳනා ලද්දේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සතර ග්‍රන්‍ථයන් විසින් ගෙතුණේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නි-වාසය තෙම සතර උපාදානයන් විසින් දැඩි කොට ගන්නාලැබේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම පඤ්චගතියට සමාරූඪ වූයේ යැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම පඤ්චකාමගුණයන් විසින් රඳනා ලැබේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම පඤ්චනීවරණයන් විසින් වතුරුවනලද'යි දක්නා වූ . ලෝකසන්නිවාසය තෙම සවැදෑරුම් විවාදමූලයන්ගෙන් විවාද කෙරේ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම සවැදෑරුම් තෘෂ්ණාකායයෙන් ඇලේ'යයි දක්නා වූ ... 'ලෝක-සන්නිවාසය තෙම ෂඩ්දෘෂ්ටීන් විසින් පර්‍යුත්ථිත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සප්ත අනුශයයන් විසින් ලුහුබඳනාලද යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සත් සංයොජනයන් විසින් සංයුක්ත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සප්තවිධ මානයන් විසින් උන්නත වූයේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අෂ්ට-ලෝකධර්මයෙන් පෙරළේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අෂ්ටමිථ්‍යාත්වයෙන් නියන්‍ත්‍රිත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අටවැදෑරුම් පුරුෂදෝෂයෙන් දූෂ්‍ය වේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නි-වාසය තෙම නවවිධ ආඝාතවස්තුයෙන් ගැටුණේ යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම නවවිධ මානයෙන් උන්නත වූයේ යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම නව තෘෂ්ණාමූලකධර්මයන්ගෙන් ඇලේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශ ක්ලේශවස්තුයෙන් කෙලෙසේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශආඝාතවස්තුයෙන් ගැටුණේ යැ'යි දක්නා වූ 'ලෝකසන්නිවාසය තෙම දශඅකුශලකර්මපථයෙන් සමන්වා-ගත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශ සංයොජනයෙන්

දසහි මිච්ඡත්තෙහි නිය්‍යාතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දසවත්ථුකාය මිච්ඡාදිට්ඨියා සමන්නාගතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දසවත්ථුකාය අන්තග්ගාහිකාය[1] දිට්ඨියා සමන්නාගතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අට්ඨසතතණ්හාපපඤ්චසතෙහි පපඤ්චිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ද්වාසට්ඨියා දිට්ඨිගතෙහි පරියුට්ඨිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති.

'අහඤ්චම්හි තිණ්ණො, ලොකො ච අතිණ්ණො; අහඤ්චම්හි මුත්තො, ලොකො ච අමුත්තො; අහඤ්චම්හි දන්තො, ලොකො ච අදන්තො; අහඤ්චම්හි සන්තො, ලොකො ච අසන්තො; අහඤ්චම්හි අස්සත්ථො, ලොකො ච අනස්සත්ථො; අහඤ්චම්හි පරිනිබ්බුතො, ලොකො ච අපරිනිබ්බුතො. පහොමි ඛ්වාහං තිණ්ණො තාරෙතුං, මුත්තො මොචෙතුං, දන්තො දමෙතුං, සන්තො සමෙතුං, අස්සත්ථො අස්සාසෙතුං, පරිනිබ්බුතො පරිනිබ්බාපෙතු'න්ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති.

ඉදං තථාගතස්ස මහාකරුණාසමාපත්තියා ඤාණං.

**මහාකරුණාසමාපත්තිඤාණ නිද්දෙසො.**

## 72-73. සබ්බඤ්ඤුත-අනාවරණඤාණානි

**කතමං** තථාගතස්ස සබ්බඤ්ඤුතඤාණං:

සබ්බං සඞ්ඛතමසඞ්ඛතං[2] අනවසෙසං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.[3]

අතීතං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

අනාගතං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

පච්චුප්පන්නං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

චක්ඛුඤ්චෙව[4] රූපා ච එතං සබ්බං[5] ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං, සොතඤ්චෙව සද්දා ච -පෙ- ඝානඤ්චෙව ගන්ධා ච -පෙ- ජිව්හා චෙව රසා ච -පෙ- කායො චෙව ඵොට්ඨබ්බා ච -පෙ- මනො චෙව ධම්මා ච එතං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

---

1 අන්තග්ගාහිකදිට්ඨියා - සී 1 2 සබ්බසඞ්ඛතමසඞ්ඛතං - ස්‍යා, සී 2
5 අනාවරණං ඤාණං - ස්‍යා 4 චක්ඛු චෙව - මජසං 5 එවං තං සබ්බං - මජසං

බැඳුණේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දශවිධමිථ්‍යාත්වයන් විසින් නියමිත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්විත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දශවස්තුක වූ අන්තග්‍රාහිකදෘෂ්ටියෙන් සමන්විත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම 'අටතුරාසියකැ'යි සලකනලද තෘෂ්ණාප්‍රපඤ්ච-සතයෙන් ප්‍රපඤ්ච කරනලද්දේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දෙසැටම්සදිටුයෙන් පයුඹිත්ථිත යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවර-යන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී.

මම් වූකලි තරණය කෙළෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් තරණය නො කෙළේ යැ, මම් වූකලි මිදුණෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො මිදුණේ යැ; මම් වූකලි දැමුණෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො දැමුණේ යැ; මම් වූකලි සිහිල් වූයෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො සිහිල් වූයේ යැ; මම් වූකලි අස්වැසුණෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො අස්වැසුණේ යැ; මම් වූකලි පිරිනිවියෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො පිරිනිවියේ යැ; එහෙයින් මම් තරණය කෙළෙම් මෙරමා තරවන්නට, මිදුනෙම් මෙරමා මුදන්නට, දැමුණෙම් මෙරමා දමන්නට, සිහිල් වූයෙම් මෙරමා සිහිල් කරන්නට, අස්වැසුණෙම් මෙරමා අස්වසාලන්නට, පිරිනිවියෙම් මෙරමා පිරිනිවාලන්නට සමර්ථයෙමි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී.

මේ තථාගතයන් වහන්සේගේ මහාකරුණාසමාපත්තියෙහි ඥාන යි.

**මහාකරුණාසමාපත්තිඥානනිර්දේශ යි.**

## 72–73 සර්වඥතා – අනාවරණඥානයෝ

තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥානය කවරේ යත්:

හැම සඞ්ඛතය අසඞ්ඛතය නිරවශෙෂ කොට දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

අතීත වූ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

අනාගත වූ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

ප්‍රත්‍යුත්පන්න වූ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණ-යෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

ඇස ද රූපයෝ ද යන මෙල සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ. සොත ද ශබ්දයෝ ද ... නැහැය ද ගන්ධයෝ ද ... දිව ද රසයෝ ද ... කය ද ස්ප්‍රෂ්ටව්‍යයෝ ද ... මනස ද ධර්මයෝ ද යන මෙල සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යාවතා අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං. යාවතා රූපස්ස අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං. යාවතා වේදනාය -පෙ- යාවතා සඤ්ඤාය -පෙ- යාවතා සඞ්ඛාරානං -පෙ- යාවතා විඤ්ඤාණස්ස -පෙ- යාවතා චක්ඛුස්ස -පෙ- යාවතා ජරාමරණස්ස අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං, යාවතා පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨං -පෙ- යාවතා පහානස්ස[1] පහානට්ඨං -පෙ- යාවතා භාවනාය භාවනට්ඨං -පෙ- යාවතා සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨං -පෙ-

යාවතා ඛන්ධානං ඛන්ධට්ඨං -පෙ- යාවතා ධාතූනං ධාතුට්ඨං -පෙ- යාවතා ආයතනානං ආයතනට්ඨං -පෙ- යාවතා සඞ්ඛතානං සඞ්ඛතට්ඨං -පෙ- යාවතා අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා කුසලෙ ධම්මෙ සබ්බං* ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං. යාවතා අකුසලෙ ධම්මෙ -පෙ- යාවතා අබ්‍යාකතෙ ධම්මෙ -පෙ-

යාවතා කාමාවචරෙ ධම්මෙ -පෙ- යාවතා රූපාවචරෙ ධම්මෙ -පෙ- යාවතා අරූපාවචරෙ ධම්මෙ -පෙ- යාවතා අපරියාපන්නෙ ධම්මෙ සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨං -පෙ- යාවතා සමුදයස්ස සමුදයට්ඨං -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨං -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨං -පෙ- යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨං -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨං -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං -පෙ- යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණ ඤාණං.

---

1 පහානාය - සං.

* "සබ්බ ජානාතීති බහුවචනපාඨයා සුන්දරො, එකවචනෙසාතෙ පනිනන්තා පන පොත්ථකෙසු එකවචනෙනෙව ලිඛිතං" යනු අට්ඨවායි.

යම්තාක් අනිත්‍යස්වභාව දුඃඛස්වභාව අනාත්මස්වභාව වේ ද ඒ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ, යම්තාක් රූපයාගේ අනිත්‍යස්වභාව දුඃඛස්වභාව අනාත්මස්වභාව වේ ද ඒ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ. යම්තාක් වේදනාවගේ ... යම්තාක් සංඥාවගේ ... යම්තාක් සංස්කාරයන්ගේ ... යම්තාක් විඥානයාගේ ... යම්තාක් චක්ෂුස්හුගේ ... යම්තාක් ජරාමරණයාගේ අනිත්‍ය ස්වභාව දුඃඛස්වභාව අනාත්මස්වභාව වේ ද ඒ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් අභිඥාවගේ අභිඥාස්වභාව වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ. යම්තාක් පරිඥාවගේ පරිඥාස්වභාව වේ ද ... යම්තාක් ප්‍රහාණයාගේ ප්‍රහාණස්වභාව .. යම්තාක් භාවනාවගේ භාවනාස්වභාව ... යම්තාක් සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාස්වභාව ...

යම්තාක් ස්කන්ධයන්ගේ ස්කන්ධස්වභාව ... යම්තාක් ධාතූන්ගේ ධාතුස්වභාව ... යම්තාක් ආයතනයන්ගේ ආයතනස්වභාව ... යම්තාක් සඞ්ඛතයන්ගේ සඞ්ඛතස්වභාව ... යම්තාක් අසඞ්ඛතයාගේ අසඞ්ඛත ස්වභාව වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් කුශලධර්මය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි ආවරණඥාන යැ. යම්තාක් අකුශලධර්මය ... යම්තාක් අව්‍යාකෘතධර්මය ...

යම්තාක් කාමාවචරධර්මය ... යම්තාක් රූපාවචරධර්මය ... යම්තාක් අරූපාවචරධර්මය ... යම්තාක් අපර්‍යාපන්නධර්මය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් දුඃඛයාගේ දුඃඛස්වභාව ... යම්තාක් සමුදයාගේ සමුදය ස්වභාව ... යම්තාක් නිරෝධයාගේ නිරෝධස්වභාව ... යම්තාක් මාර්ගයාගේ මාර්ගස්වභාවය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් අර්ථපටිසම්භිදාවගේ අර්ථපටිසම්භිදා ස්වභාව ... යම්තාන් ධම්මපටිසම්භිදාවගේ ධම්මපටිසම්භිදා ස්වභාව ... යම්තාක් නිරුත්තිපටිසම්භිදාවගේ නිරුත්තිපටිසම්භිදා ස්වභාව ... යම්තාක් පටිභානපටිසම්භිදාවගේ පටිභානපටිසම්භිදාස්වභාව වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් ඉන්ද්‍රියපරාවරතාඥානය ... යම්තාක් සත්ත්වයන්ගේ ආශයානුශයඥානය ... යම්තාක් යමකප්‍රාතිහාර්‍යඥානය ... යම්තාක් මහාකරුණාසමාපත්තිඥානය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යාවතා සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්‍ථ ආවරණං නත්‍ථීති අනාවරණ ඤාණං.

1. ‘න තස්ස අද්දිට්ඨමිධත්‍ථි[1] කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්‍ථි නෙය්‍යං[2]
තථාගතො තෙන සමන්තචක්ඛූ’ති.

සමන්තචක්ඛූති කෙනට්ඨෙන සමන්තචක්ඛු:

චුද්දස බුද්ධඤාණානි: දුක්ඛෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං බුද්ධඤාණං, අත්‍ථපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, ධම්ම-පටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, නිරුත්තිපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං බුද්ධඤාණං, ආසයානුසයෙ ඤාණං බුද්ධඤාණං, යමකපාටිහීරෙ ඤාණං බුද්ධඤාණං, මහාකරුණාසමාපත්තියා ඤාණං බුද්ධඤාණං, සබ්බඤ්ඤුතඤාණං බුද්ධඤාණං, අනාවරණඤාණං බුද්ධඤාණං, ඉමානි චුද්දස බුද්ධඤාණානි. ඉමෙසං චුද්දසන්නං බුද්ධඤාණානං අට්ඨ ඤාණානි සාවකසාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො සබ්බො ඤාතො, අඤ්ඤාතො දුක්ඛට්ඨො නත්‍ථීති සබ්බඤ්ඤුතඤාණං. තත්‍ථ ආවරණං නත්‍ථීති අනාවරණඤාණං.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො සබ්බො දිට්ඨො -පෙ- සබ්බො විදිතො -පෙ- සබ්බො සච්ඡිකතො -පෙ- සබ්බො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය දුක්ඛට්ඨො නත්‍ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්‍ථ ආවරණං නත්‍ථීති අනාවරණ ඤාණං.

යාවතා සමුදයස්ස සමුදයට්ඨො -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨො -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨො -පෙ- යාවතා අත්‍ථපටිසම්භිදාය අත්‍ථපටිසම්භිදට්ඨො -පෙ- යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨො -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨො -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨො සබ්බො ඤාතො -පෙ- සබ්බො දිට්ඨො -පෙ- සබ්බො විදිතො -පෙ- සබ්බො සච්ඡිකතො -පෙ- සබ්බො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය පටිභානපටිසම්භිදට්ඨො නත්‍ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්‍ථ ආවරණං නත්‍ථීති අනාවරණඤාණං.

යම්තාක් මරුන් සහිත වූ බඹුන් සහිත වූ සදෙවක ලෝකයා විසින් මහණබමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත ප්‍රජාව විසින් දක්නාලද රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මා-යතනයෙක් පැමිණෙනලද රූපාදියෙක් සොයනලද රූපාදියෙක් මනසින් විමසනලද රූපාදියෙක් වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුක ලෝකයෙහි (මෙකල හෝ) පැනැසින් නුදුටු කිසිවෙක් නැත. යළි (අතීත වූ) නො දත් කිසිවෙක් නැත, (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැත, දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබොධ කළහ. එහෙයින් තථාගතයෝ සමන්තචක්ඛු වූහ.

**සමන්තචක්ඛු** යනු: කවර අර්ථයෙන් සමන්තචක්ඛු වේ ද යත්:

බුද්ධඥාන තුදුසෙකි: දුඃඛසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛසමුදය සත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛනිරොධසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ අත්ථපටිසම්භිදා-යෙහි ඥානය බුද්ධඥාන යැ ධම්මපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ නිරුත්තිපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ පටිභානපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ ඉන්ද්‍රියපරාවරාතාඥානය බුද්ධඥාන යැ ආශයානුශය-ඥානය බුද්ධඥාන යැ යමකප්‍රාතිහාර්‍ය්‍යඥානය බුද්ධඥාන යැ මහාකරුණා-සමාපත්තියෙහි ඥානය බුද්ධඥාන යැ සර්වඥතාඥානය බුද්ධඥාන යැ අනා-වරණඥානය බුද්ධඥාන යි. මොහු තුදුස් බුද්ධඥානයෝ යි. මේ තුදුස් බුද්ධඥානයන් අතුරෙන් ඥානයෝ අටදෙනෙක් ශ්‍රාවකසාධාරණ වෙති. ඥානයෝ සදෙනෙක් ශ්‍රාවකයන් හා සමග අසාධාරණ වෙත්.

යම්තාක් දුඃඛයාගේ දුඃඛස්වභාවයෙක් වේ ද සියල්ල නුවණින් දත්නාලද්දේ යැ අඥාත වූ දුඃඛස්වභාවයෙක් නැත් නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් දුඃඛයාගේ දුඃඛස්වභාවයෙක් වේ ද සියල්ල (ඇසින් මෙන් නුවණින්) දක්නා ලද්දේ යැ ... සියල්ල ප්‍රකට කොට දත්නාලද්දේ යැ ... සියල්ල සාක්ෂාත් කරනලද්දේ යැ ... සියල්ල නුවණින් ස්පර්ශ කරනලද්දේ යැ, නුවණින් ස්පර්ශ නො කරනලද දුඃඛාර්ථයෙක් නැත් නු යි සර්වඥතා-ඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් සමුදයාගේ සමුදයස්වභාවයෙක් ... යම්තාක් නිරොධයාගේ නිරොධස්වභාවයෙක් ... යම්තාක් මාර්ගයාගේ මාර්ගස්වභාවයෙක් ... යම්තාක් අත්ථපටිසම්භිදාවගේ අත්ථපටිසම්භිදාස්වභාවයෙක් ... යම්තාක් ධම්මපටි-සම්භිදාවගේ ධම්මපටිසම්භිදාස්වභාවයෙක් ... යම්තාක් නිරුත්තිපටිසම්භි-දාවගේ නිරුත්තිපටිසම්භිදාස්වභාවයෙක් ... යම්තාක් පටිභානපටිසම්භිදා-වගේ පටිභානපටිසම්භිදා ස්වභාවයෙක් වේ ද සියල්ල නුවණින් දත්නා ලද්දේ යැ – සියල්ල නුවණින් දක්නාලද්දේ යැ – සියල්ල ප්‍රකට කොට දත්නාලද්දේ යැ – සියල්ල සාක්ෂාත් කරනලද්දේ යැ – සියල්ල නුවණින් ස්පර්ශ කරනලද්දේ යැ – නුවණින් ස්පර්ශ නො කරනලද පටිභානපටි-සම්භිදාස්වභාවයෙක් නැත් නු යි සර්වඥතාඥාන යැ. එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං -පෙ- යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං සබ්බං ඤාතං -පෙ- සබ්බං දිට්ඨං -පෙ- සබ්බං විදිතං -පෙ- සබ්බං සච්ඡිකතං -පෙ- සබ්බං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය මහාකරුණාසමාපත්තියා ඤාණං නත්ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං ඤාතං -පෙ- සබ්බං දිට්ඨං -පෙ- සබ්බං විදිතං -පෙ- සබ්බං සච්ඡිකතං -පෙ- සබ්බං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය නත්ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛූ’ති.

සබ්බඤ්ඤුතඤාණනිද්දෙසො.

ඤාණකථාසමත්තා.

යම්තාක් ඉන්ද්‍රියපරොපරියත්තඥනයෙක් ... යම්තාක් සත්ත්වයන්ගේ ආශයානුශයඥනයෙක් ... යම්තාක් යමකප්‍රාතිහාර්‍ය්‍යඥනයෙක් ... යම්තාක් මහාකරුණාසමාපත්තිඥනයෙක් වේ ද සියල්ල නුවණින් දන්නාලද යෑ ... සියල්ල නුවණින් දක්නාලද යෑ ... සියල්ල ප්‍රකට කොට දන්නා ලද යෑ ... සියල්ල සාක්‍ෂාත් කරනලද යෑ ... සියල්ල නුවණින් සපර්ශ කරනලද යෑ. නුවණින් සපර්ශ නො කරනලද මහාකරුණාසමාපත්තිඥනයෙක් නැත් නු යි සර්වඥතාඥන යෑ. එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥන යි.

යම්තාක් මරුන් සහිත වූ බඹුන් සහිත වූ සදෙවකලොකයා විසින් මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත ප්‍රජාව විසින් දක්නා ලද රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්‍ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මායතනයෙක් පැමිණෙනලද රූපාදියෙක් සොයනලද රූපාදියෙක් මනසින් විමසනලද රූපාදියෙක් වේ ද සියල්ල නුවණින් දන්නාලද යෑ ... සියල්ල නුවණින් දක්නාලද යෑ ... සියල්ල ප්‍රකට කොට දක්නාලද යෑ ... සියල්ල සාක්‍ෂාත් කරනලද යෑ ... සියල්ල නුවණින් සපර්ශ කරනලද යෑ. නුවණින් සපර්ශ නො කරන ලද රූපාදියෙක් නැත් නු යි සර්වඥතාඥන යෑ. එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥන යි.

ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලොකයෙහි (මෙකල හෝ) පැනැසින් නුදුටු කිසිවෙක් නැත. යළි (අතීත වූ) නො දත් කිසිවෙක් නැත. (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබොධ කළහ, එහෙයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' වූහ'යි.

**සර්වඥතාඥනනිර්දේශ යි.**

**ඥානකථා නිමි.**

# 2

# දිට්ඨිකථා

කා දිට්ඨි[1] කති දිට්ඨිට්ඨානානි, කති දිට්ඨිපරියුට්ඨානානි, කති දිට්ඨියො, කති දිට්ඨාභිනිවෙසා, කතමො දිට්ඨිට්ඨානසමුග්ඝාතොති.

1. **කාදිට්ඨීති**: අභිනිවෙසපරාමාසො දිට්ඨි[2].

2. **කතිදිට්ඨිට්ඨානානීති**: අට්ඨ දිට්ඨිට්ඨානානි.

3. **කතිදිට්ඨිපරියුට්ඨානානීති**: අට්ඨාරස දිට්ඨිපරියුට්ඨානානි,

4. **කතිදිට්ඨියොති**: සොළස දිට්ඨියො.

5. **කතිදිට්ඨාභිනිවෙසාති**: තීණි සතං[3] දිට්ඨාභිනිවෙසා,

6. **කතමො දිට්ඨිට්ඨානසමුග්ඝාතොති**: සොතාපත්තිමග්ගො දිට්ඨිට්ඨානසමුග්ඝාතො.

කථං[4] අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙස පරාමාසො දිට්ඨි, වෙදනං 'එතං මම -පෙ- සඤ්ඤං එතං මම -පෙ- සඞ්ඛාරෙ 'එතං මම -පෙ- විඤ්ඤාණං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තාති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුං එතං මම -පෙ- සොතං එතං මම -පෙ- ඝානං එතං මම -පෙ- ජිව්හං එතං මම -පෙ- කායං එතං මම -පෙ- මනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, රූපෙ[5] එතං මම -පෙ- සද්දෙ එතං මම -පෙ- ගන්ධෙ එතං මම -පෙ- රසෙ එතං මම -පෙ- ඵොට්ඨබ්බෙ එතං මම -පෙ- ධම්මෙ 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුවිඤ්ඤාණං එතං මෙ -පෙ- සොතවිඤ්ඤාණං එතං මම -පෙ- ඝානවිඤ්ඤාණං එතං මම -පෙ- ජිව්හාවිඤ්ඤාණං එතං මම -පෙ- කායවිඤ්ඤාණං එතං මම -පෙ- මනොවිඤ්ඤාණං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුසම්ඵස්සං එතං මම -පෙ- සොතසම්ඵස්සං එතං මම -පෙ- ඝානසම්ඵස්සං එතං මම -පෙ- ජිව්හාසම්ඵස්සං එතං මම -පෙ- කායසම්ඵස්සං එතං මම -පෙ- මනොසම්ඵස්සං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

---

1. කාදිට්ඨීති - සයා, කම්. 2. කති අභිනිවෙසපරාමාසො දිට්ඨි - සයා
3. තිංසසතං - සයා 4. කති - සයා 5. රූපං සද්දං (ඉමිනා) - සයා, සී 1. 2.

2

# දෘෂ්ටිකථා

දෘෂ්ටි කවර යෑ, දෘෂ්ටිකාරණයෝ කෙතෙකැ, දෘෂ්ටිපර්‍ය්‍යුත්ථානයෝ කෙතෙකැ, දෘෂ්ටිහු කෙතෙකැ, දෘෂ්ට්‍යභිනිවේශයෝ කෙතෙකැ, දෘෂ්ටිකාරණ-සමුද්ඝාතය කවරේ යත්:

1. **දෘෂ්ටිය කවර** යනු: අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ.

2. **දෘෂ්ටිකාරණයෝ කෙතෙකැ** යනු: දෘෂ්ටිකාරණයෝ අටදෙනෙකි.

3. **දෘෂ්ටිපර්‍ය්‍යුත්ථානයෝ කෙතෙකැ** යනු: දෘෂ්ටිපර්‍ය්‍යුත්ථානයෝ අට-ළොස්දෙනෙකි.

4. **දෘෂ්ටිහු කෙතෙකැ** යනු: දෘෂ්ටිහු සොළොස්දෙනෙකි.

5. **දෘෂ්ට්‍යභිනිවේශයෝ කෙතෙකැ** යනු: දෘෂ්ට්‍යභිනිවේශ තුන්-සියයෙකි.

6. **දෘෂ්ටිකාරණසමුද්ඝාතය කවරේ** යනු සෝවාන්මාර්ගය දෘෂ්ටි-කාරණසමුද්ඝාතය වේ.

කිසෙයින් අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි වෙයි යත්:

රූපය 'තෙල මාගේ යෑ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යෑ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ. වේදනාව 'තෙල මාගේ යෑ ... සංඥාව 'තෙල මාගේ යෑ ... සංස්කාර 'තෙල මාගේ යෑ ... විඥානය 'තෙල මාගේ යෑ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යෑ'යි අභිනිවේශපරා-මර්ශය දෘෂ්ටි යෑ.

චක්‍ෂුස 'තෙල මාගේ යෑ ශ්‍රොත්‍රය 'තෙල මාගේ යෑ ... ඝ්‍රාණය 'තෙල මාගේ යෑ ... ජිහ්වාව 'තෙල මාගේ යෑ ... කාය 'තෙල මාගේ යෑ ... මනස 'තෙල මාගේ යෑ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යෑ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ. රූපයන් 'තෙල මාගේ යෑ ... ශබ්දයන් 'තෙල මාගේ යෑ .. ගන්ධයන් ,තෙල මාගේ යෑ ... රසයන් 'තෙල මාගේ යෑ ... ස්ප්‍රෂ්ටව්‍යයන් තෙල මාගේ යෑ ... ධර්මයන් 'තෙල මාගේ යෑ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යෑ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ.

චක්‍ෂුර්විඥානය 'තෙල මාගේ යෑ ... ශ්‍රොත්‍රවිඥානය 'තෙල මාගේ යෑ ... ඝ්‍රාණවිඥානය 'තෙල මාගේ යෑ ... ජිහ්වාවිඥානය 'තෙල මාගේ යෑ ... කායවිඥානය 'තෙල මාගේ යෑ ... මනොවිඥානය 'තෙල මාගේ යෑ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යෑ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ.

චක්ඛුසම්ඵස්සය 'තෙල මාගේ යෑ . සොතසම්ඵස්සය 'තෙල මාගේ යෑ ... ඝානසම්ඵස්සය 'තෙල මාගේ යෑ ... ජිව්හාසම්ඵස්සය 'තෙල මාගේ යෑ ... කායසම්ඵස්සය 'තෙල මාගේ යෑ ... මනොසම්ඵස්සය 'තෙල මාගේ යෑ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යෑ'යි අභිනිවේශ පරාමර්ශය දෘෂ්ටි යෑ.

චක්ඛුසම්ඵස්සජං වේදනං එතං මම -පෙ- සොතසම්ඵස්සජං වේදනං -පෙ- ඝානසම්ඵස්සජං වේදනං -පෙ- ජිව්හාසම්ඵස්සජං වේදනං -පෙ- කායසම්ඵස්සජං වේදනං -පෙ- මනොසම්ඵස්සජං වේදනං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපසඤ්ඤං එතං මම -පෙ- සද්දසඤ්ඤං එතං මම -පෙ- ගන්ධසඤ්ඤං එතං මම -පෙ- රසසඤ්ඤං එතං මම -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤං එතං මම -පෙ- ධම්මසඤ්ඤං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපසඤ්චෙතනං එතං මම -පෙ- සද්දසඤ්චෙතනං එතං මම -පෙ- ගන්ධසඤ්චෙතනං එතං මම -පෙ- රසසඤ්චෙතනං එතං මම -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනං එතං මම-පෙ- ධම්මසඤ්චෙතනං 'එතං මම එසො හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපතණ්හං එතං මම -පෙ- සද්දතණ්හං එතං මම -පෙ- ගන්ධතණ්හං එතං මම -පෙ- රසතණ්හං එතං මම -පෙ- ඵොට්ඨබ්බතණ්හං එතං මම -පෙ- ධම්මතණ්හං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපවිතක්කං එතං මම -පෙ- සද්දවිතක්කං එතං මම -පෙ- ගන්ධවිතක්කං එතං මම -පෙ- රසවිතක්කං එතං මම -පෙ- ඵොට්ඨබ්බවිතක්කං එතං මම -පෙ- ධම්මවිතක්කං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපවිචාරං එතං මම -පෙ- සද්දවිචාරං එතං මම -පෙ- ගන්ධවිචාරං එතං මම -පෙ- රසවිචාරං එතං මම -පෙ- ඵොට්ඨබ්බවිචාරං එතං මම -පෙ- ධම්මවිචාරං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

පඨවිධාතුං එතං මම -පෙ- ආපොධාතුං එතං මම -පෙ- තෙජොධාතුං එතං මම -පෙ- වායොධාතුං එතං මම -පෙ- ආකාසධාතුං එතං මම -පෙ- විඤ්ඤාණධාතුං 'එතං මම, එසො 'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

පඨවිකසිණං එතං මම -පෙ- ආපොකසිණං -පෙ- තෙජොකසිණං -පෙ- වායොකසිණං-පෙ- නීලකසිණං -පෙ- පීතකසිණං -පෙ- ලොහිතකසිණං -පෙ- ඔදාතකසිණං -පෙ- ආකාසකසිණං -පෙ- විඤ්ඤාණකසිණං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව 'තෙල මාගේ යැ ... සොත-සම්ඵස්සයෙන් උපන් වෙදනාව ... ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... කායසම්ඵස්සයෙන් උපන් වෙද-නාව ... මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපසංඥාව 'තෙල මාගේ යැ ... ශබ්දසංඥාව තෙල මාගේ යැ ... ගන්ධසංඥාව 'තෙල මාගේ යැ ... රසසංඥාව 'තෙල මාගේ යැ... ස්‍ප්‍රෂ්ටව්‍ය-සංඥාව 'තෙල මාගේ යැ ... ධර්මසංඥාව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... ශබ්දසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... ගන්ධසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... රසසඤ්චෙතනාව 'තෙල මාගේ යැ. ... ස්‍ප්‍රෂ්ටව්‍යසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... ධර්මසඤ්චෙත-නාව තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ශබ්දතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ගන්ධතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... රසතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ස්‍ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ධර්මතෘෂ්ණාව 'තෙල මාගේ යැ තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපවිතර්කය තෙල මාගේ යැ ... ශබ්දවිතර්කය 'තෙල මාගේ යැ ... ගන්ධ-විතර්කය 'තෙල මාගේ යැ ... රසවිතර්කය 'තෙල මාගේ යැ ... ස්‍ප්‍රෂ්ටව්‍ය-විතර්කය 'තෙල මාගේ යැ ... ධර්මවිතර්කය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ' යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපවිචාරය 'තෙල මාගේ යැ ... ශබ්දවිචාරය 'තෙල මාගේ යැ ... ගන්ධවිචාරය 'තෙල මාගේ යැ ... රසවිචාරය 'තෙල මාගේ යැ ... ස්‍ප්‍රෂ්ට-ව්‍යවිචාරය 'තෙල මාගේ යැ ... ධර්මවිචාරය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

පෘථිවිධාතුව 'තෙල මාගේ යැ ... අබ්ධාතුව 'තෙල මාගේ යැ ... තෙජොධාතුව 'තෙල මාගේ යැ ... වායුධාතුව 'තෙල මාගේ යැ ... ආකාශ-ධාතුව 'තෙල මාගේ යැ ... විඥානධාතුව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

පඨවිකසිණය 'තෙල මාගේ යැ ... ආපොකසිණය... තෙජොකසිණය ... වායොකසිණය .. නීලකසිණය ... පීතකසිණය ... ලොහිතකසිණය ... ඕදාතකසිණය ... ආකාසකසිණය ... විඤ්ඤාණකසිණය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ' යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

කෙසං එතං මම -පෙ- ලොමං එතං මම -පෙ- නඛං එතං මම -පෙ- දන්තං එතං මම -පෙ- තචං එතං මම -පෙ- මංසං එතං මම -පෙ- නහාරුං එතං මම -පෙ- අට්ඨිං එතං මම -පෙ- අට්ඨිමිඤ්ජං එතං, මම -පෙ- වක්කං එතං මම -පෙ- හදයං එතං මම -පෙ- යකනං එතං මම -පෙ- කිලොමකං එතං මම -පෙ- පිහකං එතං මම -පෙ- පප්ඵාසං එතං මම -පෙ- අන්තං එතං මම -පෙ- අන්තගුණං එතං මම -පෙ- උදරියං එතං මම -පෙ- කරීසං එතං මම -පෙ- පිත්තං එතං මම -පෙ- සෙම්හං එතං මම -පෙ- පුබ්බං එතං මම -පෙ- ලොහිතං එතං මම -පෙ- සෙදං එතං මම -පෙ- මෙදං එතං මම -පෙ- අස්සුං එතං මම -පෙ- වසං එතං මම -පෙ- ඛෙළං එතං මම -පෙ- සිඞ්ඝාණිකං එතං මම -පෙ- ලසිකං එතං මම -පෙ- මුත්තං එතං මම -පෙ- මත්ථලුඞ්ගං 'එතං මම' එසො හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛායතනං එතං මම -පෙ- රූපායතනං එතං මම -පෙ- සොතායතනං එතං මම -පෙ- සද්දායතනං එතං මම -පෙ- ඝානායතනං එතං මම -පෙ- ගන්ධායතනං එතං මම -පෙ- ජිව්හායතනං එතං මම -පෙ- රසායතනං එතං මම -පෙ- කායායතනං එතං මම -පෙ- ඵොට්ඨබ්බායතනං එතං මම -පෙ- මනායතනං එතං මම -පෙ- ධම්මායතනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුධාතුං එතං මම -පෙ- රූපධාතුං එතං මම -පෙ- චක්ඛුවිඤ්ඤාණධාතුං එතං මම -පෙ- සොතධාතුං එතං මම -පෙ- සද්දධාතුං -පෙ- සොතවිඤ්ඤාණධාතුං -පෙ- ඝානධාතුං -පෙ- ගන්ධධාතුං -පෙ- ඝානවිඤ්ඤාණධාතුං -පෙ- ජිව්හාධාතුං -පෙ- රසධාතුං -පෙ- ජිව්හාවිඤ්ඤාණධාතුං -පෙ- කායධාතුං -පෙ- ඵොට්ඨබ්බධාතුං -පෙ- කායවිඤ්ඤාණධාතුං -පෙ- මනොධාතුං එතං මම -පෙ- ධම්මධාතුං එතං මම -පෙ- මනොවිඤ්ඤාණධාතුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුන්ද්‍රියං එතං මම පෙ- සොතින්ද්‍රියං එතං මම -පෙ- ඝානින්ද්‍රියං එතං මම -පෙ- ජිව්හින්ද්‍රියං එතං මම -පෙ- කායින්ද්‍රියං එතං මම -පෙ- මනින්ද්‍රියං එතං මම -පෙ- ජීවිතින්ද්‍රියං එතං මම -පෙ- ඉත්ථින්ද්‍රියං එතං මම -පෙ- පුරිසින්ද්‍රියං එතං මම -පෙ- සුඛින්ද්‍රියං එතං මම -පෙ- දුක්ඛින්ද්‍රියං එතං මම -පෙ- සොමනස්සින්ද්‍රියං එතං මම -පෙ- දොමනස්සින්ද්‍රියං එතං මම -පෙ- උපෙක්ඛින්ද්‍රියං එතං මම -පෙ- සද්ධින්ද්‍රියං එතං මම -පෙ- විරියින්ද්‍රියං එතං මම -පෙ- සතින්ද්‍රියං එතං මම -පෙ- සමාධින්ද්‍රියං එතං මම -පෙ- පඤ්ඤින්ද්‍රියං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

කාමධාතුං එතං මම -පෙ- රූපධාතුං එතං මම -පෙ- අරූපධාතුං එතං මම -පෙ- කාමභවං එතං මම -පෙ- රූපභවං එතං මම -පෙ- අරූපභවං එතං මම -පෙ- සඤ්ඤාභවං එතං මම -පෙ- අසඤ්ඤාභවං එතං මම -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එතං මම -පෙ- එකවොකාරභවං එතං මම -පෙ- චතුවොකාරභවං එතං මම -පෙ- පඤ්චවොකාරභවං එතං මම -පෙ-

කෙස් 'තෙල මාගේ යැ ... ලොම් 'තෙල මාගේ යැ ... නිය 'තෙල මාගේ යැ ... දත් 'තෙල මාගේ යැ ... සම් 'තෙල මාගේ යැ ... මස් 'තෙල මාගේ යැ ... නහර 'තෙල මාගේ යැ ... ඇට 'තෙල මාගේ යැ ... ඇටමිදුළු 'තෙල මාගේ යැ ... වකුගඩුව 'තෙල මාගේ යැ ... හදවත 'තෙල මාගේ යැ ... අක්මාව 'තෙල මාගේ යැ ... දලබුව 'තෙල මාගේ යැ .... බඩදිව 'තෙල මාගේ යැ ... පපුමස 'තෙල මාගේ යැ ... අතුනු 'තෙල මාගේ යැ ... අතුනුබහන 'තෙල මාගේ යැ ... නොපැසුණු අහර 'තෙල මාගේ යැ ... පැසුණු අහර 'තෙල මාගේ යැ .. පිත් 'තෙල මාගේ යැ ... සෙම් 'තෙල මාගේ යැ ... පූයා 'තෙල මාගේ යැ ... ලෙහෙ 'තෙල මාගේ යැ ... සෝදිය 'තෙල මාගේ යැ ... මෙදතෙල් 'තෙල මාගේ යැ ... කඳුළු 'තෙල මාගේ යැ ... වුරුණුතෙල් 'තෙල මාගේ යැ ... කෙළ 'තෙල මාගේ යැ ... මූකුණු 'තෙල මාගේ යැ ... සඳමිදුළු 'තෙල මාගේ යැ ... සුලුදිය 'තෙල මාගේ යැ ... හිස්මුල් 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ඛායතනය 'තෙල මාගේ යැ ... රූපායතනය 'තෙල මාගේ යැ ... සොතායතනය 'තෙල මාගේ යැ ... සද්දායතනය 'තෙල මාගේ යැ ... ඝානායතනය 'තෙල මාගේ යැ ... ගන්ධායතනය 'තෙල මාගේ යැ ... ජිව්හායතනය 'තෙල මාගේ යැ ... රසායතනය 'තෙල මාගේ යැ ... කායායතනය 'තෙල මාගේ යැ ... ස්ප්‍රෂ්ටව්‍යායතනය 'තෙල මාගේ යැ ... මනායතනය 'තෙල මාගේ යැ ... ධර්මායතනය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශ පරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ෂුර්ධාතුව 'තෙල මාගේ යැ ... රූපධාතුව 'තෙල මාගේ යැ ... චක්ෂුර්විඥානධාතුව 'තෙල මාගේ යැ ... ශ්‍රොත්‍රධාතුව 'තෙල මාගේ යැ ... ශබ්දධාතුව ... ශ්‍රොත්‍රවිඥානධාතුව ... ඝ්‍රාණධාතුව ... ගන්ධධාතුව ... ඝ්‍රාණ-විඥානධාතුව ... ජිව්හාධාතුව ... රසධාතුව ... ජිහ්වාවිඥාන ධාතුව ... කායධාතුව ... ස්ප්‍රෂ්ටව්‍යධාතුව ... කායවිඥානධාතුව ... මනොධාතුව 'තෙල මාගේ යැ ... ධම්මධාතුව 'තෙල මාගේ යැ ... මනොවිඥානධාතුව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශ-පරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ෂුරින්ද්‍රියය 'තෙල මාගේ යැ ... ශ්‍රොත්‍රෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ඝ්‍රාණෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ජිහ්වෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... කායෙන්ද්‍රියය 'තෙල මාගේ යැ... මනඉන්ද්‍රියය 'තෙල මාගේ යැ...ජීවිතෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ස්ත්‍රීන්ද්‍රියය 'තෙල මාගේ යැ ... පුරුෂෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සුඛෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... දුඃඛෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සොමනස්සින්ද්‍රියය 'තෙල මාගේ යැ... දෞර්මනස්සින්ද්‍රියය 'තෙල මාගේ යැ... උපෙක්ෂෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ශ්‍රද්ධෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... වීර්‍ය්‍යෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සමෘතීන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සමාධීන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ප්‍රඥෙන්ද්‍රියය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

කාමධාතුව 'තෙල මාගේ යැ ... රූපධාතුව 'තෙල මාගේ යැ ... අරූප-ධාතුව 'තෙල මාගේ යැ ... කාමභවය 'තෙල මාගේ යැ ... රූපභවය 'තෙල මාගේ යැ ... අරූපභවය 'තෙල මාගේ යැ ... සංඥාභවය 'තෙල මාගේ යැ ... අසංඥාභවය 'තෙල මාගේ යැ ... නෛවසංඥානාසංඥාභවය 'තෙල මාගේ යැ ... එකවොකාරභවය 'තෙල මාගේ යැ ... චතුවොකාර-භවය 'තෙල මාගේ යැ ... පඤ්චවොකාරභවය 'තෙල මාගේ යැ ;...

පඨමං ඣානං[1] එතං මම -පෙ- දුතියං ඣානං එතං මම -පෙ- තතියං ඣානං එතං මම -පෙ- චතුත්ථං ඣානං එතං මම -පෙ- මෙත්තං චෙතොවිමුත්තිං[2] එතං මම -පෙ- කරුණං චෙතොවිමුත්තිං එතං මම-පෙ- මුදිතං චෙතොවිමුත්තිං එතං මම -පෙ- උපෙක්ඛං චෙතොවිමුත්තිං එතං මම -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තිං එතං මම -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං එතං මම -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං එතං මම -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං 'එතං මම එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

අවිජ්ජං එතං මම -පෙ- සඞ්ඛාරෙ එතං මම -පෙ- විඤ්ඤාණං එතං මම -පෙ- නාම රූපං එතං මම -පෙ- සළායතනං එතං මම -පෙ- ඵස්සං එතං මම -පෙ- වෙදනං එතං මම -පෙ- තණ්හං එතං මම -පෙ- උපාදානං එතං මම -පෙ- භවං එතං මම -පෙ- ජාතිං එතං මම -පෙ- ජරාමරණං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

**එවං අභිනිවෙසපරාමාසො දිට්ඨි.**

කතමානි අට්ඨ දිට්ඨිට්ඨානානි:

ඛන්ධාපි දිට්ඨිට්ඨානං, අවිජ්ජාපි දිට්ඨිට්ඨානං, ඵස්සොපි දිට්ඨිට්ඨානං සඤ්ඤාපි දිට්ඨිට්ඨානං, විතක්කොපි[3] දිට්ඨිට්ඨානං අයොනිසොමනසිකාරොපි දිට්ඨිට්ඨානං, පාපමිත්තොපි දිට්ඨිට්ඨානං, පරතොපි ඝොසො[4] දිට්ඨිට්ඨානං.

ඛන්ධා හෙතු ඛන්ධා පච්චයො දිට්ඨීනං[5] උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං ඛන්ධාපි දිට්ඨිට්ඨානං.

අවිජ්ජා හෙතු අවිජ්ජා පච්චයො දිට්ඨීනං[5] උප්පාදාය[6] සමුට්ඨානට්ඨෙන එවං අවිජ්ජාපි දිට්ඨිට්ඨානං.

ඵස්සො හෙතු ඵස්සො පච්චයො දිට්ඨීනං[5] උප්පාදාය සමුට්ඨානට්ඨෙන එවං ඵස්සොපි දිට්ඨිට්ඨානං.

සඤ්ඤා හෙතු සඤ්ඤා පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන එවං සඤ්ඤාපි දිට්ඨිට්ඨානං.

විතක්කො[7] හෙතු විතක්කො[7] පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං විතක්කොපි දිට්ඨිට්ඨානං.

අයොනිසො මනසිකාරො හෙතු අයොනිසො මනසිකාරො පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං අයොනිසො මනසිකාරොපි දිට්ඨිට්ඨානං.

පාපමිත්තො හෙතු පාපමිත්තො පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං පාපමිත්තොපි දිට්ඨිට්ඨානං.

පරතොඝොසො හෙතු පරතොඝොසො පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං පරතොපි ඝොසො[4] දිට්ඨිට්ඨානං.

**ඉමානි අට්ඨ දිට්ඨිට්ඨානානි.**

---

1. පඨමජ්ඣානං - (ඉච්චාදි) බහුසු 2. මෙත්තාචෙතොවිමුත්තිං- (ඉච්චාදි) සයා PTS සී 1,2.3
3. විතක්කාපි - සයා 4: පරතොඝොසොපි - මජසං, සයා, PTS.
5 දිට්ඨිට්ඨානං - මජසං, PTS, සයා, සී 1 2 6 උපාදාය - මජසං, සයා, PTS
7: විතක්කා - සයා.

ප්‍රථමධ්‍යානය 'තෙල මාගේ යැ ... ද්විතීයධ්‍යානය 'තෙල මාගේ යැ ... තෘතීයධ්‍යානය 'තෙල මාගේ යැ ... චතුර්ථධ්‍යානය 'තෙල මාගේ යැ ... මෛත්‍රීචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ ... කරුණාචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ ... මුදිතාචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ ... උපෙක්ෂාචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ ... ආකාසානඤ්චායතනසමාපත්තිය 'තෙල මාගේ යැ ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය 'තෙල මාගේ යැ ... ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තිය 'තෙල මාගේ යැ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය 'තෙල මාගේ ය, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශ පරාමර්ශය දෘෂ්ටි යැ.

අවිද්‍යාව 'තෙල මාගේ යැ ... සංස්කාරයන් 'තෙල මාගේ යැ ... විඥනය 'තෙල මාගේ යැ ... නාමරූපය 'තෙල මාගේ යැ ... ෂඩායතනය 'තෙල මාගේ යැ ... ස්පර්ශය 'තෙල මාගේ යැ ... වේදනාව 'තෙල මාගේ යැ ... තෘෂ්ණාව 'තෙල මාගේ යැ ... උපාදානය 'තෙල මාගේ යැ ... භවය 'තෙල මාගේ යැ ... ජාතිය 'තෙල මාගේ යැ ... ජරාමරණය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශ පරාමර්ශය දෘෂ්ටි යැ.

**මෙසෙයින් අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි වේ.**

දෘෂ්ටිකාරණයෝ අටදෙන කවරහ යත්:

ස්කන්ධයෝ ද දෘෂ්ටිකාරණයෙක, අවිද්‍යාව ද දෘෂ්ටිකාරණයෙක, ස්පර්ශය ද දෘෂ්ටිකාරණයෙක, සංඥාව ද දෘෂ්ටිකාරණයෙක, විතර්කය ද දෘෂ්ටිකාරණයෙක, අයොනිසොමනසිකාරය ද දෘෂ්ටිකාරණයෙක, පාපමිත්‍ර තෙමේ ද දෘෂ්ටි-කාරණයෙක, පරතොඝොෂය ද දෘෂ්ටිකාරණයෙක.

ස්කන්ධයෝ (ජනක) හෙතු යැ ස්කන්ධයෝ (උපස්ථම්භක) ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් ස්කන්ධයෝ ද දෘෂ්ටි-කාරණයෙක.

අවිද්‍යාව හෙතු යැ අවිද්‍යාව ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් අවිද්‍යාව ද දෘෂ්ටිකාරණයෙක.

ස්පර්ශය හෙතු යැ ස්පර්ශය ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් ස්පර්ශය ද දෘෂ්ටිකාරණයෙක.

සංඥාව හෙතු යැ සංඥාව ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් සංඥාව ද දෘෂ්ටිකාරණයෙක.

විතර්කය හෙතු යැ විතර්කය ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් විතර්කය ද දෘෂ්ටිකාරණයෙක.

අයොනිසොමනසිකාරය හෙතු යැ අයොනිසොමනසිකාරය ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් අයොනිසොමනසිකාරය ද දෘෂ්ටිකාරණයෙක.

පාපමිත්‍ර හෙතු යැ පාපමිත්‍ර ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි, මෙසෙයින් පාපමිත්‍ර තෙමේ ද දෘෂ්ටිකාරණයෙක.

පරතොඝොෂය හෙතු යැ පරතොඝොෂය ප්‍රත්‍යයැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි, මෙසෙයින් පරතොඝොෂය ද දෘෂ්ටිකාරණයෙකි.

**මොහු අටදෙන දෘෂ්ටිකාරණයෝ යි.**

කතමානි අට්ඨාරස දිට්ඨිපරියුට්ඨානානි:

යා දිට්ඨි දිට්ඨිගතං, දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරං, දිට්ඨිවිසූකං[1] දිට්ඨි-විප්ඵන්දිතං, දිට්ඨිසඤ්ඤොජනං, දිට්ඨිසල්ලං, දිට්ඨිසම්බාධො,[2] දිට්ඨිපලිබොධො[3] දිට්ඨිබන්ධනං, දිට්ඨිපපාතො, දිට්ඨානුසයො, දිට්ඨිසන්තාපො, දිට්ඨිපරිළාහො, දිට්ඨිගන්ථො, දිට්ඨුපාදානං, දිට්ඨාභිනිවෙසො, දිට්ඨිපරාමාසො.

**ඉමානි අට්ඨාරස දිට්ඨිපරියුට්ඨානානි.**

කතමා සොළස දිට්ඨියො:

අස්සාදදිට්ඨි, අත්තානුදිට්ඨි, මිච්ඡාදිට්ඨි, සක්කායදිට්ඨි, සක්කාය වත්ථුකා සස්සතදිට්ඨි, සක්කායවත්ථුකා උච්ඡෙදදිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි, පුබ්බන්තානු දිට්ඨි, අපරන්තානුදිට්ඨි, සඤ්ඤොජනිකා දිට්ඨි, 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, අත්තවාදපටිසංයුත්තා දිට්ඨි, ලොකවාද-පටිසංයුත්තා දිට්ඨි, භවදිට්ඨි, විභවදිට්ඨි.

**ඉමා සොළස දිට්ඨියො.**

කතමෙ තීණි සතං දිට්ඨාභිනිවෙසා:

අස්සාදදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අත්තානුදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

මිච්ඡාදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

සක්කායදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති

සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

පුබ්බන්තානුදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අපරන්තානුදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

සඤ්ඤොජනිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

1. දිට්ඨිවිසූකායිකං - ධම්මසඞ්ගණී
2. දිට්ඨිසම්භවො - සයා. 3. දිට්ඨිපලිබොධො - මජසං. සයා PTS
* "කතමෙ තීණි සතං දිට්ඨාභිනිවෙසා"ති පුච්ඡා සයා - PTS, පොත්ථකෙසු න ගහිතා

අටළොස් දෘෂ්ටිපර්‍යුත්ථානයෝ කවරහ යත්:

යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටි නමැති හුලෙක් දෘෂ්ටිහුගේ විරූප වූ චලනයෙක් දෘෂ්ටිසංයොජනයෙක් දෘෂ්ටිශල්‍යයෙක් දෘෂ්ටිසම්බාධයෙක් දෘෂ්ටිපරිබොධයෙක් දෘෂ්ටිබන්ධනයෙක් දෘෂ්ටිප්‍රපාතයෙක් දෘෂ්ට්‍යනුශයයෙක් දෘෂ්ටිසන්තාපයෙක් දෘෂ්ටිපරිදාහයෙක් දෘෂ්ටිග්‍රන්ථයෙක් දෘෂ්ට්‍යුපාදානයෙක් දෘෂ්ට්‍යභිනිවෙශයෙක් දෘෂ්ටිපරාමර්ශයෙක් වේ ද,

මොහු අටළොස් දෘෂ්ටිපර්‍යුත්ථානයෝ යි.

සොළොස් දෘෂ්ටිහු කවරහ යත්:

ආස්වාදදෘෂ්ටි යැ අත්මානුදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටි යැ සත්කායදෘෂ්ටි යැ සත්කායවස්තුක වූ ශාශ්වතදෘෂ්ටි යැ සත්කාය වස්තුක වූ උච්ඡේදදෘෂ්ටි යැ අන්තග්‍රාහික දෘෂ්ටි යැ පූර්වාන්තානුදෘෂ්ටි යැ අපරාන්තානුදෘෂ්ටි යැ සංයොජ-නිකදෘෂ්ටි යැ 'මම' යයි (උපන්) මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ 'මාගේ යැ'යි (උපන්) මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ ආත්මවාදයෙන් බැඳුණු දෘෂ්ටි යැ ලොකවාදයෙන් බැඳුණු දෘෂ්ටි යැ භවදෘෂ්ටි යැ විභවදෘෂ්ටි යි.

මොහු සොළොස් දෘෂ්ටිහු වෙත්.

තුන්සියයක් දෘෂ්ට්‍යභිනිවෙශයෝ කවරහ යත්:

කිහි අයුරෙකින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවෙශය (බැසැ ගැනීම) වේ ද?

කිහි අයුරෙකින් ආත්මානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් මිථ්‍යාදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සත්කායදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සත්කායවස්තුක උච්ඡේදදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් පූර්වාන්තානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් අපරාන්තානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සංයොජනිකදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

භවදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

විභවදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අස්සාදදිට්ඨියා පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

අත්තානුදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

මිච්ඡාදිට්ඨියා දසහාකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්ඤාසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

පුබ්බන්තානුදිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

අපරන්තානුදිට්ඨියා චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

සඤ්ඤොජනිකාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො හොති.

භවදිට්ඨියා එකෙන ආකාරෙන[1] අභිනිවෙසො හොති.

විභවදිට්ඨියා එකෙන ආකාරෙන[1] අභිනිවෙසො හොති.

1 එකූනවීසතියා ආකාරෙහි - සභා

කිහි අයුරෙකින් 'මම' යයි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් ආත්මවාද ප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් ලොකවාද ප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් භවදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් විභවදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද යත්:

පන්තිස් අයුරෙකින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

විසි අයුරෙකින් ආත්මානුදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

දස අයුරෙකින් මිථ්‍යාදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

විසි අයුරෙකින් සත්කායදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

පසළොස් අයුරෙකින් සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

පස් අයුරෙකින් සත්කායවස්තුක උච්ඡේදදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

පනස් අයුරෙකින් අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් පූර්වාන්තානුදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

සියුසාලිස් අයුරෙකින් අපරාන්තානුදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් සංයොජනිකදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් 'මම' යයි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

විසි අයුරෙකින් ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අට අයුරෙකින් ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

එක් අයුරෙකින් භවදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

එක් අයුරෙකින් විභවදෘෂ්ටියෙහි අභිනිවේශය වේ.

# 2 - 1. අස්සාදදිට්ඨි

අස්සාදදිට්ඨියා කතමෙහි පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති:

‘යං රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං රූපස්ස අස්සාදො’ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. දිට්ඨි න අස්සාදො, අස්සාදො න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො අස්සාදො; යා ච දිට්ඨි, යො ච අස්සාදො, අයං වුච්චති අස්සාදදිට්ඨි.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි[1] දිට්ඨිවිපත්ති, තාය දිට්ඨිවිපත්තියා සමන්නාගතො පුග්ගලො දිට්ඨිවිපන්නො, දිට්ඨිවිපන්නො පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා. යො දිට්ඨියා රාගො,[2] සො න දිට්ඨි, දිට්ඨි න රාගො, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො රාගො; යා ච දිට්ඨි යො ච රාගො, අයං වුච්චති දිට්ඨිරාගො. තාය ච දිට්ඨියා තෙන ච රාගෙන සමන්නාගතො පුග්ගලො දිට්ඨිරාගරත්තො[3] දිට්ඨිරාගරත්තෙ පුග්ගලෙ දින්නං දානං න මහප්ඵලං හොති න මහානිසංසං. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො: නිරයො වා තිරච්ඡානයොනි වා. මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං.[4] සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා, යා ච පත්ථනා, යො ච පණිධි, යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා. සෙය්‍යථාපි නිම්බබීජං වා කොසාතකීබීජං වා තිත්තකාලාබුබීජං[5] වා අල්ලාය පථවියා නික්ඛිත්තං යඤ්චෙව පථවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං තිත්තකත්තාය[6] කටුකත්තාය[7] අසාතත්තාය[8] සංවත්තති. තං කිස්ස හෙතු: බීජං හිස්ස පාපකං. එවමෙව මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි[9] දිට්ඨිගතං, දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරං, දිට්ඨිවිසූකං, දිට්ඨිවිප්ඵන්දිතං, දිට්ඨිසඤ්ඤොජනං, දිට්ඨිසල්ලං, දිට්ඨිසම්බාධො, දිට්ඨිපළිබොධො, දිට්ඨිබන්ධනං, දිට්ඨිපපාතො, දිට්ඨානුසයො, දිට්ඨිසන්තාපො දිට්ඨිපරිළාහො, දිට්ඨිගන්ථො, දිට්ඨුපාදානං, දිට්ඨාභිනිවෙසො, දිට්ඨිපරාමාසො,[10] ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි පරියුට්ඨිතචිත්තස්ස සඤ්ඤොගො.

1 ‘මිච්ඡාදිට්ඨි’ ඉති ස්‍යාම පොත්ථකෙ නත්ථි 2 යා දිට්ඨියො රාගො - ස්‍යා PTS
3 දිට්ඨිරාගරත්තො - ස්‍යා 4 යථාදිට්ඨිසමත්තං - සී 2 5 තිත්තකලාබුබීජං - [illegible]
6 තිත්තකත්තාය - ස්‍යා PTS 7 කටුකත්තාය ස්‍යා PTS 8 අසාරත්තාය - ස්‍යා PTS
9 යා දිට්ඨි - ස්‍යා 10 දිට්ඨාභිනිවෙසපරාමාසො හොති - ස්‍යා

## 2 – 1. ආස්වාදදෘෂ්ටිය

කවර පන්තිස් අයුරින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි යත්:

'රූපස්කන්ධය පිණිස යම් සුවයෙක් සෞම්නස්‍යයෙක් උපදී ද මේ රූපයාගේ ආස්වාද යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය ආස්වාද නො වෙයි. ආස්වාදය දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක, ආස්වාදය අනෙකෙක; යම් දෘෂ්ටියෙකුත් යම් ආස්වාදයෙකුත් වේ ද, මේ 'ආස්වාදදෘෂ්ටි' යයි කියනු ලැබෙ.

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙක, මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තියෙක, ඒ දෘෂ්ටිවිපත්තියෙන් සමන්‍වාගත පුද්ගල තෙම දෘෂ්ටිවිපන්න නම. දෘෂ්ටිවිපන්න පුද්ගල තෙම සෙවනය නො කටයුත්තේ යැ, භජනය නො කටයුත්තේ යැ, පයර්‍යුපාසනය නො කටයුත්තේ යි. එ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක වූ ද එහෙයිනි. දෘෂ්ටියෙහි (උපදනා) යම් රාගයෙක් වේ ද හේ දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය රාග නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක, රාගය අනෙකෙකි. යම් දෘෂ්ටියෙකුත් යම් රාගයෙකුත් වේ ද මේ 'දිට්ඨිරාග ය'යි කියනු ලැබේ. ඒ දෘෂ්ටියෙනුදු ඒ රාගයෙනුදු සමන්‍වාගත පුද්ගල තෙම දෘෂ්ටිරාගරක්ත නම. දෘෂ්ටිරාගරක්ත පුද්ගලයා කෙරෙහි දෙන ලද දානය මහත්ඵල නො වෙයි, මහානෘශංස නො වේ. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි.

මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි. නිරය හෝ තිරිසන් යොනිය හෝ යි. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරනලද ගන්නාලද යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරනලද ගන්නා ලද යම් මනඃකර්මයෙකුත් වේ ද, යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, එ හැම ධර්මයෝ අනිෂ්ට බව පිණිස අකාන්ත බව පිණිස අමනාප බව පිණිස අහිත පිණිස දුක් පිණිස පවතිත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක වූ ද එහෙයිනි. යම්සේ කොසොඹ බිජුවටෙක් හෝ තිත්ත වැටකොළු බිජුවටෙක් හෝ තෙත් වූ පොළොවෙහි රෝපණය කරන ලද්දේ යම් පෘථිවිරසයෙකුත් ගනු ලැබේද යම් අබ්රසයෙකුත් ගනු ලැබේ ද එ හැම තිත්ත බවට කටුක බවට නො මිහිරි බවට වැටෙයි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඒ කොසොඹ ආදියෙහි බිජුවට ලාමක ද එහෙයිනි. එපරිද්දෙන් මැ මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරනලද ගන්නාලද යම් කායකර්මයෙකුත් වේ ද .. යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් මනඃකර්මයෙකුත් වේ ද යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද එ හැම ධර්මයෝ අනිෂ්ට බවට අකාන්ත බවට අමනාප බවට අහිතයට දුකට වැටෙත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි.

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිගතයෙක, දෘෂ්ටිගහනයෙක, දෘෂ්ටිකාන්තාරයෙක, දෘෂ්ටි නමැති හුලෙක, දෘෂ්ටියගේ විරූප චලනයෙක, දෘෂ්ටිසංයොජනයෙක, දෘෂ්ටිශල්‍යයෙක, දෘෂ්ටිසම්බාධයෙක, දෘෂ්ටිපරිබොධයෙක, දෘෂ්ටිබන්ධනයෙක, දෘෂ්ටිප්‍රපාතයෙක, දෘෂ්ට්‍යනුශයෙක, දෘෂ්ටිසන්තාපයෙක, දෘෂ්ටිපරිදාහයෙක, දෘෂ්ටිග්‍රන්ථයෙක, දෘෂ්ට්‍යුපාදානයෙක, දෘෂ්ට්‍යභිනිවෙශයෙක, දෘෂ්ටිපරාමර්ශයෙකි. මේ අටළොස් අයුරින් සමුදාචාරයට පැමිණි සිත් ඇත්තහුගේ (සසර) සංයොගය වේ.

අත්ථි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච, අත්ථි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

කතමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච: සක්කායදිට්ඨි සීලබ්බතපරාමාසො, ඉමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච.

කතමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො: කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං මානසඤ්ඤොජනං විචිකිච්ඡාසඤ්ඤොජනං භවරාගසඤ්ඤොජනං ඉස්සාසඤ්ඤොජනං මච්ඡරියසඤ්ඤොජනං අනුනයසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනං, ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.*

යං වෙදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච -පෙ- යං විඤ්ඤාණං පටිච්ච -පෙ- යං චක්ඛුං පටිච්ච -පෙ- යං සොතං පටිච්ච -පෙ- යං ඝානං පටිච්ච -පෙ- යං ජිව්හං පටිච්ච -පෙ- යං කායං පටිච්ච -පෙ- යං මනං පටිච්ච -පෙ- යං රූපෙ පටිච්ච -පෙ- යං සද්දෙ පටිච්ච -පෙ- යං ගන්ධෙ පටිච්ච -පෙ- යං රසෙ පටිච්ච -පෙ- යං ඵොට්ඨබ්බෙ පටිච්ච -පෙ- යං ධම්මෙ පටිච්ච -පෙ- යං චක්ඛුවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං සොතවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං ඝානවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං ජිව්හාවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං කායවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං මනොවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං චක්ඛුසම්ඵස්සං පටිච්ච -පෙ- යං සොතසම්ඵස්සං පටිච්ච -පෙ- යං ඝානසම්ඵස්සං පටිච්ච -පෙ- යං ජිව්හාසම්ඵස්සං පටිච්ච -පෙ- යං කායසම්ඵස්සං පටිච්ච -පෙ- යං මනොසම්ඵස්සං පටිච්ච -පෙ- යං චක්ඛුසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං සොතසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං ඝානසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං ජිව්හාසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං කායසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං මනොසම්ඵස්සජං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං මනොසම්ඵස්සජාය වෙදනාය අස්සාදො'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. දිට්ඨි න අස්සාදො, අස්සාදො න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො අස්සාදො. යා ච දිට්ඨි යො ච අස්සාදො, අයං වුච්චති අස්සාදදිට්ඨි.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති. තාය දිට්ඨිවිපත්තියා සමන්නාගතො පුග්ගලො දිට්ඨිවිපන්නො; දිට්ඨිවිපන්නො පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු දිට්ඨි හිස්ස පාපිකා. යො දිට්ඨියා රාගො, සො න දිට්ඨි, දිට්ඨි න රාගො, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො රාගො. යා ච දිට්ඨි, යො ච රාගො, අයං වුච්චති දිට්ඨිරාගො. තාය ච දිට්ඨියා තෙන ච රාගෙන සමන්නාගතො පුග්ගලො දිට්ඨිරාගරත්තො. දිට්ඨිරාගරත්තෙ පුග්ගලෙ දින්නං දානං න මහප්ඵලං හොති න මහානිසංසං. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා.

---

* 'ඉමෙහි අට්ඨාරසහි' ආදිං කත්වා යාව 'න ච දිට්ඨියො'ති - ස්‍යා PTS පොත්ථකෙසු ඌනං.

දෘෂ්ටි ද වූ සංයොජනයෝ ද ඇත. දෘෂ්ටි නො වූ සංයෝජනයෝ ද ඇති.

දෘෂ්ටි ද වූ සංයොජනයෝ කවරහ යත්: සත්කායදෘෂ්ටි යැ ශීලව්‍රත-පරාමර්ශ යි. මොහු දෘෂ්ටි ද වූ සංයොජනයෝ යි.

දෘෂ්ටි නො වූ සංයොජනයෝ කවරහ යත්: කාමරාග සංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ මානසංයෝජන යැ විචිකිත්සා සංයොජන යැ භවරාග-සංයොජන යැ ඊර්ෂ්‍යා සංයොජන යැ මාත්සර්‍ය්‍ය සංයොජන යැ අනුනය-සංයොජන යැ අවිද්‍යාසංයොජන යි. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

වෙදනාව නිසා .. සංඥව නිසා ... සංස්කාරයන් නිසා ... විඥනය නිසා ... චක්ෂුස නිසා .... ශ්‍රොත්‍රය නිසා ... ඝ්‍රාණය නිසා ... ජිහ්වාව නිසා ... කාය නිසා ... මනස නිසා ... රූපයන් නිසා ... ශබ්දයන් නිසා ... ගන්ධයන් නිසා ... රසයන් නිසා ... ස්ප්‍රෂ්ටව්‍යයන් නිසා ... ධර්මයන් නිසා ... චක්ෂුර්-විඥනය නිසා ... ශ්‍රොත්‍රවිඥනය නිසා ... ඝ්‍රාණ විඥනය නිසා ... ජිහ්වාවිඥ-නය නිසා ... කාය විඥනය නිසා ... මනොවිඥනය නිසා ... චක්ඛුසම්ඵස්සය නිසා ... සොතසම්ඵස්සය නිසා ... ඝානසම්ඵස්සය නිසා ... ජිව්හාසම්ඵස්සය නිසා ...කායසම්ඵස්සය නිසා ... මනොසම්ඵස්සය නිසා ... චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... සොතසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... කායසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... මනො-සම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාවගේ ආස්වාද යි. අභිනිවෙශ පරාමර්ශ දෘෂ්ටි යැ. දෘෂ්ටිය ආස්වාද නො වෙයි. ආස්වාදය දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක, ආස්වාදය අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් වේ ද යම් ආස්වාදයෙකුත් වේ ද මේ 'ආස්වාද දෘෂ්ටි යැ'යි කියනු ලැබේ.

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ, මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ, ඒ දෘෂ්ටි-විපත්තියෙන් සමන්‍වාගත පුද්ගල තෙමේ 'දෘෂ්ටිවිපන්න' නම. දෘෂ්ටිවිපන්න පුද්ගල තෙම සෙවනය නො කටයුත්තේ යැ, භජනය නො කටයුත්තේ යැ, පර්‍ය්‍යුපාසනය නො කට යුත්තේ යි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි. දෘෂ්ටියෙහි (උපදනා) යම් රාගයෙක් වේ ද හේ දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය රාග නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක. රාගය අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් රාගයෙකුත් වේ ද මේ 'දෘෂ්ටිරාග' යයි කියනු ලැබේ. ඒ දෘෂ්ටියෙනුදු ඒ රාගයෙනුදු සමන්‍වාගත පුද්ගල තෙම 'දෘෂ්ටිරාගරක්ත' නම් වෙයි. දෘෂ්ටිරාගරක්ත පුද්ගලයා කෙරෙහි දුන් දන් මහත්ඵල නො වෙයි. මහ අනුසස් ඇත්තේ නො වෙයි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො: නිරයො වා තිරච්ඡානයොනි වා. මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා. සෙය්‍යථාපි නිම්බබීජං වා කොසාතකීබීජං වා තිත්තකාලාබුබීජං වා අල්ලාය පථවියා නික්ඛිත්තං යඤ්චෙව පථවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං තිත්තකත්තාය කටුකත්තාය අසාතත්තාය සංවත්තති. තං කිස්ස හෙතු: බීජං හිස්ස පාපකං.[1] එවමෙව මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං -පෙ- දිට්ඨාභිනිවෙසො දිට්ඨිපරාමාසො. ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි පරියුට්ඨිතචිත්තස්ස සඤ්ඤොගො.

අත්ථි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච, අත්ථි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. කතමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච: සක්කායදිට්ඨි, සීලබ්බතපරාමාසො,[2] ඉමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච.

කතමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො: කාමරාගසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං, මානසඤ්ඤොජනං, විචිකිච්ඡාසඤ්ඤොජනං, භවරාගසඤ්ඤොජනං, ඉස්සාසඤ්ඤොජනං, මච්ඡරියසඤ්ඤොජනං, අනුනයසඤ්ඤොජනං, අවිජ්ජාසඤ්ඤොජනං, ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

අස්සාදදිට්ඨියා ඉමෙහි පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 2. අත්තානුදිට්ඨි

අත්තානුදිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී,[3] සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

1 පාපිකං - මජසං
2 සක්කායදිට්ඨි පරාමාසො චෙව සක්කායදිට්ඨි සීලබ්බතපරාමා සො ච - ස්‍යා
3 'සප්පුරිසානං අදස්සාවී'ති - ස්‍යාමපොත්ථකෙ නත්ථි

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි, නිරය හෝ තිර්යග්යොනි හෝ යි. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් මනඃකර්මයෙක් වේ ද යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, එ හැම ධර්මයෝ අනිෂ්ටයට අකාන්තයට අමනාපයට අහිතයට දුකට වැටෙත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි. යම්සේ කොසොඹ-බිජුවටෙක් වේවයි තිත්තවැටකොළු බිජුවටෙක් වේවයි තිත්තලබුබිජුවටෙක් වේවයි තෙත් පොළොව්හි රොපණය කරන ලද්දේ යම් පෘථිවිරසයෙකුත් ගන්නා ලැබේ ද, යම් අබ්රසයෙකුත් ගන්නා ලැබේ ද, එ හැම තිත්ත බවට කටුක බවට අමධුර බවට වැටෙයි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඒ කොසොඹ ආදිහුගේ බිජුවට ලාමක ද එහෙයිනි. එසෙයින් මැ මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නාලද යම් මනඃකර්මයෙකුත් වේ ද, යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, එ හැම ධර්මයෝ අනිෂ්ටයට අකාන්තයට අමනාපයට අහිතයට දුකට වැටෙත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි. ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිගත යැ දෘෂ්ටිගහන යැ ... දෘෂ්ට්‍යභිනිවෙශ යැ දෘෂ්ටිපරාමර්ශ යි. මේ අටළොස් අයුරින් සමුදාචාරයට පැමිණි සිත් ඇත්තහුගේ සංයොගය වේ.

දෘෂ්ටි ද වූ සංයොජනයෝ ඇත. දෘෂ්ටි නො වූ සංයොජනයෝ ද ඇති. දෘෂ්ටි ද වූ සංයොජනයෝ කවරහ යත්: සත්කායදෘෂ්ටි යැ ශීලව්‍රතපරාමර්ශ යි. මොහු දෘෂ්ටි ද වූ සංයොජනයෝ යි.

දෘෂ්ටි නො වූ සංයොජනයෝ කවරහ යත්: කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ මානසංයොජන යැ විචිකිත්සාසංයොජන යැ භවරාගසංයොජන යැ ඊර්ෂ්‍යාසංයොජන යැ මාත්සර්යසංයොජන යැ අනුනයසංයොජන යැ අවිද්‍යාසංයොජන යි. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

මේ පන්තිස් අයුරින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ.

## 2 – 2 ආත්මානුදෘෂ්ටිය

කවර විසි අයුරින් ආත්මානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වෙයි යත්:

මෙ ලොව්හි (බුද්ධාදි) ආර්‍යයන් නො දක්නාසුලු ආර්‍යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් (විපරීතසංඥායෙන්) දකී. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ දකී. වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්මවශයෙන් (විපරීතසංඥායෙන්) දකී. ආත්මය විඥානවත් කොට හෝ විඥානය ආත්මයෙහි ලා හෝ ආත්මය විඥානයෙහි ලා හෝ දකී.

කථං රූපං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො පඨවීකසිණං[1] අත්තතො සමනුපස්සති, යං පඨවීකසිණං, සො අහං, යො අහං, තං පඨවීකසිණ'න්ති පඨවීකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො 'යා අච්චි,[2] සො වණ්ණො, යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො පඨවීකසිණං අත්තතො සමනුපස්සති, 'යං පඨවීකසිණං, සො අහං; යො අහං තං පඨවීකසිණ'න්ති පඨවීකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො -පෙ- ඉමානි සඤ්ඤොජනානි, න ච දිට්ඨියො.

ඉධෙකච්චො ආපොකසිණං -පෙ- තෙජොකසිණං -පෙ- වායොකසිණං -පෙ- නීලකසිණං -පෙ- පීතකසිණං -පෙ- ලොහිතකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති. 'යං ඔදාතකසිණං සො අහං, යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො 'යා අච්චි සො වණ්ණො යො වණ්ණො සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො -පෙ- ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි, න ච දිට්ඨියො. එවං රූපං අත්තතො සමනුපස්සති.

කථං රූපවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා රූපෙන රූපවා'ති රූපවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනං[3] පුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො, අයං ඡායා; අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා; සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන අයං අත්තා ඉමිනා රූපෙන රූපවා'ති රූපවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපවන්තං අත්තානං සමනුපස්සති.

1 පඨවිකසිණං - මජසං 2 අච්ඡි - සයා 3 තමෙනං - සයා, PTS

කිසෙයින් රූපය ආත්මවශයෙන් දකී ද යත්: මෙ ලොව්හි ඇතැමෙක් පෘථිවිකසිණය ආත්මවශයෙන් දකී. 'යම් පෘථිවිකසිණයෙක් වේ ද හේ මම යෑ, යමෙක් මම් වේ ද හේ පෘථිවිකසිණ යෑ යි පෘථිවිකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල්පහනක්හුගේ යම් සිළුවක් වේ ද හේ වර්ණ යෑ, යමෙක් වර්ණය වේ ද හේ සිළුවැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී. එපරිද්දෙන් මැ මෙලෙව්හි ඇතැමෙක් පෘථිවිකසිණය ආත්මවශයෙන් දකී. 'යම් පෘථිවිකසිණයෙක් වේ ද, හේ මම යෑ, යමෙක් මම් වේ ද හේ පෘථිවිකසිණ යෑ යි පෘථිවිකසිණයත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යෑ, දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යමක් දෘෂ්ටි වේ ද යමෙකුත් වස්තු වේ ද මේ පළමු වැනි රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යෑ... ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

මෙ ලොව්හි ඇතැමෙක් ආපොකසිණය ... තෙජොකසිණය .. වායොකසිණය... නීලකසිණය... පීතකසිණය... ලොහිතකසිණය... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. 'යම් ඔදාතකසිණයෙක් වේ ද, හේ මම යෑ, යමෙක් මම් වේ ද, හේ ඔදාතකසිණ යෑ'යි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල්පහනක්හුගේ යම් සිළුවක් වේ ද, හේ වර්ණ යෑ, යමෙක් වර්ණය වේ ද, හේ සිළුවැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී. එපරිද්දෙන් මැ මෙලොව්හි ඇතැමෙක් ... ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යෑ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක. වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් වේ ද යම් වස්තුවකුත් වේ ද, මේ පළමු වැනි රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී.

කිසෙයින් ආත්මය රූපවත් කොට දකී ද යත්: මෙ ලොව්හි ඇතැමෙක් වෙදනාව සංඥාව සංස්කාරයත් විඥානය ආත්මවශයෙන් (විපරීතසංඥායෙන්) දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යෑ, මාගේ මේ ආත්ම මේ (ශරීරය කසිණ) රූපයෙන් රූපවත් යෑ'යි ආත්මය රූපවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද, ඒ වෘක්ෂය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යෑ. 'මේ වෘක්ෂය යෑ, මේ ඡායා යෑ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකක, වැළිත් ඒ මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් යෑ'යි (මෙසේ) වෘක්ෂය ඡායාවක් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙ ලොව්හි ඇතැමෙක් වෙදනාව-සංඥාව-සංස්කාරයන්-විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි. 'මේ වූකලි මාගේ ආත්ම යෑ, මාගේ මේ ආත්මය මේ රූපයෙන් රූපවත් යෑ'යි ආත්මය රූපවත් කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යෑ, දෘෂ්ටි යෑ වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ දෙවනු වූ රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මය රූපවත් කොට දකී.

කථං අත්තනි රූපං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා ඉමස්මිං ච පන අත්තනි ඉදං රූප'න්ති අත්තනි රූපං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙන[1] පුරිසො එවං වදෙය්‍ය: ඉදං පුප්ඵං, අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං, අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි ඉදං රූප'න්ති අත්තනි රූපං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු: යා ච දිට්ඨි, යඤ්ච වත්ථු; අයං තතියා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති: -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි රූපං සමනුපස්සති.

කථං රූපස්මිං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං රූපෙ'ති රූපවන්තං අත්තානං සමනුපස්සති, සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙන[1] පුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො, සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං රූපෙ'ති රූපස්මිං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි: අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං චතුත්ථා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපස්මිං අත්තානං සමනුපස්සති.

කථං වෙදනං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුසම්ඵස්සජං වෙදනං -පෙ- සොතසම්ඵස්සජං වෙදනං -පෙ- ඝානසම්ඵස්සජං වෙදනං -පෙ- ජිව්හාසම්ඵස්සජං වෙදනං -පෙ- කායසම්ඵස්සජං වෙදනං -පෙ- මනොසම්ඵස්සජං වෙදනං අත්තතො සමනුපස්සති, 'යා මනොසම්ඵස්සජා වෙදනා, සො අහං; යො අහං, සා මනොසම්ඵස්සජා වෙදනා'ති මනොසම්ඵස්සජං වෙදනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි සො වණ්ණො, යො වණ්ණො සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොසම්ඵස්සජං වෙදනං අත්තතො සමනුපස්සති 'යා මනොසම්ඵස්සජා වෙදනා සො අහං, යො අහං සා මනොසම්ඵස්සජා වෙදනා'ති මනොසම්ඵස්සජං වෙදනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා වෙදනාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං වෙදනං අත්තතො සමනුපස්සති.

---

1 තමෙනං - සයා, PTS

කිසෙයින් ආත්මයෙහි ලා රූපය දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මේ ආත්මයෙහි මේ රූප යැ'යි ආත්මයෙහි ලා රූපය දකී. යම්සේ ගන්ධසම්පන්න වූ පුෂ්පයෙක් වන්නේ ද, ඒ පුෂ්පය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: "මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ, පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැලිත් ඒ මේ ගන්ධය තෙමේ මේ පුෂ්පයෙහි වේ යයි. මෙසේ පුෂ්පයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මේ වූ කලී මාගේ ආත්ම යැ, වැලිත් මේ ආත්මයෙහි මේ රූපය වේ'යයි ආත්මයෙහි ලා රූපය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ තුන් වනු වූ රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා රූපය දකී.

කිසෙයින් රූපයෙහි ලා ආත්මය දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය මේ රූපයෙහි වේ' යයි රූපයෙහි ලා ආත්මය දකී. යම්සේ කරඬුවෙක බහාලන ලද මැණිකෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ය: 'මේ මැණික යැ, මේ කරඬුව යැ, මැණික අනෙකෙක කරඬුව අනෙකෙකි. වැලිත් ඒ මේ මැණික තෙමේ මේ කරඬුවෙහි වේ යයි මෙසේ කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූ කලී මාගේ ආත්ම යැ වැලිත් මාගේ මේ ආත්මය මේ රූපයෙහි වේ යයි රූපයෙහි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි වෙයි. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ සතර වනු වූ රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් රූපයෙහි ලා ආත්මය දකී.

කිසෙයින් වේදනාව ආත්මවශයෙන් දකී ද යත්: මෙලොව ඇතැමෙක් චක්ඛුසම්ඵස්සයෙන් උපන් වේදනාව ... සෝතසම්ඵස්සයෙන් උපන් වේදනාව... ඝාණසම්ඵස්සයෙන් උපන් වේදනාව... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වේදනාව ... කායසම්ඵස්සයෙන් උපන් වේදනාව ... මනොසම්ඵස්සයෙන් උපන් වේදනාව ආත්මවශයෙන් දකී. යමක් මනොසම්ඵස්සයෙන් උපන් වේදනා වේ ද, හේ මම් වෙමි. යමෙක් මම් වේ ද, හේ මනොසම්ඵස්සයෙන් උපන් වේදනා වේ' යයි මනොසම්ඵස්සජ වේදනාවත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන පහනක්හුගේ යම් සිළුයෙක් වේ ද, ඒ වර්ණ යැ, යම් වර්ණයෙක් වේ ද, ඒ සිළු යැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් මනොසම්ඵස්සයෙන් උපන් වේදනාව ආත්මවශයෙන් දකී. යමක් මනොසම්ඵස්සයෙන් උපන් වේදනා වේ ද, හේ මම් වෙමි. යමෙක් මම් වේ ද, ඒ මනොසම්ඵස්සජ වේදනා වේ' යයි මනොසම්ඵස්සජ වේදනාවත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි වෙයි. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ වේදනා වස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් වේදනාව ආත්මවශයෙන් දකී.

කථං වේදනාවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වේදනාය වේදනාවා'ති වේදනාවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො අයං ඡායා, අඤ්ඤො රුක්ඛො අඤ්ඤා ඡායා, සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වේදනාය වේදනාවා'ති වේදනාවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු; අයං දුතියා වේදනාවත්ථුකා අත්තානුදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං වේදනාවන්තං අත්තානං සමනුපස්සති.

කථං අත්තනි වේදනං සමනුපස්සති: ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිඤ්ච පන අත්තනි අයං වේදනා'ති අත්තනි වේදනං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'ඉදං පුප්ඵං, අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං අඤ්ඤො ගන්ධො; සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා: ඉමස්මිං ච පන අත්තනි අයං වේදනා'ති අත්තනි වේදනං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු; අයං තතියා වේදනාවත්ථුකා අත්තානුදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි වේදනං සමනුපස්සති.

කථං වේදනාය අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වේදනායා'ති වේදනාය අත්තානං සමනුපස්සති. 'සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි, අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො. සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වේදනායා'ති වේදනාය අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං චතුත්ථා වේදනා වත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨි-විපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං වේදනාය අත්තානං සමනුපස්සති.

කිසෙයින් ආත්මය වේදනාවත් කොට දකී ද යත්: මෙලොව ඇතැමෙක් සංඥාව සංස්කාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: ‘මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ වේදනායෙන් වේදනාවත් යැ’යි ආත්මය වේදනාවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්න රුකෙක් වන්නේ ද එ රුක ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: ‘මේ රුක යැ, මේ සෙවණලු යැ, රුක අනෙකෙක, සෙවණැල්ල අනෙකෙකි. වැළිත් ඒ මේ රුක මේ සෙවණලුයෙන් සෙවණලු ඇත්තේ යැ’යි (මෙසේ) රුක සෙවණලු ඇත්තක් කොට දකී ද එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් සංඥාව සංස්කාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙම මේ වේදනායෙන් වේදනාවත් වේ’යයි ආත්මය වේදනාවත් කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි වෙයි. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද මේ දෙවනු වූ වේදනා වස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තියැ . මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මය වේදනාවත් කොට දකී.

කිසෙයින් ආත්මයෙහි ලා වේදනාව දකී ද යත්: මෙ ලොව ඇතැමෙක් සංඥාව සංස්කාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: ‘මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ වේදනාව වේ’ යයි ආත්මයෙහි ලා වේදනාව දකී. යම්සේ ගන්ධසම්පන්නපුෂ්පයෙක් වේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: ‘මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ, පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැළිත්, ඒ මේ ගන්ධය තෙමේ මේ පුෂ්පයෙහි වේ’ යයි මෙසේ පුෂ්පයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් සංඥාව සංස්කාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. ‘මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ වේදනාව වේ’ යයි ආත්මයෙහි ලා වේදනාව දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ තුන්වනු වූ වේදනාවස්තුක-ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා වේදනාව දකී.

කිසෙයින් වේදනායෙහි ලා ආත්මය දකී ද යත්: මෙලොව ඇතැමෙක් සංඥාව සංස්කාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: ‘මේ වූ කලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ වේදනායෙහි වේ’ යයි වේදනායෙහි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලන ලද්දේ වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: මේ මැණික, මේ කරඬු යැ, මැණික අනෙකෙක කරඬුව අනෙකෙකි. වැළිත් මේ මැණික කරඬුයෙහි වේ යයි (මෙසේ) කරඬුයෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් සංඥාව සංස්කාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: ‘මේ වූ කලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ වේදනායෙහි වේ’ යයි වේදනායෙහි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ සතරවනු වූ වේදනාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ, මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් වේදනායෙහි ලා ආත්මය දකී.

කථං සඤ්ඤං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුසම්ඵස්සජං සඤ්ඤං-පෙ- සොතසම්ඵස්සජං සඤ්ඤං-පෙ- ඝානසම්ඵස්සජං සඤ්ඤං-පෙ- ජිව්හාසම්ඵස්සජං සඤ්ඤං -පෙ- කායසම්ඵස්සජං සඤ්ඤං -පෙ- මනොසම්ඵස්සජං සඤ්ඤං අත්තතො සමනුපස්සති. 'යා මනොසම්ඵස්සජා සඤ්ඤා, සො අහං; යො අහං සා මනොසම්ඵස්සජා සඤ්ඤා'ති මනොසම්ඵස්සජං සඤ්ඤඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි, සො වණ්ණො; යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොසම්ඵස්සජං සඤ්ඤං අත්තතො සමනුපස්සති, යා මනොසම්ඵස්සජා සඤ්ඤා සො අහං, යො අහං සා මනොසම්ඵස්සජා සඤ්ඤා'ති මනොසම්ඵස්සජං සඤ්ඤඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං පඨමා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං සඤ්ඤං අත්තතො සමනුපස්සති.

කථං සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය සඤ්ඤවා'ති සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති, සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනං පුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො අඤ්ඤා ඡායා, සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය සඤ්ඤවා'ති සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති.

කථං අත්තනි සඤ්ඤං සමනුපස්සති: ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි අයං සඤ්ඤා'ති අත්තනි සඤ්ඤං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනං පුරිසො, එවං වදෙය්‍ය: 'ඉදං පුප්ඵං, අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං, අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි අයං සඤ්ඤා'ති අත්තනි සඤ්ඤං සමනුපස්සති. අභිනිවෙස-පරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං තතියා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං අත්තනි සඤ්ඤං සමනුපස්සති.

කිසෙයින් සංඥාව ආත්මවශයෙන් දකී ද යත්: මෙලොව ඇතැමෙක් චක්ඛුසම්ඵස්සයෙන් උපන් සංඥාව ... සොතසම්ඵස්සයෙන් උපන් සංඥාව ... ඝානසම්ඵස්සයෙන් උපන් සංඥාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් සංඥාව ... කායසම්ඵස්සයෙන් උපන් සංඥාව ... මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව ආත්මවශයෙන් දකී. 'යමක් මනොසම්ඵස්සයෙන් උපන් සංඥා වේ ද හේ මම් වෙමි, යමෙක් මම් වේ ද, හෝ මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව වේ' යයි මනොසම්ඵස්සයෙන් උපන් සංඥාවත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල් පහනක්හුගේ යමක් සිළුව වේ ද, ඒ වර්ණ ය, යමෙක් වර්ණය වේ ද, ඒ සිළුවැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් මනොසම්ඵස්ස-යෙන්උපන් සංඥාව ආත්මවශයෙන් දකී. 'යමක් මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව වේ ද, හේ මම් වෙමි, යමෙක් මම් වේ ද හෝ මනොසම්ඵස්ස-යෙන් උපන් සංඥාව වේ' යයි මනොසම්ඵස්සයෙන් උපන් සංඥාවත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් සංඥාව ආත්මවශයෙන් දකී.

කිසෙයින් ආත්මය සංඥාවත් කොට දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංඥායෙන් සංඥාවත් වේ' යයි ආත්මය සංඥාවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද 'මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකක; වැලිත් මේ වෘක්ෂය තෙමේ මේ ඡායායෙන් ඡායාවත් වේ' යයි (මෙසේ) වෘක්ෂය ඡායාවත් කොට දකී ද එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංඥායෙන් 'සංඥාවත් වේ' යයි ආත්මය සංඥාවත් කොට දකී අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නොවෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ දෙවනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මය සංඥාවත් කොට දකී.

කිසෙයින් ආත්මයෙහි ලා සංඥාව දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ වැලිත් මේ ආත්මයෙහි මේ සංඥාව වේ' යයි ආත්මයෙහි ලා සංඥාව දකී. යම්සේ ගන්ධසම්පන්න පුෂ්පයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද 'මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ; පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැලිත් ඒ මේ ගන්ධය මේ පුෂ්පයෙහි වේ' යයි (මෙසේ) පුෂ්ප-යෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් මේ ආත්මයෙහි මේ සංඥාව වේ' යයි ආත්මයෙහි ලා සංඥාව දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. මේ තුන්වනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටි මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් අත්මයෙහි ලා සංඥාව දකී.

කථං සඤ්ඤාය අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය'ති සඤ්ඤාය අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි, අයං කරණ්ඩකො අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො, සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති, එවමෙව ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය'ති සඤ්ඤාය අත්තානං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු අයං චතුත්ථා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඤ්ඤාය අත්තානං සමනුපස්සති.

කථං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුසම්ඵස්සජං චෙතනං -පෙ- සොතසම්ඵස්සජං චෙතනං -පෙ- ඝානසම්ඵස්සජං චෙතනං -පෙ- ජිව්හාසම්ඵස්සජං චෙතනං -පෙ- කායසම්ඵස්සජං චෙතනං -පෙ- මනොසම්ඵස්සජං චෙතනං අත්තතො සමනුපස්සති: 'යා මනොසම්ඵස්සජා චෙතනා සො අහං, යො අහං සා මනොසම්ඵස්සජා චෙතනා'ති මනොසම්ඵස්සජං චෙතනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි, සො වණ්ණො; යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොසම්ඵස්සජං චෙතනං අත්තතො සමනුපස්සති; 'යා මනොසම්ඵස්සජා චෙතනා සො අහං යො අහං සා මනොසම්ඵස්සජා චෙතනා'ති මනොසම්ඵස්සජං චෙතනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති.

කථං සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමෙහි සඞ්ඛාරෙහි සඞ්ඛාරවා'ති සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා; සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා සො ඛො පන මෙ අයං අත්තා ඉමෙහි සඞ්ඛාරෙහි සඞ්ඛාරවාති සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු: යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති

කිසෙයින් සංඥායෙහි ලා ආත්මය දකී ද යත්: මෙලොව ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වේදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මේ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ සංඥායෙහි වේ' යයි සංඥායෙහි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලන ලද්දේ වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද: 'මේ මැණික, මේ කරඬුව, මැණික අනෙකෙක, කරඬුව අනෙකෙකි. වැළිත් මේ මැණික මේ කරඬුවෙහි වේ' යයි කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙ ලොව ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වේදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ සංඥායෙහි වේ'යයි සංඥායෙහි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශීය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ සතර වනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටිය නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් සංඥායෙහි ලා ආත්මය දකී.

කිසෙයින් සංස්කාරයන් ආත්මවශයෙන් දකී ද යත්: මෙලොව ඇතැමෙක් චක්ඛුසම්ඵස්සයෙන් උපන් චේතනාව ... සොතසම්ඵස්සයෙන් උපන් චේතනාව ... ඝානසම්ඵස්සයෙන් උපන් චෙතනාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් චේතනාව ... කායසම්ඵස්සයෙන් උපන් චේතනාව ... මනොසම්ඵස්සයෙන් උපන් චේතනාව ... ආත්මවශයෙන් දකී. යමක් මනොසම්ඵයෙන් උපන් චේතනා වේ ද හේ මම් වෙමි, යමෙක් මම් වේ ද හෝ මනොසම්ඵස්සයෙන් උපන් චේතනා වේ' යයි මනොසම්ඵස්සජචේතනාවත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල් පහනක්හුගේ යම් සිළුවක් වේ ද ඒ වණී වෙයි. යමෙක් වණීය වේ ද ඒ සිළුව වේ' යයි සිළුවත් වණීයත් එකක් මැ කොට දකි ද එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් මනොසම්ඵස්සයෙන් උපන් චේතනාව ආත්මවශයෙන් දකී. 'යමක් මනොසම්ඵස්සයෙන් උපන් චේතනා වේ ද හේ මම් වෙමි. යමෙක් මම් වේ ද හෝ මනොසම්ඵස්සයෙන් උපන් චේතනා වේ' යයි මනොසම්ඵස්සජචේතනාවත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවේශපරාමර්ශීය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ සංස්කාර වස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් සංස්කාරයන් ආත්මවශයෙන් දකී.

කිසෙයින් ආත්මය සංස්කාරවත් කොට දකී ද යත්: මෙ ලොව ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංස්කාරයන්ගෙන් සංස්කාරවත් වේ' යයි ආත්මය සංස්කාරවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්න වෘක්ෂයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකකි. වැළිත් මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් වේ'යයි මෙසේ වෘක්ෂය ඡායාවත් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ සංස්කාරයන්ගෙන් සංස්කාරවත් වේ' යයි ආත්මය සංස්කාරවත් කොට දකී. අභිනිවේශපරාමර්ශීය දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ දෙවනු වූ සංස්කාරවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මය සංස්කාරවත් කොට දකී.

කථං අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති: ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිඤ්ච පන අත්තනි ඉමෙ සඞ්ඛාරා'ති අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙන පුරිසො එවං වදෙය්‍ය: 'ඉදං පුප්ඵං අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිඤ්ච පන අත්තනි ඉමෙ සඞ්ඛාරා'ති අත්තනි සඞ්ඛාරෙ සමනු-පස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං තතියා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති.

කථං සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමෙසු සඞ්ඛාරෙසූ'ති සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි, අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො; සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමෙසු සඞ්ඛාරෙසූ'ති සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං චතුත්ථා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති.

කථං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුවිඤ්ඤාණං -පෙ- සොතවිඤ්ඤාණං -පෙ- ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං අත්තතො සමනුපස්සති: 'යං මනො-විඤ්ඤාණං සො අහං, යො අහං තං මනොවිඤ්ඤාණ'න්ති මනොවිඤ්ඤාණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි සො වණ්ණො, යො වණ්ණො සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොවිඤ්ඤාණං අත්තතො සමනු-පස්සති: 'යං මනොවිඤ්ඤාණං සො අහං, යො අහං තං මනොවිඤ්ඤා-ණ'න්ති මනොවිඤ්ඤාණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙස-පරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඤ්චමා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති.

කිසෙයින් ආත්මයෙහි ලා සංස්කාරයන් දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් විඥනය රූපය වේදනාව සංඥව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ සංස්කාරයෝ වෙති' ආත්මයෙහි ලා සංස්කාරයන් දකී. යම්සේ ගන්ධසම්පන්න පුෂ්පයෙක් වන්නේ ද එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද 'මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ, පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැළිත් මේ ගන්ධය මේ පුෂ්පයෙහි වේ'යයි පුෂ්පයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් විඥනය රූපය වේදනාව සංඥව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් 'මේ ආත්මයෙහි මේ සංස්කාරයෝ වෙති' ආත්මයෙහි ලා සංස්කාරයන් දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ තුන්වනු වූ සංස්කාරවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා සංස්කාරයන් දකී.

කිසෙයින් සංස්කාරයන්හි ලා ආත්මය දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් විඥනය රූපය වේදනාව සංඥව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංස්කාරයන්හි වේ'යයි සංස්කාරයන්හි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලනලද්දේ වේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද: 'මේ මැණිකා, මේ කරඬුවැ. මැණික අනෙකෙක, කරඬුව අනෙකෙකි. වැළිත් මේ මැණික මේ කරඬුවෙහි වේ' යයි (මෙසේ) කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් විඥනය රූපය වේදනාව සංඥව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූ කලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංස්කාරයන්හි වේ'යයි සංස්කාරයන්හි ලා ආත්මය දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ සතර වනු වූ සංස්කාරවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් සංස්කාරයන්හි ලා ආත්මය දකී.

කිසෙයින් විඥනය ආත්මවශයෙන් දකී ද යත්: මෙලොව ඇතැමෙක් චක්ෂුර්විඥනය, ශ්‍රොත්‍රවිඥනය, ඝ්‍රාණවිඥනය, ජිහ්වාවිඥනය, කායවිඥනය, මනොවිඥනය ආත්මවශයෙන් දකී. යමෙක් මනොවිඥන වේ ද, හේ මම් වෙමි. යමෙක් මම් වේ ද ඒ මනොවිඥන වේ' යයි මනොවිඥනයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල් පහනක්හු ගේ යම් සිළුවක් වේ ද හේ වර්ණ යැ, යමෙක් වර්ණ වේ ද; ඒ සිළුවැ' යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් මනොවිඥනය ආත්මවශයෙන් දකී. යමෙක් මනොවිඥන වේ ද හේ මම වෙමි. යමෙක් මම් වේ ද හේ මනොවිඥන වේ' යයි මනොවිඥනයත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තුව නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ, පළමුවනු වූ විඥනවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් විඥනය ආත්මවශයෙන් දකී.

කථං විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා විඤ්ඤාණෙන විඤ්ඤාණවා’ති විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා; සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා’ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා විඤ්ඤාණෙන විඤ්ඤාණවා’ති විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු: යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති.

කථං අත්තනි විඤ්ඤාණං සමනුපස්සති: ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති. ‘අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි ඉදං විඤ්ඤාණ’න්ති අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: ‘ඉදං පුප්ඵං, අයං ගන්ධො: අඤ්ඤං පුප්ඵං අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ’ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි ඉදං විඤ්ඤාණ’න්ති අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං තතියා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි විඤ්ඤාණං සමනුපස්සති.

කථං විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති. ‘අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං විඤ්ඤාණෙ’ති විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: ‘අයං මණි, අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො; සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ’ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං විඤ්ඤාණෙ’ති විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං චතුත්ථා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති.

අත්තානුදිට්ඨියා ඉමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

කිසෙයින් ආත්මය විඥානවත් කොට දකී ද යත්: මෙලොව ඇතැමෙක් රූපය, වේදනාව, සංඥාව, සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ විඥානයෙන් විඥානවත් වේ' යයි ආත්මය විඥානවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, 'මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකෙකි. වැලිත් ඒ මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් වේ'යයි, මෙසේ වෘක්ෂය ඡායාවත් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් රූපය, වේදනාව, සංඥාව, සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි, මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ විඥානයෙන් විඥානවත් වේ' යයි ආත්මය විඥානවත් කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් විස්තුවක් හා වේ ද, මේ දෙවනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මය විඥානවත් කොට දකී.

කිසෙයින් ආත්මයෙහි ලා විඥානය දකී ද යත්: මෙලොව ඇතැමෙක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මේ ආත්මයෙහි මේ විඥානය වේ' යයි විඥානය ආත්මයෙහි ලා දකී. යම්සේ ගන්ධසම්පන්න පුෂ්පයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ; පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි, වැලිත් මේ ගන්ධය මේ පුෂ්පයෙහි වේ' යයි (මෙසේ) ගන්ධය පුෂ්පයෙහි ලා දකී ද, එපරිද්දෙන් මැ මෙ ලොව ඇතැමෙක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මේ බඳු සිතෙක් වෙයි: මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මෙ ආත්මයෙහි මේ විඥානය වේ' යයි ආත්මයෙහි ලා විඥානය දකී අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තුව නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ තුන්වනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා විඥානය දකී.

කිසෙයින් විඥානයෙහි ලා ආත්මය දකී ද යත්: මෙලොව ඇතැමෙක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය මේ විඥානයෙහි වේ'යයි විඥානයෙහි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලන ලද්දේ වේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, 'මේ මැණික, මේ කරඬුවැ, මැණික අනෙකෙක, කරඬුව අනෙකෙකි. වැලිත් මේ මැණික කරඬුවෙහි වේ'යයි. (මෙසේ) කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් රූපය, වේදනාව සංඥාව, සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ විඥානයෙහි වේ'යයි විඥානයෙහි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ සතරවනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් විඥානයෙහි ලා ආත්මය දකී

ආත්මානුදෘෂ්ටියෙහි මේ විසි අයුරින් අභිනිවේශය වේ.

## 2 – 3. මිච්ඡාදිට්ඨි

මිච්ඡාදිට්ඨියා කතමෙහි දසහාකාරෙහි අභිනිවෙසො හොති:

'නත්ථි දින්න'න්ති වත්ථු[1] එවංවාදෙ, මිච්ඡාභිනිවෙසපරාමාසො[2] දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා මිච්ඡාවත්ථුකා මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි, න ච දිට්ඨියො.

'නත්ථි යිට්ඨං'න්ති වත්ථු -පෙ- 'නත්ථි හුත'න්ති වත්ථු -පෙ- 'නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො'ති වත්ථු -පෙ- 'නත්ථි අයං ලොකො'ති වත්ථු -පෙ- 'නත්ථි පරො ලොකො'ති වත්ථු -පෙ- 'නත්ථි මාතා'ති වත්ථු -පෙ- 'නත්ථි පිතා'ති වත්ථු -පෙ- 'නත්ථි සත්තා ඔපපාතිකා'ති වත්ථු -පෙ- 'නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති වත්ථු, එවංවාදෙ මිච්ඡාභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දසමා මිච්ඡාවත්ථුකා මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. මිච්ඡාදිට්ඨියා ඉමෙහි දසහාකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 4. සක්කායදිට්ඨි

'සක්කායදිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

කථං රූපං අත්තතො සමනුපස්සති. ඉධෙකච්චො පඨවීකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති: 'යං ඔදාතකසිණං සො අහං යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො -පෙ- එවමෙව ඉධෙකච්චො ඔදාතකසිණං අත්තතො සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි -පෙ- අයං පඨමා රූපවත්ථුකා සක්කායදිට්ඨි සක්කායදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපං අත්තතො සමනුපස්සති -පෙ- සක්කායදිට්ඨියා ඉමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

---

1. වත්ථුං - ස්‍යා. ඝ්‍යා PTS සිහළක්ඛරපොත්ථකෙසු නත්ථි.
2. මිච්ඡාදිට්ඨාභිනිවෙසපරාමාසො - ඝ්‍යා PTS

## 2 - 3. මිථ්‍යාදෘෂ්ටිය

මිථ්‍යාදෘෂ්ටියෙහි කවර දස අයුරෙකින් අභිනිවේශ වෙයි යත්:

'දානයෙහි ඵල නැත' යනු වස්තු යැ. මෙ බඳු වාද ඇති මිථ්‍යාභිනිවේශයාගේ පරාමර්ශය දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ මිථ්‍යාවස්තුක මිථ්‍යාදෘෂ්ටි වේ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'යාගයෙහි ඵල නැත' යනු වස්තු යැ ... 'මහායාගයෙහි ඵල නැත' යනු වස්තු යැ ... 'සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක නැත' යනු යනු වස්තු යැ ... (පෙර කළ කර්මයෙන්) 'මෙලොව නැත' යනු වස්තු යැ ... (මෙහි කළ කර්මයෙන්) 'පරලොව නැත' යනු වස්තු යැ ... 'මවු නැත' යනු වස්තු යැ ... 'පියා නැත' යනු වස්තු යැ ... 'ඖපපාතිකසත්ත්වයෝ නැත' යනු වස්තු යැ ... 'යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් එ බඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න ශ්‍රමණබ්‍රාහමණයෝ ලොවැ නැත' යනු වස්තු යැ මෙ බඳු වාද ඇති මිථ්‍යාභිනිවේශයාගේ පරාමර්ශය දෘෂ්ටි නම්. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ දසවනු වූ මිථ්‍යාවස්තුක මිථ්‍යාදෘෂ්ටි වේ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂ පුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මිථ්‍යාදෘෂ්ටියෙහි මේ දසඅයුරින් අභිනිවේශය වේ.

## 2 - 4. සත්කායදෘෂ්ටිය

සත්කායදෘෂ්ටියෙහි කවර විසි අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

මෙලොවැ (බුද්ධාදි) ආර්‍යයන් නො දක්නාසුලු ආර්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් (විපරීතසංඥයෙන්) දකී. ආත්මය රූපවත් කොට හෝ, රූප ආත්මයෙහි ලා හෝ, ආත්මය රූපයෙහි ලා හෝ වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්මවශයෙන් දකී. ආත්මය විඥානවත් කොට හෝ, විඥානය ආත්මයෙහි ලා හෝ, ආත්මය විඥානයෙහි ලා හෝ දකී.

කිසෙයින් රූපය ආත්මවශයෙන් දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් පඨවිකසිණය ... ඕදාතකසිණය ආත්මවශයෙන් දකී. යමෙක් ඕදාතකසිණ වේ ද සේ මම වෙමි, යමෙක් මම වේ ද ඒ ඕදාතකසිණ වේ' යයි ඕදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දල්වෙන පහනක්හුගේ... එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් ඕදාතකසිණය ආත්මවශයෙන් දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ .. මේ පළමුවනු වූ රූපවස්තුකසත්කායදෘෂ්ටි වේ. සත්කාය දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි ය ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී සත්කායදෘෂ්ටියෙහි මේ විසිඅයුරින් අභිනිවේශය වේ.

## 2 – 5. සක්කායවත්ථුකා සස්සතදිට්ඨි.

සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා කතමෙහි පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනාවන්තං වා අත්තානං -පෙ- සඤ්ඤාවන්තං වා අත්තානං -පෙ- සඞ්ඛාරවන්තං වා අත්තානං -පෙ- විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

කථං රූපවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා රූපෙන රූපවා'ති රූපවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායා-සම්පන්නො අස්ස, තමෙනං පුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා. සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති, එවමෙව ඉධෙ-කච්චො වෙදනං -පෙ- අයං පඨමා සක්කායවත්ථුකා සස්සතදිට්ඨි සස්ස-තදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූප-වන්තං අත්තානං සමනුපස්සති. -පෙ- සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා ඉමෙහි පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 6. සක්කායවත්ථුකා උච්ඡෙදදිට්ඨි.

සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා කතමෙහි පඤ්චහි ආකාරෙහි අභි-නිවෙසො හොති.

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, වෙදනං අත්තතො සමනුපස්සති, සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, විඤ්ඤාණං අත්තතො සමනුපස්සති.

කථං රූපං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො පඨවීකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති: යං ඔදාතකසිණං සො අහං යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනු-පස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො -පෙ- අයං පඨමා සස්සත-වත්ථුකා උච්ඡෙදදිට්ඨි, උච්ඡෙදදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපං අත්තතො සමනුපස්සති -පෙ- සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා ඉමෙහි පඤ්චහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 5. සත්කායවස්තුකශාශ්වතදෘෂ්ටිය

සත්කායවස්තුකශාශ්වතදෘෂ්ටියෙහි කවර පසළොස් අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

මෙලොවැ ආර්යයන් නො දක්නාසුලු ආර්යධර්මයෙහි අදක්ෂ වූ ආර්යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ ආත්මය වේදනාවත් කොට හෝ ... ආත්මය සංඥාවත් කොට හෝ ... ආත්මය සංස්කාරවත් කොට හෝ ... ආත්මය විඥානවත් කොට හෝ ... විඥානය ආත්මයෙහි ලා හෝ ... ආත්මය විඥානයෙහි ලා හෝ දකී.

කිසෙයින් ආත්මය රූපවත් කොට දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙම මේ රූපයෙන් රූපවත් වේ'යයි ආත්මය රූපවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද: 'මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකෙකි. වැලිත් ඒ මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් වේ' යයි (මෙසේ) වෘක්ෂය ඡායාවත් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් වේදනාව ... මේ පළමුවනු වූ සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටි නම. ශාශ්වතදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මය රූපවත් කොට දකී ... සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටියෙහි මේ පසළොස් අයුරින් අභිනිවේශය වේ.

## 2 – 6. සත්කාය වස්තුක උච්ඡේද දෘෂ්ටිය

කවර පස් අයුරෙකින් සත්කාය වස්තුක උච්ඡේද දෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද යත්:

මෙලොවැ ආර්යයන් නො දක්නාසුලු ආර්යධර්මයෙහි අදක්ෂ වූ ආර්යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් දකී. වේදනාව ආත්මවශයෙන් දකී, සංඥාව ආත්මවශයෙන් දකී, සංස්කාරයන් ආත්මවශයෙන් දකී, විඥානය ආත්මවශයෙන් දකී.

කිසෙයින් රූපය ආත්මවශයෙන් දක්නේ ද යත්: මෙලොවැ ඇතැමෙක් පඨවිකසිණය ... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. යමෙක් ඔදාතකසිණ වේ ද හේ මම් වෙමි, යමෙක් මම් වේ ද ඒ ඔදාතකසිණ වේ' යයි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දල්වෙන තෙල් පහනක්හු ගේ ... මේ පළමුවනු වූ සත්කාය වස්තුක උච්ඡේදදෘෂ්ටි නම. උච්ඡේදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී ... මේ පස් අයුරින් සත්කායවස්තුක උච්ඡේදදෘෂ්ටියෙහි අභිනිවේශය වේ.

## 2 - 7. අන්තග්ගාහිකාදිට්ඨි

අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්ඤාසාය ආකාරෙහි අභිනිවෙසො හොති:

සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති. 'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති. අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'තං ජීවං තං සරීරන්ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'න හොති තථාගතො පරං මරණා'ති -පෙ- 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහා-කාරෙහි අභිනිවෙසො හොති.

'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසොහොති -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්ච-හාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ලොකො චෙව සස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි. දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු. අයං පඨමා 'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි. අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ලොකො චෙව සස්සතා චා'ති -පෙ- 'සඤ්ඤා ලොකො චෙව සස්සතා චා'ති -පෙ- 'සඞ්ඛාරා ලොකො චෙව සස්සතා චා'ති -පෙ- 'විඤ්ඤාණං ලොකො චෙව සස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඤ්චමී 'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. 'සස්සතො ලොකො'ති අන්තග්ගාහි-කාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්ච-හාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ලොකො චෙව අසස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො' ති අන්තග්ගාහිකා දිට්ඨි-පෙ- අයං පඨමා අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

## 2 – 7 අන්තග්‍රාහිකදෘෂ්ටිය

කවර පනස් අයුරෙකින් අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද යත්:

'ලෝකය ශාශ්වතය'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කිහි අයුරෙකින් අභිනිවේශය වේ ද, 'ලෝකය අශාශ්වතය'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කිහි අයුරෙකින් අභිනිවේශය වේ ද, 'ලෝකය අන්ත ඇත්තේ යැ'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි ... 'ලෝකය අන්ත නැත්තේ යැ'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි ... හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි ...'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ' යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වේ' යයි ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො වේ' යයි ... 'සත්ත්වතෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ' යයි ... 'සත්ත්වතෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කිහි අයුරෙකින් අභිනිවේශය වේ ද යත්:

ලෝකය ශාශ්වතය'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි පස් අයුරෙකින් අභිනිවේශය වෙයි ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි පස් අයුරෙකින් අභිනිවේශය වේ.

'ලෝකය ශාශ්වතය'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපයත් ලෝකයත් ශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශීය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමු වනු වූ 'ලෝකය ශාශ්වත යැ යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වේදනාව ලෝක ද ශාශ්වත ද වේ' යයි ... 'සංඥාව ලෝක ද ශාශ්වත ද වේ' යයි ... සංස්කාරයෝ ලෝක ද ශාශ්වත ද වෙති .. 'විඥානය ලෝක ද ශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශීය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නුයි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පස්වනු වූ 'ලෝකය ශාශ්වත යැ, යන අන්තග්‍රාහිකදෘෂ්ටි නමි. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. 'ලෝකය ශාශ්වත යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ලෝකය අශාශ්වත යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපයත් ලෝකයත් අශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශීය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නුයි අන්තග්‍රාහිකදෘෂ්ටි නම ... මේ පළමු වනු වූ 'ලෝකය අශාශ්වත යැ යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තියැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වෙදනා ලොකො චෙව අසස්සතා චා'ති -පෙ- 'සඤ්ඤා ලොකො චෙව අසස්සතා චා'ති -පෙ- 'සඞ්ඛාරා ලොකො චෙව අසස්සතා චා'ති -පෙ- විඤ්ඤාණං ලොකො චෙව අසස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. 'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: ඉධෙකච්චො පරිත්තං ඔකාසං නීලකතො ඵරති, තස්ස එවං හොති: 'අන්තවා අයං ලොකො පරිවටුමො'ති අන්තසඤ්ඤී හොති. 'යං ඵරති, තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

ඉධෙකච්චො පරිත්තං ඔකාසං පීතකතො ඵරති -පෙ- ලොහිතකතො ඵරති -පෙ- ඔදාතකතො ඵරති -පෙ- ඔභාසකතො ඵරති, තස්ස එවං හොති: 'අන්තවා අයං ලොකො පරිවටුමො'ති අන්තසඤ්ඤී හොති. 'යං ඵරති තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරහි අභිනිවෙසො හොති.

'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: ඉධෙකච්චො විපුලං ඔකාසං නීලකතො ඵරති. තස්ස එවං හොති: 'අනන්තවා අයං ලොකො අපරියන්තො'ති අනන්තසඤ්ඤී හොති. 'යං ඵරති, තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි. දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි. අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

ඉධෙකච්චො විපුලං ඔකාසං පීතකතො ඵරති -පෙ- ලොහිතකතො ඵරති -පෙ- ඔදාතකතො ඵරති -පෙ- ඔභාසකතො ඵරති, තස්ස එවං හොති. 'අනන්තවා අයං ලොකො අපරියන්තො'ති අනන්තසඤ්ඤී හොති. 'යං ඵරති, තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'වේදනාව ලෝක ද අශාශ්වත ද වේ' යයි ... සංඥාව ලෝක ද අශාශ්වත ද වේ යයි ... සංස්කාරයෝ ලෝක ද අශාශ්වත ද වෙත්' යයි ... විඥානය ලෝක ද අශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ ... ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. ... අන්තග්‍රාහික දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. 'ලෝකය අශාශ්වත යැ, යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ලෝකය අන්ත ඇත්තේ යැ' යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: මෙලොවැ ඇතැමෙක් අල්ප අවකාශයක් නීල වශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මෙලොවැ අන්තවත් යැ පිරිසිඳීම් ඇත්තේ ය'යි. අන්තසංඥා ඇත්තේ වෙයි. යම් කසිණරූපයක් අරමුණු කෙරේ ද ඒ කසිණරූපය වස්තු (අරමුණ) ද ලෝක ද වෙයි, යම් සිතෙකින් අරමුණු කෙරේ ද එ සිත ආත්ම ද ලෝක ද වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමුවනු වූ ''ලෝකය අන්තවත් යැ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

මෙ ලොවැ ඇතැමෙක් මඳ අවකාශයක් පීත වශයෙන් අරමුණු කෙරෙයි ... ලෝහිතවශයෙන් අරමුණු කෙරෙයි... අවදාත වශයෙන් අරමුණු කෙරෙයි .. අවභාසවශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මෙලොවැ අන්තවත් යැ පිරිසිඳීම් ඇත්තේ යැ'යි අන්තසංඥා ඇත්තේ වෙයි. 'යම් කසිණරූපයක් අරමුණු කෙරේ ද, ඒ කසිණරූපය වස්තු ද ලෝක ද වෙයි. යම් සිතෙකින් අරමුණු කෙරේ ද එ සිත ආත්ම ද ලෝක ද වේ යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම, ... 'ලෝකය අන්තවත් යැ' යන අන්තග්‍රාහික දෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ලෝකය අන්ත නැත්තේ යැ'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: මෙලොව අතැමෙක් මහත් අවකාශයක් නීල වශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මෙලොව අන්ත නැත්තේ යැ පරිච්ඡේද නැත්තේ යැ'යි අනන්තසංඥා ඇත්තේ වෙයි. යම් කසිණරූපයක් අරමුණ කෙරේ ද ඒ කසිණරූපය වස්තු ද ලෝක ද වෙයි, යම් සිතෙකින් අරමුණු කෙරේ ද එ සිත ආත්ම ද ලෝක ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ 'ලෝකය අන්ත නැත්තේ යැ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහික දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

මෙලොව ඇතැමෙක් මහත් අවකාශයක් පීත වශයෙන් අරමුණු කෙරෙයි ... ලෝහිත වශයෙන් අරමුණු කෙරෙයි ... අවදාතවශයෙන් අරමුණු කෙරෙයි ... අවභාස වශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මෙලොව අන්තවත් නො වෙයි පරිච්ඡේද නැත්තේ යැ'යි අනන්තසංඥා ඇත්තේ වෙයි. 'යම් කසිණරූපයක් අරමුණු කෙරේ ද ඒ කසිණරූපය වස්තු ද ලෝක ද වෙයි, යම් සිතෙකින් අරමුණ කෙරේ ද එ සිත ආත්මද ලෝක ද වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි යැ ... ලෝකය අන්ත-නැත්තේ ය' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ජීවඤ්චෙව සරීරඤ්ච, යං ජීවං තං සරීරං, යං සරීරං තං ජීව'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ජීවං[1] චෙව සරීරඤ්ච -පෙ- සඤ්ඤා ජීවං චෙව සරීරඤ්ච -පෙ- සඞ්ඛාරා ජීවං චෙව සරීරඤ්ච -පෙ- 'විඤ්ඤාණං ජීවඤ්චෙව සරීරඤ්ච, යං ජීවං තං සරීරං, යං සරීරං තං ජීව'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං සරීරං න ජීවං, ජීවං න සරීරං. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි. දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකා දිට්ඨි අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

වෙදනා සරීරං න ජීවං -පෙ- සඤ්ඤා සරීරං න ජීවං -පෙ- සඞ්ඛාරා සරීරං න ජීවං -පෙ- විඤ්ඤාණං සරීරං න ජීවං, ජීවං න සරීරං. අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීර'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'හොති තථාගතො පරම්මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොති'පි තිට්ඨතිපි උප්පජ්ජතිපි නිබ්බත්තතිපී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ- විඤ්ඤාණං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොතිපි තිට්ඨතිපි උප්පජ්ජතිපි නිබ්බත්තතිපී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'හොති තථාගතො පරම්මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

1 ජීවා - ඡපසං., සතා

'හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස්-අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපය ජීව ද ශරීර ද වෙයි. යමෙක් ජීව ද හේ ශරීර යැ, යමෙක් ශරීර ද හේ ජීව යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමු වනු වූ 'හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

වෙදනාව ජීව ද ශරීර ද වෙයි, සංඥාව ජීව ද ශරීර ද වෙයි, සංස්කාරයෝ ජීව ද ශරීර ද වෙති, විඥානය ජීව ද ශරීර ද වෙයි. යමෙක් ජීව වේ ද, හේ ශරීර යැ, යමෙක් ශරීර වේ ද හේ ජීව යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම ... 'හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස්අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: රූපය ශරීර යැ ජීව නො වෙයි, ජීවය ශරීර නො වෙයි, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකි' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වෙදනාව ශරීර යැ ජීව නො වෙයි ... සංඥාව ශරීර යැ ජීව නො වෙයි ... සංස්කාරයෝ ශරීර යැ ජීව නො වෙයි ... විඥානය ශරීර යැ ජීව නො වෙයි. ජීවය ශරීර නො වෙයි. ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම ... ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වෙයි' යන අන්තග්‍රාහික දෘෂ්ටියෙහි කවර පස්අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: රූපය මෙලොවෙහි මැ නැසෙන සැභැවි යැ, සත්ත්ව තෙම ශරීරභෙදයෙන් මත්තෙහි විද්‍යමාන වන්නේ ද (ශාශ්වත බැවින්) සිටුනේ ද, (අණ්ඩජ ජරායුජ විසින්) උපදනේ ද (සංසෙදජ ඔපපාතික විසින්) සකස පහළ වන්නේ ද වේ'යයි අභි-නිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්ත-ග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමුවනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වෙයි' යන අන්තග්‍රාහික දෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වෙදනාව මෙහි මැ නැසෙනසැභැවි යැ ... සංඥාව මෙහි මැ නැසෙන-සැභැවි යැ ... සංස්කාරයෝ මෙහි මැ නැසෙනසැභැවියහ ... විඥානය මෙහි මැ නැසෙනසැභැවි යැ. සත්ත්ව තෙම ශරීරභෙදයෙන් මත්තෙහි විද්‍යමාන වන්නේ ද සිටුනේ ද උපදනේ ද පහළවන්නේ ද වේ'යයි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම. ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'න හොති තථාගතො පරංමරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති. 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතොපි කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති තථාගතො පරංමරණාති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා-පෙ විඤ්ඤාණං ඉධෙව මරණධම්මං,තථාගතොපි කායස්සභෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති තථාගතො පරංමරණා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි-පෙ- 'න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'හොති ච න ච හොති තථාගතො පරංමරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොති ච න ච හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ- විඤ්ඤාණං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොති ච න ච හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'නෙව හොති න න හොති තථාගතො පරංමරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති. 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා[1] පරං මරණා නෙව හොති න න හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'නෙව හොති න න හොති තථාගතො පරං මරණාති අන්තග්ගාහිකා දිට්ඨි. අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

1. කායස්සභෙදා පරං මරණා - මජසං.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපය මෙහි මැ නැසෙනසැහැවි යැ සත්ත්ව තෙමේ ද ශරීරභෙදයෙන් මත්තෙහි සිඳෙයි වැනැසෙයි සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමු වනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

වේදනාව මෙහි මැ නැසෙනසැහැවි යැ ... සංඥාව මෙහි මැ නැසෙනසැහැවි යැ... සංස්කාරයෝ මෙහි මැ නැසෙනසැහැවියහ... විඥානය මෙහි මැ නැසෙනසැහැවි යැ. සත්ත්ව තෙමේ ද ශරීරභෙදයෙන් මත්තෙහි සිඳෙයි වැනැසෙයි සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වෙයි යත් රූපය මෙහි මැ නැසෙන සවභාව ඇත්තේ යැ, සත්ත්ව තෙමේ ශරීරභෙදයෙන් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමුවනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ .. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වේදනාව මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ .. සංඥාව මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ ... සංස්කාරයෝ මෙහි මැ නැසෙනපියවි ඇත්තාහ ... විඥානය මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ. සත්ත්ව තෙම ශරීර භෙදයෙන් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම් ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: රූපය මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ, සත්ත්ව තෙම කාබුන්-මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වේදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ- විඤ්ඤාණං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා නෙව හොති න න හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඤ්චමී 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සංයොජනානි න ච දිට්ඨියො. 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 8. පුබ්බන්තානුදිට්ඨි

පුබ්බන්තානුදිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

චත්තාරො සස්සතවාදා, චත්තාරො එකච්චසස්සතිකා, චත්තාරො අන්තානන්තිකා, චත්තාරො අමරාවික්ඛෙපිකා, ද්වෙ අධිච්චසමුප්පන්නිකා.

පුබ්බන්තානුදිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 9. අපරන්තානුදිට්ඨි

අපරන්තානුදිට්ඨියා කතමෙහි චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

සොළස සඤ්ඤීවාදා, අට්ඨ අසඤ්ඤීවාදා, අට්ඨ නෙවසඤ්ඤී නාසඤ්ඤීවාදා, සත්ත උච්ඡෙදවාදා, පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා.

අපරන්තානුදිට්ඨියා ඉමෙහි චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 10. සංයොජනිකා දිට්ඨි

සංයොජනිකාය දිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

යා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං -පෙ- දිට්ඨාභිනිවෙසො දිට්ඨිපරාමාසො.

සංයොජනිකාය දිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති,

'වේදනාව මෙහි මැ නැසෙනපියැවි ඇත්තේ යැ ... සංඥාව මෙහි මැ නැසෙනපියැවි ඇත්තේ යැ ... සංස්කාරයෝ මෙහි මැ නැසෙන පියැවි ඇත්තාහ. ... විඥානය මෙහි මැ නැසෙනපියැවි ඇත්තේ යැ, සත්ත්ව තෙම කාබුත්මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අභිනිවේශ පරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද්දු යි අන්තග්‍රාහිකා දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද මේ පස්වනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පනස් අයුරින් අභිනිවේශය වේ.

## 2 - 8. පූර්වාන්තානුදෘෂ්ටිය

පූර්වාන්තානුදෘෂ්ටියෙහි කවර අටළොස් අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

චතුර්විධ ශාශ්වතවාද යැ චතුර්විධ එකත්‍යශාශ්වතවාද යැ චතුර්විධ අන්තානන්තිකවාද යැ චතුර්විධ අමරාවික්ෂෙපිකවාද යැ ද්විවිධ අධීත්‍ය-සමුත්පන්නිකවාද යි.

පූර්වාන්තානුදෘෂ්ටියෙහි මේ අටළොස් අයුරින් අභිනිවේශය වේ.

## 2 - 9. අපරාන්තානුදෘෂ්ටිය

අපරාන්තානුදෘෂ්ටියෙහි කවර සියුසාලිස්අයුරින් අභිනිවේශය වෙයි යත්:

ෂොඩශප්‍රකාර සංඥීවාද යැ අෂ්ටප්‍රකාර අසංඥීවාද යැ අෂ්ටප්‍රකාර නෛවසංඥීනාසංඥීවාද යැ සප්තප්‍රකාර උච්ඡේදවාද යැ පඤ්චප්‍රකාර දෘෂ්ටධර්මනිර්වාණවාද යි.

අපරාන්තානුදෘෂ්ටියෙහි මේ සියුසාලිස්අයුරින් අභිනිවේශය වේ.

## 2 - 10. සංයොජනිකදෘෂ්ටි

සංයොජනිකදෘෂ්ටියෙහි කවර අටළොස්අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් ... දෘෂ්ට්‍යභිනිවේශ-යෙක් දෘෂ්ටිපරාමර්ශයෙක් වේ ද,

සංයොජනිකදෘෂ්ටියෙහි මේ අටළොස්අයුරින් අභිනිවේශය වේ.

## 2 - 11. අහන්තිමානවිනිබන්ධා දිට්ඨි

'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

'චක්ඛුං අහ'න්ති අභිනිවෙසපරාමාසො 'අහන්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මානවිනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'සොතං අහ'න්ති -පෙ- 'ඝානං අහ'න්ති -පෙ- 'ජිව්හා අහ'න්ති-පෙ- 'කායො අහ'න්ති -පෙ- 'මනො අහ'න්ති -පෙ- 'රූපා අහ'න්ති -පෙ- 'ධම්මා අහ'න්ති -පෙ- 'චක්ඛුවිඤ්ඤාණං අහ'න්ති -පෙ- 'මනොවිඤ්ඤාණං අහං'න්ති අභිනිවෙසපරාමාසො 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං අට්ඨාරසමී 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මාන විනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති

## 2 - 12. මමන්තිමානවිනිබන්ධා දිට්ඨි

'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

'චක්ඛුං මම'න්ති අභිනිවෙසපරාමාසො 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මානවිනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'සොතං මම'න්ති -පෙ- 'ඝානං මම'න්ති -පෙ- 'ජිව්හා මම'න්ති -පෙ- 'කායො මම'න්ති -පෙ- 'මනො මම'න්ති -පෙ- 'රූපා මම'න්ති -පෙ- 'ධම්මා මම'න්ති -පෙ- 'චක්ඛුවිඤ්ඤාණං මම'න්ති -පෙ- 'මනොවිඤ්ඤාණං මම'න්ති 'අභිනිවෙසපරාමාසො මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං අට්ඨාරසමී 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මානවිනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

''මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 11 අහන්තිමානවිනිබන්ධදෘෂ්ටිය

'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි කවර අටලොස්අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

'ඇස මම වෙමි' අභිනිවේශපරාමර්ශය 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'කන මම වෙමි' ... 'නැහැය මම වෙමි' ... 'දිව මම වෙමි' ... 'කය මම වෙමි' ... 'මනස මම වෙමි' ... 'රූපයෝ මම වෙමි' ... 'ධර්මයෝ මම වෙමි' ... 'චක්‍ෂුර්විඥානය මම වෙමි' ... 'මනොවිඥානය මම වෙමි' අභිනිවේශපරාමර්ශය 'මම'යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේද, මේ අටලොස්වනු වූ 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි වේ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි මේ අටලොස්අයුරින් අභිනිවේශය වේ.

## 2 – 12. මමන්තිමානවිනිබන්ධදෘෂ්ටිය

'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි කවර අටලොස්අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

'ඇස මාගේ යැ'යි අභිනිවේශපරාමර්ශය 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'කන මාගේ යැ' යි ... 'නැහැය මාගේ යැ' යි ... 'දිව මාගේ යැ'යි ... 'කය මාගේ යැ'යි ... 'මනස මාගේ යැ'යි ... 'රූපයෝ මාගේ යැ'යි ... 'ධර්මයෝ මාගේ යැ'යි ... 'චක්‍ෂුර්විඥානය මාගේ යැ' යි ... 'මනොවිඥානය මාගේ යැ'යි අභිනිවේශපරාමර්ශය 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ අටලොස්වනු වූ 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි වේ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි මේ අටලොස්අයුරින් අභිනිවේශය වේ.

## 2 - 13. අත්තවාදපටිසංයුත්තා දිට්ඨි.

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනිවා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං -පෙ-

කථං රූපං අත්තතො සමනුපස්සති:

ඉධෙකච්චො පඨවීකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති, 'යං ඔදාතකසිණං සො අහං, යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි 'තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි, සො වණ්ණො, යො වණ්ණො සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො ඔදාතකසිණං අත්තතො සමනුපස්සති-පෙ-අයං පඨමා රූපවත්ථුකා අත්තවාදපටිසංයුත්තා දිට්ඨි අත්තවාදපටිසංයුත්තා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො; එවං රූපං අත්තතො සමනුපස්සති -පෙ-

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා ඉමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 14. ලොකවාදපටිසංයුත්තා දිට්ඨි

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා කතමෙහි අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො හොති.

'සස්සතො අත්තා ච ලොකො චා'ති අභිනිවෙසපරාමාසො ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං පඨමා ලොකවාදපටිසංයුත්තා දිට්ඨි. ලොකවාදපටිසංයුත්තා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'අසස්සතො අත්තා ච ලොකො චා'ති -පෙ- 'සස්සතො ච අසස්සතො ච අත්තා ච ලොකො චා'ති -පෙ- 'නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො චා'ති -පෙ- 'අන්තවා අත්තා ච ලොකො චා'ති -පෙ- 'අනන්තවා අත්තා ච ලොකො චා'ති -පෙ- 'අන්තවා ච අනන්තවා ච අත්තා ච ලොකො චා'ති -පෙ- 'නෙව අන්තවා න අනන්තවා අත්තා ච ලොකො චා'ති අභිනිවෙසපරාමාසො ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං අට්ඨමී ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, ලොකවාදපටිසංයුත්තා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා ඉමෙහි අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 13. ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය

ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි කවර විසි අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

මෙලොව (බුද්ධාදී) ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් දකී. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ ... වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්මවශයෙන් දකී. ආත්මය රූපවත් කොට හෝ විඥානය ආත්මයෙහි ලා හෝ ආත්මය විඥානයෙහි ලා හෝ ...

කිසෙයින් රූපය ආත්මවශයෙන් දක්නේ ද යත්:

මෙලොව ඇතැමෙක් පෘථිවිකසිණය ... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. "යමෙක් ඔදාතකසිණ වේ ද, හේ මම වෙමි. යමෙක් මම වේ ද හේ ඔදාතකසිණ වේ" යයි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දල්වෙන තෙල්පහනක්හුගේ යම් සිළුවක් වේ ද හේ වර්ණ වෙයි, යමෙක් වර්ණ වේ ද හෝ සිළුව වේ" යයි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දක්නේ ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් ඔදාතකසිණය ආත්මවශයෙන් දකී ... මේ පළමුවනු වූ රූපවස්තුකආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටි වේ. ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ .. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී ...

ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි මේ විසිඅයුරින් අභිනිවේශය වේ.

## 2 – 14. ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය

ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි කවර අටඅයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

"ආත්මයත් ලොකයත් ශාශ්වත යැ"යි අභිනිවේශපරාමර්ශය ලොකවාද-ප්‍රතිසංයුක්තදෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටි වේ. ලොකවාදප්‍රතිස - යුක්තදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

"ආත්මයත් ලොකයත් අශාශ්වත යැ"යි ... "ආත්මයත් ලොකයත් ශාශ්වත ද අශාශ්වත ද වේ" යයි ... "ආත්මයත් ලොකයත් නො මැ ශාශ්වත වූයේ අශාශ්වත නො වේ" යයි ... "ආත්මයත් ලොකයත් අන්ත ඇත්තේ යැ" යි ... "ආත්මයත් ලොකයත් අන්ත නැත්තේ යැ" යි .. "ආත්මයත් ලොකයත් අන්ත ඇත්තේ ද අන්ත නැත්තේ ද වේ" යයි ... ආත්මයත් ලොකයත් නො මැ අන්ත ඇත්තේ අන්ත නැත්තේ නො වේ" යයි අභිනිවේශපරාමර්ශය ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද මේ අටවනු වූ ලොකවාදප්‍රතිසංයුක්ත දෘෂ්ටි වේ. ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි මේ අටඅයුරින් අභිනිවේශය වේ.

## 2 – 15, 16. භවදිට්ඨි – විභවදිට්ඨියො.

ඔලීයනාභිනිවෙසො[1] භවදිට්ඨි, අතිධාවනාභිනිවෙසො විභවදිට්ඨි, අස්සාදදිට්ඨියා පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො කති භවදිට්ඨියො, කති විභවදිට්ඨියො: අත්තානුදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො කති භවදිට්ඨියො, කති විභවදිට්ඨියො -පෙ- ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො කති භවදිට්ඨියො, කති විභවදිට්ඨියො:

අස්සාදදිට්ඨියා පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. අත්තානුදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො පන්නරස භවදිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො, මිච්ඡාදිට්ඨියා දසහි අකාරෙහි අභිනිවෙසො සබ්බාව තා විභවදිට්ඨියො. සක්කායදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො පන්නරස භවදිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො. සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො සබ්බාව තා භවදිට්ඨියො. සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො.

සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා භවදිට්ඨියො. 'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො. 'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො. සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො. 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා භවදිට්ඨියො. 'හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා භවදිට්ඨියො. 'න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො සබ්බාව තා විභවදිට්ඨියො. 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො.

පුබ්බන්තානුදිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. අපරන්තානුදිට්ඨියා චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. සඤ්ඤොජනිකාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. 'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො. 'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො. සබ්බාව තා භවදිට්ඨියො. අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො, පන්නරස භවදිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො. ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො.

1. ඔලීයනාභිනිවෙසො - ස්‍යා.

# 2 - 15, 16. භව - විභවදෘෂ්ටි

(ශාශ්වතසංඥ හෙයින් නිර්වාණයෙන් සිත) හැකිළීමෙහි අභිනිවේශය භවදෘෂ්ටි නම. (උච්ඡේදසංඥ හෙයින් නිරොධගාමිනීප්‍රතිපදායෙහි) අනිධාවනයෙහි අභිනිවේශය විභවදෘෂ්ටි නම්. ආස්වාදදෘෂ්ටියෙහි පන්තිස් අයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටිහු කෙතෙක් ද, විභවදෘෂ්ටිහු කෙතෙක් ද, ආත්මානුදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටිහු කෙතෙක් ද, විභවදෘෂ්ටිහු කෙතෙක් ද, ලොකවාදප්‍රතිසංයුක්ත-දෘෂ්ටියෙහි අටඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටිහු කෙතෙක් ද, විභව දෘෂ්ටිහු කෙතෙක් ද යත්:

ආස්වාදදෘෂ්ටියෙහි පන්තිස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. ආත්මානුදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටි පසළොසෙක, විභවදෘෂ්ටි පසෙකි. මිථ්‍යාදෘෂ්ටියෙහි දසඅයුරෙකින් අභිනිවේශය වෙයි. එ හැම විභවදෘෂ්ටිහු වෙති. සත්කායදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටි පසළොසෙක, විභවදෘෂ්ටි පසෙකි. සත්කායවස්තුකශාශ්වත-දෘෂ්ටියෙහි පසළොස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එ හැම භවදෘෂ්ටි වෙයි. සත්කායවස්තුකඋච්ඡේදදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම විභවදෘෂ්ටිහු වෙති.

"ලොකය ශාශ්වත යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම භවදෘෂ්ටිහු යැ. "ලොකය අශාශ්වත යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම විභව දෘෂ්ටිහු යැ. "ලොකය අන්ත ඇත්තේ යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. 'ලොකය අන්ත නැත්තේ යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. "හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම විභවදෘෂ්ටිහු යැ. "ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි, එහැම භවදෘෂ්ටිහු යැ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එ හැම භවදෘෂ්ටිහු යැ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි, එහැම විභවදෘෂ්ටිහු යැ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො වන්නේත් වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස් අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහු යැ.

පූර්වාන්තානුදෘෂ්ටියෙහි අටළොස් අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද, වන්නාහ. අපරාන්තානුදෘෂ්ටියෙහි සියුසාලිස්-අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. සංයොජනිකදෘෂ්ටියෙහි අටළොස් අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. "මම"යි මානයෙන් බැඳුණු දෘෂ්ටි-යෙහි අටළොස් අයුරින් අභිනිවේශය වෙයි. එ හැම විභවදෘෂ්ටිහු යැ, "මාගේ යැ"යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අටළොස් අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම භවදෘෂ්ටිහු යැ ආත්මවාද ප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටි පසළොසෙක, විභවදෘෂ්ටි පසෙකි. ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අටඅයුරින් අභිනිවේශය භවදෘෂ්ටි-හු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහු ය.

සබ්බාව තා දිට්ඨියො අස්සාදදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො අත්තානුදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො මිච්ඡාදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො සක්කායදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො අන්තග්ගාහිකා දිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො සඤ්ඤොජනිකා දිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො අත්තවාදපටිසංයුත්තා දිට්ඨියො.

"භවඤ්ච දිට්ඨිං විභවඤ්ච දිට්ඨිං[1]
එතං ද්වයං තක්කිකා නිස්සිතා සෙ[2]
තෙසං නිරොධම්හි න හත්ථි[3] ඤාණං
යත්ථායං ලොකො විපරීතසඤ්ඤී"ති.

"ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති[4] එකෙ, අතිධාවන්ති එකෙ, චක්ඛුමන්තො ච පස්සන්ති.

කථඤ්ච භික්ඛවෙ, ඔලීයන්ති එකෙ: භවාරාමා භික්ඛවෙ, දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා, තෙසං භවනිරොධාය ධම්මෙ දෙසියමානෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති[5] න සන්තිට්ඨති නාධිමුච්චති. එවං ඛො භික්ඛවෙ ඔලීයන්ති එකෙ.

කථඤ්ච භික්ඛවෙ, අතිධාවන්ති එකෙ: භවෙනෙව[6] ඛො පනෙකෙ අට්ටීයමානා.[7] හරායමානා ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති: 'යතො කිර භො අයං අත්තා කායස්ස භෙදා[8] උච්ඡිජ්ජති විනස්සති න හොති පරං මරණා, එතං සන්තං එතං පණීතං එතං යාථාවන්ති[9] එවං ඛො භික්ඛවෙ අතිධාවන්ති එකෙ.

කථඤ්ච භික්ඛවෙ චක්ඛුමන්තො ච පස්සන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු භූතං භූතතො පස්සති, භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ චක්ඛුමන්තො ච පස්සන්ති.

'යො භූතං භූතතො දිස්වා භූතස්ස ච අතික්කමං,
යථාභූතෙ'ධිමුච්චති භවතණ්හා පරික්ඛයා' (1)

ස වෙ[10] භූත පරිඤ්ඤාතො[11] වීතතණ්හො භවාභවෙ
භූතස්ස විභවා භික්ඛු නාගච්ඡති පුනබ්භව"න්ති (2)

තයො පුග්ගලා විපන්නදිට්ඨී, තයො පුග්ගලා සම්පන්නදිට්ඨී.

කතමෙ තයො පුග්ගලා විපන්නදිට්ඨී. තිත්ථියො ච තිත්ථියසාවකො ච යො ච මිච්ඡාදිට්ඨිකො. ඉමෙ තයො පුග්ගලා විපන්නදිට්ඨී.

කතමෙ තයො පුග්ගලා සම්පන්නදිට්ඨී. තථාගතො ච තථාගතසාවකො ච යො ච සම්මාදිට්ඨිකො, ඉමෙ තයො පුග්ගලා සම්පන්නදිට්ඨී.

1 භවදිට්ඨියො විභවදිට්ඨියො - ස්‍යා PTS 2 නිස්සිතා යෙ - ස්‍යා PTS
3 නත්ථි - ස්‍යා PTS 4 ඔලීයන්ති - ස්‍යා PTS
5 න පසීදති - මජ්ඣං PTS න සම්පසීදති - ස්‍යා
6 භවෙන - ස්‍යා 7 අට්ටියමානා - ස්‍යා PTS 8 භෙදා පරං මරණා - මජ්සං
9 යථාවන්ති - ස්‍යා - PTS
10 සවෙ - ස්‍යා 11 භූතස්ස පරිඤ්ඤා - PTS භූතස්ස පරිඤ්ඤාතො සො-ස්‍යා

එහැම දෘෂ්ටිහු ආසවාද දෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු ආත්මානුදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු මිථ්‍යාදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු සත්කායදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු අන්තග්‍රාහිකදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු සංයෝජනිකා දෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු ආත්මවාදප්‍රතිසංයුක්ත දෘෂ්ටි වෙත්.

"තාර්කිකයෝ තුමූ භවදෘෂ්ටිය ද, විභවදෘෂ්ටිය ද යන මෙ දෙක ඇසුරු කළාහු වෙති. යම් කරුණෙකින් මේ ලෝවැසි තෙම යම් නිරොධ-සුඛයෙක්හි විපරීතසංඥා ඇත්තේ ද, ඔවුනට ඒ නිරෝධයෙහි ඥානයෙක් නැද්ද එහෙයිනි."

"මහණෙනි, ද්විවිධ දෘෂ්ටිගතයන් විසින් සමුදාචාරයට පත් දෙව්මිනිස්සු ඇතැම් කෙනෙක් ඔලීයන (ශාශ්වත සංඥා හෙයින් නිර්වාණයෙන් හැකිළීම) කෙරෙති. ඇතැම් කෙනෙක් (උච්ඡේද හෙයින් නිරොධගාමිනීප්‍රතිපදායෙහි) අතිධාවන කෙරෙත්. නුවණැස් ඇත්තාහු මැ දකිත්.

මහණෙනි, කිසෙයින් ඇතැම් කෙනෙක් ඔලීයන කෙරෙති යත් මහණෙනි, දෙව්මිනිස්සු භවය අභිරමණස්ථානය කොට ඇත්තාහු යැ. භවයෙහි ඇලුණාහු යැ, භවයෙන් සතුටු වූවාහු යැ. භවනිරොධය පිණිස දහම් දෙසනු ලබන කල්හි ඔවුන්ගේ සිත (ධර්මදෙශනාවට හෝ භව-නිරොධයට) නො පිවිසෙයි. නො පහදී. නො පිහිටයි අධිමුක්ත නො වේ. මහණෙනි, මෙසෙයින් ඇතැම් කෙනෙක් ඔලීයන කෙරෙත්.

මහණෙනි, කිසෙයින් ඇතැම් කෙනෙක් අතිධාවන කෙරෙති. යත්: තවද ඇතැම් කෙනෙක් භවයෙන් මැ පෙළෙනු ලබන්නාහු ලජ්ජාවට පැමිණෙන්නාහු ජුගුප්සාවට පැමිණෙන්නාහු උච්ඡේදයට සතුටු වෙත්. භවත්නි, යම් තැනක පටන් මේ ආත්මය කාබුත් මරණින් මත්තෙහි සිඳේ ද වැනසේ ද මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ ද තෙල (සිඳීම) ශාන්ත යැ තෙල ප්‍රණීත යැ තෙල යථාසවභාවය ල'යි. මහණෙනි, මෙසෙයින් ඇතැම් කෙනෙක් අතිධාවන කෙරෙත්.

මහණෙනි, කිසෙයින් ඇස් ඇත්තාහු මැ දකිති යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම භූතය (හෙතුයෙන් උපන් සක්ඛන්ධපඤ්චක සඞ්ඛ්‍යාත දුඃඛය) භූත (දුඃඛ) වශයෙන්, දකී. භූතය භූතවශයෙන් දැක භූතයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ. මහණෙනි, මෙසෙයින් ඇස් ඇත්තාහු මැ දකිත්.

"යමෙක් භූතය භූතවශයෙන් දැක භූතයාගේ ඉක්මවීම (නිරොධය) ද දැක භවතෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙන් යථාසවභාව වූ නිරොධයෙහි අධිමුක්ත වේ ද, (1)

ඒ අර්හත් තෙමේ එකාන්තයෙන් භූත සඞ්ඛ්‍යාත දුඃඛය පිරිසිඳ දත්තේ කුදුමහත් භවයෙහි පහවූ තෘෂ්ණා ඇත්තේ භූත සඞ්ඛ්‍යාත වන්ත දුඃඛයාගේ සිඳීමෙන් පුනර්භවයට නො පැමිණේ'' යයි. (2)

පුද්ගලයෝ තිදෙනෙක් විරූපභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු යැ පුද්ගලයෝ තිදෙනෙක් සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු යැ.

කවර පුද්ගලයෝ තිදෙනෙක් විරූපභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු ද යත්: තීර්ථක යැ තීර්ථකශ්‍රාවක යැ යමෙකුත් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ නම් හේ යැ. මොහු විරූපභාවයට ගිය දෘෂ්ටි ඇති තුන් පුහුලෝ යි.

කවර පුද්ගලයෝ තිදෙනෙක් සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු ද යත්: තථාගත යැ තථාගතශ්‍රාවක යැ යමෙකුත් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ නම් හේ යැ. මොහු සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇති තුන් පුහුලෝ යි.

‘කොධනො උපනාහී ච පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨි මායාවී තං ජඤ්ඤා වසලො ඉති, (1)

අක්කොධනො අනුපනාහී විසුද්ධො[1] සුද්ධතං ගතො,
සම්පන්නදිට්ඨි මෙධාවී තං ජඤ්ඤා අරියො ඉතී’ති, (2)

තිස්සො විපන්නදිට්ඨියො, තිස්සො සම්පන්නදිට්ඨියො.

කතමා තිස්සො විපන්නදිට්ඨියො: ‘එතං මමා’ති[2] විපන්නදිට්ඨි ‘එසො’හමස්මිති විපන්නදිට්ඨි, ‘එසො මෙ අත්තා’ති විපන්නදිට්ඨි, ඉමා තිස්සො විපන්නදිට්ඨියො.

කතමා තිස්සො සම්පන්නදිට්ඨියො. ‘නෙතං මමා’ති[2] සම්පන්නදිට්ඨි, ‘නෙසො හමස්මී’ති සම්පන්නදිට්ඨි, ‘න මෙසො අත්තා’ති සම්පන්නදිට්ඨි, ඉමා තිස්සො සම්පන්නදිට්ඨියො.

‘එතං මමා’ති[2] කා දිට්ඨි. කති දිට්ඨියො: කතමන්තානුග්ගහිතා තා දිට්ඨියො. ‘එසො හමස්මී’ති කා දිට්ඨි. කති දිට්ඨියො. කතමන්තානුග්ගහිතා තා දිට්ඨියො. ‘එසො මෙ අත්තා’ති කා දිට්ඨි. කති දිට්ඨියො. කතමන්තානුග්ගහිතා තා දිට්ඨියො.

‘එතං මමා’ති පුබ්බන්තානුදිට්ඨි, අට්ඨාරස දිට්ඨියො, පුබ්බන්තානුග්ගහිතා තා දිට්ඨියො, ‘එසො හමස්මී’ති අපරන්තානුදිට්ඨි, චතුචත්තාලීසං දිට්ඨියො, අපරාන්තානුග්ගහිතා තා දිට්ඨියො, ‘එසො මෙ අත්තා’ති වීසතිවත්ථුකා අත්තානුදිට්ඨි, වීසති වත්ථුකා සක්කායදිට්ඨි, සක්කායදිට්ඨිපමුඛානි[3] ද්වාසට්ඨි දිට්ඨිගතානි, පුබ්බන්තාපරන්තානුග්ගහිතා තා දිට්ඨියො.

‘යෙ කෙචි භික්ඛවෙ, මයි නිට්ඨං ගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා, තෙසං දිට්ඨිසම්පන්නානං පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස, කොලංකොලස්ස, එකබීජිස්ස, සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා. ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස, උපහච්චපරිනිබ්බායිස්ස, අසඞ්ඛාරපරිනිබ්බායිස්ස, සසඞ්ඛාරපරිනිබ්බායිස්ස, උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

1. අමක්ඛි - ස්‍යා PTS. 2. මමන්ති - ස්‍යා PTS.
3. දිට්ඨිපමුඛෙන - ස්‍යා

යම් මිනිසෙක් කිපෙනසුලු ද බද්ධවෛර ඇත්තේ ද ලාමක වූ මකුගුණ ඇත්තේ ද විරූපභාවයට ගිය දෘෂ්ටි ඇත්තේ ද කල වරද වසන-සුලු ද ඔහු 'වසල' යයි දන්නේ යැ. (1)

(යමෙක්) නො කිපෙනසුලු ද බද්ධවෛර නැත්තේ ද (ඥානදර්ශන-විශුද්ධියෙන්) විශුද්ධ වූයේ ද, (මාර්ගඵල සඞ්ඛ්‍යාත) ශුද්ධභාවයට ගියේ ද සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇත්තේ ද ප්‍රඥා ඇත්තේ ද ඔහු 'ආර්‍ය්‍ය' යයි දන්නේ ය'යි. (2)

විපන්නදෘෂ්ටීහු තිදෙනෙක, සම්පන්නදෘෂ්ටීහු තිදෙනෙකි.

තුන් විපන්නදෘෂ්ටීහු කවරහ යත්: 'තෙල මාගේ යැ'යනු විපන්නදෘෂ්ටි යැ "තෙල මම වෙමි" යනු විපන්නදෘෂ්ටි යැ "තෙල මාගේ ආත්ම යැ" යනු විපන්නදෘෂ්ටි යි. මොහු තුන් විපන්නදෘෂ්ටීහු වෙත්.

තුන් සම්පන්නදෘෂ්ටීහු කවරහ යත්: "තෙල මාගේ නො වෙයි" යනු සම්පන්නදෘෂ්ටි යැ, "තෙල මම නො වෙමි' යනු සම්පන්නදෘෂ්ටි යැ. "තෙල මාගේ ආත්මය නො වෙයි" යනු සම්පන්නදෘෂ්ටි යි. මොහු තුන් සම්පන්න දෘෂ්ටීහු වෙත්.

"තෙල මාගේ යැ" යනු කවර දෘෂ්ටි ද, දෘෂ්ටීහු කෙතෙක් ද, ඒ දෘෂ්ටීහු කවර අන්තයෙකින් අනුගෘහීත වූවාහු ද, "තෙල මම වෙමි" යනු කවර දෘෂ්ටි ද, දෘෂ්ටීහු කෙතෙක් ද, ඒ දෘෂ්ටීහු කවර අන්තයෙකින් අනුගෘහීත වූවාහු ද, "තෙල මාගේ ආත්ම යැ" යනු කවර දෘෂ්ටි ද, දෘෂ්ටීහු කෙතෙක් ද, ඒ දෘෂ්ටීහු කවර අන්තයෙකින් අනුගෘහීත වූවාහු ද යත්:

"තෙල මාගේ යැ" යනු පූර්වාන්තානුදෘෂ්ටි යැ දෘෂ්ටි අටළොසෙකි. ඒ දෘෂ්ටීහු පූර්වාන්තයෙන් අනුගෘහීතයහ. "තෙල මම වෙමි" යනු අපරාන්තානු-දෘෂ්ටි යැ. දෘෂ්ටි සිවුසාළිසෙකි. ඒ දෘෂ්ටීහු අපරාන්තයෙන් අනුගෘහීතයහ. "තෙල මාගේ ආත්ම යැ" යනු විංශද්වස්තුක ආත්මානුදෘෂ්ටි යැ. විංශද්වස්තුක සත්කායදෘෂ්ටි යැ, සත්කායදෘෂ්ටිය ප්‍රමුඛ කොට ඇති දෘෂ්ටිගත දෙසැටෙකි. ඒ දෘෂ්ටීහු පූර්වාන්තාපරාන්තයෙන් අනුගෘහීත වෙත්.

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි ('භාග්‍යවත්හු සම්‍යක්-සම්බුද්ධහය'යි) මාර්ගඥානවශයෙන් නිෂ්ඨාවට ගියාහු ද ඒ සියල්ලෝ දෘෂ්ටි-සම්පන්නයෝ යි. ඒ දෘෂ්ටිසම්පන්නයන් අතුරින් පස්දෙනකුන්හට මේ කාමධාතුයෙහි නිෂ්ඨා (පරිනිර්වාණය) වෙයි. පස්දෙනකුන්හට මේ කාම-භවය හැරපියා නිෂ්ඨා වෙයි.

කවර පස්දෙනකුන්හට මෙහි නිෂ්ඨා වේ ද යත්: සත්තක්ඛත්තු-පරමහට යැ කොලංකොලහට යැ එකබීජිහට යැ සකදාගාමිහට යැ යමෙකුත් මේ අත්බැව්හි මැ අර්හත් වේ ද ඔබට යැ යන මේ පස්දෙනාහට මෙහි නිෂ්ඨා වේ.

කවර පස්දෙනකුන්හට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වේ ද යත්: අන්තරාපරිනිබ්බායීහට යැ උපහච්චපරිනිබ්බායීහට යැ අසඞ්ඛාරපරිනිබ්බායී-හට යැ සසඞ්ඛාරපරිනිබ්බායීහට යැ ඌර්ධ්වංසොත අකනිට්ඨගාමිහට යැ යන මේ පස්දෙනාහට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨාව වේ.

යෙ කෙචි භික්ඛවෙ මයි නිට්ඨං ගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා, තෙසං දිට්ඨිසම්පන්නානං ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්නා, සබ්බෙ තෙ සොතාපන්නා, තෙසං සොතාපන්නානං පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස, කොලංකොලස්ස, එකබීජිස්ස, සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා, ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස, උපහච්චපරිනිබ්බායිස්ස, අසඞ්ඛාරපරිනිබ්බායිස්ස, සසඞ්ඛාර පරිනිබ්බායිස්ස, උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්නා, සබ්බෙ තෙ සොතාපන්නා, තෙසං සොතාපන්නානං ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.''

**දිට්ඨිකථා සමත්තා.**

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි නිෂ්ඨාවට ගියාහු ද එහැම දෙන දෘෂ්ටියෙන් සුන්දර බවට ගියාහු යැ. ඒ දෘෂ්ටියෙන් සුන්දර බවට ගියවුන් අතුරින් මොවුන් පස්දෙනහට ඉධනිෂ්ඨා යැ මොවුන් පස්දෙනහට ඉධ-විහාය නිෂ්ඨා යි.

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි අචල ප්‍රසාදයෙන් ප්‍රසන්නයෝ වෙත් ද, එහැම දෙන ආර්‍යමාර්ගශ්‍රොතසට පැමිණියාහු යැ. ඒ ආර්‍යමාර්ගශ්‍රොතසට පැමිණියවුන් අතුරින් පස්දෙනකුන්හට මේ කාම-ධාතුයෙහි නිෂ්ඨා වෙයි. පස් දෙනකුන්හට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වෙයි.

කවර පස්දෙනකුන්හට මේ කාමධාතුයෙහි නිෂ්ඨා වෙයි යත්: සත්තක්ඛත්තුපරමහට යැ. කොලංකොලහට යැ එකබීජහට යැ සකෘදාගාමි-හට යැ යමෙකුන් මෙ අත්බැව්හි මැ අර්හත් වේ ද ඔබට යැ යන මොවුන් පස්දෙනහට මේ කාමධාතුයෙහි නිෂ්ඨා වේ.

කවර පස්දෙනකුන්හට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වෙයි යත්: අන්තරාපරිනිබ්බායීහට යැ උපහච්චපරිනිබ්බායීහට යැ අසඞ්ඛාරපරිනිබ්බායී-හට යැ සසඞ්ඛාරපරිනිබ්බායීහට යැ උද්ධංසොතඅකනිට්ඨගාමීහට යැ යන මොවුන් පස්දෙනහට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨාව වේ.

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි අචල ප්‍රසාදයෙන් ප්‍රසන්නයෝ වෙත් ද එහැම දෙන ආර්‍යමාර්ගශ්‍රොතසට පැමිණියාහු වෙති. ඒ ආර්‍යමාර්ගශ්‍රොතසට පැමිණියවුන් අතුරෙන් මොවුන් පස්දෙනහට මේ කාමධාතුයෙහි නිෂ්ඨා වෙයි. මොවුන් පස්දෙනහට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වේ යයි.

**දෘෂ්ටිකථා නිමි.**

## 3

# ආනාපානසතිකථා.

## 3 - 1. ගණනුද්දෙසො

සොළසවත්ථුකං ආනාපානසති සමාධිං[1] භාවයතො සමධිකානි[2] ද්වෙ ඤාණසතානි උප්පජ්ජන්ති: අට්ඨ පරිපන්ථෙ ඤාණානි, අට්ඨ[3] උපකාරෙ ඤාණානි, අට්ඨාරස උපක්කිලෙසෙ ඤාණානි, තෙරස වොදානෙ ඤාණානි, බත්තිංස[4] සතොකාරිස්ස[5] ඤාණානි, චතුවීසති සමාධිවසෙන ඤාණානි, ද්වෙසත්තති විපස්සනාවසෙන ඤාණානි, අට්ඨ නිබ්බිදාඤාණානි, අට්ඨ නිබ්බිදානුලොමඤාණානි, අට්ඨ නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණානි, එකවීසති විමුත්තිසුඛෙ ඤාණානි.

**ගණනුද්දෙසො සමත්තො**

## 3 - 2. පරිපන්ථ - උපකාරසොළස ඤාණානි

කතමානි අට්ඨ පරිපන්ථෙ ඤාණානි, අට්ඨ ච උපකාරෙ ඤාණානි.

කාමච්ඡන්දො සමාධිස්ස පරිපන්ථො, නෙක්ඛම්මං සමාධිස්ස උපකාරං; බ්‍යාපාදො සමාධිස්ස පරිපන්ථො, අබ්‍යාපාදො සමාධිස්ස උපකාරං; ථිනමිද්ධං[6] සමාධිස්ස පරිපන්ථො, ආලොකසඤ්ඤා සමාධිස්ස උපකාරං; උද්ධච්චං සමාධිස්ස පරිපන්ථො, අවික්ඛෙපො සමාධිස්ස උපකාරං; විචිකිච්ඡා සමාධිස්ස පරිපන්ථො, ධම්මවවත්ථානං සමාධිස්ස උපකාරං; අවිජ්ජා සමාධිස්ස පරිපන්ථො, ඤාණං සමාධිස්ස උපකාරං; අරති සමාධිස්ස පරිපන්ථො, පාමොජ්ජං සමාධිස්ස උපකාරං; සබ්බෙපි අකුසලා ධම්මා සමාධිස්ස පරිපන්ථා, සබ්බෙපි කුසලා ධම්මා සමාධිස්ස උපකාරා. ඉමානි අට්ඨ පරිපන්ථෙ ඤාණානි, අට්ඨ ච උපකාරෙ ඤාණානි.

ඉමෙහි සොළසහි ආකාරෙහි උදුචිතං චිත්තං[7] සමුදුචිතං[8] එකත්තෙ සන්තිට්ඨති, නීවරණෙහි විසුජ්ඣති.

කතමෙ තෙ එකත්තා: නෙක්ඛම්මං එකත්තං, අබ්‍යාපාදො එකත්තං, ආලොකසඤ්ඤා එකත්තං, අවික්ඛෙපො එකත්තං, ධම්මවවත්ථානං එකත්තං, ඤාණං එකත්තං, පාමොජ්ජං එකත්තං, සබ්බෙපි කුසලා ධම්මා එකත්තා.

කතමෙ[9] තෙ නීවරණා: කාමච්ඡන්දො නීවරණං, බ්‍යාපාදො නීවරණං, ථිනමිද්ධං නීවරණං, උද්ධච්චකුක්කුච්චං නීවරණං, විචිකිච්ඡා නීවරණං, අවිජ්ජා නීවරණං, අරති නීවරණං, සබ්බෙපි අකුසලා ධම්මා නීවරණා.

---

1. ආනාපානස්සතිසමාධිං - මජසං, ස්‍යා 2 සමාධිකානි - මජසං, ස්‍යා PTS,
3. අට්ඨ ච - මජසං, 4. බාත්තිංසං - මජසං, බත්තිං සං - PTS, ස්‍යා
5. සතොකාරිසු - ස්‍යා, PTS, 6. ථිනමිද්ධං - මජසං.
7. උද්ධතං චිත්තං - PTS උදුපිතචිත්තං - ස්‍යා,
8. සමුදුචිතං චිත්තං - මජසං, සමුදුපිත චිත්තං - ස්‍යා සමුදුචිත්තං - PTS. උදුජිතං චිත්තං- සමුදුජිතං--පු, උදුජිතං චිත්තං සමුදුජිතං - පු.
9 නිවරණානි කතමෙ - මජසං.

# 3

# ආනාපානස්මෘති කථා

## 3 – 1. ගණනවාරය

ෂෝඩශවස්තුක ආනාපානසමෘති සමාධිය වඩන්නහුට සාතිරේක දෙසියක් ඥනයෝ උපදිති. උවදුරු අරමුණු කොට පැවැති ඥනයෝ අට දෙනෙක, උපකාර අරමුණු කොට පැවැති ඥනයෝ අටදෙනෙක, උපක්ලෙශ අරමුණු කොට පැවැති ඥනයෝ අටළොසෙක, ව්‍යවදානඥන තුදුසෙක, සිහි ඇති ව කරන්නහුගේ ඥන දෙතිසෙක, සමාධිවශයෙන් පැවැති ඥනයෝ සුවිස්සෙක, විදර්ශනාවශයෙන් පැවැති ඥනයෝ දෙසැත්තෑවෙක, නිර්වේදඥනයෝ අටදෙනෙක, නිර්වේදයට අනුලෝම වූ ඥනයෝ අටදෙනෙක, නිර්වේදයාගේ සන්සිඳීමෙහි ඥනයෝ අටදෙනෙක, විමුක්තිසුඛසම්ප්‍රයුක්ත-ඥනයෝ එක්විස්සෙකි.

**ගණනවාරය නිමි.**

## 3 – 2. පරිපන්ථ උපකාර ෂොඩශඥනයෝ

උවදුරු අරමුණ කොට පැවැති ඥනයෝ අටදෙන, උපකාර අරමුණු කොට පැවැත් ඥනයෝ අටදෙන කවරහ යත්:

කාමච්ඡන්දය සමාධියට උවදුරු යැ, නෛෂ්ක්‍රම්‍යය සමාධියට උපකාර යැ. ව්‍යාපාදය සමාධියට උවදුරු යැ, අව්‍යාපාදය සමාධියට උපකාර යැ. ථිනමිද්ධය සමාධියට උවදුරු යැ, ආලොකසංඥව සමාධියට උපකාර යැ. ඖද්ධත්‍යය සමාධියට උවදුරු යැ, අවික්ෂෙපය සමාධියට උපකාර යැ. විචිකිත්සාව සමාධියට උවදුරු යැ, ධර්මනිශ්‍රවය සමාධියට උපකාර යැ. අවිද්‍යාව සමාධියට උවදුරු යැ, ඥනය සමාධියට උපකාර යැ. අරතිය සමාධියට උවදුරු යැ, ප්‍රාමොද්‍යය සමාධියට උපකාර යැ. හැම අකුශලධර්මයෝ සමාධියට උවදුරු වෙති, හැම කුශලධර්මයෝ සමාධියට උපකාර වෙත්. මොහු උවදුරු අරමුණු කොට පැවැති ඥනයෝ අටදෙන ද උපකාර අරමුණු කොට පැවැති ඥනයෝ අටදෙන ද වෙත්.

මේ සොළොස් අයුරින් මතුමත්තෙහි කළ පරිචය ඇති මොනොවට මතුමත්තෙහි කළ පරිචය ඇති සිත එකත්වයෙහි පිහිටයි, නීවරණයන් කෙරෙන් විශුද්ධ වෙයි.

ඒ එකත්වයෝ කවරහ යත්: නෛෂ්ක්‍රම්‍යය එකත්ව යැ අව්‍යාපාදය එකත්ව යැ ආලොකසංඥව එකත්ව යැ අවික්ෂෙපය එකත්ව යැ ධර්මනිශ්‍රවය එකත්ව යැ ඥනය එකත්ව යැ ප්‍රාමොද්‍යය එකත්ව යැ හැම කුශලධර්මයෝ එකත්වයෝ යි.

ඒ නීවරණයෝ කවරහ යත්: කාමච්ඡන්දය නීවරණ යැ ව්‍යාපාදය නීවරණ යැ ථිනමිද්ධය නීවරණ යැ උද්ධච්චකුක්කුච්චය නීවරණ යැ විචිකිච්ඡාව නීවරණ යැ අවිජ්ජාව නීවරණ යැ අරතිය නීවරණ යැ හැම අකුශලධර්මයෝ නීවරණයෝ යි.

**නීවරණා'ති** කෙනට්ඨෙන[1] නීවරණා: නිය්‍යානාවරණට්ඨෙන[2] නීවරණා.

කතමෙ තෙ නිය්‍යානා: නෙක්ඛම්මං අරියානං නිය්‍යානං, තෙන ච නෙක්ඛම්මෙන අරියා නීයන්ති;[3] කාමච්ඡන්දො නිය්‍යානාවරණං, තෙන ච කාමච්ඡන්දෙන නිවුතත්තා නෙක්ඛම්මං අරියානං නිය්‍යානං නප්පජානාතීති[5] කාමච්ඡන්දො නිය්‍යානාවරණං, අබ්‍යාපාදො අරියානං නිය්‍යානං, තෙන ච අබ්‍යාපාදෙන අරියා නීයන්ති;[3] බ්‍යාපාදො නිය්‍යානාවරණං, තෙන ච බ්‍යාපාදෙන නිවුතත්තා අබ්‍යාපාදං අරියානං නිය්‍යානං නප්පජානාතීති[4], බ්‍යාපාදො නිය්‍යානාවරණං. ආලොකසඤ්ඤා අරියානං නිය්‍යානං, තාය ච ආලොකසඤ්ඤාය අරියා නීයන්ති; ථීනමිද්ධං නිය්‍යානාවරණං, තෙන ච ථීනමිද්ධෙන නිවුතත්තා අලොකසඤ්ඤං අරියානං නිය්‍යානං නප්පජානාතීති ථීනමිද්ධං නිය්‍යානාවරණං. අවික්ඛෙපො අරියානං නිය්‍යානං, තෙන ච අවික්ඛෙපෙන අරියා නීයන්ති; උද්ධච්චං නිය්‍යානාවරණං, තෙන ච උද්ධච්චෙන නිවුතත්තා අවික්ඛෙපං අරියානං නිය්‍යානං නප්පජානාතීති උද්ධච්චං නිය්‍යානාවරණං. ධම්මවවත්ථානං අරියානං නිය්‍යානං, තෙන ච ධම්මවවත්ථානෙන අරියා නීයන්ති; විචිකිච්ඡා නිය්‍යානාවරණං, තාය ච විචිකිච්ඡාය නිවුතත්තා ධම්මවවත්ථානං අරියානං නිය්‍යානං නප්පජානාතීති විචිකිච්ඡා නිය්‍යානාවරණං, ඤාණං අරියානං නිය්‍යානං, තෙන ච ඤාණෙන අරියා නීයන්ති; අවිජ්ජා නිය්‍යානාවරණං, තාය ච අවිජ්ජාය නිවුතත්තා ඤාණං අරියානං නිය්‍යානං නප්පජානාතීති අවිජ්ජා නිය්‍යානාවරණං, පාමොජ්ජං[5] අරියානං නිය්‍යානං තෙන ච පාමොජ්ජෙන අරියා නීයන්ති; අරති නිය්‍යානාවරණං, තාය ච අරතියා නිවුතත්තා පාමොජ්ජං අරියානං නිය්‍යානං නප්පජානාතීති අරති නිය්‍යානාවරණං, සබ්බෙපි කුසලා ධම්මා අරියානං නිය්‍යානං, තෙහි ච කුසලෙහි ධම්මෙහි අරියා නීයන්ති; සබ්බෙපි අකුසලා ධම්මා නිය්‍යානාවරණා, තෙහි ච අකුසලෙහි ධම්මෙහි නිවුතත්තා කුසලෙ ධම්මෙ අරියානං නිය්‍යානං නප්පජානාතීති සබ්බෙපි අකුසලා ධම්මා නිය්‍යානාවරණා.

**සොළසඤාණනිද්දෙසො සමත්තො.**

## 3 - 3. උපක්කිලෙසඤාණානි.

ඉමෙහි ච පන නීවරණෙහි විසුද්ධචිත්තස්ස සොළසවත්ථුකං[6] ආනාපානසතිසමාධිං භාවයතො ඛණිකසමොධානා කතමෙ අට්ඨාරස උපක්කිලෙසා උප්පජ්ජන්ති:

---

1. කෙනට්ඨෙන - සයා. 2. නිය්‍යානාවාරණට්ඨෙන - පු.
3. නිය්‍යන්ති - මජසං, PTS 4. න පජානාතීති - PTS
5. පාමුජ්ජං - සයා, 6. සොළසකවත්ථුකං - සී 2

**නීවරණා** යනු: කවර අරුතින් නීවරණ වෙයි යත්: නිර්‍යාණා-වරණාර්‍ථයෙන් නීවරණ යැ.

ඒ නිර්‍යාණයෝ කවරහ යත්: නෛෂ්ක්‍රම්‍යය ආර්‍ය්‍යයන්ගේ නිර්‍යා-ණයෙක. ඒ නෛෂ්ක්‍රම්‍යය හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (කාමයෙන්) නික්ම යෙති. කාමච්ඡන්දය නිර්‍යාණාවරණයෙක. ඒ කාමච්ඡන්දයෙනුදු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණය වූ නෛෂ්ක්‍රම්‍යය නො දනී නු යි කාමච්ඡන්දය නිර්‍යාණාවරණ යැ. අව්‍යාපාදය ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ අව්‍යාපාදය හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (ව්‍යාපාදයෙන්) නික්ම යෙති. ව්‍යාපාදය නිර්‍යාණයට ආවරණයෙක. ඒ ව්‍යාපාදයෙනුදු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණය වූ අව්‍යාපාදය නො දනී නු යි ව්‍යාපාදය නිර්‍යා-ණාවරණ යැ. ආලොකසංඥව ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ ආලොක සංඥව හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (ථිනමිද්ධයෙන්) නික්ම යෙති. ථිනමිද්ධය නිර්‍යාණයට ආවරණයෙක. ඒ ථිනමිද්ධයෙනු දු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණය වූ ආලොකසංඥව නො දනී නු යි ථිනමිද්ධය නිර්‍යාණාවරණ යැ. අවික්ෂෙපය ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ අවික්ෂෙපය හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (ඖද්ධත්‍යයෙන්) නික්ම යෙති. ඖද්ධත්‍යය නිර්‍යාණයට ආවරණයෙක. ඒ ඖද්ධත්‍යයෙනුදු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණය වූ අවික්ෂෙපය නො දනී නු යි ඖද්ධත්‍යය නිර්‍යාණාවරණ යැ. ධර්මනිශ්චය ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ ධර්මනිශ්චය හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (විචිකිත්සායෙන්) නික්ම යෙති. විචිකිත්සාව නිර්‍යාණයට ආවරණයෙක. ඒ විචිකිත්සායෙනුදු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යා-ණය වූ ධර්මනිශ්චය නො දනී නු යි විචිකිත්සාව නිර්‍යාණාවරණ යැ. ඥනය ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ ඥනය හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (අවිද්‍යායෙන්) නික්ම යෙති. අවිද්‍යාව නිර්‍යාණයට ආවරණයෙක. ඒ අවිද්‍යායෙනුදු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණය වූ ඥනය නො දනී නු යි අවිද්‍යාව නිර්‍යාණාවරණ යැ. ප්‍රාමොද්‍යය ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ ප්‍රාමොද්‍යය හෙතුකොටගෙන ද ආර්‍ය්‍යයෝ (අරතියෙන්) නික්ම යෙති. අරතිය නිර්‍යාණාවරණයෙක. ඒ අරතියෙනුදු වැසුණු බැවින් ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණය වූ ප්‍රාමොද්‍යය නො දනී නු යි අරතිය නිර්‍යාණාවරණ යැ. හැම කුශලධර්මයෝ ආර්‍ය්‍යයන්ගේ නිර්‍යාණයෙක. ඒ කුශලධර්මයන් හෙතුකොට ගෙන ද ආර්‍ය්‍යයෝ (හැම අකුශලයෙන්) නික්ම යෙති. හැම අකුශල ධර්මයෝ නිර්‍යාණාවරණයෝ යැ. ඒ අකුශලධර්මයන් විසිනුදු වැසුණු බැවින් ආර්‍ය්‍ය-යන්ගේ නිර්‍යාණය වූ කුශලධර්මයන් නො දනී නු යි හැම අකුශලධර්මයෝ නිර්‍යාණාවරණයෝ යි.

**ෂොඩශඥනනිර්දේශය නිමි.**

## 3 – 3. උපක්ලෙශඥන

තවද මේ නීවරණයන් කෙරෙන් (උපචාරභූමියෙහි) විශුද්ධ වූ සිත් ඇති, ෂොඩශවස්තුක ආනාපානසමෘතිය වඩන්නහුට **ක්ෂණිකසමවධානය** (උපක්ලෙශසමාගමය) හෙතුකොටගෙන **කවර අටළොස් උපක්ලෙශයෝ උපදනාහු ද යත්:**

අස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො අජ්ඣත්තවික්ඛෙපගතං චිත්තං සමාධිස්ස පරිපන්ථො, පස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො බහිද්ධාවික්ඛෙපගතං චිත්තං සමාධිස්ස පරිපන්ථො, අස්සාසපටිකඞ්ඛනා නිකන්තිතණ්හාචරියා සමාධිස්ස පරිපන්ථො, පස්සාසපටිකඞ්ඛනා නිකන්තිතණ්හාචරියා සමාධිස්ස පරිපන්ථො, අස්සාසෙනාභිතුන්නස්ස පස්සාසපටිලාභෙ මුච්ඡනා සමාධිස්ස පරිපන්ථො, පස්සාසෙනාභිතුන්නස්ස අස්සාසපටිලාභෙ මුච්ඡනා සමාධිස්ස පරිපන්ථො.

"අනුගච්ඡනා ච අස්සාසං පස්සාසං අනුගච්ඡනා,
සති අජ්ඣත්තවික්ඛෙපා කඞ්ඛනා බහිද්ධා වික්ඛෙපපත්ථනා[1] (1)

අස්සාසෙනාභිතුන්නස්ස පස්සාසපටිලාභෙ මුච්ඡනා,
පස්සාසෙනාභිතුන්නස්ස අස්සාසපටිලාභෙ මුච්ඡනා[2] (2)

ඡ එතෙ උපක්කිලෙසා ආනාපානසති[3] සමාධිස්ස,
යෙහි වික්ඛිප්පමානස්ස[4] නො ච[5] චිත්තං විමුච්චති
විමොක්ඛං අප්පජානන්තා තෙ හොන්ති පරපත්තියා'ති. (3)

පඨමං ඡක්කං.

නිමිත්තං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො; අස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො, නිමිත්තං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො, පස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො; අස්සාසං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො; පස්සාසං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො.

"නිමිත්තං ආවජ්ජමානස්ස අස්සාසෙ වික්ඛිප්පතෙ[6]මනො
අස්සාසං ආවජ්ජමානස්ස නිමිත්තෙ චිත්තං විකම්පති (4)

නිමිත්තං ආවජ්ජමානස්ස පස්සාසෙ වික්ඛිප්පතෙ මනො,
පස්සාසං ආවජ්ජමානස්ස නිමිත්තෙ චිත්තං විකම්පති, (5)

අස්සාසං ආවජ්ජමානස්ස පස්සාසෙ වික්ඛිප්පතෙ මනො,
පස්සාසං ආවජ්ජමානස්ස අස්සාසෙ චිත්තං විකම්පති. (6)

ඡ එතෙ උපක්කිලෙසා ආනාපානසතිසමාධිස්ස,
යෙහි වික්ඛිප්පමානස්ස නො ච චිත්තං විකම්පති,
විමොක්ඛං අප්පජානන්තා තෙ හොන්ති පරපත්තියා"ති, (7)

දුතියං ඡක්කං.

1. වික්ඛෙපපත්ථනා - සයා 2. 'අස්සාසෙනාති අයං ගාථා සයාම පොත්ථකෙ න දිස්සති
3. ආනාපානස්සති - මජසං සයා 4. වික්ඛෙපමානස්ස - PTS, සයා, කම්පමානස්ස - සයා
5. නොචෙ - සයා 6 වික්ඛිපතෙ - මජසං, PTS.

ආශ්වාසයාගේ ආදි-මධ්‍ය-පර්‍යවසානය සිහියෙන් අනුව යන්නහුගේ අධ්‍යාත්මයෙහි වික්ෂෙපයට ගිය සිත සමාධියට උපද්‍රවයෙක. ප්‍රශ්වාසයාගේ ආදි-මධ්‍ය-පර්‍යවසානය සිහියෙන් අනුව යන්නහුගේ බාහ්‍යායතනයෙහි වික්ෂෙපයට ගිය සිත සමාධියට උපද්‍රවයෙක. ආශ්වාසය පිළිබඳ ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නිකාමය වූ තෘෂ්ණාවගේ පැවැත්ම සමාධියට උපද්‍රවයෙක. ප්‍රශ්වාසය පිළිබඳ ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නිකාමනය වූ තෘෂ්ණාවගේ පැවැත්ම සමාධියට උපද්‍රවයෙක. ආශ්වාසයෙන් පෙළුණහුගේ ප්‍රශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම සමාධියට උපද්‍රවයෙක. ප්‍රශ්වාසයෙන් පෙළුණහුගේ ආශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම සමාධියට උපද්‍රවයෙකි.

ආශ්වාසය අනුව යන්නා වූ අධ්‍යාත්මවික්ෂෙපයට හෙතු වූ ස්මෘතිය ද, ප්‍රශ්වාසය අනුව යන්නා වූ බාහ්‍යවික්ෂෙපයට හෙතු වූ ස්මෘතිය ද, අධ්‍යාත්මවික්ෂෙපය (ආශ්වාසය) පිළිබඳ ප්‍රාර්ථනාව ද, බාහ්‍යවික්ෂෙපය (ප්‍රශ්වාසය) පිළිබඳ ප්‍රාර්ථනාව ද, (1)

ආශ්වාසයෙන් මඩනාලද්දහුගේ ප්‍රශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම ද, ප්‍රශ්වාසයෙන් මඩනාලද්දහුගේ ආශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම ද, යන (2)

මොහු සදෙන ආනාපානස්මෘතිසමාධියට උපක්ලෙශ වෙති. යම් උපක්ලෙශ කෙනකුන් විසින් වික්ෂෙපයට පමුණුවනුලබන්නහුගේ සිත (කෙලෙසුන් කෙරෙන්) නො මිදේ නම් (ආශ්වාසප්‍රශ්වාසාලම්බනයෙහි ද) නො බැඳේ නම් ඔහු යැ. විමොක්ෂය නො දන්නා වූ ඔහු පරප්‍රත්‍යයට (මෙරමා හැදහීමට) සුදුසු වෙත්. (3)

**ප්‍රථම ෂට්කය යි.**

(ආශ්වාස) නිමිත්ත ආවර්ජනා කරන්නාහට ආශ්වාසයෙහි සිත සැලෙයි. ඒ සමාධියට උපද්‍රවයෙක. ආශ්වාසය ආවර්ජනා කරන්නාහට නිමිත්තයෙහි සිත සැලෙයි. ඒ සමාධියට උපද්‍රවයෙක. (ප්‍රශ්වාස) නිමිත්ත ආවර්ජනා කරන්නාහට ප්‍රශ්වාසයෙහි සිත සැලෙයි, ඒ සමාධියට උපද්‍රවයෙක. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නාහට නිමිත්තයෙහි සිත සැලෙයි, ඒ සමාධියට උපද්‍රවයෙක. ආශ්වාසය ආවර්ජනා කරන්නාහට ප්‍රශ්වාසයෙහි සිත සැලෙයි. ඒ සමාධියට උපද්‍රවයෙක. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නාහට ආශ්වාසයෙහි සිත සැලෙයි, ඒ සමාධියට උපද්‍රවයෙකි.

නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ සිත ආශ්වාසයෙහි විසිරෙයි. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත නිමිත්තයෙහි සැලෙයි. (4)

නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි විසිරෙයි. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත නිමිත්තයෙහි සැලෙයි. (5)

ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි විසිරෙයි. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත ආශ්වාසයෙහි සැලෙයි. (6)

මොහු සදෙන ආනාපානස්මෘතිසමාධියට උපක්ලෙශ වෙති. යම් උපක්ලෙශ කෙනකුන් විසින් වික්ෂෙපයට පමුණුවනුලබන්නහුගේ සිත (කෙලෙසුන් කෙරෙන්) නො මිදේ නම් (ආශ්වාසප්‍රශ්වාසාලම්බනයෙහි ද) නො බැඳේ නම් ඔහු යැ විමොක්ෂය නො දන්නා වූ ඔහු පරප්‍රත්‍යයට සුදුසු වෙත්. (7)

**ද්විතීය ෂට්කය යි.**

අතීතානුධාවනං චිත්තං වික්ඛෙපානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අනාගතපටිකඞ්ඛනං චිත්තං විකම්පිතං[1] සමාධිස්ස පරිපන්ථො, ලීනං චිත්තං කොසජ්ජානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අතිපග්ගහිතං චිත්තං උද්ධච්චානු-පතිතං සමාධිස්ස පරිපන්ථො, අභිනතං[2] චිත්තං රාගානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අපනතං[3] චිත්තං බ්‍යාපාදානුපතිතං සමාධිස්ස පරිපන්ථො.

''අතීතානුධාවනං චිත්තං - අනාගතපටිකඞ්ඛනං ලීනං,
අතිපග්ගහිතං අභිනතං[2] - අපනතං[3] චිත්තං න සමාධියති. (8)

ඡ එතෙ උපක්කිලෙසා - ආනාපානසතිසමාධිස්ස,
යෙහි උපක්කිලිට්ඨසඞ්කප්පො - අධිචිත්තං නප්පජානාතී''ති. (9)

**තතියං ඡක්කං.**

අස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො අජ්ඣත්තං වික්ඛෙප-ගතෙන චිත්තෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො බහිද්ධා වික්ඛෙපගතෙන චිත්තෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අස්සාසපටිකඞ්ඛනාය නිකන්තියා තණ්හාචරියාය කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසපටිකඞ්ඛනාය නිකන්තියා තණ්හාචරියාය කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අස්සාසෙනාභිතුන්නස්ස පස්සාසපටිලාභෙ මුච්ඡිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසෙනාභිතුන්නස්ස අස්සාස-පටිලාභෙ මුච්ඡිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; නිමිත්තං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; නිමිත්තං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පි-තත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අස්සාසං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච; ඵන්දිතා ච අතීතානු-ධාවනෙන චිත්තෙන වික්ඛෙපානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අනාගතපටිකඞ්ඛනෙන චිත්තෙන විකම්පිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, ලීනෙන චිත්තෙන කොසජ්ජානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අතිපග්ගහිතෙන චිත්තෙන උද්ධච්චානු-පතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අභිනතෙන චිත්තෙන රාගානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අපනතෙන චිත්තෙන බ්‍යාපාදානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච.

---

1 'විඛම්භිතං - PTS 2. 'අභිණතං - PTS. අභිඤ්ඤතං - ස්‍යා.

3 අපණතං - PTS, අපඤ්ඤතං - ස්‍යා.

අතීත (ආශ්වාසප්‍රශ්වාස) ය ලුහුබඳනා සිත වික්ෂේපය අනුව ගියේ සමාධියට උවදුරෙක, අනාගත (ආශ්වාසප්‍රශ්වාස) ය ප්‍රාර්ථනාකරනු ලබන සිත සැලුණේ සමාධියට උවදුරෙක, ලීන වූ සිත කෞසීද්‍යය අනුව ගියේ සමාධියට උවදුරෙක, ඉතා දැඩිව ගන්නාලද සිත ඖද්ධත්‍යය අනුව ගියේ සමාධියට උවදුරෙක, වෙසෙසින් නැමුණු සිත රාගය අනුව ගියේ සමාධියට උවදුරෙක, නතු නො වූ සිත ව්‍යාපාදය අනුව ගියේ සමාධියට උවදුරෙකි.

අතීතය ලුහුබඳනා සිත ද අනාගතය ප්‍රාර්ථනා කරන සිත ද ලීන සිත ද ඉතා දැඩි වැ ගන්නාලද සිත ද වෙසෙසින් නැමුණු සිත ද සමාහිත නො වෙත් (8)

යම් උපක්ලේශ කෙනකුන් විසින් කෙලෙසනලද සංකල්ප ඇත්තේ අධිචිත්තය නො දනී නම් තෙල සදෙන ආනාපානසමෘතිසමාධියට උපක්ලේශයෝ යි. (9)

### තෘතීය ෂට්කය යි.

ආශ්වාසයාගේ ආදිමධ්‍යපර්‍ය්‍යවසානය සිහියෙන් අනු වැ යන්නහුගේ අධ්‍යාත්මයෙහි වික්ෂේපයට ගිය සිතින් කය ත් සිත ත් (මහත් කැළඹීමෙන්) දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසයාගේ ආදිමධ්‍යපර්‍ය්‍යවසානය සිහියෙන් අනු වැ යන්නහුගේ බාහ්‍යාලම්බනයෙහි වික්ෂේපයට ගිය සිතින් කය ත් සිත ත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසය ප්‍රාර්ථනා කරන්නා වූ නිකාන්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාචර්‍ය්‍යායෙන් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසය ප්‍රාර්ථනා කරන්නා වූ නිකාන්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාචර්‍ය්‍යායෙන් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසයෙන් පීඩිත වූවහුගේ ප්‍රශ්වාසප්‍රතිලාභයෙහි ඇලුණු බැවින් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසයෙන් පීඩිත වූවහුගේ ආශ්වාසප්‍රතිලාභයෙහි ඇලුණු බැවින් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ ආශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ නිමිත්තෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ ප්‍රශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ නිමිත්තෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ ප්‍රශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ ආශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කය ත් සිත ත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. වික්ෂේපය අනු වැ ගිය අතීතය ලුහුබඳනා සිතින් කය ත් සිත ත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. අනාගතය ප්‍රාර්ථනා කරන්නා වූ විකම්පිත වූ සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ලීන වූ කෞසීද්‍යය අනු වැ ගිය සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ඉතා දැඩි වැ ගන්නාලද ඖද්ධත්‍යය අනු වැ ගිය සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. වෙසෙසින් නැමුණු රාගය අනු වැ ගිය සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. නතු වූ ව්‍යාපාදය අනු වැ ගිය සිතින් කයත් සිත ත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙත්.

“ආනාපානසති යස්ස පරිපුණ්ණං[1] අභාවිතා
කායොපි ඉඤ්ජිතො හොති චිත්තම්පි හොති ඉඤ්ජිතං
කායොපි ඵන්දිතො හොති චිත්තම්පි හොති ඵන්දිතං (10)

ආනාපානසති යස්ස පරිපුණ්ණං සුභාවිතා
කායොපි අනිඤ්ජිතො හොති චිත්තම්පි හොති අනිඤ්ජිතං
කායොපි අඵන්දිතො හොති චිත්තම්පි හොති අඵන්දිත”න්ති, (11)

තෙහි ච පන නීවරණෙහි විසුද්ධචිත්තස්ස සොළසවත්ථුකං ආනාපානසතිසමාධිං භාවයතො ඛණිකසමොධානා ඉමෙ අට්ඨාරස උපක්කිලෙසා උප්පජ්ජන්ති.

උපක්කිලෙසඤාණනිද්දෙසො.

## 3 – 4. වොදානඤාණානි

කතමානි තෙරස වොදානෙ ඤාණානි: අතීතානුධාවනං චිත්තං වික්ඛෙපානුපතිතං, තං විවජ්ජයිත්වා එකට්ඨානෙ සමාදහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, අනාගතපටිකඞ්ඛනං චිත්තං විකම්පිතං,[2] තං විවජ්ජයිත්වා තත්ථෙව අධිමොචෙති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, ලීනං චිත්තං කොසජ්ජානුපතිතං, තං පග්ගණ්හිත්වා කොසජ්ජං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති. අතිපග්ගහිතං චිත්තං උද්ධච්චානුපතිතං, තං නිග්ගණ්හිත්වා[3] උද්ධච්චං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, අභිනතං චිත්තං රාගානුපතිතං, තං සම්පජානො හුත්වා රාගං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති අපනතං චිත්තං බ්‍යාපාදානුපතිතං, තං සම්පජානො හුත්වා, බ්‍යාපාදං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, ඉමෙහි ඡහි ඨානෙහි පරිසුද්ධං චිත්තං පරියොදාතං එකත්තගතං හොති.

කතමෙ තෙ එකත්තා: දානවොස්සග්ගුපට්ඨානෙකත්තං,[4] සමථනිමිත්තුපට්ඨානෙකත්තං, වයලක්ඛණුපට්ඨානෙකත්තං, නිරොධුපට්ඨානෙකත්තං.

දානවොස්සග්ගුපට්ඨානෙකත්තං චාගාධිමුත්තානං, සමථනිමිත්තුපට්ඨානෙකත්තඤ්ච අධිචිත්තමනුයුත්තානං, වයලක්ඛණුපට්ඨානෙකත්තඤ්ච විපස්සකානං, නිරොධුපට්ඨානෙකත්තඤ්ච අරියපුග්ගලානං, ඉමෙහි චතූහි ඨානෙහි එකත්තගතං චිත්තං පටිපදාවිසුද්ධිපක්ඛන්තඤ්චෙව[5] හොති, උපෙක්ඛානුබ්‍රූහිතඤ්ච ඤාණෙන ච සම්පහංසිතං.

පඨමස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං.

1. ආනාපානස්සති යස්ස පරිපුණ්ණා - මජසං... යස්ස අපරිපුණ්ණා - සයා, PTS,
2, වික්ඛම්භිතං - PTS, සී 2
3. විනිග්ගණ්හිත්වා - මජසං,
4. දානවොසග්ගුපට්ඨානෙකත්තා - මජසං.
5. පක්ඛන්දඤ්චෙව - මජසං පසන්නඤ්චෙව - සයා PTS,

යමක්හු විසින් ආනාපානසමෘතිය පරිපූර්ණ කොට අභාවිත වූවා ද (ඔහුගේ) කයත් කම්පිත වූයේ වෙයි. සිතත් කම්පිත වූයේ වෙයි. කයත් සැලුණේ වෙයි සිතත් සැලුණේ වේ. (10)

යමක්හු විසින් අනාපානසමෘතිය පරිපූර්ණ කොට මොනොවට වඩනලද ද (ඔහුගේ) කයත් කම්පිත නො වූයේ වෙයි. සිතත් කම්පිත නො වූයේ වෙයි. කයත් නො සැලුණේ වෙයි. සිතත් නො සැලුණේ වේ. (11)

තවද මේ නීවරණයන් කෙරෙන් (උපචාරභූමියෙහි) විශුද්ධ වූ සිත් ඇති, ෂොඩශවස්තුකආනාපානසමෘත්සමාධිය වඩන්නහුට ක්‍ෂණිකාසමව-ධානය (උපක්ලේශසමාගමය) හෙතු කොට ගෙන මේ අටලොස් උපක්ලේශයෝ උපදිත්.

**උපක්ලේශඥානනිදේශ යි.**

# 3 – 4. ව්‍යවදානඥාන

තෙලෙස් ව්‍යවදානඥානයෝ කවරහ යත්: අතීතය ලුහුබඳනා වික්‍ෂේපය අනු වැ ගිය සිතෙක් වේ ද, එය හැරපියා (ආශ්වාසප්‍රශ්වාසයන් අතුරෙන්) එක්තැනෙක පිහිටුවයි. මෙසේත් සිත වික්‍ෂේපයට නො යෙයි. අනාගතය ප්‍රාර්ථනා කරන මෙසෙසින් කම්පිත වූ සිතෙක් වේ ද, එය හැරපියා එහි මැ සන්ටුහන් කෙරෙයි. මෙසේ ත් සිත වික්‍ෂේපයට නො යෙයි. ලීන වූ කෞසීද්‍යය අනු වැ ගිය සිතෙක් වේ ද, එය ප්‍රග්‍රහණය කොට කෞසීද්‍යය දුරු කෙරෙයි, මෙසේ ත් සිත වික්‍ෂේපයට නො යෙයි. ඉතා දැඩි කොට ගන්නා ලද ඖද්ධත්‍යය අනු වැ ගිය සිතෙක් වේද, එය නිග්‍රහ කොට ඖද්ධත්‍යය දුරු කෙරෙයි. මෙසේ ත් සිත වික්‍ෂේපයට නො යෙයි. වෙසෙසින් නැමුණු රාගය අනු වැ ගිය සිතෙක් වේද, සම්‍යග්ඥාන ඇති වැ ඒ රාගය දුරු කෙරෙයි. මෙසේත් සිත වික්‍ෂේපයට නො යෙයි. නතු නො වූ ව්‍යාපාදය අනු වැ ගිය සිතෙක් වේ ද, සම්‍යග්ඥාන ඇති වැ ඒ ව්‍යාපාදය දුරු කෙරෙයි. මෙසේත් සිත වික්‍ෂේපයට නො යෙයි. මේ සකරුණින් පිරිශුද්ධ වූ සිත ප්‍රභාස්වර වූයේ එකත්වයට ගියේ වේ.

ඒ එකත්වයෝ කවරහ යත්: දානවස්තුපරිත්‍යාගයාගේ එළඹසිටීමෙන් වූ එකත්ව යැ ශමථනිමිත්ත එළඹසිටීමෙන් වූ එකත්ව යැ භඞ්ගලක්‍ෂණය එළඹසිටීමෙන් වූ එකත්ව යැ නිරොධය එළඹසිටීමෙන් වූ එකත්ව යයි.

දානවස්තුපරිත්‍යාගයාගේ එළඹසිටීමෙන් වූ එකත්වය දානයෙහි අධි-මුක්තයනට වෙයි. විදර්ශනාපාදකසමාධිය අනු වැ යෙදුණවුනට ශමථ නිමිත්ත එළඹසිටීමෙන් වූ එකත්වය ද විදර්ශකයනට භඞ්ගලක්‍ෂණය එළඹ-සිටීමෙන් වූ එකත්වය ද අයඨිපුද්ගලයනට නිරොධය එළඹසිටීමෙන් වූ එකත්වය ද වෙයි. මේ සතර කරුණින් එකත්වයට ගිය සිත ප්‍රතිපද්-විශුද්ධියට පිවිසියේ ද වෙයි. උපෙක්‍ෂායෙන් වඩනලද්දේත් ඥානයෙන් විශොධිත වූයේත් වේ.

ප්‍රථමධ්‍යානයාගේ ආදිය කවරෙ යැ මධ්‍යය කවරෙ යැ පයඨිවසානය කවරෙ යත්: ප්‍රතිපද්විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදි යැ උපෙක්‍ෂානුබෘංහණය මධ්‍ය යැ සම්ප්‍රහර්ෂණය පයඨිවසාන යි.

පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස කති ලක්ඛණානි; ආදිස්ස තීණි ලක්ඛණානි: යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති; යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති, පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං ආදිකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච.

පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, මජ්ඣස්ස කති ලක්ඛණානි. මජ්ඣස්ස තීණි ලක්ඛණානි: විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති; යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති, පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, මජ්ඣස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං මජ්ඣෙකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච.

පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං, පරියොසානස්ස කති ලක්ඛණානි; පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි; තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා, තදුපගවිරියවාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා; පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං. පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං පරියොසානකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච.

එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාරසම්පන්නඤ්ච පීතිසම්පන්නඤ්ච සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

දුතියස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: දුතියස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං පීතිසම්පන්නඤ්චෙව හොති සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

තතියස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං සුඛසම්පන්නඤ්චෙව හොති චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

ප්‍රතිපද්විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදි යැ. ආදිහුගේ ලක්‍ෂණ කෙතෙක් ද යත්: ආදිහුගේ ලක්‍ෂණ තුනෙකි. යමෙක් ඒ ප්‍රථමධ්‍යානයට පරිපන්‍ථ වේ නම් එයින් සිත විශුද්ධ වෙයි. විශුද්ධ බැවින් සිත මධ්‍යමශමථ-නිමිත්තට (අර්පණාසමාධියට) පැමිණෙයි. පිළිපන් බැවින් එහි සිත පිවිසෙයි. පරිපන්‍ථයෙන් යම් චිත්තවිශුද්ධියකුත් වේ ද විශුද්ධ බැවින් චිත්තය මධ්‍යමශමථනිමිත්තට යම් බැසගැනීමකුත් වේ ද පිළිපන් බැවින් එහි යම් සිත පිවිසගැනීමකුත් වේ ද, ප්‍රතිපද්විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදි යැ ආදිහුගේ මේ තුන් ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'ප්‍රථම-ධ්‍යානය ආදිකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ යයි.

උපෙක්‍ෂානුබ්‍රෑහණය ප්‍රථමධ්‍යානයාගේ මධ්‍යය වෙයි. මධ්‍යයාගේ ලක්‍ෂණ කෙතෙක් ද යත්: මධ්‍යයාගේ ලක්‍ෂණ තුනෙකි. විශුද්ධ සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. ශමථයට පිළිපන් සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි· එකත්වයෙන් එළඹසිටි සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. යම් විශුද්ධ සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ ද යම් ශමථයට පිළිපන් සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ ද යම් එකත්වයෙන් එළඹසිටි සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ ද, ඒ උපෙක්‍ෂානු-බ්‍රෑහණය ප්‍රථමධ්‍යානයාගේ මධ්‍යය වෙයි. මධ්‍යයාගේ මේ තුන් ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'ප්‍රථමධ්‍යානය මධ්‍යකල්‍යාණ ද ලක්‍ෂණ-සම්පන්න ද වේ' යයි.

සම්ප්‍රහර්ෂණය ප්‍රථමධ්‍යානයාගේ පර්‍ය්‍යවසානය වෙයි. පර්‍ය්‍යවසානයාගේ ලක්‍ෂණ කෙතෙක් ද යත්: පර්‍ය්‍යවසානයාගේ ලක්‍ෂණ සතරෙකි. ඒ භාවනාවිශෙෂයෙහි උපන් (සමාධිප්‍රඥ සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා සවභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ තදනුවර්තික-වීර්‍ය්‍යවහනභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ ආසෙවන සවභාවයෙන් සම්ප්‍රහර්ෂණ යි සම්ප්‍රහර්ෂණය ප්‍රථමධ්‍යානයාගේ පර්‍ය්‍යවසානය වෙයි. පර්‍ය්‍යවසානයාගේ මේ සතර ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'ප්‍රථමධ්‍යානය පර්‍ය්‍යවසානකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ' යයි.

මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණ-සම්පන්න වූයේ විතර්කසම්පන්න ද විචාරසම්පන්න ද ප්‍රීතිසම්පන්න ද සුඛ-සම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍ය්‍යසම්පන්න ද සමෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

ද්විතීයධ්‍යානයාගේ ආදිය කවරෙ යැ මධ්‍යය කවරෙ යැ පර්‍ය්‍යවසානය කවරෙ යැ යත්: ප්‍රතිපද්විශුද්ධිය ද්විතීයධ්‍යානයාගේ ආදි යැ. උපෙක්‍ෂානු-බ්‍රෑහණය මධ්‍ය යැ සම්ප්‍රහර්ෂණය පර්‍ය්‍යවසාන යි ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ ප්‍රීතිසම්පන්න ද සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍ය්‍යසම්පන්න ද සමෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

තෘතීයධ්‍යානයාගේ ආදිය කවරෙ යැ මධ්‍යය කවරෙ යැ පර්‍ය්‍යව-සානය කවරෙ යැ යත්: ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධ-කල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍ය්‍යසම්පන්න ද සමෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

චතුත්ථස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං උපෙක්ඛාසම්පන්නඤ්චෙව හොති චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

ආකාසානඤ්චායතනසමාපත්තියා -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං උපෙක්ඛාසම්පන්නඤ්චෙව හොති චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච -පෙ- පඤ්ඤාසම්පන්නඤ්ච.

අනිච්චානුපස්සනාය කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාරසම්පන්නඤ්ච පීතිසම්පන්නඤ්ච සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

දුක්ඛානුපස්සනාය -පෙ- අනත්තානුපස්සනාය -පෙ- නිබ්බිදානුපස්සනාය -පෙ- විරාගානුපස්සනාය -පෙ- නිරොධානුපස්සනාය -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය -පෙ- ඛයානුපස්සනාය -පෙ- වයානුපස්සනාය -පෙ- විපරිණාමානුපස්සනාය -පෙ- අනිමිත්තානුපස්සනාය -පෙ- අප්පණිහිතානුපස්සනාය -පෙ- සුඤ්ඤතානුපස්සනාය -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනාය -පෙ- යථාභූතඤාණදස්සනාය -පෙ- ආදීනවානුපස්සනාය -පෙ- පටිසඞ්ඛානුපස්සනාය -පෙ- විවට්ටනානුපස්සනාය -පෙ-

සොතාපත්තිමග්ගස්ස -පෙ- සකදාගාමිමග්ගස්ස -පෙ- අනාගාමිමග්ගස්ස -පෙ- අරහත්තමග්ගස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: අරහත්තමග්ගස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං. අරහත්තමග්ගස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස කති ලක්ඛණානි: ආදිස්ස තීණි ලක්ඛණානි: යො තස්ස පරිපන්ථො, තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති: යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති. අරහත්තමග්ගස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස ඉමානි තීණි ලක්ඛණානි. තෙන වුච්චති අරහත්තමග්ගො ආදිකල්‍යාණො චෙව හොති ලක්ඛණසම්පන්නො ච.

අරහත්තමග්ගස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ. මජ්ඣස්ස කති ලක්ඛණානි: මජ්ඣස්ස තීණි ලක්ඛණානි: විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති. යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති තෙන වුච්චති අරහත්තමග්ගො මජ්ඣෙකල්‍යාණො චෙව හොති ලක්ඛණසම්පන්නො ච.

චතුර්ථධ්‍යානයාගේ ආදිය කවරේ යැ මධ්‍යය කවරේ යැ පර්‍යවසානය කවරේ යැ යත්: ... මෙසේසින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ උපෙක්‍ෂාසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍ය්‍යසම්පන්න ද සමෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

ආකාසානඤ්චායතනසමාපත්තිහුගේ ... විඤ්ඤාණඤ්චායතනසමාපත්ති-හුගේ ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිහුගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිහුගේ ආදිය කවරේ යැ මධ්‍යය කවරේ යැ පර්‍යවසානය කවරේ යැ යත්: ... මෙසේසින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ උපෙක්‍ෂාසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨාන-සම්පන්න ද ... ප්‍රඥාසම්පන්න ද වේ.

අනිච්චානුපස්සනාවගේ ආදිය කවරේ යැ මධ්‍යය කවරේ යැ පර්‍යව-සානය කවරේ යැ යත්: ... මෙසේසින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ විතර්කසම්පන්න ද විචාරසම්පන්න ද ප්‍රීතිසම්පන්න ද සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධා-සම්පන්න ද වීර්‍ය්‍යසම්පන්න ද සමෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥා-සම්පන්න ද වේ.

දුක්ඛානුපස්සනාවගේ ... අනත්තානුපස්සනාවගේ ... නිබ්බිදානුපස්සනා-වගේ ... විරාගානුපස්සනාවගේ ... නිරොධානුපස්සනාවගේ ... පටිනිස්සග්ගා-නුපස්සනාවගේ ... ඛයානුපස්සනාවගේ ... වයානුපස්සනාවගේ ... විපරිණා-මානුපස්සනාවගේ ... අනිමිත්තානුපස්සනාවගේ ... අප්පණිහිතානුපස්සනා-වගේ ... සුඤ්ඤතානුපස්සනාවගේ .. අධිපඤ්ඤාධම්මවිපස්සනාවගේ ... යථාභූතඤාණදස්සනයාගේ ... ආදීනවානුපස්සනාවගේ ... පටිසඞ්ඛානු පස්සනාවගේ ... විවට්ටානුපස්සනාවගේ ...

ශ්‍රොතාපත්තිමාර්ගයාගේ ... සකෘදාගාමිමාර්ගයාගේ ... අනාගාමිමාර්ගයාගේ ... අර්හත්මාර්ගයාගේ ආදිය කවරේ යැ මධ්‍යය කවරේ යැ පර්‍යවසානය කවරේ යැ යත්: ප්‍රතිපද්විශුද්ධිය අර්හත්මාර්ගයාගේ ආදි යැ උපෙක්‍ෂානුබෘංහණය මධ්‍ය යැ සම්ප්‍රහර්ෂණය පර්‍යවසාන යි. ප්‍රතිපද්විශුද්ධිය අර්හත්මාර්ගයාගේ ආදිය වෙයි. ආදිහුගේ ලක්‍ෂණ කෙතෙක් ද ආදිහුගේ ලක්‍ෂණ තුනෙකි. යම් ධර්මයෙක් ඒ ප්‍රතිපද්විශුද්ධියට පරිපන්ථ වේ ද එයින් සිත විශුද්ධ වෙයි. විශුද්ධ බැවින් සිත මධ්‍යමශමථනිමිත්තට පැමිණෙයි. පිළිපන් බැවින් එහි සිත පිවිසගනී. පරිපන්ථයෙන් යම් චිත්තවිශුද්ධියකුත් වේ ද විශුද්ධ බැවින් සිත මධ්‍යමශමථනිමිත්තට යම් පැමිණීමෙකුත් වේ ද පිළිපන් බැවින් එහි යම් සිත පිවිසගැනීමෙකුත් වේ ද ඒ ප්‍රතිපද්විශුද්ධිය අර්හත්මාර්ගයාගේ ආදිය වෙයි. ආදිහුගේ මේ තුන් ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'අර්හත්මාර්ගය ආදිකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ' යයි

උපෙක්‍ෂානුබෘංහණය අර්හත්මාර්ගයාගේ මධ්‍යය වෙයි, මධ්‍යයාගේ ලක්‍ෂණ කෙතෙක් ද යත්: මධ්‍යයාගේ ලක්‍ෂණ තුනෙකි: විශුද්ධ සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. ශමථයට පිළිපන් සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. එකත්වයෙන් එළඹ-සිටි සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. යම් විශුද්ධ සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ නම් යම් ශමථයට පිළිපන් සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ නම් යම් එකත්වයෙන් එළඹසිටි සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ නම් එයින් කියනු ලැබෙයි: 'අර්හත්මාර්ගය මධ්‍යකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ' යයි.

අරහත්තමග්ගස්ස සම්පහංසනා පරියොසානං. පරියොසානස්ස කති ලක්ඛණානි. පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා, තදුපගවිරියවාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා. අරහත්තමග්ගස්ස සම්පහංසනා පරියොසානං, පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි. තෙන වුච්චති: අරහත්තමග්ගො පරියොසානකල්‍යාණො චෙව හොති ලක්ඛණසම්පන්නො ච. එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාරසම්පන්නඤ්ච පීතිසම්පන්නඤ්ච සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණාමෙකචිත්තස්ස,[1]
අජානතො ච තයො ධම්මෙ භාවනා නුපලබ්භති. (1)

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණාමෙකචිත්තස්ස,
ජානතො ච තයො ධම්මෙ භාවනා උපලබ්භතී'ති. (2)

කථං ඉමෙ තයො ධම්මා එකචිත්තස්ස ආරම්මණා න හොන්ති, න චිමෙ තයො ධම්මා අවිදිතා හොන්ති, න ච චිත්තං වික්ඛෙපං ගච්ඡති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති, විසෙසමධිගච්ඡති:

සෙය්‍යථාපි රුක්ඛො සමෙ භූමිභාගෙ නික්ඛිත්තො,[2] තමෙනං පුරිසො කකචෙන ඡින්දෙය්‍ය, රුක්ඛෙ ඵුට්ඨකකචදන්තානං වසෙන පුරිසස්ස සති උපට්ඨිතා හොති, න ආගතෙ වා ගතෙ වා කකචදන්තෙ මනසිකරොති, න ආගතා වා ගතා වා කකචදන්තා අවිදිතා හොන්ති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති. යථා රුක්ඛො සමෙ භූමිභාගෙ නික්ඛිත්තො, එවං උපනිබන්ධනානිමිත්තං. යථා කකචදන්තා, එවං අස්සාසපස්සාසා. යථා රුක්ඛෙ ඵුට්ඨකකචදන්තානං වසෙන පුරිසස්ස සති උපට්ඨිතා හොති න ආගතෙ වා ගතෙ වා කකචදන්තෙ මනසි කරොති, න ආගතා වා ගතා වා කකචදන්තා අවිදිතා හොන්ති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති. එවමෙව භික්ඛු නාසිකග්ගෙ වා මුඛනිමිත්තෙ වා සතිං උපට්ඨපෙත්වා නිසින්නො හොති, න ආගතෙ වා ගතෙ වා අස්සාසපස්සාසෙ මනසි කරොති, න ආගතා වා ගතා වා අස්සාසපස්සාසා අවිදිතා හොන්ති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති, විසෙසමධිගච්ඡති.

---

1. අනාරම්මණමෙකස්ස චිත්තස්ස - සී 1, 2  අනාරම්මණමෙකචිස්සත්ත - මජසං, අනාරම්මණං එකචිත්තස්ස - පු  2. නික්ඛිපිතො - සී 1, 2

සම්ප්‍රහර්ෂණය අර්හත්මාර්ගයාගේ පර්යවසානය වෙයි. පර්යවසානයාගේ ලක්ෂණ කෙතෙක් ද යත්: පර්යවසානයාගේ ලක්ෂණ සතරෙකි. ඒ භාවනා විශෙෂයෙහි උපන් (සමාධි-ප්‍රඥා සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ, ඉන්ද්‍රියයන් ගේ එකකෘත්‍යස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ, තදනුවර්ජවිත්‍රවීර්යනිර්ධූරස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ, ආසෙවනස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යි. සම්ප්‍රහර්ෂණය අර්හත්මාර්ගයාගේ පර්යවසානය වෙයි. පර්යවසානයාගේ මේ සතර ලක්ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි 'අර්හත්මාර්ගය පර්යවසානලක්ෂණ ද ලක්ෂණසම්පන්න ද වේ'යයි. මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්ෂණසම්පන්න වූයේ විතර්කසම්පන්න ද විචාරසම්පන්න ද ප්‍රීතිසම්පන්න ද සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්යසම්පන්න ද සමෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

නිමිත්ත යැ ආශ්වාසප්‍රශ්වාසයෝ යැ යන මොහු එක් සිතට අරමුණු නො වන්නාහු වෙති. (නිමිත්තාදි) තුන් ධර්මයන් නො දන්නාහට (ආනාපානසතිසමාධි) භාවනාව නො ලැබෙයි. (1)

නිමිත්ත යැ ආශ්වාසප්‍රශ්වාසයෝ යැ යන මොහු එක් සිතට අරමුණු නො වන්නාහු වෙති. (නිමිත්තාදි) තුන් ධර්මයන් දන්නාහට වැළිත් (ආනාපානසතිසමාධි) භාවනාව ලැබේ යයි. (2)

කිසෙයින් මේ තුන් ධර්මයෝ එක් සිතට අරමුණු නො වන්නාහු ද, මේ තුන් ධර්මයෝ නො ද අවිදිතයෝ වෙත් ද, සිත වික්ෂෙපයට නො ද යෙයි. ප්‍රදහන ද පැනෙයි. ප්‍රයොගය (නීවරණවිෂ්කම්භකධ්‍යානය) ද සාධයි. මාර්ගයට පැමිණෙයි යත්:

යම්සේ සම වූ භූමිභාගයෙහි රොපණය කරන ලද වෘක්ෂයෙක් වේ ද, ඒ මේ වෘක්ෂය පුරුෂයෙක් තෙම කියතින් සිඳුනේ නම් වෘක්ෂයෙහි ස්පර්ශ කරන ලද කියත්දත් වශයෙන් පුරුෂයාගේ සිහිය එළඹසිටියා වෙයි. (වෘක්ෂය ස්පර්ශ කොට තමා වෙතට) ආවා වූ හෝ (වෘක්ෂය ස්පර්ශ කොට පරභාගයට) ගියා වූ හෝ කියත්දත් නො මෙනෙහි කෙරෙයි. ආවා වූ හෝ ගියා වූ හෝ කියත්දත් නො දන්නා ලද්දාහු නො වෙති, ප්‍රදහන ද පැනෙයි, ප්‍රයොගය ද සාධයි. සම වූ භූමිභාගයෙහි රොපණය කරනලද වෘක්ෂය යම්බඳු ද උපනිබන්ධනා (සමෘති) නිමිත්ත එබඳු යැ. කියත්දත් යම් බඳු ද ආශ්වාසප්‍රශ්වාසයෝ එබඳු යැ. යම්සේ වෘක්ෂයෙහි ස්පර්ශ කරනලද කියත්දත් වශයෙන් පුරුෂයාගේ සමෘතිය එළඹසිටියා වේ ද ආගිය කියත්දත් නො මෙනෙහි කෙරේ ද ආගිය කියත්දත් නොදන්නාලද්දාහු නො වෙත් ද ප්‍රදහනත් පැනේ ද ප්‍රයොගයත් සාධා ද, එසෙයින් මැ මහණ තෙම නාසිකාග්‍රයෙහි හෝ මුඛනිමිත්තෙහි හෝ සිහි එළවා හුන්නේ වෙයි. ආවා වූ හෝ ගියා වූ හෝ ආශ්වාසප්‍රශ්වාසයන් නො මෙනෙහි කෙරෙයි. ආවා වූ හෝ ගියා වූ හෝ ආශ්වාසප්‍රශ්වාසයන් නො දන්නාලද්දාහු නො වෙති, ප්‍රදහන ද පැනෙයි, ප්‍රයොගය ද සාධයි, විශෙෂයට (මාර්ගයට) පැමිණේ.

**පධානන්ති**[1] කතමං පධානං: ආරද්ධවිරියස්ස කායොපි චිත්තම්පි කම්මනියං හොති, ඉදං පධානං. කතමො පයොගො: ආරද්ධවිරියස්ස උපක්කිලෙසා පහීයන්ති, විතක්කා වූපසමන්ති, අයං පයොගො. කතමො විසෙසො: ආරද්ධවිරියස්ස සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති[2] අයං විසෙසො.

එවං ඉමෙ තයො ධම්මා එකචිත්තස්ස ආරම්මණා න හොන්ති, න චිමෙ[3] තයො ධම්මා අවිදිතා හොන්ති, න ච චිත්තං වික්ඛෙපං ගච්ඡති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති, විසෙසමධිගච්ඡති.

ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා,
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා"ති. (3),

**ආනන්ති** අස්සාසො, නො පස්සාසො. **අපානන්ති** පස්සාසො, නො අස්සාසො. අස්සාසවසෙන උපට්ඨානං සති, පස්සාසවසෙන උපට්ඨානං සති. යො අස්සසති, තස්සුපට්ඨාති; යො පස්සසති, තස්සුපට්ඨාති.

**පරිපුණ්ණාති** පරිග්ගහට්ඨෙන පරිපුණ්ණා, පරිවාරට්ඨෙන පරිපුණ්ණා, පරිපූරට්ඨෙන පරිපුණ්ණා.

**සුභාවිතාති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා. තස්සිමෙ චත්තාරො භාවනට්ඨා යානීකතා[4] හොන්ති වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා.

**යානීකතාති** යත්ථ යත්ථ ආකඞ්ඛති, තත්ථ තත්ථ වසිප්පත්තො හොති බලප්පත්තො වෙසාරජ්ජප්පත්තො. තස්ස[5] තෙ ධම්මා ආවජ්ජනපටිබද්ධා[6] හොන්ති ආකඞ්ඛනපටිබද්ධා[7] මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා. තෙන වුච්චති: 'යානීකතා'ති.

**වත්ථුකතාති** යස්මිං යස්මිං වත්ථුස්මිං චිත්තං ස්වාධිට්ඨිතං හොති තස්මිං තස්මිං වත්ථුස්මිං සති සූපට්ඨිතා[8] හොති. යස්මිං යස්මිං වා පන වත්ථුස්මිං සති සූපට්ඨිතා හොති, තස්මිං තස්මිං වත්ථුස්මිං චිත්තං ස්වාධිට්ඨිතං හොති. තෙන වුච්චති: 'වත්ථුකතා'ති.

**අනුට්ඨිතාති**[9] යෙන යෙන චිත්තං අභිනීහරති, තෙන තෙන සති අනුපරිවත්තති. යෙන යෙන වා පන සති අනුපරිවත්තති, තෙන තෙන චිත්තං අභිනීහරති. තෙන වුච්චති: 'අනුට්ඨිතා'ති.

---

1. විසෙසමධිගච්ඡති පධානඤ්ච - මජ්ඣං, 'පධානන්ති' පදං- ස්‍යා, PTS පොත්ථකෙසු න දිස්සති.
2. බ්‍යාසන්ති - ස්‍යා, බ්‍යන්තීහොන්ති - PTS 3. න චිමෙ - පු 4 යානිකතා - PTS.
5. තස්ස මෙ - මජ්ඣං. 6 අවජ්ජනප්පටිබද්ධා - PTS
7. ආකඞ්ඛපටිබද්ධා - මජ්ඣං, ආකඞ්ඛණප්පටිබද්ධා - PTS ආකඞ්ඛනපටිබද්ධා ස්‍යා.
8. සුපච්ඡිතා - මජ්ඣං, සුපතිට්ඨිතා - PTS. 9. අනුට්ඨිතාති වත්ථුසම්- - මජ්ඣං.

**පධානං** යනු: ප්‍රදහන කවරේ යත්: ආරබ්ධවීර්‍යය ඇත්තහුගේ කයත් සිතත් කර්මණ්‍ය වෙයි. මේ ප්‍රදහන වෙයි. ප්‍රයොග කවරෙ යත්: ආරබ්ධවීර්‍ය ඇත්තහුගේ උපක්ලේශයෝ ප්‍රහීණ වෙති. විතර්කයෝ සන්සිඳෙත්. මේ ප්‍රයොගය වෙයි. විශෙෂ කවරෙ යත්: ආරබ්ධවීර්‍ය ඇත්තහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙති. අනුශයයෝ විගත වෙත්. මේ විශෙෂය වෙයි.

මෙසෙයින් මේ තුන් ධර්මයෝ එක් සිතට අරමුණු නො වෙති. මේ තුන් ධර්මයෝ නො දන්නාලද්දාහු නො ද වෙති. සිත වික්‍ෂෙපයට නො ද යෙයි. ප්‍රදහන ද පැනෙයි. ප්‍රයොගය ද සාධයි විශෙෂයට පැමිණේ.

යමක්හු විසින් ආනාපානසමෘතිය බුදුන් වදාළ සෙයින් පරිපූර්ණ වූවා මොනොවට වඩනලද ද පිළිවෙළින් ප්‍රගුණ කරනලද ද හෙතෙම වලායෙන් මිදුණු සඳ සෙයින් මෙලොව දීප්ත කෙරේ. (3)

**ආන** යනු. ආශ්වාස යැ ප්‍රශ්වාසය නො වෙයි. **අපාන** යනු: ප්‍රශ්වාස යැ ආශ්වාසය නො වෙයි, ආශ්වාස වශයෙන් එළඹසිටීම සමෘති යැ, ප්‍රශ්වාස වශයෙන් එළඹ සිටීම සමෘති යි. යමෙක් ආශ්වාස කෙරේ ද ඔහුගේ සිහිය ආශ්වාසයට එළඹසිටියි. යමෙක් ප්‍රශ්වාස කෙරේ ද ඔහුගේ සිහිය ප්‍රශ්වාසයට එළඹසිටී.

**පරිපුණ්ණා** යනු: පරිග්‍රහසවභාවයෙන් පරිපූර්ණ යැ පරිවාරසවභාව-යෙන් පරිපූර්ණ යැ (භාවනා) පරිපූර සවභාවයෙන් පරිපූර්ණ යි.

**සුභාවිතා** යනු: භාවනා සතරෙකි: ඒ භාවනා විශෙෂයෙහි උපන් (සමාධි – ප්‍රඥ සඞ්ඛාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා සවභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යසවභාවයෙන් භාවනා යැ තදනුච්ඡවික වීර්‍යයීධුර සවභාවයෙන් භාවනා යැ ආසෙවන සවභාවයෙන් භාවනා යි. ඔහු විසින් මේ සතර භාවනාර්ථයෝ යුක්තා-යානයක් මෙන් කරනලද්දාහු (ප්‍රතිෂ්ඨාර්ථයෙන්) වාසතුවක් මෙන් කරන-ලද්දාහු එළඹසිටියාහු භාත්පසින් රැස්කරන ලද්දාහු මොනොවට කරන ලද්දාහු වෙත්.

**යානීකතා** යනු: යම් යම් ධ්‍යානවිදර්ශනායෙක්හි කැමැති වේ නම් ඒ ඒ ධ්‍යානවිදර්ශනායෙහි වශයට පැමිණියේ බලයට පැමිණියේ විශාරද බවට පැමිණියේ වෙයි. ඔහුගේ ඒ (ශමථවිදර්ශනා) ධර්මයෝ ආවර්ජනප්‍රතිබද්ධ-වූවාහු ආකාඞ්ක්‍ෂාප්‍රතිබද්ධ වූවාහු මනසිකාරප්‍රතිබද්ධ වූවාහු චිත්තොත්පාද-ප්‍රතිබද්ධ වූවාහු වෙත්. එයින් කියනු ලැබෙයි: 'යානීකතා' යි.

**වත්ථුකතා** යනු: යම් යම් වස්තුයෙකැ සිත මොනොවට පිහිටියේ වේ ද ඒ ඒ වස්තුයෙහි සිහි එළඹසිටියා වෙයි. තවද යම් යම් වස්තුයෙකැ සිහි එළඹසිටියා වේ ද ඒ ඒ වස්තුයෙහි සිත මොනොවට පිහිටියේ වෙයි. එයින් කියනු ලැබෙයි. 'වත්ථුකතා' යි.

**අනුට්ඨිතා** යනු: යම් යම් භාවනාවිශෙෂයෙක්හි සිත එළවා ද ඒ ඒ භාවනාවිශෙෂයෙහි සිහිය අනුකූල වැ පවතී. තවද යම් යම් භාවනා-විශෙෂයෙක්හි සිහිය අනුකූල වැ පෙරළේ ද ඒ ඒ භාවනාවිශෙෂයෙහි සිත එළවයි. එයින් කියනු ලැබෙයි. 'අනුට්ඨිතා' යි.

**පරිචිතාති** පරිග්ගහට්ඨෙන පරිචිතා, පරිවාරට්ඨෙන පරිචිතා, පරිපූරට්ඨෙන පරිචිතා, සතියා පරිග්ගණ්හනෙතා ජිනාති පාපකෙ අකුසලෙ ධම්මෙ. තෙන වුච්චති: 'පරිචිතා'ති.[1]

**සුසමාරද්ධාති** චත්තාරො සුසමාරද්ධා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සුසමාරද්ධා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සුසමාරද්ධා, තදුපගවිරියවාහනට්ඨෙන සුසමාරද්ධා, තප්පච්චනීකානං කිලෙසානං සමුග්ඝාතත්තා[2] 'සුසමාරද්ධා.'

**සුසමන්ති** අත්ථි සමං, අත්ථි සුසමං. කතමං සමං: යෙ තත්ථ ජාතා අනවජ්ජා කුසලා බොධිපක්ඛියා,[3] ඉදං සමං. කතමං සුසමං: යං තෙසං තෙසං ධම්මානං ආරම්මණං නිරොධො නිබ්බානං, ඉදං සුසමං, ඉති ඉදඤ්ච සමං ඉදඤ්ච සුසමං ඤාතං හොති දිට්ඨං[4] විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා,[5] පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං. තෙන වුච්චති: 'සුසමාරද්ධා'ති.

**අනුපුබ්බං පරිචිතාති** දීඝං අස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා, දීඝං පස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. රස්සං අස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. රස්සං පස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. සබ්බාපි සොළසවත්ථුකා ආනාපානසතියො අඤ්ඤමඤ්ඤං පරිචිතා චෙව හොන්ති අනුපරිචිතා ච. තෙන වුච්චති: 'අනුපුබ්බං පරිචිතා'ති.

**යථාති** දස යථත්ථා: අත්තදමථට්ඨො යථත්ථො, අත්තසමථට්ඨො යථත්ථො, අත්තපරිනිබ්බාපනට්ඨො යථත්ථො, අභිඤ්ඤට්ඨො[6] යථත්ථො, පරිඤ්ඤට්ඨො යථත්ථො, පහානට්ඨො යථත්ථො, භාවනට්ඨො යථත්ථො, සච්ඡිකිරියට්ඨො යථත්ථො, සච්චාභිසමයට්ඨො යථත්ථො, නිරොධෙ පතිට්ඨාපකට්ඨො යථත්ථො.

---

1 ධම්මෙ පරිචිතා - මජසං. 2 සුසමූහතත්තා - මජසං. සුසමුග්ඝාතත්තා - සතා, PTS.
3. බොධිපක්ඛියා - PTS. 4. ඉට්ඨං - PTS. 5. අසම්මුට්ඨා මජසං අපම්මුට්ඨං - සතා, PTS.
6 අභිඤ්ඤත්ථො - මජසං.

**පරිචිතා** යනු: පරිග්‍රහසවභාවයෙන් හාත්පසින් රැස්කරන ලද්දාහු යැ පරිවාරසවභාවයෙන් හාත්පසින් රැස් කරනලද්දාහු යැ පරිපූරසවභාවයෙන් හාත්පසින් රැස්කරනලද්දාහු යැ සමෘතියෙන් පරිග්‍රහ කරනුයේ ලාමක අකුශල ධර්මයන් දිනා නු යි පරිචිතයෝ යි.

**සුසමාරද්ධා** යනු: සුසමාරබ්ධයෝ (මොනොවට කරනලද්දාහු) සතර දෙනෙකි: ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධධර්මයන් නො ඉක්ම පවත්නාසවභාවයෙන් සුසමාරබ්ධ යැ, ඉන්‍ද්‍රියයන්ගේ එකකෘත්‍යසවභාවයෙන් සුසමාරබ්ධ යැ. තදනුච්ඡවිකවීය්‍යීහුරසවභාවයෙන් සුසමාරබ්ධ යැ, ඒ ධ්‍යාන - විදර්ශනාමාර්ගයන්ට ප්‍රතිපක්ෂ වූ කෙලශයන් මොනොවට නැසූ බැවින් සුසමාරබ්ධ යි.

**සුසමං** යනු: ශමයෙක් ඇති සුශමයෙක් ඇති. 'ශම' නම් කවරෙ යත්: ඒ භාවනාවිශෙෂයෙහි උපන් යම් නිරවද්‍ය වූ කුශල වූ බොධිපාක්ෂිකධර්ම කෙනෙක් වෙත් ද මේ ශම නම. සුශම' නම් කවරෙ යත්: ඒ ඒ ධර්මයන්ට අරමුණු වූ යම් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, මේ සුශම නම් මෙසෙසින් මේ ශමයත් මේ සුශමයත් දන්නා ලද්දේ දක්නා ලද්දේ විදිත වූයේ ප්‍රඥයෙන් සාක්ෂාත් කරන ලද්දේ සපර්ශ කරන ලද්දේ වෙයි. නො හැකුළුණු වීය්‍යීය පටන්ගත්නාලද වෙයි, නො නට සිහි එළඹසිටියා වෙයි. දරථ රහිත කය නිවුණේ වෙයි. එකඟ වූ සිත (අරමුණෙහි) සම වැ තබනලද යැ. එසින් කියනු ලැබෙයි 'සුසමාරද්ධා' යි.

**අනුපුබ්බං පරිචිතා** යනු: දීර්ඝ කොට ආශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුන පුනා ප්‍රගුණ කරන ලද යැ, දීර්ඝ කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ, හ්‍රසව කොට ආශ්වාස කිරීම් වසයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ. පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ හ්‍රසව කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ. පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරනලද යැ, ... පටිනිස්සජනය අනු වැ බලමින් ආශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ, පටි-නිස්සජනය අනු වැ බලමින් ප්‍රශ්වාස කිරීම් වසයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ, හැම ෂොඩශවස්තුක ආනාපානසමෘතීහු ඔවුනොවුන් ප්‍රගුණ කරන ලද්දාහු ද පුනපුනා ප්‍රගුණ කරන ලද්දාහු ද වෙත්, එසින් කියනු ලැබෙයි. අනු-පුබ්බං පරිචිතා'යි.

**යථා** යනු: යථාසවභාවයෝ දශ දෙනෙකි: ආත්මදමනසවභාවය යථාසවභාව යැ ආත්මශමනසවභාවය යථාසවභාව යැ ආත්මපරිනිර්වාපණ-සවභාවය යථාසවභාව යැ අභිඥසවභාවය යථාසවභාව යැ පරිඥසවභාවය යථාසවභාව යැ ප්‍රහාණසවභාවය යථාසවභාව යැ භාවනාසවභාවය යථා-සවභාව යැ සාක්ෂාත්ක්‍රියාසවභාවය යථාසවභාව යැ සත්‍යප්‍රතිවේධසවභාවය යථාසවභාව යැ නිරොධයෙහි පිහිටුවන සවභාවය යථාසවභාව යි

**බුද්ධොති** යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ[1] අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි,[2] තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො බලෙසු ච වසීභාවං.

**බුද්ධොති** කෙනට්ඨෙන බුද්ධො: ‘බුජ්ඣිතා සච්චානී’ති බුද්ධො, ‘බොධෙතා[3] පජායා’ති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බදස්සාවිතාය බුද්ධො අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතාය[4] බුද්ධො, ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො, නිරුපලෙපසඞ්ඛාතෙන[5] බුද්ධො, ‘එකන්තවීතරාගො’ති බුද්ධො, ‘එකන්තවීතදොසො’ති බුද්ධො, ‘එකන්තවීතමොහො’ති බුද්ධො, ‘එකන්තනික්කිලෙසො’ති බුද්ධො, ‘එකායනමග්ගං ගතො’ති බුද්ධො, ‘එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො’ති බුද්ධො, අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභා බුද්ධො. ‘බුද්ධො’ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති, යදිදං ‘බුද්ධො’ති.

**දෙසිතොති** අත්තදමථට්ඨෙන යථත්ථො යථා බුද්ධෙන දෙසිතො, අත්තසමථට්ඨෙන යථත්ථො යථා බුද්ධෙන දෙසිතො, අත්තපරිනිබ්බාපනට්ඨෙන යථත්ථො යථා බුද්ධෙන දෙසිතො -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන යථත්ථො යථා බුද්ධෙන දෙසිතො.

**සො ති**[6] ගහට්ඨො වා හොති පබ්බජිතො වා.

**ලොකොති** ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො විපත්තිභවලොකො විපත්තිසම්භවලොකො සම්පත්තිභවලොකො සම්පත්තිසම්භවලොකො එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා -පෙ- අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයො.

**‘පභාසෙති’ති** අත්තදමථට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති, අත්තසමථට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති, අත්තපරිනිබ්බාපනට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති.

---

1 බුද්ධෙ - PTS   2 අභිසම්බුජ්ඣති - PTS   3 බොධෙන්තො - සයා
4 විසතිතාය - සයා   5 නිරුපක්කිලෙසසඞ්ඛාතෙන - සයා නිරුපධිසඞ්ඛාතෙන - PTS
6 කොති - සයා සොති - PTS

**බුද්ධෝ** යනු: යමෙක් භාග්‍යවත් වූයේ තෙමේ (සත්‍යයන්) අවබෝධ කෙළේ ආචාර්යයන් නැත්තේ පෙර නො ඇසූවිරූ දහම්හි තෙමේ සත්‍යයන් අවබෝධ කෙළේ ඒ සත්‍යයන්හි දු සර්වඥත්වයට පැමිණියේ බලධර්මයන්හිදු වශීභාවයට පැමිණියේ වේ ද හේ යැ.

**බුද්ධෝ** යනු: කවර අර්ථයෙන් බුද්ධ වෙයි යත්: සත්‍යයන් අවබෝධ කෙළේ නු යි බුද්ධ යැ ප්‍රජාවට අවබෝධ කරවා නු යි බුද්ධ යැ, සර්වඥ බැවින් බුද්ධ යැ, සියල්ල දක්නාසුලු බැවින් බුද්ධ යැ, අනුන් විසින් අවබෝධ නො කැරවිය යුතු බැවින් බුද්ධ යැ, (නානාගුණ) විසවනය කරන හෙයින් බුද්ධ යැ, ක්ෂීණාස්‍රව සඞ්ඛ්‍යායෙන් බුද්ධ යැ, තෘෂ්ණාලෙප රහිත සඞ්ඛ්‍යායෙන් බුද්ධ යැ, එකාන්තයෙන් වීතරාග නු යි බුද්ධ යැ, එකාන්තයෙන් වීතදෙස නු යි බුද්ධ යැ, එකාන්තයෙන් වීතමොහ නු යි බුද්ධ යැ, එකාන්තයෙන් නිකෙලශ නු යි බුද්ධ යැ, එකාන්තමාර්ගයට ගියේ නු යි බුද්ධ යැ, එකලා වැ අනුත්තර සම්‍යක් සම්බෝධිය අභිසම්බෝධ කෙළේ නු යි බුද්ධ යැ, අබුද්ධිය නැසූ බැවින් බුද්ධිප්‍රතිලාභ හෙයින් බුද්ධ යැ, බුද්ධ යන තෙල නාමය මව විසින් නො කරනලද යැ පියා විසින් නො කරනලද යැ බෑයා විසින් නො කරන ලද යැ බූන විසින් නො කරනලද යැ සගයහළුවන් විසින් නො කරන ලද යැ නෑ සහලේනෑයන් විසින් නො කරනලද යැ මහණබමුණන් විසින් නො කරනලද යැ දෙවියන් විසින් නො කරනලද යැ. යම් බුද්ධ යන නමෙක් වී ද තෙල බුද්ධ නාමය භාග්‍යවත් බුදුවරයන්ට විමොක්ෂාන්තයෙහි බෝමූල සර්වඥතාඥනයාගේ ප්‍රතිලාභය හා සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකි.

**දෙසිතා** යනු: ආත්ම දමනස්වභාව වූ යථාස්වභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද, ආත්මශමනස්වභාව වූ යථාස්වභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද, ආත්මපරිනිර්වාපණස්වභාව වූ යථාස්වභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද ... නිරොධයෙහි පිහිටුවන ස්වභාව වූ යථාස්වභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද,

**සො** යනු: ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ වෙයි.

**ලොකං** යනු: සකන්ධලොක යැ ධාතුලොක යැ ආයතනලොක යැ විපත්තිභව (අපාය) ලොක යැ විපත්තිසම්භව (අපායූපගකර්ම) ලොක යැ සම්පත්තිභව (සුගති) ලොක යැ සම්පත්තිසම්භවලොක යැ එක් ලොවෙක: හැම සත්හු ආහාරයෙන් සිටුනාහු යැ; ... අටලොස් ලොවෙක. අටලොස් ධාතුහු යැ.

**පභාසෙති** යනු: ආත්මදමනස්වභාව වූ යථාස්වභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මේ ලොකය අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරෙයි. ආත්මශමන ස්වභාව වූ යථාස්වභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මෙ ලොව අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරෙයි. ආත්මපරිනිර්වාපණස්වභාව වූ යථාස්වභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මේ ලොව අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරෙයි ... නිරොධයෙහි පිහිටුවන ස්වභාව වූ යථාස්වභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මෙ ලොව අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරේ.

**අබ්භා මුත්තොව චන්දිමා'ති** යථා අබ්භා එවං කිලෙසා, යථා චන්දො එවං අරියඤාණං, යථා චන්දිමා දෙවපුත්තො එවං භික්ඛු, යථා චන්දො අබ්භා මුත්තො මහිකා මුත්තො[1] ධූමරජා මුත්තො[2] රාහුගහණා[3] විප්පමුත්තො භාසතෙ[4] ච තපතෙ[5] ච විරොචතෙ[6] ච, එවමෙව භික්ඛු සබ්බකිලෙසෙහි විප්පමුත්තො භාසතෙ ච තපතෙ ච විරොචතෙ ච. තෙන වුච්චති: 'අබ්භා මුත්තොව චන්දිමා'ති. ඉමානි තෙරස වොදානෙ ඤාණානි.

**වොදානඤාණනිද්දෙසො.**

## 3 - 5. සතොකාරිඤාණානි

**කතමානි බත්තිංස සතොකාරිස්ස[7] ඤාණානි:**

ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සතොව අස්සසති, සතො පස්සසති, දීඝං වා අස්සසන්තො 'දීඝං අස්සසාමී'ති පජානාති, දීඝං වා පස්සසන්තො 'දීඝං පස්සසාමී'ති පජානාති, රස්සං වා අස්සසන්තො 'රස්සං අස්සසාමී'ති පජානාති, රස්සං වා පස්සසන්තො 'රස්සං පස්සසාමී'ති පජානාති 'සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති. 'සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති 'පීතිපටිසංවෙදී අස්සසිස්සාමී'ති -පෙ- 'සුඛපටිසංවෙදී පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං -පෙ- චිත්තපටිසංවෙදී පෙ- අභිප්පමොදයං චිත්තං -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං -පෙ- අනිච්චානුපස්සී -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- 'පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

**ඉධා'ති** ඉමිස්සා දිට්ඨියා, ඉමිස්සා ඛන්තියා, ඉමිස්සා රුචියා, ඉමස්මිං ආදායෙ, ඉමස්මිං ධම්මෙ, ඉමස්මිං විනයෙ, ඉමස්මිං ධම්මවිනයෙ, ඉමස්මිං පාවචනෙ, ඉමස්මිං බ්‍රහ්මචරියෙ, ඉමස්මිං සත්ථුසාසනෙ. තෙන වුච්චති: 'ඉධා'ති.

**භික්ඛූ'ති** පුථුජ්ජනකල්‍යාණකො වා හොති භික්ඛු සෙක්ඛො වා අරහා වා අකුප්පධම්මො.

**අරඤ්ඤ'න්ති** නික්ඛමිත්වා බහි ඉන්දඛීලා, සබ්බමෙතං අරඤ්ඤං.

---

1 මහියා මුත්තො-පු, PTS, මහියා - ස්‍යා 2 ධූමරජමුත්තො - ස්‍යා
3 රාහුපාණා - ස්‍යා 4 භාසති - ස්‍යා PTS 5 තපති - ස්‍යා PTS
6 විරොචති - ස්‍යා TPS 7 සතොකාරීසු - ස්‍යා TPS

**අබ්භාමුත්තොව චන්දිමා** යනු: වලාවෝ යම් බඳු ද කෙලෙස් එබඳු යැ චන්ද්‍රයා යම් බඳු ද ආර්යඥානය එබඳු යැ චන්ද්‍රිම දිව්‍යපුත්‍ර යම් බඳු ද මහණ එබඳු යැ යම්සේ චන්ද්‍ර තෙම වලායෙන් මිදුණේ මිහිදුමින් මිදුණේ දුම්-රජසින් මිදුණේ රාහුග්‍රහණයෙන් මිදුණේ බැබැලේ ද තැවේ ද දිලේ ද එසෙයින් මැ මහණ තෙම හැම කෙලෙසුන් කෙරෙන් වෙසෙසින් මිදුණේ බැබැලෙන්නේ ද තැවෙන්නේ ද දිලෙන්නේ ද වෙයි. එයින් කියනු ලැබෙයි: 'අබ්භා මුත්තොව චන්දිමා'යි. මොහු කෙලෙස් ව්‍යවදානඥානයෝ යි.

**ව්‍යවදානඥානනිර්දේශ යි.**

## 3 – 5. සතොකාරිඥානනිර්දේශය

**සතොකාරිහු (සිහි ඇති වැ කරන්නාහු) ගේ දෙතිස් ඥානයෝ කවරහ යත්:**

**මෙසස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ** ශූන්‍යාගාරයට ගියේ හෝ **පලක්** බැඳ (උඩු) කය සෘජු කොට තබා කමට-හනට අභිමුඛ වැ සිහි එළවාතබා හිඳියි. හෙතෙම සිහි ඇති වැ මැ ආශ්වාස කෙරෙයි. සිහි ඇති වැ ප්‍රශ්වාස කෙරෙයි. දික් කොට හෝ ආශ්වාස කරන්නේ දික් කොට ආශ්වාස කෙරෙමි දනියි. දික් කොට හෝ ප්‍රශ්වාස කරන්නේ දික් කොට ප්‍රශ්වාස කෙරෙමි දනියි. ලුහුඬු කොට හෝ ආශ්වාස කරන්නේ ලුහුඬු කොට ආශ්වාස කෙරෙමි දනියි. ලුහුඬු කොට හෝ ප්‍රශ්වාස කරන්නේ ලුහුඬු කොට ප්‍රශ්වාස කෙරෙමි දනියි. සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. සියලු ආශ්වාසප්‍රශ්වාස-කය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙයි. (ඖදාරික ආශ්වාස ප්‍රශ්වාස සඞ්ඛ්‍යාත) කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙයි ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ... සුඛය ප්‍රකට කෙරෙමින් ... චිත්තසංස්කාරය (වෙදනාසංඥාස්කන්ධ) ප්‍රකට කෙරෙමින් ... චිත්තසංස්කාරය සන්හිඳුවමින් .... චිත්තය ප්‍රකට කෙරෙමින් ... සිත සතුටු කෙරෙමින් ... සිත (අරමුණෙහි) සම වැ තබමින් ... සිත (නීවරණයෙන්) මුදමින් .. අනිත්‍යය අනු වැ බලමින් ... විරාගය අනු වැ බලමින් ... නිරොධය අනු වැ බලමින් ... පටිනිස්සජ්ජනය අනු වැ බලමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි, පටිනිස්සජ්ජනය අනු වැ බලමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙ.

**ඉධ** යනු: (බුදුන්ගේ) මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචන-යෙහි මේ බ්‍රහ්මචර්යයෙහි මේ ශාස්තෘශාසනයෙහි යි. එයින් කියනු ලැබෙයි: 'ඉධ' යි.

**භික්ඛු** යනු: පෘථග්ජනකල්‍යාණක මහණ හෝ වෙයි. ශෛක්ෂ මහණ හෝ වෙයි. අකොප්‍ය (අභීත්ඵල) ධර්ම ඇති රහතුන් වහන්සේ හෝ වෙත්.

**අරඤ්ඤං** යනු: ඉන්ද්‍රකීලයෙන් නික්ම පිටත්හි තෙල සියල්ල අරණ්‍ය වේ.

**රුක්ඛමූලන්ති** යත්ථ භික්ඛුනො ආසනං පඤ්ඤත්තං හොති, මඤ්චො වා පීඨං වා භිසි වා තට්ටිකා වා චම්මඛණ්ඩො[1] වා තිණසන්ථාරො[2] වා පණ්ණසන්ථාරො[2] වා පලාලසන්ථාරො[3] වා තත්ථ භික්ඛු චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති.

**සුඤ්ඤන්ති** කෙනචි අනාකිණ්ණං හොති ගහට්ඨෙහි වා පබ්බජිතෙහි වා.

**අගාරන්ති**[4] විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා.

**නිසීදති පල්ලඞ්කං ආභුජිත්වාති** නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා.

**උජුං කායං පණිධායාති** උජුකො හොති කායො ඨිතො[5] පණිහිතො.[6]

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වාති**: **පරීති** පරිග්ගහට්ඨො, **මුඛන්ති** නිය්‍යානට්ඨො, **සතීති** උපට්ඨානට්ඨො. තෙන වුච්චති: 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා'ති.

**සතොව අස්සසති සතො පස්සසතීති**[7] බත්තිංසාය[8] ආකාරෙහි සතොකාරී හොති:[9] දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති[10] උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති, රස්සං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති. රස්සං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන-පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති.

කථං දීඝං අස්සසන්තො 'දීඝං අස්සසාමී'ති පජානාති, දීඝං පස්සසන්තො 'දීඝං පස්සසාමී'ති පජානාති: දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති, දීඝං පස්සාසං අද්ධානසඞ්ඛාතෙ පස්සසති, දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි; දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි ඡන්දො උප්පජ්ජති.

---

1 චම්මඛණ්ඩො - සී 1, 2. සන්ථරො - මජසං, ස, සණ්ඨරො - සයා
3. පලාලසණ්ඨරො - සයා 4. ආගාරන්ති - PTS, සයා
5. පණිධිතො - සයා 6. සුපණිහිතො - මජසං. PTS සයා
7 'සතො පස්සසති' - තායිපොත්ථකෙ නත්ථි 8. බාත්තිංසාය - මජසං
9. 'හොති' - සයා පොත්ථකෙ නත්ථි. 10. සතිං - සයා

**රුක්ඛමූලං** යනු: යම් රුක්මූලෙකැ මහණහට මැස්සෙක් වේවයි පුටුයෙක් වේවයි බිස්සෙක් වේවයි තට්ටිකායෙක් වේවයි සම්කඩෙක් වේවයි ඇතිරියෙක් වේවයි කොළඇතිරියෙක් වේවයි පිදුරුඇතිරියෙක් වේවයි අසුනෙක් පනවනලද වේ ද, එහි මහණ තෙම සක්මන් කෙරේ හෝ සිටුනේ හෝ හිඳිනේ හෝ ශයනය හෝ කෙරේ.

**සුඤ්ඤං** යනු: ගිහින් විසින් හෝ පැවිද්දන් විසින් හෝ කිසිවකු විසින් අනාකීර්ණ වූයේ වෙයි.

**අගාරං** යනු: විහාර යැ ගරුඬාකාරසෙවෙනි ඇති ගේ යැ ප්‍රාසාද යැ සඳලු ඇති ගේ යැ ගුහා යි.

**නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා** යනු: පලක් බැඳ හිඳිනේ වෙයි.

**උජුං කායං පණිධාය** යනු: කය මොනොවට තබනලද්දේ සෘජු වැ සිටියේ වෙයි.

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** යනු: **පරි** යනු: පරිග්‍රහාර්ථ යැ, **මුඛං** යනු නිර්‍ය්‍යාණාර්ථ යැ, **සති** යනු: උපස්ථානාර්ථ යැ, එයින් කියනු ලැබෙයි: 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා' යි.

**සතොව අස්සසති සතො පස්සසති**: යනු දෙතිස් අයුරින් සිහි ඇති වැ කරනසුලු වෙයි. දික් කොට ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයා-ගේ එකඟ බව අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. දික්කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂෙපය දන්නාහට සිහි එළඹ සිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. ලුහුඬු කොට ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. ලුහුඬු කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. ... පටිනිස්සජනය අනු වැ දක්නේ ආශ්වාස කිරීම් වශයෙන් ... පටිනිස්සජනය අනු වැ දක්නේ ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වේ

කිසෙයින් දික් කොට ආශ්වාස කරන්නේ දික් කොට ආශ්වාස කෙරෙමි දනී ද, දික් කොට ප්‍රශ්වාස කරන්නේ දික්කොට ප්‍රශ්වාස කෙරෙමි දනී ද යත්: දීර්ඝ වූ ආශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කෙරෙයි. දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. දීර්ඝ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. දීර්ඝ වූ ආශ්වාස ප්‍රශ්වාස දීර්ඝකාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ඡන්දය උපදියි.

ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං පස්සාසං අද්ධානසඞ්ඛාතෙ පස්සසති, ඡන්දවසෙන තතොසුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධාන-සඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි. ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි පාමොජ්ජං උප්පජ්ජති.

පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං පස්සාසං අද්ධාන-සඞ්ඛාතෙ පස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාස-පස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි දීඝං අස්සාසපස්සාසාපි චිත්තං විවට්ටති[1] උපෙක්ඛා සණ්ඨාති.

ඉමෙහි නවහාකාරෙහි දීඝං අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං, නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති, තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො; දුක්ඛතො අනුපස්සති, නො සුඛතො; අනත්තතො අනු-පස්සති, නො අත්තතො; නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති, පටිනිස්සජ්ජති, නො ආදියති; අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛ-සඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරො-ධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං තං කායං අනුපස්සති.

**භාවනාති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තන-ට්ඨෙන භාවනා ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහ-නට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

දීඝං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

---

1 විවත්තති - මජසං; ස්‍යා,

ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසය දීර්ඝකාල-යෙහි ආශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස ද කෙරෙයි. ප්‍රශ්වාස ද කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නා හට ද ප්‍රාමොද්‍යය උපදියි.

ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසය දීර්ඝකාල-යෙහි ආශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස ද කෙරෙයි. ප්‍රශ්වාස ද කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද දීර්ඝ යැ යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන් කෙරෙහුදු සිත පෙරළෙයි. උපෙක්‍ෂාව පිහිටා සිටියි.

මේ නව අයුරින් දීර්ඝ යයි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම. (අරමුණට) එළඹිසිටීම සති නම. අනුපස්සනාව ඥාන නම. කය උපස්ථාන යැ සති නො වෙයි. සතිය උපස්ථාන ද සති ද වෙයි ඒ සතියෙන් ඒ ඥානයෙන් ඒ කය අනු වැ ගොස් බලයි. එයින් කියනු ලැබෙයි: **'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'** යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි, නිත්‍ය හෙයින් අනුපස්සනා නො කෙරෙයි. දුඃඛ හෙයින් අනුපස්සනා කෙරෙයි, සුඛ හෙයින් අනුපස්සනා නො කෙරෙයි. අනාත්ම හෙයින් අනුපස්සනා කෙරෙයි, ආත්ම හෙයින් අනුපස්සනා නො කෙරෙයි, කලකිරෙයි, සතුටු නො වෙයි. විරක්ත වෙයි නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි. සමුදය නො කෙරෙයි. හැරපියයි. ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුපස්සනා කරන්නේ නිත්‍ය සංඥව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් අනුපස්සනා කරන්නේ සුඛසංඥව දුරු කෙරෙයි, අනාත්ම හෙයින් අනුපස්සනා කරන්නේ ආත්මසංඥව දුරු කෙරෙයි. කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි. විරක්ත වනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. පටිනිස්ස-ජනය කරනුයේ ග්‍රහණය දුරු කෙරෙයි. මෙසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ.

**භාවනා** යනු: භාවනා සතරෙකි: ඒ භාවනා විශෙෂයෙහි උපන් යුගනද්ධධර්මයන් නො ඉක්ම පවත්නා සවභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රිය-යන්ගේ එකකෘත්‍යභාවයෙන් භාවනා යැ, තදනුවත්තිකවීර්‍ය්‍යවාහිරසවභාවයෙන් භාවනා යැ, ආසෙවනසවභාවයෙන් භාවනා යි.

දීර්ඝ යයි කියනලද ආශ්වාසප්‍රශ්වාස වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂෙපය දන්නාහට ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙති ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙති. ප්‍රකට කොට දන්නාලද සංඥවෝ උපදිති. ප්‍රකට කොට දන්නා ලද්දාහු වැටහෙති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙති. ප්‍රකට කොට දන්නාලද විතර්කයෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

කථං විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති: කථං වෙදනාය උප්පාදෙ විදිතො හොති: 'අවිජ්ජාසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාය උප්පාදෙ විදිතො හොති. 'තණ්හාසමුදයා වෙදනාසමුදයො'ති -පෙ- 'කම්මසමුදයා වෙදනාසමුදයො'ති -පෙ- 'ඵස්සසමුදයා වෙදනාසමුදයො'ති පයච්චසමුදයට්ඨෙන වෙදනාය උප්පාදෙ විදිතො හොති. නිබ්බත්තිලක්ඛණා පස්සතොපි වෙදනාය උප්පාදෙ විදිතො හොති. එවං වෙදනාය උප්පාදෙ විදිතො හොති.

කථං වෙදනාය උපට්ඨානං විදිතං හොති: අනිච්චතො මනසිකරොතො ඛයතුපට්ඨානං විදිතං හොති, දුක්ඛතො මනසිකරොතො භයතුපට්ඨානං විදිතං හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතුපට්ඨානං විදිතං හොති. එවං වෙදනාය උපට්ඨානං විදිතං හොති.

කථං වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති: 'අවිජ්ජානිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති. 'තණ්හානිරොධා වෙදනානිරොධො'ති -පෙ- 'කම්මනිරොධා වෙදනානිරොධො'ති-පෙ-ඵස්සනිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති, විපරිණාමලක්ඛණං පස්සතොපි වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති එවං වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති.

එවං විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

කථං විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති: කථං සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති: 'අවිජ්ජාසමුදයා සඤ්ඤාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති, 'තණ්හාසමුදයා සඤ්ඤාසමුදයො'ති -පෙ- 'කම්මසමුදයා සඤ්ඤාසමුදයො'ති -පෙ- 'ඵස්සසමුදයා සඤ්ඤාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති, නිබ්බත්තිලක්ඛණං පස්සතොපි සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති. එවං සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති.

කථං සඤ්ඤාය උපට්ඨානං විදිතං හොති: අනිච්චතො මනසිකරොතො ඛයතුපට්ඨානං විදිතං හොති, දුක්ඛතො මනසිකරොතො භයතුපට්ඨානං විදිතං හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතුපට්ඨානං විදිතං හොති. එවං සඤ්ඤාය උපට්ඨානං විදිතං හොති.

කිසෙයින් ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත් ද: කිසෙයින් වෙදනාවගේ උත්පාදය දන්නාලද වේ ද යත්: අවිද්‍යාසමුදයෙන් වෙදනාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයස්වභාවයෙන් වෙදනාවගේ උත්පාදය දන්නාලද වෙයි. තෘෂ්ණාසමුදයෙන් වෙදනාසමුදය වේ යයි ... කර්මසමුද-යෙන් වෙදනාසමුදය වේ යයි ස්පර්ශසමුදයෙන් වෙදනාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදය ස්වභාවයෙන් වෙදනාවගේ උත්පාදය දන්නාලද වෙයි. නිර්වෘත්තිලක්ෂණය දක්නහු විසින් ද වෙදනාවගේ උත්පාදය දන්නාලද වේ· මෙසෙයින් වෙදනාවගේ උත්පාදය දන්නාලද්දේ වේ.

කිසෙයින් වෙදනාවගේ වැටහීම දන්නාලද වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නහු විසින් ක්ෂය වශයෙන් වැටහීම දන්නාලද වෙයි දුඃඛ හෙයින් මෙනෙහිකරන්නහු විසින් භය වශයෙන් වැටහීම දන්නාලද වෙයි. අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නහු විසින් ශූන්‍යවශයෙන් වැටහීම දන්නාලද වෙයි. මෙසෙයින් වෙදනාවගේ වැටහීම දන්නාලද වේ.

කිසෙයින් වෙදනාවගේ විනාශය දන්නාලද වේ ද යත්: අවිද්‍යානිරො-ධයෙන් වෙදනානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධස්වභාවයෙන් වෙදනා-වගේ විනාශය දන්නාලද වෙයි. තෘෂ්ණානිරොධයෙන් වෙදනානිරොධය වේ යයි ... කර්මනිරොධයෙන් වෙදනානිරොධය වේ යයි ... ස්පර්ශනිරොධ-යෙන් වෙදනානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධස්වභාවයෙන් වෙදනාවගේ විනාශය දන්නාලද වෙයි. විපරිණාමලක්ෂණය දක්නහු විසින් ද වෙදනාවගේ විනාශය දන්නාලද වෙයි. මෙසෙයින් වෙදනාවගේ විනාශය දන්නා ලද වේ.

මෙසෙයින් ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

කිසෙයින් ප්‍රකට කොට දන්නාලද සංඥාවෝ උපදිත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත් ද: කිසෙයින් සංඥාවගේ උත්පාදය දන්නාලද වේ ද යත්: අවිද්‍යා-සමුදයෙන් සංඥාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයස්වභාවයෙන් සංඥාවගේ උත්පාදය දන්නාලද වෙයි. තෘෂ්ණාසමුදයෙන් සංඥාසමුදය වේ යයි ... කර්මසමුදයෙන් සංඥාසමුදය වේ යයි ... ස්පර්ශසමුදයෙන් සංඥාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයස්වභාවයෙන් සංඥාවගේ උත්පාදය දන්නාලද වෙයි. නිර්වෘත්ති-ලක්ෂණය දක්නහු විසින් ද සංඥාවගේ උත්පාදය දන්නාලද වෙයි. මෙසෙයින් සංඥාවගේ උත්පාදය දන්නාලද්දේ වේ.

කිසෙයින් සංඥාවගේ වැටහීම දන්නාලද වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නහු විසින් ක්ෂයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නහු විසින් භයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නහු විසින් ශූන්‍යවශයෙන් වැටහීම දන්නා ලද වෙයි. මෙසෙයින් සංඥාවගේ වැටහීම දන්නාලද්දේ වේ.

කථං සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති: 'අවිජ්ජානිරොධා සඤ්ඤානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති, 'තණ්හානිරොධා සඤ්ඤානිරොධො'ති -පෙ- 'කම්මනිරොධා සඤ්ඤානිරොධො'ති -පෙ- 'ඵස්සනිරොධා සඤ්ඤානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති, විපරිනාමලක්ඛණං පස්සතොපි සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති එවං සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති.

එවං විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

කථං විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති: කථං විතක්කානං උප්පාදො විදිතො හොති: 'අවිජ්ජාසමුදයා විතක්කසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විතක්කානං උප්පාදො විදිතො හොති, 'තණ්හාසමුදයා විතක්කසමුදයො'ති -පෙ- 'කම්මසමුදයා විතක්කසමුදයො'ති -පෙ- 'සඤ්ඤාසමුදයා විතක්කසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විතක්කානං උප්පාදො විදිතො හොති, නිබ්බත්තිලක්ඛණං පස්සතොපි විතක්කානං උප්පාදො විදිතො හොති. එවං විතක්කානං උප්පාදො විදිතො හොති.

කථං විතක්කානං උපට්ඨානං විදිතං හොති. අනිච්චතො මනසිකරොතො ඛයතුපට්ඨානං විදිතං හොති, දුක්ඛතො මනසිකරොතො භයතුපට්ඨානං විදිතං හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතුපට්ඨානං විදිතං හොති, එවං විතක්කානං උපට්ඨානං විදිතං හොති.

කථං විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති: 'අවිජ්ජානිරොධා විතක්කනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති, 'තණ්හානිරොධා විතක්කනිරොධො'ති -පෙ- 'කම්මනිරොධා විතක්කනිරොධො'ති පෙ- 'සඤ්ඤානිරොධා විතක්කනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති, විපරිනාමලක්ඛණං පස්සතොපි විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති. එවං විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති.

එවං විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

දීඝං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති. [බලානි -පෙ- බොජ්ඣඞ්ගෙ -පෙ- මග්ගං] -පෙ- ධම්මෙ සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

කිසෙයින් සංඥාවගේ විනාශය දන්නාලද වේ ද යත්: අවිද්‍යානිරොධ- යෙන් සංඥානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධසවභාවයෙන් සංඥාවගේ විනාශය දන්නා ලද වෙයි. තෘෂ්ණානිරොධයෙන් සංඥානිරොධය වේ යයි ... කර්මනිරොධයෙන් සංඥානිරොධය වේ යයි ... ස්පර්ශනිරොධයෙන් සංඥානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධසවභාවයෙන් සංඥාවගේ විනාශය දන්නාලද වෙයි. විපරිණාමලක්ෂණය දක්නහු විසින් ද සංඥාවගේ විනාශය දන්නා ලද වෙයි. මෙසෙයින් සංඥාවගේ විනාශය දන්නා ලද්දේ වේ.

මෙසෙයින් ප්‍රකට කොට දන්නාලද සංඥාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වටහති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

කිසෙයින් ප්‍රකට කොට දන්නාලද විතර්කයෝ උපදිත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත් ද, කිසෙයින් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වේ ද යත්: අවිද්‍යාසමුදයෙන් විතර්කසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයසවභාවයෙන් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වෙයි. තෘෂ්ණාසමුදයෙන් විතර්කසමුදය වේ යයි ... කර්මසමුදයෙන් විතර්කසමුදය වේ යයි ... සංඥාසමුදයෙන් විතර්කසමුදය වේ යයි ප්‍රත්‍යය- සමුදයසවභාවයෙන් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වෙයි. නිර්වෘත්ති ලක්ෂණය දක්නහු විසින් ද විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වෙයි. මෙසෙයින් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද්දේ වේ.

කිසෙයින් විතර්කයන්ගේ වැටහීම දන්නා ලද වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නහු විසින් ක්ෂයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නහු විසින් භයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. අනාත්ම හෙයින් මෙනෙහි කරන්නහු විසින් ශූන්‍ය වශයෙන් වැටහීම දන්නාලද වෙයි. මෙසෙයින් විතර්කයන්ගේ වැටහීම දන්නාලද්දේ වේ.

කිසෙයින් විතර්කයන්ගේ විනාශය දන්නාලද වේ ද යත්: අවිද්‍යා- නිරොධයෙන් විතර්කනිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධසවභාවයෙන් විතර්ක- යන්ගේ විනාශය දන්නාලද වෙයි. තෘෂ්ණානිරොධයෙන් විතර්කනිරොධය වේ යයි ... කර්මනිරොධයෙන් විතර්කනිරොධය වේ යයි ... සංඥානිරොධ- යෙන් විතර්කනිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධසවභාවයෙන් විතර්කයන්ගේ විනාශය දන්නාලද වෙයි. විපරිණාමලක්ෂණය දක්නහු විසින් ද විතර්ක- යන්ගේ විනාශය දන්නාලද වෙයි. මෙසෙයින් විතර්කයන්ගේ විනාශය දන්නාලද්දේ වේ.

මෙසෙයින් ප්‍රකට කොට දන්නාලද විතර්කයෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වටහති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

දීර්ඝ යයි කියනලද ආශ්වාසප්‍රශ්වාසවශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂේපය දැනගන්නේ ඉන්ද්‍රියයන් (අරමුණෙහි) පිහිටුවයි. ආලම්බනය ද දැනගනියි. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරෙයි ... මාර්ගය සමවධානය කෙරෙයි. ධර්මයන් සමවධානය කෙරෙයි. ගොචරය ද දැනගනියි. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

**ඉන්ද්‍රියානි සමොධානෙතීති** කථං ඉන්ද්‍රියානි සමොධානෙති: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං සමොධානෙති, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං සමොධානෙති, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං සමොධානෙති, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං සමොධානෙති. අයං පුග්ගලො ඉමානි ඉන්ද්‍රියානි ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'ඉන්ද්‍රියානි සමොධානෙතී'ති.

**ගොචරඤ්ච පජානාතීති** යං තස්ස ආරම්මණං, තං තස්ස ගොචරං; යං තස්ස ගොචරං, තං තස්ස ආරම්මණං, **පජානාතීති** පුග්ගලො, පජානනා පඤ්ඤා.

**සමන්ති** ආරම්මණස්ස උපට්ඨානං සමං, චිත්තස්ස අවික්ඛෙපො සමං, චිත්තස්ස අධිට්ඨානං සමං, චිත්තස්ස වොදානං සමං. **අත්ථොති** අනවජ්ජට්ඨො නික්කිලෙසට්ඨො වොදානට්ඨො පරමට්ඨො.

**පටිවිජ්ඣතීති** ආරම්මණස්ස උපට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අවික්ඛෙපට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අධිට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස වොදානට්ඨං පටිවිජ්ඣති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**බලානි සමොධානෙතීති** කථං බලානි සමොධානෙති: අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං සමොධානෙති, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං සමොධානෙති, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං සමොධානෙති, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං සමොධානෙති, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං සමොධානෙති. අයං පුග්ගලො ඉමානි බලානි ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'බලානි සමොධානෙතී'ති. **ගොචරඤ්ච පජානාතීති** -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**බොජ්ඣඞ්ගෙ සමොධානෙතීති** කථං බොජ්ඣඞ්ගෙ සමොධානෙති: උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, අයං පුග්ගලො ඉමෙ බොජ්ඣඞ්ගෙ ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'බොජ්ඣඞ්ගෙ සමොධානෙතී'ති. **ගොචරඤ්ච පජානාතීති** -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**ඉන්ද්‍රියානි සමොධානෙති** යනු: කිසෙයින් ඉන්ද්‍රියයන් සමවධානය කෙරේ ද යත්: අධිමොක්ෂ ස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය සමවධාන කෙරෙයි ප්‍රග්‍රහස්වභාවයෙන් වීයෙෂීන්ද්‍රියය සමවධාන කෙරෙයි. එළඹ සිටීම් ස්වභාව-යෙන් සමෘතීන්ද්‍රියය සමවධාන කෙරෙයි. අවික්ෂෙපස්වභාවයෙන් සමා-ධීන්ද්‍රියය සමවධාන කෙරෙයි. දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියය සමවධාන කෙරෙයි. මේ පුද්ගල තෙම මේ ඉන්ද්‍රියයන් මේ අරමුණෙහි සමවධාන කෙරෙයි. (පිහිටුවයි) එයින් කියනු ලැබෙයි. 'ඉන්ද්‍රියානි සමොධානෙති'යි.

**ගොචරඤ්ච පජානාති** යනු: යමෙක් ඔහුට ආලම්බන වේ ද ඒ ඔහුට ගොචර වෙයි. යමෙක් ඔහුට ගොචර වේ ද ඒ ඔහුට ආලම්බන වේ **පජානාතීති පුග්ගලො පජානනා පඤ්ඤා,** යනු: පුද්ගල තෙම ප්‍රඥයෙන් දැනගනී.

**සමං** යනු: ආලම්බනයාගේ එළඹසිටීම ශම යැ චිත්තයාගේ අවික්ෂෙපය ශම යැ චිත්තයාගේ අධිෂ්ඨානය ශම යැ චිත්තයාගේ ව්‍යවදානය ශම යි. **අත්ථො** යනු: අනවද්‍යස්වභාව යැ නිකෙලශස්වභාව යැ පරිශුද්ධස්වභාව යැ උත්තමස්වභාව යි.

**පටිවිජ්ඣති** යනු: ආලම්බනයාගේ එළඹසිටීම ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ අවික්ෂෙපස්වභාව ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ අධිෂ්ඨාන ස්වභාව ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ පරිශුද්ධස්වභාව ප්‍රතිවෙධ කෙරේ. එයින් කියනු ලැබෙයි. 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි.

**බලානි සමොධානෙති** යනු: කිසෙයින් බලයන් සමවධාන කෙරේ ද යත්: අශ්‍රද්ධායෙහි සලනු නො හැකි ස්වභාවයෙන් ශ්‍රද්ධාබලය සමවධාන කෙරෙයි. කෞසීද්‍යයෙහි සලනු නො හැකි ස්වභාවයෙන් වීය්‍යීබලය සමවධාන කෙරෙයි. ප්‍රමාදයෙහි සලනු නො හැකි ස්වභාවයෙන් සමෘති-බලය සමවධාන කෙරෙයි. උද්ධතභාවයෙහි සලනු නො හැකි ස්වභාවයෙන් සමාධිබලය සමවධාන කෙරෙයි. අවිද්‍යායෙහි සලනු නො හැකි ස්වභාව-යෙන් ප්‍රඥබලය සමවධාන කෙරේ. මේ පුද්ගල තෙම මේ බලයන් මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'බලානි සමොධා-නෙති'යි. **ගොචරඤ්ච පජානාති** යනු: එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

**බොජ්ඣඞ්ග සමොධානෙති** යනු: කිසෙයින් බොධ්‍යඞ්ගයන් සමව-ධාන කෙරේ ද යත්: එළඹසිටුනා ස්වභාවයෙන් සමෘතිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. ප්‍රවිචයස්වභාවයෙන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. ප්‍රග්‍රහස්වභාවයෙන් වීය්‍යීසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි පැතිරීම් ස්වභාවයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. ව්‍යුපශම-ස්වභාවයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. අවික්ෂෙප ස්වභාවයෙන් සමාධිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. සමවහිතස්වභාව-යෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරේ. මේ පුද්ගල තෙම මේ බොධ්‍යඞ්ගයන් මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'බොජ්ඣඞ්ග සමොධානෙති'යි. **ගොචරඤ්ච පජානාති** යනු: ... එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

**මග්ගං සමොධානෙතීති** කථං මග්ගං සමොධානෙති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨිං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සම්මාසඞ්කප්පං සමොධානෙති, පරිග්ගහට්ඨෙන සම්මාවාචං සමොධානෙති, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තං සමොධානෙති, වොදානට්ඨෙන සම්මාආජීවං සමොධානෙති, පග්ගහට්ඨෙන සම්මාවායාමං සමොධානෙති, උපට්ඨානට්ඨෙන සම්මාසතිං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධිං සමොධානෙති. අයං පුග්ගලො ඉමං මග්ගං ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'මග්ගං සමොධානෙතී'ති. **ගොචරඤ්ච පජානාතීති** -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**ධම්මෙ සමොධානෙතීති** කථං ධම්මෙ සමොධානෙති: ආධිපතෙය්‍යට්ඨෙන[1] ඉන්ද්‍රියානි සමොධානෙති, අකම්පියට්ඨෙන බලානි සමොධානෙති, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ග සමොධානෙති, හෙතුට්ඨෙන මග්ගං සමොධානෙති, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං සමොධානෙති, පදහනට්ඨෙන සම්මප්පධානං සමොධානෙති, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදං සමොධානෙති, තථට්ඨෙන සච්චං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සමථං සමොධානෙති, අනුපස්සනට්ඨෙන විපස්සනං සමොධානෙති, එකරසට්ඨෙන සමථවිපස්සනං සමොධානෙති, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[2] සමොධානෙති, සංවරට්ඨෙන සීලවිසුද්ධිං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධිං සමොධානෙති, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධිං සමොධානෙති, විමුත්තට්ඨෙන[3] විමොක්ඛං සමොධානෙති, පටිවෙධට්ඨෙන විජ්ජං සමොධානෙති, පරිච්චාගට්ඨෙන විමුත්තිං සමොධානෙති, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං සමොධානෙති, පටිප්පස්සද්ධට්ඨෙන[4] අනුප්පාදෙ ඤාණං සමොධානෙති, ඡන්දං මූලට්ඨෙන සමොධානෙති, මනසිකාරං සමුට්ඨානට්ඨෙන සමොධානෙති, ඵස්සං සමොධානට්ඨෙන සමොධානෙති, වෙදනං සමොසරණට්ඨෙන සමොධානෙති, සමාධිං පමුඛට්ඨෙන සමොධානෙති, සතිං ආධිපතෙය්‍යට්ඨෙන[1] සමොධානෙති, පඤ්ඤං[5] තතුත්තරට්ඨෙන සමොධානෙති, විමුත්තිං සාරට්ඨෙන සමොධානෙති, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන සමොධානෙති. අයං පුග්ගලො ඉමෙ ධම්මෙ ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'ධම්මෙ සමොධානෙතී'ති.

---

1. අධිපතෙය්‍යට්ඨෙන - PTS 2. යුගනන්ධං - කාළුවි.
3. මුත්තට්ඨෙන - ස්‍යා. 4. පටිප්පස්සද්ධට්ඨෙන - PTS.
5. සතිසම්පජඤ්ඤං - ස්‍යා.

**මග්ගං සමොධානෙති** යනු: කිසෙයින් මාර්ග සමවධාන කෙරේ ද යත්: දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය සමවධාන කෙරෙයි. අභිනිරෝපණ ස්වභාවයෙන් සම්‍යක්සංකල්පය සමවධාන කෙරෙයි. පරිග්‍රහස්වභාවයෙන් සම්‍යග්වචනය සමවධාන කෙරෙයි. සමුත්ථානස්වභාවයෙන් සම්‍යක්-කර්මාන්තය සමවධාන කෙරෙයි. පරිශුද්ධස්වභාවයෙන් සම්‍යගාජීවය සමව-ධාන කෙරෙයි. ප්‍රග්‍රහස්වභාවයෙන් සම්‍යග්ව්‍යායාමය සමවධාන කෙරෙයි· එළඹසිටුනාස්වභාවයෙන් සම්‍යක්ස්මෘතිය සමවධාන කෙරෙයි. අවික්ෂෙප-ස්වභාවයෙන් සම්‍යක්සමාධිය සමවධාන කෙරේ. මේ පුද්ගල තෙම මේ මාර්ගය මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'මග්ගං සමොධානෙති'යි. **ගොචරඤ්ච පජානාති** යනු: ... එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

**ධම්මෙ සමොධානෙති** යනු: කිසෙයින් ධර්මයන් සමවධාන කෙරේ ද යත්: ආධිපත්‍යස්වභාවයෙන් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, අකම්ප්‍ය ස්වභාවයෙන් බලයන් සමවධාන කෙරෙයි, නියර්‍යාණ ස්වභාවයෙන් බොධ්‍යඞ්ගයන් සමවධාන කෙරෙයි. හෙතු ස්වභාවයෙන් මාර්ගය සමවධාන කෙරෙයි, (අරමුණට) එළඹ සිටීම් ස්වභාවයෙන් සතිපට්ඨානය සමවධාන කෙරෙයි. ප්‍රදහන ස්වභාවයෙන් සම්‍යක්ප්‍රධානය සමවධාන කෙරෙයි. සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදය සමවධාන කෙරෙයි, තථස්වභාව-යෙන් සත්‍යය සමවධාන කෙරෙයි. අවික්ෂෙපස්වභාවයෙන් සමථය සමවධාන කෙරෙයි. අනුපස්සනාස්වභාවයෙන් විදර්ශනාව සමවධාන කෙරෙයි, එකකෘත්‍යස්වභාවයෙන් ශමථවිදර්ශනා සමවධාන කෙරෙයි, නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් යුගනද්ධය (ශමථ-විදර්ශනා) සමවධාන කෙරෙයි, සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධිය සමවධාන කෙරෙයි. අවික්ෂෙප-ස්වභාවයෙන් චිත්තවිශුද්ධිය සමවධාන කෙරෙයි, දර්ශනස්වභාවයෙන් දෘෂ්ටිවිශුද්ධිය සමවධාන කෙරෙයි. විමුක්තිස්වභාවයෙන් විමොක්ෂය සමවධාන කෙරෙයි, ප්‍රතිවෙධස්වභාවයෙන් විද්‍යාව සමවධාන කෙරෙයි, පරිත්‍යාග-ස්වභාවයෙන් විමුක්තිය සමවධාන කෙරෙයි, සමුච්ඡේදස්වභාවයෙන් ක්ෂයඥානය සමවධාන කෙරෙයි, ප්‍රතිප්‍රශ්‍රබ්ධිස්වභාවයෙන් අනුත්පාද ඥානය සමවධාන කෙරෙයි, ඡන්දය මූලස්වභාවයෙන් සමවධාන කෙරෙයි, මනසිකාරය සමුත්ථානස්වභාවයෙන් සමවධාන කෙරෙයි, ස්පර්ශය සමව-ධානස්වභාවයෙන් සමවධාන කෙරෙයි, වෙදනාව සමවසරණස්වභාවයෙන් සමවධාන කෙරෙයි, සමාධිය ප්‍රමුඛස්වභාවයෙන් සමවධාන කෙරෙයි, ස්මෘතිය ආධිපත්‍යස්වභාවයෙන් සමවධාන කෙරෙයි, ප්‍රඥාව තදුත්තර ස්වභාවයෙන් සමවධාන කෙරෙයි, විමුක්තිය සාරස්වභාවයෙන් සමවධාන කෙරෙයි, අමතොගධනිර්වාණය පර්‍යවසානස්වභාවයෙන් සමවධාන කෙරෙයි, මේ පුද්ගල තෙම මේ ධර්මයන් මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙ සමොධානෙති'යි.

**ගොචරඤ්ච පජානාතීති** යං තස්ස ආරම්මණං තං තස්ස ගොචරං, යං තස්ස ගොචරං තං තස්ස ආරම්මණං, **පජානාතීති** පුග්ගලො, පජානනා පඤ්ඤා.

**සමන්ති** ආරම්මණස්ස උපට්ඨානං සමං, චිත්තස්ස අවික්ඛෙපො සමං, චිත්තස්ස අධිට්ඨානං සමං, චිත්තස්ස වොදානං සමං. **අත්ථොති** අනවජ්ජට්ඨො නික්කිලෙසට්ඨො වොදානට්ඨො පරමට්ඨො, **පටිවිජ්ඣතීති** ආරම්මණස්ස උපට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අවික්ඛෙපට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අධිට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස වොදානට්ඨං පටිවිජ්ඣති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති (1)

**කථං රස්සං අස්සසන්තො 'රස්සං අස්සසාමී'ති පජානාති, රස්සං පස්සසන්තො 'රස්සං පස්සසාමී'ති පජානාති:**

රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති, රස්සං පස්සාසං ඉත්තරසඞ්ඛාතෙ පස්සසති, රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි, රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි ඡන්දො උප්පජ්ජති.

ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං පස්සාසං ඉත්තරසඞ්ඛාතෙ පස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි පාමොජ්ජං උප්පජ්ජති.

පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං පස්සාසං ඉත්තරසඞ්ඛාතෙ පස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි. පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි රස්සා අස්සාසපස්සාසා චිත්තං විවට්ටති, උපෙක්ඛා සණ්ඨාති.

ඉමෙහි නවහාකාරෙහි රස්සා අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති: –පෙ– එවං තං කායං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා –පෙ– ආසෙවනට්ඨෙන භාවනා. රස්සං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති –පෙ– රස්සං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති –පෙ– තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (2)

**ගොචරඤ්ච පජානාති** යනු: යමක් ඒ පුද්ගලහට ආලම්බන වේ ද ඒ ආලම්බන තෙම ඒ පුද්ගලහට ගොචර වෙයි, යමක් ඒ පුද්ගලහට ගොචර වේ ද ඒ ගොචරය තෙම ඒ පුද්ගලහට ආලම්බන වේ. **පජානාති** යනු: (හෙ තෙම) පුද්ගල යැ, **පජානනා** ප්‍රඥ යැ, පුද්ගල ප්‍රඥයෙන් දැනගනී යනු යි.

**සමං** යනු: අරමුණ එළඹසිටීම ශම ය චිත්තයාගේ අවික්ෂෙපය ශම යැ, චිත්තයාගේ අධිෂ්ඨානය ශම යැ, චිත්තයාගේ ව්‍යවදානය ශම යි. **අත්ථං** යනු: අනවද්‍යස්වභාව යැ නිකෙලශස්වභාව යැ ව්‍යවදානස්වභාව යැ උත්තම ස්වභාව යි. **පටිවිජ්ඣති** යනු: ආලම්බනයාගේ එළඹසිටීම ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ අවික්ෂෙපස්වභාවය ප්‍රතිවෙධ කෙරෙයි, චිත්තයාගේ අධිෂ්ඨාන ස්වභාවය ප්‍රතිවෙධ කෙරෙයි, චිත්තයාගේ පරිශුද්ධස්වභාවය ප්‍රතිවෙධ කෙරේ. එයින් කියනු ලැබෙයි: ‘සමත්ථඤ්ච පටිවිජ්ඣති’යි. (1)

කිසෙයින් ලුහුඬු කොට ආශ්වාස කරනුයේ ‘ලුහුඬු කොට ආශ්වාස කෙරෙමි’යි දැනගනී ද, ‘ලුහුඬු කොට ප්‍රශ්වාස කරනුයේ ලුහුඬු කොට ප්‍රශ්වාස කෙරෙමි’යි දැනගනී ද යත්:

ලුහුඬු වූ ආශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කෙරෙයි, ලුහුඬු වූ ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි, ලුහුඬු වූ ආශ්වාස-ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ඡන්දය උපදී.

ඡන්දවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ප්‍රාමොද්‍යය උපදී.

ප්‍රාමොද්‍යවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසය අල්ප-සඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසයෙන් සිත පෙරළෙයි. උපෙක්ෂාව පිහිටයි.

මේ නව අයුරින් ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම, (අරමුණට) එළඹසිටීම සමෘති නම, අනුපස්සනාව ඥාන නම, කය උපස්ථාන යැ සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥාන-යෙන් ඒ කය අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: ‘කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා’යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනස්වභාවයෙන් භාවනා යි. ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසවශයෙන් චිත්ත-යාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති ... ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාස වශයෙන් චිත්තයාගේ එකාග්‍රතාසඞ්ඛ්‍යාත අවික්ෂෙපය දැනගන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි ... එයින් කියනු ලැබෙයි: ‘සමත්ථඤ්ච පටිවිජ්ඣති’යි. (2)

කථං 'සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, 'සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති:

**කායොති** ද්වෙ කායා: නාමකායො ච රූපකායො ච කතමො නාමකායො: වෙදනා සඤ්ඤා චෙතනා ඵස්සො මනසිකාරො, නාමඤ්ච නාමකායො ච, යෙ ච වුච්චන්ති චිත්තසඞ්ඛාරා, අයං නාමකායො. කතමො රූපකායො: චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං අස්සාසො ච පස්සාසො ච නිමිත්තඤ්ච උපනිබන්ධනා, යෙ ච වුච්චන්ති කායසඞ්ඛාරා, අයං රූපකායො.

කථං තෙ කායා පටිවිදිතා හොන්ති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති, රස්සං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති, රස්සං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති.

ආවජ්ජතො තෙ කායා පටිවිදිතා හොන්ති, පජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, පස්සතො තෙ කායා පටිවිදිතා හොන්ති, පච්චවෙක්ඛතො තෙ කායා පටිවිදිතා හොන්ති, චිත්තං අධිට්ඨහතො තෙ කායා පටිදිතා හොන්ති, සද්ධාය අධිමුච්චතො තෙ කායා පටිවිදිතා හොන්ති, විරියං පග්ගණ්හතො තෙ කායා පටිවිදිතා හොන්ති, සතිං උපට්ඨාපයතො තෙ කායා පටිවිදිතා හොන්ති, චිත්තං සමාදහතො තෙ කයා පටිවිදිතා හොන්ති, පඤ්ඤාය පජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, අභිඤ්ඤෙය්‍යං අභිජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, පරිඤ්ඤෙය්‍යං පරිජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, පහාතබ්බං පජහතො තෙ කායා පටිවිදිතා හොන්ති, භාවෙතබ්බං භාවයතො තෙ කායා පටිවිදිතා හොන්ති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො තෙ කායා පටිවිදිතා හොන්ති, එවං තෙ කායා පටිවිදිතා හොන්ති.

සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'ති.

කිසෙයින් 'සියලු ආශ්වාසප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සියලු ආශ්වාසප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

**කායො** යනු: දෙ කයෙකි: නාමකය ද රූපකය ද යි. නාමකාය කවරෙ යත්: වෙදනා යැ සංඥා යැ චෙතනා යැ ස්පර්ශ යැ මනසිකාර යි. නාමය ද නාමකාය ද යම් ධර්ම කෙනෙක් චිත්තසංස්කාරයහ යි කියනු ලැබෙත් නම් ඔහු ද යි මේ නාමකාය නම් වෙයි. රූපකාය කවරෙ යත්: සතර මහාභූත යැ සතර මහාභූතයන් නිසා පවත්නා රූප යැ ආශ්වාස යැ ප්‍රශ්වාස යැ නිමිත්ත යැ උපනිබන්ධනා (ආශ්වාසප්‍රශ්වාසයන් ස්පර්ශ කරන තැන) යැ, යම් ධර්ම කෙනෙක් කායසංස්කාරයහ'යි කියනු ලැබෙත් නම් ඔහු යැ යන මේ රූපකාය නමි.

කිසෙයින් ඒ (ආශ්වාසප්‍රශ්වාස) කායයෝ දන්නාලද්දාහු වෙත් ද යත්: දික් කොට ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙති. දික් කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙති. ලුහුඬු කොට ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙති. ලුහුඬු කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නා-හට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නා ලද්දාහු වෙත්.

ආවර්ජනා කරන්නාහට ඒ (ආශ්වාසප්‍රශ්වාස) කායයෝ ප්‍රකට වූවාහු වෙති දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. දක්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. චිත්තය අධිෂ්ඨාන කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. ශ්‍රද්ධායෙහි අධිමුක්තයහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති වීර්‍ය්‍යය දැඩි කොට ගන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සිහි එළවන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති සිත (අරමුණෙහි) පිහිටුවන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති ප්‍රඥයෙන් දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති ස්වලක්ෂණ විසින් දතයුත්ත ස්වලක්ෂණ විසින් දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සාමාන්‍යලක්ෂණ විසින් දතයුත්ත සාමාන්‍ය ලක්ෂණ විසින් දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. ප්‍රහාතව්‍යය ප්‍රහාණය කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති භාවිතව්‍යය භාවනා කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. මෙසෙයින් ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙත්.

සියලු ආශ්වාසප්‍රශ්වාසකාය ප්‍රකට කරන්නා වූ ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම. (ආශ්වාසප්‍රශ්වාසයන්ට) එළඹ සිටීම සමෘති නාම. අනුපස්සනාව ඥාන නම කය උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ කාය අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි 'කායෙ කායානුපස්සනාසතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති. -පෙ- එවං තං කායං අනුපස්සති, **භාවෙතීති** චතස්සො භාවනා: -පෙ- ආසෙවනට්ඨෙන භාවනා, සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසානං[1] සංවරට්ඨෙන සීලවිසුද්ධිං අවික්ඛෙපට්ඨෙන චිත්ත විසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි, යො තත්ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා, යො තත්ථ අවික්ඛෙපට්ඨො, අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො, අයං අධිපඤ්ඤාසික්ඛා, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති, පස්සන්තො සික්ඛති පච්චවෙක්ඛන්තො සික්ඛති, චිත්තං අධිට්ඨහන්තො සික්ඛති සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං පග්ගණ්හන්තො සික්ඛති, සතිං උපට්ඨපෙන්තො සික්ඛති, චිත්තං සමාදහන්තො සික්ඛති, පඤ්ඤාය පජානන්තො සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛති, පහාතබ්බං පජහන්තො සික්ඛති, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

කථං 'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමො කායසඞ්ඛාරො: දීඝං අස්සාසා කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා කායසඞ්ඛාරා, තෙ කායසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති. දීඝං පස්සාසා කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා කායසඞ්ඛාරා, තෙ කායසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති. රස්සං අස්සාසා -පෙ- රස්සං පස්සාසා -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසා -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසා කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා කායසඞ්ඛාරා, තෙ කායසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත් ... මෙසෙයින් ඒ කාය අනුපස්සනා කෙරේ. **භාවෙති** යනු: භාවනා සතරෙකි ... ආසෙවන සවභාවයෙන් භාවනා යි. සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ ආශ්වාසප්‍රශ්වාසයන් ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ අවික්ෂෙපසවභාවයෙන් චිත්තවිශුද්ධි යැ දර්ශන සවභාවයෙන් දෘෂ්ටිවිශුද්ධි යි. එහි යම් සංවරසවභාවයෙක් වේ ද මේ අධිශීලශික්ෂා යැ. එහි යම් අවික්ෂෙපසවභාවයෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා යැ. එහි යම් දර්ශන-සවභාවයෙක් වේ ද මේ අධිප්‍රඥශික්ෂා යි. මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙයි, දනිමින් හික්මෙයි, දකිමින් හික්මෙයි, ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙයි, අධිෂ්ඨාන කෙරෙමින් හික්මෙයි, ශ්‍රද්ධායෙහි අධි-මුක්ත වෙමින් හික්මෙයි, වීර්‍ය්‍ය දැඩි කොට ගනිමින් හික්මෙයි, සිහි එළවමින් හික්මෙයි, සිත (අරමුණෙහි) පිහිටුවමින් හික්මෙයි, ප්‍රඥයෙන් ප්‍රජානනය කෙරෙමින් හික්මෙයි, සවලක්ෂණ විසින් දතයුත්ත සවලක්ෂණ විසින් දනිමින් හික්මෙයි, සාමාන්‍ය ලක්ෂණ විසින් දතයුත්ත සාමාන්‍ය ලක්ෂණ විසින් දනිමින් හික්මෙයි, ප්‍රහාතව්‍යය ප්‍රහාණය කෙරෙමින් හික්මෙයි, භාවිතව්‍යය භාවනා කෙරෙමින් හික්මෙයි, සාක්ෂාත් කර්තව්‍යය සක්ෂාත් කෙරෙමින් හික්මේ.

සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟබව යයි කියනලද අවික්ෂෙපය දන්නාහට ප්‍රකට වූ වෙදනාවෝ උපදිත්. ... සියලු ආශ්වාසප්‍රශ්වාස කාය ප්‍රකට කරන්-නා වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟබව යයි කියන ලද අවික්ෂෙපය දැනගන්නේ ඉන්ද්‍රියයන් සමොධානය කෙරෙයි. ... එයින් කියනු ලැබෙයි: ''සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති'' යි.(3)

කිසෙයින් 'කායසංසකාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'කායසංසකාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

කායසංසකාර කවරෙ යත්: රූපකයෙහි උපන් දීර්ඝ යයි කියන ලද ආශ්වාස කෙනෙක් වෙත් ද තෙල ධර්මයෝ කය පිළිබඳ වූවාහු කාය-සංසකාර නම් වෙති. ඒ කායසංසකාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. රූපකයෙහි උපන් දීර්ඝ යයි කියන ලද ප්‍රශ්වාස කෙනෙක් වෙත් ද තෙල ධර්මයෝ කය පිළිබඳ වූවාහු කායසංසකාර නම් වෙති. ඒ කායසංසකාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. හ්‍රසව යයි කියන ලද ආශ්වාසයෝ ... හ්‍රසව යයි කියන ලද ප්‍රශ්වාසයෝ ... සියලු ආශ්වාස-ප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ ආශ්වාසයෝ ... සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ කායික ප්‍රශ්වාස කෙනෙක් වෙත් ද තෙල ධර්මයෝ කය පිළිබඳ වූවාහු කායසංසකාර නම් වෙති. ඒ කාය සංසකාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි.

යථාරූපෙහි කායසඞ්ඛාරෙහි යා කායස්ස ආනමනා විනමනා සන්නමනා පනමනා ඉඤ්ජනා ඵන්දනා චලනා පකම්පනා,[1] ‘පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී’ති සික්ඛති, ‘පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී’ති සික්ඛති. යථාරූපෙහි කායසඞ්ඛාරෙහි යා කායස්ස න ආනමනා න විනමනා න සන්නමනා න පනමනා[2] අනිඤ්ජනා අඵන්දනා අචලනා අකම්පනා, ‘සන්තං සුඛුමං පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී’ති සික්ඛති, ‘පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී’ති සික්ඛති. ඉති කිර පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී’ති සික්ඛති, ‘පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී’ති සික්ඛති. එවං සන්තෙ වාතූපලද්ධියා[3] ච පභාවනා න හොති, අස්සාසපස්සාසානඤ්ච පභාවනා න හොති, ආනාපානසතියා ච පභාවනා න හොති, ආනාපානසතිසමාධිස්ස ච පභාවනා න හොති, න ච නං තං[4] සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි. ඉති කිර ‘පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී’ති සික්ඛති, ‘පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී’ති සික්ඛති. එවං සන්තෙ වාතූපලද්ධියා[3] ච පභාවනා හොති, අස්සාසපස්සාසානඤ්ච පභාවනා හොති, ආනාපානසතියා ච පභාවනා හොති, ආනාපානසතිසමාධිස්ස ච පභාවනා හොති, තඤ්ච නං සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි.

යථා කථං විය: සෙය්‍යථාපි කංසෙ ආකොටිතෙ පඨමං ඔළාරිකා සද්දා පවත්තන්ති, ඔළාරිකානං සද්දානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සූපධාරිතත්තා නිරුද්ධෙපි ඔළාරිකෙ සද්දෙ අථ පච්ඡා සුඛුමකා සද්දා පවත්තන්ති, සුඛුමකානං සද්දානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා නිරුද්ධෙපි සුඛුමෙ සද්දෙ අථ පච්ඡා සුඛුමසද්දනිමිත්තාරම්මණතාපි[5] චිත්තං සූපධාරිතත්තා පවත්තති. එවමෙව පඨමං ඔළාරිකා අස්සාසපස්සාසා පවත්තන්ති ඔළාරිකානං අස්සාසපස්සාසානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සූපධාරිතත්තා නිරුද්ධෙපි ඔළාරිකෙ අස්සාසපස්සාසෙ අථ පච්ඡා සුඛුමකා අස්සාසපස්සාසා පවත්තන්ති, සුඛුමකානං අස්සාසපස්සාසානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සූපධාරිතත්තා නිරුද්ධෙපි සුඛුමකෙ අස්සාසපස්සාසෙ අථ පච්ඡා සුඛුමකඅස්සාසපස්සාසානං නිමිත්තාරම්මණතාපි[6] චිත්තං න වික්ඛෙපං ගච්ඡති.

එවං සන්තෙ වාතූපලද්ධියා ච පභාවනා හොති, අස්සාසපස්සාසානඤ්ච පභාවනා හොති, ආනාපානසතියා ච පභාවනා හොති, ආනාපානසතිසමාධිස්ස ච පභාවනා හොති, තඤ්ච නං සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි.

---

1. කම්පනා - සභා, PTS, 2. නප්පණමනා - සභා
3. වාතුපලද්ධියා - සභා, 4. න ච තං - සභා - තඤ්ච තං PTS
5. සුඛුමනිමිත්තාරම්මණතොපි - සභා. සුඛුමසද්දනිමිත්තාරම්මණතාපි - PTS
6. නිමිත්තාරම්මණතාපි - සභා, PTS.

යම්බඳු කායසංස්කාර කෙනකුත් කාරණ කොටගෙන කය පිළිබඳ යම් ආපසු නැමීමෙක් දෙපසට නැමීමෙක් මොනොවට නැමීමෙක් පෙරට නැමීමෙක් කම්පනයෙක් මඳ වූ චලනයෙක් බලවත් චලනයෙක් ප්‍රකම්පනයෙක් වේ ද එබඳු කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි· යම්බඳු කායසංස්කාර කෙනකුත් කාරණ කොට ගෙන කය පිළිබඳ යම් ආපසු නො නැමීමෙක් දෙපසට නො නැමීමෙක් මොනොවට නො නැමීමෙක් පෙරට නො නැමීමෙක් අනිඤ්ජනයෙක් අඵන්දනයෙක් අචලනයෙක් අකම්පනයෙක් වේ ද එබඳු වූ ශාන්ත වූ සූක්ෂම වූ කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. ඉදින් මෙසෙයින් 'කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මේ ද 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද මෙසේ ඇති කල්හි වාතොපලබ්ධ විඥානයාගේ ද ඉපදීමෙක් නො වේ නම් ආශ්වාසප්‍රශ්වාසයන්ගේ ද ඉපදීමෙක් නො වේ නම් ආනාපානසමෘතියගේ ද ඉපදීමෙක් නො වේ නම් ආනාපානසමෘති සමාධිහුගේ ද ඉපදීමෙක් නො වේ නම නුවණැතියෝ ඒ සමවතට සමවදනාහු ද (ඉන්) නැගීසිටුනාහු ද නො ද වෙති. ඉදින් මෙසෙයින් 'කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි, හික්මේ ද 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද මෙසේ ඇති කල්හි වාතොපලබ්ධවිඥානයාගේ ද ඉපදීම වේ නම් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ද ඉපදීම වේ නම් අනාපානසමෘතියගේ ද ඉපදීම වේ නම් ආනාපානසමෘතිසමාධිහුගේ ද ඉපදීම වේ නම් නුවණැතියෝ වැළිත් ඒ සමවතට සමවදනාහු ද ඉන් නැගී සිටුනාහු ද වෙත්.

ඒ කිසෙයින යත්: යම්සේ කස්බඳුන පහළ, කල්හි පළමු වැ ඖදාරික ශබ්දයෝ පවතිත්. ඖදාරික වූ ශබ්දයන්ගේ නිමිත්ත මොනොවට ගන්නා ලද බැවින් මොනොවට මෙනෙහි කරන ලද බැවින් මොනොවට සිත්හි තබන ලද බැවින් ඖදාරික ශබ්දය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂම වූ ශබ්දයෝ පවතිත්. සූක්ෂමශබ්දයන්ගේ නිමිත්ත මොනොවට ගන්නාලද බැවින් මොනොවට මෙනෙහිකරනලද බැවින් මොනොවට සිත්හි තබන ලද බැවින් සූක්ෂමශබ්දය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂමශබ්දනිමිත්තාලම්බන බැවිනුදු සිත පවතී ද, එසෙයින් මැ පළමු වැ ඖදාරික වූ ආශ්වාසප්‍රශ්වාසයෝ පවතිත්. ඖදාරික වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ නිමිත්ත මොනොවට ගන්නාලද බැවින් මොනොවට මෙනෙහි කරන ලද බැවින් මොනොවට සිත්හි තබනලද බැවින් ඖදාරික වූ ආශ්වාසප්‍රශ්වාසය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසයෝ පවතිත්. සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසයන් ගේ නිමිත්ත මොනොවට ගන්නාලද බැවින් මොනොවට මෙනෙහිකරනලද බැවින් මොනොවට සිත්හි තබන ලද බැවින් සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ නිමිත්තාලම්බන බැවිනුදු සිත වික්ෂෙපයට නො යෙයි.

මෙසේ ඇති කල්හි වාතොපලබ්ධවිඥානයාගේ ද ඉපදීම වෙයි, ආශ්වාසප්‍රශ්වාසයන්ගේ ද ඉපදීම වෙයි, ආනාපානසමෘතියගේ ද ඉපදීම වෙයි. ආනාපානසමෘතිසමාධිහුගේ ද ඉපදීම වෙයි. නුවණැතියෝ වැළිත් ඒ සමවතට සමවදනාහු ද ඉන් නැගීසිටුනාහු ද වෙත්.

පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති, තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති. -පෙ- එවං තං කායං අනුපස්සති, **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා, පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසානං[1] සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි, යො තත්‍ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා. යො තත්‍ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා, යො තත්‍ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං, පජානන්තො ඉන්‍ද්‍රියානි සමොධානෙති -පෙ- තෙන වුච්චති: 'සමත්‍ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ[2] ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො,[3] චත්තාරි සුත්තන්තිකවත්‍ථූනි කායෙ කායානුපස්සනාය.

පඨමචතුක්කං

කථං පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, 'පීතිපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමා පීති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති පීතිපාමොජ්ජං, යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති පීති පාමොජ්ජං -පෙ- රස්සං අස්සාසවසෙන -පෙ- රස්සං පස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති පීතිපාමොජ්ජං, යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති[4] ඔදග්‍යං[5] අත්තමනතා චිත්තස්ස අයං පීති.

1. අස්සාසපස්සාස සා - ස්‍යා 2. අනුපස්සනා - මජසං,
3. අට්ඨ චුපට්ඨානානුස්සතියො - පු 4. චිත්තස්ස - ස්‍යා,
5. ඔදග්ගං - ස.

'පස්සම්භයං කායසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම, (අරමුණට) එළඹසිටීම සමෘති නම, අනුපස්සනාව ඥාන නම, කය උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි, ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ ආශ්වාසප්‍රශ්වාස කය අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත්. ... මෙසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි:... ආසෙවන ස්වභාවයෙන් භාවනා යි. 'පස්සම්භයං කායසංඛාරං' යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවර ස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ අවික්ෂෙප ස්වභාවයෙන් චිත්තවිශුද්ධි යැ දර්ශන ස්වභාවයෙන් දෘෂ්ටිවිශුද්ධි යි. එහි යම් සංවරස්වභාවයෙක් වේ ද මේ අධිශීල ශික්ෂා යැ එහි යම් අවික්ෂෙප ස්වභාවයෙක් වේ ද මේ අධිචිත්ත ශික්ෂා යැ එහි යම් දර්ශන ස්වභාවයෙක් වේ ද මේ අධිප්‍රඥශික්ෂා යි. මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙයි ... සාක්ෂාත්කතීව්‍යය සාක්ෂාත් කෙරෙමින් හික්මේ.

'පස්සම්භයං කායසඞ්ඛාරං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රකට වූ වෙදනාවෝ උපදිති ... 'පස්සම්භයං කායසඞ්ඛාරං' යි කියන ලද ආශ්වාස-ප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව වූ අවික්ෂෙපය දැන-ගත්තේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි ... එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (4)

කයෙහි කය අනුව බැලීමෙහි අනුදර්ශනාඥානයෝ අට දෙනෙක, උපස්ථානානුසමෘතිහු ද අටදෙනෙක, සෞත්‍රාන්තික වස්තූහු සතරදෙනෙකි.

### ප්‍රථමචතුෂ්කය යි.

කිසෙයින් 'ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද 'ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

ප්‍රීති කවරැ යත්: 'දීඝං' යි කියන ලද ආශ්වාසයා ගේ වශයෙන් චිත්ත-යාගේ එකඟ බව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රීතිප්‍රාමොද්‍යය උපදී. යම් ප්‍රීතියක් ප්‍රමුදිත බවෙක් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් (ධනය වැනි බැවින්) විත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද, 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රීතිය ප්‍රාමොද්‍යය උපදී ... 'රස්සං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් 'රස්සං' යි ... කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'සබ්බකායපටිසංවෙදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... සබ්බකායපටිසංවෙදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං කායසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භ-යං කායසඞ්ඛාරං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ-බව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රීතිය ප්‍රාමොද්‍යය උපදී. යම් ප්‍රීතියක් ප්‍රමුදිත බවෙක් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් විත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමනබවෙක් වේ ද මේ ප්‍රීති නමු.

කථං සා පීති[1] පටිවිදිතා හොති දීඝං අස්සාසවසෙන[2] චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා පීති පටිවිදිතා හොති. දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා පීති පටිවිදිතා හොති, රස්සං අස්සාසවසෙන -පෙ- රස්සං පස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා පීති පටිවිදිතා හොති, ආවජ්ජතො සා පීති පටිවිදිතා හොති, ජානතො -පෙ- පස්සතො -පෙ- පච්චවෙක්ඛතො -පෙ- චිත්තං අධිට්ඨහතො -පෙ- සද්ධාය අධිමුච්චතො -පෙ- විරියං පග්ගණ්හතො -පෙ- සතිං උපට්ඨාපයතො -පෙ- චිත්තං සමාදහතො -පෙ- පඤ්ඤාය පජානතො -පෙ- අභිඤ්ඤෙය්‍යං අභිජානතො -පෙ- පරිඤ්ඤෙය්‍යං පරිජානතො -පෙ- පහාතබ්බං පජහතො -පෙ- භාවෙතබ්බං භාවයතො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො සා පීති පටිවිදිතා හොති. එවං සා පීති පටිවිදිතා හොති.

පීතිපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

අනුපස්සතීති කථං තං වෙදනං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං වෙදනං අනුපස්සති, භාවනාති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

පීතිපටිසංවෙදී අස්සාසපස්සාසානං[3] සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- පීතිපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

කථං 'සුඛපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති,[4] 'සුඛපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

සුඛන්ති ද්වෙ සුඛානි: කායිකඤ්ච සුඛං, චෙතසිකඤ්ච සුඛං. කතමං කායිකං සුඛං. යං කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං[5] වෙදයිතං කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං කායිකං සුඛං. කතමං චෙතසිකං සුඛං: යං චෙතසිකං සාතං[6] චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං චෙතසිකං සුඛං.

---

1. 'කථං සා පීති' කායි පොත්ථකෙ න දිස්සති,
2. අස්සාසපස්සාසවසෙන - මජසං
3. අස්සාසපස්සාසා - සයා, අස්සාසපස්ස සංවරට්ඨෙන - සී 1,
4. 'සුඛ -පෙ- සික්ඛති' තායිපොත්ථකෙ නත්ථි.
5. කායසම්ඵස්සජං සාතං සුඛං' තායිපොත්ථකෙ නත්ථි.
6. චෙතසිකං සුඛං' තායිපොත්ථකෙ නත්ථි.

කිසෙයින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වේ ද යත්: ‘දීඝං’ යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වෙයි. ‘දීඝං’යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වෙයි. ‘රස්සං’යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් ... ‘රස්සං’යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... ‘සබ්බකායපටිසංවෙදී’යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... සබ්බකායපටිසංවෙදී’යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... පස්සම්භයං කායසඞ්ඛාරං’යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් ... ‘පස්සම්භයං කායසඞ්ඛාරං’යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වෙයි. ආවර්ජනා කරන්නාහට ඒ ප්‍රීතිය ප්‍රකට වූවා වෙයි. දන්නාහට ... දක්නාහට ... ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ... චිත්තය අධිෂ්ඨාන කරන්නාහට... ශ්‍රද්ධායෙහි අධිමුක්තයහට ... වීර්‍ය්‍යය දැඩි කොට ගන්නාහට... සිහි එළවන්නාහට ... සිත (අරමුණෙහි) පිහිටුවන්නාහට ... ප්‍රඥයෙන් ප්‍රකට කොට දන්නාහට ... සවභාවලක්ෂණ විසින් දතයුත්ත සවභාවලක්ෂණ විසින් දන්නාහට ... සාමාන්‍ය ලක්ෂණ විසින් දතයුත්ත සාමාන්‍යලක්ෂණ විසින් දන්නාහට ... ප්‍රහාතව්‍යය ප්‍රහාණය කරන්නාහට ... භාවිතව්‍යය භාවනා කරන්නාහට ... සාක්ෂාත්කතීව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ ප්‍රීතිය ප්‍රකට වූවා වෙයි. මෙසෙයින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වේ.

‘පීතිපටිසංවෙදී’යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් වෙදනා වෙයි. උපස්ථානය සමෘති යැ අනුපස්සනාව ඥන යැ. වෙදනාව උපස්ථාන වෙයි, සමෘති නො වෙයි, සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥනයෙන් ඒ වෙදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: ‘වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා’යි.

**අනුපස්සති** යනු; කිසෙයින් ඒ වෙදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. ... මෙසෙයින් ඒ වෙදනාව අනුපස්සනා කෙරෙයි. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන සවභාවයෙන් භාවනා යි.

‘පීතිපටිසංවෙදී’යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි වෙයි ... ‘පීතිපටිසංවෙදී’ යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි. ‘සමත්ථඤ්ච පටිවිජ්ඣති’යි. (1)

කිසෙයින් ‘සුඛය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි’ හික්මේ ද, ‘සුඛය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි’ හික්මේ ද යත්:

**සුඛං** යනු: සුඛයෝ දෙදෙනෙකි: කායිකසුඛය ද චෛතසිකසුඛය දැ’යි. කායිකසුඛය කවරැ යත්: යම් කායිකසාතයෙක් (මිහිරෙක්) කායිකසුඛයෙක් කායසමඵස්සයෙන් උපන් සාත-සුඛවෙදයිතයෙක් කායසමඵස්සයෙන් උපන් සාතසුඛවෙදනාවක් වේ ද, මේ කායිකසුඛ නම් වෙයි. චෛතසික සුඛ කවරැ යත්: යම් චෛතසිකසාතයෙක් චෛතසිකසුඛයෙක් චෙතොසමඵස්සයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චෙතොසමඵස්සයෙන් උපන් සාතසුඛවෙදනාවක් වේ ද මේ චෛතසිකසුඛ නම් වේ.

කථං තෙ සුඛෙ පටිවිදිතා හොන්ති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ සුඛෙ පටිවිදිතා හොන්ති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ සුඛෙ පටිවිදිතා හොන්ති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො තෙ සුඛෙ පටිවිදිතා හොන්ති, එවං තෙ සුඛෙ පටිවිදිතා හොන්ති.

සුඛපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං. වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං වෙදනං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

සුඛපටිසංවෙදී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- සුඛපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානනතො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (2)

කථං 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමො චිත්තසඞ්ඛාරො: දීඝං අස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා; දීඝං පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා -පෙ- සුඛපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සුඛපටිසංවෙදී පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා. අයං චිත්තසඞ්ඛාරො.

කථං තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති. තාය සතියා තෙන ඤාණෙන තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති. -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති. එවං තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති.

කිසෙයින් ඒ සුඛයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙත් ද යත්: 'දීඝං'යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සුඛයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙති. 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සුඛයෝ ප්‍රකට කොට දන්නා ලද්දාහු වෙති ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ සුඛයෝ ප්‍රකට වූවාහු වෙති. මෙසෙයින් ඒ සුඛයෝ ප්‍රකට වූවාහු වෙත්.

'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් වේදනා වෙයි. (අරමුණට) එළඹසිටීම ස්මෘති යැ අනුපස්සනාව ඥාන යැ වේදනාව උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි. ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වේදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වේදනාසු වේදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි ... මෙසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන-ස්වභාවයෙන් භාවනා යි.

'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරස්වභාව-යෙන් ශීලවිශුද්ධි වෙයි ... 'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාස-යන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි; 'සමන්තං ච පටිවිජ්ඣති'යි. (2)

කිසෙයින් චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද 'චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

චිත්තසංස්කාර කවරු යත්: 'දීඝං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. මෙතෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. මෙතෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. ... 'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් – සුඛපටිසංවෙදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. මෙතෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්ත-සංස්කාර වෙති. මේ චිත්තසංස්කාර නම් වේ.

කිසෙයින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙත් ද යත්: 'දීඝං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට කොට දන්නා ලද්දාහු වෙති. 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි, ඒ සිහියෙන් ඒ නුවණින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙති. ... සාක්ෂාත් කර්තව්‍යය සාක්ෂාත්කරන්නාහට ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට වූවාහු වෙති. මෙසෙයින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට වූවාහු වෙත්.

චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති තෙන වුච්චති: වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති. අනිච්චතො අනුපස්සති, -පෙ- එවං තං වෙදනං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

**කථං පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති:**

කතමො චිත්තසඞ්ඛාරො: දීඝං අස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා, තෙ චිත්තසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති, දීඝං පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා, තෙ චිත්තසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති, චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා, තෙ චිත්තසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති.

පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං වෙදනං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො, චත්තාරි සුත්තන්තිකවත්ථූනි වෙදනාසු වෙදනානුපස්සනාය.

**දුතියචතුක්කං**

'චිත්තසඞ්ඛාරපටිසංවේදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් වේදනා වෙයි. උපස්ථානය ස්මෘති යැ අනුපස්සනාව ඥාන යැ වේදනාව උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වේදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි.; 'වේදනාසු වේදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. ... මෙසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන ස්වභාවයෙන් භාවනා යි.

'චිත්තසඞ්ඛාරපටිසංවේදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවර ස්වභාවයෙන් ශීලවිශුද්ධි වෙයි. ... 'චිත්තසඞ්ඛාරපටිසංවේදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි. (3)

කිසෙයින් 'චිත්තසංස්කාරය සන්හිඳුව මින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද 'චිත්තසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

චිත්තසංස්කාර කවරැ යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. තෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. ඒ චිත්තසංස්කාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. තෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. ඒ චිත්තසංස්කාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. 'චිත්තසඞ්ඛාරපටිසංවේදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'චිත්තසඞ්ඛාරපටිසංවේදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. තෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. ඒ චිත්තසංස්කාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මේ.

'පස්සම්භයං චිත්තසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් වේදනා වෙයි (අරමුණට) එළඹසිටීම ස්මෘති යැ. අනුපස්සනාව ඥාන යැ, වේදනාව උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි. ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වේදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වේදනාසු වේදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. ... මෙසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ. **භාවනා** යනු භාවනා සතරෙකි: ... ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

'පස්සම්භයං චිත්තසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'පස්සම්භයං චිත්තසඞ්ඛාරං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයනගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (4)

වේදනාවන්හි වේදනාව අනුව බැලීමෙහි අනුදර්ශනාඥානයෝ අට දෙනෙක, උපස්ථානානුස්මෘතීහු ද අටදෙනෙක, සෞත්‍රාන්තික වස්තූහු සතර දෙනෙකි.

**ද්විතීයචතුෂ්කය යි.**

කථං 'චිත්තපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, 'චිත්තපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමං තං චිත්තං: දීඝං අස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං,[1] යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො[2] මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනො[3] විඤ්ඤාණධාතු,[4] දීඝං පස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං[1] යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනො[3] විඤ්ඤාණධාතු[4] ඉදං චිත්තං.

කථං තං චිත්තං පටිවිදිතං හොති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං පටිවිදිතං හොති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං පටිවිදිතං හොති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො තං චිත්තං පටිවිදිතං හොති, එවං තං චිත්තං පටිවිදිතං හොති.

චිත්තපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං,[1] උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන විඤ්ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතී**ති කථං තං චිත්තං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං චිත්තං අනුපස්සති. **භාවනා**ති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

චිත්තපටිසංවෙදී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි. -පෙ- චිත්තපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං-පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (1)

කථං 'අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති:

කතමො[5] චිත්තස්ස අභිප්පමොදො: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති චිත්තස්ස අභිප්පමොදො. යා චිත්තස්ස ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති[6] ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස. දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති චිත්තස්ස අභිප්පමොදො, යා චිත්තස්ස ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස -පෙ- චිත්තපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තපටිසංවෙදී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති චිත්තස්ස අභිප්ප-මොදො, යා චිත්තස්ස ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස, අයං චිත්තස්ස අභිප්පමොදො.

---

1. විඤ්ඤාණචිත්තං - සයා, PTS. 2. 'මනො' තායිපොත්ථකෙ නත්ථි,
3. තජ්ජමනො - PTS, 4 විඤ්ඤාණධාතු - PTS
5. කතමො ච - සයා 6. චිත්තස්ස - සයා

කිසෙයින් 'චිත්තය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි'යි හික්මේ ද 'චිත්තය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මේ ද යත්:

ඒ චිත්තය කවරු යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් විඥනය චිත්ත නම. යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප මනොවිඥනධාතුයෙක් වේ ද, 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං චිත්තසඞ්ඛාරං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං චිත්තසඞ්ඛාරං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් විඥනය චිත්ත නම. යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප මනොවිඥනධාතුයෙක් වේ ද මේ චිත්ත නම් වේ.

කිසෙයින් ඒ චිත්තය ප්‍රකට කොට දන්නාලද වේ ද යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹ සිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සිත ප්‍රකට කොට දන්නාලද වෙයි. 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සිත ප්‍රකට කොට දන්නා ලද වෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ සිත ප්‍රකට වූයේ වෙයි. මෙසෙයින් ඒ සිත ප්‍රකට කොට දන්නාලද වේ.

'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් විඥනය චිත්ත නම. (අරමුණට) එළඹසිටිම සමෘති යැ. අනුපස්සනාව ඥන යැ. චිත්තය උපස්ථාන වෙයි සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥනයෙන් ඒ සිත අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ සිත අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි ... මෙසෙයින් ඒ සිත අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි...ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමන්තඤ්ච පටිවිජ්ඣති' යි. (1)

කිසෙයින් 'සිත ප්‍රමුදිත කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සිත ප්‍රමුදිත කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

චිත්තයාගේ ප්‍රමෝදය (අධික තුෂ්ටිය) කවර යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට චිත්තයාගේ ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් (ධනය වැනි බැවින්) චිත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද, 'දීඝං' යි කියන ලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට චිත්තයාගේ ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් චිත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද .. 'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'චිත්තපටිසංවෙදී' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට චිත්තයාගේ ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් චිත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද මේ චිත්තයාගේ ප්‍රමෝදය යි.

අභිප්පමොදයං චිත්තං අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං චිත්තං අනුපස්සති: -පෙ- එවං තං චිත්තං අනුපස්සති, **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

අභිප්පමොදයං චිත්තං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි-පෙ- අභිප්පමොදයං චිත්තං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (2)

කථං 'සමාදහං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'සමාදහං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති:

කතමො සමාධි.[1] දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති[2]. අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා[3] සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි. දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි -පෙ- සමාදහං චිත්තං අස්සාසවසෙන -පෙ- සමාදහං චිත්තං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි, අයං සමාධි.

සමාදහං චිත්තං අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති, තෙන වුච්චති: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං චිත්තං අනුපස්සති: -පෙ- එවං තං චිත්තං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

සමාදහං චිත්තං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- සමාදහං චිත්තං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

---

1 කතමඤ්ච සමාධින්ද්‍රියං - සනා

2 අධිට්ඨිති -පෙ- සනා,

3. අවිසාහතමානසතා - සනා

'අභිප්පමෝදයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් විඥානය චිත්ත නම. උපස්ථානය සමෘති යැ. අනුපස්සනාව ඥාන යැ. චිත්තය උපස්ථාන වෙයි, සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් එ සිත අනුපස්සනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් එ සිත අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් එ සිත අනුපස්සනා කෙරේ **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'අභිප්පමෝදයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'අභිප්පමෝදයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (2)

**කිසෙයින් 'සිත (අරමුණෙහි) පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සිත පිහිටුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:**

සමාධි කවරැ යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි නම. චිත්තයාගේ යම් (අරමුණෙහි) සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නො විසිර යැමෙක් අවික්ෂෙපයෙක් නො විසුළුසිත් ඇති බවෙක් ශමථයෙක් සමාධින්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද, 'දීඝං' යි කියන ලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි නම ... 'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'සමාදහං චිත්තං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි නම. චිත්තයාගේ යම් (අරමුණෙහි) සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළුසිත් ඇති බවෙක් ශමථයෙක් සමාධින්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද මේ සමාධි නම් වේ.

'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයාගේ වශයෙන් විඥානය චිත්ත නම. උපස්ථානය සමෘති යැ අනුපස්සනාව ඥාන යැ. චිත්තය උපස්ථාන වෙයි, සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් එසිත අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් එසිත අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් එසිත අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (3)

කථං 'විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති.

'රාගතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති, සික්ඛති 'රාගතො විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති, 'දොසතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'දොසතො විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති. සික්ඛති, 'මොහතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති -පෙ- මානතො විමොචයං චිත්තං -පෙ- දිට්ඨියා විමොචයං චිත්තං -පෙ- විචිකිච්ඡාය විමොචයං චිත්තං -පෙ- ථීනතො[1] විමොචයං චිත්තං -පෙ- උද්ධච්චතො විමොචයං චිත්තං- පෙ- අහිරිකතො විමොචයං චිත්තං-පෙ- 'අනොත්තප්පතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'අනොත්තප්පතො විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති, විමොචයං චිත්තං අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං, උපට්ඨානං සති -පෙ-

**අනුපස්සතීති** කථං තං චිත්තං අනුපස්සති. -පෙ- එවං තං චිත්තං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

විමොචයං චිත්තං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- විමොචයං චිත්තං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො, චත්තාරි සුත්තන්තිකවත්ථූනි චිත්තෙ චිත්තානුපස්සනාය.

**තතියචතුක්කං.**

කථං 'අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති: **අනිච්චන්ති** කිං අනිච්චං පඤ්චක්ඛන්ධා අනිච්චා. කෙනට්ඨෙන අනිච්චා, උප්පාදවයට්ඨෙන අනිච්චා. පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති: පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, පඤ්චන්නං ඛන්ධානං උදයබ්බයං පස්සන්තො ඉමානි පඤ්ඤාස ලක්ඛණානි පස්සති.

'රූපෙ අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'රූපෙ අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- 'ජරාමරණෙ අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'ජරාමරණෙ අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

අනිච්චානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති, තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානභාවනා'ති.

---

1 ථීනංතො - මජසං, ථීනමිද්ධතො - සයා, PTS

කිසෙයින් 'සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්: රාගයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'රාගයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'ද්වෙෂයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'ද්වෙෂයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'මොහයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'මානයෙන් සිත මුදමින් ... දෘෂ්ටියෙන් සිත මුදමින් ... විචිකිත්සායෙන් සිත මුදමින් ... ස්ත්‍යානයෙන් සිත මුදමින් ... ඖද්ධත්‍යයෙන් සිත මුදමින් .. අහිරිකයෙන් සිත මුදමින් ... ... අනොත්තප්පයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. අනොත්තප්පයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

'විමොචයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් විඥානය චිත්ත නම්. උපස්ථානය සමෘති යැ ...

**අනුපස්සති** යනු: කිසෙයින් එ සිත අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් එ සිත අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි .. ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'විමොචයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'විමොචයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (4)

සිතෙහි සිත අනුවැ බැලීමෙහි අනුදර්ශිනාඥානයෝ අටදෙනෙක, උපස්ථානානුසමෘතීහු අටදෙනෙක, සෞත්‍රාන්තිකවස්තූහු සතර දෙනෙකි.

### තෘතීයචතුෂ්කය යි.

කිසෙයින් අනිත්‍යානුදර්ශී (අනිත්‍ය අනු වැ බලනසුලු) වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

**අනිච්චං** යනු: අනිත්‍ය කවර යත්: පඤ්චස්කන්ධයෝ අනිත්‍යයහ. කවර අරුතින් අනිත්‍යයහ යත්: උත්පාදව්‍යයසවභාවයෙන් අනිත්‍යයහ. පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දක්නේ ද, ව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දක්නේ ද, උදයව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දක්නේ ද යත්: පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ පස්විසි ලක්ෂණයන් දකී. ව්‍යය දක්නේ පස්විසි ලක්ෂණයන් දකී පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය දක්නේ මේ පනස් ලක්ෂණයන් දකී.

'රූපයෙහි අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'රූපයෙහි අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, වෙදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි .. විඥානයෙහි ... චක්ෂුසෙහි ... 'ජරාමරණයෙහි අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'ජරාමරණයෙහි අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

'අනිච්චානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙති. උපස්ථානය සමෘති යැ අනුපස්සනාව ඥාන යැ. ධර්මයෝ උපස්ථාන ය සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි.. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සතීති** කථං තෙ ධම්මෙ අනුපස්සති: -පෙ- එවං තෙ ධම්මෙ අනුපස්සති, **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

අනිච්චානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- අනිච්චානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, තෙන වුච්චති: 'සමත්තං සුව පටිවිජ්ඣතී'ති. (1)

කථං 'විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති:

රූපෙ ආදීනවං දිස්වා රූපවිරාගෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං 'රූපෙ විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'රූපෙ විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ ආදීනවං දිස්වා ජරාමරණවිරාගෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං, 'ජරාමරණෙ විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'ජරාමරණෙ විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති,

විරාගානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනාඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති, තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තෙ ධම්මෙ අනුපස්සති -පෙ- එවං තෙ ධම්මෙ අනුපස්සති. **භාවනාති**. චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

විරාගානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- විරාගානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්තං සුව පටිවිජ්ඣතී'ති (2)

කථං 'නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති:

රූපෙ ආදීනවං දිස්වා රූපනිරොධෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො[1], චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. 'රූපෙ නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'රූපෙ නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ ආදීනවං දිස්වා ජරාමරණනිරොධෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො,[1] චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං, 'ජරාමරණෙ නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, ජරාමරණෙ නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

1. සද්ධාවිමුත්තො - සී 1

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත් ... මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'අනිච්චානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යෑ ... 'අනිච්චානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි (1)

කිසෙයින් විරාගානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, විරාගානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

රූපයෙහි ආදීනව දක රූපවිරාගයෙහි උපන් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි 'රූපයෙහි විරාගානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි 'රූපයෙහි විරාගානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, වෙදනායෙහි ... සංඥායෙහි- සංස්කාරයන්හි- විඥානයෙහි- චක්ෂුසෙහි ... ජරාමරණයෙහි ආදීනව දක ජරාමරණවිරාගයෙහි උපන් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි, ජරාමරණයෙහි විරාගානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'ජරාමරණයෙහි විරාගානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

විරාගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙති. උපස්ථානය ස්මෘති යෑ, අනුපස්සනාව ඥාන යෑ. ධර්ම උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි. ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි, ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන සවභාවයෙන් භාවනා යි.

'විරාගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යෑ ... 'විරාගානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ප්‍රකට කොට දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි. (2)

කිසෙයින් නිරොධානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, නිරොධානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

රූපයෙහි ආදීනව දක රූපනිරොධයෙහි උපන් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. 'රූපයෙහි නිරොධානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි 'රූපයෙහි නිරොධානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. වෙදනායෙහි ... සංඥායෙහි - සංස්කාරයන්හි - විඥානයෙහි - චක්ෂුසෙහි ... ජරාමරණයෙහි ආදීනව දක ජරාමරණනිරොධයෙහි උපන් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. ජරාමරණයෙහි නිරොධානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ජරාමරණයෙහි නිරොධානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

කතිහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති, කතිහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති: පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති, අට්ඨහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති.

කතමෙහි පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති: අනිච්චට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, දුක්ඛට්ඨෙන අවිජ්ජාය අදීනවො හොති, අනත්තට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, සන්තාපට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, විපරිනාමට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, ඉමෙහි පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති.

කතමෙහි අට්ඨහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති: නිදානනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, සමුදයනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, ජාතිනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, පභවනිරොධෙන[1] අවිජ්ජා නිරුජ්ඣති, හෙතුනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති පච්චයනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, ඤාණුප්පාදෙන අවිජ්ජා නිරුජ්ඣති, නිරොධුපට්ඨානෙන අවිජ්ජා නිරුජ්ඣති. ඉමෙහි අට්ඨහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති.

ඉමෙහි පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවං දිස්වා ඉමෙහි අට්ඨහාකාරෙහි අවිජ්ජානිරොධෙ[2] ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. අවිජ්ජාය 'නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, අවිජ්ජාය නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතිහාකාරෙහි සඞ්ඛාරෙසු ආදීනවො හොති, කතිහාකාරෙහි සඞ්ඛාරා නිරුජ්ඣන්ති: -පෙ- කතිහාකාරෙහි විඤ්ඤාණෙ ආදීනවො හොති, කතිහාකාරෙහි විඤ්ඤාණං නිරුජ්ඣති. -පෙ- කතිහාකාරෙහි නාමරූපෙ ආදීනවො හොති, කතිහාකාරෙහි නාමරූපං නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි සළායතනෙ ආදීනවො හොති, කතිහාකාරෙහි සළායතනං නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි ඵස්සෙ ආදීනවො හොති, කතිහාකාරෙහි ඵස්සො නිරුජ්ඣති-පෙ- කතිහාකාරෙහි වෙදනාය ආදීනවො හොති, කතිහාකාරෙහි වෙදනා නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි තණ්හාය ආදීනවො හොති, කතිහාකාරෙහි තණ්හා නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි උපාදානෙ ආදීනවො හොති, කතිහාකාරෙහි උපාදානං නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි භවෙ ආදීනවො හොති, කතිහාකාරෙහි භවො නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි ජාතියා ආදීනවො හොති, කතිහාකාරෙහි ජාති නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති, කතිහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති: පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති, අට්ඨහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති.

කතමෙහි පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති: අනිච්චට්ඨෙන ජරාමරණෙ ආදීනවො හොති, දුක්ඛට්ඨෙන -පෙ- අනත්තට්ඨෙන -පෙ- සන්තාපට්ඨෙන -පෙ- විපරිනාමට්ඨෙන ජරාමරණෙ ආදීනවො හොති. ඉමෙහි පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති.

---

1 ආහාරනිරොධෙන - ස්‍යා

2 අවිජ්ජනිරොධෙන - ස්‍යා, PTS,

කිහි අයුරෙකින් අවිද්‍යායෙහි ආදීනව වේ ද? කිහි අයුරෙකින් අවිද්‍යාව නිරුද්ධ වේ ද යත්: පස් අයුරෙකින් අවිද්‍යායෙහි ආදීනව වෙයි. අට අයුරෙකින් අවිද්‍යාව නිරුද්ධ වේ.

කවර පස්අයුරෙකින් අවිද්‍යායෙහි ආදීනව වේ ද යත්: අනිත්‍යසවභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. අනාත්මසවභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. සන්තාපසවභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. විපරිණාමසවභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වේ. මේ පස්අයුරින් අවිද්‍යායෙහි ආදීනව වේ.

කවර අටඅයුරෙකින් අවිද්‍යාව නිරුද්ධ වේ ද යත්: මූලප්‍රත්‍යය නිරොධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ආසන්නප්‍රත්‍යය නිරොධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, මූලප්‍රත්‍යයාගේ උත්පත්තිනිරොධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ආසන්නප්‍රත්‍යයාගේ උත්පත්තිනිරොධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ජනක ප්‍රත්‍යය නිරොධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි: උපසථම්භකප්‍රත්‍යය නිරොධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, (විදර්ශනා-මාර්ග) ඥානොත්පාදයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි. නිරොධය එළඹසිටීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි. මේ අට අයුරින් අවිද්‍යාව නිරුද්ධ වේ. මේ පස් අයුරින් අවිද්‍යායෙහි ආදීනව දැක මේ අට අයුරින් අවිද්‍යානිරොධයෙහි හටගත් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. ‘අවිද්‍යාවගේ නිරොධය අනුව බලමින් ආශ්වාස කරන්නෙමි’ හික්මෙයි. ‘අවිද්‍යාවගේ නිරොධය අනුව බලමින් ප්‍රශ්වාස කරන්නෙමි’ හික්මේ.

කිහි අයුරෙකින් ‘සංස්කාරයන්හි ආදීනව වේ ද, කිහි අයුරෙකින් සංස්කාරයෝ නිරුද්ධ වෙත් ද, ... කිහි අයුරෙකින් විඥානයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් විඥානය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් නාමරූපයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් නාමරූපය නිරුද්ධ වේ ද? කිහි අයුරෙකින් සළායතනයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් සළායතනය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් සපර්ශයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් සපර්ශය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් වෙදනායෙහි ආදීනව වේ ද. කිහි අයුරෙකින් වෙදනාව නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් තෘෂ්ණාවගේ ආදීනව වේ ද, කිහි අයුරෙකින් තෘෂ්ණාව නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් උපාදානයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් උපාදානය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් භවයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් භවය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් ජාතියෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් ජාතිය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් ජරාමරණයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් ජරාමරණය නිරුද්ධ වේ ද යත්: පස් අයුරෙකින් ජරාමරණයෙහි ආදීනව වෙයි. අට අයුරෙකින් ජරාමරණය නිරුද්ධ වේ.

කවර පස් අයුරින් ජරාමරණයෙහි ආදීනව වේ ද යත්: අනිත්‍ය සවභාවයෙන් ජරාමරණයෙහි ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්ම සවභාවයෙන් ... සන්තාපසවභාවයෙන් ... විපරිණාමසවභාවයෙන් ජරාමරණයෙහි ආදීනව වෙයි. මේ පස් අයුරින් ජරාමරණයෙහි ආදීනව වේ.

කතමෙහි අට්ඨහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති: නිදානනිරොධෙන ජරාමරණං නිරුජ්ඣති, සමුදයනිරොධෙන -පෙ- ජාතිනිරොධෙන -පෙ- පභවනිරොධෙන[1] -පෙ- හෙතුනිරොධෙන -පෙ- පච්චයනිරොධෙන -පෙ- ඤාණුප්පාදෙන -පෙ- නිරොධුපට්ඨානෙන ජරාමරණං නිරුජ්ඣති. ඉමෙහි අට්ඨහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති.

ඉමෙහි පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවං දිස්වා ඉමෙහි අට්ඨහාකාරෙහි ජරාමරණනිරොධෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො,[2] චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං, 'ජරාමරණෙ නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, ජරාමරණෙ නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

නිරොධානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති. තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තෙ ධම්මෙ අනුපස්සති -පෙ- එවං තෙ ධම්මෙ අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

නිරොධානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- නිරොධානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

කථං 'පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති:

**පටිනිස්සග්ගාති** ද්වෙ පටිනිස්සග්ගා: පරිච්චාගපටිනිස්සග්ගො ච, පක්ඛන්දනපටිනිස්සග්ගො ච. 'රූපං පරිච්චජතී'ති පරිච්චාගපටිනිස්සග්ගො 'රූපනිරොධෙ නිබ්බානෙ චිත්තං පක්ඛන්දතී'ති පක්ඛන්දනපටිනිස්සග්ගො, රූපෙ පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, රූපෙ 'පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- 'ජරාමරණං පරිච්චජතී'ති පරිච්චාගපටිනිස්සග්ගො, 'ජරාමරණනිරොධෙ නිබ්බානෙ චිත්තං පක්ඛන්දතී'ති පක්ඛන්දනපටිනිස්සග්ගො.

'ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති. තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

---

1. භවනිරොධෙන - ස්‍යා, සී 1
2. සද්ධාවිමුත්තො - සී 1.

**කවර අට අයුරින් ජරාමරණය නිරුද්ධ වේ ද** යත්: නිදානනිරොධයෙන් ජරාමරණය නිරුද්ධ වෙයි. සමුදයනිරොධයෙන් ... ජාතිනිරොධයෙන් ... පභවනිරොධයෙන් ... හෙතුනිරොධයෙන් ... ප්‍රත්‍යයනිරොධයෙන් ... ඥානොත්පාදයෙන් ... නිරොධය එළඹසිටීමෙන් ජරාමරණය නිරුද්ධ වෙයි. මේ අට අයුරින් ජරාමරණය නිරුද්ධ වේ. මේ පස් අයුරින් ජරාමරණයෙහි ආදීනව දැක මේ අට අයුරින් ජරාමරණනිරොධයෙහි හටගත් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. 'ජරාමරණයෙහි නිරොධය අනුවැ බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ජරාමරණයෙහි නිරොධය අනුවැ බලමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'නිරොධානුපස්සී'යි කියන ලද ආශ්වාස-ප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙයි. උපස්ථානය සමෘති යැ අනුපස්සනාව ඥාන යැ. ධර්ම උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි. 'ධම්මෙසු ධම්මානුපස්සනා-සතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනස්වභාවයෙන් භාවනා යි. 'නිරොධානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් සංවර ස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'නිරොධානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ප්‍රකට කොට දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි. සමන්තචක්ඛු පටිවිජ්ඣතී'යි.

කිසෙයින් 'පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්: **පටිනිස්සග්ගා** යනු: ප්‍රතිනිඃසර්ගයෝ දෙදෙනෙකි: පරිත්‍යාගප්‍රතිනිඃසර්ග යැ, ප්‍රස්කන්දනප්‍රතිනිඃසර්ග යැ යි. රූපය පරිත්‍යාග කෙරේ නු යි පරිත්‍යාග ප්‍රතිනිඃසර්ග වෙයි. රූපනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි චිත්තය ප්‍රස්කන්දනය කෙරේ නු යි ප්‍රස්කන්දනප්‍රතිනිඃසර්ග වෙයි. 'රූපයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'රූපයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ෂුෂ ... ජරාමරණය පරිත්‍යාග කෙරේ නු යි පරිත්‍යාගප්‍රතිනිඃසර්ග වෙයි, ජරාමරණනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි චිත්තය ප්‍රස්කන්දන කෙරේ නු යි ප්‍රස්කන්දනප්‍රතිනිඃසර්ග වෙයි. 'ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. පටිනිස්සග්ගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාස-යන්ගේ වශයෙන් ධර්මයෝ වෙති. උපස්ථානය සමෘති යැ, අනුපස්සනාව ඥාන යැ, ධර්ම උපස්ථාන වෙයි. සමෘති නො වෙයි සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි. 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨාන භාවනා'යි.

**අනුපස්සතීති** කථං තෙ ධම්මෙ අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං තෙ ධම්මෙ අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි, යො තත්ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා. යො තත්ථ අවික්ඛෙපට්ඨො, අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො, අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති, බලානි සමොධානෙති, බොජ්ඣඞ්ගෙ සමොධානෙති, මග්ගං සමොධානෙති, ධම්මෙ සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

**ඉන්ද්‍රියානි සමොධානෙතීති** කථං ඉන්ද්‍රියානි සමොධානෙති: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං සමොධානෙති -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො, චත්තාරි සුත්තන්තිකවත්ථූනි ධම්මෙසු ධම්මානුපස්සනාය.

ඉමානි බත්තිංස සතොකාරිස්ස ඤාණානි.

**චතුත්ථ චතුක්කං.**

**සතොකාරිඤාණ නිද්දෙසො.**

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. නිත්‍ය හෙයින් අනුපස්සනා නො කෙරෙයි. ... පරිත්‍යාග කෙරෙයි. ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුපස්සනා කරනුයේ නිත්‍යසංඥව දුරු කෙරෙයි ... පරිත්‍යාග කරනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි **භාවනා** යනු: භාවනා සතරෙකි: ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධ (සමාධි-ප්‍රඥ) ධර්මයන්ගේ නො ඉක්ම පවත්නා සවභාවයෙන් භාවනා යෑ ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'පටිනිස්සග්ගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යෑ අවික්ෂෙපසවභාවයෙන් චිත්තවිශුද්ධි යෑ දර්ශනසවභාවයෙන් දෘෂ්ටිවිශුද්ධි යෑ, එහි යම් සංවරසවභාවයෙක් වේ ද මේ අධිශීලශික්ෂා යෑ, එහි යම් අවික්ෂෙපසවභාවයෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා, යෑ එහි යම් දර්ශනසවභාවයෙක් වේ ද මේ අධිප්‍රඥශික්ෂා යි. මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කරන්නේ හික්මෙයි දන්නේ හික්මෙයි. ... සාක්ෂාත්-කර්තව්‍යය සාක්ෂාත් කරන්නේ හික්මේ.

'පටිනිස්සග්ගානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති, ප්‍රකට කොට දන්නාලද්දාහු වටහති· ප්‍රකට කොට දන්නා ලද්දාහු අස්තයට යති ... 'පටිනිස්සග්ගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. ගොචරය ද ප්‍රකට කොට දැනගනී. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරෙයි. බලයන් සමවධාන කෙරෙයි. බොධ්‍යඞ්ගයන් සමවධාන කෙරෙයි. මාර්ගය සමවධාන කෙරෙයි. ධර්මයන් සමවධාන කෙරෙයි. ගොචරය ද ප්‍රකට කොට දැනගනී· ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

**ඉන්ද්‍රියානි සමොධානෙති** යනු: කිසෙයින් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, යත්: අධිමොක්ෂසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

ධර්මයන්හි ධර්මානුදර්ශනායෙහි අනුදර්ශනාඥනයෝ අටදෙනෙක උපස්ථානානුසමෘතීහු ද අට දෙනෙක, සෞත්‍රාන්තිකවස්තූහු සතර දෙනෙකි·

මොහු සතොකාරීහුගේ දෙතිස් ඥනයෝ යි.

චතුර්ථ චතුෂ්කය යි.

**සතොකාරීඥනනිර්දේශය නිමි.**

## 3 - 6, 11. ඤාණරාසිඡක්කං

(6) කතමානි චතුවීසති සමාධිවසෙන ඤාණානි:

දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි -පෙ- විමොචයං චිත්තං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, විමොචයං චිත්තං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි.

ඉමානි චතුවීසති සමාධිවසෙන ඤාණානි.

(7) කතමානි ද්වෙසත්තති විපස්සනාවසෙන ඤාණානි:

දීඝං අස්සාසං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දීඝං පස්සාසං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා -පෙ- විමොචයං චිත්තං අස්සාසං -පෙ- විමොචයං චිත්තං පස්සාසං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා.

ඉමානි ද්වෙසත්තති විපස්සනාවසෙන ඤාණානි.

(8) කතමානි අට්ඨ නිබ්බිදාඤාණානි:

අනිච්චානුපස්සී අස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං, අනිච්චානුපස්සී පස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං.

ඉමානි අට්ඨ නිබ්බිදාඤාණානි.

(9) කතමානි අට්ඨ නිබ්බිදානුලොමෙ ඤාණානි.

අනිච්චානුපස්සී අස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං, අනිච්චානුපස්සී පස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං.

ඉමානි අට්ඨ නිබ්බිදානුලොමෙ ඤාණානි.

## 3 - 6, 11. ඥානරාශිෂට්ක

සමාධිවශයෙන් සූවිසි ඥානයෝ කවරහ යත්:

'දීඝං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ ... 'විමොචයං චිත්තං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ 'විමොචයං චිත්තං'යි කියනලද ප්‍රශ්වාසයා ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යි.

මොහු සමාධි වශයෙන් සූවිසි ඥානයෝ යි. (1)

විදර්ශනා වශයෙන් දෙසැත්තෑ ඥානයෝ කවරහ යත්:

දීඝි වූ ආශ්වාසය අනිත්‍ය හෙයින් අනුදර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ දුඃඛ හෙයින් අනුදර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ අනාත්ම හෙයින් අනු- දර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ දීඝි වූ ප්‍රශ්වාසය අනිත්‍ය හෙයින් අනු- දර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ දුඃඛ හෙයින් අනුදර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ අනාත්ම හෙයින් අනුදර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ... සිත මුදමින් ආශ්වාසය ... සිත මුදමින් ප්‍රශ්වාසය අනිත්‍ය හෙයින් අනුදර්ශනා ස්වභාවයෙන් විදර්ශනා යැ දුඃඛ හෙයින් අනුදර්ශනාස්වභාවයෙන් විදර්ශනා යැ අනාත්ම හෙයින් අනුදර්ශනාස්වභාවයෙන් විදර්ශනා යි.

මොහු විදර්ශනා වශයෙන් දෙසැත්තෑ ඥානයෝ යි. (2)

අෂ්ටනිර්වේදඥනයෝ කවරහ යත්:

අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥන යැ අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාසය කරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥන යැ ... ප්‍රතිනිඃසර්ගානුදර්ශී වැ ආශ්වාසකරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥන යැ ප්‍රතිනිඃසර්ගානු දර්ශීවැ ප්‍රශ්වාස කරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥන යි.

මොහු අෂ්ට නිර්වේදඥනයෝ යි. (3)

අෂ්ටනිර්වේදානුලොමඥනයෝ කවරහ යත්:

අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥව නිර්වේදානුලොමඥන යැ අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥව නිර්වේදානුලොමඥන යැ ... පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥව නිර්වේදානුලොම- ඥන යැ පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥව නිර්වේදානුලොමඥන යි.

මොහු අෂ්ට නිර්වේදානුලොමඥනයෝ යි. (4)

(10) කතමානි අට්ඨ නිබ්බිදාපටිප්පස්සද්ධි ඤාණානි:

අනිච්චානුපස්සී අස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං, අනිච්චානුපස්සී පස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං.

ඉමානි අට්ඨ නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණානි.

(11) තතමානි එකවීසති විමුත්තිසුඛෙ ඤාණානි:

සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨියා පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, විචිකිච්ඡාය පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, සීලබ්බතපරාමාසස්ස -පෙ- දිට්ඨානුසයස්ස -පෙ- විචිකිච්ඡානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, සකදාගාමිමග්ගෙන ඔළාරිකස්ස කාමරාගසඤ්ඤොජනස්ස -පෙ- පටිඝසඤ්ඤොජනස්ස -පෙ- ඔළාරිකස්ස කාමරාගානුසයස්ස, පටිඝානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, අනාගාමිමග්ගෙන අනුසහගතස්ස කාමරාගසඤ්ඤොජනස්ස -පෙ- පටිඝසඤ්ඤොජනස්ස, අනුසහගතස්ස කාමරාගානුසයස්ස, පටිඝානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, අරහත්තමග්ගෙන රූපරාගස්ස -පෙ- අරූපරාගස්ස, මානස්ස, උද්ධච්චස්ස, අවිජ්ජාය මානානුසයස්ස, භවරාගානුසයස්ස, අවිජ්ජානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං.

ඉමානි එකවීසති විමුත්තිසුඛෙ ඤාණානි.

සොළසවත්ථුකං ආනාපානසතිසමාධිං භාවයතො සමධිකානි ඉමානි ද්වෙ ඤාණසතානි උප්පජ්ජන්ති.

**ආනාපානසතිකථා සමත්තා.**

නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥානයෝ අටදෙන කවරහ යත්:

අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥාව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වෙයි, අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥාව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වෙයි, පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥාව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වෙයි, පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥාව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වේ.

මොහු නිර්වේදඥානයෝ අටදෙන වෙත්. (5)

එක්විසි විමුක්තිසුඛඥානයෝ කවරහ යත්:

ස්‍රොතාපත්තිමාර්ගයෙන් සත්කායදෘෂ්ටිය පුහුන් බැවින් මූලුසුන් කරන ලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. විචිකිත්සාව පුහුන් බැවින් මූලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. ශීලව්‍රතපරාමර්ශය ... දෘෂ්ට්‍යනුශය විචිකිත්සානුශය පුහුන් බැවින් මූලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරිකකාමරාගසංයොජනය ... ප්‍රතිඝසංයෝජනය ඖදාරික වූ කාමරාගානුශය ප්‍රතිඝානුශය පුහුන් බැවින් මූලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. අනාගාමිමාර්ගයෙන් අනුසහගත වූ කාමරාගසංයොජනය...ප්‍රතිඝසංයොජනය අනුසහගත වූ කාමරාගානුශය ප්‍රතිඝානුශය පුහුන් බැවින් මූලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. අර්හත්මාර්ගයෙන් රූපරාගය .. අරූපරාගය මානය ඖද්ධත්‍යය අවිද්‍යාව මානානුශය භවරාගානුශය අවිද්‍යානුශය පුහුන් බැවින් මූලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී.

මොහු එක්විසි විමුක්තිඥානයෝ යි.

ෂොඩශවස්තුක වූ ආනාපානසතිසමාධිය වඩන්නාහට සාධක වූ මේ ඥානයෝ දෙසියදෙන උපදිත්.

ආනාපානසමෘතිකථා නිමි

# 4

# ඉන්ද්‍රිය කථා.

## 4 - 1. පඨමසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ හගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි, කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි.

ඉමානි පඤ්චින්ද්‍රියානි කතිහාකාරෙහි විසුජ්ඣන්ති: ඉමානි පඤ්චින්ද්‍රියානි පන්නරසහි ආකාරෙහි විසුජ්ඣන්ති. අස්සද්ධෙ පුග්ගලෙ පරිවජ්ජයතො, සද්ධෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, පසාදනීයෙ සුත්තන්තෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි සද්ධින්ද්‍රියං විසුජ්ඣති.

කුසීතෙ පුග්ගලෙ පරිවජ්ජයතො, ආරද්ධවිරියෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, සම්මප්පධානෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි විරියින්ද්‍රියං විසුජ්ඣති.

මුට්ඨස්සතී පුග්ගලෙ පරිවජ්ජයතො, උපට්ඨිතසතී[2], පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, සතිපට්ඨානෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි සතින්ද්‍රියං විසුජ්ඣති.

අසමාහිතෙ පුග්ගලෙ පරිවජ්ජයතො, සමාහිතෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, ඣානවිමොක්ඛෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි සමාධින්ද්‍රියං විසුජ්ඣති.

දුප්පඤ්ඤෙ පුග්ගලෙ පරිවජ්ජයතො, පඤ්ඤවන්තෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, ගම්භීරඤාණචරියං පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි පඤ්ඤින්ද්‍රියං විසුජ්ඣති.

ඉති ඉමෙ පඤ්ච පුග්ගලෙ පරිවජ්ජයතො, පඤ්ච පුද්ගලෙ සෙවතො භාජතො පයිරුපාසතො, පසාදනීයෙ සුත්තන්තෙ[3] පච්චවෙක්ඛතො, ඉමෙහි පන්නරසහි ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි විසුජ්ඣන්ති.

කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති[4], කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනා හොති: දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති,[4] දසහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනා හොති.

---

1. විරිඉන්ද්‍රියං - මජසං.
2. උපට්ඨිතානසති - මජසං, සහා
3. පඤ්ච සුත්තන්තක්ඛන්ධෙ - මජසං, සහා
4. භාවියන්ති - මජසං, සහා.

# 4

# ඉන්ද්‍රියකථා

## 4 – 1. ප්‍රථම සූත්‍රය

"මා විසින් මෙසේ අසනලද නොහොත් මා ගේ ඇසීම මෙසේ යි. කෙසේ ද යත්: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඩුසිටුහුගේ අරමෙහි වාසය කරන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ ඉන්ද්‍රියසූත්‍රය වදාළ සේක.

මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස් දෙනෙක. කවර පස්දෙනෙක් ද යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි. මහණෙනි, මොහු පඤ්චෙන්ද්‍රියයෝ යි.

මේ පඤ්චෙන්ද්‍රියයෝ කිහි අයුරෙකින් විශුද්ධ වෙත් ද යත්: මේ පඤ්චෙන්ද්‍රියයෝ පසළොස් අයුරෙකින් විශුද්ධ වෙති. ශ්‍රද්ධා නැති පුද්ගලයන් දුරුලන්නාහට ශ්‍රද්ධා ඇති පුද්ගලයන් සෙවුනාහට භජනය කරන්නාහට පයර්‍යුපාසනය කරන්නාහට ප්‍රසාද එළවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් ශ්‍රද්ධෙන්ද්‍රියය විශුද්ධ වෙයි.

කුසීදපුද්ගලයන් දුරුලන්නාහට, ආරබ්ධවීර්‍ය්‍ය පුද්ගලයන් සෙවන-භජන-පයර්‍යුපාසන කරන්නාහට, සම්‍යක්ප්‍රදහනයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් වීර්‍ය්‍යෙන්ද්‍රියය විශුද්ධ වෙයි.

මුළාසිහි ඇති පුද්ගලයන් දුරුලන්නාහට, එළඹසිටි සිහි ඇති පුද්ගලයන් සෙවන-භජන-පයර්‍යුපාසන කරන්නාහට, සිව්වටන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් ස්මෘතීන්ද්‍රියය විශුද්ධ වෙයි.

අසමාහිත පුද්ගලයන් දුරුලන්නාහට, සමාහිතපුද්ගලයන් සෙවන-භජන-පයර්‍යුපාසන කරන්නාහට, ධ්‍යාන-විමොක්ෂයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් සමාධීන්ද්‍රිය විශුද්ධ වෙයි.

ප්‍රඥා නැති පුද්ගලයන් දුරුලන්නාහට, ප්‍රඥා ඇති පුද්ගලයන් සෙවන-භජන-පයර්‍යුපාසන කරන්නාහට, ගම්භීරඥානචර්‍ය්‍යා ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට මේ තුන් අයුරින් ප්‍රඥෙන්ද්‍රියය විශුද්ධ වෙයි.

මෙසෙයින් මේ පඤ්චපුද්ගලයන් දුරුලන්නාහට පඤ්චපුද්ගලයන් සෙවන-භජන-පයර්‍යුපාසන කරන්නාහට පඤ්චසූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට මේ පසළොස් අයුරින් මේ පඤ්චෙන්ද්‍රියයෝ විශුද්ධ වෙත්.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනුලැබෙත් ද කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනාව වේ ද යත්: දසඅයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනු ලැබෙති. දසඅයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනාව වෙයි.

අස්සද්ධියං පජහන්තො සද්ධින්ද්‍රියං භාවෙති, සද්ධින්ද්‍රියං භාවෙන්තො අස්සද්ධියං පජහති. කොසජ්ජං පජහන්තො විරියින්ද්‍රියං භාවෙති, විරියින්ද්‍රියං භාවෙන්තො කොසජ්ජං පජහති. පමාදං පජහන්තො සතින්ද්‍රියං භාවෙති, සතින්ද්‍රියං භාවෙන්තො පමාදං පජහති. උද්ධච්චං පජහන්තො සමාධින්ද්‍රියං භාවෙති, සමාධින්ද්‍රියං භාවෙන්තො උද්ධච්චං පජහති. අවිජ්ජං පජහන්තො පඤ්ඤින්ද්‍රියං භාවෙති, පඤ්ඤින්ද්‍රියං භාවෙන්තො අවිජ්ජං පජහති.

ඉමෙහි දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවියන්ති, ඉමෙහි දසහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනා හොති.

කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි: දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි.

අස්සද්ධියස්ස පහීනත්තා සුප්පහීනත්තා සද්ධින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, සද්ධින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා අස්සද්ධියං පහීනං හොති සුප්පහීනං, කොසජ්ජස්ස පහීනත්තා සුප්පහීනත්තා විරියින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, විරියින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා කොසජ්ජං පහීනං හොති සුප්පහීනං, පමාදස්ස පහීනත්තා සුප්පහීනත්තා සතින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, සතින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා පමාදො පහීනො හොති සුප්පහීනො, උද්ධච්චස්ස පහීනත්තා සුප්පහීනත්තා සමාධින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, සමාධින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා උද්ධච්චං පහීනං හොති සුප්පහීනං, අවිජ්ජාය පහීනත්තා සුප්පහීනත්තා පඤ්ඤින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, පඤ්ඤින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා අවිජ්ජා පහීනා හොති සුප්පහීනා.

ඉමෙහි දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි.

කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවියන්ති,[1] කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච: චතුහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවියන්ති, චතුහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

සොතාපත්තිමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, සොතාපත්තිඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච,[2] පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච, සකදාගාමිමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, සකදාගාමිඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච, අනාගාමිමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, අනාගාමිඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච, අරහත්තමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, අරහත්තඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

---

1 භාවියන්ති - මජසං, ස්‍යා

2. සුභාවිතානි - සී 1, 2,

ශ්‍රද්ධා නැති බව දුරලනුයේ ශ්‍රද්ධෙන්ද්‍රියය වඩයි. ශ්‍රද්ධෙන්ද්‍රියය වඩනුයේ ශ්‍රද්ධා නැති බව දුරලයි. කුසීද බව දුරලනුයේ වීය්‍ර්‍යෙන්ද්‍රියය වඩයි. වීය්‍ර්‍යෙන්ද්‍රියය වඩනුයේ කුසීද බව දුරලයි. ප්‍රමාදය දුරලනුයේ සමෘතීන්ද්‍රියය වඩයි, සමෘතීන්ද්‍රියය වඩනුයේ ප්‍රමාදය දුරලයි. උද්ධතභාවය දුරලනුයේ සමාධීන්ද්‍රියය වඩයි. සමාධීන්ද්‍රියය වඩනුයේ උද්ධතභාවය දුරලයි. අවිද්‍යාව දුරලනුයේ ප්‍රඥෙන්ද්‍රියය වඩයි. ප්‍රඥෙන්ද්‍රියය වඩනුයේ අවිද්‍යාව දුරලයි.

මේ දස අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. මේ දස අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනාව වේ.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලද්දාහු මොනොවට වඩනා ලද්දාහු වෙත් ද යත්: දස අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු මොනොවට වඩනාලද්දාහු වෙති.

ශ්‍රද්ධා නැති බව ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීන බැවින් ශ්‍රද්ධෙන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනාලද්දේ වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනාලද බැවින් ශ්‍රද්ධා නැති බව ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි. කුසීද බව ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් වීය්‍ර්‍යෙන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනා ලද්දේ වෙයි. වීය්‍ර්‍යෙන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනාලද බැවින් කුසීද බව ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි. ප්‍රමාදය ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් සමෘතීන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනාලද්දේ වෙයි. සමෘතීන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනා ලද බැවින් ප්‍රමාදය ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි. උද්ධතභාවය ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් සමාධීන්ද්‍රිය වඩනා ලද්දේ මොනොවට වඩනාලද්දේ වෙයි. සමාධීන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනාලද බැවින් උද්ධතභාවය ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි අවිද්‍යාව ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් ප්‍රඥෙන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනා ලද්දේ වෙයි. ප්‍රඥෙන්ද්‍රියය වඩනාලද බැවින් මොනවට වඩකාලද බැවින් අවිද්‍යාව ප්‍රහීණ වූවා මොනොවට ප්‍රහීණ වූවා වෙයි.

මේ දශ අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලද්දාහු මොනොවට වඩනා ලද්දාහු වෙත්.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙත් ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනා ලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති යත්: සියු අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. සියුඅයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලද්දාහු ද මොනොවට වඩනා ලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති.

ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. ස්‍රොතාපත්තිඵලක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනා ලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති. සකෘදාගාමි මාර්ගක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. සකෘදාගාමිඵලක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්සිඳුනහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති. අනාගාමිමාර්ගක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලැබෙති. අනාගාමිඵලක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්හිඳුනාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති. අර්හත්මාර්ගක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. අර්හත්ඵලක්‍ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙත්.

ඉති චතස්සො මග්ගවිසුද්ධියො, චතස්සො ඵලවිසුද්ධියො, චතස්සො සමුච්ඡෙදවිසුද්ධියො, චතස්සො පටිප්පස්සද්ධිවිසුද්ධියො. ඉමෙහි චතූහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භවීයන්ති, ඉමෙහි චතූහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

කතිනං[1] පුග්ගලානං ඉන්ද්‍රියභාවනා. කති පුග්ගලා භාවිතින්ද්‍රියා. අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා, තයො පුග්ගලා භාවිතින්ද්‍රියා.

කතමෙසං අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා: සත්තන්නඤ්ච සෙක්ඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච[2] ඉමෙසං අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා, කතමෙ තයො පුග්ගලා භාවිතින්ද්‍රියා: සවනෙන බුද්ධො[3] තථාගතස්ස සාවකො[4] ඛීණාසවො භාවිතින්ද්‍රියො, සයං භූතට්ඨෙන[5] පච්චෙකබුද්ධො[6] භාවිතින්ද්‍රියො, අප්පමෙය්‍යට්ඨෙන තථාගතො අරහං සම්මාසම්බුද්ධො භාවිතින්ද්‍රියො. ඉමෙ තයො පුග්ගලා භාවිතින්ද්‍රියා.

ඉති ඉමෙසං අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා, ඉමෙ තයො පුග්ගලා භාවිතින්ද්‍රියා.

**පඨමසුත්තනිද්දෙසො.**

# 4 - 2. දුතියසුත්තං

[සාවත්ථිනිදානං.]

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං.

යෙ හි කෙචි[7] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච අදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, නමෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, න ච පන තෙ[8] ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා[9] බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි[10] භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, තෙ ඛො මෙ[11] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, තෙ ච පනායස්මන්තො[12] සාමඤ්ඤත්ථං වා[13] බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තී'ති.

---

1. කතිනං - මජසං, ස්‍යා  2. පුථුජ්ජනස්ස ච කල්‍යාණකස්ස - සී 1
3. භාවිතින්ද්‍රියවසෙන බුද්ධොති - ස්‍යා, සී 1, 2,  4. තථාගතසාවකො - ස්‍යා
5. සයම්භූඤාණෙන - සී 1.  6 පච්චෙකසම්බුද්ධො - මජසං, පච්චෙකබුද්ධා - සී 1, 2.
7. යො හි කොචි - සී 2,  8. න ච පනෙතෙ - මජසං,
9. සාමඤ්ඤත්ථං - සී. 1  10. යෙ කෙචි ඛො - ස්‍යා
11. තෙ ඛො - සී. 1  12. පනායස්මන්තා - මජසං, ස්‍යා
13. සාමඤ්ඤත්ථඤ්ච - මජසං ස්‍යා

මෙසෙයින් මාර්ගවිශුද්ධි සතරෙක, ඵලවිශුද්ධි සතරෙක, සමුච්ඡේද විශුද්ධි සතරෙක, ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිශුද්ධි සතරෙකි. මේ සියු අයුරින් පඤ්චේන්ද්‍රියයෝ වඩනාලැබෙති. මේ සියු අයුරින් පඤ්චේන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙත්.

කෙනෙක් පුද්ගලයනට ඉන්ද්‍රියභාවනා වේ ද, කෙනෙක් පුද්ගලයෝ භාවිතඉන්ද්‍රිය ඇත්තාහු වෙත් ද යත්: පුද්ගලයන් අටදෙනකුන්හට ඉන්ද්‍රිය භාවනා වෙයි. පුද්ගලයෝ තිදෙනෙක් භාවිතඉන්ද්‍රිය ඇත්තාහු වෙති.

කවර පුද්ගලයන් අටදෙනෙකුන්හට ඉන්ද්‍රියභාවනා වේ ද යත්: සප්තශෛක්ෂයනට ද පෘථග්ජනකල්‍යාණකහට ද යි මේ පුද්ගලයන් අටදෙනාහට ඉන්ද්‍රියභාවනා වෙයි. කවර පුද්ගලයෝ තිදෙනෙක් භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු ද, යත්: ශ්‍රවණයෙන් චතුසසත්‍යාවබෝධය කළා වූ තථාගතශ්‍රාවක වූ ක්ෂීණාස්‍රව තෙමේ භාවිත ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. තමා මැ ආයතිජාතියෙහි ජාතසවභාවයෙන් පසේබුදුහු භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙති. අප්‍රමෙය සවභාවයෙන් තථාගත වූ අර්හත් වූ සම්මාසම්බුදුහු භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්. මේ පුද්ගලයෝ තිදෙන භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්. මෙසෙයින් මේ පුද්ගලයන් අටදෙනාහට ඉන්ද්‍රියභාවනා වෙයි. මේ තුන් පුද්ගලයෝ භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්.

**ප්‍රථම සූත්‍රාන්තනිර්දේශ යි.**

## 4 – 2. ද්විතීයසූත්‍රය

**[සාවත්ථිනිදාන යි]**

මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්යෙන්ද්‍රිය යැ සමෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පඤ්චේන්ද්‍රියයන්ගේ සමුදය (ප්‍රත්‍යය)ත් අස්තඞ්ගමයත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් යථාසවභාවයෙන් නො දනිත් ද, මහණෙනි, මා විසින් ඒ මහණහු වේවයි බමුණහු වේවයි ශමිතපාපී ශ්‍රමණයන් කෙරෙහි හෝ 'ශ්‍රමණ යැ'යි සම්මතයෝ නො වෙති. බාහිතපාපී බ්‍රාහමණයන් කෙරෙහි හෝ 'බ්‍රාහමණ යැ'යි සම්මතයෝ නො වෙති. තවද තෙල ආයුෂමත්හු ශ්‍රමණභාවාර්ථය හෝ බ්‍රාහමණභාවාර්ථය හෝ මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ නො ද වාසය කෙරෙති.

තවද මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහමණ කෙනෙක් හෝ මේ පඤ්චේන්ද්‍රියයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආසවාදයත් ආදීනවයත් නිස්සරණයත් යථාසවභාවයෙන් දැනගනිත් ද, මහණෙනි, මා විසින් වැළිත් ඒ මහණහු වේවයි බමුණහු වේවයි (ශමිතපාපී) ශ්‍රමණයන් කෙරෙහි 'ශ්‍රමණ යැ'යි සම්මතයෝ වෙති. (බාහිතපාපී) බ්‍රාහමණයන් කෙරෙහි 'බ්‍රාහමණ යැ'යි සම්මතයෝ වෙති. තවද තෙල ආයුෂමත්හු ශ්‍රමණභාවාර්ථය ද බ්‍රාහමණභාවාර්ථය ද මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙරෙත් යයි.

කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයං පජානාති. කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදං පජානාති, කති-හාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවං පජානාති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං හොති. කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං පජානාති:

චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයො හොති, චත්තාරීසාය ආකාරෙහි සමුදයං පජානාති. චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමො හොති. චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති. පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදො හොති, පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදං පජානාති, පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවො හොති, පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවං පජානාති, අසීතිසතං ආකාරෙහි[1] පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං හොති, අසීතිසතං ආකාරෙහි[1] පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං පජානාති.

කතමෙහි චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයො හොති, කතමෙහි චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයං පජානාති:

අධිමොක්ඛත්ථාය ආවජ්ජනාය සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, අධිමොක්ඛවසෙන ඡන්දස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, අධි-මොක්ඛවසෙන මනසිකාරස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහත්ථාය ආවජ්ජනාය සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහ-වසෙන ඡන්දස්ස සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, විරියින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං විරියින්ද්‍රියස්ස සමුදයො හොති. උපට්ඨානත්ථාය ආවජ්ජනාය සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපත්ථාය ආවජ්ජනාය සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනත්ථාය ආවජ්ජනාය සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන ඡන්දස්ස සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන මනසිකාරස්ස සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති.

1. අසීතිසතාකාරෙහි - සයා, අසීතිසතආකාරෙහි - සී 1.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී ද යත්:

සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වෙයි, සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී. සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වෙයි, සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී. පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය වෙයි, පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී. පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වෙයි, පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී. එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වෙයි. එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී.

කවර සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වේ ද, කවර සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී ද යත්:

අධිමොක්ෂය (ශ්‍රද්ධාව) පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (ඡන්දසම්ප්‍රයුක්ත) අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි, අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලම්බයෙන් සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (ඡන්දසම්ප්‍රයුක්ත) ප්‍රග්‍රහයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි (අරමුණට) එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (අරමුණට) එළඹසිටීම් වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (අරමුණට) එළඹසිටීම් වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි අවික්ෂෙපයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්ශනයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි දර්ශනයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි.

අධිමොක්ඛට්ඨාය ආවජ්ජනාය සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහට්ඨාය ආවජ්ජනාය සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානට්ඨාය ආවජ්ජනාය සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපට්ඨාය ආවජ්ජනාය සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනට්ඨාය ආවජ්ජනාය සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, අධිමොක්ඛවසෙන ඡන්දස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන ඡන්දස්ස සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන ඡන්දස්ස සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති.

අධිමොක්ඛවසෙන මනසිකාරස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන මනසිකාරස්ස සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, විරියින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං විරියින්ද්‍රියස්ස සමුදයො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සතින්ද්‍රියස්ස සමුදයො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති.

ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයො හොති, ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයං පජානාති.

කතමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමො හොති, කතමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති:

අධිමොක්ඛට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අධිමොක්ඛවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අධිමොක්ඛවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං[1], සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

පග්ගහට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, විරියින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

1 එකත්තං අනුපට්ඨානං - සයා.

අධිමොක්‍ෂය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්ත-යාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අරමුණට එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්‍ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය සමාධීන්ද්‍රි-යට ප්‍රත්‍යය වෙයි. දර්‍ශනය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අධිමොක්‍ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි ප්‍රග්‍රහවශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් ධර්මච්ඡන්දයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්‍ෂෙපයාගේ වශයෙන් ධර්මච්ඡන්දයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්‍ශනයාගේ වශයෙන් ධර්මච්ඡන්දයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි.

අධිමොක්‍ෂයාගේ වශයෙන් මනසිකාරයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහවශයෙන් මනසිකාරයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් මනසිකාරයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. අවික්‍ෂෙපයාගේ වශයෙන් මනසිකාරයාගේ සමුදය සමාධීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. දර්‍ශනයාගේ වශයෙන් මනසිකාරයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බන-යෙහි අචලභාවයෙන් සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ස්මෘතීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම සමාධීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ප්‍රඥෙන්ද්‍රියයට ප්‍රත්‍යය වේ.

මේ සතළිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වෙයි. මේ සතළිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී.

කවර සතළිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වේ ද, කවර සතළිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී ද යත්:

අධිමොක්‍ෂය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අස්තඞ්ගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. අධිමොක්‍ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අස්තඞ්ගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. අධි-මොක්‍ෂයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ අස්තඞ්ගමය ශ්‍රද්ධෙන්ද්‍රිය-යාගේ අස්තඞ්ගමය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි.

ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අස්තඞ්ගමය වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ප්‍රග්‍රහ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අස්තඞ්ගමය වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ප්‍රග්‍රහ වශයෙන් පැවැති මනසිකාරයාගේ අස්තඞ්ගමය වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රි-යයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි.

උපට්ඨානට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො, සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අවික්ඛෙපට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

දස්සනට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අධිමොක්ඛට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අධිමොක්ඛවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අධිමොක්ඛවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අරමුණට එළඹසිටීම් පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකත්වයෙහි නො සිටීම් සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි.

අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවර්ජන චිත්තයාගේ අසනාඩගමය සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකත්වයෙහි නො සිටීම සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි.

දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. දර්ශනයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. දර්ශනයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වේ.

අධිමොක්ෂය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය වීර්‍යෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අරමුණට එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අසනාඩගමය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වේ.

අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. ප්‍රග්‍රහවශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය වීර්‍යෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. උපස්ථානවශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අවික්ෂෙපවශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. දර්ශනවශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අසනාඩගමය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වේ.

අධිමොක්ෂවශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. ප්‍රග්‍රහවශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය වීර්‍යෙන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. උපස්ථානවශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය සමෘතීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. අවික්ෂෙපවශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය සමාධීන්ද්‍රියයාගේ අසනාඩගමය වෙයි. දර්ශනවශයෙන් පැවැති මනසිකාරයාගේ අසනාඩගමය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසනාඩගමය වේ.

සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති. විරියින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමො හොති, ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති.

කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදො හොති, කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදං පජානාති:

අස්සද්ධියස්ස අනුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, අස්සද්ධියපරිළාහස්ස අනුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, අධිමොක්ඛචරියාය වෙසාරජ්ජං සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, යං සද්ධින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං සද්ධින්ද්‍රියස්ස අස්සාදො.

කොසජ්ජස්ස අනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, කොසජ්ජපරිළාහස්ස අනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, පග්ගහචරියාය වෙසාරජ්ජං විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, යං විරියින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං විරියින්ද්‍රියස්ස අස්සාදො.

පමාදස්ස අනුපට්ඨානං සතින්ද්‍රියස්ස අස්සාදො හොති, පමාදපරිළාහස්ස අනුපට්ඨානං සතින්ද්‍රියස්ස අස්සාදො හොති, උපට්ඨානචරියාය වෙසාරජ්ජං සතින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො සතින්ද්‍රියස්ස අස්සාදො හොති, යං සතින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං සතින්ද්‍රියස්ස අස්සාදො.

උද්ධච්චස්ස අනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, උද්ධච්චපරිළාහස්ස අනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, අවික්ඛෙපචරියාය වෙසාරජ්ජං සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, යං සමාධින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං සමාධින්ද්‍රියස්ස අස්සාදො.

අවිජ්ජාය අනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, අවිජ්ජාපරිළාහස්ස අනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, දස්සනචරියාය වෙසාරජ්ජං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, යං පඤ්ඤින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො.

ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදො හොති, ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදං පජානාති.

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නොසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් එකත්ව-යෙහි නො සිටීම ස්මෘතීන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම සමාධීන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම ප්‍රඥෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වේ.

මේ සතලිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වෙයි. මේ සතලිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී.

කවර පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය වේ ද, කවර පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී ද යත්:

අශ්‍රද්ධභාවයාගේ නො එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාදය වෙයි. අශ්‍රද්ධභාව සඞ්ඛ්‍යාත පරිදාහයාගේ නො එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාද වෙයි. අධිමොක්ෂචර්‍ය්‍යායෙහි විශාරද බව ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය (ශමථවිදර්ශනාප්‍රතිලාභය) ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාදය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාදය වේ.

කෞසීද්‍යයාගේ නො එළඹසිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. කෞසීද්‍ය පරිදාහයාගේ නො එළඹසිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ප්‍රග්‍රහචර්‍ය්‍යා-යෙහි විශාරද බව වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්-නසෙක් උපදී ද, මේ වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වේ.

ප්‍රමාදයාගේ නො එළඹසිටීම ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. ප්‍රමාද-පරිදාහයාගේ නො එළඹසිටීම ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. උපස්ථාන-චර්‍ය්‍යායෙහි විශාරද බව ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. ස්මෘතීන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්න-සෙක් උපදී ද, මේ ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වේ.

ඖද්ධත්‍යයාගේ නො එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. ඖද්ධත්‍ය-පරිදාහයාගේ නො එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. අවික්ෂෙපචර්‍ය්‍යා-යෙහි විශාරද බව සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. සමාධීන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ සමාධීන්ද්‍රියයට ආස්වාද වේ.

අවිද්‍යාවගේ නො එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. අවිද්‍යාපරිදාහ-යාගේ නො එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. දර්ශනචර්‍ය්‍යායෙහි විශාරද බව ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ප්‍රඥෙන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වේ.

මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාද වෙයි. මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී. (1)

කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවො හොති, කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවං පජානාති:

අස්සද්ධියස්ස උපට්ඨානං සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, අස්සද්ධිය-පරිළාහස්ස උපට්ඨානං සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චටෙඨන සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛටෙඨන සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, අනත්තටෙඨන සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති.

කොසජ්ජස්ස උපට්ඨානං විරියින්ද්‍රියස්ස ආදීනවො හොති, කොසජ්ජ-පරිළාහස්ස උපට්ඨානං විරියින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චටෙඨන විරියින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛටෙඨන -පෙ- අනත්තටෙඨන විරියින්ද්‍රි-යස්ස ආදීනවො හොති.

පමාදස්ස උපට්ඨානං සතින්ද්‍රියස්ස ආදීනවො හොති, පමාදපරිළාහස්ස උපට්ඨානං සතින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චටෙඨන සතින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛටෙඨන -පෙ- අනත්තටෙඨන සතින්ද්‍රියස්ස ආදීනවො හොති.

උද්ධච්චස්ස උපට්ඨානං සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති, උද්ධච්ච-පරිළාහස්ස උපට්ඨානං සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චටෙඨන සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛටෙඨන -පෙ- අනත්තටෙඨන සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති.

අවිජ්ජාය උපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති, අවිජ්ජා-පරිළාහස්ස උපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චටෙඨන පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛටෙඨන -පෙ- අනත්තටෙඨන පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති

ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවො හොති, ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවං පජානාති.

කතමෙහි අසීතිසතං ආකාරෙහි[1] පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං හොති. කතමෙහි අසීතිසතං ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං පජානාති.

අධිමොක්ඛටෙඨන සද්ධින්ද්‍රියං අස්සද්ධියා නිස්සටං[2] හොති, අස්සද්ධිය-පරිළාහා නිස්සටං[2] හොති තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතර-සද්ධින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරසද්ධින්ද්‍රියා නිස්සටං හොති.

පග්ගහටෙඨන විරියින්ද්‍රියං කොසජ්ජා නිස්සටං හොති, කොසජ්ජ-පරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතර විරියින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරවිරියින්ද්‍රියා නිස්සටං හොති.

---

1 අසීතිසතාකාරෙහි - ස්‍යා
2 නිස්සතං - සී 1

කවර පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වේ ද, කවර පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී ද යත්:

අශ්‍රද්ධාව එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. අශ්‍රද්ධාභාව සඞ්ඛ්‍යාත පරිදාහයාගේ එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍ය සවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනාත්මසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වේ.

කෞසීද්‍යයාගේ එළඹසිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආදීනව වෙයි. කෞසීද්‍ය-පරිදාහයාගේ එළඹසිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍යසවභාවයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්මසවභාවයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආදීනව වේ.

ප්‍රමාදයාගේ එළඹසිටීම ස්මෘතීන්ද්‍රියයට ආදීනව වෙයි ප්‍රමාදපරිදාහයා-ගේ එළඹසිටීම ස්මෘතීන්ද්‍රියයට ආදීනව වෙයි අනිත්‍යසවභාවයෙන් ස්මෘතීන්ද්‍රි-යට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්මසවභාවයෙන් ස්මෘතීන්ද්‍රියයට ආදීනව වේ.

ඖද්ධත්‍යයාගේ එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආදීනව වෙයි. ඖද්ධත්‍යපරිදා-හයාගේ එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍යසවභාවයෙන් සමාධීන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්මසවභාවයෙන් සමාධීන්ද්‍රියයට ආදීනව වේ.

අවිද්‍යාවගේ එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. අවිද්‍යාපරිදාහයාගේ එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍යසවභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනාත්ම-සවභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වේ.

මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වෙයි. මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී. (2)

කවර එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වේ ද, කවර එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී ද යත්:

අධිමොක්ෂසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අශ්‍රද්ධායෙන් නික්මුණේ වෙයි. අශ්‍රද්ධාභාව සඞ්ඛ්‍යාත පරිදාහයෙන් නික්මුණේ වෙයි. එය අනුවැ පවත්නා ක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද සියලු කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරශ්‍රද්ධෙන්ද්‍රියය කෙරෙන් නික්මුණේ වේ.

ප්‍රග්‍රහසවභාවයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය කෞසීද්‍යයෙන් නික්මුණේ වෙයි. කෞසීද්‍යපරිදාහයෙන් නික්මුණේ වෙයි. තදනුවර්ත්තක ක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද සියලු කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ වීර්‍ය්‍යෙන්ද්‍රිය-යාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරවීර්‍ය්‍යෙන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාදා නිස්සටං හොති. පමාදපරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතරසතින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරසතින්ද්‍රියා නිස්සටං හොති.

අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං උද්ධච්චා නිස්සටං හොති, උද්ධච්ච-පරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතර-සමාධින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරසමාධින්ද්‍රියා නිස්සටං හොති.

දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අවිජ්ජාය නිස්සටං හොති, අවිජ්ජා-පරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතර-පඤ්ඤින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරපඤ්ඤින්ද්‍රියා නිස්සටං හොති.

පුබ්බභාගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි පඨමජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, පඨමෙ ඣානෙ[1] පඤ්චහි ඉන්ද්‍රියෙහි[2] දුතියජ්ඣාන-වසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, දුතියෙ ඣානෙ[3], පඤ්චහි ඉන්ද්‍රියෙහි[2] තතියජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, තතියෙ ඣානෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි චතුත්ථජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, චතුත්ථෙ ඣානෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි ආකාසානඤ්චා-යතනසමාපත්තිවසෙන[4] පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති. ආකාසානඤ්චා-යතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි අනිච්චානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති,

---

1. පඨමජ්ඣානෙ - සයා සී 1,
2. පඤ්චහින්ද්‍රියෙහි - මජ්ඣං, සයා, පඤ්චින්ද්‍රියෙහි - සී 1.
3. දුතියජ්ඣානෙ - සයා සී 1
4. සමාපත්තියා වසෙන - සී 1,

උපස්ථානස්වභාවයෙන් සමෘතීන්ද්‍රියය ප්‍රමාදය කෙරෙන් නික්මුණේ වෙයි. ප්‍රමාදපරිදාහයෙන් නික්මුණේ වෙයි. තදනුවර්තක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද සියලු ක්ලේශයන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ සමෘතීන්ද්‍රියයාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරසමෘතීන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියය ඖද්ධත්‍යයෙන් නික්මුණේ වෙයි. ඖද්ධත්‍යපරිදාහයෙන් නික්මුනේ වෙයි. තදනුවර්තකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද හැම ක්ලේශයන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ සමාධීන්ද්‍රියයාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරසමාධීන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියය අවිද්‍යායෙන් නික්මුණේ වෙයි. අවිද්‍යා-පරිදාහයෙන් නික්මුණේ වෙයි. තදනුවර්තකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධ-යන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද හැම ක්ලේශයන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ ප්‍රඥෙන්ද්‍රියයාගේ ප්‍රතිලාභ-යෙන් පූර්වතරප්‍රඥෙන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

පූර්වභාගයෙහි (ප්‍රථමධ්‍යානොපචාරයෙහි) පැවැති පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ප්‍රථමධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ප්‍රථමධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ද්විතීයධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ද්විතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් තෘතීයධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. තෘතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් චතුර්ථධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. චතුර්ථධ්‍යානයෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් ආකාසානඤ්චායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙ-න්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ආකාසානඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් විඤ්ඤාණඤ්චායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙ-න්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙ-න්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමා-පත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අනිත්‍යානුදර්ශනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙත්. (3)

අනිච්චානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි දුක්ඛානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, දුක්ඛානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අනත්තානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අනත්තානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි නිබ්බිදානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, නිබ්බිදානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි විරාගානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විරාගානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි නිරොධානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, නිරොධානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි පටිනිස්සග්ගානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, පටිනිස්සග්ගානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි ඛයානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, ඛයානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි වයානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, වයානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි විපරිණාමානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විපරිණාමානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අනිමිත්තානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අනිමිත්තානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අප්පණිහිතානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අප්පණිහිතානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි සුඤ්ඤතානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සුඤ්ඤතානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අධිපඤ්ඤාධම්මවිපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අධිපඤ්ඤාධම්මවිපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි යථාභූතඤාණදස්සනවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, යථාභූතඤාණදස්සනෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි ආදීනවානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, ආදීනවානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි පටිසඞ්ඛානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, පටිසඞ්ඛානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි විවට්ටනානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විවට්ටනානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි සොතාපත්තිමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සොතාපත්තිමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි සොතාපත්තිඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සොතාපත්තිඵලසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි සකදාගාමිමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සකදාගාමිමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි සකදාගාමිඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සකදාගාමිඵලසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි අනාගාමිමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අනාගාමිමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි අනාගාමිඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අනාගාමිඵලසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි අරහත්තමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අරහත්තමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි අරහත්තඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති.

අනිච්චානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් දුක්ඛානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. දුක්ඛානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අනත්තානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අනත්තානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් නිබ්බිදානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති නිබ්බිදානු-පස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් විරාගානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විරාගානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් නිරොධානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. නිරොධානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් පටිනිස්සග්ගානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. පටිනිස්සග්ගානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ඛයානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ඛයානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් වයානු-පස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. වයානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් විපරිණාමානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විපරිණාමානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අනිමිත්තානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අනිමිත්තානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අප්පණිහිතානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අප්පණිහිතානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් සුඤ්ඤතානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. සුඤ්ඤතානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අධිපඤ්ඤාධම්මවිපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අධිපඤ්ඤාධම්මවිපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් යථාභූතඤාණ-දස්සන වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. යථාභූතඤාණදස්සන-යෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ආදීනවානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රි-යයෝ නික්මුණාහු වෙති. ආදීනවානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් පටිසඞ්ඛානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. පටිසඞ්ඛානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් විවට්ටානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විවට්ටානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් සොතාපත්තිමග්ග වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ස්‍රොතාපත්තිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ස්‍රොතාපත්තිඵලසමාපත්තිවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ස්‍රොතාපත්තිඵලසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් සකෘදාගාමි මාර්ගවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. සකෘදාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් සකෘදාගාමිඵලසමාපත්ති වශයෙන් පඤ්චෙන්ද්‍රි-යයෝ නික්මුණාහු වෙති. සකෘදාගාමිඵලසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අනාගාමිමාර්ග වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අනාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අනාගාමිඵලසමාපත්ති වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති, අනාගාමිඵලසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අර්හත්මාර්ග වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අර්හත්ඵලසමාපත්ති වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙත්.

නෙක්ඛම්මෙ[1], පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්දතො නිස්සටානි හොන්ති, අබ්‍යාපාදෙ පඤ්චින්ද්‍රියානි බ්‍යාපාදතො නිස්සටානි හොන්ති, ආලොකසඤ්ඤාය පඤ්චින්ද්‍රියානි ථීනමිද්ධතො නිස්සටානි හොන්ති, අවික්ඛෙපෙ පඤ්චින්ද්‍රියානි උද්ධච්චතො නිස්සටානි හොන්ති, ධම්මවවත්ථානෙ පඤ්චින්ද්‍රියානි විචිකිච්ඡාය නිස්සටානි හොන්ති, ඤාණෙ පඤ්චින්ද්‍රියානි අවිජ්ජාය නිස්සටානි හොන්ති, පාමොජ්ජෙ පඤ්චින්ද්‍රියානි අරතියා නිස්සටානි හොන්ති.

පඨමෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි නීවරණෙහි නිස්සටානි හොන්ති, දුතියෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි විතක්කවිචාරෙහි නිස්සටානි හොන්ති, තතියෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි පීතියා නිස්සටානි හොන්ති, චතුත්ථෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි සුඛදුක්ඛෙහි නිස්සටානි හොන්ති, ආකාසානඤ්චායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය නිස්සටානි හොන්ති, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි ආකාසානඤ්චායතනසඤ්ඤාය නිස්සටානි හොන්ති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය නිස්සටානි හොන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය නිස්සටානි හොන්ති.

අනිච්චානුපස්සනාය පඤ්චින්ද්‍රියානි නිච්චසඤ්ඤාය නිස්සටානි හොන්ති, දුක්ඛානුපස්සනාය පඤ්චින්ද්‍රියානි සුඛසඤ්ඤාය නිස්සටානි හොන්ති, අනත්තානුපස්සනාය පඤ්චින්ද්‍රියානි අත්තසඤ්ඤාය නිස්සටානි හොන්ති, නිබ්බිදානුපස්සනාය පඤ්චින්ද්‍රියානි නන්දියා නිස්සටානි හොන්ති, විරාගානුපස්සනාය පඤ්චින්ද්‍රියානි රාගතො නිස්සටානි හොන්ති, නිරොධානුපස්සනාය පඤ්චින්ද්‍රියානි සමුදයතො නිස්සටානි හොන්ති, පටිනිස්සග්ගානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ආදීනවතො නිස්සටානි හොන්ති, ඛයානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ඝනසඤ්ඤාය නිස්සටානි හොන්ති, වයානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ආයූහනතො නිස්සටානි හොන්ති, විපරිණාමානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ධුවසඤ්ඤාය නිස්සටානි හොන්ති, අනිමිත්තානුපස්සනාය පඤ්චින්ද්‍රියානි නිමිත්තතො නිස්සටානි හොන්ති, අප්පණිහිතානුපස්සනාය පඤ්චින්ද්‍රියානි පණිධියා නිස්සටානි හොන්ති, සුඤ්ඤතානුපස්සනාය පඤ්චින්ද්‍රියානි අභිනිවෙසතො නිස්සටානි හොන්ති, අධිපඤ්ඤාධම්මවිපස්සනාය පඤ්චින්ද්‍රියානි සාරාදානාභිනිවෙසතො නිස්සටානි හොන්ති, යථාභූතඤාණදස්සනෙ පඤ්චින්ද්‍රියානි සම්මොහාභිනිවෙසතො නිස්සටානි හොන්ති, ආදීනවානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ආලයාභිනිවෙසතො නිස්සටානි හොන්ති, පටිසඞ්ඛානුපස්සනාය පඤ්චින්ද්‍රියානි අප්පටිසඞ්ඛාය නිස්සටානි හොන්ති, විවට්ටනානුපස්සනාය පඤ්චින්ද්‍රියානි සඤ්ඤොගාභිනිවෙසතො නිස්සටානි හොන්ති.

1. නික්ඛම්මෙ - ස්‍යා, සී, 1

නෛෂ්ක්‍රම්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ කාමච්ඡන්දය කෙරෙන් නික්මුණාහු වෙති. අව්‍යාපාදයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ව්‍යාපාදයෙන් නික්මුණාහු වෙති. ආලෝකසංඥායෙහි පඤ්චෙන්ද්‍රියයෝ ථිනමිද්ධය කෙරෙන් නික්මුණාහු වෙති. අවික්ෂෙපයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ඖද්ධත්‍යය කෙරෙන් නික්මුණාහු වෙති. ධර්මව්‍යවස්ථානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ විචිකිත්සාව කෙරෙන් නික්මුණාහු වෙති. ඥානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අවිද්‍යාව කෙරෙන් නික්මුණාහු වෙති. ප්‍රාමොද්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අරතිය කෙරෙන් නික්මුණාහු වෙත්.

ප්‍රථමධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නීවරණයන් කෙරෙන් නික්මුණාහු වෙති. ද්විතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ විතර්කවිචාරයන් කෙරෙන් නික්-මුණාහු වෙති. තෘතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ප්‍රීතිය කෙරෙන් නික්මුණාහු වෙති. චතුර්ථධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සුඛදුඃඛයන් කෙරෙන් නික්මුණාහු වෙති. ආකාසානඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ රූපසංඥා, ප්‍රතිඝසංඥා, නානාත්වසංඥා කෙරෙන් නික්මුණාහු වෙති. විඤ්ඤා-ණඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආකාසානඤ්චායතනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රි-යයෝ විඤ්ඤාණඤ්චායතනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. නෙව-සඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආකිඤ්චඤ්ඤායතන සංඥාව කෙරෙන් නික්මුණාහු වෙත්.

අනිත්‍යානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නිත්‍යසංඥාව කෙරෙන් නික්මු-ණාහු වෙති. දුඃඛානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සුඛසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. අනාත්මානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආත්මසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. නිර්වේදානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නන්දිය කෙරෙන් නික්මුණාහු වෙති. විරාගානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ රාගය කෙරෙන් නික්මුණාහු වෙති. නිරොධානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සමුදය කෙරෙන් නික්මුණාහු වෙති. පටිනිස්සග්ගානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආදීනවය කෙරෙන් නික්මුණාහු වෙති. ක්ෂයානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ඝනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. ව්‍යයානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආයූහනය කෙරෙන් නික්මුණාහු වෙති. විපරිණාමානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රි-යයෝ ධ්‍රැවසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. අනිමිත්තානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නිමිත්ත කෙරෙන් නික්මුණාහු වෙති. අප්‍රණිහිතානුදර්ශන-යෙහි පඤ්චෙන්ද්‍රියයෝ ප්‍රණිධිය කෙරෙන් නික්මුණාහු වෙති. ශූන්‍යතානු-දර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. අධි-ප්‍රඥාධර්මවිදර්ශනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ නිත්‍යසාරග්‍රහණාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. යථාභූතඥානදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සම්මූළ්හාභි-නිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. ආදීනවානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආලයාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. පටිසඞ්ඛානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ අප්පටිසඞ්ඛාව (අසමවාහිතභාවය) කෙරෙන් නික්මුණාහු වෙති. විවට්ටානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ සංයොගාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙත්.

සොතාපත්තිමග්ගෙ පඤ්චින්ද්‍රියානි දිට්ඨෙකට්ඨෙහි කිලෙසෙහි නිස්සටානි හොන්ති, සකදාගාමිමග්ගෙ පඤ්චින්ද්‍රියානි ඔළාරිකෙහි කිලෙසෙහි නිස්සටානි හොන්ති, අනාගාමිමග්ගෙ පඤ්චින්ද්‍රියානි අණුසහගතෙහි කිලෙසෙහි නිස්සටානි හොන්ති, අරහත්තමග්ගෙ පඤ්චින්ද්‍රියානි සබ්බකිලෙසෙහි නිස්සටානි හොන්ති, සබ්බසඞ්ඛාව බීණාසවානං තත්‍ථ තත්‍ථ පඤ්චින්ද්‍රියානි නිස්සටානි චෙව හොන්ති සුනිස්සටානි ච පටිප්පස්සද්ධානි ච සුපටිප්පස්සද්ධානි ච.

ඉමෙහි අසීතිසතංආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං හොති. ඉමෙහි අසීතිසතං ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං පජානාති.

දුතියසුත්තන්තනිද්දෙසො.

භාණවාරො පඨමො.

## 4 – 3. තතියසුත්තන්තං

[සාවත්ථිනිදානං:]

"පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි, කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං.

කත්‍ථ ච භික්ඛවෙ, සද්ධින්ද්‍රියං දට්ඨබ්බං: චතූසු සොතාපත්තියඞ්ගෙසු එත්‍ථ සද්ධින්ද්‍රියං දට්ඨබ්බං. කත්‍ථ ච භික්ඛවෙ, විරියින්ද්‍රියං දට්ඨබ්බං, චතූසු සම්මප්පධානෙසු, එත්‍ථ විරියින්ද්‍රියං දට්ඨබ්බං. කත්‍ථ ච භික්ඛවෙ, සතින්ද්‍රියං දට්ඨබ්බං, චතූසු සතිපට්ඨානෙසු, එත්‍ථ සතින්ද්‍රියං දට්ඨබ්බං. කත්‍ථ ච භික්ඛවෙ, සමාධින්ද්‍රියං දට්ඨබ්බං. චතූසු ඣානෙසු, එත්‍ථ සමාධින්ද්‍රියං දට්ඨබ්බං කත්‍ථ ච භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, චතූසු අරියසච්චෙසු එත්‍ථ පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං;[a]

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි: චතූසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

---

a ඉන්ද්‍රියසංයුත්ත - සුද්ධිකවග්ග.

ස්‍රොතාපත්තිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ දෘෂ්ටිය හා සමග එක් වැ සිටි කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. සකෘදාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ඖදාරික වූ කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. අනාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අණුසහගත වූ කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ හැම කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. හැම රහත්නට මැ ඒ ඒ තන්හි පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු ද මොනොවට නික්මුණාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙත්.

මේ එක්සියඅසූ අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වෙයි, මේ එක්සියඅසූ අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී.

**ද්විතීයසූත්‍රනිර්දේශය යි.**

**පළමුවන බණවර යි.**

## 4 – 3. තෘතීය සූත්‍රය

සැවැත් නිදාන යි.

"මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක් ද යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ සමෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි.

මහණෙනි, කොතැන්හි ලා ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු ද යත්: සතර ශ්‍රොතාපත්තිඅඞ්ගයන්හි යැ, මෙහි ලා ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු ද යත්: සතර සම්‍යක්ප්‍රධානයන්හි යැ, මෙහි ලා වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා සමෘතීන්ද්‍රියය දතයුතු ද යත්: සතර සතිපට්ඨානයන්හි යැ, මෙහි ලා සමෘතීන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා සමාධීන්ද්‍රියය දතයුතු ද යත්: සතර ධ්‍යානයන්හි යැ, මෙහි ලා සමාධීන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා ප්‍රඥෙන්ද්‍රියය දතයුතු ද යත්: සතර ආර්‍ය්‍යසත්‍යයන්හි යැ මෙහි ලා ප්‍රඥෙන්ද්‍රියය දතයුතු".

සතර ශ්‍රොතාපත්තිඅඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර සතිපට්ඨානයන්හි සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර ආර්‍ය්‍යසත්‍යයන්හි පඤ්චෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ, සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ. සතර සතිපට්ඨානයන්හි සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ. සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ. සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු යි.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

සප්පුරිසසංසෙවෙ සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධම්මසවනෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- යොනිසො මනසිකාරෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- ධම්මානුධම්මපටිපත්තියා සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය සම්මප්පධානෙ -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය සම්මප්පධානෙ -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

කායෙ කායානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං. සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

සත්පුරුෂසංසෙවා සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථ (එළඹසිටුනාස්වභාව)-යෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ. සද්ධර්මශ්‍රවණ සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... යොනිසොමනසකාර සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... ධර්මානුධර්මප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ' ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු යි.

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

නූපන් ලාමක වූ අකුශලධර්මයන් නූපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, උපන් ලාමක වූ අකුශලධර්මයන් ප්‍රහාණය කරනු පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... නූපන් කුශලධර්මයන් උපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... උපන් කුශලධර්මයන් සිටුනා පිණිස නො නස්නා පිණිස බහුලභාවය පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූර්ණ බව පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු.

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු යි.

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

කයෙහි කායානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ; ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, වේදනාවන්හි වේදනානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... චිත්තයෙහි චිත්තානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... ධර්මයන්හි ධර්මානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු.

චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

පඨමෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, දුතියෙ ඣානෙ –පෙ– තතියෙ ඣානෙ –පෙ– චතුත්ථෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

දුක්ඛෙ අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං. පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දුක්ඛසමුදයෙ අරියසච්චෙ –පෙ– දුක්ඛනිරොධෙ අරියසච්චෙ –පෙ– දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා, චතූසු සම්මප්පධානෙසු –පෙ– චතූසු සතිපට්ඨානෙසු –පෙ– චතූසු ඣානෙසු –පෙ– චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා: චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා, චතූසු සම්මප්පධානෙසු –පෙ– චතූසු සතිපට්ඨානෙසු –පෙ– චතූසු ඣානෙසු –පෙ– චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චේන්ද්‍රියයෝ දතයුත්තාහු වෙත්.

සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ප්‍රථමධ්‍යානයෙහි අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ. ද්විතීයධ්‍යානයෙහි ... තෘතීයධ්‍යානයෙහි ... චතුර්ථධ්‍යානයෙහි අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු.

සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චේන්ද්‍රියයෝ දතයුත්තාහු වෙත්.

සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරින් පඤ්චේන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

දුඃඛාර්යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු. දුඃඛසමුදයාර්යසත්‍යයෙහි ... දුඃඛනිරොධාර්යසත්‍යයෙහි ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චේන්ද්‍රියයෝ දතයුත්තාහු වෙත්.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු ද, සතර සම්‍යක්ප්‍රධානයන්හි ... සතර සතිපට්ඨානයන්හි ... සතර ධ්‍යානයන්හි ... සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු ද යත්: සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු යැ, සතර සම්‍යක්ප්‍රධානයන්හි ... සතරසතිපට්ඨානයන්හි ... සතර ධ්‍යානයන්හි ... සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු.

චතුසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

සප්පුරිසසංසෙවෙ සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා. සද්ධම්මසවනෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- යොනිසොමනසිකාරෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- ධම්මානුධම්මපටිපත්තියා සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා.

චතුසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

චතුසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය සම්මප්පධානෙ -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය සම්මප්පධානෙ -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා -පෙ-

චතුසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

චතුසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

කායෙ කායානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා-පෙ-

චතුසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

සත්පුරුෂසංසෙවා සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, අවික්‍ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු. සද්ධර්මශ්‍රවණ සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි .. යොනිසොමනසිකාර සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... ධර්මානුධර්මප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, අවික්‍ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

නූපන් ලාමක වූ අකුශලධර්මයන් නූපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, අවික්‍ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, අධිමොක්‍ෂස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, උපන් ලාමක වූ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... නූපන් කුශලධර්මයන් උපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... උපන් කුශලධර්මයන්ගේ සිටීම පිණිස නො නැසීම පිණිස බහුල බව පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූර්ණ බව පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු. ...

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

කයෙහි කායානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්‍ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, අධිමොක්‍ෂස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යෑ, වෙදනාවන්හි වෙදනානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... චිත්තයෙහි චිත්තානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... ධර්මයන්හි ධර්මානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු. ...

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන කතමෙහි විසතියා ආකාරෙහි ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

පඨමෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා. දුතියෙ ඣානෙ -පෙ- තතියෙ ඣානෙ -පෙ- චතුත්ථෙ ඣානෙ අවික්ඛෙපාධි-පතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා -පෙ-

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

දුක්ඛෙ අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දුක්ඛසමුදයෙ අරියසච්චෙ -පෙ- දුක්ඛනිරොධෙ අරියසච්චෙ -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රි-යස්ස චරියා දට්ඨබ්බා.

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

චාරො ච විහාරො ච අනුබුද්ධො හොති පටිවිද්ධො, යථාචරන්තං යථා-විහරන්තං විඤ්ඤූ සබ්‍රහ්මචාරී ගම්භීරෙසු ඨානෙසු ඔකප්පෙය්‍යුං: අද්ධා අයමායස්මා පත්තො වා පාපුණිස්සති වා.

**චරියාති** අට්ඨ චරියායො: ඉරියාපථචරියා, ආයතනචරියා, සතිචරියා, සමාධිචරියා, ඤාණචරියා, මග්ගචරියා, පත්තිචරියා, ලොකත්ථචරියා'ති.[1]

**ඉරියාපථචරියාති** චතූසු[2] ඉරියාපථෙසු.

**ආයතනචරියාති** ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු.

**සතිචරියාති** චතූසු සතිපට්ඨානෙසු.

**සමාධිචරියාති** චතූසු ඣානෙසු.

**ඤාණචරියාති** චතූසු අරියසච්චෙසු.

---

1. ලොකත්ථචරියා - සයා.
2. **චතූසු - මජසං,** සයා.

සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

ප්‍රථමධ්‍යානයෙහි අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාන්‍රියෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ. අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ. ද්විතීයධ්‍යානයෙහි ... තෘතීය ධ්‍යානයෙහි ... චතුර්ථධ්‍යානයෙහි අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු. ...

සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

දුඃඛාර්‍ය්‍යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ. දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයෙහි ... දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යයෙහි ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චේන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

චර්‍ය්‍යාව ද විහරණය ද අනුමානයෙන් දත්නාලද්දේ ප්‍රත්‍යක්ෂයෙන් දත්නා ලද්දේ වෙයි. යම් පරිද්දෙකින් හැසිරෙන්නහු යම් පරිද්දෙකින් වෙසෙන්නහු 'එකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙම අධිගම කෙළේ යැ'යි හෝ අධිගම කරන්නේ යැ'යි හෝ නුවණැති සබ්‍රහ්මචාරීහු ධ්‍යානාදි ගැඹුරු තන්හි හඳහන්නාහු යි.

**චර්‍ය්‍යා** යනු: චර්‍ය්‍යාවෝ අටදෙනෙකි: ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යා යැ ආයතනචර්‍ය්‍යා යැ ස්මෘතිචර්‍ය්‍යා යැ සමාධිචර්‍ය්‍යා යැ ඥානචර්‍ය්‍යා යැ මාර්ගචර්‍ය්‍යා යැ ඵලචර්‍ය්‍යා යැ ලොකාර්ථචර්‍ය්‍යා යි.

**ඉරියාපථචර්‍ය්‍යා** යනු: සතර ඉරියව්හි යැ.

**ආයතනචර්‍ය්‍යා** යනු: සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි යැ.

**ස්මෘතිචර්‍ය්‍යා** යනු: සතර සතිපට්ඨානයන්හි යැ.

**සමාධිචර්‍ය්‍යා** යනු: සතර ධ්‍යානයන්හි යැ.

**ඥානචර්‍ය්‍යා** යනු: සතර ආර්‍ය්‍යසත්‍යයන්හි යැ.

**මග්ගචරියාති** චතූසු අරියමග්ගෙසු.

**පත්තිචරියාති** චතූසු සාමඤ්ඤඵලෙසු.

**ලොකත්ථචරියාති** තථාගතෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු, පදෙසෙ[1] පච්චෙකබුද්ධෙසු, පදෙසෙ[1] සාවකෙසු.

ඉරියාපථචරියා ච පණිධිසම්පන්නානං. ආයතනචරියා ච ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං. සතිචරියා ච අප්පමාදවිහාරීනං. සමාධිචරියා ච අධිචිත්තමනුයුත්තානං, ඤාණචරියා ච බුද්ධිසම්පන්නානං, මග්ගචරියා ච සම්මාපටිපන්නානං,[3] පත්තිචරියා ච අධිගතඵලානං, ලොකත්ථචරියා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, පදෙසෙ[1] පච්චෙකබුද්ධානං, පදෙසෙ[1] සාවකානං, ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: අධිමුච්චන්තො සද්ධාය චරති, පග්ගණ්හන්තො විරියෙන චරති, උපට්ඨාපෙන්තො සතියා චරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා චරති, පජානන්තො පඤ්ඤාය චරති, විජානන්තො විඤ්ඤාණචරියාය[4] චරති, එවං පටිපන්නස්ස කුසලා ධම්මා ආයාපෙන්තීති[5] ආයතනචරියාය චරති, එවං පටිපන්නො විසෙසමධිගච්ඡතීති විසෙසචරියාය චරති, ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: දස්සනචරියා ච සම්මාදිට්ඨියා, අභිනිරොපනචරියා ච සම්මාසඞ්කප්පස්ස, පරිග්ගහචරියා ච සම්මාවාචාය, සමුට්ඨානචරියා ච සම්මාකම්මන්තස්ස, වොදානචරියා ච සම්මාආජීවස්ස, පග්ගහචරියා ච සම්මාවායාමස්ස. උපට්ඨානචරියා ච සම්මාසතියා, අවික්ඛෙපචරියා ච සම්මාසමාධිස්ස, ඉමා අට්ඨ චරියායො.

**විහාරොති** අධිමුච්චන්තො සද්ධාය විහරති, පග්ගණ්හන්තො විරියෙන විහරති, උපට්ඨාපෙන්තො සතියා විහරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා විහරති, පජානන්තො පඤ්ඤාය විහරති.

**අනුබුද්ධොති** සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨො අනුබුද්ධො හොති, විරියින්ද්‍රියස්ස පග්ගහට්ඨො අනුබුද්ධො හොති, සතින්ද්‍රියස්ස උපට්ඨානට්ඨො අනුබුද්ධො හොති, සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපට්ඨො අනුබුද්ධො හොති, පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨො අනුබුද්ධො හොති.

**පටිවිද්ධොති** සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨො පටිවිද්ධො හොති, විරියින්ද්‍රියස්ස පග්ගහට්ඨො පටිවිද්ධො හොති, සතින්ද්‍රියස්ස උපට්ඨානට්ඨො පටිවිද්ධො හොති, සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපට්ඨො පටිවිද්ධො හොති, පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨො පටිවිද්ධො හොති.

---

1. පදෙසා - සභා, සප්පදෙසා - සී 1,
2. පදෙසො - සභා, සප්ප දෙසු - සී 1,
3. සමාපත්තිසම්පන්නානං - සී 1,
4. විඤ්ඤාණෙන - සභා, විඤ්ඤාණචරියා - සී;
5. අභාපෙන්තීති - සී 1,

**මග්ගචරියා** යනු: සතර ආර්‍ය්‍යමාර්ගයන්හි යැ.

**පත්තිචරියා** යනු: සතර ශ්‍රාමණ්‍යඵලයන්හි යැ.

**ලොකත්ථචරියා** යනු: තථාගත වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහි (නිපසදෙසයෙහි) ප්‍රත්‍යෙකබුද්ධයන් කෙරෙහි (ලොකාර්ථචර්‍ය්‍යා පිළිබඳ) එකදෙශයෙක්හි, ශ්‍රාවකයන් කෙරෙහි (ලොකාර්ථචර්‍ය්‍යා පිළිබඳ) එකදෙශයෙක්හි යැ.

ප්‍රණිධිසම්පන්නයනට ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යාව ද ඉන්ද්‍රියයන්හි පියනලද දොර ඇතියනට ආයතනචර්‍ය්‍යාව ද අප්‍රමාදවිහාර ඇතියනට ස්මෘතිචර්‍ය්‍යාව ද සමාධියෙහි අනුයුක්තයනට සමාධිචර්‍ය්‍යාව ද බුද්ධිසම්පන්නයනට ඥානචර්‍ය්‍යාව ද සම්‍යක්ප්‍රතිපන්නයනට මාර්ගචර්‍ය්‍යාව ද පැමිණි ඵල ඇතියනට ප්‍රාප්තිචර්‍ය්‍යාව ද තථාගත වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධයනට (නිපපදෙසයෙහි) ලොකාර්ථචර්‍ය්‍යාව ද ප්‍රත්‍යෙකබුද්ධයනට එකදෙශයෙහි (ලොකාර්ථචර්‍ය්‍යාව) ද ශ්‍රාවකයනට එකදෙශයෙහි (ලොකාර්ථචර්‍ය්‍යාව) ද යන මොහු චර්‍ය්‍යාවෝ අටදෙන වෙත්.

අනෙකුදු චර්‍ය්‍යාවෝ අටදෙනෙකි: නිශ්චය කරනුයේ ශ්‍රද්ධාවශයෙන් පවතී. ප්‍රග්‍රහ කරනුයේ වීර්‍ය්‍යවශයෙන් පවතී. (අරමුණෙහි) එළවනුයේ ස්මෘතිවශයෙන් පවතී. අවික්ෂෙප කරනුයේ සමාධිවශයෙන් පවතී. දැනගන්නේ ප්‍රඥාවශයෙන් පවතී. (ආවර්ජන සිතින්) විජානනය කරනුයේ විඥානචර්‍ය්‍යායෙන් පවතී. මෙසෙයින් පිළිපන්නහුට කුශලධර්මයෝ අතිශයින් යැපෙත් නු යි ආයතනචර්‍ය්‍යාවශයෙන් පවතී. මෙසෙයින් පිළිපන්නේ විශෙෂයට පැමිණේ නු යි විශෙෂචර්‍ය්‍යාවශයෙන් පවතී. මොහු චර්‍ය්‍යාවෝ අටදෙන වෙත්.

අනෙකුදු චර්‍ය්‍යාවෝ අටදෙනෙකි: සම්‍යග්දෘෂ්ටියගේ දර්ශනචර්‍ය්‍යා යැ සම්‍යක්සංකල්පයාගේ අභිනිරොපණ (අරමුණට නැඟීම්) චර්‍ය්‍යා යැ සම්‍යග්වචනයාගේ පරිග්‍රහචර්‍ය්‍යා යැ සම්‍යක්කර්මාන්තයාගේ සමුත්ථානචර්‍ය්‍යා යැ සම්‍යගාජීවයාගේ පරිශුද්ධචර්‍ය්‍යා යැ සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රග්‍රහචර්‍ය්‍යා යැ සම්‍යක්ස්මෘතියගේ උපස්ථානචර්‍ය්‍යා යැ සම්‍යක්සමාධිහුගේ අවික්ෂෙපචර්‍ය්‍යා යි. මොහු චර්‍ය්‍යාවෝ අටදෙන වෙත්.

**විහාරො** යනු: නිශ්චය කරනුයේ ශ්‍රද්ධාවශයෙන් වෙසෙයි, ප්‍රග්‍රහ කරනුයේ වීර්‍ය්‍යවශයෙන් වෙසෙයි. (අරමුණෙහි) එළවනුයේ ස්මෘතිවශයෙන් වෙසෙයි. අවික්ෂෙප කරනුයේ සමාධිවශයෙන් වෙසෙයි. දැනගන්නේ ප්‍රඥාවශයෙන් වෙසේ.

**අනුබුද්ධො** යනු: ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි, ස්මෘතීන්ද්‍රියයාගේ උපස්ථානස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි, සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙපස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනස්වභාවය අනුමානයෙන් දන්නාලද වේ.

**පටිවිද්ධො** යනු: ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වෙයි., වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වෙයි, ,ස්මෘතීන්ද්‍රියයාගේ උපස්ථානස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වෙයි. සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙපස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නා ලද වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වේ.

**යථාචරන්තන්ති**[1] එවං සද්ධාය චරන්තං, එවං විරියෙන චරන්තං, එවං සතියා චරන්තං, එවං සමාධිනා චරන්තං, එවං පඤ්ඤාය චරන්තං.

**යථාවිහරන්තන්ති** එවං සද්ධාය විහරන්තං, එවං විරියෙන විහරන්තං, එවං සතියා විහරන්තං, එවං සමාධිනා විහරන්තං, එවං පඤ්ඤාය විහරන්තං.

**විඤ්ඤූති** විඤ්ඤූ විභාවී මෙධාවී පණ්ඩිතා බුද්ධිසම්පන්නා.

**සබ්‍රහ්මචාරීති** එකකම්මං,[2] එකුද්දෙසො සමසික්ඛතා[3]

**ගම්භීරෙසු ඨානෙසූති** ගම්භීරානි ඨානානි වුච්චන්ති: ඣානා[4] ච විමොක්ඛා ච සමාධි[5] ච සමාපත්තියො ච මග්ගා ච ඵලානි ච අභිඤ්ඤායො ච පටිසම්භිදා ච.

**ඔකප්පෙය්‍යුන්ති** සද්දහෙය්‍යුං අධිමුච්චෙය්‍යුං.

**අද්ධාති** එකංසවචනමෙතං, නිස්සංසයවචනමෙතං, නික්කඞ්ඛවචනමෙතං,[6] අද්වෙජ්ඣවචනමෙතං, අද්වෙළ්හකවචනමෙතං, නියොගවචනමෙතං[7], අපණ්ණකවචනමෙතං, අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති.

**ආයස්මාති** පියවචනමෙතං, ගරුවචනමෙතං, සගාරවසප්පතිස්සාධිවචන[8] මෙතං 'ආයස්මා, ති.

**පත්තො වාති** අධිගතො වා[9].

**පාපුණිස්සති වාති** අධිගමිස්සති වා.[10]

**තතියසුත්තනිද්දෙසො.**

## 4 - 4. චතුත්ථසුත්තං

[**සාවත්ථිනිදානං**[11]]

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි: කතමානි පඤ්ච. සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි.

ඉමානි පඤ්චින්ද්‍රියානි කතිහාකාරෙහි කෙනට්ඨෙන[12] දට්ඨබ්බානි: ඉමානි පඤ්චින්ද්‍රියානි ඡහාකාරෙහි තෙනට්ඨෙන[13] දට්ඨබ්බානි. ආධිපතෙය්‍යට්ඨෙන, ආදිවිසොධනට්ඨෙන, අධිමත්තට්ඨෙන, අධිට්ඨානට්ඨෙන, පරියාදානට්ඨෙන, පතිට්ඨාපකට්ඨෙන.

කථං ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

අස්සද්ධියං පජහතො අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං.

1. යථාචරන්ති - සී 1, 2. එකං කම්මං - සී, 3. සමසික්ඛාතා - ස්‍යා
4. ඣානානි - ස්‍යා PTS, 5. සමාධි - ස්‍යා, සී 1, 6. නික්කඞ්ඛාවචනමෙතං - ස්‍යා, සී 1,
7. නිය්‍යානිකවචනමෙතං - ස්‍යා, 8. සප්පතිස්සාධිවචනං - ස්‍යා,
9. අධිගතො - ස්‍යා PTS, 10. අධිගමිස්සති - ස්‍යා, PTS,
11. පරිපුණ්ණනිදානං - ස්‍යා, සී, PTS, 12. කතිහාකාරෙහි - ස්‍යා PTS,
13. ඡහාකාරෙහි - ස්‍යා,

**යථා චරන්තං** යනු: මෙසේ ශ්‍රද්ධාවශයෙන් පවත්නහු, මෙසේ වීර්‍ය්‍ය වශයෙන් පවත්නහු, මෙසේ ස්මෘතිවශයෙන් පවත්නහු, මෙසේ සමාධි වශයෙන් පවත්නහු, මෙසේ ප්‍රඥාවශයෙන් පවත්නහු යැ.

**යථා විහරන්තං** යනු: මෙසේ ශ්‍රද්ධාවශයෙන් වෙසෙන්නහු, මෙසේ වීර්‍ය්‍යවශයෙන් වෙසෙන්නහු, මෙසේ ස්මෘතිවශයෙන් වෙසෙන්නහු, මෙසේ සමාධිවශයෙන් වෙසෙන්නහු, මෙසේ ප්‍රඥාවශයෙන් වෙසෙන්නහු යැ.

**විඤ්ඤූ** යනු: විඥ වූවාහු විමංසක වූවාහු ධාරණප්‍රඥ ඇත්තාහු පණ්ඩිත වූවාහු බුද්ධිමත් වූවාහු යැ.

**සබ්‍රහ්මචාරී** යනු: එකකර්‍මී එකොද්දෙශ සමානශික්‍ෂා ඇති බව යි.

**ගම්භීරෙසු ඨානෙසු** යනු: ධ්‍යානයෝ ද විමොක්‍ෂයෝ ද සමාධීහු ද සමාපත්තීහු ද මාර්‍ගයෝ ද ඵලයෝ ද අභිඥාවෝ ද ප්‍රතිසංවිදාවෝ ද ගම්භීර-ස්ථානහ යි කියනු ලැබෙත්.

**ඔකප්පෙය්‍යුං** යනු: හදහන්නාහු යැ අධිමුක්ත වන්නාහු යි.

**අද්ධා** යනු: තෙල 'අද්ධා' යනු එකාන්තවචන යැ නිස්සංශයවචන යැ නිසැක වචන යැ අද්වෛධවචන යැ නො දෙගිත් වචන යැ නියොගවචන යැ අවිරුද්ධවචන යැ සනිටුහන් වචන යි.

**ආයස්මා** යනු: තෙල 'ආයස්මා' යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරවසප්‍රතිශ්‍රයාධිවචන යි.

**පත්තො වා** යනු: පැමිණියේ හෝ යැ.

**පාපුණිස්සති වා** යනු: පැමිණෙන්නේ හෝ යි.

**තාතීයසූත්‍රනිර්දේශ යි.**

## 4 – 4. චතුර්ථසූත්‍රය

**[සැවැත්නිදාන යි:]**

**මහණෙනි,** මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙකි: කවර පස්දෙනෙක් ද යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි. මහණෙනි, මොහු පඤ්චෙන්ද්‍රියයෝ යි.

මේ පඤ්චෙන්ද්‍රියයෝ කිහි අයුරෙකින් කවර අරුතෙකින් දතයුත්තාහු ද යත්: මේ පඤ්චෙන්ද්‍රියයෝ සඅයුරෙකින් එ මැ අරුතින් දතයුත්තාහ, අධිපතිභාවාර්ථයෙන ආදිවිශොධනාර්ථයෙන අධිමාත්‍රාර්ථයෙන අධිෂ්ඨා-නාර්ථයෙන පර්‍ය්‍යාදානාර්ථයෙන ප්‍රතිෂ්ඨාපකාර්ථයෙනි.

කිසෙයින් අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

අශ්‍රද්ධාව දුරුකරන්නාහට අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දත-යුතු යැ එළඹසිටුනාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු.

කොසජ්ජං පජහතො පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං.

පමාදං පජහතො උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං.

උද්ධච්චං පජහතො අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං.

අවිජ්ජං පජහතො දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

කෞසීද්‍යය දුරු කරන්නාහට ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එළඹසිටීම් අර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු.

ප්‍රමාදය දුරු කරන්නාහට උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු.

ඖද්ධත්‍යය දුරුකරන්නාහට අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු.

අවිද්‍යාව දුරුකරන්නාහට දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් අධිමොක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍යවශයෙන් දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

බ්‍යාපාදං පජහතො අබ්‍යාපාදවසෙන -පෙ- ථීනමිද්ධං පජහතො ආලොකසඤ්ඤාවසෙන -පෙ- සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, -පෙ- සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

එවං අධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

කථං ආදිවිසොධනට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අස්සද්ධිය[1] සංවරට්ඨෙන සීලවිසුද්ධි සද්ධින්ද්‍රියස්ස ආදිවිසොධනා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං කොසජ්ජ[2] සංවරට්ඨෙන සීලවිසුද්ධි විරියින්ද්‍රියස්ස ආදවිසොධනා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාද[3] සංවරට්ඨෙන සීලවිසුද්ධි සතින්ද්‍රියස්ස ආදිවිසොධනා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං උද්ධච්ච[4] සංවරට්ඨෙන සීලවිසුද්ධි සමාධින්ද්‍රියස්ස ආදිවිසොධනා දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අවිජ්ජා[5] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්ඤින්ද්‍රියස්ස ආදිවිසොධනා.

නෙක්ඛම්මෙ පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්ද[6] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා, අබ්‍යාපාදෙ පඤ්චින්ද්‍රියානි බ්‍යාපාද[7] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා, ආලොකසඤ්ඤාය පඤ්චින්ද්‍රියානි ථීනමිද්ධ[8] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා, අරහත්තමග්ගෙ පඤ්චින්ද්‍රියානි සබ්බකිලෙස[9] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා.

එවං ආදිවිසොධනට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

කථං අධිමත්තට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

සද්ධින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති, *ඡන්දවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, ඡන්දවසෙන පාමොජ්ජං උප්පජ්ජති, පාමොජ්ජවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, පාමොජ්ජවසෙන පීති උප්පජ්ජති, පීතිවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, පීතිවසෙන පස්සද්ධි උප්පජ්ජති, පස්සද්ධිවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, පස්සද්ධිවසෙන සුඛං උප්පජ්ජති, සුඛවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සුඛවසෙන ඔභාසො උප්පජ්ජති, ඔභාසවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, ඔභාසවසෙන සංවෙගො උප්පජ්ජති, සංවෙගවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සංවෙජෙත්වා චිත්තං සමාදහති, සමාධිවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති. තථා සමාහිතං චිත්තං සාධුකං පග්ගණ්හාති, පග්ගහවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, තථාපග්ගහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛති. උපෙක්ඛාවසෙන සද්ධාවසෙන

1. අස්සද්ධියං - සයා, සී 1 PTS. 2. කොසජ්ජං - සයා. සී 1, PTS.
3. පමාදං - සයා, සී 1.2, PTS. 4 උද්ධච්චං - සයා, සී 1.2, PTS 5 අවිජ්ජං - සයා PTS අවිජ්ජාය සී 2. 6. කාමච්ඡන්දං - සයා, සී 1, PTS. 7. බ්‍යාපාදං - සයා, සී 1 PTS
8. ථීනමිද්ධං - සයා. සී 1,2 ,PTS, ථීනමිද්ධ - මජසං. 9, සබ්බකිලෙසෙ - සයා සී 1, PTS.
* 'ඡන්දවසෙනා'ති ආදිං කත්වා යාව 'අස්සද්ධියස්සා'ති පදං සයා PTS පොත්ථකෙසු න දිස්සන්ති.

ව්‍යාපාදය දුරු කරන්නාහට අව්‍යාපාද වශයෙන් ... ථිනමිද්ධය දුරු කරන්නාහට ආලෝකසංඥා වශයෙන් ... හැම කෙලෙසුන් දුරු කරන්නාහට අර්හත්මාර්ගයාගේ වශයෙන් අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ශ්‍රද්ධෙන්ද්‍රියාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය දතයුතු යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ... හැම කෙලෙසුන් දුරු කරන්නාහට අර්හත්මාර්ගයාගේ වශයෙන් දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

මෙසෙයින් අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ යි.

කිසෙයින් ආදිවිශොධනාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය වෙයි. අශ්‍රද්ධා සංවරාර්ථයෙන් ශීල-විශුද්ධිය ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදි (ශීල) විශොධන යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය වෙයි. කෞසීද්‍ය සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආදිවිශොධන යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය වෙයි. ප්‍රමාද සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය ස්මෘතීන්ද්‍රියයට ආදිවිශොධන යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වෙයි. ඖද්ධත්‍යසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය සමාධීන්ද්‍රියයට ආදිවිශොධන යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය වෙයි, අවිද්‍යාසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය ප්‍රඥෙන්ද්‍රියයට ආදිවිශොධන යි.

නෛෂ්ක්‍රම්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වෙති, කාමච්ඡන්ද සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශොධන යැ, අව්‍යාපාදයෙහි පඤ්චෙන්ද්‍රි-යයෝ වෙති, ව්‍යාපාද සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශො-ධන යැ, ආලෝකසංඥායෙහි පඤ්චෙන්ද්‍රියයෝ වෙති, ථිනමිද්ධ සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශොධන යැ අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රි-යයෝ වෙති, සර්වක්ලෙශසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවි-ශොධන යි.

මෙසෙයින් ආදිවිශොධනාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

කිසෙයින් අධිමාත්‍රාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ භාවනායෙහි කුශලච්ඡන්දය උපදී. ඡන්ද වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර (බලවත්) වෙයි, ඡන්ද වශයෙන් ප්‍රාමොද්‍යය උපදී. ප්‍රාමොද්‍යවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, ප්‍රාමොද්‍යවශයෙන් ප්‍රීතිය උපදී, ප්‍රීතිවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, ප්‍රශ්‍රබ්ධිවශයෙන් සුඛය උපදී, සුඛවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, සුඛවශයෙන් ඥානාවභාසය උපදී. අවභාසවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, අවභාස වශයෙන් සංවෙගය උපදී, සංවෙගවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, සංවෙග උපදවා සිත සමාහිත කෙරෙයි, සමාධි වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, එසෙයින් සමාහිත වූ සිත (ලීනොද්ධතභාවයෙන් මිදී) මොනොවට ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, එසෙයින් ප්‍රග්‍රහ කරන ලද සිත මොනොවට අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි, උපෙක්‍ෂාවශයෙන් ශ්‍රද්ධාවශයෙන්

සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, උපෙක්ඛාවසෙන නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති, විමොක්ඛවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනාවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, භාවිතත්තා තතො පණීතතරෙ විවට්ටන්ති, විවට්ටනාවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, විවට්ටිතත්තා තතො වොස්සජ්ජති.[1] වොස්සග්ගවසෙන[2] සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, වොස්සජ්ජිතත්තා[3] තතො නිරුජ්ඣන්ති, නිරොධවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, නිරොධවසෙන ද්වෙ වොස්සග්ගා: පරිච්චාගවොස්සග්ගො ච පක්ඛන්දනවොස්සග්ගො ච, කිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතීති පරිච්චාගවොස්සග්ගො, නිරොධනිබ්බානධාතුයා චිත්තං පක්ඛන්දතීති පක්ඛන්දනවොස්සග්ගො, නිරොධවසෙන ඉමෙ ද්වෙ වොස්සග්ගා.

අස්සද්ධියස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අස්සද්ධියපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- දිට්ඨෙකට්ඨානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- ඔළාරිකානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අණුසහගතානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති, ඡන්දවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති -පෙ-

විරියින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- කොසජ්ජස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- කොසජ්ජපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- දිට්ඨෙකට්ඨානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

සතින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- පමාදස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- පමාදපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

සමාධින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- උද්ධච්චස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- උද්ධච්ච පරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං සහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

1. වොසජ්ජති - මජසං,
2. වොසග්ගවසෙන - මජසං,
3. වොසජ්ජිතත්තා - මජසං,

ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, උපෙක්ෂාවශයෙන් නානාස්වභාව වූ කෙලෙසුන් කෙරෙන් සිත මිදෙයි, විමොක්ෂවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, (නානාස්වභාව කෙලෙසුන් කෙරෙන්) විමුක්ත බැවින් ඒ (ඡන්දාදි) ධර්මයෝ එකරස (එකකෘත්‍ය) වෙති. එකරසාර්ථයෙන් භාවනා-වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, භාවිත බැවින් ඒ විදර්ශනාලම්බනයට වඩා ප්‍රණීතතර (නිර්වාණාලම්බන) යෙහි නවතිත්. විවර්තන වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, විවර්තිත (නැවැතුණු) බැවින් එහෙයින් මැ (කෙලෙසුන් හා ස්කන්ධයන් හා) දුරු කෙරෙයි, දුරලීම් වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, දුරලූ බැවින් එකරුණෙන් මැ (කෙලෙස් හා ස්කන්ධයෝ හා) නිරුද්ධ වෙති, නිරොධ-වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, නිරොධවශයෙන් වොස්සග්ග දෙකෙකි: පරිච්චාගවොස්සග්ග යැ පක්ඛන්දනවොස්සග්ග යි. කෙලෙසුන් හා ස්කන්ධයන් හා දුරු කෙරේ නු යි පරිච්චාගවොස්සග්ග නම. නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත ප්‍රස්කන්දනය කෙරේ නු යි පක්ඛන්දන වොස්සග්ග නම්. නිරොධවශයෙන් මේ වොස්සග්ගයෝ දෙදෙන වෙත්.

අශ්‍රද්ධාභාවයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අශ්‍රද්ධාපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... දෘෂ්ටිය හා එකස්වභාව වූ කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ඖදාරික කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අණුසහගත කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී, ඡන්දවශයෙන් ශ්‍රද්ධා වශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමාත්‍ර වෙයි ...

වීර්යෙන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... කෞසීද්‍යයාගේ දුරලීම පිණිස ඡන්දය උපදී ... කෞසීද්‍යපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... දෘෂ්ටිය හා එකස්වභාව වූ කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සර්වකෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

ස්මෘතීන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... ප්‍රමාදයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ප්‍රමාදපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

සමාධීන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... ඖද්ධත්‍යයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ඖද්ධත්‍යපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

පඤ්ඤින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- අවිජ්ජාය පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අවිජ්ජාපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- දිට්ඨෙකට්ඨානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- ඔළාරිකානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අණුසහගතානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති, ඡන්දවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, ඡන්දවසෙන පාමොජ්ජං උප්පජ්ජති, පාමොජ්ජවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පාමොජ්ජවසෙන පීති උප්පජ්ජති, පීතිවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පීතිවසෙන පස්සද්ධි උප්පජ්ජති, පස්සද්ධිවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති. පස්සද්ධිවසෙන සුඛං උප්පජ්ජති, සුඛවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, සුඛවසෙන ඔභාසො උප්පජ්ජති, ඔභාසවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, ඔභාසවසෙන සංවෙගො උප්පජ්ජති, සංවෙගවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, සංවෙජෙත්වා[1] චිත්තං සමාදහති, සමාධිවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, තථා සමාහිතං චිත්තං සාධුකං පග්ගණ්හාති, පග්ගහවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, තථා පග්ගහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛති, උපෙක්ඛාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති. උපෙක්ඛාවසෙන නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති, විමොක්ඛවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති, එකරසට්ඨෙන[2] භාවනාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, භාවිතත්තා තතො පණීතතරෙ විවට්ටනති[3] විවට්ටනාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, විවට්ටිතත්තා තතො වොස්සජ්ජති[4] වොස්සග්ගවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, වොස්සජ්ජිතත්තා තතො නිරුජ්ඣන්ති, නිරොධවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, නිරොධවසෙන ද්වෙ වොස්සග්ගා: පරිච්චාගවොස්සග්ගො ච, පක්ඛන්දනවොස්සග්ගො ච, කිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතීති පරිච්චාගවොස්සග්ගො, නිරොධනිබ්බානධාතුයා චිත්තං පක්ඛන්දතීති පක්ඛන්දනවොස්සග්ගො, නිරොධවසෙන ඉමෙ ද්වෙ වොස්සග්ගා.

එවං අධිමත්තට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

භාණවාරො දුතියො[5]

කථං අධිට්ඨානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

සද්ධින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති, ඡන්දවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිට්ඨාති, ඡන්දවසෙන පාමොජ්ජං උප්පජ්ජති, පාමොජ්ජවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිට්ඨාති. -පෙ-

එවං අධිට්ඨානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

1. සංවෙජෙත්වා - PT  2 එකරසට්ඨෙන - මජසං පොත්ථකෙ නත්ථි,
3. විවත්තනානි - සී 1  4. වොසජ්ජති - මජසං.  5. භාණවාරං නිට්ඨිතං - ස්‍යා, සී, PTS

ප්‍රඥෙන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අවිද්‍යාපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... දෘෂ්ටිය හා එකස්වභාව වූ කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ඖදාරික කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අණුසහගත කෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

සර්වකෙලශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී, ඡන්දවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වෙයි. ඡන්දවශයෙන් ප්‍රාමොද්‍යය උපදී, ප්‍රාමොද්‍ය වශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. ප්‍රාමොද්‍යවශයෙන් ප්‍රීතිය උපදී, ප්‍රීතිවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. ප්‍රීතිවශයෙන් ප්‍රශ්‍රබ්ධිය උපදී. ප්‍රශ්‍රබ්ධිවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. ප්‍රශ්‍රබ්ධිවශයෙන් සුඛය උපදී, සුඛවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. සුඛවශයෙන් අවභාසය උපදී, අවභාස වශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. අවභාස වශයෙන් සංවෙගය උපදී, සංවෙගවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. සංවෙග දනවා සිත සමාහිත කෙරෙයි, සමාධිවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. එසේ සමාහිත වූ සිත මොනොවට ප්‍රග්‍රහ කෙරෙයි. ප්‍රග්‍රහවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. එසේ ප්‍රගෘහීත වූ සිත මොනොවට අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි, උපෙක්‍ෂා වශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. උපෙක්‍ෂාවශයෙන් නානාස්වභාව වූ කෙලෙසුන් කෙරෙන් සිත මිදෙයි, විමොක්‍ෂවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. විමුක්ත බැවින් ඒ (ඡන්දාදි) ධර්මයෝ එකකෘත්‍ය වෙති, එකකෘත්‍ය වූ භාවනාවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. භාවිත බැවින් එයට වඩා ප්‍රණීතතර වූ අරමුණෙහි නවතිත්. විවර්තනාවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. විවර්තිත බැවින් එයින් මැ (කෙලෙසුන් ද ස්කන්ධයන් ද) දුරු කෙරෙයි. වොස්සග්ගවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. දුරලූ බැවින් එකරුණින් මැ කෙලෙසුන් හා ස්කන්ධයන් හා අනුත්පාද නිරොධවශයෙන් නිරුද්ධ වෙති. නිරොධවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. නිරොධවශයෙන් වොස්සග්ගයෝ දෙදෙනෙකි: පරිච්චාගවොස්සග්ග සැ පක්ඛන්දනවොස්සග්ග යි. කෙලෙසුන් ද ස්කන්ධයන් ද දුරු කෙරේ නු යි පරිච්චාගවොස්සග්ග නම්, නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත ප්‍රස්කන්දනය කෙරේ නු යි පක්ඛන්දන-වොස්සග්ග නම්. නිරොධවශයෙන් මේ වොස්සග්ගයෝ දෙදෙන වෙත්.

මෙසේ අධිමාත්‍රාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**දෙවැනි බණවර යි.**

කිසෙයින් අධිෂ්ඨානාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ භාවනායෙහි කුශලච්ඡන්දය උපදී. ඡන්දවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය පිහිටයි. ඡන්දවශයෙන් ප්‍රාමොද්‍යය උපදී. ප්‍රාමොද්‍යවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය පිහිටයි ...

මෙසෙයින් අධිෂ්ඨානාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ යි.

කථං පරියාදානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අස්සද්ධියං පරියාදියති. අස්සද්ධියපරිළාහං පරියාදියති. පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං කොසජ්ජං පරියාදියති, කොසජ්ජපරිළාහං පරියාදියති. උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාදං පරියාදියති, පමාදපරිළාහං පරියාදියති. අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං උද්ධච්චං පරියාදියති, උද්ධච්චපරිළාහං පරියාදියති. දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අවිජ්ජං පරියාදියති, අවිජ්ජාපරිළාහං පරියාදියති.

නෙක්ඛම්මෙ පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්දං පරියාදියන්ති, අබ්‍යාපාදෙ පඤ්චින්ද්‍රියානි බ්‍යාපාදං පරියාදියන්ති. ආලොකසඤ්ඤාය පඤ්චින්ද්‍රියානි ථිනමිද්ධං පරියාදියන්ති. අවික්ඛෙපෙ පඤ්චින්ද්‍රියානි උද්ධච්චං පරියාදියන්ති. -පෙ- අරහත්තමග්ගෙ පඤ්චින්ද්‍රියානි සබ්බකිලෙසෙ පරියාදියන්ති.

එවං පරියාදානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

කථං පතිට්ඨාපකට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

සද්ධො සද්ධින්ද්‍රියං අධිමොක්ඛෙ පතිට්ඨාපෙති, සද්ධස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛෙ පතිට්ඨාපෙති. විරියවා විරියින්ද්‍රියං පග්ගහෙ පතිට්ඨාපෙති විරියවතො විරියින්ද්‍රියං පග්ගහෙ පතිට්ඨාපෙති. සතිමා සතින්ද්‍රියං උපට්ඨානෙ පතිට්ඨාපෙති, සතිමතො සතින්ද්‍රියං උපට්ඨානෙ පතිට්ඨාපෙති. සමාහිතො සමාධින්ද්‍රියං අවික්ඛෙපෙ පතිට්ඨාපෙති, සමාහිතස්ස සමාධින්ද්‍රියං අවික්ඛෙපෙ පතිට්ඨාපෙති. පඤ්ඤවා පඤ්ඤින්ද්‍රියං දස්සනෙ පතිට්ඨාපෙති, පඤ්ඤවතො පඤ්ඤින්ද්‍රියං දස්සනෙ පතිට්ඨාපෙති.

යොගාවචරො පඤ්චින්ද්‍රියානි නෙක්ඛම්මෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි නෙක්ඛම්මෙ පතිට්ඨාපෙති. යොගාවචරො පඤ්චින්ද්‍රියානි අබ්‍යාපාදෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි අබ්‍යාපාදෙ පතිට්ඨාපෙති. යොගාවචරො පඤ්චින්ද්‍රියානි ආලොකසඤ්ඤාය පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි ආලොකසඤ්ඤාය පතිට්ඨාපෙති. යොගාවචරො පඤ්චින්ද්‍රියානි අවික්ඛෙපෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි අවික්ඛෙපෙ පතිට්ඨාපෙති -පෙ- යොගාවචරො පඤ්චින්ද්‍රියානි අරහත්තෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි අරහත්තෙ පතිට්ඨාපෙති.

එවං පතිට්ඨාපකට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

## චතුත්ථසුත්තන්තනිද්දෙසො.

පුථුජ්ජනො සමාධිං භාවෙන්තො[1] කතිහාකාරෙහි උපට්ඨානකුසලො හොති, සෙක්ඛො[2] සමාධිං භාවෙන්තො කතිහාකාරෙහි උපට්ඨානකුසලො හොති, වීතරාගො සමාධිං භාවෙන්තො කතිහාකාරෙහි උපට්ඨානකුසලො හොති:

පුථුජ්ජනො සමාධිං භාවෙන්තො සත්තහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති. සෙක්ඛො සමාධිං භාවෙන්තො අට්ඨහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති. වීතරාගො සමාධිං භාවෙන්තො දසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති.

1 භාවයන්තො - PTS 2 සෙඛො - PTS සී

කිසෙයින් පයර්‍යාදනාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අශ්‍රද්ධාව ක්‍ෂය කෙරෙයි, අශ්‍රද්ධාපරිදාහය ක්‍ෂය කෙරෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රිය තෙමේ කුසීද බව ක්‍ෂය කෙරෙයි, කෞසීද්‍යපරිදාහය ක්‍ෂය කෙරෙයි, උපස්ථානාර්ථයෙන් සමෘතීන්ද්‍රිය තෙමේ ප්‍රමාදය ක්‍ෂය කෙරෙයි, ප්‍රමාද පරිදාහය ක්‍ෂය කෙරෙයි, අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය තෙමේ උද්ධතභාවය ක්‍ෂය කෙරෙයි, ඖද්ධත්‍යපරිදාහය ක්‍ෂය කෙරෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය තෙමේ අවිද්‍යාව ක්‍ෂය කෙරෙයි, අවිද්‍යාපරිදාහය ක්‍ෂය කෙරෙයි.

නෛෂ්ක්‍රම්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ කාමච්ඡන්දය ක්‍ෂය කෙරෙත්, අව්‍යාපාදයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ව්‍යාපාදය ක්‍ෂය කෙරෙති, ආලොකසංඥායෙහි පඤ්චෙන්ද්‍රියයෝ ථිනමිද්ධය ක්‍ෂය කෙරෙති, අවික්‍ෂෙපයෙහි පඤ්චෙන්ද්‍රියයෝ උද්ධතභාවය ක්‍ෂය කෙරෙති ... අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ හැම කෙලෙසුන් ක්‍ෂය කෙරෙත්.

මෙසෙයින් පයර්‍යාදනාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

කිසෙයින් ප්‍රතිෂ්ඨාපකාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ශ්‍රද්ධා ඇත්තේ ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂයෙහි පිහිටුවයි, ශ්‍රද්ධා ඇතියහුගේ ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂයෙහි පිහිටුවයි, වීර්‍ය ඇත්තේ වීර්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහයෙහි පිහිටුවයි, වීර්‍ය ඇතියහුගෙ වීර්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහයෙහි පිහිටුවයි, සිහි ඇත්තේ සමෘතීන්ද්‍රියය උපස්ථානයෙහි පිහිටුවයි, සිහි ඇතියහුගේ සමෘතීන්ද්‍රියය උපස්ථානයෙහි පිහිටුවයි, සමාහිත වූයේ සමාධීන්ද්‍රියය අවික්‍ෂෙපයෙහි පිහිටුවයි, සමාහිත වූවහුගේ සමාධීන්ද්‍රියය අවික්‍ෂෙපයෙහි පිහිටුවයි, ප්‍රඥා ඇත්තේ ප්‍රඥෙන්ද්‍රියය දර්ශනයෙහි පිහිටුවයි, ප්‍රඥා ඇතියහුගේ ප්‍රඥෙන්ද්‍රියය දර්ශනයෙහි පිහිටුවා.

යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් නෛෂ්ක්‍රම්‍යයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් නෛෂ්ක්‍රම්‍යයෙහි පිහිටුවයි, යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් අව්‍යාපාදයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් අව්‍යාපාදයෙහි පිහිටුවයි, යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් ආලොකසංඥායෙහි පිහිටුවයි, යොගාවොචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් ආලොකස ඥායෙහි පිහිටුවයි, යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් අවික්‍ෂෙපයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් අවික්‍ෂෙපයෙහි පිහිටුවයි .. යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් අර්හත්ත්වයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් අර්හත්ත්වයෙහි පිහිටුවා.

මෙසෙයින් ප්‍රතිෂ්ඨාපකාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

## චතුර්ථසූත්‍ර නිර්දේශ යි.

පෘථග්ජන තෙම (නිර්වේදභාගිය) සමාධිය වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, ශෛක්‍ෂ තෙම සමාධිය වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, වීතරාග (රහත්) තෙම සමාධිය වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

පෘථග්ජන තෙම සමාධිය වඩනුයේ සත් අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි. ශෛක්‍ෂ තෙම සමාධිය වඩනුයේ අට අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම සමාධිය වඩනුයේ දස අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

පුථුජ්ජනො සමාධිං භාවෙන්තො කතමෙහි සත්තහාකාරෙහි උපට්ඨානකුසලො හොති:

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලො හොති, සමථනිමිත්තූපට්ඨානකුසලො හොති, පග්ගහනිමිත්තූපට්ඨානකුසලො හොති, අවික්ඛෙපූපට්ඨානකුසලො හොති, ඔභාසූපට්ඨානකුසලො හොති, සම්පහංසනූපට්ඨානකුසලො හොති, උපෙක්ඛූපට්ඨානකුසලො හොති. පුථුජ්ජනො සමාධිං භාවෙන්තො ඉමෙහි සත්තහාකාරෙහි උපට්ඨානකුසලො හොති.

සෙක්ඛො සමාධිං භාවෙන්තො කතමෙහි අට්ඨහා'කාරෙහි උපට්ඨානකුසලො හොති:

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලො හොති, -පෙ- උපෙක්ඛූපට්ඨානකුසලො හොති, එකත්තූපට්ඨානකුසලො හොති. සෙක්ඛො සමාධිං භාවෙන්තො ඉමෙහි අට්ඨහාකාරෙහි උපට්ඨානකුසලො හොති.

වීතරාගො සමාධිං භාවෙන්තො කතමෙහි දසහාකාරෙහි උපට්ඨානකුසලො හොති:

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලො හොති -පෙ- එකත්තූපට්ඨානකුසලො හොති, ඤාණූපට්ඨානකුසලො හොති, විමුත්තූපට්ඨානකුසලො[3] හොති. වීතරාගො සමාධිං භාවෙන්තො ඉමෙහි දසහා'කාරෙහි උපට්ඨානකුසලො හොති.

පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො[1] කතිහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතිහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති, සෙක්ඛො[2] විපස්සනං භාවෙන්තො කතිහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතිහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති, වීතරාගො විපස්සනං භාවෙන්තො කතිහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතිහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති:

පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො නවහාකාරෙහි උපට්ඨානකුසලො හොති, නවහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති. සෙක්ඛො විපස්සනං භාවෙන්තො දසහාකාරෙහි උපට්ඨානකුසලො හොති, දසහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති. වීතරාගො විපස්සනං භාවෙන්තො ද්වාදසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති, ද්වාදසහි ආකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො[1] කතමෙහි නවහාකාරෙහි උපට්ඨානකුසලො හොති, කතමෙහි නවහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති:

අනිච්චතො උපට්ඨානකුසලො හොති, නිච්චතො අනුපට්ඨානකුසලො හොති, දුක්ඛතො උපට්ඨානකුසලො හොති, සුඛතො අනුපට්ඨානකුසලො හොති, අනත්තතො උපට්ඨානකුසලො හොති, අත්තතො අනුපට්ඨානකුසලො හොති, ඛයතො උපට්ඨානකුසලො හොති, ඝනතො අනුපට්ඨානකුසලො හොති. වයතො උපට්ඨානකුසලො හොති, ආයූහනානුපට්ඨානකුසලො හොති. විපරිණාමූපට්ඨානකුසලො හොති, ධුවතො අනුපට්ඨානකුසලො හොති, අනිමිත්තූපට්ඨානකුසලො හොති, නිමිත්තානුපට්ඨානකුසලො හොති. අප්පණිහිතූපට්ඨානකුසලො හොති, පණිධානුපට්ඨානකුසලො හොති, සුඤ්ඤතූපට්ඨානකුසලො හොති, අභිනිවෙසානුපට්ඨානකුසලො හොති. පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො ඉමෙහි නවහාකාරෙහි උපට්ඨානකුසලො හොති, ඉමෙහි නවහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

---

1. භාවයන්තො - PTS. 2. සෙඛො - PTS, සී. 3 චිත්තූපට්ඨානකුසලො - සතා.

පෘථග්ජන තෙම සමාධිය වඩනුයේ කවර සත් අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි යත්:

ආවර්ජනා කළ බැවින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ශමථ-නිමිත්තට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ප්‍රග්‍රහනිමිත්තට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අවික්ෂෙපයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අවභාසයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, සම්ප්‍රහර්ෂණයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, උපෙක්ෂාවට එළඹ සිටීමෙහි නිපුණ වෙයි, පෘථග්ජන තෙම සමාධිය වඩනුයේ මේ සත් අයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

ශෛක්‍ෂ තෙම සමාධිය වඩනුයේ කවර අටඅයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි යත්:

ආවර්ජනා කළ බැවින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි ... උපෙක්ෂා-වට එළඹසිටීමෙහි නිපුණ වෙයි. (නෛෂ්ක්‍රම්‍යාදි) එකත්වයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ශෛක්‍ෂ තෙම සමාධිය වඩනුයේ මේ අටඅයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

වීතරාග තෙම සමාධිය වඩනුයේ කවර දස අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි යත්:

ආවර්ජනා කළ බැවින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි ... එකත්වයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, (අසම්මොහ) ඥානයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, (අර්හත්ඵල) විමුක්තියට එළඹසිටීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම සමාධිය වඩනුයේ මේ දස අයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වේ ද, කිහි අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද, ශෛක්‍ෂ තෙම විදර්ශනා වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කිහි අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද, වීතරාග (රහත්) තෙම විදර්ශනා වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කිහි අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ නව අයුරෙකින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වෙයි, නව අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ශෛක්‍ෂ තෙම විදර්ශනා වඩනුයේ දස අයුරෙකින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වෙයි, දස අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම විදර්ශනා වඩනුයේ දොළොස් අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, දොළොස් අයුරෙකින් අරමුණට නො එළඹ සිටීමෙහි නිපුණ වේ.

පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ කවර නව අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කවර නව අයුරෙකින් අරමුණට නො එළඹ සිටීමෙහි නිපුණ වේ ද යත්:

අනිත්‍ය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිත්‍ය විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. දුඃඛ විසින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වෙයි, සුඛ විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. අනාත්ම විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ආත්ම විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ක්‍ෂය විසින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වෙයි, ඝන විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි, ව්‍යය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ආයූහනයට නො එළඹ සිටීමෙහි නිපුණ වෙයි. විපරිණාමයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ධ්‍රැව විසින් නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. අනිමිත්තයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිමිත්තයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. අප්‍රණිහිතයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ප්‍රණිධියට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි, ශූන්‍යතයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අභිනිවෙශයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ මේ නවඅයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, මේ නවඅයුරින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ.

සෙක්ඛො විපස්සනං භාවෙන්තො කතමෙහි දසහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතමෙහි දසහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති:

අනිච්චතො උපට්ඨානකුසලො හොති, නිච්චතො අනුපට්ඨානකුසලො හොති -පෙ- සුඤ්ඤතූපට්ඨානකුසලො හොති, අභිනිවෙසානුපට්ඨානකුසලො හොති. ඤාණූපට්ඨානකුසලො හොති, අඤ්ඤාණානුපට්ඨානකුසලො හොති. සෙක්ඛො විපස්සනං භාවෙන්තො ඉමෙහි දසහාකාරෙහි උපට්ඨානකුසලො හොති, ඉමෙහි දසහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

වීතරාගො විපස්සනං භාවෙන්තො කතමෙහි ද්වාදසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති, කතමෙහි ද්වාදසහි ආකාරෙහි අනුපට්ඨානකුසලො හොති:

අනිච්චතො උපට්ඨානකුසලො හොති, නිච්චතො අනුපට්ඨානකුසලො හොති -පෙ- ඤාණූපට්ඨානකුසලො හොති, අඤ්ඤාණානුපට්ඨානකුසලො හොති, විසඤ්ඤොගූපට්ඨානකුසලො හොති, සඤ්ඤොගානුපට්ඨානකුසලො හොති. නිරොධූපට්ඨානකුසලො හොති, සඞ්ඛාරානුපට්ඨානකුසලො හොති. වීතරාගො විපස්සනං භාවෙන්තො ඉමෙහි ද්වාදසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති, ඉමෙහි ද්වාදසහි ආකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලවසෙන ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති, -පෙ- ධම්මෙ සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

**ඉන්ද්‍රියානි සමොධානෙතීති** කථං ඉන්ද්‍රියානි සමොධානෙති: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං සමොධානෙති, -පෙ- සමථනිමිත්තූපට්ඨානකුසලවසෙන -පෙ- පග්ගහනිමිත්තූපට්ඨානකුසලවසෙන -පෙ- අවික්ඛෙපූපට්ඨානකුසලවසෙන -පෙ- ඔභාසූපට්ඨානකුසලවසෙන -පෙ- සම්පහංසනූපට්ඨානකුසලවසෙන -පෙ- උපෙක්ඛූපට්ඨානකුසලවසෙන -පෙ- එකත්තූපට්ඨානකුසලවසෙන -පෙ- ඤාණූපට්ඨානකුසලවසෙන -පෙ- විමුත්තූපට්ඨාන[1] කුසලවසෙන -පෙ-.

අනිච්චතො උපට්ඨානකුසලවසෙන -පෙ- නිච්චතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- දුක්ඛතො උපට්ඨානකුසලවසෙන -පෙ- සුඛතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- අනත්තතො උපට්ඨානකුසලවසෙන -පෙ- අත්තතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- භයතො උපට්ඨානකුසලවසෙන -පෙ- ඝනතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- වයතො උපට්ඨානකුසලවසෙන -පෙ- ආයූහනානුපට්ඨානකුසලවසෙන -පෙ- විපරිනාමූපට්ඨානකුසලවසෙන -පෙ- ධුවතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- අනිමිත්තූපට්ඨානකුසලවසෙන -පෙ- නිමිත්තානුපට්ඨානකුසලවසෙන -පෙ- අප්පණිහිතූපට්ඨානකුසලවසෙන -පෙ- පණිධානුපට්ඨාන[2]කුසලවසෙන -පෙ- සුඤ්ඤතූපට්ඨානකුසලවසෙන -පෙ- අභිනිවෙසානුපට්ඨානකුසලවසෙන -පෙ- ඤාණූපට්ඨානකුසලවසෙන -පෙ- අඤ්ඤාණානුපට්ඨානකුසලවසෙන -පෙ- විසඤ්ඤොගූපට්ඨානකුසලවසෙන -පෙ- සඤ්ඤොගානුපට්ඨානකුසලවසෙන -පෙ- නිරොධූපට්ඨානකුසලවසෙන -පෙ- සඞ්ඛාරානුපට්ඨානකුසලවසෙන ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

---

1 චිත්තූපට්ඨාන - ස්‍යා, 2. පණිධිඅනුපට්ඨාන - මජසං

ශෛක්ෂ තෙම විදර්ශනා වඩනුයේ කවර දසඅයුරෙකින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වේ ද, කවර දසඅයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

අනිත්‍ය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිත්‍ය විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි ... ශූන්‍යතයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අභිනිවේශයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ඥානයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අඥානයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ශෛක්ෂ තෙම විදර්ශනා වඩනුයේ මේ දසඅයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, මේ දසඅයුරින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ.

වීතරාග තෙම විදර්ශනා වඩනුයේ කවර දෙළොස්අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කවර දෙළොස්අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

අනිත්‍ය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිත්‍ය විසින් අරමුණට නො එළඹීමෙහි නිපුණ වෙයි ... ඥානයට එළඹීමෙහි නිපුණ වෙයි, අඥානයට නො එළඹීමෙහි නිපුණ වෙයි. විසංයොගයට එළඹීමෙහි නිපුණ වෙයි, සංයොගයට නො එළඹීමෙහි නිපුණ වෙයි. නිරොධයට එළඹීමෙහි නිපුණ වෙයි, සංස්කාරයනට නො එළඹීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම විදර්ශනා වඩනුයේ මේ දෙළොස් අයුරින් අරමුණට එළඹීමෙහි නිපුණ වෙයි, මේ දෙළොස් අයුරින් අරමුණට නො එළඹීමෙහි නිපුණ වේ.

ආවර්ජනා කළ බැවින් ආලම්බනොපස්ථානයෙහි කෞශල්‍ය (නිපුණ බව) වශයෙන් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, (අරමුණෙහි පිහිටුවයි) අරමුණ ද දැනගනී, ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරෙයි ... ධර්මයන් සමවධාන කෙරෙයි, අරමුණ ද දැනගනී, ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

**ඉන්ද්‍රියානි සමොධානෙති** යනු: කිසෙයින් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි යත්: අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය සමවධාන කෙරෙයි ... සමථනිමිත්තොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... ප්‍රග්‍රහනිමිත්තොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... අවික්ෂෙපොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... අවභාසොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... සම්ප්‍රහර්ෂණොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... උපෙක්ෂොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... එකත්වොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... ඥානොපස්ථානයෙහි කෞශල්‍ය වශයෙන් ... විමුක්ත්‍යුපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ...

අනිත්‍ය විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... නිත්‍ය විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... දුඃඛ විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... සුඛ විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අනාත්ම විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍ය වශයෙන් ... ආත්ම විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ක්ෂය විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ඝන විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ව්‍යය විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ආයූහනයට නො එළඹීමෙහි කෞශල්‍ය වශයෙන් ... විපරිණාමයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ධ්‍රැව විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අනිමිත්තයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... නිමිත්තයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අප්‍රණිහිතයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ප්‍රණිධියට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ශූන්‍යතයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අභිනිවෙශයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ඥානයට එළඹසිටීමෙහි කෞශල්‍යවශයෙන් ... අඥානයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... විසංයොගයට එළඹසිටීමෙහි කෞශල්‍යවශයෙන් ... සංයොගයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... නිරොධයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... සංස්කාරයනට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, අරමුණ ද දැනගනී, ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණන්නං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං, කතමෙසං තිණ්ණන්නං ඉන්ද්‍රියානං: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස අඤ්ඤින්ද්‍රියස්ස අඤ්ඤාතාවින්ද්‍රියස්ස.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤාතාවින්ද්‍රියං කති ඨානානි ගච්ඡති:

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං එකං ඨානං ගච්ඡති, සොතාපත්තිමග්ගං. අඤ්ඤින්ද්‍රියං ඡ ඨානානි ගච්ඡති, සොතාපත්තිඵලං. සකදාගාමිමග්ගං සකදාගාමිඵලං අනාගාමිමග්ගං අනාගාමිඵලං අරහත්තමග්ගං, අඤ්ඤාතාවින්ද්‍රියං එකං ඨානං ගච්ඡති, අරහත්තඵලං.

සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං පග්ගහපරිවාරං හොති, සතින්ද්‍රියං උපට්ඨානපරිවාරං හොති, සමාධින්ද්‍රියං අවික්ඛෙපපරිවාරං හොති, පඤ්ඤින්ද්‍රියං දස්සනපරිවාරං හොති, මනින්ද්‍රියං විජානනපරිවාරං හොති, සොමනස්සින්ද්‍රියං අභිසන්දනපරිවාරං[1] හොති, ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. සොතාපත්තිමග්ගක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව කුසලා හොන්ති ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව නිය්‍යානිකා හොන්ති, සබ්බෙව අපචයගාමිනො හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති. සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.[2]

සොතාපත්තිඵලක්ඛණෙ -පෙ- අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති -පෙ- ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. අරහත්තඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති. අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති. -පෙ- තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච. ඉති ඉමානි අට්ඨට්ඨකානි[3] චතුසට්ඨි හොන්ති.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති; එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති. සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති. අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති; අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති.

---

1 අභිනන්දනපරිවාරං - ස්‍යා, PTS  2. පරිවාරා - සී 1,  3. අට්ඨකානි - PTS, අට්ඨඅට්ඨකානි - මජසං, අට්ඨාධිකානි - සී 1

සූසැට අයුරෙකින් තුන් ඉන්ද්‍රියයන්ගේ වශීභාවයෙහි පැවැති ප්‍රඥාව ආශ්‍රවයන්ගේ ක්‍ෂයඥාන වෙයි. කවර තුන් ඉන්ද්‍රිය කෙනකුන්ගේ ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයාගේ ද අඤ්ඤින්ද්‍රියයාගේ ද අඤ්ඤාතාවින්ද්‍රියයාගේ යි.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය කිහි තැනෙක උපදී ද, අඤ්ඤින්ද්‍රිය කිහි තැනෙක උපදී ද, අඤ්ඤාතාවින්ද්‍රිය කිහි තැනෙක උපදී ද යත්:

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය එක් තැනෙක උපදී: සෝතාපත්තිමාර්ගයෙහි යැ, අඤ්ඤින්ද්‍රිය සතැනෙක උපදී: ස්‍රොතාපත්තිඵලයෙහි යැ සකෘදාගාමිමාර්ගයෙහි යැ සකෘදාගාමිඵලයෙහි යැ අනාගාමිමාර්ගයෙහි යැ අනාගාමිඵලයෙහි යැ අර්හත්මාර්ගයෙහි යි. අඤ්ඤාතාවින්ද්‍රිය එක් තැනෙක උපදී: අර්හත්ඵලයෙහි යි.

ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අධිමොක්‍ෂාර්ථයෙන් පිරිවර වෙයි, වීර්යෙන්ද්‍රිය තෙමේ ප්‍රග්‍රහාර්ථයෙන් පිරිවර වෙයි, ස්මෘතීන්ද්‍රිය තෙමේ උපස්ථානාර්ථයෙන් පිරිවර වෙයි, සමාධීන්ද්‍රිය තෙමේ අවික්‍ෂෙපාර්ථයෙන් පිරිවර වෙයි, ප්‍රඥෙන්ද්‍රිය තෙමේ දර්ශනාර්ථයෙන් පිරිවර වෙයි, මනින්ද්‍රිය තෙමේ විජානනාර්ථයෙන් පිරිවර වෙයි, සෞමනස්සින්ද්‍රිය තෙමේ අභිසන්දන (චිත්තචෛතසිකයන් තෙමන) අර්ථයෙන් පිරිවර වෙයි, ජීවිතින්ද්‍රිය තෙමේ ප්‍රවෘත්තිසන්තතියට අධිපතිභාවයෙන් පිරිවර වෙයි, ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ කුසල් වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ නෛර්යාණික වෙති, සියල්ලෝ මැ අපචයගාමී වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති, ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පිරවර වෙති, අන්‍යෝ’න්‍යභාවයෙන් පිරිවර වෙති. නිශ්‍රයභාවයෙන් පිරවර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පිරිවර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙති, ඒ අෂ්ටෙන්ද්‍රිය ධර්මයෝ මැ ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

ස්‍රොතාපත්තිඵලක්‍ෂණයෙහි ... අර්හත්ඵලක්‍ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අධිමොක්‍ෂාර්ථයෙන් පිරිවර වෙයි ... ජීවිතින්ද්‍රිය තෙමේ ප්‍රවෘත්තිසන්තතියට අධිපතිභාවයෙන් පිරිවර වෙයි, අර්හත්ඵලක්‍ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ අව්‍යාකෘත වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝමැ නිර්වාණාලම්බන වෙති, අර්හත්ඵලක්‍ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පිරිවර වෙති ... ඒ ධර්මයෝ මැ ඒ අඤ්ඤාතාවින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙති. මෙසේ මේ අෂ්ටකයෝ අටදෙන සූසැටක් වෙත්.

**ආසවා** යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

කොතැන්හි කෙලෙ ආස්‍රවයෝ ක්‍ෂය වෙති යත්: ස්‍රොතාපත්තිමාර්ගයෙන් නිරවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි, අපායගමනීය වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි, අපායගමනීය වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි කෙලෙ ආස්‍රවයෝ ක්‍ෂය වෙති. සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරික වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි කෙලෙ ආස්‍රවයෝ ක්‍ෂය වෙති, අනාගාමිමාර්ගයෙන් නිරවශෙෂ වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි, තදෙකස්ථ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි, තදෙකස්ථ වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි කෙලෙ ආස්‍රවයෝ ක්‍ෂය වෙති, අර්හත්මාර්ගයෙන් නිරවශෙෂ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි, නිරවශෙෂ වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි කෙලෙ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

න තස්ස අද්දිට්ඨ[1]මිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛූ'ති.

**සමන්තචක්ඛූති** කෙනට්ඨෙන සමන්තචක්ඛු: චුද්දස බුද්ධඤාණානි: දුක්ඛෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං බුද්ධඤාණං, -පෙ- සබ්බඤ්ඤුතඤාණං බුද්ධඤාණං, අනාවරණඤාණං බුද්ධඤාණං, ඉමානි චුද්දස බුද්ධඤාණානි. ඉමෙසං චුද්දසන්නං බුද්ධඤාණානං අට්ඨ ඤාණානි සාවකසාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි.

'යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො ඤාතො, අඤ්ඤාතො දුක්ඛට්ඨො නත්ථී'ති සමන්තචක්ඛු. යං සමන්තචක්ඛු, තං පඤ්ඤින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං.

'යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය දුක්ඛට්ඨො නත්ථී'ති සමන්තචක්ඛු. යං සමන්තචක්ඛු, තං පඤ්ඤින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං.

'යාවතා සමුදයස්ස සමුදයට්ඨො -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨො -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨො -පෙ- යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨො -පෙ- යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨො -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨො -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨො -පෙ- යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං -පෙ- යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං -පෙ- යාවතා සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තං[2] ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය නත්ථී'ති සමන්තචක්ඛු. යං සමන්තචක්ඛු, තං පඤ්ඤින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං.

1. අදිට්ඨ - සී., PTS. 2. 'තං' ඉති - සී. PTS, පොත්ථකෙසු නත්ථි.

ඒ තථාගතයන් වහන්සේ විසින් නුවණැසින් නො දක්නා කිසි ධර්මජාතයෙක් මේ ත්‍රෛධාතුකලෝකධාතුයෙහි නැත, තවද නො දත් (අනාගතයෙහි) නො දතයුතු කිසි ධර්මජාතයෙක් නැත, දතයුතු වූ යම් ධර්මජාතයෙක් ඇද්ද ඒ සියල්ල වෙසෙසින් දතුවහ. එහෙයින් තථාගතයන් වහන්සේ 'සමන්තචක්ඛු' නම් වෙත්.

**සමන්තචක්ඛු** යනු: කවර අරුතින් 'සමන්තචක්ඛු' වෙයි යත්: බුද්ධඥාන තුදුසෙකි: දුඃඛසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛසමුදයසත්‍ය-යෙහි ඥානය බුද්ධඥාන යැ ... සර්වඥතාඥානය බුද්ධඥාන යැ අනාවරණඥානය බුද්ධඥාන යි. මොහු තුදුස් බුද්ධඥානයෝ යි. මේ තුදුස් බුද්ධඥානයන් අතුරින් ඥානයෝ අටදෙනෙක් ශ්‍රාවකසාධාරණ වෙති. ඥානයෝ සදෙනෙක් ශ්‍රාවකයන් හා සමග අසාධාරණ වෙත්.

යම් පමණ දුඃඛයාගේ දුඃඛාර්ථය වේ ද ඒ දන්නාලද යැ නො දන්නාලද දුඃඛාර්ථයෙක් නැත් නු යි 'සමන්තචක්ඛු' යැ යමක් සමන්තචක්ඛු වේ ද ඒ ප්‍රඥෙන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රිය වෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වේ.

යම් පමණ දුඃඛයාගේ දුඃඛාර්ථය වේ ද ඒ දක්නාලද යැ ප්‍රකට කරන ලද යැ සාක්ෂාත් කරනලද යැ ප්‍රඥයෙන් පහස්නාලද යැ ප්‍රඥයෙන් නො පහස්නාලද දුඃඛාර්ථයෙක් නැත් නු යි 'සමන්තචක්ඛු' යැ. යමක් 'සමන්ත-චක්ඛු' වේ ද, ඒ ප්‍රඥෙන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථ-යෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රිය වෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වේ.

යම් පමණ සමුදයාගේ සමුදයාර්ථය වේ ද ... යම් පමණ නිරොධයාගේ නිරොධාර්ථය වේ ද ... යම් පමණ මාර්ගයාගේ මාර්ගාර්ථය වේ ද ... යම් පමණ අර්ථප්‍රතිසංවිදාවගේ අර්ථප්‍රතිසංවිදාර්ථය වේ ද ... යම් පමණ ධර්මප්‍රතිසංවිදාවගේ ධර්මප්‍රතිසංවිදාර්ථය වේ ද ... යම් පමණ නිරුක්තිප්‍රතිසංවිදාවගේ නිරුක්ති-ප්‍රතිසංවිදාර්ථය වේ ද ... යම් පමණ ප්‍රතිභානප්‍රතිසංවිදාවගේ ප්‍රතිභානප්‍රතිසං-විදාර්ථය වේ ද ... යම් පමණ ඉන්ද්‍රියපරොපරියත්තඥානය වේ ද ... යම් පමණ සත්ත්වයන්ගේ ආශය අනුශය දන්නා ඥානය වේ ද ... යම් පමණ යමක-ප්‍රාතිහාර්යඥානය වේ ද ... යම් පමණ මහාකරුණාසමාපත්තිඥානය වේ ද ... යම් පමණ මරුන් සහිත වූ බඹුන් සහිත වූ සදෙවකලොකයා විසින් මහණ බමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත වූ ප්‍රජාව විසින් දක්නාලද රූපායත-නයෙක් අසනලද ශබ්දායතනයෙක් ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් දන්නා ලද ධර්මායතනයෙක් (සොයා හෝ නො සොයා හෝ) ලබනලද්දෙක් (ලබන ලද හෝ නො ලබනලද හෝ) සොයන ලද්දෙක් සිතින් විමසනලද්දෙක් වේ ද ඒ දන්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත් කරන ලද යැ ප්‍රඥයෙන් පහස්නාලද යැ, ප්‍රඥයෙන් නො පහස්නාලද්දෙක් නැත් නු යි 'සමන්තචක්ඛු' යැ. යමක් 'සමන්තචක්ඛු' වේ ද, ඒ ප්‍රඥෙන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රිය වෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වේ.

සද්දහන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො සද්දහති. සද්දහන්තො උපට්ඨාපෙති, උපට්ඨාපෙන්තො සද්දහති. සද්දහන්තො සමාදහති, සමාදහන්තො සද්දහති සද්දහන්තො පජානාති, පජානන්තො සද්දහති. පග්ගණ්හන්තො උපට්ඨාපෙති, උපට්ඨාපෙන්තො පග්ගණ්හාති. පග්ගණ්හන්තො සමාදහති, සමාදහන්තො පග්ගණ්හාති. පග්ගණ්හන්තො පජානාති, පජානන්තො පග්ගණ්හාති. පග්ගණ්හන්තො සද්දහති, සද්දහන්තො පග්ගණ්හාති. උපට්ඨාපෙන්තො සමාදහති, සමාදහන්තො උපට්ඨාපෙති. උපට්ඨාපෙන්තො පජානාති, පජානන්තො උපට්ඨාපෙති. උපට්ඨාපෙන්තො සද්දහති, සද්දහන්තො උපට්ඨාපෙති. උපට්ඨාපෙන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො උපට්ඨාපෙති. සමාදහන්තො පජානාති, පජානන්තො සමාදහති. සමාදහන්තො සද්දහති, සද්දහන්තො සමාදහති. සමාදහන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො සමාදහති. සමාදහන්තො උපට්ඨාපෙති, උපට්ඨාපෙන්තො සමාදහති. පජානන්තො සද්දහති, සද්දහන්තො පජානාති. පජානන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො පජානාති. පජානන්තො උපට්ඨාපෙති උපට්ඨාපෙන්තො පජානාති. පජානන්තො සමාදහති, සමාදහන්තො පජානාති.

සද්දහිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා සද්දහිතං; සද්දහිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා සද්දහිතං; සද්දහිතත්තා සමාදහිතං, සමාදහිතත්තා සද්දහිතං; සද්දහිතත්තා පජානිතං, පජානිතත්තා සද්දහිතං; පග්ගහිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා පග්ගහිතං; පග්ගහිතත්තා සමාදහිතං, සමාදහිතත්තා පග්ගහිතං; පග්ගහිතත්තා පජානිතං, පජානිතත්තා පග්ගහිතං; පග්ගහිතත්තා සද්දහිතං, සද්දහිතත්තා පග්ගහිතං; උපට්ඨාපිතත්තා සමාදහිතං, සමාදහිතත්තා උපට්ඨාපිතං; උපට්ඨාපිතත්තා පජානිතං, පජානිතත්තා උපට්ඨාපිතං; උපට්ඨාපිතත්තා සද්දහිතං, සද්දහිතත්තා උපට්ඨාපිතං; උපට්ඨාපිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා උපට්ඨාපිතං; සමාදහිතත්තා පජානිතං, පජානිතත්තා සමාදහිතං; සමාදහිතත්තා සද්දහිතං, සද්දහිතත්තා සමාදහිතං; සමාදහිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා සමාදහිතං; සමාදහිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා සමාදහිතං; පජානිතත්තා සද්දහිතං, සද්දහිතත්තා පජානිතං; පජානිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා පජානිතං; පජානිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා පජානිතං; පජානිතත්තා සමාදහිතං, සමාදහිතත්තා පජානිතං.

යං බුද්ධචක්ඛු, තං බුද්ධඤාණං; යං බුද්ධඤාණං, තං බුද්ධචක්ඛු, යෙන චක්ඛුනා තථාගතො සත්තෙ පස්සති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො[1] අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො.

1. භයදස්සාවිනො - සයා,

හදහනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ හදහයි, හදහනුයේ (අරමුණෙහි සිත) එළවයි, (අරමුණෙහි සිත) එළවනුයේ හදහයි, හදහනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ හදහයි, හදහනුයේ දැනගනී, දැනගනුයේ හදහයි, ප්‍රග්‍රහ කරනුයේ සිත එළවයි, සිත එළවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ දැනගනී, දැනගනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ හදහයි, හදහනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, සිත් එළවනුයේ සිත පිහිටුවයි. සිත පිහිටුවනුයේ සිත එළවයි, සිත එළවනුයේ දැනගනී, දැනගනුයේ සිත එළවයි, සිත එළවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ සිත එළවයි, සිත පිහිටුවනුයේ දැනගනී, දැනගනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ හදහයි, හදහනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ සිත එළවයි, සිත එළවනුයේ සිත පිහිටුවයි, දැනගනුයේ හදහයි, හදහනුයේ දැනගනී, දැනගනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ දැනගනී, දැනගනුයේ සිත එළවයි, සිත එළවනුයේ දැනගනී, දැනගනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ දැනගනී.

හදහනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහකරනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් පිහිටුවනලද, පිහිටුවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් දත්නාලද, දත්නාලද වන බැවින් හදහනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් පිහිටුවනලද, පිහිටුවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් දත්නාලද, දත්නාලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; අරමුණෙහි එළවනලද වන බැවින් පිහිටුවනලද, සමාදහිත බැවින් අරමුණෙහි එළවනලද; අරමු-ණෙහි එළවනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් අරමුණෙහි එළවනලද; අරමුණෙහි එළවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් අරමුණෙහි එළවනලද; අරමුණෙහි එළවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහ කරනලද වන බැවින් අරමුණෙහි එළවනලද; (අරමුණෙහි) පිහිටුවනලද වන බැවින් දත්නාලද, දත්නාලද වන බැවින් පිහිටුවනලද; පිහිටුවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් පිහිටුවනලද; පිහිටුවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහ කරනලද වන බැවින් පිහිටුවනලද; පිහිටුවනලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් පිහිටුවනලද; දත්නාලද වන බැවින් හදහනලද, හදහනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහ කරනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් පිහිටුවනලද, පිහිටුවනලද වන බැවින් දත්නාලද.

යමක් 'බුද්ධචක්ඛු' වේ ද, ඒ බුද්ධඥාන වෙයි, යමක් බුද්ධඥාන වේ ද, ඒ බුද්ධචක්ඛු වෙයි, යම් නුවණෙකින් තථාගතයන් වහන්සේ සත්ත්වයන් අල්ප වූ (රාගාදි) රජස් ඇතියන් මහත් වූ රාගාදි රජස් ඇතියන් තියුණු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇතියන් මෘදු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇතියන් සුන්දර වූ ශ්‍රද්ධාදි ආකාර ඇතියන් ගර්හිත වූ ශ්‍රද්ධාදි ආකාර ඇතියන් සුවසේ හැඟැවිය හැකි දුකසේ හැඟැවියහැකි ඇතැමකුන් පරලොකවද්‍යයෙහි භය දක්නාසුල්ලන් ඇතැමකුන් පරලොකවද්‍යයෙහි භය නො දක්නාසුල්ලන් දකිත් ද ඒ බුද්ධචක්ෂුස යි.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙති** සද්ධො පුග්ගලො අප්පරජක්ඛො, අස්සද්ධො පුග්ගලො මහාරජක්ඛො; ආරද්ධවිරියො පුග්ගලො අප්පරජක්ඛො, කුසීතො පුග්ගලො මහාරජක්ඛො; උපට්ඨිතසති[1], පුග්ගලො අප්පරජක්ඛො, මුට්ඨස්සති පුග්ගලො මහාරජක්ඛො; සමාහිතො පුග්ගලො අප්පරජක්ඛො, අසමාහිතො පුග්ගලො මහාරජක්ඛො; පඤ්ඤවා පුග්ගලො අප්පරජක්ඛො, දුප්පඤ්ඤො පුග්ගලො මහාරජක්ඛො.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙති**. සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො, අස්සද්ධො පුග්ගලො මුදින්ද්‍රියො -පෙ- පඤ්ඤවා පුග්ගලො තික්ඛින්ද්‍රියො, දුප්පඤ්ඤො පුග්ගලො මුදින්ද්‍රියො.

**ස්වාකාරෙ ද්වාකාරෙති** සද්ධො පුග්ගලො ස්වාකාරො, අස්සද්ධො පුග්ගලො ද්වාකාරො -පෙ- පඤ්ඤවා පුග්ගලො ස්වාකාරො, දුප්පඤ්ඤො පුග්ගලො ද්වාකාරො.

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙති** සද්ධො පුග්ගලො සුවිඤ්ඤාපයො, අස්සද්ධො පුග්ගලො දුවිඤ්ඤාපයො -පෙ- පඤ්ඤවා පුග්ගලො සුවිඤ්ඤාපයො, දුප්පඤ්ඤො පුග්ගලො දුවිඤ්ඤාපයො.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනොති** සද්ධො පුග්ගලො පරලොකවජ්ජභය-දස්සාවී, අස්සද්ධො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී -පෙ- පඤ්ඤවා පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, දුප්පඤ්ඤො පුග්ගලො න පරලොක-වජ්ජභයදස්සාවී.

**ලොකොති** ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො විපත්තිභව-ලොකො විපත්තිසම්භවලොකො සම්පත්තිභවලොකො සම්පත්තිසම්භව ලොකො.

එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා: නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා: තිස්සො වෙදනා, චත්තාරො ලොකා: චත්තාරො ආහාරා, පඤ්ච ලොකා: පඤ්චුපාදානක්ඛන්ධා, ඡ ලොකා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත ලොකා: සත්ත විඤ්ඤාණට්ඨිතියො, අට්ඨ ලොකා: අට්ඨ ලොකධම්මා, නව ලොකා: නව සත්තාවාසා, දස ලොකා: දසායතනානි, ද්වාදස ලොකා: ද්වාදසායතනානි, අට්ඨාරස ලොකා: අට්ඨාරසධාතුයො.

**වජ්ජන්ති** සබ්බෙ කිලෙසා වජ්ජා, සබ්බෙ දුච්චරිතා වජ්ජා, සබ්බෙ අභිසඞ්ඛාරා වජ්ජා, සබ්බෙ භවගාමිකම්මා වජ්ජා. ඉති ඉමස්මිඤ්ච ලොකෙ ඉමස්මිඤ්ච වජ්ජෙ තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොන්ති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ.

ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි ජානාති පස්සති අඤ්ඤාති පටිවිජ්ඣතීති.

**තතියො භාණවාරො.**

**ඉන්ද්‍රියකථා සමත්තා**

---

1. උපට්ඨිතස්සති - මජසං.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ** යනු: සැදැහැති පුද්ගල තෙම අල්පරජස්ක යැ සැදැහැ නැති පුද්ගල තෙම මහාරජස්ක යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම අල්පරජස්ක යැ කුසීත වූ පුද්ගල තෙම මහාරජස්ක යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම අල්පරජස්ක යැ මුළාසිහි ඇති පුද්ගල තෙම මහාරජස්ක යැ සමාහිත වූ පුද්ගල තෙම අල්පරජස්ක යැ සමාහිත නො වූ පුද්ගල තෙම මහාරජස්ක යැ ප්‍රඥ ඇති පුද්ගල තෙම අල්පරජස්ක යැ ප්‍රඥ නැති පුද්ගල තෙම මහාරජස්ක යි.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම තියුණු ඉන්ද්‍රිය ඇත්තේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ ... ප්‍රඥ ඇති පුද්ගල තෙම තියුණු ඉන්ද්‍රිය ඇත්තේ යැ ප්‍රඥ නැති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යි.

**ස්වාකාරෙ ද්වාකාරෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම සුන්දරආකාර ඇත්තේ යැ. ශ්‍රද්ධා නැති පුද්ගල තෙම ගර්හිත ආකාර ඇත්තේ යැ ... ප්‍රඥ ඇති පුද්ගල තෙම සුන්දර ආකාර ඇත්තේ යැ ප්‍රඥ නැති පුද්ගල තෙම ගර්හිත ආකාර ඇත්තේ යි.

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම සුවසේ හැඟැවිය හැක්කේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම දුකසේ හැඟැවිය හැක්කේ යැ ... ප්‍රඥ ඇති පුද්ගල තෙම සුවසේ හැඟැවිය හැක්කේ යැ ප්‍රඥ නැති පුද්ගල තෙම දුකසේ හැඟැවිය හැක්කේ යි.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු නො වෙයි. ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම පරලොකවද්‍යභයදක්නාසුලු යැ කුසීද පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු නො වෙයි ... ප්‍රඥ ඇති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු යැ ප්‍රඥ නැති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු නො වේ.

**ලොකො** යනු: ස්කන්ධලොක යැ ධාතුලොක යැ ආයතනලොක යැ විපත්තිභව (අපාය) ලොක යැ විපත්තිසම්භව (අපායොපගකර්ම) ලොක යැ සම්පත්තිභව (සුගති) ලොක යැ සම්පත්තිසම්භව (සුගතූපගකම්ම) ලොක යි.

ලෝ එකෙක් වෙයි: හැම සත්හු ආහාරයෙන් සිටුනාහු යැ, ලොව්හු දෙදෙනෙක් වෙති: නාමය හා රූපය හා යැ, ලොව්හු තිදෙනෙක් වෙති: තුන් වෙදනා යැ, ලොව්හු සතර දෙනෙක් වෙති: සතර ආහාරයෝ යැ, ලොව්හු පස්දෙනෙක් වෙති: පඤ්චොපාදානස්කන්ධයෝ යැ, ලොව්හු සදෙනෙක් වෙති: ආධ්‍යාත්මිකආයතනයෝ සදෙන යැ, ලොව්හු සත් දෙනෙක් වෙති: සප්තවිඥනස්ථිතීහු යැ, ලොව්හු අටදෙනෙක් වෙති: අෂ්ටලොකධර්මයෝ යැ, ලොව්හු නවදෙනෙක් වෙති: නවසත්ත්වාවාසයෝ යැ, ලොව්හු දසදෙනෙක් වෙති: දශආයතනයෝ යැ, ලොව්හු දොළොස් දෙනෙකි දොළොස් ආයතනයෝ යැ, ලොව්හු අටලොස් දෙනෙකි: අටලොස්ධාතුහු යි.

**වජ්ජං** යනු: හැම කෙලෙස්හු වද්‍යයෝ යැ, හැම දුසිරිත්හු වද්‍යයෝ යැ. හැම අභිසංස්කාරයෝ වද්‍යයෝ යැ, හැම භවගාමිකර්මයෝ වද්‍යයෝ යි. මෙසේ මෙලෙව්හි ද මේ වද්‍යයෙහි ද බලවත් වූ 'භය' සංඥවෝ ඔසවනලද අසිපත් ඇති වධකයකු කෙරෙහි සෙයින් එළඹසිටියාහු වෙති.

මේ පනස් අයුරින් මේ පඤ්චෙන්ද්‍රියයන් (තථාගතයෝ) දැනගනිති, දකිති, හාත්පසින් දැනගනිති, ප්‍රතිවෙධ කෙරෙත්.

**තුන්වැනි බණවර යි.**

**ඉන්ද්‍රියකථා නිමි.**

# 5

# විමොක්ඛකථා

[සාවත්ථිනිදානං:][1]

5-1. "තයොමෙ භික්ඛවෙ, විමොක්ඛා, කතමෙ තයො: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො විමොක්ඛා."

අපිච- අට්ඨසට්ඨි විමොක්ඛා: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො, අජ්ඣත්තවුට්ඨානො විමොක්ඛො බහිද්ධාවුට්ඨානො විමොක්ඛො, උභතොවුට්ඨානො විමොක්ඛො, අජ්ඣත්තවුට්ඨානා චත්තාරො විමොක්ඛා, බහිද්ධාවුට්ඨානා චත්තාරො විමොක්ඛා, උභතොවුට්ඨානා චත්තාරො විමොක්ඛා, අජ්ඣත්තවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා, බහිද්ධාවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා, උභතොවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා, අජ්ඣත්තවුට්ඨානපටිප්පස්සද්ධි[2] චත්තාරො විමොක්ඛා, බහිද්ධාවුට්ඨානපටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා, උභතොවුට්ඨානපටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා. 'රූපී රූපානි පස්සතී'ති විමොක්ඛො, 'අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධාරූපානි පස්සතී'ති විමොක්ඛො, 'සුභන්තෙව' අධිමුත්තො හොතී'ති විමොක්ඛො. ආකාසානඤ්චායතනසමාපත්තිවිමොක්ඛො, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති-විමොක්ඛො, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො, නෙවසඤ්ඤානා-සඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිවිමො-ක්ඛො. සමයවිමොක්ඛො, අසමයවිමොක්ඛො, සාමයිකො[3] විමොක්ඛො, අසාමයිකො විමොක්ඛො. කුප්පො විමොක්ඛො අකුප්පො විමොක්ඛො. ලොකියො විමොක්ඛො, ලොකුත්තරො විමොක්ඛො, සාසවො විමොක්ඛො, අනාසවො විමොක්ඛො. සාමිසො විමොක්ඛො, නිරාමිසො විමොක්ඛො, නිරාමිසා[4] නිරාමිසතරො විමොක්ඛො, පණිහිතො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො, පණිහිතපටිප්පස්සද්ධි විමොක්ඛො. සඤ්ඤුත්තො විමොක්ඛො, විසඤ්ඤුත්තො විමොක්ඛො, එකත්තවිමොක්ඛො, නානත්ත-විමොක්ඛො, සඤ්ඤාවිමොක්ඛො, ඤාණවිමොක්ඛො, සීතිසියාවිමොක්ඛො,[5] ඣානවිමොක්ඛො, අනුපාදා චිත්තස්ස විමොක්ඛො.

**විමොක්ඛුද්දෙසො.**

කතමො සුඤ්ඤතො විමොක්ඛො: "ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. 'සො තත්ථ අභිනිවෙසං න කරොතී'ති සුඤ්ඤතො විමොක්ඛො. අයං සුඤ්ඤතො විමොක්ඛො.

1. පරිපුණ්ණනිදානං - ස්‍යා, සී, PTS, පුරිමනිදානං - මජ්සං, 2 අජ්ඣත්තවුට්ඨානා පටිප්පස්සද්ධි - ස්‍යා, PTS, සී, 3. සාමායිකො - පු.
4 'නිරාමිසා'ති තාලපොත්ථකෙ නත්ථි. 5 සීතිසිතාවිමොක්ඛො -පු.

# 5

# විමොක්ෂකථා

[සැවැත්නිදාන යි.]

5-1. "මහණෙනි, මේ විමොක්ෂයෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද යත්: ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තවිමොක්ෂ යැ අප්‍රණිහිත විමොක්ෂ යි. මහණෙනි, මොහු තුන්විමොක්ෂයෝ යි."

තවද විමොක්ෂයෝ අටසැට දෙනෙක් වෙති: ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තවිමොක්ෂ යැ අප්‍රණිහිතවිමොක්ෂ යැ (සතර ධ්‍යානයෝ අධ්‍යාත්මයෙහි නීවරණාදියෙන් නැගීසිටුනා හෙයින්) අජ්ඣත්තවුට්ඨානවිමොක්ඛ යැ (සතර අරූපසමාපත්තිහු ආලම්බනයන් කෙරෙන් නැගිසිටුනා හෙයින්) බහිද්ධාවුට්ඨානවිමොක්ඛ යැ දුභතොවුට්ඨාන (සමුච්ඡෙද) විමොක්ඛ යැ අජ්ඣත්තවුට්ඨාන වූ ධ්‍යාන සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ බහිද්ධාවුට්ඨාන වූ අරූපසමාපත්ති සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ දුභතොවුට්ඨාන වූ සතර විමොක්ෂයෝ යැ අජ්ඣත්තවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ යැ බහිද්ධාවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ යැ දුභතොවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ යැ අජ්ඣත්තවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ බහිද්ධාවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ දුභතොවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ රූපධ්‍යාන ඇත්තේ (කසිණාදී බාහිර) රූපයන් (ධ්‍යානචක්ෂුසින්) දකී නු'යි විමොක්ෂ යැ අධ්‍යාත්මයෙහි 'රූප' යැ යන සංඥ නැත්තේ බාහිරරූපයන් දකී නු'යි විමොක්ෂ යැ 'ශුභ' යැ යි අධිමුක්ත වේ නු'යි විමොක්ෂ යැ ආකාසානඤ්චායතනසමාපත්ති විමොක්ෂ යැ විඤ්ඤාණඤ්චායතනසමාපත්ති විමොක්ෂ යැ ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ යැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ යැ සංඥාවෙදයිතනිරොධසමාපත්ති විමොක්ෂ යැ සමය විමොක්ෂ යැ අසමය විමොක්ෂ යැ සාමයිකවිමොක්ෂ යැ අසාමයික විමොක්ෂ යැ කොප්‍යවිමොක්ෂ යැ අකොප්‍යවිමොක්ෂ යැ ලෞකික විමොක්ෂ යැ ලොකොත්තර විමොක්ෂ යැ සාස්‍රව විමොක්ෂ යැ අනාස්‍රව විමොක්ෂ යැ සාමිෂ විමොක්ෂ යැ නිරාමිෂ විමොක්ෂ යැ නිරාමිෂයට වඩා අතිශයින් නිරාමිෂ වූ විමොක්ෂ යැ ප්‍රණිහිත විමොක්ෂ යැ අප්‍රණිහිතවිමොක්ෂ යැ ප්‍රණිධි සන්හිඳීම් සඞ්ඛ්‍යාත විමොක්ෂ යැ සංයුක්ත විමොක්ෂ යැ විසංයුක්තවිමොක්ෂ යැ එකත්ව විමොක්ෂ යැ නානාත්ව විමොක්ෂ යැ සංඥාවිමොක්ෂ යැ ඥානවිමොක්ෂ යැ (විදර්ශනාඥානය මැ) 'සිහිල් වන්නේ යැ'යි පවත්නා විමොක්ෂ යැ ධ්‍යාන විමොක්ෂ යැ උපාදාන නො කොට චිත්තයාගේ විමොක්ෂය යි.

## විමොක්ෂොද්දෙශ යි.

ශූන්‍යතවිමොක්ෂ කවරෙ යත්: මෙසස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසෙයින් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: 'මේ පඤ්චස්කන්ධය තෙම ආත්මයෙන් හෝ ආත්මීයයෙන් හෝ ශූන්‍ය වේ'' යයි. හෙතෙම එහි අභිනිවෙශ නො කෙරේ නු' යි ශූන්‍යත විමොක්ෂ නම. මේ ශූන්‍යතවිමොක්ෂ නම් වෙයි.

කතමො අනිමිත්තො විමොක්ඛො: ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. සො තත්ථ නිමිත්තං න කරොතී'ති අනිමිත්තො විමොක්ඛො. අයං අනිමිත්තො විමොක්ඛො.

කතමො අප්පණිහිතො විමොක්ඛො: ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. සො තත්ථ පණිධිං න කරොතී'ති අප්පණිහිතො විමොක්ඛො. අයං අප්පණිහිතො විමොක්ඛො.

කතමො අජ්ඣත්තවුට්ඨානො විමොක්ඛො: චත්තාරි ඣානානි. අයං අජ්ඣත්තවුට්ඨානො විමොක්ඛො.

කතමො බහිද්ධාවුට්ඨානො විමොක්ඛො: චතස්සො අරූපසමාපත්තියො, අයං බහිද්ධාවුට්ඨානො විමොක්ඛො.

කතමො දුභතොවුට්ඨානො විමොක්ඛො: චත්තාරො අරියමග්ගා. අයං දුභතොවුට්ඨානො විමොක්ඛො.

කතමෙ අජ්ඣත්තවුට්ඨානා චත්තාරො විමොක්ඛා: පඨමං ඣානං[1] නීවරණෙහි වුට්ඨාති, දුතියං ඣානං විතක්කවිචාරෙහි වුට්ඨාති, තතියං ඣානං පීතියා වුට්ඨාති, චතුත්ථං ඣානං සුඛදුක්ඛෙහි වුට්ඨාති. ඉමෙ අජ්ඣත්තවුට්ඨානා චත්තාරො විමොක්ඛා.

කතමෙ බහිද්ධාවුට්ඨානා චත්තාරො විමොක්ඛා: ආකාසානඤ්චායතනසමාපත්ති රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය වුට්ඨාති, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති ආකාසානඤ්චායතනසඤ්ඤාය වුට්ඨාති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය වුට්ඨාති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය වුට්ඨාති. ඉමෙ බහිද්ධාවුට්ඨානා චත්තාරො විමොක්ඛා.

කතමෙ දුභතො වුට්ඨානා චත්තාරො විමොක්ඛා: සොතාපත්තිමග්ගො සක්කායදිට්ඨිවිචිකිච්ඡාසීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති; සකදාගාමිමග්ගො ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති; අනාගාමිමග්ගො අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති,

1. පඨමජ්ඣානං - ස්‍යා, PTS.

අනිමිත්තවිමොක්ෂ කවරේ යත්: මේ සස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේසිත් ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: "මේ පඤ්චස්කන්ධය තෙම ආත්මයෙන් හෝ ආත්මීයයෙන් හෝ ශූන්‍ය වේ" යයි. හෙතෙම එහි (නිත්‍ය) නිමිත්ත නො කෙරේ නු'යි අනිමිත්තවිමොක්ෂ නම. මේ අනිමිත්තවිමොක්ෂ නම් වෙයි.

අප්‍රණිහිතවිමොක්ෂ කවරේ යත්: මේ සස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේසිත් ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: "මේ පඤ්චස්කන්ධය තෙම ආත්මයෙන් හෝ ආත්මීයයෙන් හෝ ශූන්‍ය වේ" යයි. හෙතෙම එහි ප්‍රණිධි නො කෙරේ නු'යි. අප්‍රණිහිතවිමොක්ෂ නම. මේ අප්‍රණිහිතවිමොක්ෂ නම් වෙයි.

අජ්ඣත්තවුට්ඨානවිමොක්ඛ කවරේ යත්: සතර ධ්‍යානයෝ යි. මේ අජ්ඣත්තවුට්ඨානවිමොක්ඛ නම් වෙයි.

බහිද්ධාවුට්ඨානවිමොක්ඛ කවරේ යත්: සතර අරූපසමාපත්තිහු යි. මේ බහිද්ධාවුට්ඨානවිමොක්ඛ නම් වෙයි.

දුභතොවුට්ඨානවිමොක්ෂ කවරේ යත්: සතර ආර්‍ය්‍යමාර්ගයෝ යි. මේ දුභතොවුට්ඨානවිමොක්ඛ නම් වෙයි.

අධ්‍යාත්මව්‍යුත්ථාන වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ප්‍රථමධ්‍යානය (අධ්‍යාත්මයෙහි) නීවරණයන් කෙරෙන් නැඟෙයි, ද්විතීයධ්‍යානය විතර්ක-විචාරයන් කෙරෙන් නැඟෙයි, තෘතීයධ්‍යානය ප්‍රීතිය කෙරෙන් නැඟෙයි, චතුර්ථධ්‍යානය සුඛදුඃඛයන් කෙරෙන් නැඟේ. මොහු අධ්‍යාත්මව්‍යුත්ථාන වූ සතර විමොක්ෂයෝ වෙති.

බහිර්ව්‍යුත්ථාන වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ආකාසානඤ්චායතනසමාපත්තිය රූපසංඥයෙන් ප්‍රතිඝසංඥයෙන් නානාත්වසංඥයෙන් නැඟෙයි, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ආකාසානඤ්චායතනසංඥව කෙරෙන් නැඟෙයි, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය විඤ්ඤාණඤ්චායතන සංඥව කෙරෙන් නැඟෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ආකිඤ්චඤ්ඤායතනසංඥව කෙරෙන් නැඟේ. මොහු බහිර්ව්‍යුත්ථාන වූ සතර විමොක්ෂයෝ වෙති.

දුභතොවුට්ඨාන වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ස්‍රොතාපත්තිමාර්ගය සත්කායදෘෂ්ටිවිචිකිත්සාශීලව්‍රතපරාමර්ශ කෙරෙන් දෘෂ්ට්‍යනුශය කෙරෙන් විචිකිත්සානුශය කෙරෙන් නැඟෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි, බාහිර වූ ත් සියලු නිමිති කෙරෙන් නැඟෙයි, සකෘදාගාමිමාර්ගය ඖදාරික වූ කාමරාගසංයොජනය කෙරෙන් ප්‍රතිඝසංයොජනය කෙරෙන් ඖදාරික වූ කාමරාගානුශය කෙරෙන් ප්‍රතිඝානුශය කෙරෙන් නැඟෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහිර වූ ත් සියලු නිමිති කෙරෙන් නැඟෙයි, අනාගාමිමාර්ගය අණුසහගත වූ කාමරාගසංයොජනය කෙරෙන් ප්‍රතිඝසංයොජනය කෙරෙන් අණුසහගත වූ කාමරාගානුශය කෙරෙන් ප්‍රතිඝානුශය කෙරෙන් නැඟෙයි. එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහිර වූ ත් සියලු නිමිති කෙරෙන් නැඟෙයි;

අරහත්තමග්ගො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, ඉමෙ දුභතො වුට්ඨානා චත්තාරො විමොක්ඛා.

කතමෙ අජ්ඣත්තවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා: පඨමං ඣානං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, දුතියං ඣානං පටිලාභත්ථාය -පෙ- තතියං ඣානං පටිලාභත්ථාය -පෙ- චතුත්ථං ඣානං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, ඉමෙ අජ්ඣත්තවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා.

කතමෙ බහිද්ධාවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා: ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, ඉමෙ බහිද්ධාවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා.

කතමෙ දුභතො වුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා: සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා, සකදාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අනාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අරහත්තමග්ගං පටිලාභත්ථාය අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා. ඉමෙ දුභතො වුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා.

කතමෙ අජ්ඣත්තවුට්ඨාන[1] පටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා: පඨමස්ස ඣානස්ස[2] පටිලාභො වා විපාකො වා, දුතියස්ස ඣානස්ස -පෙ- තතියස්ස ඣානස්ස -පෙ- චතුත්ථස්ස ඣානස්ස පටිලාභො වා විපාකො වා, ඉමෙ අජ්ඣත්තවුට්ඨානපටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා.

කතමෙ බහිද්ධා වුට්ඨාන[3] පටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා: ආකාසානඤ්චායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා, ඉමෙ බහිද්ධාවුට්ඨානපටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා.

කතමෙ දුභතො වුට්ඨානපටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා: සොතාපත්තිමග්ගස්ස සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගස්ස සකදාගාමිඵලං, අනාගාමිමග්ගස්ස අනාගාමිඵලං, අරහත්තමග්ගස්ස අරහත්තඵලං. ඉමෙ දුභතො වුට්ඨානපටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා.

---

1. අජ්ඣත්තවුට්ඨානා - සී., PTS,
2. පඨමජ්ඣානස්ස - සී., PTS,
3. බහිද්ධාවුට්ඨානා - සී., PTS,

අර්හත්මාර්ග රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් නැඟෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි, බාහිර වූත් සියලු නිමිති කෙරෙන් නැඟේ. මොහු දුභතොවුට්ඨාන වූ සතර විමොක්ෂයෝ වෙති.

අධ්‍යාත්මව්‍යුත්ථානයන්ට අනුලෝම වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද, ද්විතීයධ්‍යානය ලැබීම පිණිස ... තෘතීයධ්‍යානය ලැබීම පිණිස ... චතුර්ථධ්‍යානය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද යන මොහු අධ්‍යාත්මව්‍යුත්ථානයන්ට අනුලෝම වූ සතර විමොක්ෂයෝ වෙති.

බාහිර ව්‍යුත්ථානයන්ට අනුලෝම වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ආකාසානඤ්චායතන සමාපත්තිය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද යන මොහු බාහිර ව්‍යුත්ථානයන්ට අනුලෝම වූ සතර විමොක්ෂයෝ වෙති.

දුභතොවුට්ඨානයන්ට අනුලෝම වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ස්‍රොතාපත්තිමාර්ග ලැබීම පිණිස අනිත්‍යානුදර්ශනය දුඃඛානුදර්ශනය අනාත්මානුදර්ශනය යැ, සකෘදාගාමිමාර්ග ලැබීම පිණිස ... අනාගාමිමාර්ග ලැබීම පිණිස ... අර්හත්මාර්ගය ලැබීම පිණිස අනිත්‍යානුදර්ශනය දුඃඛානුදර්ශනය අනාත්මානුදර්ශනය යි. මොහු දුභතොවුට්ඨානයන්ට අනුලෝම වූ සතර විමොක්ෂයෝ වෙති.

අධ්‍යාත්මව්‍යුත්ථානයන් ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ කවරහ යත්: ප්‍රථමධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ, ද්විතීය-ධ්‍යානයාගේ ... තෘතීයධ්‍යානයාගේ ... චතුර්ථධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යි. මොහු අධ්‍යාත්මව්‍යුත්ථානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ වෙති.

බාහිර ව්‍යුත්ථානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ කවරහ යත්: ආකාසානඤ්චායතනසමාපත්තියගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියගේ ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය-ගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යි. මොහු බාහිරව්‍යුත්ථානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ වෙති.

දුභතොවුට්ඨානයන්ගේ සන්සිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ කවරහ යත්: ස්‍රොතාපත්තිමාර්ගයට ස්‍රොතාපත්තිඵල යැ සකෘදාගාමිමාර්ගයට සකෘදාගාමිඵල යැ අනාගාමිමාර්ගයට අනාගාමිඵල යැ අර්හත්මාර්ගයට අර්හත්ඵල යි. මොහු දුභතොවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ වෙති.

කථං 'රූපී රූපානි පස්සතී'ති විමොක්ඛො: ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං නීලනිමිත්තං මනසිකරොති, නීලසඤ්ඤං පටිලභති, සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථා පෙති[1] සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා බහිද්ධා නීලනිමිත්තෙ චිත්තං උපසංහරති, නීල-සඤ්ඤං පටිලභති. සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති,[1] සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං[2] අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස එවං හොති: 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච උභයමිදං රූප'න්ති රූපසඤ්ඤී හොති.

ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං පීතනිමිත්තං -පෙ- ලොහිතනිමිත්තං -පෙ- ඔදාතනිමිත්තං මනසිකරොති, ඔදාතනිමිත්තං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති;[1] සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා බහිද්ධා ඔදාතනිමිත්තෙ චිත්තං උපසංහරති, ඔදාතසඤ්ඤං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධා-රිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති: සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස එවං හොති: 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච උභයමිදං රූප'න්ති රූපසඤ්ඤී හොති. එවං 'රූපී රූපානි පස්සතී'ති විමොක්ඛො.

කථං 'අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සතී'ති විමොක්ඛො: ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං නීලනිමිත්තං න මනසි කරොති, නීල-සඤ්ඤං න පටිලභති, බහිද්ධා නීලනිමිත්තෙ චිත්තං උපසංහරති, නීලං සඤ්ඤං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති. සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා, සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස එවං හොති: 'අජ්ඣත්තං අරූපං[3] බහිද්ධා රූපමිද'න්ති රූපසඤ්ඤී හොති.

ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං පීතනිමිත්තං -පෙ- ලොහිතනිමිත්තං -පෙ- ඔදාතනිමිත්තං න මනසි කරොති, ඔදාතසඤ්ඤං න පටිලභති, බහිද්ධා ඔදාතනිමිත්තෙ චිත්තං උපසංහරති, ඔදාතසඤ්ඤං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති; සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති; සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස එවං හොති: 'අජ්ඣත්තං අරූපං බහිද්ධා රූපමිද'න්ති රූපසඤ්ඤී, හොති, එවං 'අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සතී'ති විමොක්ඛො.

1. වවත්ථාපෙති - පු,
2. සාවත්ථිතං - සී 2
3. අරූපසඤ්ඤී - ස්‍යා සී 1, 2,

කිසෙයින් රූපධ්‍යාන ඇත්තේ රූපයන් දකී නු'යි විමොක්‍ෂ වෙයි යත්: මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා නීලනිමිත්ත මෙනෙහි කෙරෙයි, 'නීල' යැ යන සංඥව ලබයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශචය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශචය කොට බාහිර වූ නීල (කසිණ) නිමිත්තෙහි සිත එළවයි. 'නීල' යැ යන සංඥව ලබයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශචය කෙරෙයි, හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශචය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ''අධ්‍යාත්ම වූ ත් බාහිර වූ ත් මෙදෙක රූප වේ''යයි. 'රූප' යැ යන සංඥ ඇත්තේ වෙයි.

මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා පීත නිමිත්ත ... ලොහිතනිමිත්ත... ඔදාත නිමිත්ත මෙනෙහි කෙරෙයි, ඔදාත නිමිත්ත ලබයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශචය කෙරෙයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශචය කොට බාහිර වූ ඔදාත (කසිණ) නිමිත්තෙහි සිත එළවයි. ඔදාත යැ යන සංඥව ලබයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නා ලද්දක් කෙරෙයි. සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශචය කෙරෙයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නා ලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශචය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි; ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ''අධ්‍යාත්ම වූ ත් බාහිර වූ ත් මෙදෙක රූප වේ''යයි. 'රූප' යැ යන සංඥ ඇත්තේ වෙයි. මෙසෙයින් 'රූපධ්‍යාන ඇත්තේ රූපයන් දකී නු'යි විමොක්‍ෂ නම් වෙයි.

කිසෙයින් ''අධ්‍යාත්මයෙහි 'රූප' යැ යන සංඥ නැත්තේ බාහිරරූපයන් දකී'' නු'යි විමොක්‍ෂ වෙයි යත්: මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා නීලනිමිත්ත නො මෙනෙහි කෙරෙයි, 'නීල'යැ යන සංඥව නො ලබයි, බාහිර වූ නීලනිමිත්තෙහි සිත එළවයි, 'නීල'යැ යන සංඥව ලබයි, හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශචය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශචය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ''අධ්‍යාත්මයෙහි 'රූප' නො වෙයි, මේ බාහිර රූපය වේ''යයි 'රූප'යැ යන සංඥ ඇත්තේ වෙයි.

මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා 'පීත' නිමිත්ත ... 'ලොහිත' නිමිත්ත ... 'ඔදාත' නිමිත්ත නො මෙනෙහි කෙරෙයි, 'ඔදාත' යැ යන සංඥව නො ලබයි, බාහිර වූ ඔදාත නිමිත්තෙහි සිත එළවයි, 'ඔදාත'යැ යන සංඥව ලබයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කෙරෙයි. සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශචය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගන්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ''අධ්‍යාත්මයෙහි රූප නො වෙයි, මේ බාහිර රූපය වේ''යයි රූපය යන සංඥ ඇත්තේ වෙයි. මෙසෙයින් 'අධ්‍යාත්මයෙහි රූපය යන සංඥ නැත්තේ බාහිර රූපයන් දකී නු'යි විමොක්‍ෂ නම් වෙයි.

කථං සුභන්තෙ'ව අධිමුත්තො[1] හොතීති විමොක්ඛො: ඉධ භික්ඛු මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං.[2] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[3] ඵරිත්වා විහරති, මෙත්තාය භාවිතත්තා සත්තා අප්පටිකූලා[4] හොන්ති. කරුණාසහගතෙන චෙතසා එකං දිසං -පෙ- කරුණාය භාවිතත්තා සත්තා අප්පටිකූලා හොන්ති. මුදිතාසහගතෙන චෙතසා එකං දිසං -පෙ- මුදිතාය භාවිතත්තා සත්තා අප්පටිකූලා හොන්ති. උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං -පෙ- උපෙක්ඛාය භාවිතත්තා සත්තා අප්පටිකූලා හොන්ති. එවං 'සුභන්තෙ'ව අධිමුත්තො හොතී'ති විමොක්ඛො.

කතමො ආකාසානඤ්චායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං ආකාසානඤ්චායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිවිමොක්ඛො.

කතමො සමයවිමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සමයවිමොක්ඛො.

කතමො අසමයවිමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අසමයවිමොක්ඛො.

කතමො සාමයිකො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සාමයිකො විමොක්ඛො.

---

1. අධිමුත්තො - PTS අධිමොක්ඛො - සී 1,2. 2 චතුත්ථං - මජසං, සයා, සී 1, PTS
3. අබ්‍යාපජ්ඣෙන - සයා, සී 1, PTS. 4. අප්පතිකූලා - සී 1,2.

කිසෙයින් 'ශුභ' යයි අධිමුක්ත වේ නු යි විමොක්ෂ වේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙම මෛත්‍රී සහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් අරමුණු කොට වෙසෙයි, එසෙයින් දෙවැනි තුන්වැනි සතරවැනි දිශායෙහි සත්ත්වයන් අරමුණු කොට වෙසෙයි, මෙසෙයින් උඩ යට සරස හැමතන්හි හැම සතුන් ඇති ලොව සියල්ලන් ආත්මසමතායෙන් යුතු වැ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාපාද වූ මෛත්‍රීසහගිය සිතින් අරමුණු කොට වෙසෙයි, මෛත්‍රිය වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙති. කරුණාසහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් ... කරුණාව වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙති. මෘදුතා සහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් .. මෘදුතාව වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙති. උපෙක්ෂා සහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් ... උපෙක්ෂාව වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙත්. මෙසෙයින් 'ශුභ' යැ යි අධිමුක්ත වේ' නු යි විමොක්ෂ නම් වෙයි.

ආකාසානඤ්චායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් රූපසංඥවන් ඉක්මවීමෙන් ප්‍රතිඝ-සංඥවන් ප්‍රහාණයෙන් නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාශය අනන්ත යැ'යි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි මේ ආකාසානඤ්චායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ නම් වෙයි.

විඤ්ඤාණඤ්චායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඥනය අනන්ත යැ'යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ විඤ්ඤාණඤ්චායතනසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙසස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

සංඥවෙදයිතනිරොධසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සංඥවෙදයිතනිරොධයට පැමිණ වාසය කෙරෙයි. මේ සංඥ-වෙදයිතනිරොධසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

සමයවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ සමයවිමොක්ෂ නම් වෙයි.

අසමයවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අසමයවිමොක්ෂ නම් වෙයි.

සාමයිකවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ සාමයිකවිමොක්ෂ නම් වෙයි.

කතමො අසාමයිකො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අසාමයිකො විමොක්ඛො.

කතමො කුප්පො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං කුප්පො විමොක්ඛො.

කතමො අකුප්පො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අකුප්පො විමොක්ඛො.

කතමො ලොකියො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං ලොකියො විමොක්ඛො.

කතමො ලොකුත්තරො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං ලොකුත්තරො විමොක්ඛො.

කතමො සාසවො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සාසවො විමොක්ඛො.

කතමො අනාසවො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අනාසවො විමොක්ඛො.

කතමො සාමිසො විමොක්ඛො: රූපපටිසඤ්ඤුත්තො[1] විමොක්ඛො. අයං සාමිසො විමොක්ඛො.

කතමො නිරාමිසො විමොක්ඛො: අරූපපටිසඤ්ඤුත්තො[2] විමොක්ඛො. අයං නිරාමිසො විමොක්ඛො.

කතමො නිරාමිසා[3] නිරාමිසතරො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං නිරාමිසා නිරාමිසතරො විමොක්ඛො.

කතමො පණිහිතො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො, අයං පණිහිතො විමොක්ඛො.

කතමො අප්පණිහිතො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අප්පණිහිතො විමොක්ඛො.

කතමො පණිහිතපටිප්පස්සද්ධි[4] විමොක්ඛො: පඨමස්ස ඣානස්ස[5] පටිලාභො වා විපාකො වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා. අයං පණිහිතපටිප්පස්සද්ධිවිමොක්ඛො.

කතමො සඤ්ඤුත්තො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සඤ්ඤුත්තො විමොක්ඛො.

කතමො විසඤ්ඤුත්තො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං විසඤ්ඤුත්තො විමොක්ඛො.

කතමො එකත්තවිමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං එකත්තවිමොක්ඛො.

---

1. රූපප්පටිසඤ්ඤුත්තො මජසං, සයා, PTS 2. අරූපප්පටිසඤ්ඤුත්තො-මජසං, සයා, PTS
3. නිරාමිසා'ති නාසිපොත්ථකෙ නත්ථි 4. පණිහිතප්පටිප්පස්සද්ධි - මජසං, සයා, PTS
5. පඨමජ්ඣානස්ස - සයා, සී 1;2. PTS

අසාමයිකවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අසාමයිකවිමොක්ෂ නම් වෙයි.

කොප්‍යවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තීහු ද යන මේ කොප්‍යවිමොක්ෂ නම් වේ.

අකොප්‍යවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අකොප්‍යවිමොක්ෂ නම් වෙයි.

ලෞකිකවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තීහු ද යන මේ ලෞකිකවිමොක්ෂ නම් වෙයි.

ලොකොත්තරවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ ලොකොත්තරවිමොක්ෂ නම් වෙයි.

සාස්‍රවවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ සාස්‍රවවිමොක්ෂ නම් වෙයි.

අනාස්‍රවවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අනාස්‍රවවිමොක්ෂ නම් වෙයි.

සාමිෂ විමොක්ෂ නම් කවරෙ යත්: රූපධ්‍යානප්‍රතිසංයුක්ත වූ විමොක්ෂ-ය යි. මේ සාමිෂ විමොක්ෂ නම් වෙයි.

නිරාමිෂවිමොක්ෂ නම් කවරෙ යත්: අරූපසමාපත්තිප්‍රතිසංයුක්ත වූ විමොක්ෂය යි. මේ නිරාමිෂවිමොක්ෂ නම් වෙයි.

නිරාමිෂයට වඩා අතිශයින් නිරාමිෂ වූ විමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ නිරාමිෂයට වඩා නිරාමිෂතර වූ විමොක්ෂ නම් වෙයි.

ප්‍රණිහිතවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ ප්‍රණිහිතවිමොක්ෂ නම් වෙයි.

අප්‍රණිහිතවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අප්‍රණිහිතවිමොක්ෂ නම් වෙයි.

ප්‍රණිධි සන්හිඳීම් සඞ්ඛ්‍යාත විමොක්ෂ නම් කවරෙ යත්: ප්‍රථමධ්‍යාන-යාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ ... නෛවසඤ්ඤානාසඤ්ඤායතන-සමාපත්තියගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යි. මේ ප්‍රණිධි සන්හිඳීම් සඞ්ඛ්‍යාත විමොක්ෂ නම් වෙයි.

සංයුක්තවිමොක්ෂ නාම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ සංයුක්තවිමොක්ෂ නම් වෙයි.

විසංයුක්තවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ විසංයුක්තවිමොක්ෂ නම් වෙයි.

එකත්වවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ එකත්වවිමොක්ෂ නම් වෙයි.

කතමො නානත්තවිමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං නානත්තවිමොක්ඛො,

කතමො සඤ්ඤාවිමොක්ඛො: සියා එකො සඤ්ඤාවිමොක්ඛො දස සඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.[1]

**සියන්ති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා ඤාණං[2] නිච්චතො සඤ්ඤාය මුච්චතීති[3] සඤ්ඤාවිමොක්ඛො, දුක්ඛානුපස්සනා ඤාණං සුඛතො සඤ්ඤාය මුච්චතීති[3] සඤ්ඤාවිමොක්ඛො, අනත්තානුපස්සනා ඤාණං අත්තතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, නිබ්බිදානුපස්සනා ඤාණං නන්දියා සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, විරාගානුපස්සනා ඤාණං රාගතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, නිරොධානුපස්සනා ඤාණං සමුදයතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනා ඤාණං ආදානතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, අනිමිත්තානුපස්සනා ඤාණං නිමිත්තතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො අප්පණිහිතානුපස්සනා ඤාණං පණිධියා සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො.

එවං සියා එකො සඤ්ඤාවිමොක්ඛො දස සඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

රූපෙ අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො -පෙ- රූපෙ සුඤ්ඤතානුස්සනා ඤාණං අභිනිවෙසතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො. එවං සියා එකො සඤ්ඤාවිමොක්ඛො දසසඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, එවං සියා එකො සඤ්ඤාවිමොක්ඛො දස සඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන. අයං සඤ්ඤාවිමොක්ඛො.

කතමො ඤාණවිමොක්ඛො: සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති. දස ඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.[1]

---

1 පරියායෙන සියාති - මජසං, 2 අනිච්චානුපස්සනාඤාණ'න්ති සමාසපදං, අනිච්චානුපස්සනා ඤාණන්ති වා පාඨො තථා සෙසෙසුපි - අට්ඨකථා, 3. විමුච්චතීති - සී 2,

නානත්වවිමොක්ෂ නම් කවරේ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ නානත්වවිමොක්ෂ නම් වෙයි.

සංඥාවිමොක්ෂ නම් කවරේ යත්: එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙති ද දශසංඥාවිමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන්, පර්‍යායයෙන් වන්නේ යි.

**සියං** යනු: කිසෙයින් වන්නේ ද යත්: අනිච්චානුපස්සනාඤාණය නිත්‍ය වශයෙන් පැවැති සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, දුක්ඛානුපස්සනාඤාණය සුඛසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, අනත්තානුපස්සනාඤාණය ආත්මසංඥායෙන් මිදේ නු'යි සංඥාවිමොක්ෂ නම, නිබ්බිදානුපස්සනාඤාණය නන්දි වශයෙන් පැවැති සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, විරාගානුපස්සනා ඤාණය රාගසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, නිරොධානුපස්සනා ඤාණය සමුදයසංඥායෙන් මිදේ නු'යි සංඥාවිමොක්ෂ නම, පටිනිස්සග්ගානුපස්සනා ඤාණය ආදානසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, අනිමිත්තානුපස්සනා ඤාණය නිමිත්තසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, අප්පණිහිතානුපස්සනා ඤාණය ප්‍රණිධි සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, සුඤ්ඤතානුපස්සනා ඤාණය අභිනිවෙශසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම්.

මෙසෙයින් එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙති ද දශසංඥා විමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යි.

රූපයෙහි අනිච්චානුපස්සනා ඤාණය නිත්‍යසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනා ඤාණය අභිනිවෙශ සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම්. මෙසෙයින් එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙති ද දශසංඥාවිමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යි.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යසංඥායෙන් මිදේ නු යි සංඥාවිමොක්ෂ නම ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශසංඥායෙන් මිදේ නු යි සංඥාවිමොක්ෂ නම්. මෙසෙයින් එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙති ද දශසංඥාවිමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍යායෙන් වන්නේ යි. මේ සංඥාවිමොක්ෂ නම්.

ඥානවිමොක්ෂ නම් කවරේ යත්: එක් ඥානවිමොක්ෂය දශ ඥාන-විමොක්ෂයෝ වෙති ද දශ ඥානවිමොක්ෂයෝ එක් ඥානවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යි.

**සියාති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං නිච්චතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, දුක්ඛානුපස්සනා යථාභූතං ඤාණං සුඛතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො. අනත්තා–නුපස්සනා යථාභූතං ඤාණං අත්තතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, නිබ්බිදානුපස්සනා යථාභූතං ඤාණං නන්දියා සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, විරාගානුපස්සනා යථාභූතං ඤාණං රාගතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, නිරොධානු-පස්සනා යථාභූතං ඤාණං සමුදයතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, පටිනිස්සග්ගානුපස්සනා යථාභූතං ඤාණං ආදානතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, අනිමිත්තානුපස්සනා යථාභූතං ඤාණං නිමිත්තතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණ-විමොක්ඛො, අප්පණිහිතානුපස්සනා යථාභූතං ඤාණං පණිධියා සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, සුඤ්ඤතානුපස්සනා යථාභූතං ඤාණං අභිනිවෙසතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො.

එවං සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති, දස ඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

රූපෙ අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං නිච්චතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති, ඤාණවිමොක්ඛො -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනා යථාභූතං ඤාණං අභිනිවෙසතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණ-විමොක්ඛො. එවං සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති, දසඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං නිච්චතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා යථාභූතං ඤාණං අභිනිවෙසතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො එවං සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති, දස ඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන, අයං ඤාණවිමොක්ඛො.

**කතමෙ සීතිසියා විමොක්ඛා:** සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියා විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන

සියා යනු: කිසෙයිත් වන්නේ ද යත්: අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය නිත්‍ය වශයෙන් පැවැති සම්මෝහ සඞ්ඛ්‍යාත නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, දුක්ඛානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය සුඛ වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, අනත්තානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය ආත්ම වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, නිබ්බිදානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය නන්දි වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, විරාගානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය රාග වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, නිරොධානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය සමුදය වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, පටිනිස්සග්ගානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය ආදාන වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, අනිමිත්තානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය නිමිත්ත වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, අප්පණිහිතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය ප්‍රණිධි වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම, සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය අභිනිවේශ වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නමි.

මෙසෙයින් එක් ඥනවිමොක්‍ෂය දශඥනවිමොක්‍ෂයෝ වෙති ද දශඥනවිමොක්‍ෂයෝ එක් ඥනවිමොක්‍ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

රූපයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය නිත්‍ය වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය අභිනිවේශ වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නමි. මෙසෙයින් එක් ඥනවිමොක්‍ෂය දශ ඥනවිමොක්‍ෂයෝ වෙති ද, දශඥනවිමොක්‍ෂයෝ එක් ඥනවිමොක්‍ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි ... චක්‍ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥනය නිත්‍ය වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’ යි ඥනවිමොක්‍ෂ නම ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූත ඥනය අභිනිවේශ වශවයන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු’යි ඥනවිමොක්‍ෂ නමි. මෙසෙයින් එක් ඥනවිමොක්‍ෂය දශඥනවිමොක්‍ෂයෝ වෙති ද, දශඥනවිමොක්‍ෂයෝ එක් ඥනවිමොක්‍ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි. මේ ඥනවිමොක්‍ෂ නම් වේ.

ශීතිස්‍යාද්විමොක්‍ෂ නම් කවරේ යත්: එක් ශීතිස්‍යාද්විමොක්‍ෂය දශ ශීතිස්‍යාද්විමොක්‍ෂයෝ වෙති ද දශ ශීතිස්‍යාද්විමොක්‍ෂයෝ එක් ශීතිස්‍යාද් විමොක්‍ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

**සියාති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං[1] නිච්චතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. දුක්ඛානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං සුඛතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. අනත්තානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අත්තතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියා විමොක්ඛො. නිබ්බිදානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නන්දියා සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො, විරාගානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං රාගතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියා විමොක්ඛො. නිරොධානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං සමුදයතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං ආදානතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. අනිමිත්තානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නිමිත්තතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. අප්පණිහිතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං පණිධියා සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. සුඤ්ඤතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අභිනිවෙසතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියා විමොක්ඛො.

එවං සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

රූපෙ අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නිච්චතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො, -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අභිනිවෙසතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. එවං සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නිච්චතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අභිනිවෙසතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො.

එවං සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන. අයං සීතිසියාවිමොක්ඛො.

---

1 සීතිභාවඤාණං - සී 1, 2

**සියා** යනු: කිසෙසින් වන්නේ ද යත්: අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර (උතුම්) වූ ශීතිභාව (නිර්වාණ) ඥානය නිත්‍ය වශයෙන් පැවැති (කෙලෙශ සඞ්ඛ්‍යාත) සන්තාපපරිදාහදරථයෙන් (තැවීම්දැවීම්ළණුසුම්න්) මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, දුක්ඛානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය සුඛ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, අනත්තානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාව ඥානය ආත්ම වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, නිබ්බිදානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය නන්දි වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද් විමොක්ෂ නම, විරාගානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය රාග වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, නිරොධානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය සමුදය වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, පටිනිස්සග්ගානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය ආදාන වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේනු'යි ශීතිස්‍යාද් විමොක්ෂ නම, අනිමිත්තානුපස්සනා සංඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය නිමිත්ත වශයෙන් පැවැති සන්තාපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, අප්පණිහිතානුපස්සනා සංඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය ප්‍රණිධි වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතිස්‍යාද්විමොක්ෂ නම, සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය අභිනිවේශ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතිස්‍යාද්විමොක්ෂ නමි.

මෙසෙයින් එක් ශීතිස්‍යාද්විමොක්ෂය දශශීතිස්‍යාද්විමොක්ෂයෝ වෙති ද දශශීතිස්‍යාද්විමොක්ෂයෝ එක් ශීතිස්‍යාද්විමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන්, පර්‍යායයෙන් වන්නේ යැ.

රූපයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය නිත්‍ය වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතිස්‍යාද්විමොක්ෂ නම ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය අභිනිවේශ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නමි. මෙසෙයින් එක් ශීතිස්‍යාද් විමොක්ෂය දශශීතිස්‍යාද්විමොක්ෂයෝ වෙති ද දශ ශීතිස්‍යාද්විමොක්ෂයෝ එක් ශීතිස්‍යාද්විමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යැ.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය නිත්‍ය වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නම ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය අභිනිවේශ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්ෂ නමි.

මෙසෙයින් එක් ශීතිස්‍යාද්විමොක්ෂය දශශීතිස්‍යාද්විමොක්ෂයෝ වෙති ද දශශීතිස්‍යාද්විමොක්ෂයෝ එක් ශීතිස්‍යාද්විමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන්, පර්‍යායයෙන් වන්නේ යි. මේ ශීතිස්‍යාද්විමොක්ෂ නම් වේ.

**කතමො ඣානවිමොක්ඛො**: නෙක්ඛම්මං ඣායතීති[1] ඣානං කාමච්ඡන්දං ඣාපෙතීති ඣානං, ඣායන්තො[2] මුච්චතීති ඣානවිමොක්ඛො, ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො. ඣායන්තීති[3] ධම්මා, ඣාපෙතීති කිලෙසෙ, ඣාතෙ[4] ච ඣාපෙ ච ජානාතීති ඣානවිමොක්ඛො. අබ්‍යාපාදෙ ඣායතීති[1] ඣානං, බ්‍යාපාදං ඣාපෙතීති ඣානං, ඣායන්තො[2] මුච්චතීති ඣානවිමොක්ඛො, ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො. ඣායන්තීති[3] ධම්මා' ඣාපෙතීති කිලෙසෙ, ඣාතෙ[4] ච ඣාපෙ ච ජානාතීති ඣානවිමොක්ඛො ආලොකසඤ්ඤා ඣායතීති ඣානං, ථිනමිද්ධං ඣාපෙතීති ඣානං -පෙ- අවික්ඛෙපො ඣායතීති ඣානං, උද්ධච්චං ඣාපෙතීති ඣානං -පෙ- ධම්මවවත්ථානං ඣායතීති ඣානං, විචිකිච්ඡං ඣාපෙතීති ඣානං -පෙ- ඤාණං ඣායතීති ඣානං, අවිජ්ජං ඣාපෙතීති ඣානං, -පෙ- පාමොජ්ජං ඣායතීති ඣානං, අරතිං ඣාපෙතීති ඣානං -පෙ- පඨමං ඣානං, ඣායතීති ඣානං, නීවරණෙ[1] ඣාපෙතීති ඣානං -පෙ- අරහත්තමග්ගො ඣායතීති ඣානං, සබ්බකිලෙසෙ ඣාපෙතීති ඣානං, ඣායන්තො මුච්චතීති ඣානවිමොක්ඛො, ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො. ඣායන්තීති ධම්මා, ඣාපෙතීති කිලෙසෙ, ඣාතෙ ච ඣාපෙ ච ජානාතීති ඣානවිමොක්ඛො. අයං ඣානවිමොක්ඛො.

**කතමො** අනුපාදචිත්තස්ස විමොක්ඛො: සියා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො දස අනුපාදචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

**සියාති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. දුක්ඛානුපස්සනා ඤාණං සුඛතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. අනත්තානුපස්සනා ඤාණං අත්තතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. නිබ්බිදානුපස්සනා ඤාණං නන්දියා උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. විරාගානුපස්සනා ඤාණං රාගතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. නිරොධානුපස්සනා ඤාණං සමුදයතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනා ඤාණං ආදානතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. අනිමිත්තානුපස්සනා ඤාණං නිමිත්තතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. අප්පණිහිතානුපස්සනා ඤාණං පණිධියා උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො උපාදානා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො.

**එවං** සියා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො දස අනුපාදචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

---

1. ජායතීති - සයා, පු. 2. ජායන්තො - සයා 3. ජායන්තීති - සයා 4. ජාතෙ - සයා
5 නීවරණං - සයා.

ධ්‍යානවිමොක්‍ෂ නම් කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍ය තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, කාමච්ඡන්දය දවා නු’ යි ධ්‍යාන නම, ධ්‍යාන කරනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම, දවනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම. **ඣායන්ති** යනු: ධර්මයෝ යැ, **ඣාපෙති** යනු: කෙලෙසුන් යැ; ධ්‍යාන කළ ධර්මයන් ද දැවුණු කෙලෙසුන් ද දනී නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම, අව්‍යාපාද තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, ව්‍යාපාදය දවා නු’ යි ධ්‍යාන නම, ධ්‍යාන කරනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම, දවනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම. **ඣායන්ති** යනු: ධර්මයෝ යැ, **ඣාපෙති** යනු: කෙලෙසුන් යැ, ධ්‍යාන කළ ධර්මයන් ද දැවුණු කෙලෙසුන් ද දනී නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම. ආලෝකසංඥ තොමෝ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නමු, ථිනමිද්ධය දවා නු’ යි ධ්‍යාන නමු ... අවික්‍ෂෙප තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, ඖද්ධත්‍යය දවා නු’ යි ධ්‍යාන නම ... ධර්මව්‍යවස්ථාන තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, විචිකිත්සාව දවා නු’ යි ධ්‍යාන නම ... ඥාන තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, අවිද්‍යාව දවා නු’ යි ධ්‍යාන නම ... ප්‍රාමොද්‍ය තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, අරතිය දවා නු’ යි ධ්‍යාන නම ... ප්‍රථමධ්‍යාන තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, නීවරණයන් දවා නු’ යි ධ්‍යාන නම ... අර්හත්මාර්ග තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, හැම කෙලෙසුන් දවා නු’ යි ධ්‍යාන නම ... ධ්‍යාන කරනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නම, දවනුයේ මිදේ නු’ යි ධ්‍යාන විමොක්‍ෂ නම. **ඣායන්ති** යනු: ධර්මයෝ යැ, **ඣාපෙති** යනු: කෙලෙසුන් යැ, ධ්‍යාන කළ දහම්හුදු දැවුණු කෙලෙසුනුදු දනී නු’ යි ධ්‍යානවිමොක්‍ෂ නමි. මේ ධ්‍යානවිමොක්‍ෂ නම් වේ.

අනුපාදචිත්තවිමොක්‍ෂ කවරෙ යත්: එක් අනුපාදචිත්තවිමොක්‍ෂය දශ අනුපාදචිත්තවිමොක්‍ෂයෝ වෙතී ද දශ අනුපාදචිත්තවිමොක්‍ෂයෝ එක් අනුපාදචිත්තවිමොක්‍ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ සි.

**සියං** යනු: කිසෙයින් වන්නේ යැ යත්: අනිච්චානුපස්සනාඤාණය නිත්‍යවශයෙන් පැවැති උපාදනයෙන් (ග්‍රහණයෙන්) මිදේ නු’ යි අනුපාද-චිත්තවිමොක්‍ෂ යැ, දුක්ඛානුපස්සනාඤාණය සුඛවශයෙන් පැවැති උපාදන-යෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ, අනත්තානුපස්සනාඤාණය ආත්මවශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ, නිබ්බිදානුපස්සනාඤාණය නන්දිවශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ විරාගානුපස්සනාඤාණය රාගවශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ නිරොධානුපස්සනා-ඤාණය සමුදය වශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්ත-විමොක්‍ෂ යැ පටිනිස්සග්ගානුපස්සනාඤාණය ආදානවශයෙන් පැවැති උපාද-නයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්තවශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ අප්පණිහිතානුපස්සනාඤාණය ප්‍රණිධිවශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යැ සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශ වශයෙන් පැවැති උපාදනයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්‍ෂ යි.

මෙසෙයින් එක් අනුපාදචිත්තවිමොක්‍ෂය දශ අනුපාදචිත්තවිමොක්‍ෂයෝ වෙතී ද දශ අනුපාදචිත්තවිමොක්‍ෂයෝ එක් අනුපාදචිත්තවිමොක්‍ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ සි.

රූපෙ අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො උපාදානා මුච්චතීති අනුපාදාචිත්තස්ස විමොක්ඛො. -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො උපාදානා මුච්චතීති අනුපාදාචිත්තස්ස විමොක්ඛො. එවං සියා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො උපාදානා මුච්චතීති අනුපාදාචිත්තස්ස විමොක්ඛො. එවං සියා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

අනිච්චානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි[1] මුච්චති. දුක්ඛානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි මුච්චති. අනත්තානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි මුච්චති. නිබ්බිදානුපස්සනා ඤාණං -පෙ- විරාගානුපස්සනා ඤාණං -පෙ- නිරොධානුපස්සනා ඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සනා ඤාණං -පෙ- අනිමිත්තානුපස්සනා ඤාණං -පෙ- අප්පණිහිතානුපස්සනා ඤාණං -පෙ- සුඤ්ඤතානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි මුච්චතීති.

අනිච්චානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති, දුක්ඛානුපස්සනා ඤාණං එකුපාදානා[2] මුච්චති, අනත්තානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති, නිබ්බිදානුපස්සනා ඤාණං එකුපාදානා මුච්චති, විරාගානුපස්සනා ඤාණං එකුපාදානා මුච්චති, නිරොධානුපස්සනා ඤාණං චතූහුපාදානෙහි මුච්චති, පටිනිස්සග්ගානුපස්සනා ඤාණං චතූහුපාදානෙහි මුච්චති, අනිමිත්තානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති, අප්පණිහිතානුපස්සනා ඤාණං එකුපපාදානා මුච්චති, සුඤ්ඤතානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති.

අනිච්චානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා[3] අත්තවාදුපාදානා. අනිච්චානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති.

දුක්ඛානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. දුක්ඛානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා[4] මුච්චති.

අනත්තානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. අනත්තානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති.

නිබ්බිදානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. නිබ්බිදානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා මුච්චති.

විරාගානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. විරාගානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා මුච්චති.

1 කතිහු පාදානෙහි - මජසං., සයා
2. එකුපාදානා - මජසං., සයා,
3. සීලබ්බතුපාදානා -මජසං., සයා
4 ඉතොපාදානා - සයා. ඉමා එකුපාදානා - සී 1, ඉමං එකුපාදානං - PTS,

රූපයෙහි අනිච්චානුපස්සනාඥාණය නිත්‍යවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු' යි අනුපාදවිත්තවිමොක්ෂ යැ ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවෙශ වශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු' යි අනුපාදවිත්තවිමොක්ෂ යි. මෙසෙයින් එක් අනුපාදවිත්තවිමොක්ෂය දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ වෙතී ද දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ එක් අනුපාදවිත්තවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍යායයෙන් වත්තේ යැ.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවෙශ වශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු' යි අනුපාදවිත්තවිමොක්ෂ යි. මෙසෙයින් එක් අනුපාදවිත්තවිමොක්ෂය දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ වෙතී ද දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ එක් අනුපාදවිත්තවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වත්තේ යි.

අනිච්චානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද, දුක්ඛානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද, අනත්තානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද, නිබ්බිදානුපස්සනාඥාණය ... විරාගානුපස්සනාඥාණය ... නිරොධානුපස්සනාඥාණය ... පටිනිස්සග්ගානුපස්සනාඥාණය ... අනිමිත්තානුපස්සනාඥාණය ... අප්පණිහිතානුපස්සනාඥාණය ... සුඤ්ඤතානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද යත්:

අනිච්චානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදෙයි, දුක්ඛානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, අනත්තානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදෙයි, නිබ්බිදානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, විරාගානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, නිරොධානුපස්සනාඥාණය සතර උපාදානයෙකින් මිදෙයි, පටිනිස්සග්ගානුපස්සනාඥාණය සතර උපාදානයෙකින් මිදෙයි, අනිමිත්තානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදෙයි, අප්පණිහිතානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, සුඤ්ඤතානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදේ.

අනිච්චානුපස්සනාඥාණය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත්: දෘෂ්ට්‍යුපාදානයෙන ශීලව්‍රතොපාදානයෙන ආත්මවාදෙපාදානයෙනි. අනිච්චානුපස්සනාඥාණය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

දුක්ඛානුපස්සනාඥාණය කවර එක් උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙනි. දුක්ඛානුපස්සනාඥාණය මේ එක් උපාදානයෙන් මිදෙයි.

අනත්තානුපස්සනාඥාණය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත්: දෘෂ්ට්‍යුපාදානයෙන, ශීලව්‍රතොපදානයෙන, ආත්මවාදෙපාදානයෙනි. අනත්තානුපස්සනාඥාණය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

නිබ්බිදානුපස්සනාඥාණය කවර එක් උපාදානයෙකින මිදෙයි යත්: කාමොපදානයෙනි. නිබ්බිදානුපස්සනාඥාණය මේ එක් උපාදානයෙන් මිදෙයි.

විරාගානුපස්සනාඥාණය කවර එක් උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙනි. විරාගානුපස්සනාඥාණය මේ එක් උපාදානයෙන් මිදෙයි.

නිරොධානුපස්සනා ඤාණං කතමෙහි චතුහුපාදානෙහි මුච්චති: කාමුපාදානා දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. නිරොධානුපස්සනා ඤාණං ඉමෙහි චතුහුපාදානෙහි මුච්චති.

පටිනිස්සග්ගානුපස්සනා ඤාණං කතමෙහි චතුහුපාදානෙහි මුච්චති: කාමුපාදානා දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. පටිනිස්සග්ගානුපස්සනා ඤාණං ඉමෙහි චතුහුපාදානෙහි මුච්චති.

අනිමිත්තානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. අනිමිත්තානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති

අප්පණිහිතානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. අප්පණිහිතානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා මුච්චති.

සුඤ්ඤතානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. සුඤ්ඤතානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති.

යඤ්ච අනිච්චානුපස්සනා ඤාණං, යඤ්ච අනත්තානුපස්සනා ඤාණං, යඤ්ච අනිමිත්තානුපස්සනා ඤාණං, යඤ්ච සුඤ්ඤතානුපස්සනා ඤාණං, ඉමානි චත්තාරි ඤාණානි තීහුපාදානෙහි මුච්චන්ති: දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. යඤ්ච දුක්ඛානුපස්සනා ඤාණං, යඤ්ච නිබ්බිදානුපස්සනා ඤාණං, යඤ්ච විරාගානුපස්සනා ඤාණං, යඤ්ච අප්පණිහිතානුපස්සනා ඤාණං, ඉමානි චත්තාරි ඤාණානි එකුපාදානා මුච්චන්ති: කාමුපාදානා. යඤ්ච නිරොධානුපස්සනා ඤාණං, යඤ්ච පටිනිස්සග්ගානුපස්සනා ඤාණං, ඉමානි ද්වෙ ඤාණානි චතුහුපාදානෙහි මුච්චන්ති: කාමුපාදානා දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. අයං අනුපාද[1] චිත්තස්ස විමොක්ඛො.

## විමොක්ඛකථාය පඨමකභාණවාරං.[2]

තීණි ඛො පනිමානි විමොක්ඛමුඛානි, ලොකනිය්‍යානාය සංවත්තන්ති: සබ්බසඞ්ඛාරෙ පරිච්ඡෙදපරිවට්ටුමතො[3] සමනුපස්සනතාය අනිමිත්තාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය, සබ්බසඞ්ඛාරෙසු මනොසමුත්තෙජනතාය අප්පණිහිතාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය, සබ්බධම්මෙ පරතො සමනුපස්සනතාය, සුඤ්ඤතාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය ඉමානි තීණි විමොක්ඛමුඛානි ලොකනිය්‍යානාය සංවත්තන්ති.

අනිච්චතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති.[4] දුක්ඛතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති. අනත්තතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති: අනිච්චතො මනසිකරොතො ඛයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, දුක්ඛතො මනසිකරොතො භයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො සඞ්ඛාරා උපට්ඨහන්ති.

1 අනුපාදය - සී 1,
2 පඨමභාණවාරො-මජසං, පඨමභාණවාරං - සෞ PTS,
3. පරිවට්ටුමතො සෞ, පරිවට්ටනතො - PTS
4. උපට්ඨහන්ති - මජසං, සෞ

නිරොධානුපස්සනාඥානය කවර සතර උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙන, දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදො-පාදානයෙනි. නිරොධානුපස්සනාඥානය මේ සතර උපාදානයෙන් මිදෙයි.

පටිනිස්සග්ගානුපස්සනාඥානය කවර සතර උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙන, දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදො-පාදානයෙනි. පටිනිස්සග්ගානුපස්සනාඥානය මේ සතර උපාදානයෙන් මිදෙයි.

අනිමිත්තානුපස්සනාඥානය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත්: දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදොපාදානයෙනි. අනි-මිත්තානුපස්සනාඥානය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

අප්පණිහිතානුපස්සනාඥානය කවර එක් උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙනි. අප්පණිහිතානුපස්සනාඥානය මේ එක් උපාදානයෙන් මිදෙයි.

සුඤ්ඤතානුපස්සනාඥානය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත් දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදොපාදානයෙනි. සුඤ්ඤ-තානුපස්සනාඥානය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

යම් අනිච්චානුපස්සනාඥානයෙකුත් යම් අනත්තානුපස්සනාඥානයෙ-කුත් යම් අනිමිත්තානුපස්සනාඥානයෙකුත් යම් සුඤ්ඤතානුපස්සනාඥාන-යෙකුත් වේ ද, මේ සතර ඥානයෝ තුන් උපාදානයෙකින් මිදෙති: දෘෂ්ටුපා-දානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදොපාදානයෙනි. යම් දුක්ඛානු-පස්සනාඥානයෙකුත් යම් නිබ්බිදානුපස්සනාඥානයෙකුත් යම් විරාගානු-පස්සනාඥානයෙකුත් යම් අප්පණිහිතානුපස්සනාඥානයෙකුත් වේ ද, මේ සතර ඥානයෝ එක් උපාදානයෙකින් මිදෙති: කාමොපාදානයෙනි. යම් නිරොධානුපස්සනාඥානයෙකුත් යම් පටිනිස්සග්ගානුපස්සනාඥානයෙකුත් වේ ද මේ ඥානයෝ දෙදෙන සතර උපාදානයෙකින් මිදෙති: කාමොපා-දානයෙන දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදොපාදානයෙනි. මේ අනුපාදවිත්තවිමොක්ෂ යි.

**විමොක්ෂකථායෙහි පළමු වන බණවර යි.**

මේ තුන් විමොක්ෂමුඛයෝ (ත්‍රෛධාතුක) ලොකයෙන් නික්මීම පිණිස පවතිත්: හැම සංස්කාරයන් පරිච්ඡෙද වශයෙන් පයීනාන වශයෙන් නුවණින් විමසන බැවින් ද අනිමිත්ත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසෙන බැවින් ද (ලොකනියර්‍යාණය වෙයි), හැම සංස්කාරයන්හි සිත සංවෙග කරන බැවින් ද අප්‍රණිහිත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසෙන බැවින් ද (ලොකනියර්‍යාණය වෙයි), හැම ධර්මයන් අනාත්ම වශයෙන් නුවණින් විමසන බැවින් ද ශූන්‍යත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසෙන බැවින් ද (ලොකනියර්‍යාණය වෙයි). මේ තුන් විමොක්ෂමුඛයෝ ලොක-නියර්‍යාණය පිණිස පවතිත්.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ක්ෂය විසින් සංස්කාරයෝ වටහති. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට භය විසින් සංස්කාරයෝ වටහති. අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට ශූන්‍ය විසින් සංස්කාරයෝ වටහත්.

අනිච්චතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති: අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො වෙදබහුලං චිත්තං හොති.

අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො කතමින්ද්‍රියං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො කතමින්ද්‍රියං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො කතමින්ද්‍රියං පටිලභති: අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො සද්ධින්ද්‍රියං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො සමාධින්ද්‍රියං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො පඤ්ඤින්ද්‍රියං පටිලභති.

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි[1] හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කො භාවෙති:

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කො භාවෙති:

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියා තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කො භාවෙති:

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස සද්ධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස ඉන්ද්‍රියභාවනා.

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස සමාධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස ඉන්ද්‍රියභාවනා.

---

1. තදන්වයා - මජසං, ස,

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට අධිමොක්ෂය බහුල කොට ඇති සිත වෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රශ්‍රබ්ධිය බහුල කොට ඇති සිත වෙයි, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට තුෂ්ටිය බහුල කොට ඇති සිත වේ.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අධිමොක්ෂය බහුල කොට ඇතියේ කවර ඉන්‍ද්‍රියයක් ලබා ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ ප්‍රශ්‍රබ්ධිය බහුල කොට ඇතියේ කවර ඉන්‍ද්‍රියයක් ලබා ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ තුෂ්ටිය බහුල කොට ඇතියේ කවර ඉන්‍ද්‍රියයක් ලබා ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අධිමොක්ෂය බහුල කොට ඇතියේ ශ්‍රද්ධෙන්‍ද්‍රියය ලබයි, දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ ප්‍රශ්‍රබ්ධිය බහුල කොට ඇතියේ සමාධීන්‍ද්‍රිය ලබයි, අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ තුෂ්ටිය බහුල කොට ඇතියේ ප්‍රඥෙන්‍ද්‍රිය ලබා.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට කවර ඉන්‍ද්‍රියයෙක් අධිපති කොට ඇත්තේ වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්‍ද්‍රියයෝ එය අනුව යන්නාහු වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යො’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකකෘත්‍යයෝ වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද,

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර ඉන්‍ද්‍රියයෙක් අධිපති කොට ඇත්තේ වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්‍ද්‍රියයෝ එය අනුව යන්නාහු වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යො’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද,

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර ඉන්‍ද්‍රියයෙක් අධිපති කොට ඇත්තේ වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්‍ද්‍රියයෝ එය අනුව යන්නාහු වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යො’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට ශ්‍රද්ධෙන්‍ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්‍ද්‍රිය කෙනෙක් තදනුකූල වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, (විමුක්තිරසයෙන්) එකරසාර්ථයෙන් භාවනාව වෙයි, යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හෙතෙම භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට ඉන්‍ද්‍රියභාවනා නැති.

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට සමාධීන්‍ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්‍ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි. යමෙක් සම්‍යක් ප්‍රතිපන්න වේ ද හෙතෙම භාවනා කෙරෙයි. මිථ්‍යාප්‍රතිපන්නයාහට ඉන්‍ද්‍රියභාවනා නැති.

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස ඉන්ද්‍රියභාවනා.

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස සද්ධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො. එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති.

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නා වූ තුෂ්ටිබහුලයාහට ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හෙතෙම භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට ඉන්ද්‍රියභාවනා නැති.

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, (සත්‍ය) ප්‍රතිවෙධ කාලයෙහි කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, සත්‍යප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවර අර්ථයෙකින් ප්‍රතිවෙධය වේ ද යත්:

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, ප්‍රතිවෙධ කාලයෙහි කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙන් භාවනා වේ ද, කවර අර්ථයෙන් ප්‍රතිවෙධ වෙයි යත්:

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාත ප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, ප්‍රතිවෙධකාලයෙහි කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙන් භාවනා වේ ද, කවර අර්ථයෙන් ප්‍රතිවෙධ වෙයි යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට ශ්‍රද්ධෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රතිවෙධකාලයෙහි ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි, මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද, ප්‍රතිවෙධ කෙරේ.

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස සමාධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වායානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය චත්තාරින්ද්‍රියානි තදන්වායානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති.

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වායානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ[1], පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය චත්තාරින්ද්‍රියානි තදන්වායානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති.

අනිච්චතො මනසිකරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති, කතමින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො[2] හොති. දුක්ඛතො මනසිකාරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති, කතමින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී[3] හොති. අනත්තතො මනසිකරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති, කතමින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො,[2] හොති, දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති.

'සද්දහන්තො විමුත්තො'ති[4] සද්ධාවිමුත්තො,[2] ඵුට්ඨත්තා සච්ඡිකතො'ති[5] කායසක්ඛී, 'දිට්ඨත්තා පත්තො'ති දිට්ඨිප්පත්තො, සද්දහන්තො විමුච්චතී'ති[6] සද්ධාවිමුත්තො,[2] 'ඣානඵස්සං පඨමං ඵුසති, පච්ඡා නිරොධං නිබ්බානං සච්ඡිකරොතී'ති කායසක්ඛී, 'දුක්ඛා සඞ්ඛාරා, සුඛො නිරොධො'ති ඤාතං.[7] හොති දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤායා'ති දිට්ඨිප්පත්තො.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, සියා ඉමෙ තයො පුග්ගලා සද්ධාවිමුත්තාපි කායසක්ඛීපි දිට්ඨිප්පත්තාපි වත්ථුවසෙන පරියායෙන.[8]

---

1. පටිවෙධකාලෙපි - මජසං. 2. සද්ධාධිමුත්තො - ස්‍යා. 3. කායසක්ඛි - ස්‍යා.
4. අධිමුත්තොතාති - ස්‍යා. 5. සච්ඡිකරොතීති - ස්‍යා. PTS.
6. අධිමුච්චතීති - ස්‍යා. 7. ඤාණං - ස්‍යා.
8. පරියායෙන සියාති - මජසං.

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට සමාධීන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රතිවෙධකාලයෙහි ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි, මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද, භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද, ප්‍රතිවෙධ කෙරේ.

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නා වූ, තුෂ්ටිබහුලයාහට ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රතිවෙධ කාලයෙහි ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි, මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට කවර ඉන්ද්‍රියයෙක් බලවත් වේ ද, කවර ඉන්ද්‍රියයක් බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වේ ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට කවර ඉන්ද්‍රියයෙක් බලවත් වේ ද, කවර ඉන්ද්‍රියයක් බලවත් බැවින් කායසාක්ෂි වේ ද, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට කවර ඉන්ද්‍රියයෙක් බලවත් වේ ද, කවර ඉන්ද්‍රියයක් බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වෙයි යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ.

හදහමින් මිදුණේ නු'යි ශ්‍රද්ධාවිමුක්ත යැ (ධ්‍යානස්පර්ශය) ස්පර්ශ කළ බැවින් ප්‍රත්‍යක්ෂ කරන ලද නු'යි කායසාක්ෂි යැ (ප්‍රඥෙන්ද්‍රියයෙන්) දක්නා ලද බැවින් (නිවනට) පැමිණියේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත යි. හදහමින් මිදේ නු'යි ශ්‍රද්ධාවිමුක්ත යැ ධ්‍යානස්පර්ශය පළමු වැ ස්පර්ශ කෙරෙයි, පසුව නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය සාක්ෂාත් කෙරේ නු'යි කායසාක්ෂි යැ සංස්කාරයෝ දුඃඛයෝ යැ නිරොධය සුබ යැ'යි ප්‍රඥයෙන් දන්නා ලද දක්නා ලද ප්‍රකට කරන ලද සාක්ෂාත් කරන ලද ස්පර්ශ කරනලද වේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත යි.

යමෙකුත් ශ්‍රද්ධාවිමුක්තපුද්ගල වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මේ පුද්ගලයෝ තිදෙන වස්තුවශයෙන් පර්‍යායයෙන් ශ්‍රද්ධාවිමුක්ත ද වන්නාහ, කායසාක්ෂි ද වන්නාහ, දෘෂ්ටිප්‍රාප්ත ද වන්නාහු යි.

**සියාති** කථඤ්ච සියා. අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, දුක්ඛතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, අනත්තතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, එවං ඉමෙ තයො පුග්ගලා සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා.

දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනත්තතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනිච්චතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, එවං ඉමෙ තයො පුග්ගලා සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී.

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති. අනිච්චතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති, දුක්ඛතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති. එවං ඉමෙ තයො පුග්ගලා පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, එවං සියා ඉමෙ තයො පුග්ගලා සද්ධාවිමුත්තාපි කායසක්ඛීපි දිට්ඨිප්පත්තාපි වත්ථුවසෙන පරියායෙන.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, සියා ඉමෙ තයො පුග්ගලා අඤ්ඤො යෙව සද්ධාවිමුත්තො, අඤ්ඤො කායසක්ඛී, අඤ්ඤො දිට්ඨිප්පත්තො.

**සියාති** කථඤ්ච සියා. අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති. අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, එවං සියා ඉමෙ තයො පුග්ගලා සද්ධාවිමුත්තාපි කායසක්ඛීපි දිට්ඨිප්පත්තාපි වත්ථුවසෙන පරියායෙන, අඤ්ඤො යෙව සද්ධාවිමුත්තො අඤ්ඤො කායසක්ඛී, අඤ්ඤො දිට්ඨිප්පත්තො.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිමග්ගං පටිලභති, තෙන වුච්චති සද්ධානුසාරී. චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, සද්ධින්ද්‍රියස්ස වසෙන චතුන්නං ඉන්ද්‍රියානං භාවනා හොති. යෙ හි කෙචි සද්ධින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිමග්ගං පටිලභන්ති, සබ්බෙ තෙ සද්ධානුසාරිනො.

**සියා** යනු: කිසෙයින් වන්නේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. මෙසෙයින් මේ තුන් පුහුලෝ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වන්නාහ.

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වේ. වෙසෙයින් මේ තුන් පුහුලෝ සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වන්නාහ.

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වෙයි. අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ. මෙසෙයින් මේ තුන් පුහුලෝ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වන්නාහ.

යමෙකුත් ශ්‍රද්ධාවිමුක්තපුද්ගල වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මෙසෙයින් මේ පුද්ගලයෝ තිදෙන වස්තුවශයෙන් පර්‍යායයෙන් ශ්‍රද්ධාවිමුක්ත ද කායසාක්ෂි ද දෘෂ්ටිප්‍රාප්ත ද වන්නාහු යි.

යම් ද පුද්ගලයෙක් ශ්‍රද්ධාවිමුක්ත වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මේ පුද්ගලයෝ තිදෙන අනෙකෙක් මැ ශ්‍රද්ධාවිමුක්ත වන්නේ යැ අනෙකෙක් මැ කායසාක්ෂි වන්නේ යැ අනෙකෙක් මැ දෘෂ්ටිප්‍රාප්ත වන්නේ යි.

**සියා** යනු: කිසෙයින් වන්නේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ.

යම් ද පුද්ගලයෙක් ශ්‍රද්ධාවිමුක්ත වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මෙසෙයින් මේ පුද්ගලයෝ තිදෙන වස්තුවශයෙන් පර්‍යායයෙන් ශ්‍රද්ධාවිමුක්ත ද වන්නේ යැ කායසාක්ෂි ද වන්නේ යැ දෘෂ්ටිප්‍රාප්ත ද වන්නේ යැ, අනෙකෙක් මැ ශ්‍රද්ධාවිමුක්ත වන්නේ යැ අනෙකෙක් මැ කායසාක්ෂි වන්නේ යැ අනෙකෙක් මැ දෘෂ්ටිප්‍රාප්ත වන්නේ යි.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිමාර්ගය ලබයි, එයින් කියනු ලැබෙයි 'ශ්‍රද්ධානුසාරී' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත්. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ භාවනා වෙයි. යම් කිසි කෙනෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිමාර්ගය ලබත් ද එ හැම දෙන 'ශ්‍රද්ධානුසාරී' වෙති.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති, තෙන වුච්චති සද්ධාවිමුත්තො: චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, සද්ධින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි සද්ධින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිඵලං සච්ඡිකතා, සබ්බෙ තෙ සද්ධාවිමුත්තා.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සකදාගාමිමග්ගං පටිලභති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අනාගාමිමග්ගං පටිලභති -පෙ- අනාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අරහත්තමග්ගං පටිලභති -පෙ- අරහත්තං.[1] සච්ඡිකතං හොති, තෙන වුච්චති සද්ධාවිමුත්තො, චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති -පෙ- සම්පයුත්තපච්චයා හොන්ති, සද්ධින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි සද්ධින්ද්‍රියස්ස වසෙන අරහත්තං සච්ඡිකතා[2] සබ්බෙ තෙ සද්ධාවිමුත්තා.

දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිමග්ගං පටිලභති, තෙන වුච්චති කායසක්ඛි; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, සමාධින්ද්‍රියස්ස වසෙන චතුන්නං ඉන්ද්‍රියානං භාවනා හොති, යෙ හි කෙචි සමාධින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිමග්ගං පටිලභන්ති, සබ්බෙ තෙ කායසක්ඛී.

දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති පෙ- සකදාගාමිමග්ගං පටිලභති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අනාගාමිමග්ගං පටිලභති -පෙ- අනාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අරහත්තමග්ගං පටිලභති -පෙ- අරහත්තං සච්ඡිකතං හොති, තෙන වුච්චති කායසක්ඛි; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා සමාධින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙහි කෙචි සමාධින්ද්‍රියස්ස වසෙන අරහත්තං සච්ඡිකතා, සබ්බෙ තෙ කායසක්ඛී,

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්ති මග්ගං පටිලභති, තෙන වුච්චති ධම්මානුසාරී; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති; පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චතුන්නං ඉන්ද්‍රියානං භාවනා හොති, යෙ හි කෙචි පඤ්ඤින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිමග්ගං පටිලභන්ති සබ්බෙ තෙ ධම්මානුසාරිනො.

---

1. අරහත්තඵලං - සං PTS,
2. සච්ඡිකතං - මජසං

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත් කරනලද වෙයි. එහින් කියනු ලැබෙයි 'ශ්‍රද්ධාවිමුක්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යො'න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙත්. යම් කිසි කෙනෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත් කළාහු ද එහැම දෙන ශ්‍රද්ධාවිමුක්ත වෙති.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් සකෘදාගාමිමාර්ගය ලබයි... සකෘදාගාමිඵලය සාක්ෂාත් කරනලද වෙයි ... අර්හත්මාර්ගය ලබයි... අර්හත්ඵලය සාක්ෂාත් කරනලද වෙයි, එහින් කියනු ලැබෙයි 'ශ්‍රද්ධාවිමුක්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති ...සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙති. යම් කිසි කෙනෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් අර්හත්ඵලය සාක්ෂාත් කළාහු ද එහැම දෙන ශ්‍රද්ධාවිමුක්ත වෙත්.

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිමාර්ගය ලබයි, එහින් කියනු ලැබෙයි 'කායසාක්ෂි' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ භාවනා වෙයි, යම් කිසි කෙනෙක් සමාධීන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිමාර්ගය ලබත් ද එහැම දෙන 'කායසාක්ෂි වෙත්.

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිඵලය පසක් කරනලද වෙයි ... සකෘදාගාමිමාර්ගය ලබයි ... සකෘදාගාමිඵලය පසක් කරනලද වෙයි ... අනාගාමිමාර්ගය ලබයි ... අනාගාමිඵලය පසක් කරනලද වෙයි ... අර්හත්මාර්ගය ලබයි ... අර්හත්ඵලය පසක් කරනලද වෙයි, එහින් කියනු ලැබෙයි 'කායසාක්ෂි' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙත්. යම් කිසි කෙනෙක් සමාධීන්ද්‍රියයාගේ වශයෙන් අර්හත්ඵලය පසක් කළාහු ද එහැම දෙන 'කායසාක්ෂි' වෙත්.

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිමාර්ගය ලබයි, එහින් කියනු ලැබෙයි 'ධර්මානුසාරී' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ භාවනා වෙයි. යම් කිසි කෙනෙක් ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිමාර්ගය ලබත් ද, එහැම දෙන 'ධර්මානුසාරී' වෙත්.

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති; තෙන වුච්චති දිට්ඨිප්පත්තො: චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි පඤ්ඤින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිඵලං සච්ඡිකතා, සබ්බෙ තෙ දිට්ඨිප්පත්තා.

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා සකදාගාමිමග්ගං පටිලභති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අනාගාමිමග්ගං පටිලභති -පෙ- අනාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අරහත්තමග්ගං පටිලභති -පෙ- අරහත්තං සච්ඡිකතං හොති, තෙන වුච්චති දිට්ඨිප්පත්තො; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අරහත්තං සච්ඡිකතා, සබ්බෙ තෙ දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි නෙක්ඛම්මං[1], භාවිතා වා භාවෙන්ති වා භාවිස්සන්ති වා, අධිගතා වා අධිගච්ඡන්ති වා අධිගමිස්සන්ති වා, පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පටිලද්ධා වා පටිලභන්ති වා පටිලභිස්සන්ති වා පටිවිද්ධා වා පටිවිජ්ඣන්ති වා පටිවිජ්ඣිස්සන්ති වා, සච්ඡිකතා වා සච්ඡිකරොන්ති වා සච්ඡිකරිස්සන්ති වා, ඵස්සිතා වා ඵස්සන්ති වා ඵස්සිස්සන්ති වා, වසිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පාරමිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, වෙසාරජ්ජප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා,[2] සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි අබ්‍යාපාදං -පෙ- ආලොකසඤ්ඤං -පෙ- අවික්ඛෙපං -පෙ- ධම්මවවත්ථානං -පෙ- ඤාණං -පෙ- පාමොජ්ජං[3] -පෙ- පඨමං ඣානං[4] -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තිං -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං -පෙ- අනිච්චානුපස්සනං -පෙ- දුක්ඛානුපස්සනං -පෙ- අනත්තානුපස්සනං -පෙ- නිබ්බිදානුපස්සනං -පෙ- විරාගානුපස්සනං -පෙ- නිරොධානුපස්සනං -පෙ- පටිනිස්සග්ගානුපස්සනං -පෙ- ඛයානුපස්සනං -පෙ- වයානුපස්සනං -පෙ- විපරිණාමානුපස්සනං -පෙ- අනිමිත්තානුපස්සනං -පෙ- අප්පණිහිතානුපස්සනං -පෙ- සුඤ්ඤතානුපස්සනං -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනං -පෙ- යථාභූතඤාණදස්සනං -පෙ- ආදීනවානුපස්සනං -පෙ- පටිසඞ්ඛානුපස්සනං -පෙ- විවට්ටනානුස්සනං -පෙ- සොතාපත්තිමග්ගං -පෙ- සකදාගාමිමග්ගං -පෙ- අනාගාමිමග්ගං -පෙ- අරහත්තමග්ගං -පෙ- යෙ හි කෙචි චත්තාරො සති පට්ඨානෙ -පෙ- චත්තාරො සම්මප්පධානෙ -පෙ- චත්තාරො ඉද්ධිපාදෙ -පෙ- පඤ්චින්ද්‍රියානි -පෙ- පඤ්ච බලානි -පෙ- සත්ත බොජ්ඣඞ්ගෙ -පෙ- අරියං අට්ඨඞ්ගිකං මග්ගං -පෙ- යෙ හි කෙචි අට්ඨ විමොක්ඛෙ භාවිතා වා භාවෙන්ති වා භාවිස්සන්ති වා, අධිගතා වා අධිගච්ඡන්ති වා අධිගමිස්සන්ති වා,

1. නික්ඛම්මං - සී1, 2. සද්ධාධිමුත්තා - ස්‍යා,
3. පාමුජ්ජං - ස්‍යා. 4. පඨමජ්ඣානං - ස්‍යා. PTS.

අනාත්ම හෙයින් මෛනෙක්කරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත්කෘත වෙයි, එයින් කියනු ලැබෙයි 'දෘෂ්ටිප්‍රාප්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙති, යම් කිසි කෙනෙක් ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත්කෘත වෙත් ද එහැම දෙන 'දෘෂ්ටිප්‍රාප්ත' වෙත්.

අනාත්ම හෙයින් මෛනෙක්කරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් සකෘදාගාමිමාර්ගය ලබයි ... සකෘදාගාමිඵලය සාක්ෂාත්කෘත වෙයි ... අනාගාමිමාර්ගය ලබයි ... අනාගාමිඵලය සාක්ෂාත්කෘත වෙයි ... අර්හත්මාර්ගය ලබයි ... අර්හත්ඵලය සාක්ෂාත්කෘත වෙයි, එයින් කියනු ලැබෙයි 'දෘෂ්ටිප්‍රාප්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩන ලද්දාහු වෙති. යම් කිසි කෙනෙක් ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අර්හත්ඵලය සාක්ෂාත්කෘත වෙත් ද එහැම දෙන 'දෘෂ්ටිප්‍රාප්ත' වෙත්.

යම් කිසි කෙනෙක් නෛෂ්ක්‍රම්‍යය වැඩූහු ද වඩත් ද වඩන්නාහු ද, අධිගම කළාහු ද අධිගම කෙරෙත් ද අධිගම කරන්නාහු ද. පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, ලැබූහු ද ලබත් ද ලබන්නාහු ද, ප්‍රතිවෙධ කළාහු ද ප්‍රතිවෙධ කෙරෙත් ද ප්‍රතිවෙධ කරන්නාහු ද ප්‍රත්‍යක්ෂ කළාහු ද ප්‍රත්‍යක්ෂ කෙරෙත් ද ප්‍රත්‍යක්ෂ කරන්නාහු ද (ඥානස්පර්ශයෙන්) ස්පර්ශ කළාහු ද ස්පර්ශ කෙරෙත් ද ස්පර්ශ කරන්නාහු ද, වශීභාවයට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද; පරතෙරට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, විශාරදභාවයට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂී වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් අව්‍යාපාදය ... ආලොකසංඥාව ... අවික්ෂෙපය ... ධර්මනිශ්චය ... ඥානය ... ප්‍රාමොද්‍යය ... ප්‍රථමධ්‍යානය ... ද්විතීයධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය ... ආකාසානඤ්චායතනසමාපත්තිය ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ... අනිච්චානුපස්සනාව ... දුක්ඛානුපස්සනාව ... අනත්තානුපස්සනාව ... නිබ්බිදානුපස්සනාව ... විරාගානුපස්සනාව ... නිරොධානුපස්සනාව ... පටිනිස්සග්ගානුපස්සනාව ... ඛයානුපස්සනාව ... වයානුපස්සනාව ... විපරිනාමානුපස්සනාව ... අනිමිත්තානුපස්සනාව ... අප්පණිහිතානුපස්සනාව ... සුඤ්ඤතානුපස්සනාව ... අධිපඤ්ඤාධම්මවිපස්සනාව ... යථාභූතඤාණදස්සනය ... ආදීනවානුපස්සනාව ... පටිසඞ්ඛානුපස්සනාව ... විවට්ටානුපස්සනාව ... ස්‍රොතාපත්තිමාර්ගය ... සකෘදාගාමිමාර්ගය ... අනාගාමිමාර්ගය ... අර්හත්මාර්ගය ... යම් කිසි කෙනෙක් සතරසතිපට්ඨානයන් ... සතර සම්‍යක්ප්‍රධානයන් ... සතර ඍද්ධිපාදයන් ... පඤ්චෙන්ද්‍රියයන් ... පඤ්චබලයන් ... සප්තබොධ්‍යඞ්ගයන් ... ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ... යම් කිසි කෙනෙක් අෂ්ටවිමොක්ෂයන් වැඩූහු ද වඩත් ද වඩන්නාහු ද, අධිගම කළාහු ද අධිගම කෙරෙත් ද අධිගම කරන්නාහු ද,

පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පටිලද්ධා වා පටිලභන්ති වා පටිලභිස්සන්ති වා, පටිවිද්ධා වා පටිවිජ්ඣන්ති වා පටිවිජ්ඣිස්සන්ති වා, සච්ඡිකතා වා සච්ඡිකරොන්ති වා සච්ඡිකරිස්සන්ති වා, ඵස්සිතා වා ඵස්සන්ති වා ඵස්සිස්සන්ති වා, වසිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පාරමිප්පත්තා වා පපුණන්ති වා පාපුණිස්සන්ති වා, වෙසාරජ්ජප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධා-විමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි චතස්සො පටිසම්භිදා පත්තා වා පාපුණන්ති පාපුණිස්සන්ති වා -පෙ- සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි තිස්සො විජ්ජා පටිවිද්ධා වා පටිවිජ්ඣන්ති වා පටි-විජ්ඣිස්සන්ති වා, -පෙ- සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි තිස්සො සික්ඛා සික්ඛිතා වා සික්ඛන්ති වා සික්ඛිස්සන්ති වා සච්ඡිකතා වා සච්ඡිකරොන්ති වා සච්ඡිකරිස්සන්ති වා, ඵස්සිතා වා ඵස්සන්ති වා ඵස්සිස්සන්ති වා, වසිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පාරමිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, වෙසාරජ්ජප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි දුක්ඛං පරිජානන්ති -පෙ- සමුදයං පජහන්ති -පෙ- නිරොධං සච්ඡිකරොන්ති -පෙ- මග්ගං භාවෙන්ති, සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

කතිහාකාරෙහි සච්චපටිවෙධො හොති. කතිහාකාරෙහි සච්චානි පටි-විජ්ඣති: චතුහාකාරෙහි සච්චපටිවෙධො හොති, චතුහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති. දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටි-විජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති. ඉමෙහි චතුහා-කාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි චතුහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තො, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තො.

පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, ලැබූහු ද ලබත් ද ලබන්නාහු ද, ප්‍රතිවෙධ කළාහු ද ප්‍රතිවෙධ කෙරෙත් ද ප්‍රතිවෙධ කරන්නාහු ද, ප්‍රත්‍යක්ෂ කළාහු ද ප්‍රත්‍යක්ෂ කෙරෙත් ද ප්‍රත්‍යක්ෂ කරන්නාහු ද, (ඥාන පහසින්) පැහැසූහු ද පහසිත් ද පහස්නාහු ද, ඉසුරු බවට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, පරතෙරට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, විශාරද බවට පැමිණියාහු ද පැමිණෙත් ද, පැමිණෙන්නාහු ද, එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් සතර ප්‍රතිසංවිදාවනට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද ... එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් ත්‍රිවිද්‍යාවන් ප්‍රතිවෙධ කළාහු ද ප්‍රතිවෙධ කෙරෙත් ද ප්‍රතිවෙධ කරන්නාහු ද ... එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් ත්‍රිවිධශික්ෂාවන් හික්මුණාහු ද හික්මෙත් ද හික්මෙන්නාහු ද, සාක්ෂාත් කළාහු ද සාක්ෂාත් කෙරෙත් ද සාක්ෂාත් කරන්නාහු ද, (නුවණපහසින්) පැහැසූහු ද පහසිත් ද පහස්නාහු ද, ඉසුරු බවට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, අවසනට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, වෙසරද බවට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් දුඃඛසත්‍යය (ඥාතතීරණපරිඥායෙන්) දැනගනිත් ද ... සමුදයසත්‍යය ... දුරු කෙරෙත් ද... නිරොධසත්‍යය සාක්ෂාත් කෙරෙත් ද, මාර්ගසත්‍යය වඩත් ද, එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද යත්: සියු අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, සියු අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි: දුඃඛසත්‍යය පරිඥාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරේ. මේ සියු අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි, මේ සියු අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙයි, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වේ.

කතිහාකාරෙහි සච්චපටිවෙධො හොති. කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති. නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති, අභිඤ්ඤාපටිවෙධො ච සබ්බධම්මානං, පරිඤ්ඤාපටිවෙධො ච සබ්බසඞ්ඛාරානං, පහානපටිවෙධො ච සබ්බාකුසලානං, භාවනාපටිවෙධො ච චතුන්නං මග්ගානං, සච්ඡිකිරියාපටිවෙධො ච නිරොධස්ස. ඉමෙහි නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තො, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තො.

### දුතියක භාණවාරං.

අනිච්චතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති,[1] දුක්ඛතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති: (1)

අනිච්චතො මනසිකරොතො ඛයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, දුක්ඛතො මනසිකරොතො භයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො සඞ්ඛාරා උපට්ඨහන්ති. (2)

අනිච්චතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති: (1)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො වෙදබහුලං චිත්තං හොති. (2)

අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො කතමං විමොක්ඛං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො කතමං විමොක්ඛං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො කතමං විමොක්ඛං පටිලභති: (1)

අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො අනිමිත්තං විමොක්ඛං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො අප්පණිහිතං විමොක්ඛං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො සුඤ්ඤතං විමොක්ඛං පටිලභති. (2)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති. කෙනට්ඨෙන භාවනා, කො භාවෙති. (1)

1. උපට්ඨාති - මජ්ඣං ස්‍යා

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද යත්: නව අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, නව අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි, දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, හැම ධර්මයන්ගේ අභිඥප්‍රතිවෙධය ද, හැම සංස්කාරයන්ගේ පරිඥප්‍රතිවෙධය ද, හැම අකුශලයන්ගේ ප්‍රහාණ-ප්‍රතිවෙධය ද, සතර මාර්ගයන්ගේ භාවනාප්‍රතිවෙධය ද, නිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධය ද යන මේ නව අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි, මේ නව අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙයි, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙයි, ප්‍රඥෙන්ද්‍රිය-යාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වේ.

දෙවැනි බණවර යි.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, අනාත්ම හෙයින් මෙනෙහි කරනුවහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද යත්: (1)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට ක්ෂය විසින් සංස්කාරයෝ වටහති, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට භය විසින් සංස්කාරයෝ වටහති, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට ශූන්‍ය විසින් සංස්කාරයෝ වටහත්. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද යත්: (1)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට අධිමොක්ෂබහුල වූ සිත වෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට ප්‍රශ්‍රබ්ධිබහුල වූ සිත වෙයි, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට තුෂ්ටිබහුල වූ සිත වේ. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයා කවර විමොක්ෂයක් ලබා ද, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයා කවර විමොක්ෂයක් ලබා ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටි-බහුලයා කවර විමොක්ෂයක් ලබාද යත්: (1)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයා අනිමිත්ත-විමොක්ෂය ලබයි, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයා අප්‍රණිහිතවිමොක්ෂය ලබයි, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටි-බහුලයා ශූන්‍යතවිමොක්ෂය ලබා. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමි වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද යත්:

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති. එකරසා හොන්ති කෙනට්ඨෙන භාවනා, කො භාවෙති: (2)

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති: කෙනට්ඨෙන භාවනා, කො භාවෙති: (3)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සය-පච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එක-රසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡා-පටිපන්නස්ස විමොක්ඛභාවනා. (1)

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස විමොක්ඛභාවනා. (2)

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස විමොක්ඛභාවනා. (3)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති: පටිවෙධකාලෙ කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති: පටිවෙධාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤ-පච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො: (1)

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති: භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, -පෙ- එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර විමොක්‍ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්‍ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්‍ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද යත්:

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර විමොක්‍ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්‍ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්‍ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේද යත්: (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්‍ෂබහුලයාහට අනිමිත්තවිමොක්‍ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්‍ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්‍ථයෙන් භාවනා වෙයි. යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හේ භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට විමොක්‍ෂභාවනා නැති. (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට අප්‍රණිහිතවිමොක්‍ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්‍ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්‍ථයෙන් භාවනා වෙයි, යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හේ භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට විමොක්‍ෂභාවනා නැති. (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට ශූන්‍යතවිමොක්‍ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්‍ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්‍ථයෙන් භාවනා වෙයි. යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හේ භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට විමොක්‍ෂභාවනා නැති. (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්‍ෂ බහුලයාහට කවර විමොක්‍ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්‍ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, ප්‍රතිවෙධකාලයෙහි කවර විමොක්‍ෂයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් විමොක්‍ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අරුතෙකින් භාවනා වේ ද, කවර අරුතෙකින් ප්‍රතිවෙධය වේ ද යත්: (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර විමොක්‍ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්‍ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත් ද, එකරස වෙත් ද, ප්‍රතිවෙධකාලයෙහි කවර විමොක්‍ෂයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් විමොක්‍ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, ... එකරස වෙත් ද, කවර අරුතෙකින් භාවනා වේ ද, කවර අරුතෙකින් ප්‍රතිවෙධය වේ ද යත්:

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්ත පච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය කති විමොක්ඛා තදන්වයා හොන්ති -පෙ- එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො: (3)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සය-පච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ[1] අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤ-පච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති. (1)

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ.[1] අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති -පෙ- එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටි-විජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති. (2)

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහ-ජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති -පෙ- එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො. එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති. (3)

අනිච්චතො මනසිකරොතො කතමො විමොක්ඛො අධිමත්තො හොති, කතමවිමොක්ඛස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො[1] හොති: දුක්ඛතො මනසිකරොතො කතමො විමොක්ඛො අධිමත්තො හොති, කතම-විමොක්ඛස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති: අනත්තතො මනසි-කරොතො කතමො විමොක්ඛො අධිමත්තො හොති, කතමවිමොක්ඛස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති: (1)

1. පටිවෙධකාලෙපි - මජ්ඣං.

1 සද්ධාධිමුත්තො - ස්‍යා,

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, ප්‍රතිවෙධ කාලයෙහි කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද ... එකරස වෙත් ද, කවර අරුතෙකින් භාවනා වේ ද, කවර අරුතෙකින් ප්‍රතිවෙධය වේ ද යත්: (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට අනිමිත්තවිමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, ප්‍රතිවෙධ කාලයෙහි අනිමිත්තවිමොක්ෂය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ. (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට අප්‍රණිහිතවිමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති. ප්‍රතිවෙධකාලයෙහි අප්‍රණිහිතවිමොක්ෂය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති... එකරස වෙති. එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ. (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට ශූන්‍යතවිමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, ප්‍රතිවෙධ කාලයෙහි ශූන්‍යතවිමොක්ෂය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති ... එකරස වෙති. එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වේ. මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ. (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට කවර විමොක්ෂයෙක් බලවත් වේ ද, කවර විමොක්ෂයක්හු බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වේ ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට කවර විමොක්ෂයෙක් බලවත් වේ ද, කවර විමොක්ෂයක්හු බලවත් බැවින් කායසාක්ෂී වේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට කවර විමොක්ෂයෙක් බලවත් වේ ද, කවර විමොක්ෂයක්හු බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ ද යත්: (1)

අනිච්චතො මනසිකරොතො අනිමිත්තො විමොක්ඛො අධිමත්තො හොති, අනිමිත්තවිමොක්ඛස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො[1] හොති, දුක්ඛතො මනසිකරොතො අප්පණිහිතො විමොක්ඛො අධිමත්තො හොති, අප්පණිහිතවිමොක්ඛස්ස අධිමත්තත්තා කායසක්ඛි හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො විමොක්ඛො අධිමත්තො හොති, සුඤ්ඤත-විමොක්ඛස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති. (2)

''සද්දහන්තො විමුත්තො'ති[2] සද්ධාවිමුත්තො,[1] 'ඵුට්ඨත්තා සච්ඡිකතො'ති[3], කායසක්ඛි, 'දිට්ඨත්තා පත්තො'ති දිට්ඨිප්පත්තො. සද්දහන්තො විමුච්චතීති[4]. සද්ධාවිමුත්තො, 'ඣානඵස්සං පඨමං ඵුසති, පච්ඡා නිරොධං නිබ්බානං සච්ඡිකරොතී'ති කායසක්ඛි, 'දුක්ඛා සඞ්ඛාරා, සුඛො නිරොධො'ති ඤාතං[5], හොති දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤායා'ති දිට්ඨිප්පත්තො. -පෙ-*

යෙ හි කෙචි නෙක්ඛම්මං භාවිතා වා භාවෙන්ති වා භාවිස්සන්ති වා -පෙ- සබ්බෙ තෙ අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තා, අප්පණිහිත-විමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි අබ්‍යාපාදං -පෙ- ආලොකසඤ්ඤං -පෙ- අවික්ඛෙපං -පෙ- යෙ හි කෙචි දුක්ඛං පරිජානන්ති -පෙ- සමුදයං පජහන්ති -පෙ- නිරොධං සච්ඡිකරොන්ති -පෙ- මග්ගං භාවෙන්ති, සබ්බෙ තෙ අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තා, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤත-විමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තා.

කතිහාකාරෙහි සච්චපටිවෙධො[6] හොති, කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: චතුහාකාරෙහි සච්චපටිවෙධො හොති, චතුහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති.

දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති. ඉමෙහි චතුහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි චතුහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො අනිමිත්ත-විමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තො, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තො.

කතිහාකාරෙහි සච්චපටිවෙධො හොති: කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති -පෙ- අභිඤ්ඤාපටිවෙධො ච සබ්බධම්මානං, පරිඤ්ඤාපටිවෙධො ච සබ්බසඞ්ඛාරානං, පහානපටිවෙධො ච සබ්බාකුසලානං, භාවනාපටිවෙධො ච චතුන්නං මග්ගානං, සච්ඡිකිරියාපටිවෙධො ච නිරොධස්ස. ඉමෙහි නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තො, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කාසසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තො.

---

1 සද්ධාධිමුත්තො - ස්‍යා  2. අධිමුත්තොති - ස්‍යා.
3 සච්ඡිකරොතීති - ස්‍යා PTS  4. අධිමුච්චතීති - ස්‍යා
5 විඤ්ඤාතං - මජසං, ඤාණං - ස්‍යා  6. සච්චපටිවෙධො - මජසං ස්‍යා
* 'සොවායං පුග්ගලො සද්ධාවිමුත්තො'ති ආදිකා තයො වාරා සංඛිත්තා

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට අනිමිත්තවිමොක්ෂය බලවත් වෙයි, අනිමිත්තවිමොක්ෂය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට අප්‍රණිහිතවිමොක්ෂය බලවත් වෙයි, අප්‍රණිහිත-විමොක්ෂය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනාත්ම හෙයින් මෙනෙහි කරනුවහට ශූන්‍යතවිමොක්ෂය බලවත් වෙයි, ශූන්‍යවිමොක්ෂය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ. (2)

හදහමින් විමුක්ත නු' යි ශ්‍රද්ධාවිමුක්ත යැ (ධ්‍යානස්පර්ශය) පහස්නා ලද බැවින් (නිර්වාණය) ප්‍රත්‍යක්ෂ කරනලද නු'යි කායසාක්ෂි යැ (ප්‍රඥෙන්ද්‍රියයෙන්) දක්නාලද බැවින් (නිවනට) පැමිණියේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත යැ හදහමින් මිදේ නු'යි ශ්‍රද්ධාවිමුක්ත යැ ධ්‍යානස්පර්ශය පළමු වැ ස්පර්ශ කෙරෙයි, පසු වැ නිරොධසඞ්ඛ්‍යාත නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේ නු'යි කායසාක්ෂි යැ 'සංස්කාරයෝ දුඃඛයෝ යැ නිරෝධය සුඛය යැයි දන්නාලද, දක්නාලද, ප්‍රකට කරන ලද, ප්‍රත්‍යක්ෂ කරනලද, ස්පර්ශකරනලද වේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත වේ ...

යම් කිසි කෙනෙක් නෛෂ්ක්‍රම්‍යය වැඩූහු ද වඩත් ද වඩින්නාහු ද ... එ හැම දෙන අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්තයෝ යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂිහු යැ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්තයෝ යි.

යම් කිසි කෙනෙක් අව්‍යාපාදය ... ආලොකසංඥව ... අවික්ෂෙපය ... යම් කිසි කෙනෙක් දුඃඛය පරිජානනය කෙරෙත් ද ... සමුදය දුරු කෙරෙත් ද ... නිරොධය ප්‍රත්‍යක්ෂ කෙරෙත් ද ... මාර්ගය වඩත් ද, එ හැම දෙන අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්තයෝ යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂිහු යැ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්තයෝ යි.

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද: සියු අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, සියු අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ.

දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියා ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරේ. මේ සියු අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි. මේ සියු අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධා-විමුක්ත යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂි යැ ශූන්‍යත-විමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත යි.

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද යත්: නව අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, නව අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි, දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි ... හැම ධර්මයන්ගේ අභිඥප්‍රතිවෙධය ද හැම සංස්කාරයන්ගේ පරිඥප්‍රතිවෙධය ද හැම අකුශලයන්ගේ ප්‍රහාණප්‍රතිවෙධය ද සතර මාර්ගයන්ගේ භාවනාප්‍රතිවෙධය ද නිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධය ද යන මේ නව අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි. මේ නව අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂි යැ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත යි.

අනිච්චතො මනසිකරොන්තො කතමෙ ධම්මෙ යථාභූතං ජානාති[1] පස්සති, කථං සම්මාදස්සනං හොති, කථං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චතො සුදිට්ඨා හොන්ති, කත්ථ කඞ්ඛා පහීයති, (1)

දුක්ඛතො මනසිකරොන්තො කතමෙ ධම්මෙ යථාභූතං ජානාති පස්සති, කථං සම්මාදස්සනං හොති, කථං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා දුක්ඛතො සුදිට්ඨා හොන්ති, කත්ථ කඞ්ඛා පහීයති. (2)

අනත්තතො මනසිකරොන්තො කතමෙ ධම්මෙ යථාභූතං ජානාති පස්සති, කථං සම්මාදස්සනං හොති, කථං තදන්වයෙන සබ්බෙ ධම්මා අනත්තතො සුදිට්ඨා හොන්ති, කත්ථ කඞ්ඛා පහීයති. (3)

අනිච්චතො මනසිකරොන්තො නිමිත්තං යථාභූතං ජානාති පස්සති, තෙන වුච්චති සම්මාදස්සනං. එවං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චතො සුදිට්ඨා හොන්ති, එත්ථ කඞ්ඛා පහීයති. (1)

දුක්ඛතො මනසිකරොන්තො පවත්තං යථාභූතං ජානාති පස්සති, තෙන වුච්චති සම්මාදස්සනං. එවං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා දුක්ඛතො සුදිට්ඨා හොන්ති, එත්ථ කඞ්ඛා පහීයති. (2)

අනත්තතො මනසිකරොන්තො නිමිත්තඤ්ච පවත්තඤ්ච යථාභූතං ජානාති පස්සති, තෙන වුච්චති සම්මාදස්සනං එවං තදන්වයෙන සබ්බෙ ධම්මා අනත්තතො සුදිට්ඨා හොන්ති, එත්ථ කඞ්ඛා පහීයති. (3)

යඤ්ච යථාභූතං ඤාණං, යඤ්ච සම්මාදස්සනං, යා ච කඞ්ඛාවිතරණා, ඉමෙ ධම්මා නානත්ථා[2] චෙව නානාබ්‍යඤ්ජනා ච; උදාහු එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති: යඤ්ච යථාභූතං ඤාණං, යඤ්ච සම්මාදස්සනං, යා ච කඞ්ඛාවිතරණා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං.

අනිච්චතො මනසිකරොතො කිං භයතො උපට්ඨාති: දුක්ඛතො මනසිකරොතො කිං භයතො උපට්ඨාති: අනත්තතො මනසිකරොතො කිං භයතො උපට්ඨාති:

අනිච්චතො මනසිකරොතො නිමිත්තං භයතො උපට්ඨාති, දුක්ඛතො මනසිකරොතො පවත්තං භයතො උපට්ඨාති, අනත්තතො මනසිකරොතො නිමිත්තඤ්ච පවත්තඤ්ච භයතො උපට්ඨාති.

---

1. පජානාති - ස්‍යා
2. නානත්තා - සී 1

අනිත්‍ය වශයෙන් මෙනෙහිකරන්නහුගේ කවර ධර්මයක් යථාස්වභාවයෙන් දනී ද, දකී ද, කිසෙයින් සම්‍යග්දර්ශනය වේ ද, කිසෙයින් එය අනුව යෑමෙන් හැම සංස්කාරයෝ අනිත්‍ය හෙයින් මොනොවට දක්නාලද්දාහු වෙත් ද, කොහි සැකය ප්‍රහීණ වේ ද: (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නහුගේ කවර ධර්මයක් යථාස්වභාවයෙන් දනී ද, දකී ද, කිසෙයින් සම්‍යග්දර්ශනය වේ ද, කිසෙයින් එය අනුව යෑමෙන් හැම සංස්කාරයෝ දුඃඛ හෙයින් මොනොවට දක්නාලද්දාහු වෙත් ද කොහි සැකය ප්‍රහීණ වේ ද: (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නහුගේ කවර ධර්මයක් යථාස්වභාවයෙන් දනී ද, දකී ද, කිසෙයින් සම්‍යග්දර්ශනය වේ ද, කිසෙයින් එය අනුව යෑමෙන් හැම ධර්මයෝ අනාත්ම හෙයින් මොනොවට දක්නාලද්දාහු වෙත් ද කොහි සැකය ප්‍රහීණ වේ ද යත්: (3)

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නහුගේ නිමිත්ත යථාස්වභාවයෙන් දනී, දකී. එයින් කියනු ලැබෙයි 'සම්‍යග්දර්ශන' යනු. මෙසෙයින් එය අනුව යෑමෙන් හැම සංස්කාරයෝ අනිත්‍ය හෙයින් මොනවට දක්නා ලද්දාහු වෙති, මෙහි සැකය ප්‍රහීණ වේ. (1)

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නහුගේ ප්‍රවෘත්තිය යථාස්වභාවයෙන් දනී, දකී. එයින් කියනු ලැබෙයි 'සම්‍යග්දර්ශන' යි. මෙසෙයින් එය අනුව යෑමෙන් හැම සංස්කාරයෝ දුඃඛ හෙයින් මොනොවට දක්නා ලද්දාහු වෙති, මෙහි සැකය ප්‍රහීණ වේ. (2)

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නහුගේ නිමිත්තත් ප්‍රවෘත්තියත් යථාස්වභාවයෙන් දනී, දකී. එයින් කියනු ලැබෙයි 'සම්‍යග්දර්ශන' යි. මෙසෙයින් එය අනුව යෑමෙන් හැම ධර්මයෝ අනාත්ම හෙයින් මොනොවට දක්නා ලද්දාහු වෙති, මෙහි සැකය ප්‍රහීණ වේ. (3)

යම් යථාභූතඥානයෙකුත් වේ ද, යම් සම්‍යග්දර්ශනයෙකුත් වේ ද, යම් සැකදුරු කිරීමෙකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථ ද ඇත්තාහු මැ නානා ව්‍යඤ්ජන ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන නානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් යථාභූතඥානයෙකුත් වේ ද, යම් සම්‍යග්දර්ශනයෙකුත් වේ ද යම් සැක දුරු කිරීමෙකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ ව්‍යඤ්ජන මැ වෙනසි.

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් භය හෙයින් වටහා ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් භය හෙයින් වටහා ද, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් භය හෙයින් වටහා ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට නිමිත්ත භය හෙයින් වටහයි, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රවෘත්තිය භය හෙයින් වටහයි, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට නිමිත්තත් ප්‍රවෘත්තියත් භය හෙයින් වටහා.

යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා, යඤ්ච ආදීනවෙ ඤාණං, යා ච නිබ්බිදා, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච: උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා, යඤ්ච ආදීනවෙ ඤාණං, යා ච නිබ්බිදා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං·

යා ච අනත්තානුපස්සනා, යා ච සුඤ්ඤතානුපස්සනා, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච: උදාහු එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච අනත්තානුපස්සනා, යා ච සුඤ්ඤතානුපස්සනා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං.

අනිච්චතො මනසිකරොතො, කිං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති: දුක්ඛතො මනසිකරොතො කිං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති: අනත්තතො මනසිකරොතො කිං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති.

අනිච්චතො මනසිකරොතො නිමිත්තං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති, දුක්ඛතො මනසිකරොතො පවත්තං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති, අනත්තතො මනසිකරොතො නිමිත්තඤ්ච පවත්තඤ්ච පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති. (1)

යා ච මුඤ්චිතුකම්‍යතා[1] යා ච පටිසඞ්ඛානුපස්සනා යා ච සඞ්ඛාරුපෙක්ඛා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච මුඤ්චිතුකම්‍යතා යා ච පටිසඞ්ඛානුපස්සනා යා ච සඞ්ඛාරුපෙක්ඛා ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං, (2)

අනිච්චතො මනසිකරොතො කුතො චිත්තං වුට්ඨාති, කත්ථ චිත්තං පක්ඛන්දති: දුක්ඛතො මනසිකරොතො කුතො චිත්තං වුට්ඨාති, කත්ථ චිත්තං පක්ඛන්දති: අනත්තතො මනසිකරොතො කුතො චිත්තං වුට්ඨාති, කත්ථ චිත්තං පක්ඛන්දති.

අනිච්චතො මනසිකරොතො නිමිත්තා චිත්තං වුට්ඨාති, අනිමිත්තෙ චිත්තං පක්ඛන්දති, දුක්ඛතො මනසිකරොතො පවත්තා චිත්තං වුට්ඨාති, අප්පවත්තෙ චිත්තං පක්ඛන්දති, අනත්තතො මනසිකරොතො නිමිත්තා ච පවත්තා ච චිත්තං වුට්ඨාති, අනිමිත්තෙ අප්පවත්තෙ නිරොධ[2] නිබ්බානධාතුයා චිත්තං පක්ඛන්දති. (3)

යා ච බහිද්ධාවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යෙ ච ගොත්‍රභුධම්මා, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච බහිද්ධාවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යෙ ච ගොත්‍රභුධම්මා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං. (4)

---

1. මුච්චිතුකම්‍යතා - මජසං
2. නිරොධෙ - පු, මජසං

යම් භයතුපට්ඨාන ප්‍රඥාවකුත් වේ ද, යම් ආදීනව ඥානයෙකුත් වේ ද, යම් නිබ්බිදාවකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථ ද ඇත්තාහු මැ නානා ව්‍යඤ්ජනත් ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන නානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් භයතුපට්ඨාන ප්‍රඥාවකුත් වේ ද, යම් ආදීනව ඥානයෙකුත් වේ ද, යම් නිබ්බිදාවකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි.

යම් අනත්තානුපස්සනාවකුත් වේ ද, යම් සුඤ්ඤතානුපස්සනාවකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථ ද ඇත්තාහු මැ නානා ව්‍යඤ්ජන ද ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන නානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් අනත්තානුපස්සනාවකුත් යම් සුඤ්ඤතානුපස්සනාවකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට කුමක් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥානය උපදී ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥානය උපදී ද, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥානය උපදී ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට සංස්කාර නිමිත්ත ප්‍රත්‍යවෙක්ෂා කොට ඥානය උපදී, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රවෘත්තිය ප්‍රත්‍යවෙක්ෂා කොට ඥානය උපදී, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට නිමිත්තත් ප්‍රවෘත්තියත් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥානය උපදී. (1)

යම් මුඤ්චිතුකම්‍යතා ඥානයෙකුත් වේ ද, යම් පටිසඞ්ඛානුපස්සනා ඥානයෙකුත් වේ ද, යම් සඞ්ඛාරුපෙක්ඛා ඥානයෙකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථත් නානාව්‍යඤ්ජනත් ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජනනානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් මුඤ්චිතුකම්‍යතා ඥානයෙකුත් වේ ද, යම් පටිසඞ්ඛානුපස්සනා ඥානයෙකුත් වේ ද, යම් සඞ්ඛාරුපෙක්ඛා ඥානයෙකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට කොයින් සිත නැඟිසිටී ද, කොහි සිත පිවිසගනී ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට කොයින් සිත නැඟිසිටී ද, කොහි සිත පිවිසගනී ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට කොයින් සිත නැඟී සිටී ද, කොහි සිත පිවිසගනී ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට සංස්කාර නිමිත්ත කෙරෙන් සිත නැඟීසිටියි, අනිමිත්ත සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි සිත පිවිසගනියි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රවෘත්තියෙන් සිත නැඟී සිටියි, අප්‍රවෘත්තියෙහි සිත පිවිස ගනියි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට නිමිත්ත කෙරෙන් ද ප්‍රවෘත්තිය කෙරෙන් ද සිත නැඟී සිටියි, අනිමිත්තයෙහි අප්‍රවෘත්තියෙහි නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසගනී. (3)

සංස්කාරනිමිත්ත කෙරෙන් නැඟී පරාමමුඛ වැ සිටුනා යම් ප්‍රඥාවකුත් වේ ද, යම් ගොත්‍රභූ ධර්ම කෙනෙකුත් වෙත් ද, මේ ධර්මයෝ නානාර්ථත් නානාව්‍යඤ්ජනත් ඇත්තාහු ද නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන-නානාත්ව මැ ඇත්තාහු ද, යත්: යම් බහිද්ධා වුට්ඨාන විවට්ටන ප්‍රඥාවකුත් වේ ද, යම් ගොත්‍රභූ ධර්ම කෙනෙකුත් වෙත් ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි. (4)

අනිච්චතො මනසිකරොන්තො කතමෙන විමොක්ඛෙන විමුච්චති: දුක්ඛතො මනසිකරොන්තො කතමෙන විමොක්ඛෙන විමුච්චති: අනත්තතො මනසිකරොන්තො කතමෙන විමොක්ඛෙන විමුච්චති

අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛෙන විමුච්චති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛෙන විමුච්චති, අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛෙන විමුච්චති. (5)

යා ච දුහතොවුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා යඤ්ච මග්ගෙ ඤාණං, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදහු එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති යා ච දුහතොවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යඤ්ච මග්ගෙ ඤාණං ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං. (6)

කතිහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ[1] හොන්ති; කතිහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති: චතුහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති, සත්තහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති.

කතමෙහි චතුහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: ආධිපතෙය්‍යට්ඨෙන අධිට්ඨානට්ඨෙන අභිනීහාරට්ඨෙන නිය්‍යානට්ඨෙන.

කථං ආධිපතෙය්‍යට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොතො අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, දුක්ඛතො මනසිකරොතො අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, එවං ආධිපතෙය්‍යට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති, (1)

කථං අධිට්ඨානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන චිත්තං අධිට්ඨාති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන චිත්තං අධිට්ඨාති අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන චිත්තං අධිට්ඨාති, එවං අධිට්ඨානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති. (2)

කථං අභිනීහාරට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන චිත්තං අභිනීහරති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන චිත්තං අභිනීහරති, අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන චිත්තං අභිනීහරති. එවං අභිනීහාරට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති. (3)

කථං නිය්‍යානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන නිරොධං නිබ්බානං නිය්‍යාති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන නිරොධං නිබ්බානං නිය්‍යාති. අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන නිරොධං නිබ්බානං නිය්‍යාති, එවං නිය්‍යානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති, (4)

---

1 නානාක්ඛණෙ - මජසං

අනිත්‍ය හෙයින් මෙනෙහි කරනුයේ කවර විමොක්ෂයෙකින් මිදේ ද, දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ කවර විමොක්ෂයෙකින් මිදේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ කවර විමොක්ෂයෙකින් මිදේ ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්ත විමොක්ෂයෙන් මිදෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ අප්‍රණිහිත විමොක්ෂයෙන් මිදෙයි, අනාත්ම හෙයින් මෙනෙහි කරනුයේ ශූන්‍යතවිමොක්ෂයෙන් මිදේ. (5)

කෙලෙසුන් කෙරෙන් ද සංස්කාරනිමිත්ත කෙරෙන් ද යන දෙකින් නැගී පරාම්මුඛ වූ සිටුනා යම් ප්‍රඥාවකුත් වේ ද, යම් මාර්ගඥානයෙකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථත් නානාව්‍යඤ්ජනත් ඇත්තාහු ද නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජනනානාත්ව මැ ඇත්තාහු ද, යත්: යම් දුහතොවුට්ඨාන-විවට්ටන ප්‍රඥාවකුත් වේ ද, යම් මාර්ගඥානයෙකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ ව්‍යඤ්ජන මැ වෙනසි. (6)

කිහි අයුරෙකින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද, කිහි අයුරෙකින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත් ද යත්: සතර අයුරෙකින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙති, සත් අයුරෙකින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්.

කවර සතර අයුරෙකින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අධිපතිභාවාර්ථයෙන, ප්‍රතිෂ්ඨාසවභාවයෙන, අභිනීහාර (එළැවීම්) සවභාවයෙන, නියයර්‍යාණසවභාවයෙනි.

කිසෙයින් අධිපතිභාවාර්ථයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට අනිමිත්තවිමොක්ෂය අධිපති වෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට අප්‍රණිහිතවිමොක්ෂය අධිපති වෙයි, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ශූන්‍යතවිමොක්ෂය අධිපති වේ. මෙසෙයින් අධිපතිභාවාර්ථයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (1)

කිසෙයින් ප්‍රතිෂ්ඨාසවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටුවයි. දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ අප්‍රණිහිත-විමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටුවයි. අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටුවා. මෙසෙයින් ප්‍රතිෂ්ඨාසවභාව-යෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (2)

කිසෙයින් අභිනීහාර (එළැවීම්) සවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් සිත එළවයි දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් සිත එළවයි. අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් සිත එළවා. මෙසෙයින් අභිනීහාරසවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (3)

කිසෙයින් නියයර්‍යාණසවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණෙයි. දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණේ. මෙසෙයින් නියයර්‍යාණ සවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (4)

ඉමෙහි චතූහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති.

කතමෙහි සත්තහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති: සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන[1] පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන.

කථං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති.

අනිච්චතො මනසිකරොන්තො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො; යතො මුච්චති, තත්‍ථ න පණිදහතීති අප්පණිහිතො විමොක්ඛො; යත්‍ථ න පණිදහති, තෙන සුඤ්ඤොති සුඤ්ඤතො විමොක්ඛො; යෙන සුඤ්ඤො, තෙන නිමිත්තෙන අනිමිත්තොති අනිමිත්තො විමොක්ඛො, එවං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති. (1)

දුක්ඛතො මනසිකරොන්තො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො; යත්‍ථ න පණිදහති, තෙන සුඤ්ඤොති සුඤ්ඤතො විමොක්ඛො; යෙන සුඤ්ඤො තෙන නිමිත්තෙන අනිමිත්තොති අනිමිත්තො විමොක්ඛො, යෙන නිමිත්තෙන අනිමිත්තො, තත්‍ථ න පණිදහතීති අප්පණිහිතො විමොක්ඛො, එවං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති. (2)

අනත්තතො මනසිකරොන්තො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො; යෙන සුඤ්ඤො, තෙන නිමිත්තෙන අනිමිත්තොති අනිමිත්තො විමොක්ඛො; යෙන නිමිත්තෙන අනිමිත්තො, තත්‍ථ න පණිදහතීති අප්පණිහිතො විමොක්ඛො; යත්‍ථ න පණිදහති, තෙන සුඤ්ඤොති සුඤ්ඤතො විමොක්ඛො, එවං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති. (3)

ඉමෙහි සත්තහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති.

අත්‍ථි විමොක්ඛො, අත්‍ථි මුඛං, අත්‍ථි විමොක්ඛමුඛං. අත්‍ථි විමොක්ඛපච්චනීකං අත්‍ථි විමොක්ඛානුලොමං, අත්‍ථි විමොක්ඛවිවට්ටො, අත්‍ථි විමොක්ඛභාවනා, අත්‍ථි විමොක්ඛපටිප්පස්සද්ධි,

කතමො විමොක්ඛො: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො:

1. අධිගමට්ඨෙන - සතා,

මේ සතර අයුරින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්.

කවර සත් අයුරෙකින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත් ද යත්: සමවධානාර්ථයෙන, වින්දනාර්ථයෙන, ප්‍රතිලාභාර්ථයෙන, ප්‍රතිවේධාර්ථයෙන, සාක්ෂාත්ක්‍රියාර්ථයෙන, ඥනස්පර්ශනාර්ථයෙන, අභිසමයාර්ථයෙනි.

කිසෙසින් සමවධානාර්ථයෙන් වින්දනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත් ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ නිමිත්ත කෙරෙන් මිදේ නු' යි අනිමිත්තවිමොක්ෂ වෙයි, යම් නිමිත්තෙකින් මිදේ නම් එහි ප්‍රාර්ථනා නො කෙරේ නු' යි අප්‍රණිහිතවිමොක්ෂ වෙයි, යම් නිමිත්තෙක්හි ප්‍රාර්ථනා නො කෙරේ නම් ඒ නිමිතින් ශූන්‍ය නු' යි ශූන්‍යතවිමොක්ෂ වෙයි, යම් නිමිත්තෙකින් ශූන්‍ය නම් ඒ නිමිතින් නිමිත්ත රහිත නු' යි අනිමිත්තවිමොක්ෂ වේ. මෙසෙයින් සමවධානාර්ථයෙන් වින්දනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙති. (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ ප්‍රාර්ථනාව කෙරෙන් මිදේ නු' යි අප්‍රණිහිතවිමොක්ෂ වෙයි, යම් දුඃඛයෙක්හි ප්‍රාර්ථනා නො කෙරේ නම් ඒ දුඃඛයෙන් ශූන්‍ය නු' යි ශූන්‍යතවිමොක්ෂ වෙයි, යම් දුඃඛ නිමිත්තෙකින් ශූන්‍ය නම් ඒ දුඃඛ නිමිතින් නිමිත්ත රහිත නු' යි අනිමිත්තවිමොක්ෂ වෙයි, යම් දුඃඛ නිමිත්තෙකින් අනිමිත්ත වේ නම් එහි ප්‍රාර්ථනා නො කෙරේ නු' යි අප්‍රණිහිතවිමොක්ෂ වේ. මෙසෙයින් සමවධානාර්ථයෙන් වින්දනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙති. (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ අභිනිවේශය කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ වෙයි, යම් අභිනිවේශ නිමිත්තෙකින් ශූන්‍ය වේ නම් ඒ නිමිතින් නිමිත්ත රහිත නු' යි අනිමිත්තවිමොක්ෂ වෙයි, යම් අභිනිවේශ නිමිත්තෙකින් නිමිත්ත රහිත වේ නම් ඒ අභිනිවේශ නිමිත්තෙහි ප්‍රාර්ථනා නො කෙරේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ වෙයි, යම් අභිනිවේශ නිමිත්තෙක්හි ප්‍රාර්ථනා නො කෙරේ නම් ඒ අභිනිවේශ නිමිතින් ශූන්‍ය නු'යි ශූන්‍යතවිමොක්ෂ වේ. මෙසෙයින් සමවධානාර්ථයෙන් වින්දනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්: (3)

මේ සත් අයුරින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්.

විමොක්ෂයෙක් ඇත, මුඛයෙක් ඇත, විමොක්ෂමුඛයෙක් ඇත, විමොක්ෂප්‍රත්‍යනීකයෙක් ඇත, විමොක්ෂානුලොමයෙක් ඇත, විමොක්ෂ විවර්තයෙක් ඇත, විමොක්ෂභාවනායෙක් ඇත, විමොක්ෂප්‍රතිප්‍රශ්‍රබ්ධියෙක් ඇති.

විමොක්ෂ කවරැ යත්: ශූන්‍යතවිමොක්ෂ යෑ අනිමිත්තවිමොක්ෂ යෑ අප්‍රණිහිතවිමොක්ෂ යි.

කතමො සුඤ්ඤතො විමොක්ඛො: අනිච්චානුපස්සනාඤාණං නිච්චතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, දුක්ඛානුපස්සනාඤාණං සුඛතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අනත්තානුපස්සනාඤාණං අත්තතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, නිබ්බිදානුපස්සනාඤාණං නන්දියා අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, විරාගානුපස්සනාඤාණං රාගතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, නිරොධානුපස්සනාඤාණං සමුදයතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, පටිනිස්සග්ගානුපස්සනාඤාණං ආදානතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, සුඤ්ඤතානුපස්සනාඤාණං සබ්බාභිනිවෙසෙහි මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො.

රූපෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනාඤාණං සබ්බාභිනිවෙසෙහි මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනාඤාණං සබ්බාභිනිවෙසෙහි මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අයං සුඤ්ඤතො විමොක්ඛො (1)

කතමො අනිමිත්තො විමොක්ඛො: අනිච්චානුපස්සනාඤාණං නිච්චතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, දුක්ඛානුපස්සනාඤාණං සුඛතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අනත්තානුපස්සනාඤාණං අත්තතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, නිබ්බිදානුපස්සනාඤාණං නන්දියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, විරාගානුපස්සනාඤාණං රාගතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො නිරොධානුපස්සනාඤාණං සමුදයතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනාඤාණං ආදානතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අනිමිත්තානුපස්සනාඤාණං සබ්බනිමිත්තෙහි මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො.

රූපෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො -පෙ- රූපෙ අනිමිත්තානුපස්සනාඤාණං සබ්බනිමිත්තෙහි මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, රූපෙ අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, රූපෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො -පෙ- ජරාමරණෙ අනිමිත්තානුපස්සනාඤාණං සබ්බනිමිත්තෙහි මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, ජරාමරණෙ අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අයං අනිමිත්තො විමොක්ඛො. (2)

ශූන්‍යතවිමෝක්ෂ කවරැ යත්: අනිච්චානුපස්සනාඤාණය නිත්‍යාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. දුක්ඛානුපස්සනාඤාණය සුඛාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. අනත්තානුපස්සනාඤාණය ආත්මාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. නිබ්බිදානුපස්සනාඤාණය නන්ද්‍යභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. විරාගානුපස්සනාඤාණය රාගාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. නිරෝධානුපස්සනාඤාණය සමුදයාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. පටිනිස්සග්ගානුපස්සනාඤාණය ආදානාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්තාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. අප්පණිහිතානුපස්සනාඤාණය ප්‍රණිධානාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ. සුඤ්ඤතානුපස්සනාඤාණය සියලු අභිනිවෙශයන් කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යි.

රූපයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය සියලු අභිනිවෙශයන් කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යි. වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යැ ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය සියලු අභිනිවෙශයන් කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමෝක්ෂ යි. මේ ශූන්‍යතවිමෝක්ෂ නම් වේ. (1)

අනිමිත්තවිමෝක්ෂ කවරැ යත්: අනිච්චානුපස්සනාඤාණය නිත්‍යනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. දුක්ඛානුපස්සනාඤාණය සුඛනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. අනත්තානුපස්සනාඤාණය ආත්මනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. නිබ්බිදානුපස්සනාඤාණය නන්දිනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. විරාගානුපස්සනාඤාණය රාගනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. නිරෝධානුපස්සනාඤාණය සමුදයනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. පටිනිස්සග්ගානුපස්සනාඤාණය ආදානනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. අනිමිත්තානුපස්සනාඤාණය හැම නිමිති කෙරෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. අප්පණිහිතානුපස්සනාඤාණය ප්‍රණිධිනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යි.

රූපයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍ය නිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ ... රූපයෙහි අනිමිත්තානුපස්සනාඤාණය හැම නිමිති කෙරෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. රූපයෙහි අප්පණිහිතානුපස්සනාඤාණය ප්‍රණිධිනිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශනිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යනිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ ... ජරාමරණයෙහි අනිමිත්තානුපස්සනාඤාණය හැම නිමිති කෙරෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. ජරාමරණයෙහි අප්පණිහිතානුපස්සනාඤාණය ප්‍රණිධි නිමිත්තෙන්, මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යැ. ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශ නිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමෝක්ෂ යි. මේ අනිමිත්තවිමෝක්ෂ නම් වේ. (2)

කතමො අප්පණිහිතො විමොක්ඛො: අනිච්චානුපස්සනාඤාණං නිච්චතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, දුක්ඛානුපස්සනාඤාණං සුඛතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අනත්තානුපස්සනාඤාණං අත්තතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, විරාගානුපස්සනාඤාණං රාගතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, නිරොධානුපස්සනාඤාණං සමුදයතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, පටිනිස්සග්ගානුපස්සනාඤාණං ආදානතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අප්පණිහිතානුපස්සනාඤාණං සබ්බපණිධීහි මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො.

රූපෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො -පෙ- රූපෙ අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, රූපෙ අප්පණිහිතානුපස්සනාඤාණං සබ්බපණිධීහි මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, රූපෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, වෙදනාය -පෙ සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො -පෙ- ජරාමරණෙ අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, ජරාමරණෙ අප්පණිහිතානුපස්සනාඤාණං සබ්බපණිධීහි මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අයං අප්පණිහිතො විමොක්ඛො, (3) අයං විමොක්ඛො, (1)

කතමං මුඛං, යෙ තත්ථ ජාතා අනවජ්ජා කුසලා බොධිපක්ඛියා ධම්මා. ඉදං මුඛං. (2)

කතමං විමොක්ඛමුඛං: යං තෙසං[1] ධම්මානං ආරම්මණං නිරොධො නිබ්බානං, ඉදං විමොක්ඛමුඛං, විමොක්ඛඤ්ච මුඛඤ්ච විමොක්ඛමුඛං[2] ඉදං විමොක්ඛමුඛං. (3)

කතමං විමොක්ඛපච්චනීකං: තීණි අකුසලමූලානි විමොක්ඛපච්චනීකානි, තීණි දුච්චරිතානි විමොක්ඛපච්චනීකානි, සබ්බෙපි අකුසලා ධම්මා විමොක්ඛපච්චනීකා, ඉදං විමොක්ඛපච්චනීකං. (4)

කතමං විමොක්ඛානුලොමං: තීණි කුසලමූලානි විමොක්ඛානුලොමානි, තීණි සුචරිතානි විමොක්ඛානුලොමානි, සබ්බෙපි කුසලා ධම්මා විමොක්ඛානුලොමා. ඉදං විමොක්ඛානුලොමං. (5)

කතමො විමොක්ඛවිවට්ටො: සඤ්ඤාවිවට්ටො, චෙතොවිවට්ටො, චිත්තවිවට්ටො, ඤාණවිවට්ටො, විමොක්ඛවිවට්ටො, සච්චවිවට්ටො:

---

1 තෙසං තෙසං - සයා

2. විමොක්ඛඤ්ච මුඛඤ්ච විමොක්ඛමුඛ'න්ති සයා, PTS, පොත්ථකෙසු නත්ථි

අප්‍රණිහිතවිමොක්ෂ කවරේ යත්: අනිච්චානුපස්සනාඤාණය නිත්‍යප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. දුක්ඛානුපස්සනාඤාණය සුඛ ප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යැ. අනත්තානුපස්සනාඤාණය ආත්මප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. විරාගානුපස්සනාඤාණය රාගප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. නිරොධානුපස්සනාඤාණය සමුදයප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. පටිනිස්සග්ගානුපස්සනාඤාණය ආදානප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්තප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ හැම ප්‍රණිධි කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශ ප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යි.

රූපයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ ... රූපයෙහි අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්ත කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යැ, රූපයෙහි අප්පණිහිතානුපස්සනාඤාණය හැම ප්‍රණිධීන් කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ. වේදනායෙහි ... සංඥායෙහි .. සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ ... ජරාමරණයෙහි අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්ත කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යැ ජරාමරණයෙහි අප්පණිහිතානුපස්සනාඤාණය හැම ප්‍රණිධීන් කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යැ. ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යි. මේ අප්‍රණිහිත විමොක්ෂ නම් වේ. (3) මේ විමොක්ෂ යි. (1)

මුඛ කවරේ යත්: ඒ මාර්ගවිමොක්ෂයෙහි උපන් යම් (රාගාදි වරද නැති බැවින්) නිවරද වූ කුසල් වූ බොධිපාක්ෂිකධර්ම කෙනෙක් වෙත් ද, මේ මුඛ නම් වේ. (2)

විමොක්ෂමුඛ කවරේ යත්: ඒ බොධිපාක්ෂික ධර්මයන්ට අරමුණු වූ යම් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, මේ විමොක්ෂමුඛ නම් වෙයි. විමොක්ෂ ද හෙ මැ මුඛ ද හෙ මැ නු'යි විමොක්ෂමුඛ යැ. මේ විමොක්ෂ මුඛ යි. (3)

විමොක්ෂප්‍රත්‍යනීක (ප්‍රතිපක්ෂ) කවරේ යත්: තුන් අකුශලමූලයෝ විමොක්ෂප්‍රත්‍යනීකයෝ යැ ත්‍රිවිධ දුශ්චරිතයෝ විමොක්ෂප්‍රත්‍යනීකයෝ යැ හැම අකුශලධර්මයෝ මැ විමොක්ෂප්‍රත්‍යනීකයෝ යි. මේ විමොක්ෂප්‍රත්‍යනීක නම් වේ. (4)

විමොක්ෂානුලොම කවරේ යත්: තුන් කුශල මූලයෝ විමොක්ෂානුලොමයෝ යැ, ත්‍රිවිධ සුචරිතයෝ විමොක්ෂානුලොමයෝ යැ, හැම කුශල ධර්මයෝ මැ විමොක්ෂානුලොමයෝ යි. මේ විමොක්ෂානුලොම යි. (5)

විමොක්ෂවිවර්ත කවරේ යත්: සංඥාවිවර්ත යැ චෙතොවිවර්ත යැ චිත්ත විවර්ත යැ ඥානවිවර්ත යැ විමොක්ෂවිවර්ත යැ සත්‍යවිවර්ත යි.

සඤ්ජානන්තො විවට්ටතීති සඤ්ඤාවිවට්ටො, චෙතයන්තො විවට්ටතීති චෙතොවිවට්ටො, විජානන්තො විවට්ටතීති චිත්තවිවට්ටො, ඤාණං කරොන්තො විවට්ටතීති ඤාණවිවට්ටො, වොසජ්ජන්තො[1] විවට්ටතීති විමොක්ඛවිවට්ටො, තථට්ඨෙ[2] විවට්ටතීති සච්චවිවට්ටො.

යත්ථ සඤ්ඤාවිවට්ටො, තත්ථ චෙතොවිවට්ටො; යත්ථ චෙතොවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො; යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො, තත්ථ චිත්තවිවට්ටො; යත්ථ චිත්තවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො, තත්ථ ඤාණවිවට්ටො; යත්ථ ඤාණවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො; යත්ථ සඤ්ඤාවිවට්ටො; චෙතොවිවට්ටො චිත්තවිවට්ටො, ඤාණවිවට්ටො, තත්ථ විමොක්ඛවිවට්ටො, යත්ථ විමොක්ඛවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො; චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො. යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො, තත්ථ සච්චවිවට්ටො, යත්ථ සච්චවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො, අයං විමොක්ඛවිවට්ටො (6)

කතමා විමොක්ඛභාවනා: පඨමස්ස ඣානස්ස[3] ආසෙවනා භාවනා බහුලීකම්මං, දුතියස්ස ඣානස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, තතියස්ස ඣානස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, චතුත්ථස්ස ඣානස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, ආකාසානඤ්චායතනසමාපත්තියා ආසෙවනා භාවනා බහුලීකම්මං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආසෙවනා භාවනා බහුලීකම්මං, සොතාපත්තිමග්ගස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, සකදාගාමිමග්ගස්ස-පෙ- අනාගාමිමග්ගස්ස-පෙ-අරහත්තමග්ගස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, අයං විමොක්ඛභාවනා. (7)

කතමා විමොක්ඛපටිප්පස්සද්ධි: පඨමස්ස ඣානස්ස පටිලාභො වා විපාකො වා, දුතියස්ස ඣානස්ස පටිලාභො වා විපාකො වා, තතියස්ස ඣානස්ස -පෙ- චතුත්ථස්ස ඣානස්ස -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තියා -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා, සොතාපත්තිමග්ගස්ස සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගස්ස සකදාගාමිඵලං, අනාගාමිමග්ගස්ස අනාගාමිඵලං, අරහත්තමග්ගස්ස අරහත්තඵලං. අයං විමොක්ඛපටිප්පස්සද්ධි.[4] (8)

### තතියක භාණවාරං[5]

### විමොක්ඛකථා සමත්තා

1. වොසජ්ජන්තා - මජසං,
2. තථට්ඨෙන - මජසං, සයා
3. පඨමජ්ඣානස්ස - සයා, සී 2.
4. විමොක්ඛපටිප්පස්සද්ධි මජසං · විමොක්ඛපටිපස්සද්ධි - සී 2,
5. තතියකභාණවාරො - මජසං, තතියභාණවාරං - සයා, PTS,

හැඳිනගනිමින් පරාවතී වේ නු'යි සංඥාවිවතී යෑ සිතමින් පරාවතී වේ නු'යි චෙතොවිවතී යෑ දැනගනිමින් පරාවතී වේ නු'යි චිත්තවිවතී යෑ ප්‍රකට කෙරෙමින් පරාවතී වේ නු'යි ඥානවිවතී යෑ (කාමච්ඡන්දාදීන්) හැරපියමින් පරාවතී වේ නු'යි විමොක්ෂවිවතී යෑ තථාර්ථයෙහි පරාවතී වේ නු'යි සත්‍යවිවතී යි.

යම් තැනෙක සංඥාවිවතීය වේ ද, එහි චෙතොවිවතීය වෙයි; යම් තැනෙක චෙතොවිවතීය වේ ද, එහි සංඥාවිවතීය වෙයි; යම් තැනෙක සංඥාවිවතීය චෙතොවිවතීය වේ ද එහි චිත්තවිවතීය වෙයි; යම් තැනෙක චිත්තවිවතීය වේ ද, එහි සංඥාවිවතීය චෙතොවිවතීය වෙයි; යම් තැනෙක සංඥාවිවතීය චෙතොවිවතීය චිත්තවිවතීය වේ ද, එහි ඥානවිවතීය වෙයි; යම් තැනෙක ඥානවිවතීය වේ ද, එහි සංඥාවිවතීය චෙතොවිවතීය චිත්තවිවතීය වෙයි; යම් තැනෙක සංඥාවිවතීය චෙතොවිවතීය චිත්තවිවතීය ඥානවිවතීය වේ ද, එහි විමොක්ෂවිවතීය වෙයි; යම් තැනෙක විමොක්ෂවිවතීය වේ ද, එහි සංඥාවිවතීය චෙතොවිවතීය චිත්තවිවතීය ඥානවිවතීය වෙයි; යම් තැනෙක සංඥාවිවතීය චෙතොවිවතීය චිත්තවිවතීය ඥානවිවතීය විමොක්ෂවිවතීය වේ ද, එහි සත්‍යවිවතීය වෙයි; යම් තැනෙක සත්‍යවිවතීය වේ ද, එහි සංඥාවිවතීය චෙතොවිවතීය චිත්තවිවතීය ඥානවිවතීය විමොක්ෂවිවතීය වේ. මේ විමොක්ෂවිවතී යි. (6)

විමොක්ෂභාවනා කවරේ යත්: ප්‍රථමධ්‍යානයාගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ ද්විතීයධ්‍යානයාගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ තෘතීයධ්‍යානයාගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ චතුර්ථධ්‍යානයාගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ ආකාසානඤ්චායතනසමාපත්තියගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ විඤ්ඤාණඤ්චායතනසමාපත්තියගේ ... ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තියගේ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ ස්‍රොතාපත්තිමාර්ගයාගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යෑ සකෘදාගාමිමාර්ගයාගේ ... අනාගාමිමාර්ගයාගේ .. අර්හත්මාර්ගයාගේ ආසෙවන යෑ භාවනා යෑ බහුල කිරීම යි. මේ විමොක්ෂභාවනා යි .(7)

විමොක්ෂප්‍රතිප්‍රශ්‍රබ්ධි කවරැ යත්: ප්‍රථමධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යෑ ද්විතීයධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යෑ තෘතීයධ්‍යානයාගේ ... චතුර්ථධ්‍යානයාගේ . ආකාසානඤ්චායතනසමා-පත්තිහුගේ .. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිහුගේ ... ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තිහුගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිහුගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යෑ ස්‍රොතාපත්තිමාර්ගයට ස්‍රොතාපත්තිඵල යෑ සකෘදාගාමිමාර්ගයට සකෘදාගාමිඵල යෑ අනාගාමිමාර්ගයට අනාගාමිඵල යෑ අර්හත්මාර්ගයට අර්හත්ඵල යෑ යන මේ විමොක්ෂප්‍රතිප්‍රශ්‍රබ්ධි යි (8)

**තුන්වැනි බණවර යි.**

**විමොක්ෂකථා නිමි.**

# 6

# ගතිකථා

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ කතිනන්නං[1] හෙතූනං පච්චයා උපපත්ති[2] හොති. ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙ කතිනන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. රූපාවචරානං දෙවානං කතිනන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. අරූපාවචරානං දෙවානං කතිනන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙ අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. රූපාවචරානං දෙවානං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. අරූපාවචරානං දෙවානං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: නාමරූපපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමරූපං.

පටිසන්ධික්ඛණෙ පඤ්චක්ඛන්ධා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරො මහාභූතා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ තයො ජීවිතසඞ්ඛාරා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච රූපඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

---

1 කතිනං - මජසං, සයා PTS, කතීනං - ස

2. උප්පත්ති - සී 1, 2

# 6

## ගතිකථා

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද, ක්‍ෂත්‍රියමහාසාරයනට බ්‍රාහමණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද, රූපාවචර දෙවියනට කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද, අරූපාවචර දෙවියනට කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්:

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වෙයි. ක්‍ෂත්‍රියමහාසාරයනට බ්‍රාහමණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වෙයි. රූපාවචර දෙවියනට අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වෙයි. අරූපාවචර දෙවියනට අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ.

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි කවර අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: (ත්‍රිහෙතුකකාමාවචර) කුශලකර්මයාගේ ජවනක්‍ෂණයෙහි තුන් කුශලහෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යය වෙති, එයින් කියනු ලැබෙයි: "කුශලමූලප්‍රත්‍යයෙනුදු සංස්කාරයෝ වෙති" යි. (උපදනාවුනට) නිකාන්තික්‍ෂණයෙහි දෙ අකුශලහෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යය වෙති, එයින් කියනු ලැබෙයි: "අකුශලමූලප්‍රත්‍යයෙනුදු සංස්කාරයෝ වෙති" යි. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි තුන් අව්‍යාකෘතහෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යය වෙති, එයින් කියනු ලැබෙයි: "නාමරූපප්‍රත්‍යයෙනුදු විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙනුදු නාමරූපය වේ" යයි.

ප්‍රතිසන්ධික්‍ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි සතර මහාභූතයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි තුන් ජීවිතසංස්කාරයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි නාමයත් රූපයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ පඤ්චින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ ඉමෙ අට්ඨවීසති ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (1)

ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙ කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: 'නාමරූපපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමරූපං'.

පටිසන්ධික්ඛණෙ පඤ්චක්ඛන්ධා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරො මහාභූතා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො ජීවිතසඞ්ඛාරා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච රූපඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ පඤ්චින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාත පච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චේන්ද්‍රියයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්, ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් හෙතුහු සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති. සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අටවිසි ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ. (1)

ක්ෂැත්මහසලනට බමුණුමහසලනට ගැහැවිමහසලනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කවර අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි, තුන් කුශලහෙතුහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති එයින් කියනු ලැබෙයි: 'කුසලමූලපච්චයාපි සඞ්ඛාරා' යි නිකාන්තික්ෂණයෙහි දෙ අකුශලහෙතුහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි 'අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා' යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් අව්‍යාකෘතහෙතුහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙත්. එයින් කියනු ලැබෙයි. 'නාමරූපපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණපච්චයාපි නාමරූපං' යි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි සතර මහාභූතයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් ජීවිතසංස්කාරයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් රූපයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත් ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති. නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චේන්ද්‍රියයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් හෙතුහු සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති. සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත් ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

පටිසන්ධික්ඛණෙ ඉමෙ අට්ඨවීසති ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙන ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති (2)

රූපාවචරානං දෙවානං කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා -පෙ- රූපාවචරානං දෙවානං ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (3)

අරූපාවචරානං දෙවානං කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාත චෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: නාමපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණපච්චයාපි නාමං.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ පඤ්චින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සපච්චයා හොන්ති, සම්පයුත්තපච්චය හොන්ති, අරූපාවචරානං දෙවානං ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (4)

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙන කතින්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙන කතින්නං හෙතූනං පච්චයා උපපත්ති හොති:[1]

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙන ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති, ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙන ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

1. රූපවචරානං ... අරූපාවචරානං දෙවානං ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති- PTS, (අධිකං)

ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අටවිසි ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ක්ෂත්‍රියමහසලනට බමුණුමහසලනට ගෘහපතිමහසලනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ. (2)

රූපාවචර දෙවියනට කවර අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල් වූ තුන් හෙතුහු ... රූපාවචර දෙවියනට මේ අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ. (3)

අරූපාවචර දෙවියනට කවර අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල් වූ තුන් හෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'කුසලමූලපච්චයාපි සඞ්ඛාරා'යි. නිකාන්තික්ෂණයෙහි අකුසල් වූ දෙ හෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'අකුසල මූලපච්චයාපි සඞ්ඛාරා'යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි අව්‍යාකෘත වූ තුන් හෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාත ප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'නාමපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමං'යි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර සකන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍ය ප්‍රත්‍යයෝ වෙති. නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් හෙතුහු සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති. අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. අරූපාවචර දෙවියනට මේ අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වේ. (4)

ගතිසම්පත්තියෙන් ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කෙතෙක් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ ද, ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහමණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කෙතෙක් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ ද යත්:

ගතිසම්පත්තියෙන් ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වෙයි, ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහමණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ.

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙ කතමෙසං ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ ද්වෙ හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා. පටිසන්ධික්ඛණෙ ද්වෙ හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: නාමරූපපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණපච්චයාපි නාමරූපං.

පටිසන්ධික්ඛණෙ පඤ්චක්ඛන්ධා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරො මහාභූතා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ තයො ජීවිතසඞ්ඛාරා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච රූපඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා[1] අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ද්වෙ හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ ද්වාදස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයාහොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ ඉමෙ ඡබ්බීසති ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙ ඉමෙසං ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (1)

ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙ කතමෙසං ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ ද්වෙ හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති. තෙන වුච්චති: කුසමූලපච්චයාපි සඞ්ඛාරා -පෙ- ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානා ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙ ඉමෙසං ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

ගතිකථා සමත්තා.

1 ධම්මා - PTS,

ගතිසම්පත්තියෙන් ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කවර ෂඩ්-හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වෙයි යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණ-යෙහි කුසල් වූ දෙ හෙතූහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති. එයින් කියනු ලැබෙයි: ‘කුසලමූලපච්චයාපි සඞ්ඛාරා’යි නිකාන්තික්ෂ-ණයෙහි අකුසල් වූ දෙ හෙතූහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාත-ප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: ‘අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා’යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි අව්‍යාකෘත වූ හෙතූහු දෙදෙනෙක් එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: ‘නාමරූප-පච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමරූපං’ යි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි සතර මහාභූතයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් ජීවිතසංස්කාරයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් රූපයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රය-ප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි ඉන්ද්‍රියයෝ සතර දෙනෙක් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්ත-ප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතූහු දෙදෙනෙක් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍ය-යෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්ත-ප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ දොළොස් ධර්මයෝ සහජාත ප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ සව්සි ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ගතිසම්පත්තියෙන් ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ. (1)

ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කවර ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුශල වූ හෙතූහු දෙදෙනෙක් එකෙණෙහි උපන් චෙතනාවට සහජාත-ප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: ‘කුසලමූලපච්චයාපි සඞ්ඛාරා’යි. ... ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ.

**ගතිකථා නිමි.**

# 7

# කම්මකථා

අහොසිකම්මං අහොසිකම්මවිපාකො, අහොසිකම්මං නාහොසිකම්මවිපාකො, අහොසිකම්මං අත්ථිකම්මවිපාකො, අහොසිකම්මං නත්ථිකම්මවිපාකො, අහොසිකම්මං භවිස්සතිකම්මවිපාකො, අහොසිකම්මං නභවිස්සතිකම්මවිපාකො. අත්ථිකම්මං අත්ථිකම්මවිපාකො, අත්ථිකම්මං නත්ථිකම්මවිපාකො, අත්ථිකම්මං භවිස්සතිකම්මවිපාකො, අත්ථිකම්මං නභවිස්සතිකම්මවිපාකො. භවිස්සතිකම්මං භවිස්සතිකම්මවිපාකො, භවිස්සතිකම්මං නභවිස්සතිකම්මවිපාකො.

අහොසි කුසලං කම්මං අහොසි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං නාහොසි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං අත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං නත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං න භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො. අත්ථි කුසලං කම්මං අත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි කුසලං කම්මං නත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි කුසලං කම්මං භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි කුසලං කම්මං න භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො. භවිස්සති කුසලං කම්මං භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො, භවිස්සති කුසලං කම්මං න භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො.

අහොසි අකුසලං කම්මං අහොසි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං නාහොසි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං අත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං නත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං න භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො. අත්ථි අකුසලං කම්මං අත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි අකුසලං කම්මං නත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි අකුසලං කම්මං භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි අකුසලං කම්මං න භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො. භවිස්සති අකුසලං කම්මං භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො, භවිස්සති අකුසලං කම්මං න භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො.

අහොසි සාවජ්ජං කම්මං -පෙ- අහොසි අනවජ්ජං කම්මං -පෙ- අහොසි කණ්හං කම්මං -පෙ- අහොසි සුක්කං කම්මං -පෙ- අහොසි සුඛුද්‍රියං කම්මං -පෙ- අහොසි දුක්ඛුද්‍රියං[1]. කම්මං -පෙ- අහොසි දුක්ඛවිපාකං කම්මං අහොසි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං නාහොසි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං අත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං නත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං න භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො අත්ථි දුක්ඛවිපාකං කම්මං අත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අත්ථි දුක්ඛවිපාකං කම්මං නත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අත්ථි දුක්ඛවිපාකං කම්මං භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අත්ථි දුක්ඛවිපාකං කම්මං න භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො. භවිස්සති දුක්ඛවිපාකං කම්මං භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, භවිස්සති දුක්ඛවිපාකං කම්මං න භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො.

**කම්මකථා සමත්තා[2].**

---

1 දුඛුද්‍රියං - මජසං.    2. නිට්ඨිතා - මජසං

# 7

## කර්මකථා

අභූත්කර්ම යැ අභූත්කර්මවිපාක යැ, අභූත්කර්ම යැ නාභූත්කර්මවිපාක යැ, අභූත්කර්ම යැ අස්තිකර්මවිපාක යැ, අභූත්කර්ම යැ නාස්තිකර්මවිපාක යැ, අභූත්කර්ම යැ භවිෂ්‍යත්කර්මවිපාක යැ, අභූත්කර්ම යැ නභවිෂ්‍යත්කර්මවිපාක යැ, අස්තිකර්ම යැ අස්තිකර්මවිපාක යැ අස්තිකර්ම යැ, නාස්තිකර්මවිපාක යැ, අස්තිකර්ම යැ භවිෂ්‍යත්කර්මවිපාක යැ, අස්තිකර්ම යැ න භවිෂ්‍යත්කර්මවිපාක යැ, භවිෂ්‍යත්කර්ම යැ භවිෂ්‍යත්කර්මවිපාක යැ, භවිෂ්‍යත්කර්ම යැ න භවිෂ්‍යත්කර්මවිපාක යි.

අභූත්කුශලකර්ම යැ අභූත්කුශලකර්මවිපාක යැ, අභූත්කුශලකර්ම යැ නාභූත්කුශලකර්මවිපාක යැ, අභූත්කුශලකර්ම යැ අස්තිකුශලකර්ම විපාක යැ අභූත්කුශලකර්ම යැ නාස්තිකුශලකර්මවිපාක යැ, අභූත්කුශලකර්ම යැ භවිෂ්‍යත්කුශලකර්මවිපාක යැ, අභූත්කුශලකර්ම යැ නභවිෂ්‍යත්කුශලකර්මවිපාක යැ, අස්තිකුශලකර්ම යැ අස්තිකුශලකර්මවිපාක යැ, අස්තිකුශලකර්ම යැ නාස්තිකුශලකර්මවිපාක යැ, අස්තිකුශලකර්ම යැ නභවිෂ්‍යත්කුශලකර්මවිපාක යැ, අස්තිකුශලකර්මයැ නභවිෂ්‍යත්කුශලකර්මවිපාක යැ, භවිෂ්‍යත්කුශලකර්ම යැ භවිෂ්‍යත්කුශලකර්මවිපාක යැ, භවිෂ්‍යත්කුශලකර්ම යැ නවිෂ්‍යත් කුශලකර්මවිපාක යි.

අභූත් අකුශලකර්ම යැ අභූත්අකුශලකර්මවිපාක යැ, අභූත් අකුශලකර්ම යැ නාභූත්අකුශලකර්මවිපාක යැ, අභූත්අකුශලකර්ම යැ අස්තිඅකුශලකර්මවිපාක යැ, අභූත්අකුශලකර්ම යැ නාස්තිඅකුශලකර්මවිපාක යැ, අභූත් අකුශලකර්ම යැ භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යැ, අභූත්අකුශලකර්ම යැ න භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යැ, අස්තිඅකුශලකර්ම යැ, අස්තිඅකුශලකර්මවිපාක යැ, අස්තිඅකුශලකර්ම යැ නාස්තිඅකුශලකර්මවිපාක යැ, අස්තිඅකුශලකර්ම යැ භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යැ, අස්ති අකුශලකර්ම යැ නභවිෂ්‍යත්අකුශලකර්මවිපාක යැ භවිෂ්‍යත්අකුශලකර්ම යැ භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යැ, භවිෂ්‍යත්අකුශලකර්ම යැ නභවිෂ්‍යත්අකුශලකර්මවිපාක යි.

අභූත්සාවද්‍යකර්ම යැ ... අභූත්අනවද්‍යකර්ම යැ ... අභූත්කෘෂ්ණකර්ම යැ ... අභූත්ශුක්ලකර්ම යැ ... අභූත්සුඛොදයකර්ම යැ ... අභූත්දුඃඛොදයකර්ම යැ ... අභූත්සුඛවිපාකකර්ම යැ ... අභූත්දුඃඛවිපාකකර්ම යැ අභූත්දුඃඛවිපාකකර්මවිපාක යැ අභූත්දුඃඛවිපාකකර්ම යැ නාභූත්දුඃඛවිපාකකර්මවිපාක යැ, අභූත්දුඃඛවිපාකකර්ම යැ අස්තිදුඃඛවිපාකකර්මවිපාක යැ, අභූත්දුඃඛවිපාකකර්ම යැ නාස්තිදුඃඛවිපාකකර්මවිපාක යැ, අභූත්දුඃඛවිපාකකර්ම යැ භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යැ, අභූත්දුඃඛවිපාකකර්ම යැ නභවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යැ, අස්තිදුඃඛවිපාකකර්ම යැ අස්තිදුඃඛවිපාකකර්මවිපාක යැ අස්තිදුඃඛවිපාකකර්ම යැ නාස්තිදුඃඛවිපාකකර්මවිපාක යැ, අස්තිදුඃඛවිපාකකර්ම යැ භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යැ, අස්තිදුඃඛවිපාකකර්ම යැ න භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යැ, භවිෂ්‍යත්දුඃඛවිපාකකර්ම යැ භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යැ, භවිෂ්‍යත් දුඃඛවිපාකකර්ම යැ නභවිෂ්‍යත් දුඃඛවිපාකකර්මවිපාක යි.

කර්මකථා නිමි.

# 8

# විපල්ලාසකථා

සාවත්ථිනිදානං "චත්තාරො මෙ භික්ඛවෙ සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා, කතමෙ චත්තාරො: අනිච්චෙ භික්ඛවෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, දුක්ඛෙ භික්ඛවෙ සුඛන්ති සඤ්ඤාවිපල්ලායො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, අනත්තනි භික්ඛවෙ අත්තාති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, අසුභෙ භික්ඛවෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා.

චත්තාරො මෙ භික්ඛවෙ නසඤ්ඤාවිපල්ලාසා නචිත්තවිපල්ලාසා නදිට්ඨිවිපල්ලාසා, කතමෙ චත්තාරො: අනිච්චෙ භික්ඛවෙ අනිච්චන්ති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, දුක්ඛෙ භික්ඛවෙ දුක්ඛන්ති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, අනත්තනි භික්ඛවෙ අනත්තාති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, අසුභෙ භික්ඛවේ අසුභන්ති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො නසඤ්ඤාවිපල්ලාසා නචිත්තවිපල්ලාසා නදිට්ඨිවිපල්ලාසා. a

1. අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො
අනත්තනි ච අත්තාති[1] අසුභෙ සුභසඤ්ඤිනො
මිච්ඡාදිට්ඨිහතා[2] සත්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනො,

2. තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා[3]
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො,

3. යදා ච බුද්ධා ලොකස්මිං උප්පජ්ජන්ති පභඞ්කරා
තෙ ඉමං ධම්මං පකාසෙන්ති දුක්ඛූපසමගාමිනං,

4. තෙසං සුත්වාන සප්පඤ්ඤා සචිත්තං පච්චලද්ධු[4] තෙ
අනිච්චං අනිච්චතද්දක්ඛුං[5] දුක්ඛමද්දක්ඛු දුක්ඛතො,

5. අනත්තනි අනත්තාති[6] අසුභං අසුභතද්දසුං
සම්මාදිට්ඨිසමාදානා සබ්බං දුක්ඛං[7] උපච්චගුන්ති, a.

---

1. අත්තසඤ්ඤිනො - සයා.
2. මිච්ඡාදිට්ඨිගතා - අනි, PTS.
3. අයොගක්ඛෙමගාමිනො - PTS. අයොගක්ඛෙමස්ස ගාමිනො - සී 1
4. පච්චලත්ථු - අනි, පච්චලද්ධා - මජසං, සී 2
5. අනිච්චතො දක්ඛුං - අනි, මජසං සයා, PTS.
6. අනත්තං ච අනත්තතො - සයා.
7. සබ්බදුක්ඛං - සයා, PTS.

a. (4. 1. 5. 9) අඞ්ගුත්තර - චතුක්කනිපාත - රොහිතස්සවග්ග.

# 8

## විපල්ලාස කථා

සැවැත් නිදාන යි ... මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ යැ චිත්තවිපල්ලාසයෝ යැ දෘෂ්ටිවිපල්ලාසයෝ යි, කවර සතරදෙනෙකැ යත්: මහණෙනි, අනිත්‍ය (වස්තු) යෙහි නිත්‍ය යැ යන සංඥාව සංඥාවිපල්ලාස යැ චිත්ත විපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි. මහණෙනි, දුඃඛයෙහි සුඛ යැ යනු සංඥාවිපල්ලාස යැ චිත්තවිපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි. මහණෙනි, අනාත්මයෙහි ආත්ම යැ යනු සංඥාවිපල්ලාස යැ චිත්තවිපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි මහණෙනි, අශුභයෙහි ශුභ යැ යනු සංඥාවිපල්ලාස යැ චිත්ත විපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි. මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ යැ චිත්තවිපල්ලාසයෝ යැ දෘෂ්ටිවිපල්ලාසයෝ යි.

මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ නො වෙති, චිත්තවිපල්ලාසයෝ නො වෙති, දෘෂ්ටිවිපල්ලාසයෝ නො වෙත්. කවර සතරදෙනෙකැ යත්: මහණෙනි, අනිත්‍යයෙහි අනිත්‍ය යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි, දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, දුඃඛයෙහි දුඃඛ යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි. දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, අනාත්මයෙහි අනාත්ම යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි, දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, අශුභයෙහි අශුභ යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි, දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ නො වෙති, චිත්තවිපල්ලාසයෝ නො වෙති, දෘෂ්ටිවිපල්ලාසයෝ නො වෙත්.

(1) අනිත්‍යයෙහි නිත්‍ය යැ යන සංඥා ඇති දුඃඛයෙහි ද සුඛසංඥා ඇති අනාත්මයෙහි ද ආත්ම යැ යන සංඥා ඇති අශුභයෙහි ද ශුභසංඥා ඇති මිථ්‍යාදිට්ඨියෙන් මඩනාලද භ්‍රාන්ත වූ සිත් ඇති විපරීතසංඥා ඇති යම් සත්ත්ව කෙනෙක් වෙත් ද,

(2) ඒ සත්ත්වයෝ යොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිවනට නො පැමිණියාහු මාරයාගේ යොගයෙහි යෙදුණාහු වෙති. එ මැ සත්ත්වයෝ සසර හැසිරෙති, (ඔහු) ජාතිමරණයට පැමිණියාහු ද එහෙයිනි.

(3) යම් කාලෙක ප්‍රඥාලොකය කරන්නා වූ සර්වඥ බුදුවරයෝ ලොවැ උපදිත් ද ඒ බුදුවරයෝ දුක්ඛූපශම සඞ්ඛ්‍යාත නිවනට යන මේ දහම ප්‍රකාශ කෙරෙත්.

(4) සප්‍රාඥ වූ ජනයෝ ඒ බුදුවරයන්ගේ දහම අසා සවචිත්තය ලැබ අනිත්‍යය අනිත්‍ය හෙයින් දුටුවාහු යැ. දුඃඛය දුක් හෙයින් දුටුවාහු යැ.

(5) අනාත්මයෙහි අනාත්ම යැ යි දුටුවාහු යැ අශුභය අශුභ හෙයින් දුටුවාහු යැ සමාදන් කළ සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සියලු වත්දුඃඛය ඉක්මවූවාහු යයි.

ඉමෙ චත්තාරො විපල්ලාසා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා අප්පහීනාති: කෙචි පහීනා, කෙචි අප්පහීනා. අනිච්චෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො පහීනො. දුක්ඛෙ සුඛන්ති සඤ්ඤා උප්පජ්ජති, චිත්තං උප්පජ්ජති, දිට්ඨිවිපල්ලාසො පහීනො. අනත්තනි අත්තාති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො පහීනො, අසුභෙ සුභන්ති සඤ්ඤා උප්පජ්ජති, චිත්තං උප්පජ්ජති, දිට්ඨිවිපල්ලාසො පහීනො.

ද්වීසු වත්ථූසු ඡ විපල්ලාසා පහීනා, ද්වීසු වත්ථූසු ද්වෙ විපල්ලාසා පහීනා: චත්තාරො විපල්ලාසා අප්පහීනා, චතූසු වත්ථූසු අට්ඨවිපල්ලාසා පහීනා, චත්තාරො විපල්ලාසා අප්පහීනාති.

**විපල්ලාසකථා සමත්තා.**

## 9

## මග්ගකථා

මග්ගොති කෙනට්ඨෙන මග්ගො: සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි.[1] පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

අභිනිරොපට්ඨෙන[2] සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානය මග්ගො චෙව හෙතු ච පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

---

1. උත්තරිං - ස්‍යා,
2. අභිනිරොපනට්ඨෙන - PTS,

මේ සතර විපර්යාසයෝ දෘෂ්ටිසම්පන්න (සෝවාන්) පුද්ගලයාහට ප්‍රහීණ වූවාහු ද අප්‍රහීණ වූවාහු ද යත්: කිසි විපර්යාස කෙනෙක් ප්‍රහීණයහ. කිසි විපර්යාස කෙනෙක් අප්‍රහීණයහ. අනිත්‍යයෙහි නිත්‍ය යැ යන සංඥාවිපර්යාසය චිත්තවිපර්යාසය දෘෂ්ටිවිපර්යාසය ප්‍රහීණ යැ. දුඃඛයෙහි සුඛ යැ යන සංඥාව උපදී, චිත්තය උපදී. දෘෂ්ටිවිපර්යාසය ප්‍රහීණ යැ, අනාත්මයෙහි අනාත්ම යැ යන සංඥාවිපර්යාසය චිත්තවිපර්යාසය දෘෂ්ටිවිපර්යාසය ප්‍රහීණ යැ, අශුභයෙහි ශුභ යැ යන සංඥාව උපදී, චිත්තය උපදී. දෘෂ්ටිවිපර්යාසය ප්‍රහීණ යි.

(අනිත්‍යයෙහි නිත්‍ය යැ අනාත්මයෙහි ආත්ම යැ යන) දෙවත්හි විපර්යාසයෝ සදෙනෙක් ප්‍රහීණයහ. (දුඃඛයෙහි සුඛ යැ අශුභයෙහි ශුභ යැ යන) දෙවත්හි විපර්යාසයෝ දෙදෙනෙක් ප්‍රහීණයහ, විපර්යාසයෝ සතර දෙනෙක් අප්‍රහීණයහ. සතර වත්හි විපර්යාසයෝ අට දෙනෙක් ප්‍රහීණයහ විපර්යාසයෝ සතර දෙනෙක් අප්‍රහීණයෝ යි.

**විපර්යාසකථා නිමි.**

# 9

# මාර්ගකථා

**මග්ගො** යනු: කවර අර්ථයෙකින් මාර්ග වේ ද යත්: ස්‍රොතාපත්ති-මාර්ගක්ෂණයෙහි දර්ශන ස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටිහුගේ ප්‍රහාණයට මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිය විශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තයාගේ අධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තයාගේ ව්‍යොදානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිරොධයෙහි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

අභිනිරොපණ ස්වභාවයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තපාරිශුද්ධිය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

වාක්සංවර සඞ්ඛ්‍යාත පරිග්‍රහ ස්වභාවයෙන් සම්‍යග් වචනය මිථ්‍යා-වචන ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්ත පාරිශුද්ධිය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභි-සමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තස්ස පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- වොදානට්ඨෙන සම්මාආජීවො මිච්ඡාජීවස්ස පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමස්ස පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡා-සතියා පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මා-සමාධි මිච්ඡාසමාධිස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි-පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකස්ස කාමරාගසඤ්ඤොජනස්ස පටිඝසඤ්ඤොජනස්ස ඔළාරිකස්ස කාමරාගානුසයස්ස පටිඝානුසයස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරිපටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතස්ස කාමරාගසඤ්ඤොජනස්ස පටිඝසඤ්ඤොජනස්ස අණුසහගතස්ස කාමරාගානුසයස්ස පටිඝානුසයස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගස්ස මානස්ස උද්ධච්චස්ස අවිජ්ජාය, මානානුසයස්ස භවරාගානුසයස්ස[1] අවිජ්ජානුසයස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

---

1. රාගානුසයස්ස - ස්‍යා

සමුට්ඨාන සවභාවයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යාකර්මාන්තයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි ... පරිශුද්ධභාව සවභාවයෙන් සම්‍යගාජීවය මිථ්‍යාජීවයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි ... ප්‍රග්‍රහ සවභාවයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි ... උපස්ථානසවභාවයෙන් සම්‍යක්සමෘතිය මිථ්‍යා-සමෘතිහුගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි ... අවික්ෂෙපසවභාව-යෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධිහුගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි. ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. චිත්තවොදානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි දර්ශන සවභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක් සමාධිය ඖදාරික වූ කාමරාගසංයොජනයා-ගේ ප්‍රතිඝසංයොජනයාගේ ඖදාරික වූ කාමරාගානුශයාගේ ප්‍රතිඝානු-ශයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. චිත්තවොදානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ

අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශන සවභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපසවභාවයෙන් සම්‍යක්සමාධිය අණුසහගත වූ කාමරාගසංයො-ජනයාගේ ප්‍රතිඝසංයොජනයාගේ අණුසහගත වූ කාමරාගානුශයාගේ ප්‍රතිඝානුශයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. සහජාත-ධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි. ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තවොදානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනසවභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙප සවභාවයෙන් සම්‍යක්සමාධිය රූපරාගයාගේ අරූපරාගයාගේ මානයාගේ ඖද්ධත්‍යයාගේ අවිද්‍යාවගේ මානානුශයාගේ භවරාගානුශයාගේ අවිද්‍යානු-ශයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි. ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තවොදානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

දස්සනමග්ගො සම්මාදිට්ඨි, අභිනිරොපනමග්ගො සම්මාසඞ්කප්පො, පරිග්ගහමග්ගො සම්මාවාචා, සමුට්ඨානමග්ගො සම්මාකම්මන්තො, වොදානමග්ගො සම්මාආජීවො, පග්ගහමග්ගො සම්මාවායාමො, උපට්ඨානමග්ගො සම්මාසති, අවික්ඛෙපමග්ගො සම්මාසමාධි.

උපට්ඨානමග්ගො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයමග්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, පග්ගහමග්ගො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණමග්ගො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමමග්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපමග්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානමග්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියමග්ගො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියමග්ගො විරියබලං, පමාදෙ අකම්පියමග්ගො සතිබලං, උද්ධච්චෙ අකම්පියමග්ගො සමාධිබලං, අවිජ්ජාය අකම්පියමග්ගො පඤ්ඤාබලං.

අධිමොක්ඛමග්ගො සද්ධින්ද්‍රියං, පග්ගහමග්ගො විරියින්ද්‍රියං, උපට්ඨානමග්ගො සතින්ද්‍රියං, අවික්ඛෙපමග්ගො සමාධින්ද්‍රියං, දස්සනමග්ගො පඤ්ඤින්ද්‍රියං,

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං.[1] මග්ගො, අකම්පියට්ඨෙන බලං.[2] මග්ගො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගො.[3] මග්ගො, හෙතුට්ඨෙන[4] මග්ගඞ්ගං මග්ගො,[5] උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං මග්ගො, පදහනට්ඨෙන[6]. සම්මප්පධානං මග්ගො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදො මග්ගො, තථට්ඨෙන සච්චං.[7] මග්ගො, අවික්ඛෙපට්ඨෙන සමථො මග්ගො, අනුපස්සනට්ඨෙන විපස්සනා මග්ගො, එකරසට්ඨෙන සමථවිපස්සනා මග්ගො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[8] මග්ගො, සංවරට්ඨෙන සීලවිසුද්ධි මග්ගො, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි මග්ගො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි මග්ගො, මුත්තට්ඨෙන විමොක්ඛො මග්ගො, පටිවෙධට්ඨෙන විජ්ජා මග්ගො, පරිච්චාගට්ඨෙන විමුත්ති මග්ගො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං මග්ගො, ඡන්දො මූලට්ඨෙන මග්ගො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන මග්ගො, ඵස්සො සමොධානට්ඨෙන මග්ගො, වෙදනා සමොසරණට්ඨෙන මග්ගො, සමාධි පමුඛට්ඨෙන මග්ගො, සති ආධිපතෙය්‍යට්ඨෙන මග්ගො, පඤ්ඤා තදුත්තරට්ඨෙන[9]. මග්ගො, විමුත්ති සාරට්ඨෙන මග්ගො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මග්ගො'ති.

මග්ගකථා සමත්තා.

---

1 ඉන්ද්‍රියා - මජසං, ස්‍යා.
2 බලා - මජසං.
3. බොජ්ඣඞ්ගා - මජසං.
4. හෙත්වට්ඨෙන - සී 2, 3. හෙතට්ඨෙන - ස්‍යා
5. මග්ගා - මජසං
6. පදහට්ඨෙන - PTS.
7. සච්චා - මජසං ස්‍යා, PTS.
8. යුගනද්ධා - මජසං, යුගනන්ධා - ස්‍යා, PTS
9. තතුත්තරට්ඨෙන - මජසං.

දර්ශනමාර්ගය සම්‍යග්දෘෂ්ටි යැ, අභිනිරෝපණ (අරමුණට නැඟීම) මාර්ගය සම්‍යක්සංකල්ප යැ, පරිග්‍රහමාර්ගය සම්‍යග්වචන යැ, සමුත්ථානමාර්ගය සම්‍යක්කර්මාන්ත යැ, ව්‍යවදානමාර්ගය සම්‍යගාජීව යැ, ප්‍රග්‍රහමාර්ගය සම්‍යග්ව්‍යායාම යැ, උපස්ථාන (අරමුණට එළඹසිටීම) මාර්ගය සම්‍යක්ස්මෘති යැ, අවික්ෂේපමාර්ගය සම්‍යක්සමාධි යි.

උපස්ථානමාර්ගය ස්මෘතිසම්බෝධ්‍යඞ්ග යැ, ප්‍රවිචය (විමසීම) මාර්ගය ධර්මවිචයසම්බෝධ්‍යඞ්ග යැ, ප්‍රග්‍රහමාර්ගය වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ග යැ, ස්ඵරණමාර්ගය ප්‍රීතිසම්බෝධ්‍යඞ්ග යැ, ව්‍යුපශමමාර්ගය ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ග යැ, අවික්ෂේපමාර්ගය සමාධිසම්බෝධ්‍යඞ්ග යැ, පටිසඞ්ඛානමාර්ගය උපේක්ෂාසම්බෝධ්‍යඞ්ග යි.

අශ්‍රද්ධායෙහි අකම්ප්‍යමාර්ගය ශ්‍රද්ධාබල යැ, කුසීදබැව්හි අකම්ප්‍යමාර්ගය වීර්‍ය්‍යබල යැ, ප්‍රමාදයෙහි අකම්ප්‍යමාර්ගය ස්මෘතිබල යැ, උද්ධත බැව්හි අකම්ප්‍යමාර්ගය සමාධිබල යැ, අවිද්‍යායෙහි අකම්ප්‍යමාර්ගය ප්‍රඥාබල යි.

අධිමෝක්ෂමාර්ගය ශ්‍රද්ධෙන්ද්‍රිය යැ, ප්‍රග්‍රහමාර්ගය වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ, උපස්ථානමාර්ගය ස්මෘතීන්ද්‍රිය යැ, අවික්ෂේපමාර්ගය සමාධීන්ද්‍රිය යැ, දර්ශනමාර්ගය ප්‍රඥෙන්ද්‍රිය යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රිය මාර්ග වෙයි, අකම්ප්‍යාර්ථයෙන් බල මාර්ග වෙයි, නිර්‍ය්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගය මාර්ග වෙයි, හේත්වර්ථයෙන් මාර්ගාඞ්ග මාර්ග වෙයි, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානය මාර්ග වෙයි, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානය මාර්ග වෙයි, සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදය මාර්ග වෙයි, තථාර්ථයෙන් සත්‍යය මාර්ග වෙයි, අවික්ෂේපාර්ථයෙන් ශමථය මාර්ග වෙයි. අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව මාර්ග වෙයි, එකරසාර්ථයෙන් ශමථ-විදර්ශනා මාර්ග වෙයි, අනතිවර්තනාර්ථයෙන් යුගනද්ධධර්ම මාර්ග වෙයි, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය මාර්ග වෙයි, අවික්ෂේපාර්ථයෙන් චිත්තවිශුද්ධිය මාර්ග වෙයි, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය මාර්ග වෙයි, මුක්තාර්ථයෙන් විමෝක්ෂය මාර්ග වෙයි, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව මාර්ග වෙයි, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය මාර්ග වෙයි, සමුච්ඡේදාර්ථයෙන් ක්ෂයඥානය මාර්ග වෙයි, ඡන්දය මූලාර්ථයෙන් මාර්ග වෙයි, මනසිකාරය සමුත්ථානාර්ථයෙන් මාර්ග වෙයි, ස්පර්ශය සමවධානාර්ථයෙන් මාර්ග වෙයි, වේදනාව සමවසරණාර්ථයෙන් මාර්ග වෙයි, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් මාර්ග වෙයි, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් මාර්ග වෙයි, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් මාර්ග වෙයි, විමුක්තිය සාරාර්ථයෙන් මාර්ග වෙයි, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් මාර්ග වේ යයි.

මාර්ගකථා නිමි.

## 10

# මණ්ඩපෙය්‍යකථා

"මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං, සත්ථා සම්මුඛීභූතො"[1], a, තිධත්තමණ්ඩො.[2] සත්ථරි සම්මුඛීභූතෙ: දෙසනාමණ්ඩො, පටිග්ගහමණ්ඩො,[3] බ්‍රහ්මචරියමණ්ඩො.

කතමො දෙසනාමණ්ඩො: චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා[4] පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.[5] චතුන්නං සතිපට්ඨානානං -පෙ- චතුන්නං සම්මප්පධානානං -පෙ- චතුන්නං ඉද්ධිපාදානං -පෙ- පඤ්චන්නං ඉන්ද්‍රියානං -පෙ- පඤ්චන්නං බලානං -පෙ- සත්තන්නං බොජ්ඣඞ්ගානං -පෙ- අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. අයං දෙසනාමණ්ඩො. (1)

කතමො පටිග්ගහමණ්ඩො: භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා, යෙ වා පනඤ්ඤෙපි කෙචි විඤ්ඤාතාරො. අයං පටිග්ගහමණ්ඩො. (2)

කතමො බ්‍රහ්මචරියමණ්ඩො: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං:[6] සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං බ්‍රහ්මචරියමණ්ඩො. (3)

අධිමොක්ඛමණ්ඩො සද්ධින්ද්‍රියං, අස්සද්ධියං කසටො, අස්සද්ධියං කසටං ඡඩ්ඩෙත්වා සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පග්ගහමණ්ඩො විරියින්ද්‍රියං, කොසජ්ජං කසටො, කොසජ්ජං කසටං ඡඩ්ඩෙත්වා විරියින්ද්‍රියස්ස පග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. උපට්ඨානමණ්ඩො සතින්ද්‍රියං, පමාදො කසටො, පමාදං කසටං ඡඩ්ඩෙත්වා සතින්ද්‍රියස්ස උපට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. අවික්ඛෙපමණ්ඩො සමාධින්ද්‍රියං, උද්ධච්චං කසටො, උද්ධච්චං කසටං ඡඩ්ඩෙත්වා සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. දස්සනමණ්ඩො පඤ්ඤින්ද්‍රියං, අවිජ්ජා[7] කසටො, අවිජ්ජං කසටං ඡඩ්ඩෙත්වා පඤ්ඤින්ද්‍රියස්ස දස්සනමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

අස්සද්ධියෙ අකම්පියමණ්ඩො සද්ධාබලං, අස්සද්ධියං කසටො, අස්සද්ධියං කසටං ඡඩ්ඩෙත්වා සද්ධාබලස්ස අස්සද්ධියෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. කොසජ්ජෙ අකම්පියමණ්ඩො විරියබලං, කොසජ්ජං කසටො, කොසජ්ජං කසටං ඡඩ්ඩෙත්වා විරියබලස්ස කොසජ්ජෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පමාදෙ අකම්පියමණ්ඩො සතිබලං, පමාදො කසටො, පමාදං කසටං ඡඩ්ඩෙත්වා සතිබලස්ස පමාදෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. උද්ධච්චෙ අකම්පියමණ්ඩො සමාධිබලං, උද්ධච්චං කසටො, උද්ධච්චං කසටං ඡඩ්ඩෙත්වා සමාධිබලස්ස උද්ධච්චෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. අවිජ්ජාය අකම්පියමණ්ඩො පඤ්ඤාබලං, අවිජ්ජා කසටො, අවිජ්ජං කසටං ඡඩ්ඩෙත්වා පඤ්ඤාබලස්ස අවිජ්ජාය අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

---

1. සත්ථරි සම්මුඛීභූතෙ - ස්‍යා, PTS 2. තිවිධො මණ්ඩො - ස්‍යා, සී 1, 2. PTS.
3. පරිග්ගහමණ්ඩො - මජසං. 4. පඤ්ඤාපනා - ස්‍යා, සී 1, 2, PTS.
5. උත්තානිකම්මං - PTS 6. සෙය්‍යථිදං - මජසං.
7. අවිජ්ජං - මජසං, a. සංයුත්තනිකාය - නිදාන බලවග්ග

# 10

# මණ්ඩපෙය්‍ය කථා

මහණෙනි, මේ ශාසනබ්‍රහ්මචර්‍ය්‍යය මණ්ඩපෙය්‍ය (ඝෘතමණ්ඩයක් සෙයින් ප්‍රසන්න වූ හිතසුඛාවහ පානයෙක්) වෙයි. ශාස්තෘහු හමු වූහ. ශාස්තෘන් හමු වූ කල්හි ත්‍රිවිධභාවයෙන් මණ්ඩ (ප්‍රසන්න) වෙයි: දෙශනාමණ්ඩ යැ ප්‍රතිග්‍රහමණ්ඩ යැ බ්‍රහ්මචර්‍ය්‍යමණ්ඩ යි.

දෙශනාමණ්ඩ කවරේ යත්: සතර ආර්‍ය්‍යසත්‍යයන් නම් වශයෙන් කීම යැ දක්වීම යැ පැනවීම යැ ඥනමුඛයෙහි තැබීම යැ විවෘත කිරීම යැ විභාග කිරීම යැ ප්‍රකට කිරීම යැ සතර සතිපට්ඨානයන් ... සතර සම්‍යක්ප්‍රධානයන් .. සතර සෘද්ධිපාදයන් ... පඤ්චෙන්ද්‍රියයන් ... පඤ්චබලයන් සප්ත බොධ්‍යඞ්ගයන් ... ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය නම් වශයෙන් කීම යැ දක්වීම යැ පැනවීම යැ ඥනමුඛයෙහි තැබීම යැ විවෘත කිරීම යැ විභාග කිරීම යැ ප්‍රකට කිරීම යි. මේ දෙශනාමණ්ඩ නම් වෙයි. (1)

ප්‍රතිග්‍රහමණ්ඩ කවරැ යත්: මහණහු යැ මෙහෙණහු යැ උවසුවෝ යැ උවැසියෝ යැ දෙවියෝ යැ මිනිස්සු යැ, තවද අන්‍ය වූ හෝ යම් කිසි ධර්මප්‍රතිවෙධක කෙනෙක් වෙත් ද මේ ප්‍රතිග්‍රහමණ්ඩ නම් වෙයි. (2)

බ්‍රහ්මචර්‍ය්‍යමණ්ඩ කවරැ යත්: මේ මැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය යි. හෙ මෙසේයි: සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සඞ්කල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි. මේ බ්‍රහ්මචර්‍ය්‍යමණ්ඩ නම් වේ. (3)

ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂමණ්ඩ යැ අශ්‍රද්ධාව කසට යැ අශ්‍රද්ධා සඞ්ඛ්‍යාත කසටය හැරපියා ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, වීර්‍ය්‍යෙන්ද්‍රිය ප්‍රග්‍රහමණ්ඩ යැ කුසීද බව කසට යැ කෞසීද්‍ය සඞ්ඛ්‍යාත කසටය හැරපියා වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහමණ්ඩය පානය කෙරේනු'යි මණ්ඩපෙය්‍ය නම, ස්මෘතීන්ද්‍රිය උපස්ථානමණ්ඩ යැ ප්‍රමාදය කසට යැ ප්‍රමාද සඞ්ඛ්‍යාත කසටය හැරපියා ස්මෘතීන්ද්‍රියයාගේ උපස්ථානමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, සමාධීන්ද්‍රිය අවික්ෂෙපමණ්ඩ යැ උද්ධතභාවය කසට යැ උද්ධතභාව සඞ්ඛ්‍යාත කසටය හැරපියා සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙප-මණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ප්‍රඥෙන්ද්‍රිය දර්ශනමණ්ඩ යැ අවිද්‍යාව කසට යැ අවිද්‍යා සඞ්ඛ්‍යාත කසටය හැරපියා ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශන-මණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නමි.

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි අකම්පය (නො සැලෙන) මණ්ඩ යැ, අශ්‍රද්ධාව කසට යැ, අශ්‍රද්ධාකසටය හැරපියා ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධායෙහි අකම්ප්‍ය-මණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, වීර්‍ය්‍යබලය කුසීදභාවයෙහි අකම්ප්‍යමණ්ඩ යැ කුසීදභාවය කසට යැ කෞසීද්‍යකසටය හැරපියා වීර්‍ය්‍ය-බලයාගේ කුසීදභාවයෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ස්මෘතිබලය ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ ප්‍රමාද-කසටය හැරපියා ස්මෘතිබලයාගේ ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම. සමාධිබලය ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යබල යැ ඖද්ධත්‍යය කසට යැ, ඖද්ධත්‍යකසටය හැරපියා සමාධිබලයාගේ ඖද්ධත්‍ය-යෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ප්‍රඥබලය අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ; අවිද්‍යාකසටය හැරපියා ප්‍රඥබලයාගේ අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නමි.

උපට්ඨානමණ්ඩො සතිසම්බොජ්ඣඞ්ගො, පමාදො කසටො, පමාදං කසටං ඡඩ්ඩෙත්වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උපට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පවිචයමණ්ඩො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, අවිජ්ජා කසටො, අවිජ්ජං[1] කසටං ඡඩ්ඩෙත්වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස පවිචයමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පග්ගහමණ්ඩො විරියසම්බොජ්ඣඞ්ගො, කොසජ්ජං කසටො, කොසජ්ජං කසටං ඡඩ්ඩෙත්වා විරියසම්බොජ්ඣඞ්ගස්ස පග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. ඵරණමණ්ඩො පීතිසම්බොජ්ඣඞ්ගො, පරිළාහො කසටො, පරිළාහං කසටං ඡඩ්ඩෙත්වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස ඵරණමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. උපසමමණ්ඩො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, දුට්ඨුල්ලං කසටො, දුට්ඨුල්ලං කසටං ඡඩ්ඩෙත්වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උපසමමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. අවික්ඛෙපමණ්ඩො සමාධිසම්බොජ්ඣඞ්ගො, උද්ධච්චං කසටො, උද්ධච්චං කසටං ඡඩ්ඩෙත්වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස අවික්ඛෙපමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පටිසඞ්ඛානමණ්ඩො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අප්පටිසඞ්ඛා කසටො, අප්පටිසඞ්ඛං කසටං ඡඩ්ඩෙත්වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස පටිසඞ්ඛානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

දස්සනමණ්ඩො සම්මාදිට්ඨි, මිච්ඡාදිට්ඨි කසටො, මිච්ඡාදිට්ඨිං කසටං ඡඩ්ඩෙත්වා සම්මාදිට්ඨියා දස්සනමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, අභිනිරොපනමණ්ඩො සම්මාසඞ්කප්පො, මිච්ඡාසඞ්කප්පො කසටො, මිච්ඡාසඞ්කප්පං කසටං ඡඩ්ඩෙත්වා සම්මාසඞ්කප්පස්ස අභිනිරොපනමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, පරිග්ගහමණ්ඩො සම්මාවාචා, මිච්ඡාවාචා කසටො, මිච්ඡාවාචං කසටං ඡඩ්ඩෙත්වා සම්මාවාචාය පරිග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, සමුට්ඨානමණ්ඩො සම්මාකම්මන්තො, මිච්ඡාකම්මන්තො කසටො, මිච්ඡාකම්මන්තං කසටං ඡඩ්ඩෙත්වා සම්මාකම්මන්තස්ස සමුට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, වොදානමණ්ඩො සම්මාආජීවො, මිච්ඡාආජීවො කසටො, මිච්ඡාආජීවං කසටං ඡඩ්ඩෙත්වා සම්මාආජීවස්ස වොදානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, පග්ගහමණ්ඩො සම්මාවායාමො, මිච්ඡාවායාමො කසටො, මිච්ඡාවායාමං කසටං ඡඩ්ඩෙත්වා සම්මාවායාමස්ස පග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, උපට්ඨානමණ්ඩො සම්මාසති, මිච්ඡාසති කසටො, මිච්ඡාසතිං කසටං ඡඩ්ඩෙත්වා සම්මාසතියා උපට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සම්මාසමාධි, මිච්ඡාසමාධි කසටො, මිච්ඡාසමාධිං කසටං ඡඩ්ඩෙත්වා සම්මාසමාධිස්ස අවික්ඛෙපමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

අත්ථි මණ්ඩො, අත්ථි පෙය්‍යං, අත්ථි කසටො;

අධිමොක්ඛමණ්ඩො සද්ධින්ද්‍රියං, අස්සද්ධියං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පග්ගහමණ්ඩො විරියින්ද්‍රියං, කොසජ්ජං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උපට්ඨානමණ්ඩො සතින්ද්‍රියං පමාදො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සමාධින්ද්‍රියං, උද්ධච්චං කසටො, යො තත්ථ අත්ථරසො, ධම්මරසො විමුත්තිරසො ඉදං පෙය්‍යං. දස්සනමණ්ඩො පඤ්ඤින්ද්‍රියං, අවිජ්ජා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං.

1. අවිජ්ජං - ඡසං

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ප්‍රමාදකසටය හැරපියා ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ උපස්ථානමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචය (විමසීම්) මණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, අවිද්‍යාකසටය හැරපියා ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රවිචයමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, කෞසීද්‍යකසටය හැරපියා වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රග්‍රහමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ස්ඵරණමණ්ඩ යැ, පරිදාහය කසට යැ, පරිදාහකසටය හැරපියා ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ස්ඵරණමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශමමණ්ඩ යැ, දුට්ඨුල්ලය කසට යැ, දුට්ඨුල්ලකසටය හැරපියා ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ ව්‍යුපශමමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඖද්ධත්‍යකසටය හැරපියා සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ අවික්ෂෙපමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය පටිසඞ්ඛාන (ප්‍රත්‍යවෙක්ෂා) මණ්ඩ යැ, අප්පටිසඞ්ඛාව කසට යැ, අප්පටිසඞ්ඛාකසටය හැරපියා උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ පටිසඞ්ඛානමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නමි.

සම්‍යග්දෘෂ්ටිය දර්ශනමණ්ඩ යැ, මිථ්‍යාදෘෂ්ටිය කසට යැ, මිථ්‍යාදෘෂ්ටිකසටය හැරපියා සම්‍යග්දෘෂ්ටිහුගේ දර්ශනමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්සංකල්පය අභිනිරොපණ (අරමුණට නැගීම්) මණ්ඩ යැ, මිථ්‍යාසංකල්පය කසට යැ, මිථ්‍යාසංකල්පකසටය හැරපියා සම්‍යක්සංකල්පයාගේ අභිනිරොපණමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යග්වචනය පරිග්‍රහමණ්ඩ යැ, මිථ්‍යාවචනය කසට යැ, මිථ්‍යාවචනකසටය හැරපියා සම්‍යග්වචනයාගේ පරිග්‍රහමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්කර්මාන්තය සමුත්ථානමණ්ඩ යැ, මිථ්‍යාකර්මාන්තය කසට යැ, මිථ්‍යාකර්මාන්තකසටය හැරපියා සම්‍යක්කර්මාන්තයාගේ සමුත්ථානමණ්ඩය, පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යගාජීවය ව්‍යවදානමණ්ඩ යැ, මිථ්‍යාආජීවය කසට යැ, මිථ්‍යාජීවකසටය හැරපියා සම්‍යගාජීවයාගේ ව්‍යවදානමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහමණ්ඩ යැ, මිථ්‍යාව්‍යායාමය කසට යැ, මිථ්‍යාව්‍යායාමකසටය හැරපියා සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රග්‍රහමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්ස්මෘතිය උපස්ථානමණ්ඩ යැ, මිථ්‍යාස්මෘතිය කසට යැ, මිථ්‍යාස්මෘති කසටය හැරපියා සම්‍යක්ස්මෘතිහුගේ උපස්ථානමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්සමාධිය අවික්ෂෙපමණ්ඩ යැ, මිථ්‍යාසමාධිය කසට යැ, මිථ්‍යාසමාධිකසටය හැරපියා සම්‍යක්සමාධිහුගේ අවික්ෂෙපමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නමි.

මණ්ඩ (ප්‍රසන්න) යෙක් ඇත, පියයුත්තෙක් ඇත, කසටයෙක් ඇති.

ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂමණ්ඩ යැ, අශ්‍රද්ධාව කසට යැ, ඒ ශ්‍රද්ධෙන්ද්‍රියෙහි යම් අර්ථරස (සම්පත්ති) යෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රිය ප්‍රග්‍රහමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, ඒ වීර්‍ය්‍යෙන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ස්මෘතීන්ද්‍රිය උපස්ථානමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ඒ ස්මෘතීන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමාධීන්ද්‍රිය අවික්ෂෙපමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඒ සමාධීන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රඥෙන්ද්‍රිය දර්ශනමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, ඒ ප්‍රඥෙන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

අස්සද්ධියෙ අකම්පියමණ්ඩො සද්ධාබලං, අස්සද්ධියං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, කොසජ්ජෙ අකම්පියමණ්ඩො විරියබලං, කොසජ්ජං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පමාදෙ අකම්පියමණ්ඩො සතිබලං, පමාදො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උද්ධච්චෙ අකම්පියමණ්ඩො සමාධිබලං, උද්ධච්චං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවිජ්ජාය අකම්පියමණ්ඩො පඤ්ඤාබලං, අවිජ්ජා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං.

උපට්ඨානමණ්ඩො සතිසම්බොජ්ඣඞ්ගො, පමාදො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පවිචයමණ්ඩො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, අවිජ්ජා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පග්ගහමණ්ඩො විරියසම්බොජ්ඣඞ්ගො, කොසජ්ජං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, ඵරණමණ්ඩො පීතිසම්බොජ්ඣඞ්ගො, පරිළාහො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උපසමමණ්ඩො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, දුට්ඨුල්ලං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සමාධිසම්බොජ්ඣඞ්ගො, උද්ධච්චං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පටිසඞ්ඛානමණ්ඩො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අපටිසඞ්ඛා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං.

දස්සනමණ්ඩො සම්මාදිට්ඨි, මිච්ඡාදිට්ඨි කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අභිනිරොපනමණ්ඩො සම්මාසඞ්කප්පො, මිච්ඡාසඞ්කප්පො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පරිග්ගහමණ්ඩො සම්මාවාචා, මිච්ඡාවාචා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, සමුට්ඨානමණ්ඩො සම්මාකම්මන්තො, මිච්ඡාකම්මන්තො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, වොදානමණ්ඩො සම්මාආජීවො, මිච්ඡාආජීවො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පග්ගහමණ්ඩො සම්මාවායාමො මිච්ඡාවායාමො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උපට්ඨානමණ්ඩො සම්මාසති, මිච්ඡාසති කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සම්මාසමාධි, මිච්ඡාසමාධි කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං,

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි අකම්ප්‍යමණ්ඩ යැ, අශ්‍රද්ධාව කසට යැ, ඒ ශ්‍රද්ධාබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. වීර්‍ය්‍යබලය කෞසීද්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, ඒ වීර්‍ය්‍යබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ස්මෘතිබලය ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ඒ ස්මෘතිබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමාධිබලය ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඒ සමාධිබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රඥාබලය අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, ඒ ප්‍රඥාබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ඒ ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචයමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, ඒ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, ඒ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ස්ඵරණමණ්ඩ යැ, පරිදාහය කසට යැ, ඒ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශමමණ්ඩ යැ, දුෂ්ඨුල්ලය කසට යැ, ඒ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඒ සමාධිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ප්‍රත්‍යවෙක්ෂාමණ්ඩ යැ, ප්‍රතිවෙක්ෂා නො කිරීම කසට යැ, ඒ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

සම්‍යග්දෘෂ්ටිය දර්ශනමණ්ඩ යැ, මිථ්‍යාදෘෂ්ටිය කසට යැ, ඒ සම්‍යග්දෘෂ්ටියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්සංකල්පය අභිනිරොපණමණ්ඩ යැ, මිථ්‍යාසංකල්පය කසට යැ, ඒ සම්‍යක්සංකල්පයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යග්වචනය පරිග්‍රහ (වාක්සංවර) මණ්ඩ යැ, මිථ්‍යාවචනය කසට යැ, ඒ සම්‍යග්වචනයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්කර්මාන්තය සමුත්ථානමණ්ඩ යැ, මිථ්‍යාකර්මාන්තය කසට යැ, ඒ සම්‍යක්කර්මාන්තයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යගාජීවය ව්‍යවදානමණ්ඩ යැ, මිථ්‍යාජීවය කසට යැ, ඒ සම්‍යගාජීවයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහමණ්ඩ යැ, මිථ්‍යාව්‍යායාමය කසට යැ, ඒ සම්‍යග්ව්‍යායාමයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්ස්මෘතිය උපස්ථානමණ්ඩ යැ, මිථ්‍යාස්මෘතිය කසට යැ, ඒ සම්‍යක්ස්මෘතියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්සමාධිය අවික්ෂෙපමණ්ඩ යැ, මිථ්‍යාසමාධිය කසට යැ, ඒ සම්‍යක්සමාධියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

දස්සනමණ්ඩො සම්මාදිට්ඨි, අභිනිරොපනමණ්ඩො සම්මාසඞ්කප්පො, පරිග්ගහමණ්ඩො සම්මාවාචා, සමුට්ඨානමණ්ඩො සම්මාකම්මන්තො, වොදානමණ්ඩො සම්මාආජීවො, පග්ගහමණ්ඩො සම්මාවායාමො, උපට්ඨානමණ්ඩො සම්මාසති, අවික්ඛෙපමණ්ඩො සම්මාසමාධි.

උපට්ඨානමණ්ඩො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයමණ්ඩො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො පග්ගහමණ්ඩො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණමණ්ඩො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමමණ්ඩො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපමණ්ඩො සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානමණ්ඩො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියමණ්ඩො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියමණ්ඩො විරියබලං, පමාදෙ අකම්පියමණ්ඩො සතිබලං, උද්ධච්චෙ අකම්පියමණ්ඩො සමාධිබලං, අවිජ්ජාය අකම්පියමණ්ඩො පඤ්ඤාබලං.

අධිමොක්ඛමණ්ඩො සද්ධාබලං, පග්ගහමණ්ඩො විරියබලං, උපට්ඨානමණ්ඩො සතිබලං, අවික්ඛෙපමණ්ඩො සමාධිබලං, දස්සනමණ්ඩො පඤ්ඤාබලං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං[1] මණ්ඩො[2] අකම්පියට්ඨෙන බලං[3] මණ්ඩො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගො[4] මණ්ඩො, හෙතුට්ඨෙන[5] මග්ගො මණ්ඩො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං[6] මණ්ඩො, පදහනට්ඨෙන සම්මප්පධානං[7] මණ්ඩො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදො[8] මණ්ඩො, තථට්ඨෙන සච්චං[9] මණ්ඩො, අවික්ඛෙපට්ඨෙන සමථො මණ්ඩො අනුපස්සනට්ඨෙන විපස්සනා මණ්ඩො, එකරසට්ඨෙන සමථවිපස්සනා මණ්ඩො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[10] මණ්ඩො, සංවරට්ඨෙන සීලවිසුද්ධි මණ්ඩො, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි මණ්ඩො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි මණ්ඩො, මුත්තට්ඨෙන විමොක්ඛො මණ්ඩො, පටිවෙධට්ඨෙන විජ්ජා මණ්ඩො, පරිච්චාගට්ඨෙන විමුත්ති මණ්ඩො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං මණ්ඩො, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං මණ්ඩො.

ඡන්දො මූලට්ඨෙන මණ්ඩො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන මණ්ඩො, ඵස්සො සමොධානට්ඨෙන මණ්ඩො, වෙදනා සමොසරණට්ඨෙන මණ්ඩො, සමාධි පමුඛට්ඨෙන මණ්ඩො, සති ආධිපතෙය්‍යට්ඨෙන මණ්ඩො, පඤ්ඤා තදුත්තරට්ඨෙන[11] මණ්ඩො, විමුත්ති සාරට්ඨෙන මණ්ඩො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මණ්ඩොති.

**මණ්ඩපෙය්‍යකථා සමත්තා.**

**චතුත්ථභාණවාරං**

## මහාවග්ගො පඨමො

තස්ස වග්ගස්ස උද්දානං භවති:

ඤාණ[12]දිට්ඨි ච අස්සාසා
ඉන්ද්‍රියං විමොක්ඛ පඤ්චමා,
ගතිකම්මවිපල්ලාසා
වග්ගො මණ්ඩෙන තෙ දසා'ති.

එස නිකායධරට්ඨපිතො[13]
අසමො පඨමො පවරො වරවග්ගො'ති[14]

---

1. ඉන්ද්‍රියා - මජසං, ස්‍යා 2' ඉන්ද්‍රියමණ්ඩො - සී 1, 2, 3, ස
3. බලා - මජසං, 4 බොජ්ඣඞ්ගා - මජසං, 5. හෙතට්ඨෙන - ස්‍යා. සී 1, 2, 3
6. සතිපට්ඨානා මජසං, ස්‍යා, PTS 7 සම්මප්පධානා - මජසං, ස්‍යා PTS.
8 ඉද්ධිපාදා - මජසං, ස්‍යා PTS 9 සච්චා - මජසං ස්‍යා සච්චමණ්ඩො - සී 1, 2; 3
10 යුගනද්ධො - මජසං යුගනන්ධා - ස්‍යා PTS 11 තතුත්තරට්ඨෙන - මජසං. සී 1
12 ඤාණං - සී 2 13. නිකායධරෙහි ඨපිතො-මජසං නිකායවරො ඨපිතො-ස්‍යා PTS
14. පඨමො ච පවරො වරවග්ගොති - ස්‍යා පවරො වරො ච වග්ගොති - PTS

සම්‍යග්දෘෂ්ටිය දර්ශනමණ්ඩ යැ, සම්‍යක්සංකල්පය අභිනිරෝපණමණ්ඩ යැ, සම්‍යග්වචනය පරිග්‍රහමණ්ඩ යැ, සම්‍යක්කර්මාන්තය සමුට්ඨානමණ්ඩ යැ, සම්‍යගාජීවය ව්‍යවදානමණ්ඩ යැ, සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහමණ්ඩ යැ, සම්‍යක්-ස්මෘතිය උපස්ථානමණ්ඩ යැ, සම්‍යක්සමාධිය අවික්ෂෙපමණ්ඩ යි.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානමණ්ඩ යැ, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචයමණ්ඩ යැ, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහමණ්ඩ යැ, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ස්ඵරණ (පැතිරීම්) මණ්ඩ යැ, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශමමණ්ඩ යැ, සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපමණ්ඩ යැ, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය පටිසඞ්ඛානමණ්ඩ යි.

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි අකම්ප්‍ය (නො සැලෙන) මණ්ඩ යැ, වීර්‍ය්‍යබලය කෞසීද්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ස්මෘතිබලය ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, සමාධිබලය ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ප්‍රඥාබලය අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩ යි.

ශ්‍රද්ධාබලය අධිමොක්ෂමණ්ඩ යැ, වීර්‍ය්‍යබලය ප්‍රග්‍රහමණ්ඩ යැ, ස්මෘතිබලය උපස්ථානමණ්ඩ යැ, සමාධිබලය අවික්ෂෙපමණ්ඩ යැ, ප්‍රඥාබලය දර්ශනමණ්ඩ යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රිය මණ්ඩ යැ, අකම්ප්‍යාර්ථයෙන් බල මණ්ඩ යැ, නිර්‍ය්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ග මණ්ඩ යැ, හෙතුවර්ථයෙන් මාර්ග මණ්ඩ යැ, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨාන මණ්ඩ යැ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධාන මණ්ඩ යැ, සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාද මණ්ඩ යැ, තථාර්ථයෙන් සත්‍යය මණ්ඩ යැ, අවික්ෂෙපාර්ථයෙන් ශමථ මණ්ඩ යැ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව මණ්ඩ යැ, එකරසාර්ථයෙන් ශමථ-විදර්ශනා මණ්ඩ යැ, අනතිවර්තනාර්ථයෙන් යුගනද්ධ මණ්ඩ යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය මණ්ඩ යැ, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය මණ්ඩ යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය මණ්ඩ යැ, මුක්තාර්ථයෙන් විමොක්ෂය මණ්ඩ යැ, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව මණ්ඩ යැ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය මණ්ඩ යැ, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය මණ්ඩ යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාද ඥානය මණ්ඩ යි.

ඡන්දය මූලාර්ථයෙන් මණ්ඩ යැ, මනසිකාරය සමුට්ඨානාර්ථයෙන් මණ්ඩ යැ, ස්පර්ශය සමවධානාර්ථයෙන් මණ්ඩ යැ, වෙදනාව සමොසරණාර්ථයෙන් මණ්ඩ යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් මණ්ඩ යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් මණ්ඩ යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් මණ්ඩ යැ, විමුක්තිය සාරාර්ථයෙන් මණ්ඩ යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් මණ්ඩ යයි.

**මණ්ඩපෙය්‍යකථා නිමි.**

**සතරවැනි බණවර යි.**

# පළමුවැනි මහාවර්ගය යි.

ඥානකථා යැ, දෘෂ්ටිකථා යැ, ආනාපානස්මෘතිකථා යැ, ඉන්ද්‍රියකථා යැ, පස්වැනි විමොක්ෂකථා යැ, ගතිකථා යැ, කර්මකථා යැ, විපර්‍ය්‍යාසකථා යැ, මණ්ඩපෙය්‍යකථා හා සමග මාර්ගකථා යැ යන ඒ දශකථාවෝ ඒ මහාවර්ගයාගේ උද්දානය වේ.

තෙල නිකායධරයන් විසින් තබනලද අසම වූ ප්‍රවර වූ උතුම් වූ පළමුවැනි වර්ගය යි.

# පටිසම්භිදාමගග

# පදානුකකමණිකා

# ගාථාදිපාදානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කානි |
|---|---|
| අක්කෝධනෝ අනුපනාහී | 304 |
| අජාතං ඣාපෙති ජාතෙන | 132 |
| අට්ඨ සමාධිස්ස පච්චයා | 124, 128 |
| අතීතානුධාවිනං චිත්තං | 314 |
| අනත්තනි අනත්තාති | 506 |
| අනිච්චෙ නිච්චසඤ්ඤිනෝ | 506 |
| අනුගච්ඡනා ච අස්සාසං | 312 |
| අනුප්පාදං අප්පවත්තං | 114 |
| අස්සාසෙනාභිතුන්නස්ස | 312 |
| අස්සාසං ආවජ්ජමානස්ස | 312 |
| **ආ** | |
| ආනාපානසති යස්ස | 316, 324 |
| ආරම්මණං අන්වයෙන | 110 |
| ආරම්මණඤ්ච පටිසඞ්ඛා | 110 |
| **ඉ** | |
| ඉදං ආදීනවෙ ඤාණං | 114 |
| ඉමෙ අට්ඨාරසාකාරා | 124, 128 |
| **උ** | |
| උප්පාදඤ්ච පවත්තඤ්ච | 114 |
| **කු** | |
| කුසලෝ තීසු අනුපස්සනාසු | 110 |
| **කෝ** | |
| කෝධනෝ උපනාහී ච | 304 |
| **ඡ** | |
| ඡ එතෙ උපක්කිලෙසා | 312, 314 |
| **තෙ** | |
| තෙ යෝගයුත්තා මාරස්ස | 506 |
| තෙසං සුභාවිත සප්පඤ්ඤ | 506 |

| දු | පිට්ඨඞ්කානි |
|---|---|
| දුක්ඛා සඞ්ඛාරා | 132 |
| **න** | |
| න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි | 246, 248, 430 |
| **නි** | |
| නිමිත්තං අස්සාසපස්සාසා | 322 |
| නිමිත්තං ආවජ්ජමානස්ස | 312 |
| **ප** | |
| පටිසඞ්ඛා සන්තිට්ඨනා | 122 |
| **භ** | |
| භවඤ්ච දිට්ඨිං විභවඤ්ච දිට්ඨිං | 302 |
| **ය** | |
| යදා ච බුද්ධා ලෝකස්මිං | 506 |
| **යෝ** | |
| යෝ භූතං භූතතෝ දිස්වා | 302 |
| **ව** | |
| වත්ථුසඞ්කාමනා චෙව | 110 |
| **වි** | |
| විමොක්ඛචරියං ජානාති | 132 |
| **ස** | |
| සමාදහිත්වා යථා චෙ විපස්සති | 132 |
| සචෙ භූත පරිඤ්ඤාතෝ | 302 |
| සාමිසඤ්ච නිරාමිසං | 128 |

# විසෙසපදානුක්කමණිකා

**අ** — **පිට්ඨඞ්කානි**

අකම්පියට්ඨො 170
අකම්පියමග්ගො 512
අකම්පියමණ්ඩො 514, 518, 523
අකුප්පා චෙතොවිමුත්ති 64
අකුප්පො විමොක්ඛො 436, 446
අගාරං 332
අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා 142
අජ්ඣත්තවුට්ඨානෙ විමොක්ඛො 436, 438
අඤ්ඤාණචරියා 152, 154, 156
අඤ්ඤාතාවින්ද්‍රියං 218
අඤ්ඤින්ද්‍රියං 218
අතිත්තට්ඨෙන 120
අත්තවාදපටිසංයුත්තා දිට්ඨි 298
අත්තානුදිට්ඨි 266
අත්ථනානත්තෙ ඤාණං 170
අත්ථපටිසම්භිදෙ ඤාණං 4, 8, 168, 224
අත්ථසන්දස්සනෙ ඤාණං 6, 198
අත්ථිකම්මං 504
අද්ධා 412
අධිචිත්තං 86
අධිට්ඨානවසී 190
අධිට්ඨානෙ පඤ්ඤා 206
අධිපඤ්ඤා 86
අධිපතත්තා 204
අධිමුත්තත්තා 174
අධිමුත්ති 230, 232
අධිමොක්ඛමණ්ඩො 514, 516, 520
අධිසීලං 86, 90
අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං 218, 428
අනත්තට්ඨො 36
අනත්තානුපස්සනෙ ඤාණං 456
අනාගාමිමග්ගක්ඛණෙ 510
අනාවරණෙ ඤාණං 8
අනිච්චං 364
අනිච්චානුපස්සනා ඤාණං 456
අනිමිත්තානුපස්සනා ඤාණං 458
අනිමිත්තො විමොක්ඛො 436, 438
අනුට්ඨිතා 324
අනුත්තරං සීතිභාවං 452
අනුපට්ඨාන කුසලො 426
අනුපස්සති 334, 344, 348, 352, 354
අනුපුබ්බනිරොධ 64
අනුපුබ්බා පරිචිතා 326
අනුපාදචිත්තස්ස විමොක්ඛො 454
අනුබුජ්ඣනට්ඨො 32
අනුබුද්ධො 410
අනුලොමිකා ඛන්ති 230
අනුසයො 232
අන්තග්ගාහිකා දිට්ඨි 286
අපරන්තානුදිට්ඨි 294
අපරියාපන්නභූමි 160
අප්පණිහිතානුපස්සනා ඤාණං 458
අප්පණිහිතො විමොක්ඛො 436, 438, 446
අප්පරජක්ඛ 226, 434
අප්පහීනට්ඨෙන 120
අබ්භා මුත්තොව චන්දිමා 330
අභබ්බා 232
අභිජ්ජමානෙ 210
අභිඤ්ඤෙය්‍යං 12, 14, 16, 18
අභිනන්දනට්ඨෙන 118
අභිනිරොපණට්ඨො 172
අභිනිරොපණමණ්ඩො 518, 520
අභිනීහාරට්ඨෙන 118
අභිනීහාරො 116, 118, 120
අරඤ්ඤං 330
අරණවිහාරෙ ඤාණං 4, 184
අරණවිහාරො 184
අරහත්තමග්ගක්ඛණෙ 510
අරියසච්චා 70
අරූපාවචරභූමි 160
අරූපාවචරානං දෙවානං 500
අවික්ඛෙපට්ඨො 172
අවික්ඛෙපමග්ගො 512
අවික්ඛෙපමණ්ඩො 518, 520
අවිජ්ජාසම්භූතා 148, 150
අවිදිතට්ඨෙන 120
අසමයවිමොක්ඛො 436, 444
අසල්ලීනත්ත පහිතත්ත-පග්ගහට්ඨෙ පඤ්ඤා 196
අසාමයිකො විමොක්ඛො 436, 444

| අ | පිට්ඨඞ්කානි |
|---|---|
| අසම්මානො | 46 |
| අස්සාද දිට්ඨි | 262, 264, 266 |
| අහන්ති මානවිනිබන්ධා දිට්ඨි | 296 |
| අහුත්වා සම්භූතා | 146, 148, 150 |
| අහොසිකම්මං | 504 |
| ආදානං | 108, 110, 146, 148 |
| ආදීනවෙ ඤාණං | 2, 112, 114 |
| ආනන්තරිකසමාධිස්මිං ඤාණං | 4, 180, 182 |
| ආනා | 324 |
| ආනාපානසති | 308 |
| ආයතනචරියා | 408 |
| ආයතනානි | 40 |
| ආයස්මා | 412 |
| ආයූහනට්ඨො | 34 |
| ආයූහනා | 22, 26 |
| ආලොකසඤ්ඤා | 42 |
| ආවජ්ජනවසී | 190 |
| ආසයානුසයෙ ඤාණං | 8 |
| ආසයො | 230 |
| ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා | 180, 182 |
| ආසවා | 180, 182, 220, 428 |
| ආසවානං ඛයෙ ඤාණං | 6, 218 |
| ආහාරසම්භූතා | 148, 150 |
| ආහාරා | 40 |
| **ඉ** | |
| ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා | 210 |
| ඉජ්ඣනට්ඨො | 34 |
| ඉධනිට්ඨා | 304, 306 |
| ඉධවිහායනිට්ඨා | 304, 306 |
| ඉද්ධිවිධෙ ඤාණං | 6, 210 |
| ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං | 8 |
| ඉන්ද්‍රියභාවනා | 382 |
| ඉන්ද්‍රියානං චරියා | 406, 408 |
| ඉන්ද්‍රියානි | 378, 382, 400, 412, 416 |
| ඉන්ද්‍රියානි සමොධානෙති | 346 |
| ඉරියාපථචරියා | 408 |
| **උ** | |
| උදයබ්බයානුපස්සනෙ ඤාණං | 104 |
| උපකාරඤාණානි | 3[illegible]8 |
| උපක්කිලෙසා (අට්ඨාරස) | 310 |
| උපට්ඨානකුසලො | 422, 424 |
| උපට්ඨානට්ඨො | 172 |
| උපට්ඨානමග්ගො | 512 |
| උපට්ඨානමණ්ඩො | 516, 518, 520 |
| උපාදානක්ඛන්ධා | 40, 70, 74 |
| උපාදය | 148, 150 |
| උපෙක්ඛානුබ්‍රූහනා | 316, 318 |
| උප්පාදෙ | 22, 24 |
| **එ** | |
| එකග්ගතා | 90 |
| එකත්තවිමොක්ඛො | 436, 446 |
| එකත්තා | 308, 316 |
| එකත්තෙ | 32 |
| එකරසට්ඨෙ ඤාණං | 4,166 |
| එකසඞ්ගහතා | 198 |
| එකසඞ්ගහතානානත්තෙකත්ත-පටිවෙධපඤ්ඤා | 198 |
| **ඔ** | |
| ඔකප්පෙය්‍යුං | 412 |
| **ක** | |
| කම්මසම්භූතා | 148 |
| කසිණායතනානි | 50 |
| කාමාවචරානං දෙවානං | 498, 500 |
| කාමාවචරා භූමි | 160 |
| කායසක්ඛි | 466, 468 |
| කායසඞ්ඛාරො | 348 |
| කායිකං සුඛං | 354 |
| කායො | 346 |
| කුප්පො විමොක්ඛො | 436, 446 |
| කුසලාබ්‍යාකතට්ඨෙන | 118 |
| **ඛ** | |
| ඛත්තියමහාසාලානං | 498, 500 |
| ඛන්තිඤාණං | 6, 200 |
| ඛීණාසවබලං | 64 |
| **ග** | |
| ගතිසම්පත්තියා | 496, 500, 502 |
| ගම්භීරානි ඨානානි | 412 |
| ගහපතිමහාසාලානං | 498, 500 |
| ගොචරනානත්තෙ ඤාණං | 4, 148 |
| ගොචරා | 340, 344 |
| ගොත්‍රභුඤාණා | 2 |
| ගොත්‍රභුධම්මා | 126, 128 |

**ච** — පිට්ඨඞ්කානි

චතස්සො භූමියො 160
චතුධම්මවවත්ථානෙ පඤ්ඤා 160
චරිතං 232
චරියා 408
චරියානානත්තෙ ඤාණං 4, 152
චරියායො 410
චරියාවවත්ථානෙ පඤ්ඤා 152
චිත්තවිපල්ලාසො 506
චිත්තවිවට්ටෙ ඤාණං 6, 206
චිත්තවිසුද්ධි 38
චිත්තං 360
චිත්තසඞ්ඛාරෙ 356, 358
චිත්තස්ස අභිප්පමොදො 360
චෙතසිකං සුඛං 354
චෙතොපරියඤාණං 6, 212
චෙතොවිවට්ටෙ ඤාණං 6, 204

**ඡ**

ඡන්දසමාධිපධානසඞ්ඛාර-සමන්නාගතං 206, 216
ඡත්තවට්ටමනුපස්සනෙ-පඤ්ඤා 136, 138

**ජ**

ජරා 70
ජරාමරණෙ ආදීනවො 368
ජාති 70

**ඣ**

ඣානවිමොක්ඛො 4, 436, 454

**ඤ**

ඤාණචරියා 152, 158, 408
ඤාණවිමොක්ඛො 436, 448, 452
ඤාණවිවට්ටෙ ඤාණං 6, 206
ඤාතට්ඨෙ ඤාණං 4, 166

**ත**

තණ්හා 74
තණ්හාසම්භූතා 148, 150
තථට්ඨෙ පඤ්ඤා 208
තථට්ඨො 34
තයො ච සඞ්ඛාරානං-පටිප්පස්සද්ධියා 188
තික්ඛින්ද්‍රියෙ 434
තික්ඛින්ද්‍රියො 226

**ත** — පිට්ඨඞ්කානි

තිවත්තගතං චිත්තං 318
තීරණට්ඨෙ ඤාණං 4, 166
තෙජො 194

**ද**

දළ්හාසිතත්තං 190
දස්සනමග්ගා 512
දස්සනමණ්ඩා 516, 518
දස්සනවිසුද්ධි 200
දස්සනවිසුද්ධි ඤාණං 6
දිට්ඨාභිනිවෙසානි 250
දිට්ඨි 250
දිට්ඨිට්ඨානානි 250, 256
දිට්ඨිට්ඨානසමුග්ඝාතො 250
දිට්ඨිපරියුට්ඨානානි 250, 256
දිට්ඨිපපතෙනා 464, 466, 470, 474, 474
දිට්ඨියො 258
දිට්ඨිවිපල්ලාසො 506
දිට්ඨිවිසුද්ධි 38
දිට්ඨෙකට්ඨානං 90
දිබ්බචක්ඛු ඤාණං 6 216
දුක්ඛනිරොධගාමිනියා-පටිපදය ඤාණං 8
දුක්ඛනිරොධෙ ඤාණං 8
දුක්ඛසමුදයෙ ඤාණං 8
දුක්ඛානුපස්සනා ඤාණං 456
දුක්ඛෙ ඤාණං 6, 8
දුභතොවුට්ඨානො-විමොක්ඛො 436, 438
දුවිඤ්ඤපයො 228, 434
දෙසනාමණ්ඩො 514
දෙසිතා 328
ද්වාකාරෙ 434

**ධ**

ධම්මක්ඛන්ධා 34
ධම්මට්ඨිති ඤාණං 2, 94, 96
ධම්මනානත්තෙ ඤාණං 4, 162
ධම්මපටිසම්භිදෙ ඤාණං 4, 4, 172
ධම්මවවත්ථානෙ පඤ්ඤා 162
ධම්මෙ සමොධානෙති 342
ධාතුට්ඨො 36

| න | පිට්ඨඞ්කානි |
|---|---|
| නවහි සමාධිචරියාහි | 188 |
| නානත්තවිමොක්ඛා | 436 |
| නානත්තා | 166 |
| නානත්තෙකත්තං | 194, 200 |
| නානත්තෙ පඤ්ඤා | 204 |
| නානාධම්මපකාසනතා පඤ්ඤා | 198 |
| නානාධම්මා | 198 |
| නාමං | 40 |
| නිබ්බිදාඤාණානි | 347 |
| නිබ්බිදානුපස්සනාඤාණං | 456 |
| නිබ්බිදානුලොමෙ ඤාණානි | 374 |
| නිබ්බිදාපටිප්පස්සද්ධි ඤාණානි | 374 |
| නිබ්බෙධභාගියො | 66, 68 |
| නිය්‍යානා | 310 |
| නිරාමිසං | 26 |
| නිරාමිසො විමොක්ඛො | 436, 448 |
| නිරුත්තිපටිසම්භිදෙ ඤාණං | 4,8, 168, 172 |
| නිරොධසමාපත්තියා ඤාණං | 4, 180 |
| නිරොධානුපස්සනා ඤාණං | 458 |
| නිරොධෙ | 192 |
| නිරොධෙ ඤාණං | 8 |
| නීවරණා | 308, 310 |

| ප | |
|---|---|
| පකතිචරියා | 410 |
| පකාසනට්ඨො | 34, |
| පකාසනතා | 198 |
| පග්ගහට්ඨො | 172 |
| පග්ගහමග්ගො | 512 |
| පග්ගහමණ්ඩො | 518 |
| පච්චය | 94, 96, 98 |
| පච්චවෙක්ඛණවසී | 190 |
| පච්චවෙක්ඛණෙ ඤාණං | 4, 138 |
| පඤ්ඤාවසියො | 190 |
| පඤ්ඤින්ද්‍රියානි | 400, 402, 404 |
| පටිග්ගහමණ්ඩො | 514 |
| පටිපදාවිසුද්ධි | 316 |
| පටිනිස්සග්ගා | 370 |
| පටිවිජ්ඣති | 340 |
| පටිවිද්ධො | 410 |
| පටිවෙධෙ | 200 |
| පණිහිතො විමොක්ඛො | 446 |
| පණීතාධිමුත්තතා පඤ්ඤා | 184 |
| පහොතා | 412 |

| ප | පිට්ඨඞ්කානි |
|---|---|
| පදෙසවිහාරෙ ඤාණං | 6, 202 |
| පධානං | 324 |
| පයොගපටිප්පස්සද්ධිපඤ්ඤා | 132 |
| පරලොකවජ්ජභයදස්සාවිනො | 434 |
| පරිග්ගහට්ඨො | 172 |
| පරිග්ගහමණ්ඩො | 520 |
| පරිචිතා | 326 |
| පරිච්චාගට්ඨෙ ඤාණං | 166 |
| පරිඤ්ඤට්ඨො | 18 |
| පරිඤ්ඤෙය්‍ය | 40 |
| පරිනිබ්බානෙ ඤාණං | 4, 190, 192 |
| පරිපන්ථෙ ඤාණානි | 308 |
| පරිපුණ්ණෙ | 324 |
| පරිමුඛං සතිං | 332 |
| පරියොගාහණෙ ඤාණං | 6, 202 |
| පවත්තං | 22, 24 |
| පවත්තපරියාදානෙපඤ්ඤා | 190, 192 |
| පවත්තසන්තතාධිපතෙය්‍ය-පරිවාරං | 220 |
| පහානට්ඨො | 18 |
| පලිබොධට්ඨො | 34 |
| පාපුණිස්සති | 412 |
| පාමොජ්ජමූලකා ධම්මා | 162, 164 |
| පාරිසුද්ධිපධානියඞ්ගානි | 50 |
| පීති | 352 |
| පුඤ්ඤ | 194 |
| පුබ්බන්තානුදිට්ඨි | 294 |
| පුබ්බෙනිවාසානුස්සතිඤාණං | 214 |
| පොනොභවිකං | 74 |

| ඵ | |
|---|---|
| ඵස්සො | 40 |
| ඵලෙ ඤාණං | 2 |
| ඵස්සනට්ඨෙ ඤාණං | 4, 166 |

| බ | |
|---|---|
| බලානි සමොධානෙති | 340 |
| බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා | 148 |
| බහිද්ධා වුට්ඨානො විමොක්ඛො | 436, 438 |
| බුද්ධචක්ඛු | 432 |
| බුද්ධඤාණානි | 246 |
| බුද්ධො | 328 |
| බොජ්ඣඞ්ගා | 7 |
| බොජ්ඣඞ්ගෙ සමොධානෙති | 340 |

**බ** — පිට්ඨඞ්කානි

බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා 170, 172
බ්‍රහ්මචරියමණ්ඩො 514
බ්‍රාහ්මණමහාසාලානං 498, 500

**භ**

භබ්බා 232
භවදිට්ඨියො 300
භවදිට්ඨිසන්නිස්සිතා 230
භාවනට්ඨො 18
භාවනා 52, 54, 56, 58, 60, 62, 334
භාවිතින්ද්‍රියා 382
භික්ඛු 330
භූමිනානත්තෙ ඤාණං 4, 160

**ම**

මග්ගචරියා 410
මග්ගං සමොධානෙති 342
මග්ගෙ ඤාණං 2, 8
මග්ගා 74, 76, 508
මණ්ඩපෙය්‍යං 514
මරණං 70
මහාකරුණාසමාපත්තියා ඤාණං 8, 236
මහාරාජිකා 226, 434
මිච්ඡත්තා 46
මිච්ඡාදිට්ඨි 282
මුඤ්චිතුකම්‍යතාඤාණං 114
මුඤ්චිතුකම්‍යතා පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා 114
මුදින්ද්‍රියො 226, 434

**ය**

යත්ථිච්ඡකං 190
යථත්ථා 326
යථාචරන්තං 412
යථාවිහරන්තං 412
යදිච්ඡකං 190
යමකපාටිහීරෙ ඤාණං 8, 234
යානීකතා 324
යාවතිච්ඡකං 190
යොනිසොමනසිකාරමූලකා ධම්මා 164

**ර** — පිට්ඨඞ්කානි

රුක්ඛමූලං 332
රූපං 40
රූපාවචරානං දෙවානං 500
රූපාවචරාභූමි 160

**ල**

ලක්ඛණානි 104, 106, 108
ලොකවාදපටිසංයුත්තාදිට්ඨි 298
ලොකා 228, 328, 434

**ව**

වජ්ජං 228, 434
වත්ථුකතා 324
වත්ථුනානත්තෙ ඤාණං 4, 142, 146
විජ්ජා 64
විඤ්ඤාණචරියා 152, 154
විඤ්ඤාණට්ඨිතියො 40
විඤ්ඤූ 312
විපන්නදිට්ඨි (පුග්ගලා) 302
විපරිණාමට්ඨො 34
විපස්සනාබලං 186, 188
විපස්සනාවසෙන ඤාණානි 374
විපස්සනෙ ඤාණං 2, 108
විභවදිට්ඨියො 300
විභවදිට්ඨිසන්නිස්සිතා 230
විමුත්ති 64
විමුත්තිඤාණං 2
විමුත්තිසුඛෙ ඤාණානි 374
විමොක්ඛපච්චනීකං 492
විමොක්ඛපටිප්පස්සද්ධි 494
විමොක්ඛභාවනා 494
විමොක්ඛමුඛානි 458
විමොක්ඛවිවට්ටො 492
විමොක්ඛා 486, 488
විමොක්ඛානුලොමං 492
විමොක්ඛො 488, 490, 492
විරාගානුපස්සනා ඤාණං 456
විරියාරම්භෙ ඤාණං 6, 196
විවට්ටනා 110
විවට්ටානුපස්සනා 46, 88
විහාරට්ඨෙ ඤාණං 6, 174
විහාරනානත්තෙ පඤ්ඤා 14
විහාරසමාපත්තට්ඨෙ ඤාණං 4
විහාරසමාපත්තට්ඨෙන 120

ව — පිට්ඨඞ්කානි

වීමංසාසමාධිපධාන
සඞ්ඛාරසමන්නාගතං 210, 212
වුට්ඨානවිවට්ටනෙපඤ්ඤා 128, 130, 132
වොදානට්ඨො 172
වොදානමග්ගො 512

ස

සකදාගාමිමග්ගක්ඛණෙ 510
සක්කායදිට්ඨි 282
සක්කායවත්ථුකාඋච්ඡෙදදිට්ඨි 284
සක්කායවත්ථුකාසස්සතදට්ඨි 284
සඞ්ඛතට්ඨො 34
සඞ්ඛාරා 26, 28, 68
සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං 2, 122
සඞ්ඛාරෙසු ආදීනවො 268
සච්චවිවට්ටෙ ඤාණං 6, 208
සච්ඡිකිරියට්ඨො 18
සඤ්ඤාවිපල්ලාසො 506
සඤ්ඤොගට්ඨො 34
සඤ්ඤොජනානි චෙව දිට්ඨියො 264, 266
සඤ්ඤොජනිකා දිට්ඨි 294
සතිචරියා 408
සත්තාවාසා 40
සතොකාරිස්ස ඤාණානි 330
සතොව 332
සද්ධානුසාරී 466
සද්ධාවිමුත්තා 468
සද්ධින්ද්‍රියං 400
සන්තාපට්ඨො 34
සන්තිපදෙ ඤාණං 112, 114
සප්පහාසං චිත්තං 216
සබ්බඤ්ඤුත ඤාණං 8
සබ්බධම්මානං 198
සබ්‍රහ්මචාරී 412
සමන්තචක්ඛු 246, 430
සමං 194, 326, 340
සමථබලං 186
සමයවිමොක්ඛො 436, 444
සමසීසට්ඨෙ ඤාණං 4
සමාධි 362
සමාධිචරියා 408
සමාධිභාවනාමයෙ ඤාණං 2, 90
සමාධිවසෙන ඤාණානි 374
සමාපජ්ජනවසී 190
සමාපත්තට්ඨෙ ඤාණං 4
සමුට්ඨානට්ඨො 172
සමුට්ඨානමග්ගො 512

ස — පිට්ඨඞ්කානි

සමුට්ඨානමණ්ඩො 518
සමුදයෙ ඤාණං 6
සමුදගතං 140
සමුදගතා 138, 140, 142, 148
සමුදගතො 138
සමොදහනෙ පඤ්ඤා 202
සම්පන්නදිට්ඨි (පුග්ගලා) 302
සම්පහංසනා 316, 318
සම්මසනෙ ඤාණං 2, 100, 102
සම්මාසමුච්ඡෙදෙ 192
සල්ලෙඛට්ඨෙ ඤාණං 4
සල්ලෙඛො 196
සාතසහගතා 50
සාමඤ්ඤඵලානි 64
සාමයිකො විමොක්ඛො 436, 444
සාමිසං 26
සාමිසො විමොක්ඛො 436, 444
සාසවො විමොක්ඛො 446
සික්ඛායො (තිස්සො) 88
සීතිසියාවිමොක්ඛො 436, 450, 452
සීලමයෙ ඤාණං 2, 80
සීලවිසුද්ධි 38
සීලානි (පඤ්ච) 80, 82, 86
සීසං 194
සුඛං 354
සුඤ්ඤතානුපස්සනා ඤාණං 458
සුඤ්ඤතාවිහාරසමාපත්ති 176, 178
සුඤ්ඤතෙ පඤ්ඤා 206
සුඤ්ඤතො විමොක්ඛො 436
සුඤ්ඤතො විහාරො 176, 178
සුතමයෙ ඤාණං 2, 10, 12, 40, 46, 60, 62
සුභාවිතා 324
සුවිඤ්ඤාපයෙ 228, 434
සුසමං 326
සොතධාතුවිසුද්ධි ඤාණං 6
සොතාපත්තිමග්ගක්ඛණෙ 508
සොතාවධානං 10, 12, 40, 46, 60, 62
ස්වාකාරෙ 228, 434

හ

හානභාගියො ධම්මා 66
හෙතුට්ඨො 36

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාළි - ථෙරීගාථා පාළි

32 ඛුද්දක නිකාය - ජාතක පාළි I

33 ඛුද්දක නිකාය - ජාතක පාළි II

34 ඛුද්දක නිකාය - ජාතක පාළි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාළි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාළි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාළි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාළි - චරියා පිටක පාළි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤ්ඤත්තිප්පකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි ව්පතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES, Volume 29～Volume 44**

**書名：斯里蘭卡巴利文大藏經，第二十九冊～第四十四冊**
**Book Serial No., 書號：SR229～SR244**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,213,398：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,534,498；Print 1,000 sets**
**以上合計，新台幣 1,534,498 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第三十七冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; October 2013

SR237 - 11590